නිකොලායි ඔස්ත්‍රොව්ස්කි

වානේ පන්නරය ලැබූ හැටි II

RUSSIAN
CLASSICS



නිකොලායි ඔස්ත්‍රොව්ස්කි
1904-1936

නිකොලායි ඔස්ත්‍රොව්ස්කි

මගේ පන්නරය ලැබූ හැටි

II

නිකොලායි ඔස්ත්‍රොව්ස්කි

වානේ පන්නරය ලැබූ හැටි II

අනුවාදය
දෑදිගම වී. රුද්‍රිගු

ISBN 978-624-5937-18-9

පරිගණක අකුරු සකැසුම
නිරූපමා සෙනරත්

මුද්‍රණය සහ ප්‍රකාශනය

සී/ස. කැනොල් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම

2023
ශ්‍රී ලංකාවේ මුද්‍රණය කරන ලදි

දෙවැනි කොටස

I

මැදියම් රැය අවසන කබල් ට්‍රෑම් රිය ඩිපෝව බලා ගොස් බොහෝ වේලාවක් ගත වී ඇත. කවුළු පඩි කඳ සඳ රැසින් නැහැවිලාය. සඳ රැස් ඇඳ සිප ගත්තේ නිල් පැහැති ඇතිරිල්ලක් සේය. කාමරයේ ඉතිරි හරියේ අඩ අඳුරියකි. මුල්ලේ මේසයක් මත ආලෝකයකි. කවරයක් සහ විදුලි බුබුළක් සහිත පහනකි.

තම දිනපොත වන විශාල කොපි පොතක් වෙත රීතා නැඹුරු වූවාය.

'මැයි 24 ද' ඈ තම අත තිබූ පැන්සල් තුඩින් ලියුවාය.

"මගේ හැඟීම් ලිවීමට මා යළිත් වෑයම් කරනවා. නැවත හිස්බවකි. මාස එකහමාරක් ගත වුවද, එකද පිටුවක්වත් ලියා නැත. මේ කොටස සමඟ එකඟ වීමට සිදුවී තිබෙනවා.

දිනපොත ලිවීමට වේලාව සොයා ගන්නේ කෙසේද? දැන් මහ රැය. මම ලියමි. නින්ද ඉවත යයි. මධ්‍යම කාරක සභාවේ වැඩ කිරීමට සෙගාල් සහෝදරයා යයි. ඒ ආරංචිය අප හැමගේම ඉමහත් කනස්සල්ලට හේතුවකි. ලාසර් අලෙක්සාන්ද්‍රොවිච් සෙගාල් ඉතා හොඳ කෙනෙකි. ඔහු සමඟ අපගේ තිබූ මිත්‍රත්වය කොතරම් වටිනා එකක් දැයි මට අවබෝධ වන්නේ දැන්ය. ඔහුගේ පිටවී යාම නිසා ද්වන්ද්වාත්මක භෞතිකවාදය පිළිබඳ කවය සත්තකින්ම බිඳී යනු ඇත. ඊයේ රෑ බෝවන තුරු ඔහු ළඟ සිටි අපි, අපේ සිසුන්ගේ ජයග්‍රහණය යළි සොයා බැලීමු. ගුබ්කොමෝල්[1] සංවිධානයේ ලේකම්වර අකීම්ද, ප්‍රධාන ගණකාධිකාරී මූසල ටුප්ටාද පැමිණියහ. හැම එකක් ගැනම දන්නා බවක් පෙන්වන ඔහු මට පෙනෙන්ට බැරිය. සෙගාල් ප්‍රීතියෙන් කුල්මත් විය. ඔහුගේ සිසුවකු වන කොර්චාගින් පක්ෂ ඉතිහාසය පිළිබඳ පාඩමේ දී ටුප්ටා නිරුත්තර කරමින් දස්කම් පෑවේය. ඔව්, පසුගිය දෙමස අපතේ නොගියේය. මෙවැනි ප්‍රතිඵල දෙන්නේ නම් මහන්සි වූවාට දුකක් නැත. දූසමාන ආරංචි අනුව ෂුක්රායි යුද්ධමය වශයෙන් බෙදූ ඇති ප්‍රදේශයේ විශේෂ අංශයේ වැඩට යන බවකි. කවර හේතුවක්

1 ගුබ්කොමෝල් - ගුබේර්නියාවේ කොම්සොමොල් කමිටුව.

නිසා දැයි නොදනිමි.

ලාසර් අලෙක්සාන්ද්‍රොවිච් තම සිසු මට භාර දුන්නේය. "පටන්ගත් දේ අවසානයක් කරන්නැ" යි ඔහු පැවසීය. "අතර මග නවතින්න එපා. රීතා, ඔබටත්, ඔහුටත් එකිනෙකාගෙන් ඉගෙනගත යුතු දේවල් තියෙනවා. තරුණයා තවම ඉබේ හටගන්නා ක්‍රියාකාරීත්වයෙන් ඈත් වෙලා නැහැ. ඔහු තුළ කැරලි ගහන හැඟීමකින් ඔහු ජීවත් වෙන්නේ. එම හැඟීම්වල කුණාටු විසින් ඔහු පැත්තකට වීසි කරනු ලබනවා. මා දන්නා තරමින්, රීතා, ඔබ තමයි ඔහුට නායකත්වය දීමට ඉතාම සුදුසු කෙනා. මම ඔබට ජය පතමි. මට මොස්කව් නගරයට ලියන්ට අමතක කරන්ට එපා" යැ යි සෙගාල් සමු ගැනීමේදී මට කීවේය.

අද මධ්‍යම කාරක සභාව විසින් සලෝමින්ස්ක් කමිටුවේ නව ලේකම්වර ෂාර්කි මෙහි එවන ලදි. යුද හමුදාවේ සිටි කාලයේ සිට මම ඔහු හඳුනමි.

දිමීත්‍රි දුබාවා හෙට කොර්චාගින් මෙහි කැඳවා ගෙන එනු ඇත. දුබාවා ගැන විස්තරයක් කරමි. උසින් ඔහු මැද තරම්ය. ශක්තිමත්ය, මාංස පේශීන් වර්ධනය වී ඇත. 1918 සිට කොමියුනිස්ට් තරුණ සංවිධානයේද 1920 සිට කොමියුනිස්ට් පක්ෂයේද සාමාජිකයෙකි. 'කම්කරු විරුද්ධ පක්ෂයට' සම්බන්ධවීම නිසා ගුබ්කොමොල් සංවිධානය විසින් නෙරපා දමනු ලැබූ තුන් දෙනාගෙන් ඔහු දිගින් දිගට ම ප්‍රශ්න අසමින් හා තේමාවෙන් පිට කතා කරමින් සැලැස්ම කඩා කප්පල් කළේය. මගේ දෙවැනි සිසුවිය වන ඔල්ගා යුරේනෙවා හා දුබාවා අතර බහින් බස්වීම් නිතර ඇතිවිය. පළමුවැනි දවසේදීම ඔල්ගාගේ හිස සිට පාද දක්වා බැලූ දුබාවා මෙසේ පැවසීයඃ

"ආච්චි අම්මේ, නුඹේ ඇඳුම් කට්ටලය සම්පූර්ණ නැහැ හම් කලිසම් ඕන. අඩු ඇති සපත්තු ඕන. බුඩිඹනි[1] තොප්පියක් ඕන. කඩුවක් ඕන. එහෙම නැතුව නුඹ ගොඩ සතෙකුත් නොවෙයි, දිය සතෙකුත් නොවෙයි."

ඔල්ගා නිකම් හිටියේ නැහැ. යස පිළිතුරු දුන්නා. "දුබාවා කොර්චාගින්ගේ යාළුවෙක්ලු. අදට මේ ඇති නින්දට යමි."

1 බුඩිඹනි සෙනෙවියාගේ අසරු භටයන් ඇඳි මේ හිස්වැස්ම අනතුරුව එනම ලැබීය.

★

දැඩි ඉර අව්ව නිසා මහ පොළොව මැලවිණි. දුම්රියපොළට ඉහළින් පිහිටි පාලමේ යකඩ වැට ගිනි රත් විය. දැඩි හිරු තාපය නිසා හෙම්බත් වුණු මිනිස්සු පාලම දිගේ සෙමින් ගමන් කළහ. ඔවුහු දුම්රිය මඟීන් නොවූහ. නගරය දක්වා යාම සඳහා දුම්රියපොළ අසල පෙදෙසේ මිනිස්සු එම පාලම දිගේ ගියහ.

ඉහළ පඩි පෙළෙහි සිටින පාවෙල්, රීතා දුටුවේය. ඔහුට පෙර දුම්රියපොළට පැමිණි ඈ පහළ බැස යන මිනිසුන් දෙස බලාගෙන සිටියාය.

රීතා උස්තිනෝව්චිට පියවර තුනක් පමණ ඈතින් පාවෙල් කොර්චාගින් නැවතුණේය. ඈ ඔහු නොදුටුවා ය. පාවෙල් ඇය දෙස බැලුවේ අපූරු කුතුහලයකිනි. ඉරි වැටුණු හැට්ටයක් ද, තද නිල් පැහැති, බාල රෙදි වර්ගයකින් මැසූ සායක්ද ඇඟ සිටි රීතා, මුදු සම් කබායකින් දෙවුර වසා ගෙන සිටියා ය. හිරු රැසින් පදම්වුණු ඇගේ මුහුණට ඉහළින් ඇති නොහික්මුණු හිස්වැස්මක් මෙනි. යම්තම් හිස උඩු අතට හරවා ගෙන දීප්තිමත් හිරු රැස් නිසා දෙනෙත් හකුළුවාගෙන ඈ සිටගෙන සිටියාය. පළමුවැනි වරට පාවෙල් සිය මිතුරිය හා ගුරුවරිය වූ රීතා ගුබේර්නියා කොම්සොමොල් කමිටුවේ සාමාජිකාවක් පමණක් නොව, එහෙත්... යන අදහස ඇතිව ඇය දෙස බැලීය. එවැනි 'පව්කාර' අදහස් හිතට ඇතුළු කරගැනීමට ඉඩ දීම නිසා තමාටම දෙස් පවරාගත් ඔහු, ඇයට අඬ ගැසීයː

"මා ඔබ දෙස පැයක් ම බලාගෙන හිටියා. නමුත්, ඔබ මා දැක්කේවත් නැහැ. අපේ දුම්රිය ඇවිල්ලා. ගමනට වේලාව හරි."

දුම්රිය වේදිකාවේ ඇති සේවා ගේට්ටුව දෙසට ඔවුහු ගමන් ගත්හ.

එක් ප්‍රාදේශීය සාකච්ඡාවකට ඊයේ ගුබේර්නියා කොම්සොමොල් කමිටුව රීතා සිය නියෝජිතවරිය හැටියට පත් කළේය. ඇයට සහාය දීමට කොර්චාගින් පත් කළේය. දැන් ඔවුන්ගේ හදිසි කාර්යය දුම්රියට නැඟ ගැනීමය. එය කොහෙත්ම ලෙහෙසි වැඩක් නොවේ. විරල දුම්රිය, දුම්රිය ස්ථානයෙන් පිටවන විට, එය සර්වබලධාරී පස්දෙනාගේ කමිටුවට අයත්ය. එම කමිටුවේ අවසර නැතිව දුම්රියවලට ඇතුළු වීමට බැරිය. දුම්රියට ළඟා වන සියලු ස්ථාන

පස්දෙනාගේ කමිටුවේ සෙබළුන් විසින් මුර කරන ලදි. මඟීන්ගෙන් පිරී ඉතිරී ගිය දුම්රියට ගෙන යා හැකි වූයේ එයින් ගමන් කිරීමට කැමැති අයගෙන් දහයෙන් කොටසක් පමණකි. මීළඟට අහම්බෙන් පැමිණෙන දුම්රියකට නැඟීමට කිසිවෙක් සූදානම් නොවූහ. ළඟා විය නොහැකි කොළ පැහැති දුම්රිය මැදිරි දෙසට දහසක් මඟීහු දුවන්නට වූහ. ඒ දවස්වල දී දුම්රියපොළවල් මිනිසුන් විසින් වට කරන ලදි. සමහර අවස්ථාවල දී ගුටිබැට හුවමාරු කර ගැනීම්ද ඇති විය.

පාවෙල් සහ රීතා දුම්රිය වේදිකාවට යාමට තැත් කළහ. සියලු යාම් ඊම් මාර්ග ගැන දන්නා පාවෙල් රීතා සමඟ බඩු ගබඩා කාමරය හරහා දුම්රිය වේදිකාවට ළං විය. බොහෝ අමාරුවෙන් ඔවුහු අංක 4 දරන දුම්රිය මැදිරිය වෙත ආහ. දැඩි රශ්මිය නිසා දහඩිය දමමින් සිටි විශේෂ කමිටුවේ චෙකා සෙබළෙක් ඉදිරියට කඩා පනින සෙනඟ නවත්වමින් සියවැනි වරටද මෙසේ පැවසීයඃ

"දුම්රිය මැදිරියෙ සෙනඟ පිරිලා. බපර් එකෙත් වහල උඩත් යාම තහනම්, එසේ යාම නීති විරෝධියි."

කෝප වූ මිනිස්සු කොමිටිය මගින් අංක 4 මැදිරිය සඳහා නිකුත් කළ දුම්රිය ප්‍රවේශ පත්‍ර පෙන්වමින් චෙකා සෙබළා වෙත කඩා පැන්නාහ. හැම මැදිරියක් ඉදිරියේම බැණ වැදීම්, කෑ ගැසීම් හා තල්ලු කිරීම් ඇති විය. සාමාන්‍ය සිරිත් පිළිපැදීමෙන් එම දුම්රියට නැග ගැනීමට බැරි බව දුටු පාවෙල් එයින් කෙසේ හෝ යා යුතු බවත්, නැතිනම් තරුණ සමිති සාකච්ඡාව කඩාකප්පල් වන බවත් වටහා ගත්තේ ය.

ඔහු රීතා පසෙකට අඬ ගසා තම වැඩ පිළිවෙළ ගැන ඇයට දැන්වූයේය. ඔහු මැදිරියට ගොස් එහි කවුළුවක් විවෘත කරනු ඇත. ඉක්බිති රීතා එම කවුළුවෙන් මැදිරිය තුළට ඇද ගනු ඇත. නැතිනම් කාරිය සරු නොවන්නේය.

"ඔබේ හම් කබාය මට දෙන්න. එය ඕනෑම බලපත්‍රයකට වැඩියෙ හොඳයි." පාවෙල් ඇයට කීවේය.

පාවෙල් ඇගේ හම් කබාය හැඳගෙන, පිස්තෝල මිට සහ එයට ඈඳා තිබෙන ලණුව පිටතට පෙනෙන සේ සාක්කුවක ඔබාගෙන, ආහාර මල්ල රීතාගේ දෙපා ළඟ තබා දුම්රිය මැදිරිය වෙත ගියේය. ඔහු කිසිදු තැකීමක් නැතිව මඟීන් තල්ලු කරමින්, මැදිරියේ අත් පොල්ල අල්ලා ගත්තේය.

"ඒයි, සහෝදරයා නුඹ කොහේ යනවද?"

පාවෙල් පළල් දේහයකින් යුත් චෙකා සෙබළා දෙස බැලීය.

"මම ප්‍රාදේශීය විශේෂ කමිටුවෙන්, දුම්රිය මැදිරියට නැග සිටින හැම කෙනෙකු අතම කමිටුවේ බලපත්‍ර තියෙනවද කියල හොයා බලන්නට ඕන" ඔහු තම ආධිපත්‍යය පිළිබඳ ප්‍රශ්නය සැකයට භාජන නොවන සේ පැවසීය.

චෙකා සෙබළා ඔහුගේ සාක්කුව දෙස බලා, තම නළලෙන් වැගිරෙන ඩහදිය පිසගෙන උදාසීන ලෙස කතා කළේය:

"නුඹට පෙට්ටියට රිංගන්ට පුළුවන් නම්, හොයා බලාපන්."

දෑතින් හා උරහිස්වලින්ද, සමහර තැන්වලදී මිට මෙළවූ අතින්ද ක්‍රියා කළ පාවෙල් මගීන්ගේ උරහිසට උඩින් පැන යනු වස් ඉහළ ඇති නිදන කුටිවල හරස් පොලු අල්ලා ගනිමින්ද, තමා වෙත හැම දෙසකින්ම එල්ල වන බැණුම් ගණන් නොගනිමින්ද, කෙසේ හෝ දුම්රිය මැදිරියේ මැද කොටසට පැන ගත්තේය.

"නුඹව යකා ගෙනියනවද, නුඹට හෙණ හතක් වදින්ට ඕන." පාවෙල් ඉහළ සිට පහළට බසින විට ඔහුගේ පයක් තරබාරු ගෑනියකගේ උරහිසෙහි හැප්පුණෙන් ඈ බැණ වැදුණාය. බරින් රාත්තල් 250 ක් පමණ වූ සිරුරක් ඇති ඈ පහළ පෙළේ මුල්ලක වාඩිවී, දෙදණ අතර එළවළු තෙල් බඳුනක් තබාගෙන සිටියාය. එවැනි බඳුන්, මලු, පෙට්ටි ආදිය හැම ආසනයකම පාහේ තිබිණි. මැදිරිය තුළ හුස්ම ගැනීමට පවා ඉඩක් නැත.

තරබාරු ගැහැනියගේ බැණවැදීම්වලට පිළිතුරු ලෙස පාවෙල් ප්‍රශ්නයක් ඇසීය:

"රටවැසිය, නුඹගේ බලපත්‍රය ?"

"මොනවද?" නොකැඳවූ ටිකට් පරීක්ෂකයාගෙන් ඈ ඇසුවාය.

ඉහළ නිදන කුටියෙන් "හොරකුගේ" හිසක් මතු වී, අමිහිරි ගොරෝසු හඬකින් කතා කළේය:

"වාස්කා, මෙතැනට ආපු එකා මොකෙක්ද, ඌට දීපන්කො "සුවර්ග ලෝකෙට" ටිකට් එකක් !"

කෝර්චාගින් හිසට උඩින් වාස්කා විය යුතු පුද්ගලයා පෙනී හිටියේය. පපුවේ මවිල් සහිත යෝධ තරුණයකු වූ ඔහු ලේ රත් පැහැති ඇස්වලින් පාවෙල් කෝර්චාගින් දෙස බැලීය:

"නුඹ කාන්තාවගෙන් අහන්නේ මොනවාද? නුඹට ඕන ටිකට් මොනවද?"

ඉහළ එක් පැත්තක කුටියෙන් පාද හතරක් පෙනිණි. ඒ පාද අයිතිකරුවෝ කරට අත් දමාගෙන හඬ නගමින්

සූරිය මල් ඇට සපමින් උන්හ. ඔවුන් දුම්රිය මඟ දිගේ රට පුරා යමින් ආහාර කොල්ලයට ලබාගෙන ඒවා වැඩි මිල ගණන්වලට විකුණන හොර තක්කඩියන්ගේ කණ්ඩායමක් බව එක වරම පෙනිණි. ඔවුන් සමඟ කාලය නාස්ති කිරීමට වේලාවක් නැත. කෙසේ හෝ දුම්රිය මැදිරිය තුළට රීතා ගත යුතුය.

"මේ පෙට්ටිය කාගෙද?" ඔහු ලී පෙට්ටියක් පෙන්වමින් මහලු දුම්රිය ශිල්පියකු ඇමතීය.

"අන්න අර එක්කෙනාගේ" දුඹුරු පැහැති මේස් ඇඳ ඇති කකුල් දෙකක් පෙන්වමින් ඔහු කීය.

කෙසේ හෝ කවුළුව හැරිය යුතුය. පෙට්ටිය එයට බාධාවකි. එය අන් තැනක තැබීමට පවා බැරිය. ඔහු එය අතට ගෙන ඉහළ කුටියේ වාඩිවී සිටි ගැහැනියගේ අත තැබීය.

"රටවැසිය, විනාඩියකට එය අල්ලා ගන්න. මම ජනේලය අරින්නම්."

ඔහු පෙට්ටිය ඔසවා ඇගේ දණහිස මත තබත්ම, පෙතැලි නහයකින් යුත් ඈ මහ හඬින් කෑ ගැසුවාය:

"නුඹ මොකටද අනුන්ගෙ බඩු මුට්ටු අත ගාන්නෙ!"

"මෝට්කා, මොකද මේ රටවැසියා කෑ කෝ ගහන්නෙ? ඈ තම හවුල්කරුවා ගෙන් ආධාර ඉල්ලා සිටියාය. ඔහු ඉහළ කුටියෙන් බිමට නොබැසම පාවෙල්ගේ පිටි කොන්දට තම සෙරෙප්පුව සහිත කකුල තබා තල්ලු කළේය.

"ඒයි, නුඹ දියබරියා! නුඹේ නහය පොඩි කරන්නට ඉස්සෙල්ලා මෙතැනින් අහකට පල."

පාවෙල් නිහඬව පා පහර කාගෙන, දෙතොල් සපා ගනිමින් කවුළුව හැරියේය.

"සහෝදරයා, පොඩ්ඩකට අයින් වෙන්න." ඔහු දුම්රිය ශිල්පියාට පැවසීය.

ඉඩ ලබාගෙන පාවෙල් කිසිවකුගේ බඳුනක් අයින් කොට කවුළුව අසලටම පැමිණියේය. රීතා දුම්රිය මැදිරිය අසල වූවා, වහා ම ඔහු අතට ගමන් මල්ල දුන්නාය. තෙල් බඳුන දණහිස මත තබාගෙන සිටි ගැහැනියගේ ඔඩොක්කුවට මල්ල විසි කළ පාවෙල්, ඉදිරියට නැමී රීතාගේ දෑතින් අල්ලා තමා වෙත ඇද ගත්තේය. එය නීති රීති කඩ කිරීමක් බැවින් එයට විරුද්ධ වීමට දුම්රිය ආරක්ෂක රතු සෙබළා ඉදිරිපත් වීමටත් කලින් රීතා දුම්රිය මැදිරිය තුළ වූවාය. කඩිසර නොවූ රතු සෙබළාට කවුළුව අසලට පැමිණ බැණ වැදීම හැර අන් කිසිවක් ඉතිරි

නොවීය. රීතාගේ එහි පැමිණීම කළුකඩකාර හොර තක්කඩි රැළ විසින් කොතරම් විශාල සෝෂාවකින් පිළිගනු ලැබීද යත්, ඔවුන්ගෙන් විය හැකි තර්ජනය නිසා ඈ කැලඹුණා ය. මැදිරිය තුළ බිමට පය ගසා සිට ගැනීමට පවා ඉඩක් නැතිව ගියෙන්, ඈ පහළ කුටියේ අයිනක දෙපා තබාගෙන ඉහළ කුටියේ හරස් පොලු අල්ලා ගෙන සිටියාය. දසතින් බැණුම් ඇසෙන්නට විය. ඉහළ කුටියේ ගොරෝසුවෙක්, කතා කළේයඃ

"ඔන්න නීචයා, උඹත් රිංගලා, උගේ ගෑනිවත් ඇදගෙන එනවා."

කිසිවෙක් ඉහළ සිට කෑ ගැසීයඃ

"මෝට්කා, ඕකාගේ හොම්බට ඇනපන්කො."

පෙතැලි නහයකින් යුත් ගැහැනිය තම ලී පෙට්ටිය පාවෙල්ගේ හිස මත තැබීමට මහන්සි ගත්තාය. නපුරු, ගොරහැඩි මුහුණු ඇතියහු පාවෙල් සහ රීතා වටකර ගත්හ. රීතා මෙතැනට පැමිණීම ගැන පාවෙල් දුක්වුවද, දැන් කෙසේ හෝ වාඩිවීමට තැනක් ලබා දිය යුතුය.

"රටවැසිය, මග තියෙන මලු අරගනින්, මෙතන සහෝදරියක් හිටගෙන ඉන්නවා" පාවෙල් එසේ කීවේ මෝට්කා නමින් හැඳින්වෙන පුද්ගලයාටය. ඔහුට පිළිතුරු වශයෙන් මෝට්කා කොතරම් නොසරුප් බසින් බැණ වැදුණේ ද යත්, පාවෙල්ගේ ලේ රත් විය. ඔහුගේ දකුණු ඇහි බැම වේදනාවෙන් නැටවිණි.

"නැවතියන් නීචයා, තෝ මට කළ අපහාසයට තොට හොඳ පාඩමක් උගන්වන්නම්." පාවෙල් එසේ කියත්ම, ඉහළ කුටියේ වාඩිවී සිටි මැරවරයා පයකින් ඔහුගේ හිසට පහරක් ගැසීය.

"වාස්කා උඹට තව එකක් දීපන්!" මැරවරයාගේ සහචරයෝ කෑ ගැසූහ.

මෙතෙක් වේලා ඉවසාගෙන සිටි පාවෙල් තදින් කිපුණේය. එවැනි අවස්ථාවල දී හැමදා මෙන්ම, එදත් ඔහුගේ ක්‍රියා ක්ෂණික හා නොවරදිනසුලු විය.

"නීච කළුකඩකාරයන් වන තොපි නින්ද අපහාස කරන්ට හදනවද?" මෙසේ ප්‍රශ්න කරමින් ඉතා කඩිසර ලෙස ඉහළ කුටියට නැගගත් පාවෙල් උද්ධච්ච පෙනුමකින් යුත් මෝට්කාගේ මුහුණට මිට මොළවා වේගවත් පහරක් ගැසීය. එම පහර කෙතරම් බලවත් වීද යත් කළුකඩකාර මැරවරයා පහළ වැටුණෙන්, ඔහුගේ සිරුර අනිකුත් හිස්වලට වැදිණි.

"තොපි ඔක්කොම බැහැපියව් බිමට, නැතිනම් බල්ලන්ට වගේ වෙඩි තියෙනවා!" පාවෙල් වියරු ලෙස කෑ ගසමින් මැරවරයන් හතර දෙනාගේ මුහුණු ඉදිරියේ පිස්තෝලය වැනීය.

එවිට තත්ත්වය හාත්පසින්ම වෙනස් විය. කිසිවකු පාවෙල් කොර්චාගින්ට පහර දුන්නොත් හැම එකකුටම වෙඩි තැබීමට රීතා සූදානම්ව සිටියාය. ඉහළ කුටිය ඉක්මනින්ම අතහැර මැරවරයෝ පසු බැස ගියහ. "හොර" තක්කඩියා අල්ලපු කාමරයට ගියේය.

රීතාට වාඩිවීමට සැලැස්වූ පාවෙල් ඇගේ කනට කොඳුරා මෙසේ පැවසීයඃ

"ඔයා මෙතන වාඩිවෙලා ඉන්න. මම අර කට්ටිය ගැන හොයා බලන්නම්."

රීතා ඔහු නැවැත්වූවායඃ

"ඔයා හැබෑටම උන් සමඟ පොරයට යනවද?"

"නැහැ. මම හණිකට එන්නම්" ඔහු ඇය සන්සුන් කළේය.

ජනේලය හැර පාවෙල් දුම්රිය මැදිරියෙන් වේදිකාවට පැන ගත්තේය. විනාඩි කීපයකින් ඔහු තමා ඉස්සර සේවය කළ පැරණි නායකයා වූ ප්‍රවාහන විශේෂ කමිටුවේ ප්‍රධානියා වන බ්‍රර්මෙයිෂ්ටර් ඉදිරියේ පෙනී සිටියේය. ලතීෆ් ජාතිකයකු වූ ඔහු පාවෙල්ගේ කතාවට සවන් දී, දුම්රිය මැදිරියේ සිටින සියලු මඟීන් ඉවත්කොට, ඔවුන්ගේ බලපත්‍ර සියල්ල යළි පරීක්ෂා කරන ලෙස අණ කළේය.

"මම කිව්වා නේද? දුම්රිය ස්ථානයට එන්නෙ කළුකඩකාරයන් පුරවාගෙනයි." බ්‍රර්මෙයිස්ටර් ගෙරවීය.

විශේෂ කමිටුවේ සෙබළු දස දෙනෙක් දුම්රිය මැදිරිය හිස් කළහ. පාවෙල් තම පැරණි පුරුද්ද අනුව මඟීන්ගේ සියලු බලපත්‍ර බැලීමට උදව් කළේය. විශේෂ කමිටුවේ සේවයෙන් පාවෙල් අස් වී ගියද, ඔහු තම පැරණි සගයන් සමඟ මිතුරු දම් අත්හළේ නැත. තරුණ කොමියුනිස්ට් සංගමයේ ශාඛා ලේකම්වරයකු ලෙස ක්‍රියා කළ පාවෙල්, ඉතා හොඳ තරුණ සාමාජිකයන් ප්‍රවාහන විශේෂ කමිටුවේ වැඩ සඳහා යැවීය. බලපත්‍ර පරීක්ෂා කිරීමෙන් පසු පාවෙල්, රීතා වෙත හැරී ආවේය. දැන් දුම්රිය මැදිරිය හාත්පසින්ම වෙනස් මඟීන්ගෙ න් පිරී ඇත. රාජකාරී කටයුතු සඳහා යන මිනිසුන්ගෙන් හා රතු සෙබළුන්ගෙනි.

ඉහළ පෙළෙහි තුන්වැනි කුටියේ රීතාට පමණක් ඉඩ

තිබිණි. අනික් හැම තැන ම පුවත්පත් මිටිවලින් පිරිලාය.

"කමක් නැහැ. කොහොම හරි යන්ට බැරිය" රීතා කීවාය.

දුම්රිය දුවන්නට පටන් ගත්තේය.

මලු ගොඩකට මැදි වී සිටින තරබාරු ගැහැනිය වාඩි වී සිටින සැටි දුවන දුම්රියේ කවුළුවෙන් පෙනිණි.

"මාන්කා මගේ තෙල් බඳුන කෝ?" ඈ කෑ ගැසුවාය.

පුවත්පත් මිටි නිසා අසල්වැසි මඟීන්ගෙන් වෙන් කළ කුටියේ මුල්ලක වාඩි වූ පාවෙල් සහ රීතා පාන් කෑල්ලක් සහ ඇපල් ගෙඩියක් බැගින් හපමින්, කොහෙත්ම සිනාසිය නොහැකි මැත සිද්ධිය මඳ සිනාපාමින් මතක් කළහ.

දුම්රිය සෙමින් දුවන්නට විය. පැරණි, කඩතොලු වුණු සහ වුවමනාවට වැඩිය මඟීන් පටවාගත් දුම්රිය මැදිරි හඬ නැඟීය. දුම්රිය, මාර්ගයේ හැම පූට්ටුවකදීම කම්පනය විය. හවස නිල් පැහැති අඳුර ජනේලයෙන් පෙනිණි. දුම්රිය අඳුරු පටලයක වෙළාගත් රැය පැමිණියේය. මැදිරිය තුළ කළුවරය.

විඩාපත් රීතා මල්ලට හිස තබාගෙන නිදි කිරා වැටුණාය. පාවෙල් කුටියේ එක් මුල්ලක වාඩිවී දෙපා වනමින් සිගරැට් උරන්නට විය. ඔහුද විඩාපත් වී සිටියද, වැතිර ගන්නට තැනක් නැත. රැයෙහි සිසිල් සුළං දුම්රිය කවුළුවෙන් මැදිරිය තුළට හමන්නට විය. දුම්රිය ගැස්සීම නිසා රීතා අවදි වුණාය. ඕ පාවෙල්ගේ සිගරැට්ටුවේ ගිනි සිළුව දුටුවාය. "ඔය විදිහට ඔහු එළිවන තුරු වාඩි වී හිටීවි. මට අවහිර කිරීමට ඔහු ලැහැස්ති නැති බව පැහැදිලියි." රීතා සිතුවාය.

"කෝර්චාගින් සහෝදරයා, ධනපති සිරිත් අතහැර දමනවා. වැතිර නිදාගන්නවා" ඈ සරදම් ලෙස කීවාය.

පාවෙල් ඈ අසලින් වැතිරගෙන, ඉමහත් සතුටකින් විඩාපත් දෙපා දිග හැරියේය.

"හෙට අපට වැඩ ගොඩක් තියෙනවා. සණ්ඩු කෙක්ක නිදගනින්." ඈ තම අතක් ඔහුගේ ගෙල වටා මිතුරු ලෙස යැවුවාය. ඇගේ හිසකේ අග ඔහුගේ කම්මුල්වල වැදිණි.

පාවෙල්ට රීතා ශුද්ධ වූ වස්තුවකි. ඈ ඔහුගේ මිතුරිය, සගයා හා දේශපාලන නායිකාවය. එහෙත්, ඒවා කෙසේ වුවද ඈ කාන්තාවකි. ඔහුට ඇගේ තත්ත්වය ගැන පළමුවැනි වරට තේරුණේ පාලම අසලදීය. ඈ ඔහුගේ ගෙළ වටා අත යැවීම නිසා ඔහු මෙතරම් කැලඹුණේ එබැවිනි. පාවෙල්ට ගැඹුරු ඒකාකාර ආශ්වාස ප්‍රශ්වාස කිරීමක් දැනිණි. ඇගේ දෙතොල් ඔහු අසලම ඇත. මේ සමීප බව නිසාම එම දෙතොල්

සෙවීමට ඔහු තුළ ඇතිවූයේ බලවත් ආසාවකි. ඔහු සිය අදිටන් බලය ගොනු කරගෙන එම ආසාව මැඩ ගත්තේය.

රීතා ඔහුගේ හැඟීම් දැනගත්තාක් සේ අඳුරේ වැතිර මඳ සිනා පෑවාය. රාගයේ ප්‍රීතිය හා වියෝවීමේ දුක ඈ එවකට විඳ ඇත්තීය. ඈ තම ආදරය බොල්ෂෙවික්වරුන් දෙදෙනෙකුට පුද කළා ය. ඔවුන් දෙදෙනාම ප්‍රතිවිප්ලවවාදී සුදු හමුදාවන්ගේ වෙඩි පහරවල් විසින් ඇගෙන් සොරා ගන්නා ලදි. එකෙක් නිර්භය යෝධයකු වූ අතර, බ්‍රිගේඩ් හමුදාවක අණ දෙන්නෙක් විය. අනිකා සුපැහැදිලි නෙත් ඇති තරුණයකු විය.

දුම්රියේ ගැටෙන රෝද විසින් නිකුත් කරන ලද හඬ පාවෙල් නිදි කරවීය. ඔහුව අවදි කර වූයේ පසුදා උදේ දුම්රියේ හූ හඬ විසිනි.

රීතා සිය කාමරයට එන්නේ රෑ බෝවූ පසුවය. ඉඳ හිට දිග හරින කොපි පොතෙහි තවත් කෙටි සටහන් කීපයක්ම ලියැවිණි:

අගෝස්තු 11 ද

ගුබේර්නියාවේ සාකච්ඡාව අවසන් විය. අකීම්, මිහයිලෝ සහ වෙනත් අය සමස්ත උක්රයීන සාකච්ඡාවට සහභාගි වීම සඳහා හාර්කොව් බලා පිටත් වූහ. කාර්මික අංශය මගේ කරපිට වැටිණි. දුබාවා සහ පාවෙල් ගුබේර්නියා කමිටුවේ නියෝජිත බලය ලැබූහ. පෙචෝර්ස්ක් දිස්ත්‍රික්කයේ කොම්සොමොල් සංවිධානයේ ලේකම් හැටියට දිමීත්‍රි දුබාවා පත්කොට යැවූ ද සිට ඔහු අධ්‍යාපන කටයුතුවලට නොපැමිණෙයි. ඔහුට වැඩ ගොඩක් පවරා ඇත. පාවෙල් සමහර අවස්ථාවලදී ඉගෙනීමට තැත් කළද, මට ඒ සඳහා කාල වේලාවක් නැත, නැතිනම් ඔහු වෙනත් කටයුතු සඳහා පිටත් කර යැවීය. දුම්රිය මාර්ගවල තත්ත්වය උග්‍රවීම නිසා ඔවුන් නිතර කැඳවා ඇත. ෂාර්කී ඊයේ මා බැලීමට ආවේය. ඔහු ළඟ වැඩ කළ තරුණයන් අප සංවිධානයට ගැනීම නිසා ඔහු අසතුට පළ කරන අතර, ඔවුන් ඔහුට ඉතා අවශ්‍ය බව කියයි.

අගෝස්තු 23 ද

අද මම කාර්යාලයේ කොරිඩෝරය දිගේ යමින් සිටියෙමි. කළමනාකරුගේ කාමරයේ දොරටු අසලදීම මම පන්ක්‍රාතොව්, කොර්චාගින් හා තවත් නාඳුනන පුද්ගලයකු දුටිමි. කොර්චාගින් යමක් කියන සැටි මට ඇසිණි: "එතැන ඉන්නෙ හරි ජාති එවුන්. වෙඩි තිබ්බත් දුකක් නැහැ. දැවදඬු සැපයීම පිළිබඳ

කමිටුව[1] තමා මෙතන බලධාරියා. කොම්සොමොල් කමිටුවට ඇඟිලි ගැහීමට ඉඩ නැහැ. සෝයුරනි, උගේ හොම්බ තමා හොම්බ... ඔන්න පරපෝෂිතයෝ බෝවෙලා ඉන්න තැන!..” ඒ සමඟම කොර්චාගින් තිත්ත කුණු හරුපවලින් බැණ වදින සැටි මට ඇසිණි. මා දුටු පන්ක්‍රාතොව් ඒ බව අඟවමින් කොර්චාගින් තල්ලු කළේය. හැරී බලන ඔහු මා දැක සුදුමැලි විය. මගේ දෙනෙතට නොපෙනී ඔහු, පලා ගියේය. දැන් ඉතින් බොහෝ කලකට මම ඔහු නොදකිමි. නොසරුප් බසින් බැණ වදින අයට මා සමාව නොදෙන බව ඔහු දනී.

අගෝස්තු 27

බියුරෝ මණ්ඩලයේ රහස් සාකච්ඡාවක් පැවැත්විණි. තත්ත්වය අසීරුවෙන්නට පටන් ගෙන ඇත. හැම දෙයක් ගැනම සම්පූර්ණයෙන් ලිවීමට දැන් පුළුවන්කමක් නැත. උයෙස්ද්වල සිට අකීම් පැමිණියේ කනස්සල්ලකිනි. ඊයේ තේතෙරෙවො අසලදී ආහාර දුම්රියක් පීලි පන්නා තිබිණි. මේ දිනපොත දිගටම ලිවීමට පුළුවන්කමක් නැති හැඩයි. මෙය ආවාට - ගියාට ලියා ඇත. පාවෙල් කොර්චාගින් බලාපොරොත්තුවෙන් සිටිමි. ඔහු හමුවීමි, ඔහු සහ ෂාර්කී ‘පස් දෙනෙකුගේ කොමියුනයක්’ සංවිධානය කරන බව දැනගන්නට ලැබිණි.

★

දුම්රිය මාර්ග වැඩපොළේදී පාවෙල් කොර්චාගින් ටෙලිෆෝනයට අඬ ගැසුවේය. තමාට අද සවස වෙනත් වැඩක් නැති බවත්, “පැරිස් කොමියුනයේ පරාජයට හේතු” නමැති පරිච්ඡේදය අද කියවා ඉගෙන ගත හැකි බවත් රීතා ඔහුට ටෙලිෆෝනය මගින් දැන්වූවාය.

හවස රීතා පදිංචිව සිටින ක්‍රැග්ලො - උනිවෙර්සිටේට්ස්කි වීදියේ ගොඩනැගිල්ලට ළං වී පාවෙල් ඒ දෙස බැලීය. රීතා පදිංචි වී සිටින කාමරයේ පැහැදිලි ආලෝකයකි. හැමදා මෙන්ම පුරුදු පරිදි ඔහු පියගැට පෙළ දිගේ දුව ගොස් දොරට වරක් තට්ටු කොට, පිළිතුරු බලාපොරොත්තු නොවී කාමරය තුළට ගියේය.

ඔහු දන්නා තරුණයන් කිසිවකුට වාඩිවීමට පවා තහනම් ඇඳෙහි යුද ඇඳුමකින් සැරසුණු මිනිහෙක් වැතිර

1 දැවදඬු සැපයීම පිළිබඳ කමිටුව - දුම්රිය මාර්ගය සඳහා දැවදඬු සැපයීමේ සංවිධානය

සිටියේය. පිස්තෝලය, සෙබළ මල්ල, රතු තරුවක් සහිත සෙබළ තොප්පිය මේසය මත තිබිණි. රීතා ඔහු බදාගෙන සිටියාය. ඔවුහු ඉමහත් උනන්දුවකින් සාකච්ඡා කළහ... රීතා සොම්නසින් පිරි තම වත පාවෙල් දෙසට හැරවීය.

වැලඳ ගැනීමෙන් යුද සෙබළා මිදී නැගිට සිටියේය. පාවෙල්ට අත දුන් රීතා මෙසේ කීවාය. "අඳුනා ගනින්, මේ..."

"දවීද් උස්තිනෝව්චි" කොර්චාගින්ගේ අත ගෙන උණුසුම් ලෙස ආචාර කරමින් යුද සෙබළා පැවසීය.

"මෙයාගේ පැමිණීම කොහෙත්ම බලාපොරොත්තු වුණේ නැහැ." රීතා සිනාසුණාය.

පාවෙල් කිසිදු උණුසුම් බවකින් තොරව, අමුත්තාට ආචාර කරමින් අත දුන්නේය. කටින් පිට නොවූ අමනාපය රත් පැහැගත් නෙතින් පෙනිණි. දවීද් උස්තිනෝව්චි හට කණ්ඩායමක අණ දෙන්නකු බව කියැවෙන සංඥා ලකුණු ඔහුගේ සෙබළ කබායේ ඇති බව දැක ගැනීමට පාවෙල් සමත් විය.

රීතා කිසිවක් කීමට තැත් කළද, ඔහු එයට බාධා කළේය.

"මම දුවගෙන ආවෙ අද හවස මම රේගුවේ ලී පටවන බව කියන්ටයි. මා බලාපොරොත්තු වෙන්ට එපා... ඔබ බැලීමට අමුත්තකු ඇවිල්ලා ඉන්නවා. අපේ කට්ටිය මා එනතුරු පහළ බලාගෙන ඉන්නවා."

පාවෙල් හිටිහැටියේ පෙනී හිටියාක් මෙන්ම, හිටිහැටියේ අතුරුදහන් විය. ඔහු පියගැට පෙළ දිගේ බසින හැටිද, දොර හැර වැසෙන හැටිද ඇසිණි. අනතුරුව නිහඬතාවකි.

"ඔහුට මොනවා හරි සිදු වෙලා වගෙයි." සිදු වූ දෙය වටහා ගැනීමට බැරිව බලා සිටින දවීද්ට, රීතා පැකිළෙමින් පැවසුවාය.

පහළ පාලම යට ගැඹුරු ලෙස ආශ්වාස කරන්නාක් මෙන් වාෂ්ප දුම්රිය රත් පැහැති කුඩා ගිනි කැට පිට කළේය. ඒවා නැටුමක් නටන්නාක් මෙන් ඉහළ ගොස් බැස නිවී ගියේය.

පාවෙල් යකඩ වැටට හේත්තු වී ස්විච් යතුරු දෙසත්, ඉඟි බිඟි පාන්නා සේ වරෙක පත්තු වී වරෙක නිවෙන ආලෝකය දෙසත් බැලීය. ඔහු දෙනෙත් මිරිකෙන සේ තදින් වසා ගත්තේය.

"රීතාට ස්වාමිපුරුෂයකු සිටීම ගැන දැනගන්නට ලැබීම නිසා කොර්චාගින් සහෝදරයා තමුසෙට ඇති රුදාව මොක ද?"පාවෙල් කොර්චාගින් තමාගෙන්ම ප්‍රශ්න කළේය. "අනේ,

හැබෑටම රීතා කවදාහරි කීවද ඇයට ස්වාමිපුරුෂයකු නැතැයි කියලා. එහෙම කීවා වුණත්, ඒකෙ ඇති තේරුම කුමක්ද? මොකද ඒ නිසා නුඹට ඇතිවුණ රුදාව? ඉතින් ආදරණීය සහෝදරයා නුඹම, එය අදහස් හා මත අනුව පමණක් ඇති වූ උත්තරීතර මිත්‍රත්වයක් කියලා සිතුවා නේද?.. නුඹ මේ වගේ හැඟීමකට ඉඩක් තැබුවේ කොහොමද? ආ" ඔහු තමාගෙන් දිගටම ප්‍රශ්න කළේ ව්‍යාජෝක්තියකිනිඃ "ඔහු ඇගේ ස්වාමිපුරුෂයා නොවේ නම්? දවීද් උස්තිනෝවිච් ඇගේ අයියා හරි, මාමා හරි වෙන්ට පුළුවනි... එහෙම නම් නුඹ මෝඩයෙක්, නුඹ ඇය නිරපරාදේ අමනාපයට පත් කළා. එහෙම නම් නුඹ වෙනත් ඕනෑම එකකු වගේ වල් ඌරකු හැටියට කටයුතු කර තියෙනවා. ඇගේ අයියාද, නැතිද කියල දැනගන්ට පුළුවනි. නුඹේ ඔය හැසිරීමෙන් පසු, ඔහු හැබෑටම ඇගේ අයියා කෙනෙකු හරි මාමා කෙනෙකු හරි බව දැනගන්නට ලැබුණා නම්, ඇයට මුහුණ දෙන්නේ කොහොමද? නැහැ. නුඹ ඇය හමුවීමට කිසිමදක යන්නෙ නැහැ!"

ඔහුගේ සිතීම් වැලට දුම්රිය ඇන්ජිමේ හූ හඬ බාධා කළේය.

"පමා වුණා, ගෙදර යන්ට ඕන. පිස්සු, විකාර ගැන හිතුවා මදෑ."

★

දුම්රිය කම්කරුවන් ජීවත්වන පළාතක් වූ සලෝමෙන්කාහි පස්දෙනෙකු විසින් කුඩා කොමියුනයක් සාදන ලදී. ෂාර්කී, පාවෙල්, රන් පැහැති හිසකේ ඇති, ප්‍රීතිමත් චෙක් ජාතියෙකු වූ ක්ලාවිචෙක්, දුම්රිය ඩිපෝවේ කොම්සොමොල් සංවිධානයේ ලේකම්වර ඕකුන්යෙව් නිකොලායි, බොයිලේරු කම්කරුවකු වූ දැන් දුම්රිය විශේෂ කමිටුවේ වැඩ කරන ස්ත්‍යෝපා අර්ට්යූ හින්ද වූහ.

ඔවුහු කාමරයක් සොයාගත්හ. තම රැකියාවලින් පසුව විත්, තෙදිනක් තිස්සේ එය පිරිසිදු කොට, බිත්තිවලට හුනු ගා, දොර ජනේලවලට තීන්ත ගා පිළියෙල කළහ. අසල ළිඳෙන් ඔවුන් කොතරම් වතුර ගෙන ගියේද යත්, ඔවුන්ගේ කාමරය ගිනි ගෙන ඇතැයි අසල්වැසියෝ සිතූහ. අනතුරුව ඔවුහු ලී ඇඳන් සාදා ගත්හ. උද්‍යානයේ ක්ලෝන[1] නමැති ගස්වල කොළවලින් පිරවූ මෙට්ට පිළියෙල කර ගත්හ. හතර වැනි

1 ඉංග්‍රීසියෙන් මෙය මේපල් යයි හැඳින්වේ.

දවසේදී පෙත්රොව්ස්කිගේ පින්තූරයක් හා බිත්තියේ එල්ලූ විශාල සිතියමක් සහිතව කාමරය සුදු පැහැයෙන් දිලිසිණි.

කවුළු දෙක අතර අල්මාරියක් පුරවා පොත් ගොඩක් විය. කාඩ්බෝඩ් ගසා පිළියෙල කළ පෙට්ටි දෙකක් පුටු හැටියට පාවිච්චි කෙරිණි. ලොකු පකිස්පෙට්ටියක් ඔවුන්ගේ ඇඳුම් තබන අල්මාරිය විය. කාමරය මැද රෙදි කවරය රහිත විශාල බිලියඩ් මේසයකි. ර්ගුවේ සිට කොමියුනයේ සාමාජිකයන් විසින් කරින් ගෙනෙන ලද එය දහවල් කාලයේදී මේසය හැටියට ද, රෑ වූ පසු ක්ලාව්චෙක්ගේ නිදන ඇඳ හැටියටද පාවිච්චි කළේය. කොමියුනයේ සාමාජිකයෝ පස්දෙනා තමන් සතු සියලු ධනය කොමියුනයට භාර දුන්හ. ප්‍රායෝගි ක බුද්ධියක් ඇති ක්ලාව්චෙක් කොමියුනය සතු ධනය විස්තර සහිතව ලියුවේය. ඔහු එම සටහන බිත්තියේ එල්ලීමට සූදනම් වුණු විට, අනික් අයගේ ඒකමතික විරුද්ධත්වය නිසා ඔහුට සිය මතය වෙනස් කර ගැනීමට සිදුවිය. කොමියුනයේ හැම දෙයක්ම පොදු දේපොළ විය. වැටුප්, ආහාර සලාකය, අහම්බෙන් ලැබෙන ආහාර ආදී හැම දෙයක්ම සමාන ලෙස පස්දෙනා අතර බෙදීය. ඔවුන්ගේ එකම පෞද්ගලික දේපොළ වූයේ තුවක්කු සහ අවි පමණකි. පොදු අයිතියේ නීතිය උල්ලංඝනය කරන හැම සාමාජිකයකුමද, සහෝදරවරුන්ගේ විශ්වාසය කඩ කළ හැම සාමාජිකයකු ම ද කොමියුනයෙන් පන්නා දැමීමට ඔවුහු ඒකමතික තීරණය කළහ. එවැන්නන් පමණක් නොව, කාමරයෙන්ද දොට්ට දැමිය යුතු බව ඕකුන්යෙව් සහ ක්ලාව්චෙක් තරයේ කියා සිටියහ. එයද ස්ථිර විය.

කොමියුනය විවෘත කිරීමේ උත්සවයට ප්‍රාදේශීය කොම්සොමොල් සංවිධානයේ සාමාජිකයෝද සහභාගි වූහ. අල්ලපු ගෙදරින් යෝධ සමොවාරයක් ගෙන අමුත්තන්ට තේ පැන්වලින් සංග්‍රහ කළහ. මේ හේතුව නිසා කොමියුනය සතු මුළු සැකරින් තොගය එදින ඉවර විය. අමුත්තෝ වහලෙහි උළු විසිවන තරම් ප්‍රබල හඬකින් ගී ගැයූහ,

මිහිතලය කඳුළින් තෙත් වී
දුකින් පිරී ශ්‍රමයෙන් අප ජීවිත ගෙවී යයි.
එසේ වුවද හිරු එළිය බබළනවා සත්තකයි...

ගායක කණ්ඩායමේ නායිකාව වශයෙන් ක්‍රියා කළේ

තාල්යා ලගුටිනාය. ඇගේ හිස බැඳි රතු ලේන්සුව යම්තමින් ඇලවෙලාය. ඇගේ දෙනෙත් මුරණ්ඩු කොල්ලකුගේ මෙනි. ඒවාට කිට්ටු වී බැලීමට තවමත් කිසිවකු සමත් නොවීය. තාල්යා ලගුටිනා සිනාසෙන්නේ අන් අයද සිනස්වමිනි. දහඅට හැවිරිදි ඇය ලෝකය දෙස බැලුවේ මහත් වූ යෞවන උද්යෝගයකිනි. ඇය අතක් ඔසවත්ම ගායකයෝ මහ හඬින් ගී ගැයූහ,

මුහුද ගලන්නා සේ අපේ ගීතය ලොව පුරවයි
ධජය අපේ ලොව මුදුනේ ලෙළදෙයි
දීප්තිමත්ව බැබළෙන එය මිහිතලය එළිය කරයි
අපේ රුධිරය උණුසුම් ජීවය ලබාගනී...

අමුත්තෝ රෑ බෝ වූ පසු විසිර ගියහ. ඔවුන්ගේ කතා නිසා නිහඬ වීදි අවදි වූවාක් මෙන් විය.

★

ෂාර්කි ටෙලිෆෝනය අතට ගත්තේය.

"කොල්ලනේ නිහඬ වෙයල්ලා, මට කිසිවක් ඇහෙන්නෙ නැහැ!" ලේකම් තැනගේ කාර්යාල කාමරයට වැදී කෑ කෝ ගහන කොම්සොමොල් සාමාජිකයන්ගේ ගාලගෝට්ටිය නවත්වනු වස් ඔහු කීය.

කෑ ගැසීම තරමක් සන්සිඳිණි.

"මමයි, කතා කරන්නෙ. ඒ නුඹද? ඔව්, දැන්ම න්‍යාය පත්‍රය ගැනද? පරණ කාරියමද?, රේගුවේ ඉඳලා දැව දඬු ගෙන ඒමද? මොනවද? නැහැ. ඔහුව කොහේවත් යැව්වේ නැහැ. ඔහු මෙතන අඬ ගහන්ටද? හොඳයි."

ෂාර්කි, කොර්චාගින්ට ඇඟිල්ලකින් සංඥා කළේය.

"නුඹට උස්තිනෝව්චි සහෝදරිය කතා කරනවා." ෂාර්කි ඔහුට ටෙලිෆෝනය දුන්නේය.

"මම හිතුවේ නුඹ නැතැයි කියලා. අද හවස මට වැඩක් නැහැ. මගේ අයියා ඊයේ දුම්රියෙන් යන ගමන් මා බැලීමට ආවා. අපි දෙන්නා අවුරුදු දෙකකට පස්සෙ මුණ ගැසුණා. මා හමුවීමට වරෙන්."

අයියා!

පාවෙල්ට ඇගේ වචන නෑසිණි. එදින හවස ගැනද, පාලම අසල වූ වැටට හේත්තු වී කල්පනා කළ දේ ගැනද ඔහුට

මතක් විය. අදම මා ඇය හමුවීමට ගොස් මේ කටයුත්ත නිමාවට පත් කළ යුතුය. ආලය බොහෝ කැලඹීම හා වේදනා ගෙන දෙයි. ආලය ගැන කිව යුතු වේලාව මෙයද? ටෙලිෆෝනය කතා කරයි.

"නුඹට මාව ඇහෙන්නෙ නැතිද?"

"නැහැ. නැහැ. මට ඇහෙනවා. හොඳයි. බියුරෝ රැස්වීමෙන් පස්සෙ එන්නම්." ඔහු රිසිවරය තැබීය.

★

ඔහු කෙළින්ම ඇගේ නෙත් දෙස බැලීය. ඕක් ලීයෙන් කළ මේසයේ කොනක් දැඩි ලෙස අල්ලා ගත් ඔහු මෙසේ පැවසීය:

"මට මීට පස්සෙ නුඹ ළඟට එන්ට වේලාවක් නැති හැඩයි."

ඇගේ සනැති බැම සඟල හැකිළෙන සැටි, කතා කරන ඔහුට පෙනිණි. පැන්සලයකින් අකුරු ලියමින් සිටි ඇගේ අත නැවැතිණි. අතැති පැන්සලය පොත මත එක තැන රැඳී ඇත.

"මොකද?"

"වේලාවක් ලබා ගැනීම වැඩි වැඩියෙන් අමාරු වෙනවා. අපට ඉතාම කලබල කාලයක් ඇතිවෙලා තියෙන බව නුඹම දන්නවා. කනගාටුයි. නමුත්, සිද්ද වෙනවා කල් දමන්නට..."

තමාගේ කටින් පිට වූ අවසාන වචන ඇසුණු පාවෙල්ට ඒවායේ අස්ථිර භාවය ගැන දැනිණි.

"ඇති දේ ඇති හැටියට නොකියා වටේට කැරකැවෙන්නේ මොකටද? එක එල්ලේම හදවතට පහර ගැසීමට තරම් නුඹට දහිරියක් නැතිද?"

පාවෙල්ට එලෙස සිතුණද, ඔහු දැඩි ලෙස දිගටම කතා කළේය:

"ඒ හැර, නුඹව මට තේරුම් ගැනීමට අමාරු බව මම කියන්නට හිතා ගෙන හිටියා. සෙගාල් සහෝදරයා සමඟ ඉගෙන ගත්තු දවස්වල, ඒ පාඩම් මට අමතක වුණේ නැහැ. නුඹගෙන් පාඩම් අසා ගත්තායින් පස්සේ තෝකරෙව් සහෝදරය, ළඟට ගිහිල්ලා මට ඒවා නැවත පැහැදිලි කර ගන්නට සිදු වුණා. මගේ මොළයට අවබෝධ කර ගැනීමට ශක්තියක් නැහැ. මට වඩා මොළය ඇති සිසුවකු නුඹ හොයා ගනින්."

ඇගේ සැලකිලිමත් නිරීක්ෂණයෙන් බේරෙනු වස් ඔහු හැරුණේය.

ඔහු යළිත් තරුණිය වෙත පැමිණීම කඩා බිඳ දමමින්, මුරණ්ඩු ලෙස කතා කළේය:

"ඉතින් දිගින් දිගටම අපි පාඩම් කිරීම කාලය නාස්ති කිරීමකි."

නැගිට සිට, ප්‍රවේසමින් පුටුව කකුලකින් මෑත්කොට, ඉදිරියට නැඹුරු වී ඇති හිස දෙසද, පහන් එළිය නිසා සුදුමැලි වී ඇති ඇගේ මුහුණ දෙසද ඔහු බැලීය. ඔහු හිස්වැස්ම දමා ගත්තේය.

"ඉතින් රීතා සහෝදරිය සමු ගනිමු, ආයුබෝවන්! නුඹේ කාලය අපතේ යැවීම ගැන මට බොහොම කනගාටුයි. එක වරම මා ඒ ගැන කිව යුතුව තිබුණා. ඇත්තටම ඒක මගේ වරද."

රීතා යාන්ත්‍රික ලෙස අතට අත දුන්නාය. බලාපොරොත්තු රහිත ඔහුගේ දැඩි බව නිසා මවිතයට පත් වූ ඇයට කීමට පුළුවන් වූයේ මෙපමණකි:

"පාවෙල්, මා නුඹ පිට වරද පටවන්නෙ නැහැ. නුඹට හරිහැටි තේරෙන විදිහට පාඩම් පිළියෙල කිරීමට මට බැරිවීම නිසා නුඹේ දෙස් පැවරීම යුක්ති සහගතයි."

පාවෙල් පා අද්දන්නාක් මෙන් පිටවිය. නිහඬව දෙර වැසීය. දෙරකඩ අසල ඔහු නැවතුණේය. ආපසු ගොස් විස්තර කිරීමට පමා වී නැත... කුමක් සඳහාද? අවඥා සහගත වචන නමැති පහර කම්මුල හරහා වදින සැටි බලා, නැවත දෙරකඩට පැමිණෙන්ටද? නැත!

★

දුම්රියපොළ අවට පෙදෙසේ දිරාපත්වුණු දුම්රිය මැදිරි සහ කබල් වුණු දුම්රිය ඇන්ජිම ඇති පෙදෙස සොහොන් බිමක් වැනිය. හිස් වූ දැවදඬු මඩුවල වියළි ලී කුඩු හැම තැනම පතුරුවා හරිමින් සුළං හැමීය.

නගරය වටේද, මහ කැලෑවලද, ගැඹුරු අගාධවලද, ඕර්ලික්ගේ පල්හොරු රංචුව ඇවිද්දේය. දහවල් කාලයේදී ඔවුහු ගම්මානවල හෝ කැලෑවෙහි මීමැස්සන් ඇති කරන පොහොසත් ගොවීන් ළඟ හෝ සැඟවී සිට, රැයෙහි දුම්රිය මඟට වැද එහි ඇති හැම දෙයක්ම බිහිසුණු ලෙස සුනු විසුනු කොට, කඩා බිඳ දමා යළි තම ගුහාවලට වැද සැඟවුණහ.

පල්හොරු නිතර රේල්පීලිවලින් දුම්රිය පන්නමින් වානේ ඇන්ජින් යන්ත්‍ර විනාශ කර දැමූහ. නිදියමින් සිටින මිනිසුන්

සහිත දුම්රිය මැදිරි ගෙම්බන් පොඩි කරන්නාක් මෙන් තළා පොඩි කර දැමූහ. ඉතා වටිනා ධාන්‍ය, වැලි සහ ලේ සමඟ මිශ්‍ර විය.

බියගත් කිකිළියන් පාරවල් පුරා එළවා දමමින්, පල්හොරු රංචුව හිටිහැටියෙම හුදෙකලා කුඩා නගරයකට කඩා වදිති. ඉඳහිට කීපවරක් වෙඩි තැබීය. වෝලොස්ට් සෝවියට් සභා ගොඩනැගිල්ල අසල, වියළි දර කෝටු පයට පෑගෙන විට, නැගෙන හඬට සමාන හඬක් නගන රයිපල් වෙඩි ඇසෙයි. අනතුරුව පල්හොරු රංචුව හොඳ ආහාරවලින් උදර පුරවාගෙන සිටින අසුන් පිට නැගී ගම හැම තැන ම දුවමින් තමන්ට එදිරිව නැගී සිටින හැම එකකුම කපති. දර පළන්නාක් මෙන් ඔවුහු තම සතුරන් කපා පොලු ගසති. පතොරොම් පරෙස්සම් කර ගැනීම පිණිස ඔවුන් වෙඩි තැබුවේ කලාතුරකිනි.

ඔවුහු වේගයෙන් පැමිණියාක් මෙන්ම, වේගයෙන් අතුරුදහන් වූහ. මේ පල්හොරු රංචුවට හැම තැනම තම තමන්ගේ ඇස් හා තමන්ගේ කන් තිබිණි. ඔත්තු බලන එම ඇස් විසින් වෝලොස්ට් සෝවියට් සභා ගොඩනැගිල්ල තුළ කෙරෙන වැඩ කටයුතු සොයා බලනු ලබන අතර, පූජකයාගේ ගෙදර සහ ඉඩම් හිමි පොහොසත් කුලාකයාගේ ගෙදර සිට කැලෑවේ හොර රංචුවේ විමන දක්වා අදිසි පණිවුඩ මඟකි. මූනිස්සම්, පතොරොම් ආදිය පෙට්ටි ගණනින්ද, ප්‍රණීත ඌරු මස් ගාත් පිටින්ද, නිල් පැහැති මත්පැන් සහිත බෝතල් ද එමඟ ඔස්සේ යැවිණි. පුංචි අටමානයන්ගේ කනට කොඳුරා කියන පුවත් හා තොරතුරු, අවසානයේදී අතිශය සංකීර්ණ මඟක් ඔස්සේ මහා අටමානයා වන ඕර්ලික්ගේ කනෙහි වැකිණි.

මේ පල්හොරු රංචුව බෙලි කපන්නන් දෙතුන් සියයකට වඩා වැඩි නොවූවද, උන් අල්ලා ගැනීම කළ නොහැකි විය. කාණ්ඩ කීපයකට කට්ටි ගැසෙන ඔවුහු දිස්ත්‍රික්ක දෙක තුනක එකවර ක්‍රියාකාරී වෙති. ඔවුන් හැම දෙනෙකුව ම අල්ලා ගැනීම නොකළ හැක්කකි. රැයෙහි පල්හොරකු ලෙස සැහැසිකම් කරන ඔහු දිවා කාලයේදී තම ගෙවත්තේ ගොවිතැන් කරන සාමකාමී ගොවියෙකි. ඔහු අසුට කොල්ලු කවයි. නැතිනම් ගෙවත්තේ බංකුවක වාඩි වී දුම් කෝවයෙන් දුම් බොමින්, යන එන රතු අසරු හමුද දෙස ඇස් කොනින් බලයි.

නින්ද හා විවේකය රහිතව, දිස්ත්‍රික්ක තුනේ සිටි පල්හොරුන්ට විරුද්ධව රෙජිමේන්තු භාර අලෙක්සාන්දර් පුසිරේව්ස්කි ඉමහත් පරිශ්‍රමයකින් දැඩි ලෙස ක්‍රියා කළේය. සතුරා ලුහුබැඳ යාමේදී අප්‍රතිහත ධෛර්යයක් පෙන්වන ඔහු සමහර දවස්වලදී පල්හොරු රංචුවේ වලිගය අල්ලා ගැනීමට සමත් වෙයි. මසකට පසුව දිස්ත්‍රික්ක දෙකකින් පසුබැසීමට ඕර්ලික්ට සිදු විය. ඔහුගේ සහාසික ක්‍රියා පටු බිම් තීරයකට සීමා විය.

★

නගරයේ ජන ජීවිතය පුරුදු පරිදි ගෙවිණි. ජනතාව කෑ කෝ ගසමින් නගරයේ ඇති වෙළෙඳ පොළවල් පහට රොක්වූහ. ජනතාව මත පෑ සීමාන්ත දෙකකි. එකක් හැකි තරම් වැඩි මිලක් ලබා ගැනීමය. අනික හැකි තරම් අඩු මිලක් දීමය. කූට ප්‍රයෝගකාරින්ට සහ මංකොල්ලකාරි වෙළෙන්දන්ට තම දස්කම් හා හැකියාවන් පෙන්වීමට මේ වටපිටාව සීමා රහිත ඉඩකඩක් ලබා දුන්නේය. බලුමැක්කන් සේ ඔවුහු සිය ගණනක් ඇස්වලින් රැස්ව සිටි මිනිසුන් දෙස බැලූහ. එම බැලුම්වල අවංක බව හැර අන් හැම දෙයක්ම තිබිණි. නගරබද හැම පාදඩයකුම මෙතැනට එකතු වූයේ ගොම ගොඩකට වසන නිලමැස්සන් මෙනි. ඔවුන්ගේ එක ම බලාපොරොත්තුව වූයේ පහසුවෙන් රැවටෙන නවකයන් "අමාරුවේ" දැමීමය. ඉඳහිට මෙහි එන දුම්රිය විසින් මලු හා මිටි රැගත් මිනිසුන් පිටකරන ලදි. ඔවුහු වහාම බඩු පොදිත් රැගෙන වෙළඳ පොළ බලා පා නැඟූහ.

රෑ වන විට වෙළඳ පොළ හිස් විය. එහි වූ කඩ හා මඩු පෙළ පාපකාරී තර්ජනාත්මක ස්වරූපයක් පෑවේය.

හවස් වූ පසු ජනයා රහිත මේ කඩ පෙළට ආවේ නිර්භය මිනිහකු පමණකි. හැම කඩයකින්ම අවදනමක් එල්ල විය හැකිය. ඉඳහිට නොවූවද, මෙහිදී පිස්තෝලයකින් පිටවන වෙඩි හඬ නිසා යකඩයකට ගසන මිටි පහරකට සමාන හඬක් පිටවෙයි. කිසිවකුගේ ගෙල කපා දමනු ඇත. අහල පහල ස්ථානවලින් මිලීෂියා භටයන් එතැනට එන විට (ඔවුහු තනිවම නොගියහ) විකෘති කළ මළ සිරුරු හැර අන් කිසිවෙකු එහි නැත. මිනීමරුවන් පැන ගොසිනි. එම කඩ අගුපිල්වල රැය ගත කරන්නෝද සෝෂාව නිසා කුණාටුවකට හසු වූ කලෙක මෙන් අතුරුදහන් වෙත්. කඩපොළ ඉදිරිපස

'ඕරිඹන්' නමැති සිනමාහලය. මහමගද වේදිකාවද විදුලි ආලෝකයෙන් නැවී ඇත. එතැන ජනයා රැස් කති.

සිනමාහල තුළ චිත්‍රපටි පෙන්වන යන්ත්‍රය ක්‍රියා කාරී විය. අවාසනාවන්ත ආදරවන්තයෝ සිනමා තිරයේ එකිනෙකා මරමින් රඟපෑහ. ඉඳ හිට චිත්‍රපටිය කැඩී ගියෙන්, නරඹන්නෝ හූ හඬ නඟමින් කෑගැසූහ. නගරයේ මැද හා නගරාසන්න පෙදෙස්වල ජීවිතය සාමාන්‍ය අන්දමට ගෙවෙන්නට පටන් ගෙන ඇත. විප්ලවීය බලයේ මර්මස්ථානය වූ ගුබේර්නියා කමිටුවේ පවා සියලු වැඩ කටයුතු සාමාන්‍ය අන්දමට කෙරිණි. එහෙත්, මෙය හුදෙක් පිටත්තර සන්සුන් බවක් පමණකි.

නගරය තුළ කුණාටුවක් මෝරා වැඩෙන්නට පටන් ගති.

රයිපල් තුවක්කු යම්තමින් පෙනෙන, නොපෙනෙන සේ ගොවීන්ගේ දිගැති උඩු කබා යට සඟවාගෙන නොයෙක් දිසාවලින් නගරයට පැමිණි අය පවා ඒ ගැන දැන සිටියහ. ආහාර කළු කඩයට ගෙනගොස් විකුණන ජාවාරම්කාරයන් මෙන් මලු රැගෙන දුම්රිය වහලවල නැගී නගරයට පැමිණි අයද, එම කුණාටුව ගැන දැන සිටියහ. එහෙත්, ඔවුහු සැබැවින්ම ආහාර මලු වෙළඳ පොළට නොගෙන ගිය නමුදු ඉතා ඕනෑකමින් කටපාඩම් කරගත් ලිපිනවලට ඒවා ගෙන ගියහ.

මොවුන් ඒ ගැන දැන සිටියද, කම්කරු ජනපද හා බොල්ෂෙවික්වරු පවා ඒ තර්ජනාත්මක සිද්ධීන් ගැන නොදත්හ.

මේ කුමන්ත්‍රණය පිළිබඳ සියලු තොරතුරු දැනසිටි බොල්ෂෙවික්වරු පස්දෙනෙක් පමණක් නගරයේ සිටියහ.

ප්‍රතිවිප්ලවවාදී සුදු පෝලන්තයට රතු හමුදාව විසින් පන්නා දමනු ලැබූ පෙත්ල්යූරා හමුදාවේ නටබුන්, වෝසෝ නගරයේ විදේශීය තානාපති සේවකයන්ගේ ඉතා කිට්ටු සහයෝගීතාවය ඇතිව කැරැලිවලට සහභාගි වීමට සූදානම් විය.

පෙත්ල්යුරාගේ රෙජිමේන්තු හමුදාවලින් ඉතිරිවූ නටබුන් එකතු කොට රහසේ ප්‍රහාරක කණ්ඩායම් සෑදූහ.

ෂෙපෙතෝව්කා නගරයේ කැරැලිකාර මධ්‍යම කමිටුවටද තම සංවිධානයක් තිබිණි. එය පුද්ගලයන් හතළිස්හත් දෙනෙකුගෙන් සමන්විත විය. මොවුන්ගෙන් වැඩි දෙනා ප්‍රතිවිප්ලවවාදීන් වූ අතර, නගරයේ විශේෂ කමිටුව හෙවත් 'චෙකා'ව ඔවුන් කෙරෙහි විශ්වාසය තබා ඔවුන්ට නිදැල්ලේ හැසිරීමට ඉඩ දුන්නේය.

මේ සංවිධානයේ නායකයන් වූයේ වසීලි පූජකයාත්, සේනාවක කොඩිකාර නිලමේ ධුරය දැරූ වින්නික් සහ පෙත්ල්යූරාගේ හමුදාවේ නිලධාරියකු වන කුස්මෙන්කොත්ය. පූජකයාගේ දූවරුත්, වින්නික්ගේ පියා සහ මල්ලීත්, සෝවියට් කෘත්‍යාධිකාරී කමිටුවක කළමනාකාර ධුරයක් දැරූ සමෝතියා නමැති මිනිහකුත් ඔත්තු බැලූහ.

කැරැලි ගසන රැයෙහිදී දේශ සීමාවේ ඇති විශේෂ දෙපාර්තමේන්තුවට අත් බෝම්බවලින් ගසා සියලු හිරකරුවන් මුදාහැර, හැකි වුවහොත් දුම්රිය ස්ථානය අල්ලා ගැනීමට සැලැස්ම පිළියෙල කර තිබිණි.

අනාගත කැරැල්ලේ මධ්‍යස්ථානය විය යුතු ලොකු නගරයේ ඉතා රහසි ගත ලෙස පෙර පැවැති ප්‍රතිවිප්ලවවාදී හමුදාවල නිලධාරීහු රොක්වූහ. නගරාසන්න කැලෑවලට පල්හොරු කණ්ඩායම් පැමිණ සූදානම් වූහ. මෙතැන සිට විශ්වාසවන්ත 'ඒජන්තවරුන්ගේ' මාර්ගයෙන් රුමේනියාවටද, පෙත්ල්යූරාටද දූතයන් හා පණිවුඩ යැවිණි.

★

විශේෂ අංශය භාර නාවික භටයා වූ ප්යොදර් ෂුක්රායි පිට, පිටම හයවැනි රැයෙහි දීත් නොනිදා වැඩ කළේය. සියලු දේ ගැන දන්නා බොල්ෂෙවික්වරුන්ගෙන් ඔහු කෙනෙක් විය. වන මෘගයන් ලුහුබැඳ ගොස් උගේ ගුහාවට කඩා පැනීම බලාපොරොත්තුවෙන් සිටින දඩයක්කාරයකුට ෂුක්රායි සමාන විය.

දැන් ඔහු කෑ ගසා අනතුරු හැඟවීම් නොකළ යුතුය. ලේ පිපාසයෙන් සිටින රාක්ෂයා මරා දැමිය යුතු බැවිනි. හැම බිස්සක් දෙසම බියෙන් බැලීම නවත්වා සාමකාමී ලෙස වැඩ කටයුතු කළ හැකි වන්නේ එවිට පමණකි. වන මෘගයා බියගැන්වීම නුවණට හුරු නැත. මේ මාරාන්තික සටනේ දී ජය ලබන්නේ ඉවසීමේ ශක්තිය හා ශක්තිමත් බාහු ඇති සටන්කාමියාය.

කැරැලි ගැසීමේ කාලය ආසන්න විය.

මේ නගරයේ කිසියම් තැනෙක, කැරැලිකරුවන් සැඟ වී සිටින වංකගිරියේදී තීරණය ගත්තේයඃ කැරැල්ල හෙට රාත්‍රියේදී ඇරඹිය යුතුය.

මේ කැරැල්ල පිළිබඳ කුමන්ත්‍රණයේ සියලු තතු දැන සිටි බොල්ෂෙවික්වරු පස් දෙනා සතුරාට කලින් පහර ගැසීමට

තීරණය කළහ: කැරැලිකරුවන්ට අද රාත්‍රියේදී පහර දිය යුතුය.

හවස කිසිදු හඬක් නොකර දුම්රිය ඩිපෝවෙන් යුද්ධ දුම්රිය පිටවිය. යෝධමය දොරවල් වසා දැමුවේද නිහඬවය.

රහස් සංඥා සහිත විදුලි පණිවුඩ හැම තැනටම යැවිණි. ඒවායේ හදිසි ඉල්ලීම් අනුව ජනරජයේ සුරක්ෂිතතාව භාර උකුසු ඇස් ඇති මිනිස්සු නිදි නොතකා කැරැලිකරුවන්ගේ තැත උපන් ගෙයිදීම මරා දැමීම සඳහා නිසි පියවර ගත්හ.

අකීම් ටෙලිෆෝන් මගින් ෂාර්කිට අඬ ගැසීය.

"කණ්ඩායම් රැස්වීම් පිළියෙල කළාද? ඔව්, හොඳා. පක්ෂයේ ලේකම් සහෝදරයාත් සමඟ රැස්වීමක් සඳහා දැන් ම මෙහෙ එන්න. දර පිළිබඳ තත්ත්වය අප සිතුවාට වඩා නරකයි. මෙහෙ එන්න. අපි ඒ ගැන කතා කරමු." දැඩි ලෙස ඉක්මනින් කතා කරන අකීම්ට ෂාර්කි දැනුම් දුන්නේය.

"දර පිළිබඳ ප්‍රශ්නය ඉක්මනින්ම අපව ගිල දමාවි." ෂාර්කි පිළිතුරු වශයෙන් කියා රිසීවරය තැබීය.

පක්ෂ ලේකම්වරු දෙදෙනා රියැදුරු ලිට්කේ විසින් ඉතා වේගයෙන් පදවන ලද මොටෝ රියෙන් ගොඩ බටහ. දෙවැනි මාලයට නැඟුණු ඔවුනට ප්‍රශ්නය දර පිළිබඳ නොවන බව පැහැදිලි විය.

කළමනාකරුගේ මේසය මත 'මක්සිම්' මැෂින් තුවක්කුවක් විය. එය අසල විශේෂ කාර්යභාර අංශයේ සෙබළු දෙදෙනෙක් යුහුසුලු වූහ. පක්ෂයේ හා කොම්සොමොල් තරුණ සංවිධානයේ නිහඬ ආරක්ෂක සෙබළු කොරිඩෝර මුර කළහ. ගුබේර්නියාවේ පක්ෂ කමිටුවේ ලේකම් තැනගේ කාර්යාලයේ පැවැත්වූ විශේෂ හදිසි කමිටු රැස්වීම් නිමාවට පත්වෙමින් තිබිණි.

කවුළුවේ කුඩා සිදුරක් වැනි හුළං කපොල්ලක් අතරින් යුද පිටියේ පාවිච්චි කරන ටෙලිෆෝන් සඳහා වූ වයර් කම්බි ඇද්දේය.

මිනිස්සු අඩ ස්වරයෙන් කතා කළහ. ෂාර්කි අකීම්ගේ කාමරයේ රීතා සහ මිහයිල් සිටිනු දුටුවේය. දිගැති ෂිනේල කබායක් ඇඳගෙන උරහිස් හරහා හම්පටි බැඳ පිස්තෝල කොපුවක් පැලඳගෙන සිටි ෂ්කොලෙන්කෝ එකවර හඳුනා ගැනීමට බැරි විය. ඉස්සර හමුදංකයක දේශපාලන ගුරුවරයා ලෙස සේවය කළ රීතා රතු හමුදාවේ හිස්වැස්මක්ද, කාකි සායක් සහ හමින් කළ කබායක්ද හැඳ ලොකු මවුසර් පිස්තෝලයක් ඉණ වටා ඇති පටියේ රඳවාගෙන සිටියාය.

"මේවා තේරුම්ගත යුත්තේ කොහොමද?" ඔහු මවිතයෙන් ඇගෙන් ඇසුවේය.

"වාන්යා, ප්‍රායෝගික අභ්‍යාසයක්, දැන්ම අපි නුඹලාගේ ප්‍රදේශයට යමු. අපි පස්වැනි පාබළ හමුදා පාසල හමුවිය යුතුයි. කොම්සොමොල් සාමාජිකයෝ කණ්ඩායමේ රැස්වීමෙන් පසු වහාම එහි යා යුතුයි. ප්‍රධානම දේ එළියට නොපෙනෙන හැටියට එය කළ යුතුයි." රීතා ෂාර්කිට පැවසුවාය.

'කැඩෙට්' බැද්දෙහි නිහඬතාවකි.

පැරැණි යුද්ධාභ්‍යාස පාසලෙහි වන්නේ සියවස් ගණන් පැරැණි යෝධමය ඕක් ගස්ය. පල්වුණු වතුර සහිත පැරැණි පොකුණ පෙඳපාසි හා වල් පැළෑටිවලින් වැසිලාය. පුළුල් අඩි පාරවල් කොළවලින් පිරිලාය. මේ බැද්ද මැද උසැති, සුදු පැහැති බිත්තියකට එහා රතු හමුදාවේ නිලධාරීන් සඳහා වූ පාබළ හමුදා අභ්‍යාස පාසලය. එය ඉස්සර කැඩේට්වරුන්ගේ පාසලය. දැන් රෑ බෝවී ඇත. ඉහළ මාලය ආලෝකවත් කර නැත. පිටින් බලන විට මෙහි හැම දෙයක්ම නිහඬය, සාන්ත ය. බිත්තියට එහා ජීවත්වන්නවුන් නිදති යි අසලින් යන්නකු සිතනු ඇත. එසේ නම් විශාල යකඩ දොරවල් ඇර තිබෙනුයේ කවර හේතුවක් නිසාද? ඇතුළුවන තැන යෝධමය ගෙම්බන් වැනි යමක් ඇත්තේ මන්ද? දුම්රිය මාර්ග ප්‍රදේශයේ සිට හැම පැත්තකින්ම මෙහි පැමිණි උදවිය, රාත්‍රි බව දැන සිටියෝය. ඔවුන් මෙහි පැමිණියේ පක්ෂයේ හා කොම්සොමොල් තරුණ සංවිධානයේ ශාඛා හා කණ්ඩායම්වල රැස්වීම්වලින් පසුවය. එම රැස්වීම්වලදී පැන නැඟ ඇති තත්ත්වය පිළිබඳ කෙටි විස්තරයක් කෙරිණි. ඔවුහු නිහඬව මෙහි ආහ. එකා බැගින්ද, දෙදෙනා බැගින්ද, තුන්දෙනෙකුට නොවැඩි ගණනක් බැගින්ද පැමිණියහ. ඔවුන්ගේ සාක්කුවල කොමියුනිස්ට් පක්ෂය (බොල්ෂෙවික්) නමැති සාමාජික කාඩ්පත හෝ තිබිණි. යකඩ දොරටුවෙන් ඇතුළු විය හැක්කේ එවැනි කාඩ් පතක් පෙන් වූ විට පමණකි.

රැස්වීම් හල තුළ රැස්වූ පිරිස විශාලය. ශාලාව විදුලි බුබුළු වලින් ආලෝකවත් කර තිබිණි. ඝනැති කැන්වස් රෙදිවලින් කවුළු වසා දමලාය. මේ රැස්වීම කැඳ වූ බොල්ෂෙවික්වරු සන්සුන්ව සිටගෙන කඩදාසිවල දුම්කුඩු දමා ඔතා ගෙන ඒවා බොමින්, අභ්‍යාසයක් සඳහා ගත් සියලු ආරක්ෂක විධි ගැන විහිළු තහළු කරමින් සිටියහ. සැබෑ අවදානම් තිබෙන බව කිසිවකුට වත් නොදැනිණි. විශේෂ කාර්යභාර අංශවල

විනය තැකීමක් වශයෙන් නිකම් එක්රැස් කළා යැයි ඔවුහු සිතූහ. එසේ වුවද, මෙය හුදු ප්‍රායෝගික අභ්‍යාසයක් නොවන බව පළපුරුද්ද ඇති පැරැණි සෙබළුන්ට වැටහිණි. හැම දෙයක්ම වුවමනාවටත් වඩා නිහඬව කර ඇත. මුමුනමින් දුන් අණ අනුව යුද්ධාභ්‍යාස පාසලේ සිසුහු පෙළ ගැසුණහ. සුපරීක්ෂාකාරී ලෙස මැෂින් තුවක්කු එළියට ගත් අතර, කවුළුවල හෝ යුද්ධාභ්‍යාස පාසල් වත්තේ හෝ කිසිදු ආලෝකයක් පිටතට නොපෙනිණි.

"මිත්‍යායි, බැරෑරුම් දෙයක් සිදුවෙනවා වගේ නොවේද? ජනෙල් පඩි කඳක වාඩිවී සිටි දුබාවාගෙන් පාවෙල් කොර්චාගින් ඇසුවේය. ඔහු අසලින් වාඩිවී සිටිය තරුණිය ෂාර්කිලාගේ ගෙදරදී මීට දවස් තුනකට උඩදී දැක තිබෙන බව පාවෙල්ට මතක් විය.

දුබාවා විහිළුවට මෙන් පාවෙල්ගේ උරහිසකට තට්ටු කරමින් මෙසේ පැවසීය:

"මොකද හදවත බඩට බැස්සද? කමක් නැහැ. යුද්ධ කරන හැටි අපි නුඹලට උගන්වන්නම්. නුඹ මේ ගැහැනු ළමයාව හඳුනන්නේ නැතිද?" දුබාවා හිස වනමින් තරුණිය පෙන්වීය. "ඇගේ නම ආන්නා, වාසගම මතක නැහැ. උද්ඝෝෂණ අංශය භාරව ඉන්නෙ ඈ තමා."

දුබාවාගේ විසුළු හැඳින්වීම අසන තරුණිය පාවෙල් දෙස පිරික්සුම් බැල්මක් හෙළුවාය. හිස බැඳි දම්පාට ලේන්සුව අතරින් පිටතට ආ කෙස් රොදක් ඈ හරි ගස්වා ගත්තාය.

ඇගේ දෙනෙත් කොර්චාගින්ගේ නෙත් සමඟ ගැටිණි. එම හමුව තත්පර කීපයක් පැවැතුණේය. තද කළු පැහැති ඇගේ දෙනෙත් ගිනි පිටකරන්නාක් මෙන් අභියෝග කළේය. ඇගේ ඇසිපිය දිගය, තමා ඇය ඉදිරියේ ලැජ්ජා වන බව වටහාගත් පාවෙල් අසතුටින් රවා බලමින් දුබාවා දෙසට හැරුණේය.

"ඔය දෙදෙනාගෙන් උද්ඝෝෂණය කරන්නෙ කවුද?" කෘත්‍රිම ලෙස මඳ සිනා පාමින් පාවෙල් ඇසීය.

ශාලාව තුළ හඬක් ඇසිණි. මිහයිලො ෂ්කොලෙන්කෝ පුටුවක් උඩට නැඟී කෑ ගැසීය:

"පළමුවැනි සේනාංකයේ සාමාජිකයනි, ශාලාව තුළ පෙළ ගැසියල්ලා! සහෝදරවරුනි, ඉක්මනට! ඉක්මනට!"

ෂුක්රායිද, ගුබේර්නියා පක්ෂ කමිටුවේ සභාපති වරයාද, අකීම්ද ශාලාවට ඇතුළු වූහ. ඔවුන් මේ දැන්ය, මෙහි ආවේ.

පෙළ ගැසී සිටින මිනිසුන්ගෙන් ශාලාව පිරී පැවැතිණි.

අභ්‍යාස මැෂින් තුවක්කුව තබා ඇති චතුරශ්‍රය මැද සිටගත් ගුබේර්නියා පක්ෂ කමිටුවේ සභාපතිවරයා අතක් ඔසවා කතාව පටන් ගත්තේය.

"සහෝදරවරුනි, අප තමුන්නාන්සේලාව මෙහි කැඳවූයේ ඉතාම බැරෑරුම් හා හදිසි කාර්යයක් ගැන දන්වන්ටයි. ඊයේ තරම් මෑතක දන්වා සිටීමට නොහැකි වූ කරුණු දැන් කිව හැකිය. ඊයේ තරම් මෑතක ඒවා ගැඹුරු යුද්ධමය රහස් වූ බැවිනි. හෙට රෑට මේ නගරයේත්, ඒ වගේම මුළු මහත් උක්රයිනයේත් ප්‍රතිවිප්ලවවාදී කැරලි පටන් ගැනීමට තීරණය කර තිබේ. නගරය ප්‍රතිවිප්ලවවාදී නිලධාරීන්ගෙන් පිරිලාය. නගරය අවට පල්හොරු රංචු රොක්වී සිටිති. කුමන්ත්‍රණකාරීන්ගෙන් කොටසක් අවිගත් අපේ ප්‍රවාහන සේනාංකවලට රිංගා ගෙන එහි රියැදුරන් වශයෙන් වැඩ කරති. එහෙත්, විශේෂ කමිටුව එම කුමන්ත්‍රණය පිළිබඳ සියලු තොරතුරු දැනගෙන ඇත. දැන් අපි අපේ පක්ෂ සංවිධානයටයි, කොම්සොමොල් සංවිධානයටයි අවි බෙදා දෙන්නෙමු. යුද්ධාභ්‍යාස පාසලේදී පිරික්සුමට භාජන කළ සිසුන්ගේ සේනාංක සහ විශේෂ කමිටුවේ සහෝදරවරු සමඟ පළමුවැනි හා දෙවැනි කොමියුනිස්ට්වාදී බැටෑලියන් හමුදා සටන් කළ යුතුය. යුද්ධාභ්‍යාස පාසලේ සිසුන් දැනටම සටන් වැද සිටී. සහෝදරවරුනි, දැන් නුඹලාගේ වාරයයි. අවි ලබා ගැනීමට හා පෙළ ගැසීමට විනාඩි පහළොවක කාලයක් දෙමි. මේ සටනේ නායකයා ලෙස ෂුක්රායි ක්‍රියා කරනු ඇත. කළ යුතු සියලු වැඩ පිළිබඳ විධානයන් අණ දෙන සහෝදරවරුන්ට ඔහුගෙන් ලැබෙනු ඇත. දැන් තිබෙන බැරෑරුම් තත්ත්වය ගැන කොමියුනිස්ට්වාදී බැටෑලියන් හමුදාවලට යමක් කීම අමතර දෙයක් බව මගේ හැඟීමයි. හෙට පටන් ගැනීමට නියමිත කැරැල්ල අද විනාශ කර දැමිය යුතුය."

විනාඩි පහළොවක් ගතවත්ම අවිගත් බැටෑලියන් හමුදා පාසල් වත්තේ පෙළ ගැසුණහ.

නිහඬව සිටින සෙබළ පෙළ දෙස ෂුක්රායි පිරික්සුම් බැල්මක් හෙළීය.

පෙළට පියවර තුනක් ඉදිරියෙන් බඳපටි බැඳගත් දෙදෙනෙක් සීරුවෙන් සිටියහ. එකෙක් බැටෑලියනයේ අණ දෙන්නා වූ මෙන්යායිලෝය. උරාලයේ වාත්තු කම්කරුවකු වූ ඔහු යෝධයෙකි. ඔහු අසලින් බැටෑලියනයේ කොමිසාර් අකීම්ය. වම්පසින් පළමුවැනි සේනාංකයට අයත් කණ්ඩායමය.

එම කණ්ඩායමට පියවර දෙකක් ඉදිරියෙන් කණ්ඩායමේ නායක ෂ්කොලෙන්කෝ සහ දේශපාලන නායිකාව වන රීතා උස්තිනෝවිච්ය. ඔවුනට පිටුපසින් කොමියුනිස්ට්වාදී බැටෑලියනයේ සෙබළු පෙළ ගැසී උන්හ. ඔවුන් සංඛ්‍යාවෙන් තුන් සියයකි.

ප්යොදර් ෂුක්රායි අණ දුන්නේය,

"පටන් ගනිමු."

★

තුන්සියයක් සෙබළු ජනශුන්‍ය මාර්ග ඔස්සේ පා නැගූහ. නගරය නිද සිටියේය.

දීකයා වීදිය ඉදිරිපිට ල්වොව්ස්කායා වීදියේදී බැටෑලියනයේ පෙළ විසිරිණි.

නිහඬව ඔවුහු ගොඩනැගිලි වට කළහ. කඩයක පඩිපෙළ මත බැටෑලියනයේ කාර්යාලය පිහිටුවූහ.

නගර මධ්‍යස්ථානයේ සිට විශාල විදුලි පහන්වලින් මඟ ආලෝකවත් කරමින් මොටෝ රියක් වේගයෙන් දිව්වේය. බැටෑලියනයේ කාර්යාලය ඉදිරිපිට මොටෝ රිය නැවතිණි.

එවර හියුගෝ ලිට්කේ තම පියා මොටෝ රියෙන් ගෙනාවේය. කොමෙන්ඩාන්ට් පදවිය දැරූ ඔහු තම පුතාට ලැට්වියන් බසින් යමක් පවසමින් මොටෝ රියෙන් පිටතට ආවේය. මොටෝ රිය ඉමහත් වේගයකින් දුවමින් දිමිත්‍රොව්ස්කයා විදියට හැරී නොපෙනී ගියේය. හියුගෝ ලිට්කේ විස්මය ජනක ලෙස රිය පදවයි. රියෙහි සුක්කානම් රෝදය ඔහුගේ අණට කීකරු වෙයි. ඔහු රිය වමට, දකුණට හරවමින් වේගයෙන් පදවයි.

පවනට බඳු වේගයෙන් රිය පදවන හියුගෝ ලිට්කේගේ ආධාර අවශ්‍ය මෙතැනදීය. පිස්සකු මෙන් නගර වීදි ඔස්සේ මොටෝ රිය පදවන ඔහුට දවස් දෙකක හිර දඬුවමක් දීමට අද වැනි දවසක කිසිවකුට කල්පනා නොවේ.

හියුගෝ ලිට්කේ මොටෝ රිය පැදවූයේ උල්කාපාතයක වේගයෙනි.

ඇසිපිය හෙළීමටත් පෙර නගරයේ එක් කොනක සිට තවත් කොනක් දක්වා හියුගෝ ලිට්කේ තමා ගෙනයාම නිසා ප්යොදර් ෂුක්රායි සතුටට පත් වූයේ මෙසේ පැවසීය:

"හියුගෝ, අද නුඹ මෙතරම් වේගයෙන් කාර් එළවලා කාව හරි යට නොකොළොත්, හෙට මම නුඹට රත්රන් අත්

ඔරලෝසුවක් තෑගි දෙනවා.”

හියුගෝ ප්‍රීතියෙන් ඔද වැඩුණේය:

“මේ විදිහට කාර් එළවපුවම මාව දවස් දහයකට හිරගෙට දමාවි කියලා මම හිතුවා...”

මුලින්ම පහර ගැසුවේ කුමන්ත්‍රණකාරීන්ගේ ප්‍රධාන කාර්යාලයටය. වැඩි වේලා යන්නට පෙර හිරකරුවන් හා ලියවිලි විශේෂ අංශයට ගෙනාවේය.

දීකයා වීදියේ අංක 11 දරන නිවසෙහි ට්සූබර්ට් නමැත්තෙක් පදිංචිවී සිටියේය. විශේෂ කමිටුවේ ‘චෙකා’ වේ විස්තර අනුව මේ පුද්ගලයා ප්‍රතිවිප්ලවවාදී කැරැල්ල සංවිධානය කිරීම සඳහා සෑහෙන ක්‍රියා වැඩ කොටසක් ඉටුකර ඇත. පොදෙල් පෙදෙසේ පහර ගැසිය යුතු ප්‍රතිවිප්ලවවාදී නිලධාරීන්ගේ ලැයිස්තු මොහු ළඟ සුරක්ෂිත ලෙස තිබිණි.

ට්සුබර්ට් සිරභාරයට ගැනීම සඳහා කොමෙන්ඩාන්ට් ධුරය උසුලන මහ ලිට්කේ දීකයා වීදියේ අංක 11 දරන නිවසට පැමිණියේය. ට්සූබර්ට්ගේ නිවසේ ජනේල පැරැණි කන්‍යාරාමයක් වෙන් කළ බිත්තියක් සහිත ගෙවත්තකට මූණ ලා පිහිටියේය. ට්සූබර්ට් එවෙලාවේ ගෙදර නොසිටියේය. අසල්වැසියන් කී පරිදි ඔහු එදින ගෙදර ආවේ නැත. ගෙය පිරික්සා බැලූ විට, අත්බෝම්බ පෙට්ටියක්ද නම් සහ ලිපිනය සහිත ලියවිලිද සොයා ගැනිණි උගුලක් අටවන ලෙස අණ කොට, ලිට්කේ මොහොතකට මේසය අසල නැවතුණේය. ඔහු ලියවිලි බලමින් සිටියේය.

ගෙවත්ත මුර කළේ යුද්ධාභ්‍යාස පාසලේ තරුණ සිසුවෙකි. ආලෝකය සහිත කවුළුව ඔහුට පෙනේ. මුල්ලකට වී තනිවම මුරකිරීම අහිතකර දෙයකි. තරමක බියක්ද ගෙන දෙයි. බිත්තිය දෙස බලමින් සුපරීක්ෂාකාරීව සිටින ලෙස ඔහුට අණ කර තිබිණි. සිත සනසන කවුළුවේ ආලෝකය මෙතැන සිට ඈතය. තත්ත්වය වඩාත් නරක අතට හරවමින් හඳ වලාකුළුවලට මුවා විය. කළුවරේ පඳුරු පණ ඇතිවුන් සේ පෙනේ. සිසුවා අඳුරේ පඳුරුවලට අනියි. කිසිවක් එහි නැත.

“මාව මෙතැන මුර කරන්ට දැම්මේ මොකටද? තාප්පය බොහොම උසයි. ඒකට උඩින් පැනලා එන්ට කාටවත් බැහැ. මම ජනේලය ළඟට ගිහිල්ලා එබිකම් කර බලන්නම්.” සිසුවා එසේ කල්පනා කළේය. ඔහු තව වරක් බිත්තිය දෙස බලා තමා මුර කළ හතු සුවඳ හමන මුල්ලෙන් ඉවත් වී කවුළුව දෙසට ගොස් එය අසල නැවතුණේය. ලිට්කේ

ලියවිලි මේසයෙන් අතට ගෙන ඉවත්වීමට සැරසුණේය. මේ මොහොතේදී තාප්පයට උඩින් මිනිහෙක් මතු විය. ඔහුට කවුළුවේ ආලෝකය නිසා ගෙතුළ සිටින මිනිසාද, එළියේ සිටින සිසුවාද පෙනේ. තාප්පය උඩ හිටි මිනිහා කොටියකු සේ කඩිසර ලෙස තාප්පයේ සිට අසල ගහකට පැන බිමට බටුයේය. ඔහු කොටියකු සේ ගොදුර වෙත ළං විය. එක පහරකින් යුධාභ්‍යාස පාසලේ සිසුවා බිම දැමූ මිනිහා ඔහුගේ බෙල්ලට නාවික පිහියකින් ඇන්නේය.

ගෙවත්තේ තැබූ වෙඩිල්ල නිසා අවට පෙදෙස වටකළ මිනිස්සු කවාකාරව එක් වූහ.

හයදෙනෙක් සපත්තු හඬ නංවමින් ගෙය දෙසට දිව ගියහ.

මියගිය ලිට්කේ පුටුව මත වාඩි වී සිටියේය. ඔහුගේ හිස මේසය මත වැටී තිබිණි, එහි වූ තුවාලයෙන් ලේ ගලන්නට විය. කවුළුවේ වීදුරුව බිඳ දමා ය. එසේ වුවද, මිනීමරුවාට ලියවිලි ගෙනයාමට වේලාවක් නොතිබිණි.

කන්‍යාරාමයේ තාප්පයට එපිටින් තවත් වෙඩි තැබීම් ඇසිණි. මිනීමරුවා තාප්පය උඩට නැඟ වෙඩි තබමින් ගැලවී යාමට තැත් කළේ, පාළු බිමට දුවමිනි. එහෙත්, වෙඩි පහරක් නිසා මිනීමරුවා බිම ඇද වැටිණි.

මුළු රැය තිස්සේම ගෙවල් පරීක්ෂා කිරීම් සිදුවිය. ගෙවල් භාර කමිටුවේ නාම ලේඛනවල ලියා පදිංචි නොකළ නම් සහ සැක කටයුතු බලපත්‍ර හා අවි අයත් මිනිසුන් අල්ලා විශේෂ කමිටුව වෙත ගෙන ගියේය. විශේෂ කමිටුවේ කොමිසන් සභාවක් සැක කටයුතු පුද්ගලයන් ගැන සොයා බැලීය.

සමහර තැන්වලදී, කුමන්ත්‍රණකාරීහු අවිගෙන සටන් කළහ. ෂිල්යාන්ස්කයා වීදියේ එක් නිවසක් පිරික්සා බැලීමේදී අන්තොන් ලේබෙදෙව් කුමන්ත්‍රණකරුවෝ මරා දැමූහ.

එදින රැයෙහි සලෝමෙන්කාහි බැටැලියනයේ සෙබළු පස් දෙනෙක් ජීවිත පූජා කළහ. සෝවියට් ජනරජයේ විශ්වාසදායක මුර සෙබළකු වූ විශේෂ කමිටුවේ යාන් ලිට්කේද එදින දිවි පිදීය.

ප්‍රතිවිප්ලවවාදී කුමන්ත්‍රණය විනාශ කළේය.

එදින රැයෙහි ෂෙපෙතෝව්කා නගරයේ දී වසීලි පූජකයාද, ඔහුගේ දූවරුන්ද, කුමන්ත්‍රණකාරී හොරුන්ද සිරභාරයට පත් වූහ.

නොසන්සුන්තාව තුනී විය.

එහෙත්, අලුත් හතුරෙක් නගරයට තර්ජනය කළේය. එය දුම්රිය මාර්ග අඩපණ කිරීමය. මෙහි තේරුම මෙවර ශීත කාලයේ දී කුසගින්න හා ශීත ඇතිවීමය.

ආහාර හා දර හැම ප්‍රශ්නයක්ම විසඳීය.

II

කල්පනාවෙහි යෙදී සිටි ජ්යොදර් ෂුක්රායි කෙටි බටයක් සහිත දුම් පයිප්පය කටින් ඉවතට ගත්තේය. ඔහු කුහරයේ ඇති අළු පිරික්සා බැලුවේ ප්‍රවේසම්කාරී ලෙස ඇඟිල්ලකිනි. එය නිවිලාය.

සිගරැට් උරන්නන් දෙළොස් දෙනෙකු පමණ පිට කරන දුම් වලා අළු පැහැතිය. ඒවා සීලිමට පහළින් පාවෙයි.. ගුබේර්නියාවේ පක්ෂ කමිටුවේ සභාපතිගේ හිසට උඩින්ද අළු පැහැති දුම් වලා පා විය. මේසය වටා වාඩි වී සිටියවුන්ගේ මුහුණු පෙනෙන්නේ සැහැල්ලු මීදුමකින් වැසුණු කලෙක මෙනි.

ගුබේර්නියා කමිටුවේ සභාපති අසල වාඩි වී සිටි තෝකරෙව් ඉදිරියට නැඹුරු වී පපුව මේසය මත තබාගෙන සිටියේය. ඔහු ඉඳ හිට ඇස් කොනින් තට්ටයකු දෙස බලමින්, නොසන්සුන් ලෙස යටි රැවුළු ගස් අදින්නට වූයේය. මිටි මිනිහකු වූ තට්ටයා උස් හඬකින් කතා කරමින් තේරුමක් නැති වචන ගොඩක් ඇද බෑවේය. ඒවා මදය රහිත බිත්තරයක කුහරයක් මෙන් හිස්ය.

මහලු කම්කරුවාගේ විලාසය දකින අකීම්ට තම ළමා විය සිහි විය. ඔවුන්ගේ ගෙදර 'ඇහැට කොටන්නා' නම් වූ පොර කුකුළෙකු සිටියේය. පොරකෑමට පෙර ඒ කුකුළා තම සතුරා දෙස බලන ආකාරයටම දැන් තෝකරෙව් තට්ටයා දෙස බලයි.

ගුබේර්නියාවේ පක්ෂ කමිටුවේ රැස්වීම දැනට දෙපැයක් තිස්සේ පැවැත්වෙයි. තට්ට හිසක් ඇති මිනිහා දුම්රිය මාර්ගයට දැව දඬු සැපයීම පිළිබඳ සංවිධායක කමිටුවේ සභාපතිවරයාය.

තමා ඉදිරිපිට වූ කඩදාසි ගොඩ ඇඟිලිවලින් හාරා අවුස්සන තට්ටයා හඬ නඟමින් වචන පිට කරයි:

"ඉතින් මෙන්න මේ වාස්තවික හේතුන් නිසා ගුබේර්නියා පක්ෂ කමිටුවේ තීරණය ක්‍රියාවේ යෙදවීමට පුළුවන්කමක් නැත. මාසයකට පසු හෝ දැව දඬු සන මීටර හාරසියයකට

වඩා ලබාදීමට අපට පුළුවන්කමක් නැති බව මම නැවත කියා සිටිමි. දැව දඬු ඝන මීටර එක් ලක්ෂ අසූ දහසක් ලබා ගැනීමේ ඉලක්කය..." තට්ටයා උචිත වචන හොයන්නට විය. "මනෝරාජික සිහිනයක්! " ඔහු කතාව අවසන් කරමින් කට වසා ගත්තේය. ඔහුගේ කුඩා දෙතොල් අමනාප වූ ගතියක් පළ කළේය.

නිහඬතාව බොහෝ වේලාවක් පැවැතිණි.

ප්යොදර් ෂුක්රායි නියපිටින් දුම් පයිප්පයට පහරක් දී අළු ශුද්ධ කළේය. බැරෑඬි හඬින් කතා කළ තෝකරෙව් නිහඬතාව බිඳ දැමීයඃ

"දැව දඬු කම්ටුවේ දර තිබුණෙත් නැහැ, දැනට ඇත්තෙත් නැහැ. පසුවට තියෙන එකකුත් නැහැ. බලාපොරොත්තු ඇති කරගන්ට එපා... කතාව එහෙමද?"

තට්ටයා දෙඋර සෙලවීයඃ

"සහෝදරයා සමාවෙන්න, අපි දර ගොඩ ගැසුවා. නමුත් ප්‍රවාහනය මදිකම නිසා..." වචන ගිල දැමූ ඔහු කොටු සහිත ලේන්සුවකින් තම දිලිසෙන තට්ටය පිස දැමීය. ලේන්සුව සාක්කුව තුළට එබීම සඳහා ඔහු ගත් උත්සාහය ව්‍යර්ථ වූයෙන්, අවසානයේ දී ඔහු එය හම් බෑගය තුළට ඔබා ගත්තේ ස්නායු කිපුණු කලෙක මෙනි.

"දැව දඬු ලබා ගැනීමට ඔබ මෙතෙක් කල් කළේ මොනවා ද? කුමන්ත්‍රණයට සහභාගි වුණු ප්‍රධාන විශේෂඥයන් සිරභාරයට අරගෙන දැන් දවස් කීපයක්ම ගත වුණා." මුල්ලක සිටි දෙනෙක්කෝ ප්‍රශ්න කළේය.

තට්ටයා ඔහු දෙසට හැරුණේයඃ

"ප්‍රවාහන නැතිව නොකළ හැකි බව දුම්රිය පරිපාලන සංවිධානයට තුන්වරක්ම ලියා යැව්වා..."

තෝකරෙව් ඔහු නැවැත්වීය.

"අපි ඒ ගැන අහලා තියෙනවා." තට්ටයා දෙස දැඩි සතුරු බැල්මක් හෙළූ කම්කරුවා කීවේය. "නුඹ අපව මෝඩයන්ට ගණන් ගන්නවද?"

ඒ ප්‍රශ්නය නිසා තට්ටයාගේ පිට දිගේ හීන් ඩහදිය ගලා යන්නට විය.

"ප්‍රතිවිප්ලවවාදීන්ගේ වැඩවලට මට වග කියන්ට බැහැ." මෙවර තට්ටයා ඉතා හෙමින් පිළිතුරු දුන්නේය.

"දුම්රිය මඟෙන් බොහෝ ඈත ගස් කපන බව ඔබ දැන සිටියා නේද?" අකීම් ඔහුගෙන් විචාළේය.

"මා දැන හිටි නමුදු, පිට කෙනෙකුට අයිති කොටසක කෙරෙන අක්‍රමිකතා ගැන ලොක්කන්ට පෙන්වන්නට මට බැහැ."

"ඔබ ළඟ මිනිසුන් කී දෙනෙක් වැඩ කරනවද?" වෘත්තීය සමිති කමිටුවේ සභාපති ඇසීය.

"දෙසීය දෙනෙක් පමණ."

"හැම පුරවැසියෙකුටම අවුරුද්දකට දර ඝන මීටරය බැගින්." තෝකරෙව් වියරු ලෙස කීය.

"දුම්රිය ආහාර කමිටුව වෙනත් සංවිධානවලට අයත් කම්කරුවන්ගෙන් උදුරාගත් විශේෂ ආහාර සලාක ඔබ වෙනුවෙන් වෙන් කළා. කම්කරුවන්ට ඒවා ලැබිය යුතුයි. ඔබ කරන්නේ මොනවාද? කම්කරුවන් වෙනුවෙන් ඔබට එවූ පිටි රේල් පෙට්ටි දෙකට ඔබ මොනවද කළේ?" වෘත්තීය සමිති සභාපති ප්‍රශ්න කළේය.

හැම පැත්තකින්ම තට්ටයා දෙසට තියුණු ප්‍රශ්න එල්ල විණි. අමනාපයට පත් ණය හිමියන්ගෙන් බේරීමට දඟලන ණය ගැතියකු සේ ඔහු ඒවාට පිළිතුරු සැපයීය.

ප්‍රශ්නවලින් පිට යාමට ඔහු ආඳකු සේ ලිස්සන්නට විය. එහෙත්, ඔහුගේ දෙනෙත් බියසුලු ලෙස නැටවිණි. ළං ළංව එන අවදානම ඔහුට ඉවෙන් මෙන් දැනිණි. බියසුලු දුර්වල ගතියකින් ඔහු එක් දෙයක් ගැන පමණක් පැතීය: ඉක්මනින් මෙතැනින් ඉවත් වී ගොස් බඩකට පුරා රාත්‍රී ආහාරය ගැනීමය. මහලු නොවන ඔහුගේ බිරිඳ ඔහු එන තුරු පෝල්ඩි කොක්ගේ නවකතාවක් කියවමින් බලා සිටිනු ඇත.

ප්‍රශ්නවලට තට්ටයා දෙන පිළිතුරු අසන ගමන්ම, ජ්යොදර් ෂුක්රායි සටහන් පොතක මෙසේ ලියුවේය: "මේ මිනිහාව මීට වඩා ගැඹුරට පිරික්සා බැලිය යුතු බව මම යෝජනා කරනවා. මෙතැනදී, වැඩට අදක්ෂ වීම එකම හේතුව හැටියට ගණන් ගන්ට බැහැ. ඔහු ගැන දැනටමත් මට ආරංචි ලැබී තිබෙනවා... ඔහු සමඟ කරන සාකච්ඡාව නවත්වමු. ඔහු ගියාවෙ. අපි අපේ කාරිය ඉටු කරමු."

ගුබේර්නියා කමිටුවේ සභාපතිවරයා සටහන කියවා ජ්යොදර් දෙස බලා හිස වැනීය.

ෂුක්රායි නැඟිට කොරිඩෝරයේ ටෙලිෆෝනය වෙත ගියේය. ඔහු නැවත රැස්වීමට පැමිණි විට, ගුබේර්නියා පක්ෂ කමිටුවේ සභාපතිවරයා යෝජනාව කියවමින් සිටියේය:

"...දුම්රිය දැව දඬු කමිටුවේ වැඩ කඩා කප්පල් කිරීම නිසා

එම කමිටුවේ ප්‍රධානියාව රැකියාවෙන් නෙරපා දැමීමටත්, දැව දඬු කැපීම පිළිබඳ වැඩ ගැන පරීක්ෂා කර බැලීමට උචිත සංවිධානයකට භාර දීමටත් තීරණය විය.”

තට්ටයා මීට වඩා අයහපත් තීරණයක් බලාපොරොත්තු විය. කඩා කප්පල් කිරීම නිසා සේවයෙන් නෙරපා දැමීම ඔහුගේ විශ්වාසය පිළිබඳ ප්‍රශ්නයට හානියක් වුවද, එය එතරම් විශාල දෙයක් නොවෙයි. බොයාර්කාවල ප්‍රශ්නය ගැන ඔහුට බියවීමට හේතුවක් නැත. එය ඔහුට අයත් කොටසේ සිදු වූ දෙයක් නොවේ. “මම හිතුවේ ඒගොල්ල තවත් මොනවා හරි දේවල් හොයලා එළියට ඇද ගනීවි කියලා...” ඔහු තමාටම කියා ගත්තේය.

කඩදසි අත් බෑගයට දමා ගනිමින්, සම්පූර්ණයෙන්ම පාහේ සන්සුන් වෙමින් ඔහු මෙසේ පැවසීය:

“මම පක්ෂයේ සාමාජිකයකු නොවන විශේෂඥයෙක්, මා විශ්වාස නොකිරීමට ඔබට අයිතියක් තියෙනවා. නමුත්, මගේ හිත පිරිසුදුයි. මා කිසිවක් නොකළා නම්, එහි තේරුම මට එය කිරීමට බැරි වුණා විතරයි.”

ඔහුට කිසිවෙක් පිළිතුරු නොදුන්හ. තට්ටයා ඉක්මනට පියගැට පෙළ බැස සැහැල්ලු සිතින් මහ මඟට බසින දෙර හැරියේය.

“පුරවැසිය, ඔබගේ නම කුමක්ද?” සෙබළ කබායක් හැඳ සිටි පුද්ගලයා ඇසීය.

කඩා වැටෙන හදවතකින් යුතුව තට්ටයා පිළිතුරු දුන්නේ, ගොතගසමිනි:

“චෙර්... වීන්ස්කි.”

උඩ තට්ටුවේ ගුබේර්නියා පක්ෂ කමිටුවේ සභාපති වරයාගේ කාර්යාලයේ දහතුන් දෙනා තට්ට හිසක් ඇති මිනිහා ගිය විගසම විශාල මේසය වටා වාඩි වී ඉදිරියට නැඹුරු වූහ.

“මෙන්න පේනව නේද...” ප්‍යොදර් ෂුක්රායි සිතියම ඇඟිල්ලකින් පෙන්වීය. “මෙන්න මෙතැන බොයාර්කා දුම්රියපොළ. මෙතැනට හැතැප්ම හයක් දුරින් දැව දඬු කපලා තියෙනවා. මෙතැන ගොඩගහලා තියෙන දර ප්‍රමාණය ඝන මීටර දෙලක්ෂ දස දහසකි. ශ්‍රම හමුදාව මාස අටක් තිස්සේ බොහොම මහන්සි වෙලා වැඩ කළා. ප්‍රතිඵලය ද්‍රෝහී පාවා දීමකි. දුම්රිය මාර්ගයටත් නගරයටත්, දර නැතිව යාමයි. මේ දර ගොඩ හැතැප්ම හයක් දුර ඇති දුම්රියපොළට ගෙන ඒමට

කරත්ත පන්දහක් යොදවන්නට ඕන. මේ කරත්ත පන්දහම මාසයක් තිස්සේ දවසකට දෙවරක් බැගින් දුම්රියපොළට දර ගෙනාවොත් වැඩේ ඉවර කරන්නට පුළුවනි. ළඟම ඇති ගමට දුර හැතැප්ම පහළොවකි. ඒ හැර ඒ ගම්වල ඕර්ලික්ගේ පල්හොරු රංචුව ඇවිදිනවා... එහි තේරුම සහෝදරවරු දන්නවා නේද? බලන්න සැලැස්ම අනුව දැව දඬු කැපීම කළ යුත්තේ මෙතැනයි. මෙතන ඉඳලා දුම්රියපොළට. අර නීචයෝ වුවමනාවෙන්ම කැලෑව ඇතුළටම ගෙන ගියා. උන්ගේ උපාය වුණේ කපාපු දර දුම්රිය මඟට ගෙන යාමට ඉඩක් නො තැබීමය. ඇත්ත වශයෙන්ම අපට කරත්ත සියයක්වත් හොයා ගන්නට බැහැ. ඔවුන් අපට සෑහෙන පහරක් ගැසුවා. මෙය කැරැල්ල තරම්ම බරපතළයි."

ෂුක්රායි මිට මෙළ වූ අත ඉටි කඩදාසි සිතියම මත තැබීය.

ඔහු නොකී දේ පිළිබඳ භයානක තත්ත්වය ගැන දහතුන් දෙනාගෙන් හැම කෙනෙක්ම මනාසේ සිත්වල මවා ගත්හ. ශීත කාලය පැමිණීමට ආසන්නව ඇත. රෝහල්, පාසල්, කාර්යාල ලක්ෂ ගණන් ජනතාව අධික ශීතලට හසුව සිටින සැටි ඔවුහු මනසෙහි මවා ගත්හ. තුඹසකට වැදුණු කුහුඹි ගොඩකට සමාන ජනකායක් රොක්වී සිටින දුම්රියපොළින් පිටවන්නේ සතියකට එක් දුම්රියක් පමණකි.

හැම කෙනෙක්ම ගැඹුරු ලෙස සිතන්නට වූහ.

ජ්යොදර් ෂුක්රායි මිට මෙළ වූ අත දිග හැරියේය.

"සහෝදරවරුනි, ගැලවීමේ එක් මඟක් තිබෙනවා. දුම්රිය පොළේ සිට දැව දඬු ගොඩ දක්වා පටු දුම්රිය මඟක් මාස තුනක් ඇතුළතදී ගොඩනගන්නට ඕන. පළමුවැනි මඟ සති හයක් ඇතුළත දී හදලා ඉවර කරන්ට ඕන. ඒ සඳහා ෂුක්රායිගේ වියළි උගුරෙන් හඬක් පිටවිය. "කම්කරුවන් තුන්සිය පනස් දෙනෙකුයි, ඉංජිනේරුවන් දෙදෙනෙකුයි ඕන. පූෂවදීට්සවල දුම්රිය පීලි සහ එන්ජින් හතක් තියෙනවා. කොම්සොමොල්වරු ඒවා රේගුවේ තිබෙන බව හොයාගෙන තියෙනවා. යුද්දෙට ඉස්සෙල්ලා පූෂ වදීට්සවල ඉඳලා නගරයට පටු දුම්රිය මාර්ගයක් හැදීමට වැඩ පිළිවෙළක් තිබුණා. ලොකුම අමාරුවකට තියෙන්නේ බොයාර්කාවල කම්කරුවන්ට නැවතීමට තැනක් නැති එකයි. කැලෑ පාසල් මඩුව කඩා වැටිලා. කම්කරුවන් කාණ්ඩ වශයෙන් යවන්නට ඕන. සුමාන දෙකකට වඩා වැඩි කාලයක් එක කණ්ඩායමට වැඩ කරන්ට බැහැ. අකීම්, අපි එහාට කොම්සොමොල්වරුන්

යවමුද?" ඔහුගෙන් පිළිතුරු ලැබෙන තුරු බලා නොසිට ෂුක්රායි දිගටම කතා කළේය. "පුළුවන් තරම් තරුණ සමිති සාමාජිකයන් එහාට යවන්ට කියල අපි කොම්සොමොල් සංවිධානයට දන්වමු. සලොමෙන්කාවල සංවිධානයයි නගරයේ සංවිධානයෙන් කොටසකුයි පළමුවෙන් යවමු. කාරිය නම් බොහොම අමාරුයි. නමුත්, අපි තරුණයන්ට පැහැදිලි කළොත් මේ වැඩේ නිසා නගරයයි, දුම්රිය මඟයි බේරාගන්ට පුළුවන් වේවියි කියලා, ඔවුන් වැඩ කරාවි."

දුම්රිය මාර්ගවල ලොක්කා අවිශ්වාස ලෙස හිස වැනීය.

"ඒකෙන් ප්‍රයෝජනයක් ඇති වේවිද? සරත් සමය, වැස්ස, ඉන් පසු තද ශීතල. මේවා තියෙද්දී නිකම් මහ පොළොවේ හැතැප්ම හයක් දිගට දුම්රිය මඟක් සෑදීම ලේසි නැහැ." විඩාපත් වූ හඬින් ඔහු කීවේය.

ෂුක්රායි ඔහු දෙස නොබලාම ඔහුගේ කතාවට බාධා කළේය:

"දැව දඬු පිළිබඳ ප්‍රශ්නය ගැන නුඹ වඩා බරපතළ ලෙස කල්පනා කළ යුතුව තිබුණා, අන්ද්‍රෙයි වසීලෙවිච්. දුම්රිය මාර්ගය අප හැදිය යුතුමයි. දැන් බැඳගෙන හීතලේ මැරෙන්ට ඉඩ දෙන්න අපට බැහැ."

උපකරණ සහිත අවසාන පෙට්ටි කිහිපය දුම්රියට පැටවිණි. දුම්රිය පදවන කණ්ඩායම ගමනට නියමිත ස්ථානවලට ගියේය. ශීත වැසි වසින්නට විය. රීතා උස්තිනෝවිච්ගේ සම් කබාය මතට වැටෙන වැහි බිංදු කුඩා වීදුරු කැට මෙන් පහත වැටිණි.

තෝකරෙව්ගෙන් සමු ගනිමින් ඔහුට අතට'ත දුන් රීතා ඔහුගේ අත දැඩි ලෙස මිරිකන ගමන් මුදු ලෙස මෙසේ පැවසුවාය:

"අපි ඔබ හැමට ජය පතමු!"

මහලු තෝකරෙව්ගේ දෙනෙත් පැසුණු ඇහි බැම්වලට යටින් ඈ දෙස හෙළුවේ දයාන්විත බැල්මකි:

"උන්ට හෙණ වදින්ට, උන් අපට මාර වැඩක් දුන්නා." තම සිතෙහි පැන නැඟි පැනයට පිළිතුරු දෙන්නාක් මෙන් ඔහු හඬ නඟා කීය. "නුඹලා මෙතන වෙන දේ ගැන හෝදිසියෙන් හිටපල්ලා. ඕන වේලාවට බල කරපල්ලා. නිලධාරිවාදය නැතිව මෙතැන ඉන්න එවුන්ට වැඩ කරන්ට බැහැ. දැන් ඉතින් දුවේ, මට යන්ට වේලාව හරි."

මහල්ලා කබායේ බොත්තම් දැමීය. එවේලාවේදී රීතා

නිකමට මෙන් විමසුවාය: "පාවෙල් කොර්චාගින් මේ කට්ටිය එක්කලා යන්නෙ නැත්ද? ඔහු පෙනෙන්ට නැහැ."

"නැහැ. ඔහු ඊයේ අපේ කාර්මික වැඩ භාර ලොක්කා සමඟ අස් රියෙන් එහෙට ගියා. අපේ ගමනට වුවමනා දේ පිළියෙල කරන්ට." මහල්ලා පැවසීය.

ඒ මොහොතේදී ඔවුන් දෙසට ඉක්මනින් ෂාර්කිද, දුබාවාද, නිවීගිය දුම්වැටියක් සිහින් ඇඟිලි තුඩුවලින් ගෙන, ඕනෑවට එපාවට මෙන් කබායක් උරහිස මත දමා ගෙන ආන්නා බොහාර්ට්ද පැමිණියහ.

ළංවූ පිරිස දෙස බැලූ රීතා, තෝකරෙව්ගෙන් පැනයක් ඇසුවාය:

"ඔබ කොර්චාගින් සමඟ පාඩම් කිරීම කොහොමද?"

තෝකරෙව් විමතියට පත්ව ඇය දෙස බැලීය.

"මොන පාඩම්ද? ඒ හාදයා නුඹේ මඟ පෙන්වීම යටතේ නොවැ. එහෙම නේද? මිනිහා නුඹ ගැන මට කීප වරක්ම කිව්වා. පාවෙල් නුඹට බොහොම ප්‍රශංසා කළා."

රීතා මහල්ලාගේ කතාවට සවන් දුන්නේ අවිශ්වාසයකිනි:

"තෝකරෙව් සහෝදරයා කියන කතාව ඇත්තක්ද? මගේ පාඩම්වලින් පස්සේ ඒවා හරි හැටි තේරුම් කරගන්නට ඔහු ඔබ ළඟට ආවේ නැත්ද?"

මහල්ලා හඬ නඟා සිනාසෙන්නට විය:

"මා ළඟටද?.. මා ඉන්න පළාතකට ආවෙ නැහැ."

දුම්රිය හඬක් නැඟීය. ක්ලාව්චෙක් දුම්රිය මැදිරියේ සිට කෑගැසීය:

"රීතා උස්තිනෝවිච් සහෝදරිය, අපේ පප්පාව අපට දෙන්න. එයා නැතුව අපට කිසිම වැඩක් කරන්ට බැරි බව දන්නවා නේද?"

චෙක් ජාතිකයා තවත් යමක් කීමට සූදනම් වුණද, ළං වූ තිදෙනකු දැක නිහඬ විය. ආන්නාගේ දෙනෙත්වල ඇති දුක්මුසු බැල්මද, ඈ දුබාවා දෙස බලා සමුගැනීමේ මඳ සිනාවක් පෑ සැටිද දෙම්නසකින් දුටු ක්ලාව්චෙක් හණිකට මැදිරියේ කවුළුවෙන් ඈත් විය.

★

සරත් සමයේ ශීතල වැසි මුහුණට පහර දෙන්නාක් මෙන් වසින්නට විය. තෙතමනය සහිත පිම්බීගත්, ඇඳිරි අළු පැහැති වලාකුළු පහළින් පියාඹන්නට විය. දැඩි සරත් සමය විසින්

ගස්වල කොළ ගලවා දැමිණි. පැරණි ග්‍රාබ් ගස් මහල්ලන් සේ දුක්මුසු බැලුම් හෙළීය. රැලි සහිත ඒවායේ අතු දුඹුරු පාසිවලින් වැසී ඇත. අනුකම්පා විරහිත සරත් සමය තුරුවල අලංකාර වස්ත්‍ර උනා දැමූයෙන් ඒවා නග්නව හා දෙම්නස් ලෙස සිටියේය.

කුඩා දුම්රිය ස්ථානයක් මහ වනය මැද හුදෙකලාව තිබිණි. දුම්රිය වේදිකාවෙන් ගල් බැම්මේ සිට වනය දක්වා අලුතින් කැපූ මඟක් වැනි පලසකි. මේ පලස වටේ මිනිස්සු කුහුඹුවන් සේ යුහුසුලු වූහ.

කිරිමැටි වැනි මඩ පාදවලට පෑගී 'චර චර' හඬක් නැඟීය. මිනිස්සු වේගයෙන් බිම් කොටමින් සකස් කළහ. නාරස්න හා උදලු ගල්කැටවල ගැටෙන හඬ ඇසිණි.

කුඩා සිදුරු ඇති පෙනේරයකින් ගලන්නාක් සේ සෙමින් වැහි බින්දු සහිත වැසි වසින්නට විය. ඒවා මිනිසුන්ගේ ඇඳුම් අතරින් සිරුරට වැදිණි. මිනිසුන්ගේ ශ්‍රමය විසින් ගොඩනඟන ලද දේ විනාශ කිරීමට වැස්ස ඉදිරිපත් වූවා සේය. පලස දෙපස ගොඩගැසී ඇති පස් කැට ආපසු මඟට කඩා වැටුණේය.

මහ ශීතල වැසි නිසා තෙතබරි වී සිටි මිනිස්සු ශීතලේ වෙවුලමින් ඇඳිරි වැටුණු පසුද , බොහෝ වේලාවක් වැඩ කළහ. දිනපතා මිනිසුන් විසින් කපා සකස් කරන ලද මඟක් වැනි පලස කෙමෙන් වනය වෙත ළං විය.

දුම්රිය ස්ථානයට නුදුරින් මීට ඉස්සර තිබුණු, ගඩොලින් කළ ගොඩනැගිල්ල නටබුන් ගොඩකි. එම ගොඩනැගිල්ලේ උදුරාගත හැකි හැම දෙයක්ම උදුරාගෙන, පුපුරාදැමිය යුතු දේ පුපුරුවා දමා, මීට බොහෝ කලකට පෙර සොරාගෙන යන ලද්දේ මංකොල්ලකරුවන් විසිනි. දොර, කවුළු වෙනුවට විශාල සිදුරුය. ඉස්සර තිබුණු ගිනි උදුන දැන් කළු පැහැති සිදුරකි. දිරාගිය වහල සිදුරු සහිතය. එහි පරාල ඇට සැකිල්ලකට සමානය.

විශාල කාමර හතරක සිමෙන්ති බිම පමණක් හානියක් නොවින්දේය. රැයෙහි මේ සිමෙන්ති පොළොව මත තෙතබරි වූ, මඩ, කුණු හා මැටි තැවරුණු ඇඳුම් ඇඳගත් මිනිස්සු වැතිරී නිදා ගත්හ. දොර අසල තෙතබරි වූ ඇඳුම් මිරිකා හරින විට මඩ හා කුණු සහිත දිය පාරවල් ගලා ගියේය. වැස්සට හා මඩ වූ පසට මිනිස්සු නොසරුප් බසින් බැණ වැදුණහ. යම්තමින් පිදුරු දමා සකස්කොට ඇති සිමෙන්ති පොළොව මත ළං

ළංව පෙළගැසී ඔවුහු වැතිර ගත්හ. උණුසුම් වනු වස් ඔවුහු එකිනෙකාට අතිශයන්ම ළං වූහ. ඔවුන්ගේ ඇඳුම්වලින් වාෂ්ප පිට වුණද ඒවා නොවේළිණි. ජනේල සිදුරු වසා ඇති ගෝණි තෙමී වැහි වතුර කාමරය තුළට වැදිණි. වහලේ සිදුරු අතරින් ගෙතුළට වැහි බින්දු වැටුණේය. දෙරෙහි සිදුරු අතරින් සුළං හඬ නඟමින් ඇතුළු විය.

මුළුතැන් ගෙය හැටියට පාවිච්චි කළ බැරැක්කයේදී උදේ තේ පානය කළ ඔවුහු දුම්රිය මඟ සෑදීමට ගියහ. දහවල් කෑමට හැමදම එකම ආහාරයකි, එනම් කඩල සූපයකි. එකකුට දිනපතා ගල් අඟුරු වැනි කළු පාන් රාත්තල් එක හමාරක් ලැබේ.

නගරයට ඔවුන්ට දිය හැකි එකම ආහාරය එපමණක් විය.

කාර්මික වැඩ පිළිබඳ නායකයා වූ වලේරියන් නිකොදීමච්ච් පතෝෂ්කින් මහල්ලෙකි. ඔහු උසය. ඔහුගේ දෙකම්මුල්වල ගැඹුරු වක රැල්ලකි. කාර්මික ශිල්පියා වකුලෙන්කෝ පුළුල් උරහිස් ඇති මිනිහෙකි. ගොරහැඩි මුහුණක් ඇති ඔහුගේ නහය මස් ගොඩකි. මේ දෙදෙනා දුම්රිය ස්ථානාධිපතිගේ නිවසෙහි ලැගුම් ගත්හ.

තෝකරෙව් දුම්රිය ස්ථානයේ 'චෙකා' සංවිධානයේ නියෝජිතයා වන හොල්යාවාගේ ඉතා කුඩා කාමරයේ නවාතැන් ගත්තේය. මිටි මිනිහකු වූ හොල්යාවා කඩිසරය, ඉක්මන්කාරීය.

දුම්රිය මඟ ගොඩනඟන්නෝ දහසක් පරිත්‍යාගවලට මුහුණ දෙමින් දැඩි ආත්ම ශක්තියකින් වැඩ කළහ.

දවසින් දවස දුම්රිය මඟ දැමීම සඳහා අවශ්‍ය පලස වනය දෙසට ඇදෙන්නට විය.

මේ ශ්‍රම හමුදව අතහැර පැන ගියවුන්ගේ සංඛ්‍යාව නවයක් විය. දවස් කීපයක් ගතවත්ම තවත් පස්දෙනෙක් පැන ගියහ.

ගොඩනැඟිලි ව්‍යාපාරය පළවැනි පහර ලැබුවේ දෙවැනි සතියේදීය: හවස නගරයේ සිට එන දුම්රිය එදිනට අවශ්‍ය පාන් ගෙනාවේ නැත.

දුබාවා නිදා සිටි තෝකරෙව් අවදි කොට ඔහුට ඒ ගැන දැන්වීය.

පක්ෂ සංවිධානයේ ලේකම් වන මහලු තෝකරෙව් තම දෙපා වනමින්, වේගයෙන් කිහිල්ලක් කසන්නට විය.

"ඔන්න නාඩගම පටන් අරගෙන!" ඔහු මුමුනමින්

ඉක්මනින් ඇඳුම් ඇඳගත්තේය.

බෝලයක් වැනි හොල්යාවා කාමරයට ආවේය.

"ඉක්මනට ටෙලිෆෝනය ළඟට ගිහිල්ලා කොහොම හරි විශේෂ කමිටුවට ටෙලිෆෝන් කරපන්." තෝකරෙව් හොල්යාවාට දැනුම් දුන්නේය. "නුඹ පාන් ගැන කාටවත් කියන්ට එපා." ඔහු දුබාවාට අවවාද කළේය.

අඩපැයක් තිස්සේ ටෙලිෆෝන් ශිල්පීන්ට බැණ වැදුණු, මැඩලිය නොහැකි හොල්යාවා අවසානයේදී විශේෂ කමිටුවේ උප නායක ෂුක්රායිට ටෙලිෆෝන් කිරීමට සමත් විය. හොල්යාවාගේ බැණුම්වලට සවන් දෙමින්, තෝකරෙව් පාදයෙන් පාදය වරින් වර පොළොවේ ගසමින්, ඉවසිලි රහිතව සිටියේය.

"මොනවද? පාන් ගෙනාවෙ නැත්ද? ඒ වැඩේ කළේ කවුද කියල මම දැන්ම හොයා බලන්නම්." තර්ජනාත්මක ලෙස ෂුක්රායි කෑ ගැසීය.

"නුඹ මට කියපන් හෙට මිනිසුන්ට කන්ට දෙන්නෙ මොනවාද? කෝප වූ තෝකරෙව් පෙරළා කෑ ගැසීය.

ෂුක්රායි කිසිවක් කල්පනා කළේය. නිහඬතාවකින් පසු පක්ෂ සංවිධානයේ ලේකම් තැනට මෙසේ ඇසිණි:

"රෑ වෙන කොට පාන් ගෙනැවිත් දෙන්නම්. මොටෝරිය සමඟ ලිට්කේ එවන්නම්. ඔහු පාර දන්නවා. උදේ එළිවන විට පාන් ලැබේවි."

පසුද අරුණෝදය වැටෙත්ම, මඩ සහ කුණු තැවරුණු මොටෝ රියක් දුම්රිය ස්ථානයට පැමිණියේය. මුළු රැයම නිදි නැතිව රිය පැදවීම නිසා මලානිකව, විඩාපත්ව සිටි හියුගෝ ලිට්කේ එළියට ආවේය.

දුම්රිය මඟ සඳහා කරන සටන උත්සන්න විය. දුම්රිය මඟට අවශ්‍ය සිල්පර කොට නැති බව පාලක කාර්යාලයෙන් දැන්වීය. ඉදිකිරීම් වැඩට අවශ්‍ය දුම්රිය මාර්ග ද, දුම්රිය යන්ත්‍රද ප්‍රවාහනය කිරීම සඳහා මාධ්‍යයක් නැත. දුම්රිය ඇන්ජින් යන්ත්‍ර සිතුවාට වඩා වැඩියෙන් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයක පැවැතිණි. ශ්‍රම හමුදාවේ පළමුවැනි නඩය වැඩ කළ යුතු කාලය අවසන් විය. ශක්තිය සම්පූර්ණයෙන්ම සිඳී ගිය මිනිසුන් තව දුරටත් නවත්වා ගැනීම නොකළ හැක්කකි.

කුප්පි ලාම්පුවක ඇඳිරි එළියේ ආධාරයෙන් පක්ෂයේ ක්‍රියාකාරීහු බැරැක්කයේ මේසයක් වටේ වාඩි වී පැන නැගුණු

තත්ත්වය ගැන සාකච්ඡා කළහ.

දුම්රිය යන්ත්‍ර අලුත්වැඩියා කිරීම සහ දුම්රිය මාර්ග ගෙන යාම සඳහා පසුදින උදෑසන තෝකරෙව්, දුබාවා, ක්ලාව්චෙක් තවත් හයදෙනෙකු සමඟ නගරයට ගියහ. වෘත්තියෙන් පාන් සාදන්නකු වූ ක්ලාව්චෙක් සැපයුම් අංශයේ වැඩ සොයා බැලීමට ගිය අතර, අනික් අය පූෂ වදීට්ස බලා නික්මුණහ.

නොනවත්වාම වැසි වසින්නට විය.

පාවෙල් කොර්චාගින් වැර යොදා කිරි මැටි වැනි මඩ ගොඩේ එරුණු සපත්තුව සහිත කකුල ඇද්දේය. ඔහුගේ යටි පතුලට තද ශීතලක් දැනිණි. සපත්තු අඩිය සම්පූර්ණයෙන්ම ගැලවී, වෙන්වී මඩෙහි එරී තිබිණි. කොර්චාගින් මෙහි වැඩට එන විට ඔහුගේ පාවහන් කැඩී තිබුණෙන්, ඔහුට එය විශාල හිරිහැරයක් විය. ඒවා කිසි කලෙක නොවේළිණි. සිදුරු අතරින් සපත්තු තුළට රිංගන මැටි පයට පෑගෙන විට, චර-චර හඬක් නැඟීය. දැන් සපත්තුව අඩියෙන් සදහටම වෙන්වී නග්න වූ පතුල මඩෙහි එරුණේය. මේ සපත්තුව නිසා ඔහුට වැඩ කිරීම අපහසු විය. මඩෙහි එරුණු සපත්තු අඩිය එළියට ඇද ඒ දෙස බලාපොරොත්තු රහිත ලෙස බලා, තමා මෙතෙක් දී තිබුණු පොරොන්දුව කඩ කළ පාවෙල් නොසරුප් බසින් බැණ වදින්නට විය. එක් පයක් නග්නව මඩෙහි එරෙන විට ඔහුට වැඩ කළ නොහැකිය. ඔහු සපත්තු අඩියත් රැගෙන බැරැක්කයට ගොස් ජංගම කුස්සිය ළඟින් වාඩි වී කකුල වටා ඔතා තිබුණු කඩමාල්ල ගලවා දැඩි ශීතල නිසා හිරිවැටී ඇති පයේ ඇඟිලි ලිපට ළං කළේය.

දුම්රිය මාර්ග මුරකරුවකුගේ බිරිඳ වන ඔදර්කා කෝකියාගේ අත්උදව්කාරිය ලෙස වැඩ කරන්නී, බීට්රූට් අල කපමින් සිටියාය. තවම තරුණ විය නොඉක්ම වූ ඒ ගැහැනියට සොබාදහම කරුණාවන්ත විය. ඇගේ උරහිස් පිරිමියකුගේ මෙන් පුළුල්ය. ලොකු පියයුරු සහිත පපුව විශාලය. උකුළ පුළුල්ය. ඇ ඉතා ඉක්මනින් බීට්රූට් අල කපා පෙති ගසයි. ඇගේ මේසය මත පෙති කැපූ බීට්රූට් අල සහිත එළවළු කන්ද විශාල විය.

ඔදර්කා නොසැලකිලිමත් ලෙස පාවෙල් දෙස බලා ඇසුවාය:

"නුඹ දවල් කෑමට ඇවිල්ලාද? එහෙනම්, නුඹ වෙලාවට ඉස්සෙල්ලා ඇවිල්ලා තියෙනවා. මේ වගේ වේලාවක වැඩ කරන තැනින් පැනලා ඒම ලජ්ජාවට කාරණාවක්. නුඹ කකුල

දික් කරන්නේ කොහාටද? මෙතැන කුස්සියක් මිස නාන කාමරයක් නොවෙයි.” ඈ ඔහුට අවලාද කීවාය.

මහලු කෝකියා පැමිණියේය.

“මගේ සපත්තු අඩිය එහෙම පිටින්ම ගැලවුණා.” තමා කුස්සියට පැමිණීම ගැන විස්තර කරමින් පාවෙල් කීය.

කෝකියා දෙබෑවී වෙන් වී ඇති සපත්තුව දෙස බලා හිස වනා ඔදර්කා පෙන්වමින් කතා කළේය:

“මෙයාගේ පුරුෂයා බාගෙට සපත්තු මහන්නෙක්. ඔබට උදව් කරන්ට ඔහුට පුළුවන් වේවි. සපත්තු නැතුව වැඩ කළොත් ඔබ විනාශ වේවි.”

කෝකියාගේ කතාව ඇසූ ඔදර්කා පාවෙල් දෙස බලන්නී, තරමක් ලැජ්ජාවී මෙසේ කීවාය:

“මම ඔබ කම්මැළියකු හැටියට ගණන් ගත්තා.”

පාවෙල් ඇයට සමාව දෙන්නාක් මෙන් මඳ සිනා පෑවේය. ඔදර්කා සපතේරු වැඩ දන්නියක සේ පාවෙල්ගේ සපත්තුව දෙස බැලුවා ය.

“මේ සපත්තුව අලුත්වැඩියා කරන්නට අපේ එක්කෙනාට බැහැ. මේකෙන් වැඩක් නැහැ. ඔබේ කකුල බේරාගන්නට මම පරණ ගලෝෂියක් ගෙනත් දෙන්නම්. ඒක ගෙයි මුල්ලක ඇති. මේ තරම් මහන්සි වෙලා වැඩ කරන්ට ඕනද! අද හෙට වෙනකොට හිම වැටිලා තද හීතල පටන් ගනීවි. එතකොට ඔබට හොඳටම අමාරු වේවි.” එවර අනුකම්පාවකින් කතා කළ ඔදර්කා පිහිය තබා පිටතට ගියාය.

ඉක්මනින් ඈ ගැඹුරු ගලෝෂියක් සහ ගොරෝසු ලිනන් රෙදි කෑල්ලක් ගෙනාවාය. ලිපට අල්ලා රත් කරගත් පය රෙදි කැබැල්ලෙන් ඔතා උණුසුමැති ගලෝෂියට පය එබූ පසු, පාවෙල් දුම්රිය මාර්ග මුරකරුගේ බිරිඳ දෙස නිහඬ කෘතඥතා බැල්මක් හෙළීය.

★

තෝකරෙව්, නගරයේ සිට පැමිණියේ කෝපයෙනි. හොල්යාවාගේ කාමරයට ක්‍රියාකාරීන් කැඳවූ ඔහු කොහෙත් ම සතුටු විය නොහැකි පුවත් දැන්වීය:

“හැම තැනම බාධා. හැම තැනම බැලුවම වැඩ කරනවා වගේ පේනවා. නමුත්, ඒ වැඩ එක තැන පල්වෙනවා. අපි ප්‍රතිවිප්ලවවාදී සුදු බල්ලන්ව ඇල්ලුවා මදි. අපේ මුළු ජීවිත කාලයම උන්ව අල්ලන්ට සිදුවෙලා තියෙනවා.”රැස්වී සිටි

පිරිස ඇමතු මහල්ලා වාර්තා කළේය. "කොල්ලනේ මම නුඹලාට එළිපිටම කියන්නම්: වැඩේ බොහොම නරක අතට හැරිලා තියෙනවා: දෙවැනි කණ්ඩායම තවම සංවිධාන කරලා නැහැ. කොච්චර මිනිසුන්ව මෙහාට එවාවිද කියලා දන්නෙ නැහැ. ශීත කාලෙ අත ළඟටම ඇවිල්ලා. ශීත කාලෙ පටන් ගන්ට ඉස්සෙල්ලා අපි මඩ ගොහොරු බිම පහුකරලා යන්ට ඕන. තද ශීතලට බිම ගල් ගැහුණොත් වැඩ ඉවරයි. වැඩට බාධා කරන අයට විරුද්ධව නගරයේ ඉන්න අපේ උදවිය හොයා බලා නිසි පියවර ගන්නා තුරු අපට දෙගුණයක වේගයකින් වැඩ කරන්ට සිද්ද වෙනවා. අප මළත් දුම්රිය මාර්ගය හදන්නට ඕනමයි. එහෙම නැතිනම් අපි බොල්ෂෙවික්වාදීන් නොවෙයි. නිකම්ම නිකම් ගොම ගොඩක්." ඔහුට නොපුරුදු බැරෑඩි, ගොරෝසු, නොසන්සුන් වානේමය හඬකින් තෝකරෙව් කතා කළේය. සනව වැඩුණු බැම සඟළට යටින් දිලිසෙන දෙනෙත් තීරණාත්මක බවක් සහ මුරණ්ඩු බවක් පළ කළේය.

"අදම සාමාජිකයන්ට පමණක් රැස්වීමක් කැඳවා සාකච්ඡා කරමු. හෙට අපි හැම දෙනාම වැඩ කරමු. හෙට උදේට පක්ෂයේ නොවන උදවිය ගෙවල්වලට යවමු. අපි නැවතී වැඩ කරමු. ගුබේර්නියා කොම්සොමොල් කමිටුවේ තීරණය මෙන්න" තෝකරෙව් හතරට නැමූ කඩදාසි කැබැල්ලක් පන්ක්‍රාතොව් අත තැබීය.

පන්ක්‍රාතොව්ගේ උරහිසට උඩින් පාවෙල් කඩදාසි කැබැල්ලේ ඇති දේ කියවීය:

"පැන නැඟී ඇති හදිසි තත්ත්වය යටතේ, පළමුවැනි දැව දඬු තොගය නගරයට සපයන තුරු කොම්සොමොල් සංවිධානයේ සියලු සාමාජිකයන් එතැනම නැවතී වැඩ කළ යුතුය. ඔවුන් වෙනුවට වෙනත් කණ්ඩායමක් එවන්නේ ඉන් පසුවය.

ගුබේර්නියා කමිටුවේ වැඩ බලන ලේකම් රීතා උස්තිනෝවිච්."

ජනයාගෙන් පිරී ඇති බැරැක්කයට යා නොහැකිය. මිනිසුන් එකසිය විසිදෙනෙකුගෙන් එය පිරී ඇත. සමහරු බිත්තියට හේත්තු වූහ. අන් අය මේස මත නැඟ ගත්හ. එකෙක් ජංගම කුස්සිය උඩටද නැග්ගේය.

පන්ක්‍රාතොව් රැස්වීම ආරම්භ කළේය. තෝකරෙව් වැඩි වේලා කතා නොකළද, ඔහුගේ කතාව බෝම්බයක් මෙන් වීය.

"හෙට කොමියුනිස්ට්වාදීන් හා කොම්සොමොල්වරුන් නගරයට යන්නෙ නැහැ."

ඔහුගේ තීරණය ස්ථිර බව පවසමින් මහල්ලා අතක් වැනීය. මේ මඩ ගොඩෙන් ඉවත් වී, නගරයේ තම ගෙවල්වලට යාමේ බලාපොරොත්තුව එම ඉඟිය විසින් විනාශ කෙරිණි. කෑ කෝ ගැසීම් නිසා පළමුවැනි විනාඩිය තුළදී කිසිවක් තෝරා බේරා ගැනීමට බැරිවිය. මිනිසුන්ගේ සිරුරු සෙලවීම් නිසා කුප්පි ලාම්පුවේ තිරය නැටවිණි. අඳුර විසින් මුහුණු වසනු ලැබිණි. කෑ කෝ ගැසීම් වැඩි විය. "ගෙදර ඇති සැප පහසුකම්" ගැන ඔවුහු සිහිනයකින් මෙන් කතා කළහ. සමහරු කෝප වූවෝ, විඩාපත්වීම ගැන කීහ. වැඩි දෙනා නිහඬ වූහ. එකෙක් පමණක් පැන යාම ගැන කීවේය. මුල්ලක සිටි ඔහු කෝපයෙන් කතා කරමින් බැණ වැදුණේය:

"මොන යකාටද! මම එක දවසක්වත් මෙතන ඉන්නෙ නැහැ. මිනිසුන්ව බරපතළ වැඩ ඇතිව හිරගෙට යවන්නේ අපරාධ කළ නිසා. අපට වධ දෙන්නෙ මොකටද? අපව මෙතැන සුමාන දෙකක් තබාගෙන හිටියා. ඒ ඇති, මීට වැඩිය මෝඩයො නැහැ. තීරණය ගත් මිනිහාම ඇවිල්ලා මේක හදපුදෙන්. මේ මඩ ගොඩේ ලැගලා ඉන්න මට තවත් බැහැ. කැමති එවුන් නැවතුණාවේ මට ඇත්තේ එක ජීවිතයයි. මම හෙටම යනවා."

කෑ ගැසූ මිනිහා තමාට පිටු පසින් සිටි නිසා ඔහු බැලීම් වස් ඕකුන්යෙව් ගිනිකූරක් ගැසුවේ පැන යන්නා දැක ගැනීමටය. කෝපයෙන් වියරු වැටී කෑගසන මිනිහාගේ විකෘති මුහුණ ද, ඇරුණු කටද ගිනිකූරු එළියෙන් පෙනිණි. ඔහු කවුදැ යි ඕකුන්යෙව් හඳුනා ගත්තේය: ගුබේර්නියා ආහාර කමිටුවේ ගණන් පොත් තබන්නාගේ පුතාය.

"නුඹ මොකද මා දිහා බලන්නෙ? මම හැංගෙන්නට යන්නෙ නැහැ. මම හොරෙක් නොවේ."

ගිනිකූර නිවිණි. පන්ක්‍රාතොව් නැඟිට සිට ගත්තේය:

"ඔතන බෙරිහන් දුන්නේ කවුද? පක්ෂයේ කාර්ය භාරය හිර දඬුවමක් වෙලා තියෙන්නෙ කාටද?" තමා අසල සිටගෙන ඉන්නවුන් දෙස දැඩි බැල්මක් හෙළූ ඔහු ගොරවමින් ඇසීය. "සහෝදරවරුනි, අප නගරයට නොයා යුතු යි. අපේ තැන මෙතනයි. අප මෙතැනින් පැනලා ගියොත්, අපේ නගර වැසියන්ට හීතලේ මැරෙන්ට සිදු වේවි. අපි කොතරම් ඉක්මනට වැඩ කරමුද, එතරම් ඉක්මනට අපට මෙතැනින්

යාමට පුළුවන් වේවි. අර බියගුල්ලා කියන විදිහට අප මෙතැනින් පැනලා ගියොත්, අපේ අදහස්වලටයි විනයටයි අප සුදුස්සන් නොවේ."

වෘත්තියෙන් කුලී කම්කරුවකු වන පන්ක්‍රාතොව් දිගු කතාවලට කැමති නැත. එහෙත්, මේ කෙටි කතාවට බාධා කරමින් පිට වී යාමට සූදානම් වූ පුද්ගලයා උස් හඬින් කතා කළේය:

"පක්ෂයේ නොවන අය යනවද?"

"ඔව්" පන්ක්‍රාතොව් කෙටියෙන් පිළිතුරු දුන්නේය.

කෙටි නගර කබායක් ඇඳගත් තරුණයෙක් මේසය අසලට ආවේය. ඉතා වේගයෙන් ඔහු සක්කුවකින් කොම්සොමොල් තරුණ සංවිධානයේ කාඩ්පතක් රැගෙන ඉන් පන්ක්‍රාතොව්ගේ පපුවට ගැසීය. එය මේසය මත දමා අයිනක සිට ගත්තේය.

"මෙන්න කාඩ්පත කරුණාකර ආපහු ගන්න. මේ කාඩ් බෝඩ් කෑල්ල නිසා මගේ ශරීර සනීපය නැතිකර ගන්ට කැමති නැහැ!"

ඔහුගේ අවසාන වචන කීපය කෝප වූ කෑගැසීම් නිසා ගිලිණි.

"නුඹ විසි කරන්නෙ මොනවද?"

"ආ තෝ පාවාදෙන ද්‍රෝහියා!"

"කොම්සොමොල් සංවිධානයට බැඳුණෙ සැප පුටු හොයන්ටද!"

"ඔහුව මෙතැනින් එළවා දමමු!"

"උණ සන්නිපාතය බෝ කරන උකුණා, අපි නුඹව උණුහුම් කරමු!"

කාඩ්පත වීසි කළ තැනැත්තා හිස පහත් කරගෙන එළියට ගියේය. වසූරිය රෝගියකු දුටු කලෙක මෙන් ඔහුගේ සිරුරේ නොගැවී ඔහුට පිටවීමට මිනිස්සු ඉඩ දුන්හ. ඔහු පිටවී යත්ම වැසෙන දොර හඬක් නැඟීය.

වීසි කළ කාඩ් පත අතට ගත් පන්ක්‍රාතොව් එය කුප්පි ලාම්පුවට ඇල්ලීය. කාඩ්බෝඩ් කැබැල්ල පිලිස්සී බටයක් සේ නැමුණේය.

★

වනය මැද වෙඩි හඬක් ඇසිණි. දිරාපත් වූ බැරැක්කයේ සිට ඇඳිරි වනය දෙසට අසකු සහ අසරුවකු දිව්වෝය. පාසලේ හා බැරැක්කයේ සිට මිනිස්සු දිව ආහ. දොරේ සිදුරකින් එබූ තුනී ලෑලි කෑල්ලක් කිසිවකු විසින් දක්නා ලදී. කිසිවෙක් ගිනිකූරක් ගැසූහ. සුළඟට නිවී යාමට ඉඩ නොදී ගිනිකූරු එළිය කබාවලින් වටකර ගනිමින් ලෑල්ලේ ලියා ඇති අකුරු කියවූහ:

දුම්රිය ස්ථානයේ ඉඳලා ආ එවුන් ගම් රටවල් බලා පලයල්ලා. නවතින අයට වෙඩි කා මැරෙන්ට සිදුවේවි. හැම එකකුම මරා දමනවා. සමාවක් දෙන්නෙ නැහැ. හෙට රෑ වන තුරු නුඹලාට කල් දෙනවා.

මීට අටමාන් වෙස්නොක්.

වෙස්නොක්, ඕර්ලික්ගේ පල්හොරු කණ්ඩායමෙන් එකෙකි. රීතාගේ කාමරයේ දින පොත වසා නැත.

"දෙසැම්බර් 2 ද"

අද උදේ පළමුවැනි වරට හිම වැටුණා. තද ශීතල. පඩි පෙළේදී විචෙස්ලාව් ඔලිෂින්ස්කිව හමුවුණා. අපි දෙදෙනාම එක්ව ගමන් කළෙමු.

"මම හැමදම පළමුවෙන්ම වැටෙන නැවුම් හිම කැටවලට ආසා කරමි. හරිම තද ශීතල! බොහොම අලංකාරයි, එහෙම නේද?" ඔල්ෂින්ස්කි පැවසීය.

මට බොයාර්කා ගැන මතක් විය. දැඩි ශීතල සහ හිම මා ප්‍රීතියට පත් කරන්නෙ නැහැ. මට ඒවා නිසා දුකක් ඇතිවනවා. එයට හේතුව මම ඔහුට පැවසීමි.

"ඒක මනෝමූල අදහස අනුව දිගටම කල්පනා කළොත් හිනාවීම පවා වැරැදියි. යුද්ධය කෙරෙන කාලවලදි ප්‍රීතිවීම තහනම්. නමුත්, හැබෑ ජීවිතයෙදී එහෙම වෙන්නෙ නැතැ. යුද්ධ කරන පෙරමුණට විතරක් මරණය ළං කරන ඛේදවාචකය බලපානවා. ඒ වුණත් එතැනදි පවා මිනිස්සු හිනාවෙනවා. යුද පෙරමුණෙන් ඈත ජීවිතය එක වගේමයි. සිනාසීම්, ඇඬීම්, දුක, ප්‍රීතිය, සැප සෙවීම, දර්ශනීය දේ බැලීමේ ආසාව, කැලඹීම, ආලය..."

ඔල්ෂින්ස්කිගේ වචනවලට ව්‍යාජෝක්තිය සෙවීමට අමාරු විය. ඔල්ෂින්ස්කි විදේශ කටයුතු පිළිබඳ මහජන කොමසාරිස් මණ්ඩලයේ නියෝජිතවරයෙකි. ඔහු 1917 සිට පක්ෂයේ සාමාජිකයෙකි. යුරෝපීය පන්නයට ඔහු අඳියි, පලඳියි. හම තුනී වන සේ රැවුළ බා ඇත. ඔහු සැර අඩු සුවඳ විලවුන්

පාවිච්චි කරයි. අපේ ගොඩනැඟිල්ලේ සෙගාල්ගේ ගෙදර ඔහු පදිංචි වී සිටී. හවසට ඔහු මා හමුවීමට එයි. ඔහු සමග කතාබහ කිරීම සිත් ගන්නා දෙයකි. බටහිර ගැන හොඳින් දන්නා ඔල්ෂින්ස්කි බොහෝ කලක් පැරීසියේ වාසය කළේය. එසේ වුවද, අප හොඳ මිතුරෝ වූහ යි කීම උගහටය. මෙයට හේතුව ඔහු මා ප්‍රධාන කොට ගැහැනියක හැටියට දැකීමය. පක්ෂයේ සහෝදරයෙකු හැටියට ඔහු මා ගණන් ගන්නේ ඊට අනතුරුවය. ඔහු තම සිතැඟියාවන් හා අදහස් නොසඟවන බව නම් ඇත්තකි. ඔහු ඇත්ත කීමට තරම් නිර්භයය. ඔහුගේ ආසාවන් රළු ඒවා නොවේ. ඔහුගේ ආසාවන් අලංකාර කොට පෙන්වීමට ඔහු සමත්ය. එහෙත්, ඔහු මගේ සිත් නොගනී.

ෂුක්රායිගේ ගොරහැඩි චාම්බව, ඔල්ෂින්ස්කිගේ දිලිසෙන සුදු යුරෝපීය ගතිවලට වඩා මගේ සිත් ගනී.

බොයාර්කා සිට කෙටි තොරතුරු ලැබී ඇත. දවසකට සිල්පර කොට සිය ගණනක් සවි කරති. තද ශීතල නිසා වානේ මෙන් තදවී ඇති මහ පොළොව මත සිල්පර කොට සඳහා යම්තම් පස හාරා ඒවා තබති. දැන් එහි වැඩ කරන්නේ මිනිසුන් දෙසීය හතළිස් දෙනෙකු පමණකි. දෙවැනි නඩයෙන් හරි අඩක්ම පැන ගොසිනි. එහි තත්ත්වය නම් සැබැවින්ම ඉතා බරපතළය. දැඩි ශීත කාලයේදී ඔවුන් වැඩ කරන්නේ කොහොමද...? දුබාවා එහි ගොස් සතියක් ගතවිණි. පූෂ වොදීට්ස්හි දුම්රිය යන්ත්‍ර අටෙන් පහක් අලුත්වැඩියා කර ඇත. ඉතිරි ඒවාට අවශ්‍ය කොටස් නැත.

ට්‍රෑම් රථ පාලක මණ්ඩලය, දිමීත්‍රි දුබාවාට විරුද්ධව අපරාධ චෝදනා ඉදිරිපත් කළ බවකි. පූෂ වොදීට්ස් සිට නගරය දක්වා දුවන සියලු 'ප්ලැට් ට්රෑම් රථ' වර්ගය ඔහු සහ ඔහුගේ නඩය විසින් නවත්වනු ලැබිණි. මඟීන් බස්වා පටු දුම්රිය පීලි පටවාගෙන ඔහු පූෂ වොදීට්ස්වලට ඒවා ගෙන ගියේය. එලෙස දුම්රිය පීලි පටවා ගත් රථ 19ක් ඔහු ගෙනාවේය. ට්රෑම් රථ සේවකයෝ හැම තැනකදීම ඔහුට ආධාර කළහ.

සලෝමෙන්කා කොම්සමෝල් සංවිධානයේ ඉතිරි සාමාජිකයෝ රෑ තිස්සේ රේල් පීලි දුම්රියට පැටවූහ. දිමීත්‍රි සහ ඔහුගේ පිරිස රේල් පීලි සහිත දුම්රිය පදවාගෙන බොයර්කාවලට ඒවා ගෙන ගියෝය.

දුබාවා පිළිබඳ ප්‍රශ්නය බියුරෝ මණ්ඩලයට ඉදිරිපත් කිරීම අකීම් ප්‍රතික්ෂේප කළේය. ට්රෑම් රථ පාලක මණ්ඩලයේ කෑත

නිලධාරිවාදී හා කාර්යාලවාදී වැඩ ගැන අපට දිමීත්‍රි විස්තර කළේය. කාර්යය සඳහා රථ දෙකකට වඩා දීම ප්‍රතික්ෂේප කළහ.

කෙසේ වුවද, ටුප්ටා, දුබාවාට පෞද්ගලික ලෙස දෙස් පැවරීය. "නුඹගේ ඔය කට්ටිවාදී වැඩ නැවැත්වීමට දැන් වේලාවයි. නැතිනම් නුඹට හිරගෙයි ලගින්නට සිද්දවේවි. අවි ගන්නේ නැතිව වෙනත් ක්‍රමයකට සම්මුති මගින් නුඹට ඔය දේ කිරීමට බැරිවුණාද?"

දුබාවා මෙතරම් රෞද්‍ර ලෙස හැසිරෙනවා මීට පෙර මා දැක නැත.

"ඇයි නුඹට බැරිවුණේ සම්මුති මගින් වැඩ කරන්ට, කඩදසි කන්නා? තීන්ත බොන පණුවා. පල්හෑලි දෙඩවන වාචාලයා. බොයාර්කාවලට මම රේල් පීලි නොගෙනියා නම් මගේ මූණ පොඩිකරලා දවි. නුඹ මෙතැන හැම දෙනාට ම බාධා කරන්නේ නැතිව නුඹට තියෙන්නෙ ඉදිකරන නඩයකට එකතු වෙලා වැඩ කරන්නයි. තෝකරෙව් නුඹේ විකාරවලට හොඳ බෙහෙතක් දේවි." දිමීත්‍රි ගුබේර්නියා කොමිටි කාර්යාලය දෙදරුම් කවමින් කෑගැසීය.

ටුප්ටා, දුබාවාට විරුද්ධව චෝදනා පත්‍රයක් සකස් කළේය. අකීම් මට ඉවත් වන ලෙස ඉල්ලා විනාඩි දහයක් පමණ ඔහු සමඟ කතා කළේය. ටුප්ටා අකීම් වෙතින් ඉවත් වී ගියේ කෝපය මුසු රත් පැහැති මුහුණක් සහිතවය.

දෙසැම්බර් 3 ද

ගුබේර්නියා කමිටුවට අලුත් පැමිණිල්ලක් ලැබිණි. එය ප්‍රවාහණය පිළිබඳ විශේෂ කමිටුව වන ට්‍රාන්ස්චෙකාවෙනි. පන්ක්‍රාතොව්, ඔකුන්යෙව් සහ තවත් සහෝදරවරුන් පිරිසක් මතවීලව්කා දුම්රිය ස්ථානයට ඇවිත් පාළු ගොඩනැගිලිවල ජනේල රාමු සහ දොර උළුවස්ස හා දොර පළු දුම්රියකට පටවා ගත්හ. මේවා පටවන විට දුම්රියපොළේ චෙකා නියෝජිතයා ඔවුන් සිරභාරයට ගැනීමට තැත් කළේය. ඔවුන් ඔහු නිරායුධ කොට ඔහුගේ පිස්තෝලයේ පතොරොම් ගලවා, හිස් පිස්තෝලය ඔහු අතට දුන්නේ, දුම්රිය දුවන්නට ගත් පසුවය. ඔවුහු දොර පළු හා ජනේල රාමු ආදිය රැගෙන ගියහ. බොයාර්කා දුම්රිය ස්ථානයේ ගබඩාවෙන් යකඩ ඇණ පූඩ් විස්සක් උදුරාගැනීම ගැන තෝකරෙව්ට විරුද්ධව චෝදනා කර තිබිණි. සිල්පර කොට වෙනුවට දුම්රිය මඟ හරහා යොදන දැව දඬු ගෙන ඒමට ආධාර කළ ගොවීන්ට

තෝකරෙව් එම යකඩ ඇණ බෙදා දුන්නේය. මම ෂුක්රායි සහෝදරයාට මේ පැමිණිලි ගැන කීවෙමි. ඔහු සිනාසී, "අපි මේ සියලු දේ ගැන නිසි පියවර ගනිමු"යි කීය.

දුම්රිය මඟ ගොඩනැඟීමේ කාර්යය වඩාත් වැඩි නොසන්සුන්තාවක් ගෙන ඇත. හැම දවසක් ම ඉතා වටනේය. ඉතාම සුළු දේට පවා බලය පාවිච්චි කිරීමට සිදුවී තිබේ. බාධා කරන එවුන් ගුබේර්නියා කමිටුව ඉදිරියට කැඳවීමට නිතර නිතර සිදුවී ඇත. ඉදිකිරීමේ වැඩවල යෙදී සිටින සහෝදරවරු වැඩි වැඩියෙන්ම සාමාන්‍ය වැඩ පිළිවෙළින් ඈත් වී ක්‍රියා කරති.

ඔල්ෂින්ස්කි මට කුඩා විදුලි ලිපක් තෑගි කළේය. මමත් ඕල්යා යූරේනෙවාත් එම ලිපෙන් අත් රත් කර ගනිමු. මේ ලිප නිසා කාමරය තුළ උණුසුම වැඩි වී නැත. වනයේ වැඩ කරන අපේ අයවලුන් මේ රෑ ගත කරන්නේ කොහොමද? රෝහල ඉතා හීතල බවත්, රෝගීහු පොරොවාගෙන ඇඳන් වලට වී සිටින බවත් ඔල්ගා කීවාය. රෝහල්වල ගිනි තැපීම කරන්නේ දවස් දෙකකට වරක් පමණකි.

නැත, ඔල්ෂින්ස්කි සහෝදරය! පෙරමුණේ බේදවාචකය පසුපසද බේදවාචකයකි!

දෙසැම්බර් 4 ද

රෑ තිස්සේ හිම වැටිණි. බොයාර්කාවල හැම දෙයක්ම හිමෙන් වැසී ඇති බව දැනගන්නට ලැබිණි. වැඩ කිරීම නවත්වා හිමෙන් වැසුණු මඟ ශුද්ධ කරති. දුම්රිය මඟෙහි පළමුවැනි කොටස 1922 ජනවාරි 1 දට පෙර සාදා නිම කළ යුතු බව අද ගුබේර්නියා කමිටුව තීරණය කළේය. මේ තීරණය බොයාර්කාවලට දැන්වූ විට, තොකරෙව් මෙසේ කී බව දැනගන්නට ලැබිණි. "ඊට ඉස්සෙල්ලා නොමළොත්, එදාට වැඩේ සපුරාලන්නෙමු."

කොර්චාගින් ගැන කිසිදු ආරංචියක් නැත. පන්ක්රාතොව්ට මෙන් ඔහුට විරුද්ධව පැමිණිලි කිරීමට තරම් 'වැඩ' නැතිවීම මවිතයට කරුණකි. ඔහු මා හමුවීමට අකැමැති මන්දැ යි මම තවම නොදනිමි.

දෙසැම්බර් 5 ද

ඊයේ පල්හොරු රංචුව ඉදිකිරීම් කම්කරුවන්ට වෙඩි තැබූහ."

★

සිනිඳු හිම පියලි මත අශ්වයෝ ඉතා ප්‍රවේසමින් කුර

තබති. ඉඳහිට හිමට යටවී ඇති අත්තක් අසකුගේ කුරයකට පෑගී හඬක් නඟයි. එවිට අසු හේෂාරවය කරයි. එහෙත්, ඔහුගේ දෙකන් තදින් අදින විට උං හැල්මේ ගොස් ඉදිරියෙන් යන අසුන් පසුකරයි.

අසරුවන් දස දෙනෙක් පමණ කුඩා කඳු පාරක් ඔස්සේ ගියහ. එය තවම හිමෙන් වැසී නැති බැවින් කළු පැහැතිය.

මෙහි දී අසරුවෝ තම අසුන් නැවැත්වූහ. අසරුවෝ අසුන්ගේ 'රේන්ස්' පටි තද කළහ. සෑදල වළලු එකිනෙක ගැටිණි. ඉදිරියෙන් යන අශ්වයා, බොහෝ දුර ගමන් කිරීම නිසා හතිලමින්, නාස් පුඩුවලින් හඬක් නැඟීය.

"මෙතැන උන් මහ ගොඩක් ඉන්නවා." ඉදිරියෙන් යන අසරුවා කීය. "අපි උන්ව සෑහෙන්ට බය කරමු. අටමාන් බට්කෝ කීවා හෙට වෙන කොට ඔය බැල්ලිගෙ පුතාලව මෙතැනින් පන්නා දමනවා කියලා. උන් දැව දඬුවලට බොහොම ළං වෙලා..."

අසරුවෝ එකා පිටුපස එකා පෙළගැසී දුම්රිය මඟ ඔස්සේ ස්ථානය වෙත ගමන් කළහ. පැරැණි පාසල් ගොඩනැඟිල්ල අසලදී ඔවුහු ගමන් වේගය අඩුකොට තුරු අතරින් සැඟවුණේ පිටතට පැමිණීමට අකැමැති වූ බැවිනි.

රැයෙහි නිහඬතාව බිඳගෙන වෙඩි හඬ ඇසිණි. හඳ පානේ රිදීමය පැහැයෙන් බබළන බිරියෝසා අත්තක හිම කැටි බිම වැටිණි. වෙඩි පහර, තුරු අතරින් පියාඹා ගියේය. බිත්තියේ බදාමය පතුරු හරිමින් පතොරොම් වැදිණි. පන්ක්රාතොව් ගෙනා ජනේල වීදුරු කුඩු කරමින් වෙඩි හඬ මතුවිය.

සිමෙන්ති පොළොවේ නිදසිටි මිනිස්සු වෙඩි හඬ නිසා අවදි වී නැඟිට්ටාහ. නැවත වෙඩි පහර එක පිට එක ගෙය තුළට වදින්නට වූයෙන්, ඔවුහු එකිනෙකා හැප්පෙමින් බිම වැතිර ගත්හ.

එකිනෙකාගේ ඇඟේ හැප්පෙමින් බිම වැටුණහ.

"නුඹ කොහේ යනවාද?" පාවෙල්ගේ උඩ කබාය ඇඳගත් දුබාවා ප්‍රශ්න කළේය.

"ගෙවත්තට."

"බිම වැටී වැතිර ගනින්, මෝඩයා. නැඟිට්ට හැටිය වෙඩි වදීවි." දිමීත්‍රි හතිලමින් මිමිනුවේය.

ඔවුහු කාමරයේ දොර අසලට විත් වැතිර සිටියහ. තම රිවෝල්වරය දොර දෙසට දිගු කර ගෙන දුබාවා දොර ළඟ වැතිර සිටියේය. උක්කුටියෙන් වාඩිවී සිටි පාවෙල් ස්නායු

කිපුණු කලෙක මෙන් පිස්තෝලයේ මුනිස්සම් සහිත කවය අතගාමින් සිටියේය. එහි තිබුණේ පතරොම් පහක් පමණකි.

වෙඩිතැබීම හිටි හැටියේම නැවතිණි. අනතුරුව ඇති වූ නිහඬතාව මවිත කළේය.

"කොල්ලෙනි! අවි ඇති අය මේ පැත්තට වරෙල්ලා." පහත් හඬින් මුමුනමින් දුබාවා අණ කළේය.

කොර්චාගින් ප්‍රවේසමින් දොර හැරියේය. අවට කිසිවකු නැත. හිම පියලි මෘදු ලෙස වැටෙයි.

වනයේ අසරුවෝ දස දෙනෙක් තම අසුන් වේගයෙන් එළවූහ.

පසු දින නගරයේ සිට ට්‍රොලියක් පැමිණියේය. එහි සිටි ෂුක්රායි සහ අකීම් පිළිගනු වස් තෝකරෙව් සහ හොල්යාවා ඉදිරියට ආහ. මැෂින් තුවක්කුවකුත්, පතොරොම් පටි සහිත පෙට්ටි කීපයකුත් රයිපල් තුවක්කු විස්සකුත් ට්‍රොලියේ සිට වේදිකාවට ගොඩ බෑවේය.

දුම්රිය මඟෙහි වැඩ කරන ස්ථානයට ඔවුහු ඉක්මනින් ගමන් කළහ. ෂුක්රායිගේ උඩ කබාය හිම පිරි බිම වැදී ඇද කුදු රේඛාවක් ඇති කළේය. ඔහු තවමත් පා තබන්නේ වලසකු මෙනි. සාගරයේ පැද්දෙමින් යාත්‍රා කරන ඩිස්ට්‍රෝයර් නැවක ඩෙක් තට්ටුවේ ගමන් කරන කලෙක මෙනි, ප්යොදර් ෂුක්රායි පා තබා ඇවිදින්නේ මහලු තෝකරෙව්ට ඔහු පසුපස දුවන්නට සිදුවිය. උසැති අකීම් ප්යොදර් ෂුක්රායි සමඟ එක්ව පා තැබීය.

"පල්හොරුන්ගේ පහර දීම විශාලම අවාසනාව නොවෙයි. රේල්පාරේ පොඩි කන්දක් තියෙනවා. අපට එය මට්ටම් කිරීම සඳහා වැඩියෙන්ම වැඩ කරන්ට සිදු වෙනවා. එය අපේ අවාසනාවක්. වැඩියෙන් පොළොව හාරන්නට සිද්ධ වේවි."

මහල්ලා සුළං පහරට පිටදී දුම් වැටියක් උරන්නට විය. දෑත් එක් කොට බොකුටු වන සේ තබා ගෙන දෙතුන් වරක් දුම් පිට කොට, ඔහු අනික් අයට ළං වීමට ගමන් කළේය. අකීම් ඔහු එනතුරු නැවතී සිටි අතර, ෂුක්රායි වේගය අඩු නොකර ගමන් කරමින් ඈත ගියේය.

අකීම් තෝකරෙව්ගෙන් විචාළේය.

"නියමිත කාලයට දුම්රිය සාද නිම කිරීමට ඔබට පුළුවන් වේවිද?"

තෝකරෙව් පිළිතුරු දුන්නේ එකවර නොවේ.

"පුතේ නුඹ දන්නවද" ඔහු අවසානයේදී පැවසීය:

"පොදුවේ කියනවා නම් හදලා ඉවර කරන්ට බැහැ. නමුත් ඉවර නොකර ඉන්නත් බැහැ. ඔන්න ඕතනින් නිගමනය කරන්නට ඕන."

දෙදෙනාම ප්යොදර් ෂුක්රායි වෙතට ළංවී ඔහු සමඟ ගමන් කළහ. මිකැනික් කෙනෙකු වූ මහලු තෝකරෙව් උනන්දුවකින් කතා කළේය:

"මෙන්න මෙතනදි තමා "නමුත්" කියන වචනය පටන් ගන්නෙ. මේ වගේ බල්ලන්ටත් අන්ත, කාලගුණයක් යටතේ, අප ළඟ ඇති උපකරණ පාවිච්චි කරමින්, ගණනින් අඩු කම්කරුවන් යොදවමින් මේ වැඩේ කරන්ට බැරි බව දන්නේ දෙදෙනෙකු පමණයි, පතෝෂ්කින් හා මාත් පමණයි. නමුත් හදූ ඉවර නොකර ඉන්න බැරි බව හැම කෙනෙක්ම දන්නවා. 'අපි හීතලට අහුවෙලා නොමළොත්, හදූ ඉවර කරනවා' කීවෙ ඒ හන්ද. නුඹලාම බලාපල්ලා දෙමසක් තිස්සේ වැඩ කරනවා, හාරනවා. හතරවෙනි නඩයට නිවාඩු දෙන්න කාලය ඇවිල්ලා. නමුත්, ප්‍රධාන නඩය එක හුස්මට වැඩ කරගෙන යනවා. තරුණයො හින්දූ අපි අල්ලාගෙන ඉන්නවා. ඒ ගොල්ලන්ගෙන් බාගයක්ම හෙම්බිරිස්සාව හදගෙන හීතලට ලෙඩ වෙලා. ඒ තරුණයො දිහා බැලුවාම හදවත පවා වේදනාවෙන් ගැහෙනවා. උන්ගේ වටිනාකම කියලා නිම කරන්ට බැහැ... මේ කාලකණ්ණි වළ හන්දූ තරුණයන්ගෙන් එකකුට වැඩිය මැරුම් කාවි."

★

දුම්රියපොළට කිලෝමීටරයකට දුරින් දුම්රිය මඟ කෙළවර විය. එතැන සිට කිලෝමීටරයක්, කිලෝමීටර් එක හමාරක් පමණ දිගට සාදා සකස් කළ බිම මත සිල්පර වෙනුවට දිගැති කැලෑ ලී කොට තබා තිබිණි. එතැන සිට ගොඩැල්ල දක්වා මට්ටම් කළ මඟය.

මෙතැන පන්ක්රාතොව්ගේ අංක එක දරන ඉදිකිරීම් කණ්ඩායම වැඩ කළේය. මිනිස්සු හතළිස් දෙනෙක් සිල්පර කොට තැබූහ. රතු යටි රැවුළක් ඇති, අලුත් ලාප්ටි පාවහන් දෙකක් දමාගෙන සිටි ගොවියෙක් ලී කොට තොගයක් මඟ අසලින් සෙමින් ගොඩ බෑවේය. තවත් හිම යානා කීපයක් එලෙසම ලී කොට ගොඩ බෑවේය. දිගැති යකඩ පොලු දෙකක් බිම තිබිණි. එය සිල්පර මට්ටම් කිරීම සඳහා යොදන යකඩ පොලුය. බිම සකස් කිරීම සඳහා පොරෝ, නාරස්න, උදලු භාවිත කළහ.

★

සිල්පර කොට තැබීම ඉතා හෙමින් කළ යුතු අසීරු කාර්යයක් විය. එය කොතරම් ස්ථිර ලෙස පොළොව මත තැබිය යුතුද යත්, රේල් පීලි දෙපැත්තෙන් එයට එක සේ බර පැටවීම සිදුවිය යුතුය.

සිල්පර කොට තැබීමේ එම කාර්මික ශිල්පය දැන සිටියේ එක අයෙකු පමණි. ඔහු අනිකකු නොව, දුම්රිය මඟෙහි පෝමන් තනතුරු දැරූ පනස් හතර හැවිරිදි ලගූටින්ය. තද කළු පැහැති කෙස් වැටියකින් හෙබි ඔහුගේ යටි රැවුළ දෙකට බෙදූ පීරා තිබිණි. පැසුණු එකද හිසකෙසක්වත් ඔහුගේ හිසෙහි නොතිබිණි. ඔහු සිය කැමැත්තෙන්ම හතරවැනි වාරයේද එක හුස්මට වැඩ කළ අතර, තරුණයන් මෙන්ම එක සේ අමාරුකම්වලට මූණ පාමින් ජීවත් වූ නිසා හැම දෙනාගේම ගෞරවයට පාත්‍රවිය. කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයකු නොවූ ඔහු (තාල්යාගේ පියාය) පක්ෂයේ සියලු රැස්වීම්වලදී ඉතා ගරු කටයුතු ස්ථානයක් ලැබ සිටියේය. ඒ නිසා ආඩම්බරයට පත් ඔහු ඉදිකිරීමේ ව්‍යාපාරය අත නොහරින බවට දිවුරුම් දුන්නේය.

"නුඹලාව අතහැර දාලා යන්නෙ කොහොමද කියලා කියපල්ලා? නුඹලා මා නැතුව සිල්පර කොට තබන්නට දන්නෙ නැහැ. වැඩ පටලවා ගනීවි. පළපුරුදු ඇති කෙනෙකුගෙ ඇහැක් ඕන. මුළු රුසියාව පුරාම මම මේ සිල්පර තබා තියෙනවා..." වැඩ අවසන් කර යන නඩවලට ඔහු දයාන්විත ලෙස පැවසීය.

පතෝෂ්කින් ඔහු කෙරෙහි විශ්වාසය තැබූවෙන් ඔහුගේ කොටස බැලීමට ආවේ කලාතුරකිනි. ෂුක්රායි, අකීම් සහ තෝකරෙව් වැඩ කරන පුද්ගලයන් දෙසට එන විට, පන්ක්‍රාතොව් ඩහදිය පෙරමින්, රත් පැහැගෙන සිල්පරයක් සඳහා උදැල්ලකින් බිම සකස් කරමින් සිටියේය. කුලී කම්කරුවකු වූ පන්ක්‍රාතොව් අකීම්ට හඳුනා ගැනීම ලෙහෙසි නොවීය. ඔහු කෙට්ටු වෙලාය. ඔහුගේ හකු ඇට වඩාත් තියුණු විය. එතරම් හොඳින් සෝදා නොතිබුණු මුහුණ වඩාත් ඇඳිරිව ඇදී තිබිණි.

"ආ ගුබේර්නියා කමිටුව ඇවිල්ලා!" එසේ කී පන්ක්‍රාතොව් දහඩියෙන් තෙමී ඇති තම උණුසුම් අත අකීම් වෙත දිගු කළේය.

උදලු වැදෙන හඬ නැවැතිණි. අකීම් අවට සුදුමැලි මුහුණු දුටුවේය. උඩ කබා, අඩ හිම කබා හැමතැනම හිම ගොඩේ වීසි කර දමා තිබිණි.

ලගුටින් සමග කතා කළ ඉක්බිති තෝකෙරව් පන්ක්‍රාතොව් කැටුව පැමිණි තිදෙනා සමග පස් හාරන තැනට ගියේය. පන්ක්‍රාතොව් ප්යොදර් ෂුක්‍රායි සමග ගමන් කළේය:

"මතවිලෝව්කාවලදී නුඹලයි, චෙකා සෙබළායි අතර සිදුවුණු ගැටීම ගැන මට විස්තර කරපන්, හොඳද? නුඹලා ඔහු නිරායුධ කිරීම වුවමනාවට වඩා වැඩි ක්‍රියාවක් නේද?" කතා කිරීමට වැඩි කැමැත්තක් නොදක්වන පන්ක්‍රාතොව් ගෙන් ෂුක්‍රායි බැරෑරුම් ලෙස ප්‍රශ්න කළේය.

පන්ක්‍රාතොව් ලජ්ජාවෙන් මඳ සිනා පෑවේය.

"අපි ඔහුව නිරායුධ කළේ ඔහුගේ එකඟත්වය අනුවය. අපෙන් ඔහු ඉල්ලීමක් කළා. ඔහු අපේ කොල්ලෙක් නොව, 'කොල්ලනේ, නුඹලාට දොර, ජනේල ගෙනයාමට අවසර දීමට තරම් බලයක් මට නැහැ. දුම්රිය ප්‍රවාහනයට අයත් දේපොළ කොල්ලකන විට එය නැවැත් විය යුතු බවට ජේර්සින්ස්කි සහෝදරයා අණක් නිකුත් කරලා තියෙනවා. මෙතන දුම්රිය ස්ථානයේ ලොක්කා මා සමග තරහයි, උෟ අලිහොරා, මම ඔහුට බාධා කරනවා. මම නුඹලාට යන්ට හැරියොත්, ඔහු මට විරුද්ධව පැමිණිලි කරාවි. එතකොට මට වෙන්නෙ විප්ලවවාදී අධිකරණය ඉදිරියේ පෙනී හිටින්ටයි. නුඹලා මාව නිරායුධ කරලා පලයල්ලා. දුම්රිය ස්ථානාධිපතියා පැමිණිලි නොකොළොත් ඒක එතැනින් ඉවරයි.' ඉතින් අපි ඔහු කී විදිහට කළා. දොර, ජනේල අපේ පෞද්ගලික ගෙවල්වලට ගෙන ගියේ නැහැ. නොව!"

ෂුක්‍රායිගේ දෙනෙත් සිනා පාන සැටි දුටු පන්ක්‍රාතොව් මෙසේද පැවසීය:

"ඒ වැරැද්ද අප පිට ගියාවේ. ෂුක්‍රායි සහෝදරයා, ඒ ඉලන්දරියාව අමාරුවේ දමන්නට එපා."

"ඒවා සියල්ල අවසානයි. මීට පස්සේ ඒ වගේ දේ කරන්න එපා. එය විනය විනාශ කරන වැඩක්. නිලධාරිවාදය සංවිධානාත්මක ලෙස විනාශ කිරීමට තරම් සෑහෙන ශක්තියක් අපට තියෙනවා. හොඳයි, දැන් වඩාත් වැදගත් දේ ගැන කතා කරමු." ප්යොදර් ෂුක්‍රායි පල්හොරුන්ගේ පහර දීම ගැන විස්තර අසන්නට විය.

★

දුම්රිය ස්ථානයට කිලෝමීටර් හතර හමාරක් පමණ ඈතින් මිනිස්සු දැඩි කෝපයකින් උදලුවලින් දුම්රිය මඟ හරහා පිහිටි කුඩා කඳුගැටයක් සමතලා කරන්නට වූහ.

මිනිස්සු හත් දෙනෙක්, හොල්යාවා, කොර්චාගින්, පන්ක්රාතොව්, දුබාවා සහ හමුතොව්ට අයත් අවි රැගෙන පසෙක රැකවලෙහි යෙදුණහ. එම ශ්‍රම කණ්ඩායමට අයත් සියලු අවි එතැන විය.

පතෝෂ්කින් පස්ගොඩැල්ල මත වාඩි වී තම සටහන් පොතේ කිසිවක් ලියමින් සිටියේය. ඉදිකිරීමේ වැඩෙහි යෙදී සිටි එකම ඉංජිනේරු තැන පතෝෂ්කින්ය. පල් හොරුන්ගෙන් වෙඩි කා මිය යාමට වඩා, පලායාමේ චෝදනාව ලැබ අධිකරණය ඉදිරියේ පෙනී සිටීම මැනවයි සිතූ කාර්මික ශිල්පි වකුලෙන්කෝ එදින උදෑසනම නගරය බලා පලා ගියේය.

"මේ පුංචි කඳු ගැටය සමතලා කරන්ට සුමාන දෙකක් යාවි. පස හීතලට ගල් ගැහිලා." තමා ඉදිරියේ සිටින හමූතොව්ට පතෝෂ්කින් පැවසූයේ පහත් හඬකිනි. හමූතොව් නිතර දෙම්නසින් සිටින, කලාතුරකින් කතා කරන පුද්ගලයෙකි.

"අපට වැඩේ ඉවර කරන්ට දෙන්නෙ දවස් විසි පහයි. ඔබ කඳුගැටය සමතලා කරන්ට දවස් පහළොවක් වෙන් කළා." ඔහුට පිළිවදන් දුන් හමූතොව්, රොස්වූ කලෙක මෙන් උඩු රැවුලේ කොනක් යටිතොලින් අල්ලා ගත්තේය.

"මේ කාලය සෑහෙන්නෙ නැහැ. ඇත්ත තමා මගේ ජීවිතයේදි මෙවැනි තත්ත්වයක් යටතේ, මෙවැනි මිනිසුන් සමඟ කිසි දක රේල් පාරවල් හදලා නෑ. මට දෙවරක්ම වැරදුණා වගේ මේ වරත් වරදින්නට පුළුවනි."

මේ වේලාවේදී ෂුක්රායි, අකීම් සහ පන්ක්රාතොව් කඳු ගැටය වෙත ආහ. උඩ සිටියහු ඔවුන් දුටහ.

"බලපන්, අරගොල්ල කවුද?" වැළමිටිවලින් ඉරී ගිය පරණ ස්වීටරයක් හැඳ සිටි, දුම්රිය වැඩපොළේ මිකැනික් කෙනෙකු වූ තරුණ පේත්කා ත්‍රපීමොව් කොර්චාගින් තල්ලු කරමින් පැවසීය. එකෙණෙහි ම කොර්චාගින් උදැල්ලත් අතින් ගෙන කඳුගැටය දිගේ පහළට දිව ගියේය. හිස්වැස්මට යටින් වූ ඔහුගේ දෙනෙත් උණුසුම් ලෙස මඳ සිනා පෑවේය. ප්යොදර් ෂුක්රායි අන් හැමටම වැඩි වේලාවක් ඔහුගේ අත අල්ලාගෙන සුහද හැඟීම් දැක්වීය.

"ආයුබෝවන් පාවෙල්, කෑලි මූට්ටු කළ නුඹේ ඇඳුම් හින්ද නුඹව අඳුනා ගන්නත් අමාරුයි." ෂුක්රායි කීය.

පන්ක්‍රාතොව් කට ඇද කරමින් සිනාසුණේය.

"ඇඟිලි පහ වගේ කෑලි පහක් මූට්ටු කළත්, ඇඟිලි පහම දෙට්ට පැනලා. ඒ මදිවට පැනලා ගිය එවුන් පාවෙල්ගේ සෙබළ කබාය හොරකම් කරලා. ඕකුන්යෙව් පාවෙල්ට කෝට් එකක් දුන්නා. ඒ දෙදෙනා අතර කොමියුන් එකක්. කමක් නැහැ. අපේ පව්ලූෂා හොඳ හිත ඇති හාදයා. එයාගේ ලේ රත්වෙලා. තව සුමාන දෙකක් විතර මිනිහා සිමෙන්ති පොළොවට වෙලා රත්වේවි. පිදුරුවලින් වැඩක් නැති තරම්. ඊට පස්සේ මිනිහාට ලැබේවි මිනී පෙට්ටියක්" අසතුටකින් පන්ක්‍රාතොව් අකීම්ට කීවේය.

කළුවන් බැම සඟළකින්ද, පෙතැලි නහයකින්ද හෙබි ඕකුන්යෙව් දෙනෙත් කපටි ලෙස හකුළුවා ගනිමින් ඒ කතාවට විරුද්ධ විය:

"අපි පව්ලූෂාට අමාරුවේ වැටෙන්ට දෙන්නේ නැහැ. කුස්සියේ ඔදර්කාට අත් උදව්වට අපි ඔහුව ඡන්දයෙන් පත් කරමු. ඔහු මෝඩයෙකු නොවේ නම් ඔහුට එතැනදි ආහාර තරමක් වැඩියෙන් කාලා ලිප ළඟට වෙලා හරි, නැතිනම් ඔදර්කා ළඟට වෙලා හරි උණුසුම් වෙන්ට පුළුවනි."

ඔහුගේ කතාව නිසා හැම දෙනම හඬ නගා සිනාසුණාහ.

ඔවුන් පළමුවරට සිනාසුණේ එදය.

★

ජ්යොදර් ෂුක්රායි කඳුගැටය පිරික්සා බලා තෝකරෙව් සහ පතෝෂ්කින් සමඟ හිම යානයක නැඟී දැව දඬු කපන ස්ථානයට ගොස් එය ද පිරික්සා බලා ආපසු පැමිණියහ. කඳුගැටය සමතලා කරනු වස් දැඩි අධිෂ්ඨානයකින් යුතුව මිනිස්සු පස් කැපූහ. උස් පහත් වෙමින් පස් කපන උදලු දෙසද සිත කය දෙකම යොදා ඉමහත් පරිශ්‍රමයකින් වැඩ කරන මිනිසුන්ගේ කොඳු නාරටි දෙසද බලා සිටි ජ්යොදර් අකීම්ට ළංවී මිමිනුවේය:

"රැස්වීම් ඕන නැහැ. උද්ඝෝෂණය කිරීමට මෙතන මිනිසුන් නැහැ. මේ මිනිසුන්ගේ වටිනාකම කියා නිම කරන්ට බැහැයි තෝකරෙව් කී කතාව ඇත්ත. වානේ පන්නරය ලබන්නේ මෙන්න මේ වගේ තැන්වලදියි."

පස් කණ්ඩි කපමින් සිටින මිනිසුන් දෙස ෂුක්රායි බැලුවේ

ආස්වාදයකින්, දැඩි ආදරයකින් හා ආඩම්බරයකිනි. දැන් මෙතැන පස් කපන මිනිසුන්ගෙන් සමහරු ප්‍රතිවිප්ලවීය කැරැල්ල මැඩීමට පෙරදින රැයෙහි බයිනේත්තු රැගෙන සටන් වැදුණහ. දැන් ඔවුහු උණුසුමේ හා ජීවිතයේ උල්පත වන දැව දඬු නිධානය දක්වා වානේමය රේල්පීලි දමා දුම්රිය මඟක් සෑදීමේ ඒකායන පරමාර්ථයෙන් යුතුව වෙහෙසෙති.

★

සති දෙකකට පෙර කඳුගැටය කපා සමතලා කිරීමට බැරි බව පතෝෂ්කින් ඉංජිනේරු තැන ජ්‍යොදර් ෂුක්රායිට ආචාරශීලීව නමුදු, හේතු සහිතව පෙන්වා දුන්නේය. ඔහුගේ තර්කවලට සවන් දුන් ජ්‍යොදර් සිතින් යම් කිසිවක් ගැන තීරණය කරන්නට විය.

"කඳුගැටය කැපීම නවත්වන්න. රේල්පීලි දැමීම දිගටම කරගෙන යන්න. කඳුගැටය කැපීම අපි වෙනත් විදිහකට තීරණය කරමු."

දුම්රිය ස්ථානයට පැමිණි ෂුක්රායි බොහෝ වේලාවක් ටෙලිෆෝනය අසල වාඩි වී සිටියේය. හොල්යාවා දෙර අසලට වී මුර කළේය. ජ්‍යොදර්ගේ ගොරෝසු කට හඬ ඔහුට ඇසිණි:

"මා වෙනුවෙන් මිලිටරි අංශයේ ප්‍රධාන නිලධාරියාට ටෙලිෆෝන් කරන්න. පුසිරේව්ස්කිගේ රෙජිමේන්තු හමුදාව දුම්රිය මඟ ඉදිකරන පෙදෙසට වහාම යවන්නැයි කියන්න. පමානොවී ඒ පෙදෙසේ ඉන්න පල්හොරු රංචුව පන්නා දමන්නට ඕන. පුපුරා දැමීමේ වැඩ කරන මිනිසුන් සමඟ යුද අවි රැගත් දුම්රියක් එවිය යුතු බව දන්වන්න. ඉතිරි හරිය මම බලා ගන්නම්. රෑ යාමෙට මොටෝරිය දුම්රිය ස්ථානයට එවන්න කියලා ලිට්කේට්ට කියන්න."

බැරැක්කයේදී අකීම් කළ කෙටි කතාවෙන් පසු' ජ්‍යොදර් ෂුක්රායි පිරිස ඇමතීය. සහෝදරාත්මක සාකච්ඡාවට නොදැනුවත්ම පැයක් ගතවිය. ජනවාරි පළමුවැනිදට සාදා අවසන් කළ යුතු දුම්රිය මාර්ගයේ වැඩ දිග්ගැස්සවීම කොහෙත්ම කළ නොහැකි බව ජ්‍යොදර් ඔවුන්ට දන්වා සිටියේය.

"මේ ඉදිකිරීමේ ව්‍යාපාරය අද සිට යුද්ධමය තත්ත්වයකට පරිවර්තනය කරමු." ෂුක්රායි කීවේය. විශේෂ කාර්යභාර සංවිධානයකට සියලුම පාක්ෂික සහෝදරවරු අද සිට අයත් වෙනවා. මෙහි ප්‍රධාන සංවිධායකයා දුබාවා සහෝදරයාය.

ශ්‍රම නඩ හයට නියමිත කාර්යයන් භාර කරනවා. ඉතිරි වැඩ කොටස හරියට හයට බෙදලා කොටසක් බැගින් නඩයකට භාර දෙනවා. ජනවාරි 1 ද වන විට සියලු නඩ තමන්ට අයත් කටයුතු සම්පූර්ණ කරන්නට ඕන. පළමුවෙන්ම වැඩ සම්පූර්ණ කරන කණ්ඩායමට නගරයට ගිහිල්ලා විවේක ගැනීමට අයිතියත් තියෙනවා. එම කණ්ඩායමේ ඉතාම හොඳ කම්කරුවාට රතු ධජයේ සම්මානය පිරිනමන ලෙස ගුබෙර්නියා කමිටුවේ සභාපති මණ්ඩලය සමස්ත උක්රයින මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුවෙන් ඉල්ලීමක් කරනු ඇති." ෂුක්රායි කීය.

ශ්‍රම නඩ හයට නායකයන් පත් කළේ ය. පළමුවැනි නඩයේ නායකයා පන්ක්‍රාතොව් සහෝදරයා. දෙවැන්නේ නායකයා දුබාවා සහෝදරයා. තෙවැන්නේ නායකයා හමූතොව් සහෝදරයා. හතරවැන්නේ නායකයා ලගූටින් සහෝදරයා. හයවැන්නේ නායකයා ඕකුන්යෙව් සහෝදරයා.

"ඉදිකිරීමේ ව්‍යාපාරයේ නායකයා හැටියට එහි දෘෂ්ටිමය නායකයා හා ප්‍රධාන සංවිධායකයා වූ අන්තොන් නිකීපොරොවිච් තෝකරෙව් සහෝදරයා හැමදම ක්‍රියා කරනු ඇතැයි" කතාව අවසානයේදී ෂුක්රායි පැවසීය.

කුරුලු රැනක් හිටිහැටියේම ඉගිළෙන්නාක් මෙන් අත්පොළසන් දෙන්නට වූහ. දැඩි මුහුණු උපශාන්ත ගතියකින් මඳ සිනා පෑවෝය. බැරෑරුම් ගති ඇති මිනිහෙක් කතාව අවසානයේදී විහිළු කරමින් කතා කිරීම නිසා නොසන්සුන් අවධානය තුනී වී ගොස් සිනාසීම් ඇති විය.

ෂුක්රායි හා අකීම් රිය දක්වා ගොස් හැරලීමට මිනිස්සු විසිදෙනෙක් පමණ ගියහ.

ෂුක්රායි, කොර්චාගින්ගෙන් සමුගනිමින් හිමෙන් පිරී ඇති ඔහුගේ ගලෝෂිය[1] දෙස බලා පහත් හඬින් මෙසේ කීවේය:

"නුඹට මම සපත්තු කුට්ටමක් එවන්නම්. නුඹගේ කකුල් හීතලට දරදඬු වෙලා නැහැ නේද?"

"පේන්නෙ නම් ඒ වගේ තමා. කකුල් ඉදිමෙන්ට පටන් අරගෙන." පාවෙල් කොර්චාගින් පිළිතුරු වශයෙන් කීය. තමා බොහෝ කල් සිට කරන ඉල්ලීමක් ඔහුට මතක් වූයෙන්, ඔහු ජ්යොදර්ගේ කබා අතක් අල්ලා ගත්තේය.

"නුඹ මගේ පිස්තෝලයට පතොරොම් කීපයක් දෙනවද?

---

1 ගලෝෂි : සාමාන්‍ය සපත්තු තෙතමනයෙන් ආරක්ෂා කිරීම සඳහා පාවිච්චි කරන රබර් සපත්තු කවර වර්ගයකි. අනුවාදක

තුනමයි ඉතිරිවෙලා තියෙන්නෙ."

ෂුක්රායි කනගාටුව පළකරමින් හිස වැනුවද, පාවෙල්ගේ බලාපොරොත්තු රහිත දෙනෙත් දැක, කිසිවක් කල්පනා නොකොට සිය 'මවුසර්' පිස්තෝලය සහිත බඳ පටිය ගැලවීය:

"මෙන්න, නුඹට මගෙන් තෑග්ගක්."

ඔහු බොහෝ කලක් බලාපොරොත්තු වෙමින් සිටි බඳ පටිය සහිත මවුසරය ෂුක්රායි ඔහුගේ ගෙලට දැම්මේය.

"ගනින්, ගනින්! නුඹ මවුසරයට දැන් බොහොම කාලයක් තිස්සේ ඇස් ගහගෙන හිටියා. නුඹ ඕකෙන් අපේ අයට විතරක් වෙඩි නොතියන්න වග බලා ගනින්. මෙන්න ඒකට තව මුනිස්සම් සැට් තුනකුත්."

රැස්ව සිටින්නෝ පාවෙල් දෙස ඊර්ෂ්‍යාවෙන් බලන්නට වූහ. එකෙක් කෑගැසීය,

"පාවෙල්, හිම සපත්තු දෙකකටයි, බැටළු හමින් කළ හිම කබායකටයි මවුසරය මාරු කර ගනිමු."

පන්ක්රාතොව් මුරණ්ඩු ලෙස පාවෙල් පිටුපසින් තල්ලු කළේය.

"පෙල්ට් හිම සපත්තු කුට්ටමකට මාරු කර ගනිමු. යකෝ ගලෝෂ් ඇඳගෙන හිටියොත් නුඹ නත්තල් වෙනකොට මැරිලා යාවි."

රේල් ට්‍රොලියේ පඩියක් මත කකුලක් තබා ගත් ප්යොදර් ෂුක්රායි තෑගි දුන් 'මවුසරය' සඳහා අවසර පතක් ලියුවේය.

★

පසු දින හිමිදිරි පාන්දර අවි සහිත දුම්රියක් ස්විච් යතුරු හඬ නංවමින් දුම්රිය ස්ථානය වෙත ළඟා විය. දුම්රියේ ඇන්ජිම සුදෝසුදු වාෂ්ප පිට කළෙන්, එය පිරිසිදු ශීතල වාතය සමඟ එක් වී අතුරුදහන් විය. වානේමය මැදිරිවලින් සම් කබා හැඳගත් මිනිස්සු පිටවූහ. පැය කීපයක් ගත වත්ම, පුපුරවන කණ්ඩායමට අයත් මිනිස්සු තිදෙනෙක් දිගැති සේවනූල් සහිත විශාල වට්ටක්කා ගෙඩි දෙකක් වැනි පුපුරන බෝම්බ දෙකක් කඳුගැටය දෙපැත්තේ ගැඹුරු වළක් හාරා සවි කළහ. අනතුරුව ඔවුහු අනතුරු හැඟවීමේ වෙඩි කීපයක් තැබූහ. එවිට බියජනක කුඩා කඳුගැටයෙන් ඉවතට මිනිස්සු දිව ගියහ. සේවනූලට ගිනි තැබී ය. ඒවායින් ස්ඵුර දීපනයක් ඇති විය.

සිය ගණනක් මිනිස්සුන්ගේ හදවත් මොහොතකට

තද වුණාක් මෙනි. විනාඩියක දෙකක වේදනා සහගත බලාපොරොත්තුවකි. ඉක්බිති මහපොළොව කම්පනය විය. මහා බලවේගයක් විසින් කඳුගැටයේ මුදුන විනාශ කැරිණි. පස් ගොඩවල් අහස උසට විසිවිය. දෙවැනි පිපිරීම පළමුවැන්නට වඩා බලගතු විය. ගෙරවීමකට සමාන එම හඬ නිසා අවට වනයේ දෝංකාරයක් පැන නැඟී කුඩා කඳු ගැටය පුපුරා කෑලිවලට කැඩී යන විට ඇති වූ හඬත් සමඟ එකතුවී විවිධ හඬවල් ඇති කළේය.

මොහොතකට පෙර කඳුගැටය තිබුණු තැන දැන් වළකි. මීටර දසක ගණනක් දුරට සුදෝසුදු හිම සමඟ පස්කැට මිශ්‍ර විණි.

නාරාස්න හා උදලු ගත් මිනිස්සු වෙඩි පුපුරා සෑදූ වළ දෙසට ගියහ.

★

ෂුක්රායි ගිය පසු ඉදිකරන ස්ථානයේ උග්‍ර තරගයක් ඇතිවිය. ශ්‍රම නඩ අතර පළමුවැනි ස්ථානය සඳහා තරගයක් ඇරැඹිණි.

අරුණෝදයට බොහෝ වේලාවකට පෙර අවදිවුණු කොර්චාගින් කිසිවකුට නෑසෙන සේ නිහඬව නැඟිට සිට, දැඩි ශීතල නිසා හිරිවැටී දරදඬු වී ඇති දෙපා අද්දමින් මුළුතැන් ගෙය දෙසට ගියේය. තේ සඳහා බඳුනක වතුර උණුකොට නඩයේ සාමාජිකයන් අවදි කළේය.

අනික් කණ්ඩායම් නැඟිට සිටි විට අවට එළිය වැටී තිබිණි.

දුබාවා තම ශ්‍රම නඩයේ සාමාජිකයන් සමඟ වාඩි වී තේ බොමින් සිටින විට, සෙනඟ පීරාගෙන පන්ක්‍රාතොව් ඔහු ළඟට ආවේය:

"මිත්‍යායි, නුඹ දැක්කද, පාව්කා එයාගේ නඩය රෑ පාන්දරින්ම කූද්දලා වැඩට ගෙන ගියා. දැනටම ඒ ගොල්ල යාර විස්සක් විතර මඟ හදලා ඇති. දුම්රිය අලුත්වැඩියා කරන කම්හලේ කොල්ලන් සමඟ ඔහු විසිපස් වෙනිදට වැඩ සම්පූර්ණ කරන්ට තීරණය කර තියෙනවා කියලා දැන ගන්ට ලැබුණා. ඔහු අපව අන්ත පරාජයකට පත් කිරීමටයි යන්නේ. ඒ සෙල්ලම් මා එක්ක හරි යන්නේ නැහැ!" ඔහු රොස්වී පැවැසීය.

දුබාවා නොරිසි ලෙස මඳ සිනාවක් පෑවේය. දුම්රිය අලුත්වැඩියා කරන කම්හලේ තරුණයන්ගේ ක්‍රියාව නිසා

ගඟ තොටුපළේ කණ්ඩායමේ ලේකම් තැන අමනාපයට පත් වූයේ මන්දැයි ඔහු මැනවින් දනී. සැබැවින්ම දූබාවාගේ මිතුරකු වන පාවෙල් ඔහුද පසෙකට දමමින් ඉදිරියට ගොස් ඇත. එකද වචනයකුදු නොකියා පාවෙල් ඉතිරි ශ්‍රම නඩවලට අභියෝගයක් කළේය.

"යාළුකම යාළුකමටයි. තරගය පටන් ගත්තම යාළුකම් නැහැ." පන්ක්‍රාතොව් කීවේය.

මධ්‍යාහ්න වන විට, දැඩි උනන්දුවකින් වැඩ කළ කොර්චාගින්ගේ ශ්‍රම නඩයට හිටිහැටියේම බාධා ඇති විය. තුවක්කු රැක බලාගෙන සිටි මුරකරුවා ගස් අතරින් අසරු සෙබළුන් එන සැටි දකින්නේ, අනතුරු හැඟවීමේ වෙඩිල්ලක් තැබීය.

"සහෝදරවරුනි, අවි ගනිල්ලා! පල්හොරු ඇවිල්ලා!" කෑ ගැසූ පාවෙල් උදැල්ල වීසිකොට ඔහුගේ 'මවුසරය' එල්ලා තිබුණු ගස දෙසට දිව ගියේය.

තමන්ගේ රයිපල් තුවක්කු අතට ගත් නඩය පීලි අයිනේ වූ හිම ගොඩ මත වැතිර ගත්තේය. ඉදිරියෙන් ආ අසරු සෙබළු හිස් වැසුම් වැනූහ. එකෙක් කෑගැසීය:

"නැවතියව්! සහෝදරවරුනි, අපි නුඹලාගෙ උදවිය!"

රතු තරු සහිත බුඩ්ඕනි තොප්පි දමා ගත් අසරු සෙබළු පනස් දෙනෙක් පමණ මඟ ඔස්සේ ඉදිරියට ආහ.

පුසිරේව්ස්කිගේ රෙජිමේන්තු හමුදාවේ සේනාංකයක් වැඩ කරන කම්කරුවන් බැලීමට පැමිණ ඇත. සේනාංක නායකයාගේ අසුගේ එක් කනක් කැපී ඇති සැටි පාවෙල් කොර්චාගින් අවධානය කළේය. අළු පැහැති ලස්සන වෙළඹක වූ ඇගේ නළලේ සුදු පැහැති ලපයකි. අසරු සෙබළා පිටින් ගෙන සිටි උඟ හැල්මේ යමින් 'නැටීය'. පාවෙල් ඉදිරියට පැන වෙළඹගේ කටකලියාවෙන් අල්ලාගත් විට, වෙළඹ බියවී පස්සට පැන්නාය.

"ලීස්කා, මගේ හුරතල් කෙල්ලේ, ඔන්න නුඹව මුණ ගැසුණ තැන. වෙඩි පහරින් නුඹ මැරුණෙ නැහැ මගෙ, ලස්සන කෙල්ලේ!"

පාවෙල් වෙළඹගේ දිගැති සිහින් බෙල්ල අතගාමින්, වෙළඹගේ නාස්පුඩු කිති කැවීය. සේනාංක නායකයා ඉතා ඕනෑකමින් පාවෙල් දෙස බලා සිට ඔහු හැඳින ගෙන විමතියෙන් කෑ ගැසීය:

"ඇත්තටම මේ කොර්චාගින් නෙවැ...! නුඹ වෙළඹ

හඳුනාගත්තා. නුඹේ පරණ යාළුවා සෙරෙදව අමතක කළා. ආයුබෝවන් සහෝදරයා!"

★

ඒ අතර නගරයේ "යෙදවිය හැකි හැම බලයක්ම යෙදවීය. එය දුම්රිය මඟ සෑදීම ඉක්මන් කර විය. ෂාර්කි කොම්සොමොල් දිස්ත්‍රික් කමිටුවේ හැම පිරිමි සාමාජිකයකුව ම බොයාර්කාවලට යැවීය. සලෝමෙන්කාවල ඉතිරි වූයේ තරුණියන් පමණකි. දුම්රිය පාසලින් සිසුන් පිරිසක් ඉදිකිරීමේ වැඩවලට යැවීමට ෂාර්කි සමත් විය.

මේ සියල්ල ගැන අකීම්ට වාර්තා කළ ඔහු විහිළු කරමින් මෙසේ පැවසීය:

"දැන් මම කාන්තා නිර්ධන පන්තිය සමඟ නැවතී ඉන්නවා. මා වෙනුවට තාල්යා ලගුටිනාව පත්කොට 'කාන්තා අංශය' කියා නාම පුවරුවක් ගහලා මම බොයාර්කාවලට යන්නම්. මිනිහකු වන මට ගෑනු මැදට වෙලා තනිවම ඉඳීම ලේසි නැත. කෙල්ලෝ මා දිහා සැකයෙන් බලනවා. උනුන් අතර මෙහෙම කියා ගන්නවා ඇති: 'හැම එක්කෙනාවම යවලා, ඔහු විතරක් මෙතැන ඉන්නවා. හොර අලියා.' එහෙම නැතිනම් වඩාත් නරක යමක් කියනවා ඇති. මට එහි යාමට අවසර දෙන්න."

අකීම් සිනාසී ෂාර්කිගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය.

බොයාර්කාවට මිනිස්සු පැමිණියහ. දුම්රිය පාසලේ සිසුහු හැට දෙනෙක්ද එහි ආහ.

අලුතින් වැඩට පැමිණි සිසුන් සඳහා මගීන් ගෙන යන මැදිරි හතරක් යැවීමට දුම්රිය පරිපාලන සංවිධානය කැමති කර ගනු ලැබුවේ ප්යොදර් ෂුක්රායි විසිනි.

දුබාවාගේ ශ්‍රම නඩය වැඩවලින් අස් කොට, දුම්රිය යන්ත්‍ර සහ පෙතැලි රිය හැටපහක් ගෙන ඒමට පූෂ වදීට්සවලට යැවීය. මේ කාර්යය ඉටු කිරීම තම කොටසේ වැඩ සම්පූර්ණ කිරීම ලෙස සැලකීය.

පිටවී යාමට පෙර දුබාවා, ක්ලාවිචෙක් නගරයෙන් ගෙන්වා අලුතින් සංවිධාන කළ ශ්‍රම නඩයේ නායකත්වය දුබාවාට චෙක් ජාතික ක්ලාවිචෙක් මතක්වීමේ නියම හේතුන් ගැන සැක නොකළ තෝකරෙව් ඔහුගේ ඉල්ලීම පරිදි නියමයක් කළේය. එයට හේතුව වූයේ සොලෝමෙන්කා සිට පැමිණි අය සමඟ ආන්නා විසින් දිමිත්‍රි දුබාවා වෙත එවන ලද ලිපියකි:

"දිමිත්‍රි!" ආන්නා ලියුවාය. "මාත්, ක්ලාව්චෙකුත් එකතු වෙලා නුඹලාට පොත් ගොඩක් හොයා ගත්තා. නුඹටත්, බොයාර්කාවල වැඩ කරන සියලුම ශ්‍රම වීරයන්ටත් අපි සුබ පැතුම් එවමු. නුඹලා කොතරම් අගනා වීරයෝද! නුඹලාට ශක්තිය හා බලය පතමු. ඊයේ ගබඩාවලින් අවසාන දර සලාකය නගර වැසියන්ට බෙදා දුන්නා. ක්ලාව්චෙක් නුඹලාට සුබ පැතුම් එවනවා. ඔහු ඉතා හොඳ ඉලන්දාරියෙක්! ඔහු නුඹලාට තනිවම පාන් පුච්චනවා. ඒක වෙන කාටවත් කරන්ට ඔහු ඉඩ තියන්නෙ නැහැ. ඔහුම පිටි සුද්ද කරනවා. යන්ත්‍රයෙන් පිටි අනන්නෙත් ඔහුමයි. ඔහු කොහෙන්දෝ බොහොම හොඳ පිටි වගයක් ගෙනාවා. බොහොම රස පාන් ඔහු පුච්චනවා. අපට ලැබෙන පාන් වගේ නොවෙයි. ඉගෙනීමේ වැඩ ටික ටික දියුණු වෙනවා. එහෙත්, බොහෝ විට හැම දෙයක් ගැනම කතා කිරීම විශේෂයෙන්ම නුඹලා ගැන කතා කිරීම තමා අප කරන වැඩේ. හවසට අපේ කට්ටිය අපේ ගෙදර රැස්වෙනවා: ලගුටිනා, අර්ට්යූහින්, ක්ලාව්චෙක් සමහර දවස්වලට ෂාර්කි. තෝකරෙව් තරුණියන් දුම්රිය මාර්ගය හැදීමේ වැඩට බඳවා ගැනීමට විරුද්ධ වීම නිසා අපේ කෙල්ලෝ කෝප වී සිටිනවා. අනික් අය වගේම සියලු දුක් කරදරවලට කෙල්ලන්ටත් මූණ පාන්ට පුළුවන් කියලා ඔවුන් කියනවා. තාත්තාගේ ඇඳුම් ඇඳගෙන බොයාර්කාවලට යාමට ලෑස්ති වන බව තාල්යා ලගුටිනා කියනවා. 'පුළුවන් නම් මාව පන්නා දමාපුවාවේ.'

ඈ එහෙම කළොත් මා පුදුම වන්නෙ නැහැ. කළුවන් ඇස් ඇති නුඹේ යාළුවාට මගේ සුබ පැතුම්.

★

හිම කුණාටුව හිටිහැටියේම ඇරැඹිණි. අළු පැහැති වලාකුළු පහතින් පියාඹන්නට වූ අතර, හිම පියලි වඩාත් ඝන විය. හවස් වත්ම, හිම කුණාටු දුම්බටවලට වැදී හූ හඬක් නැඟීය. තුරු අතර වැදී ඝෝෂාවක් ඇති කළේය. අහසේ පාවෙන හිම පියලි පලවා හරිමින්, කුණාටුව වනයේ දෝංකාරයක් ඇති කොට තර්ජනාත්මක හඬක් නැංවීය.

රෑ තිස්සේ සුළි සුළං සහිත කුණාටුව වනය හා අවට පෙදෙස දෙවනත් කළේය. ශීතල වූ මිනිසුන්ගේ ඇටකටු පවා හිරි වැටිණි. රෑ මුළුල්ලේම ගිනි උදුන් රත් කළද, දුම්රිය පොළේ ගරා වැටුණු ගොඩනැඟිල්ල උණුසුම් කළ නොහැකි

විය. මිනිස්සු ශීතලේ ගැහෙන්නට වූහ.

උදෑසන තමන්ට අයත් පෙදෙස්වලට යාම සඳහා හිම අතු ගා දැමීමට මිනිසුන්ට සිදු විය. අඩි කීපයක් උසට හිම වැටී තිබිණි. අහස නිල් පැහැතිය. වලා රහිතය. හිරු බැබැළිණි.

පාවෙල් කොර්චාගින්ගේ කණ්ඩායම තම කොටස වසා ඇති හිම සියල්ල අතු ගා දමන්නට විය. දැඩි ශීතල නිසා කොතරම් කටුක වේදනාවක් ඇතිවේද යන්න පාවෙල්ට වැටහුණේ දැන්ය. ඕකුන්යෙව් ඔහුට දුන් පරණ කබාය තව දුරටත් ඔහුට උණුසුම නොදෙයි. ගලෝෂිය හිමෙන් පිරිලා ය. නිතර හිම ගොඩවලට එරෙන ගලෝෂිය නැතිවුණු වාර අපමණය. අනික් කකුලේ සපත්තුව අඩිය පිටින් ගැලවී යාමේ තර්ජනයට මූණ පෑවේය. සිමෙන්ති පොළොව මත වැතිර නිදා ගැනීම නිසා ඔහුගේ බෙල්ලේ විශාල ලේ ගෙඩි දෙකක් මතුවිය. බෙල්ලේ බැඳ ගැනීම සඳහා ඔහුට තෝකරෙව් තම තුවාය දුන්නේය.

දුබල වූ පාවෙල්ගේ දෙනෙත් රුදාවෙන් පෙළී රතුවිය. ඔහු ඉමහත් වේගයකින් ලී උදැල්ලෙන් හිම කැටි ඇද දමමින් සිටියේය.

මේ වේලාවේදී දුම්රිය ස්ථානයට මගීන් රැගත් දුම්රියක් පැමිණියේය. තාපන ද්‍රව්‍ය රහිත දුම්රිය යන්ත්‍රය හති ලන්නාක් මෙන් සෙමින්, සෙමින් මැදිරි කීපය ස්ථානයට ගෙනාවේය. දුම්රිය යන්ත්‍රයේ බොයිලේරුව අසල වූ තාපන ගබඩාවේ එකද දර කෑල්ලක්වත් නොතිබිණි. අවසාන දර කැබැලි කීපය ගින්නෙහි දැවෙයි.

"අපට දර දෙන්න! නැත්නම් තාපන ද්‍රව්‍ය ලැබෙන තුරු මේ දුම්රිය ෂෙඩ් එකට දාන්න!" දුම්රිය යන්ත්‍රය පදවන්නා දුම්රිය ස්ථානාධිපතිට කෑගසා කීවේය.

දුම්රිය, මහමඟින් ඈත් කොට අතුරු මඟකට දැම්මේය. අමනාපයට පත් වී සිටින මගීන්ට දුම්රිය තවත් දුර නොයෑමේ හේතු දැන්වීය. දුම්රිය මැදිරිවල පිරී ඉතිරී සිටි මගීහු බැණ වදිමින් රොස් වූහ.

"අර මහල්ලා සමඟ කතා කර බලපල්ලා!" යි දුම්රිය ස්ථානාධිපතිවරයා වේදිකාවේ ඇවිදිමින් සිටි තෝකරෙව් පෙන්වමින් දුම්රිය ගාඩ්වරුන්ට පැවසීය. "අර වේදිකාවේ ඇවිදින්නේ. එයා තමා මෙතැන ඉදි කිරීමේ වැඩවල ලොක්කා. හිම යානාවලින් දර ගෙනල්ලා දුම්රියට පැටවීමට ඔහුට අණ කරන්න පුළුවනි. ඒ ගොල්ල සිල්පර වෙනුවට රේල්

පාර හරහා දර කොට දනවා." ඔවුහු තෝකරෙව් හමු වූහ.

"දර දෙන්නම්, හැබැයි නිකම් නොවෙයි. ඒවා අපේ ඉදිකිරීමට අවශ්‍ය දේ. හිම වැටුණු හන්ද අපේ වැඩ ඇන හිටලා. දුම්රියේ මගීන් හය හත් සීයක් ඉන්නවා. ළමයින්ට සහ ස්ත්‍රීන්ට මැදිරිවලට වෙලා ඉන්ට පුළුවනි. පිරිමින් උදලු අතට අරගෙන වැඩ කළ යුතුයි. හවස් වන තුරුම හිම ශුද්ධ කළ යුතුයි. ඔවුන් ප්‍රතික්ෂේප කළොත් අලුත් අවුරුද්ද වන තුරු මෙතන ලගින්ට සිදුවේවි." තෝකරෙව් ගාඩ්වරුන්ට විස්තර කළේය.

★

"අන්න බලාපල්ලා! සෙනඟ මහ ගොඩක් එනවා. බලාපල්ලා! ගෑනුත් එනවා!" කොර්චාගින්ට පිටුපසින් වූ සගයෝ මවිත වී කීහ.

පාවෙල් හැරී බැලුවේය.

"මෙන්න තුඹට මිනිසුන් සිය දෙනෙක්. ඔවුන්ට වැඩ දීපන්. වැඩ කරනවද කියලා හොයා බලපන්." පාවෙල් වෙත පැමිණි තෝකරෙව් පැවසීය.

අලුතින් පැමිණි මිනිසුන්ට පාවෙල් වැඩ පවරා දුන්නේය. එක්තරා උස මිනිහෙක් කෝපයෙන් උදැල්ල ඒ මේ අත හරවමින් සිටියේය. ඔහුගේ උස් කය දුම්රිය නිල ඇඳුමකින් වැසී තිබිණි. කර වටා ලොම් සහිත පටියකි. හිසෙහි කරාකුල් නමැති වටිනා හිම තොප්පියකි. සීල් සතෙකුගේ හමින් කළ හිස්වැස්මක් දමාගෙන සිටි තරුණ ගැහැනියකට කතා කළ උසැති මිනිහා විරුද්ධත්වය ප්‍රකාශ කළේයඃ

"මම හිම සුද්ද කරන්නෙ නැහැ. මට බල කරන්න කාටවත් අයිතියක් නැහැ. දුම්රිය ඉංජිනේරුවරයකු හැටියට මගෙන් ඉල්ලා හිටියොත්, මට පුළුවනි වැඩවලට අණ කරන්න. ඒවා මෙහෙයවන්නට තුඹයි, මායි හිම සුද්ද නොකළ යුතුයි. නීතිවලට එහෙම වැඩකළ යුතුයි කියලා නැහැ. නාකියා නීති විරෝධී වැඩ කරනවා. එයාට මම නිසි පාඩම් උගන්වන්නම්, තුඹලාගේ නඩ නායකයා කවුද?" ළඟම සිටි කම්කරුවාගෙන් ඔහු විමසීය.

පාවෙල් කොර්චාගින් පැමිණියේය.

"රටවැසිය, තුඹ වැඩ නොකරන්නෙ මොකද?"

උසැති මිනිහා පාවෙල්ගේ හිස සිට දෙපතුල දක්වා අවඥා සහගත බැල්මක් හෙළීය.

"තමුසේ කවුද?"

"මම කම්කරුවෙක්."

"එහෙනම් මට නුඹ සමග කතා කිරීමට දෙයක් නැහැ. නඩ නායකයාව හරි වෙන කාව හරි ලොක්කකු එවනවා...

පාවෙල් ඔහු දෙස ඔරවා බැලීය.

"වැඩ කරන්ට බැරිනම්, කරන්ට එපා. නුඹගේ ටිකට් පතේ අපේ අත්සන නැතිව නුඹට ආපහු දුම්රියේ වාඩිවෙන්නට බැහැ. ඉදිකිරීම් වැඩ භාර ප්‍රධානියාගේ අණ එයයි."

"කාන්තාව, ඔබත් වැඩ කිරීම ප්‍රතික්ෂේප කරනවද?" මෙසේ ඇසූ පාවෙල් ගැහැනිය වෙත හැරුණේය. මොහොතකට ඔහු අන්දමන්ද විය. ඔහු ඉදිරියේ සිටියේ තෝන්යා තුමානොවාය.

වැරැහැලි ඇඳගෙන සිටි මේ පුද්ගලයා කොර්චාගින් බව ඇය හැඳින ගත්තේ ඉතා අපහසුවකිනි. ඉරීගිය, කඩමාලු ඇඳගෙන සිටි ඔහුගේ දෙපාවල දෙවර්ගයකට අයත් පරණ සපත්තුය. ගෙළ වටා ඇති තුවාය කිලිටි ගොඩකි. දවස් කීපයක් තිස්සේ මුහුණ සෝදා නැත. ගිනි පුපුරු පිටකරන ඇස් පමණක් පෙරසේ ම දීප්තිමත්ය. ඔහුගේ දෙනෙත්. පාදඩයකුට සමාන වැරැහැලි හැඳගත් මේ පුද්ගලයා නුදුරු අතීතයේදී ඇගේ ආදරවන්තයාව සිටියේය. කොතරම් වෙනස් වෙලා ද!

නොබෝ දිනකට පෙර විවාහ වූ තෝන්යා තුමානොවා තම සැමියාත් සමඟ ලොකු නගරයකට යමින් සිටී. එහි තම සැමියාට විධායක මණ්ඩලයකට ලොකු රස්සාවක් ලැබී ඇත. තරුණ වියේ දී තමා ආලය කළ පුද්ගලයා හමුවුණේ මෙහිදී ය. ඔහුට අතට'ත දීමට පවා පිළිකුලක් ඇ තුළ හටගත්තේ ය. ඇගේ සැමියා වන වසීලි කුමක් සිතාවිද? කොර්චාගින් මෙතරම් පහත වැටී සිටීම අසතුටු කරුණකි. පස් හෑරීමට වඩා උසස් තැනක් තරුණ ගිනි උදුන් කම්කරුවාට නොලැබෙන හැඩයි.

ඇ ලජ්ජාවෙන් රතුවෙමින් තීරණයක් ගැනීමට අපොහොසත්ව සිටගෙන සිටියාය. තම බිරිඳ දෙස ඇසි පිය නොහෙළා බලා සිටින වැරැහැලි ඇඳගත් පුද්ගලයාගේ හැසිරීම උද්දච්ච යැයි සිතූ දුම්රිය ඉංජිනේරුවා කුපිත විය. ඔහු උදැල්ල බිම දමා තෝන්යා ළඟට පැමිණියේය .

"තෝන්යා, යමු, මට සන්සුන්ව මේ ලසරෝනි දිහා බලාගෙන ඉන්ට බැහැ."

කොර්චාගින් "ජුසෙප්පෙ ගැරිබෝල්ඩි" නවකතාව කියවා

ඇති බැවින් ලසරෝනි කවුදැයි දැන සිටියේය.

"මම ලසරෝනි නම්, නුඹ කාලකණ්ණි ධනපතියෙක්" ගොරහැඩි ලෙස ඔහුට පිළිතුරු දී කොර්චාගින් තෝන්යා දෙස බලා දැඩි ලෙස මෙසේ කීයඃ "උදැල්ල අරගන්න, තුමානොවා සහෝදරිය, පෙළට සිටගෙන වැඩ කරන්න. මේ තරබාරු මී හරකාගෙන් නිදසුන් ගන්න එපා. සමාවෙන්න ඔහු ඔබගේ කවුදැයි මා දන්නෙ නැහැ."

පාවෙල් තෝන්යා පයලා සිටි ලොම් සහිත හිම සපත්තු දෙස බලා අසතුටු ලෙස මඳ සිනාවක් පා ආවාට ගියාට මෙන් කතා කළේයඃ

"මෙතැන නවතින ලෙස මම උපදෙස් දෙන්නෙ නැහැ. මේ ළඟදී පල්හොරු අපට පහර දුන්නා."

ඔහු ආපසු හැරී ගලෝෂියා හඬ නංවමින් තම නඩය දෙසට ගියේය.

ඔහුගේ අවසාන වචන නිසා දුම්රිය ඉංජිනේරුවාගේ සිත තරමක් පැහැදිණි.

නැවතී වැඩ කළ යුතු බව තම සැමියාට ඒත්තු ගැන්වීමට තෝන්යා සමත් වූවාය.

හවස වැඩ අවසන් කළ පසු, දුම්රිය ස්ථානයට හැරී යන විට තෝන්යාගේ සැමියා ඉක්මනින්ම ගියේ දුම්රිය මැදිරියේ ආසන දෙකක් අල්ලා ගැනීමටය. කම්කරුවන්ට යන්ට ඉඩදී තෝන්යා නැවතුණාය. හැමටම පිටුපසින් උදැල්ලට වාරු වෙමින් විඩාපත් පාවෙල් කොර්චාගින් පා නැඟීය.

"ආයුබෝවන්, පව්ලූෂා. නුඹ මෙතරම් කනගාටුදායක තත්ත්වයක වැටී ඉන්නවා දැකීමට මා නම් බලාපොරොත්තු වුණේ නැහැ. පස් කපනවාට වඩා මේ ආණ්ඩුව නුඹේ සේවය ඉහළින් පිළිනොගත්තේ මන්ද? මම හිතුවේ දැන් මීට බොහෝ කලකට ඉස්සෙල්ලා නුඹ කොමිසාර් හරි වෙනයම් එවැනි ඉහළ පදවියක් දරනවා ඇතැයි කියලයි. නුඹගේ ජීවිතය කොතරම් අවාසනාවන්ත වුණාද?.." ඔහු සමඟ ගමන් කළ තෝන්යා පැවසුවාය.

පාවෙල් නැවතී සිට තෝන්යා දෙස විමතියෙන් බැලී ය.

"නුඹත් මේ වගේ තත්ත්වයකට වැටී ඉන්නවා දැකීමට මා බලාපොරොත්තු වුණේ නැහැ... නිකම් ජාඩි දලා වගේ" වඩාත් මුදු වචනයක් පාවෙල්ට හසුවිය.

තෝන්යාගේ දෙකන් රත්විය.

"නුඹ හැමදා මෙන්ම අදත් රළුයි."

කොර්චාගින් උදැල්ල කර තබාගෙන පියවර කීපයක් ගිය පසු පිළිතුරු දුන්නේය:

"තුමානොවා සහෝදරිය, ඔබගේ ආචාරශීලි ගතිවලට වඩා මගේ රළු බව බොහොම සැහැල්ලුයි. මගේ ජීවිතය ගැන කලබල වෙන්ට කිසි දෙයක් නැහැ. නිසි ලෙස වැඩ කෙරෙනවා. නමුත්, ඔබගේ ජීවිතය මා හිතුවාට වඩා අයහපත් ලෙස සිදුවී තිබෙනවා. මීට අවුරුදු දෙකකට විතර ඉස්සෙල්ලා ඔබ මීට වඩා හොඳට හිටියා. කම්කරුවකුට අත දී ආචාර කිරීමට ලජ්ජා වුණේ නැහැ. දැන් ඔබ ළඟ කපුරු පුස්ඹයි. හිතට අවංකවම මම කියන්නම්, නුඹ සමඟ කතා කිරීමට මට ඇති දෙයක් නැහැ."

★

පාවෙල්ට අර්ට්යොම්ගෙන් ලිපියක් ලැබිණි. තමා ඉක්මනින්ම විවාහ වන බැවින් කෙසේ හෝ පාවෙල්ට විවාමඟුලට පැමිණෙන ලෙස අර්ට්යොම් දන්වා සිටියේය.

දැඩි සුළඟ නිසා පාවෙල් අත තිබුණු ලිපි කැබැල්ල ගිලිහිණි. එය කුරුල්ලකු සේ පියාඹන්නට විය. විවාමඟුලට සහභාගි විය නොහැකිය. එසේ යාම ගැන හිතන්නටවත් පුළුවන්ද? වලසකු බඳු පන්ක්‍රාතොව් සිය ශ්‍රම නඩය මෙහෙයවා පාවෙල්ගේ නඩය පරදවමින්, හැම දෙනෙකුම මවිතයට පත් කරවමින් ඉදිරියට යාමට පටන් ගත්තේ ඊයේ සිටය. ගඟ තොටුපළේ කුලී කම්කරුවකු වූ ඔහු සුපුරුදු උපශාන්ත ගතිවලට ආයුබෝවන් කියමින් තම සගයන් වන 'තොටුපළ' කම්කරුවන් සමඟ එක් වී වියරු වේගයකින් වැඩ කළේය.

ඉදිකරන කම්කරුවන්ගේ දැඩි නිහඬතාව පතෝෂ්කින් ඉංජිනේරු තැන නිරීක්ෂණය කළේය. ඔහු තම නළලේ දහඩිය පිසදා ගනිමින් තමාගෙන්ම ප්‍රශ්න කළේය. "මේ මිනිසුන් කවුද? තේරුම් ගත නොහැකි මේ බලවේගය කුමක්ද? කාලගුණය තව අට දවසක් යහපත්ව තිබුණොත්, අපි දැව දඬු තොගය වෙත ළං වන්නෙමු. 'සියවසක් ජීවත් වෙයන්. සියවසක් ඉගෙන ගනින්, අවසානෙදී මෝඩයෙක් වෙනවා.' මේ මිනිස්සු සියලු වාර්තා තක්සේරු පරදවමින් වැඩ කරනවා."

තමා අවසාන වරට පිච්චූ පාන් තොගයද රැගෙන නගරයේ සිට ක්ලාව්චෙක් පැමිණියේය. තෝකරෙව් හමුවූ

පසු ඔහු කොර්දචාගින් සොයා ගියේය. මිතුරන් ලෙස ඔවුහු වැලඳ ගත්හ. ක්ලාව්චෙක් මඳ සිනා පාමින් මල්ලක් තුළින්, ස්වීඩනයේ සැදූ කහ පැහැති ලොම් සහිත වටිනා සම් කබායක් එළියට ගත්තේය. ඔහු හම් වාටියට අත්ලෙන් ගසා මෙසේ කීය:

"මේක නුඹට, කාගෙන්ද කියලා දන්නෙ නැත්ද?.. හා, හා! කොල්ලා, නුඹ හරිම මෝඩයෙක්. එය නුඹට රීතා උස්තිනෝවිච් එව්වා. නුඹ මෝඩයෙකු වගේ හීතලට අහුවෙන හන්ද. මේ කබාය ඔල්ෂින්ස්කි සහෝදරයා ඇට තෑගි දීපු එකක්. ඈ එය ඔහුගෙන් අරගෙන මා අතට දුන්නා. කොර්චාගින්ට දෙන්ටයි කිව්වා. නුඹ නිකම් කෝට් කබලක් ඇඳගෙන හීතලේ වැඩ කරන බව අකීම් ඇට කිව්වා. ඔල්ෂින්ස්කිගේ නහය ටිකක් නරක් වුණා. "ඒ සහෝදරයාට සෙබළ කබායක් යවන්ට මට පුළුවනි"යි ඔහු කීවා. එවිට රීතා හිනාවුණා: කබාය ඇඳගෙන කඩිසරව වැඩ කළ හැකි යි ඈ කිව්වා! ඉඳා අරගනින්!"

මවිතයට පත් පාවෙල් වටිනා කබාය අතින් ගෙන ස්ථිර බවකින් තොරව ශීතල නිසා හිරිවැටී ඇති තම සිරුර වසා ගනිමින් ඇඟ ලා ගත්තේය. සිනිඳු ලොම් නිසා ඔහුගේ පපුවද, දෙඋරද හණිකට උණුසුම් විය.

රීතා ඇගේ සටහන් පොතේ මෙසේ ලියුවාය:

"දෙසැම්බර් 20 ද.

සුළි සුළං සහිත කුණාටු එකිනෙක හමන්නට පටන් ගෙන ඇත. හිම කුණාටු සැරය. බොයාර්කාවල වැඩ කරන අය දැව දඬු වෙතට ළං වූවද, දැඩි කුණාටු නිසා ඉදිරියට යා නොහැකි විය. ඔවුහු හිම ගොඩේ ගිලුණහ. දැඩි ශීතලට අසුවුණු පස් කැපීම ඉතා අමාරුය. ඉතිරිව තිබුණේ කිලෝමීටර තුන් කාලක් පමණකි. එහෙත්, ඉතාම අමාරු කොටස එය විය.

තෝකරෙව් මෙසේ දැන්වීය: දුම්රිය මාර්ගය තනන කම්කරුවන් අතර උණ සන්නිපාතයට අසු වූවන් තුන් දෙනෙකි.

දෙසැම්බර් 22 ද

කොම්සොමොලයේ ගුබේර්නියා කමිටු රැස්වීමට බොයාර්කාවල සිට එකෙකුවත් ආවේ නැත. පල්හොරු බොයාර්කාවල සිට කිලෝමීටර් දහහතක් ඈතින් ආහාර දුම්රියක් පීලි පැන්නූහ. ආහාර කොමසාරිස් මණ්ඩලයේ නියෝජිතයගේ අණ අනුව දුම්රිය පාර සාදන කම්කරුවන් එහි යැවීය.

දෙසැම්බර් 23 ද

බොයාර්කාවලදී උණ සන්නිපාතයට ගොදුරුවූ තවත් හත් දෙනෙකු නගරයට එවා ඇත. ඒ අය අතර ඕකුන්යෙව්ද විය. මම දුම්රියපොළට ගියෙමි. හාර්කොව් දුම්රියක බපර්වල ගමන් කළ මඟීන් ශීතලට හසුවී හිරිවැටී මළ බැවින් ඒ සිරුරු එළියට ගත් සැටි දුටිමි. රෝහල්වල ශීතලය. සාපලත් හිම කුණාටුව! එය ඉවර වන්නේ කවදද?

දෙසැම්බර් 24 ද

මම ෂුක්රායි හමුවී පැමිණියෙමි. ඕර්ලික් ඔහුගේ මුළු පල්හොරු හමුදවම යොද බොයාර්කාවල අපේ කම්කරුවන්ට පහර දීම සත්‍යයකි. දෙපැයක් තිස්සේ දෙපක්ෂය අතර සටන් ඇවිළ පැවැතිණි. පල්හොරු රංචුව පණිවුඩ මාර්ග බිඳ දැමූහ. සැබෑ තොරතුරු ලබාගැනීමට ෂුක්රායිට පුළුවන් වුණේ අද උදෑසනය. පල්හොරුන් පන්නා දමා ඇත. තෝකරෙව්ගේ පපුව විදගෙන වෙඩි පහරක් වැදිලාය. අද ඔහු මෙහි ගෙනෙනු ඇත. එදින රැයෙහි මුර සේවයේ යෙදී සිටි ප්‍රධාන ප්‍රාන්ට්ස් ක්ලාව්චෙක් පල්හොරු විසින් කපා මරා දමන ලදි. පල්හොරු එන සැටි පළමුවෙන්ම දුටුවේ ඔහුය. ඔහු අනතුරු අඟවමින් සතුරන්ට වෙඩි තැබුවද, පාසල් ගොඩනැඟිල්ලට එමින් සිටි ඔහුට අසුන් පිට නැඟ ගත් හොරු පහර දී මරා දැමූහ. දුම්රිය මඟ සාදන කම්කරුවන්ගෙන් එකොළොස් දෙනෙක් තුවාල ලැබූහ. අසරු සේනාංක දෙකක් සහ අවි රැගත් දුම්රියක්ද දැන් එහි ගොස් ඇත.

දුම්රිය මඟ ඉදිකිරීමේ නායකයා හැටියට පන්ක්‍රාතොව් පත් කළේය. පූසිරේව්ස්කිගේ රතු රෙජිමේන්තු හමුදව ග්ලුබෝකි ගමේදී පල්හොරු හමුදවෙන් අඩක් අල්ලාගෙන ඔවුන් හැම එකකුම කපා මරා දැමීය. දුම්රියක් එනතුරු පවා නොසිට, පාක්ෂිකයන් නොවන ශිල්පීන් කොටසක් දුම්රිය මඟ දිගේ නගරය දක්වා ගමන් කළෝය.

දෙසැම්බර් 25 ද

තෝකරෙව් සහ තුවාල ලැබූ ඉතිරි අයවලුන් නගරයට ගෙනැවිත්, ඔවුන් චිකිත්සාගාර රෝහලට යැවිණි. දෙස්තරවරු තෝකරෙව් මහල්ලා ජීවත් කරවන බවට පොරොන්දු වූහ. ඔහුට සිහිය නැත. ඉතිරි අයගේ ජීවිත නැතිවීමේ අවදනමක් නැත.

බොයාර්කා සිට කොමියුනිස්ට් පක්ෂයේ ගුබේර්නියා කමිටුවට සහ අපට විදුලි පුවත් දෙකක් ලැබිණි:

"පල්හොරුන්ගේ ප්‍රහාරයට පිළිතුරු වශයෙන් පටු දුම්රිය මඟ ඉදිකරන කම්කරුවන් වන අපිද, 'සෝවියට් බලය සඳහා' නමැති අවිගත් දුම්රියේ සෙබළ පිරිසද, අසරු රෙජිමේන්තුවේ රතු සෙබළුද, එක්වී රැස්වීමක් පැවැත්වූයෙමු. සියලු බාධා නොතකා ජනවාරි පළමුවැනිදට දුම්රිය මඟ සාදා අවසන් කරන බවට පොරොන්දු වෙමු. සියලු ශක්තිය යොදා අපි වැඩ කරන්නෙමු. අප මෙහි එවූ කොමියුනිස්ට් පක්ෂයට ජයවේවා! රැස්වීමේ සභාපති කොර්චාගින්, ලේකම් මෙර්සින්.

යුද්ධාචාර ඇතිව සලෝමින්කාවලදී ක්ලාවිචෙක්ගේ සිරුර භූමදන කළේය."

★

බොහෝ කල් බලාපොරොත්තු වුණු දැවදඬු ලබා ගැනීමේ සිහිනය ළංවිය. එහෙත්, ඒ කරා ළං වූයේ වේදනා සහගත ලෙස සෙමිනිඃ හැමදම උණ සන්නිපාතය විසින් මිනිසුන් දහ දෙළොස් දෙනෙකු ගිලගන්නා ලදි.

මත්පැන් බී වෙරිවූ මිනිහකු සේ වැනෙමින්, නැමෙන පාද සහිතව කොර්චාගින් දුම්රිය ස්ථානයට පැමිණියේය. ඔහුට උණ ගැනුණේ මීට දවස් කීපයකට පෙර සිට වුවද ඔහු වැඩට ගියේය. එහෙත්, අද උණ රෝගය වෙනදට වඩා දැඩිව නැඟී සිටින බව ඔහුට දැනිණි.

ශ්‍රම නඩය බෙලහීන කළ උණ සන්නිපාත රෝගය පාවෙල්ටද වැලඳිණි. දවස් පහක් තිස්සේ ඔහුගේ ශක්තිමත් සිරුර රෝගයට එදිරිව සටන් කළේය. පිදුරු දැමූ සිමෙන්ති පොළොවෙන් නැඟිට සිටීමට සහ අනිකුත් සගයන් සමඟ එකතුව වැඩට යාමට ඔහුට ශක්තිය තිබිණි. ඔහුට ලැබුණු උණුසුම් කබාය හෝ ප්යොදර් ෂුක්රායි විසින් එවන ලද උණුසුම් හිම පාවහන් හෝ - ඒවා ශීතල නිසා හිරිවැටී තිබුණු පාවලට දැම්මේය - ඔහු බේරා ගැනීමට අසමත් විය.

පය තබන විට, ඔහුගේ පපුවට දැඩි වේදනාවක් දැනිණි. සිරුර වෙව්ලන්නට වූ අතර, දත් ගැටිණි. ඇස්වල කිසියම් අන්ධකාරයක් මතුවිණි. අවට ගස් කතුරු ඔන්චිල්ලාවක් සේ කරකැවෙන බවක් ඔහුට දැනේ.

ඔහු ඉතා අමාරුවෙන් දුම්රිය ස්ථානය දක්වා පා නැඟීය. වෙනදා නැති හඬක් නිසා ඔහු මවිත විය. බඩු ගෙනයන පෙතැලි රේල්රිය කීපයක්ම පෙළ ගැසී ඇත. දුම්රියෙන් පැමිණි මිනිස්සු, දුම්රිය යන්ත්‍ර, රේල්පීලි, සිල්පර ආදිය

ගොඩබාන්නට වූහ. ඔහු තවත් පියවර කීපයක් තබත්ම සමබරව සිටගැනීමට අපොහොසත් වූයෙන් බිම ඇද වැටුණේය. හිස බිමට වැදෙන විට, දුබල වේදනාවක් දැනිණි. හිම ගොඩක්, ගිනි ගෙන දැවෙන කම්මුල සිප ගත්තෙන් ඔහුට සනීපයක් දැනුණේය.

ඊට පැය කීපයකට පසු සිහි නැතිව බිම වැටී සිටි ඔහු සොයාගෙන බැරැක්කයට ගෙනාවේය. අවට සිටින අය අඳුනා ගැනීමට ඔහුට නොපුළුවන. ඔහු ආශ්වාස ප්‍රශ්වාස කළේ අමාරුවෙනි. අවි ගත් දුම්රියේ සිට උප දෙස්තරවරයකු කැඳවීය. පාවෙල් කොර්චාගින් නිව්මෝනියා රෝගයෙන් සහ උණ සන්නිපාත ටයිපොයිඩ් රෝගයෙන් පෙළෙන බවත් ඒවා නිසා ඔහු මිය යාමට ඉඩ ඇති බවත් උප දෙස්තර පැවසීය. උණ 106 කි. දණහිස් ඉදිමී ඇත. බෙල්ලේ ලේ ගඩුය. මේවා ප්‍රධාන රෝග දෙක සමඟ සසඳන විට එතරම් බරපතළ ඒවා නොවේ.

පන්ක්‍රාතොව් සහ නගරයේ සිට පැමිණි දුබාවා පාවෙල් බේරා ගැනීම සඳහා කළ හැකි හැම දෙයක්ම කළේය.

කොර්චාගින්ගේ නගරවැසියකු වන අලෝෂා කොහොන්ස්කිට රෝගියා ගෙදර ගෙන යාම භාර කළේය. මිනිසුන්ගෙන් පිරී ඉතිරී ගිය දුම්රිය මැදිරියකට සිහිසන් නැතිව සිටි පාවෙල් සහ අලෝෂාව නැංවීමට කෙරේචාගින්ගේ ශ්‍රම කණ්ඩායමේ උදව් ඇතිව පන්ක්‍රාතොව්ට හා දුබාවාට පුළුවන් වූයේ හොල්යාවාගේ බලපෑමත් ඇතිවය. පාවෙල්ගේ උණ සන්නිපාත රෝගය බෝවන බව දැනගත් මඟීහු විරුද්ධත්වය පෑහ. ඔවුන්ට මැදිරියට ඉඩ නොදුන්හ. අතරමඟදී රෝගියාව දුම්රියෙන් ඇද දමන බවට තර්ජනය කළහ.

රෝගියාට විරුද්ධ වූවන්ට ළං වී පිස්තෝලය වැනූ හොල්යාවා කෑගැසීය:

"මේ රෝගියාගේ රෝගය බෝවෙන්නේ නැහැ! නුඹලා සියලු දෙනාවම මේ පෙට්ටියෙන් පන්නා දැමීමට සිදුවුණත් මේ රෝගියාව අපි යවනවාමයි. තීචයනි, තොපි එකකුවත් මේ රෝගියාගේ ඇඟට අත තැබුවොත්, මම ඒ ගැන මුළු දුම්රිය මාර්ගයටම දන්වා තොපව හිර ගෙට දමන බව මතක තබා ගනිව්. අලෝෂා, මෙන්න නුඹට පාවෙල්ගේ 'මවුසරය' කවුරු හරි අත තිබ්බොත් බය නැතිව වෙඩි තියපන්." හොල්යාවා අවධාරණය කළේය.

දුම්රිය, ස්ථානයෙන් පිටවිය. ජනයා රහිත වේදිකාව දිගේ පන්ක්‍රාතොව්, දුබාවා ළඟට ආවේය.

"නුඹ හිතන්නෙ කොහොමද? නොමැරේවිද?"

පිළිතුරු නොලැබිණි.

"මිත්‍යායි, යමු යන්ට, වෙන දේ වෙනවාමයි. දැන් ඉතින් හැමදේටම වග උත්තර කියන්නට ඕන අපි. දුම්රිය යන්ත්‍ර රෑටම බාලා, උදේට ඒවා රත් කරන්නට උත්සාහ ගනිමු."

හොල්යාවා දුම්රිය මඟ දිගට ඇති ස්ථානවල තම සගයන්ට ටෙලිෆෝන් මඟින් කතා කොට, කොර්චාගින් පිළිබඳ දැන්වීය. කිසිම හේතුවක් නිසා හෝ රෝගියා පිට කිරීමට මඟීන් දරන තැතට ඉඩ නොදෙන ලෙස ඉල්ලා සිටි ඔහු එසේ කිරීමට 'ඉඩ නොදෙන' බව තම සගයන් පොරොන්දු වූ පසු නින්දට ගියේය.

දුම්රිය ප්‍රධාන මංසන්ධියකදී නැවැතිණි. මඟීන් පිරි දුම්රිය මැදිරියකින් රන්වන් හිසකේ ඇති තරුණයකුගේ මළ සිරුරක් වේදිකාවට ගෙනාවේය. ඔහු කවුද, ඔහු මළේ කුමක් නිසාද යන්න කිසිවෙක් නොදනිත්. දුම්රිය ස්ථානයේ චෙකිස්ට්වරු හොල්යාවාගේ ඉල්ලීම සිහියට නගා ගෙන සිරුර පිටතට දැමීමට බාධා කළහ. එහෙත්, තරුණයා මියගිය බව සැක හැර දැන ගත් පසු ඔවුහු එම සිරුර දුම්රියේ මිනී කාමරයට යැවූහ.

ඔවුහු වහාම හොල්යාවාට ටෙලිෆෝන් කොට, ඔහු මෙතරම් සැලකිලි දැක්වූ ඔහුගේ මිතුරා මියගිය බව දැන්වූහ.

බොයාර්කා සිට එවූ කෙටි විදුලි පුවතක පාවෙල් කොර්චාගින්ගේ මරණය ගැන සඳහන් විණි.

ඒ අතර අලෝෂා කොහාන්ස්කි, රෝගියා ඔහුගේ ගෙදරට ගෙනගොස් බාර දුන්නේය. අනතුරුව ඔහුද උණ සන්නිපාතයට ගොදුරු විය.

★

"ජනවාරි 9 ද

මගේ හදවත වේදනාවෙන් මිරිකෙන්නේ මන්ද? සටහන් ලිවීම සඳහා වාඩිවීමට පෙර මම ඇඬීමි. රීතාට අඬමින් සුසුම්ලෑමට පුළුවන් බව මීට පෙර විශ්වාස කළේ කවුද? මෙතරම් දැඩි ලෙස අඬා වැලපෙන්නට කඳුළු හැමදම දුබල අධිෂ්ඨානයක සලකුණක්ද? මහා ජයක් ලැබූ දවසේ දුක්බර ගිනි හටගත්තේ මන්ද? කුරිරු ශීතල මැඩ ජයගත් ද, බඩු පටවන දුම්රිය මැදිරිවලට වටිනා ඉන්ධන - දැව දඬු පැටවූ

ද ජයග්‍රහණයේ උත්සවයට සහභාගි වූ ද, දුම්රිය මගෙහි වැඩකළ සියලු වීරයන්ට ගරු කළ ද නාගරික සෝවියට් සභාවේ රැස්වීම පැවැත්වූ ද දුක පැමිණියේ මන්ද? එය ජයග්‍රහණයක් නමුදු, ඒ සඳහා ක්ලාව්චෙක් හා කොර්චාගින් දිවි පිදූහ.

පාවෙල්ගේ මරණය මට සත්‍යයක්ද පහද දුනිː මා සිතුවාට වඩා ඔහු මට වටිනා කෙනෙක් විය.

මෙතැනින් මගේ සටහන් ලිවීම නවත්වමි. අලුත් සටහන් ලිවීමට මම කවදා හෝ ඉදිරිපත් වේදැයි නොදනිමි. උක්රයිනයේ කොමියුනිස්ට් තරුණ සංවිධානයේ මධ්‍යම කාරක සභාවේ වැඩ කිරීමට කැමැති බව දන්වා හාර්කොව් නගරයට හෙටම ලියන්නෙමි."

III

තරුණ බව ජය ගති. උණ සන්නිපාතය නිසා පාවෙල් කොර්චාගින් නොමළේ ය. හතරවැනි වරටත් ඔහු මාරයාගේ කට ළඟටම ගොස් යළි පණ ලැබීය. මසකට පසු කෙට්ටු, දුබල පාවෙල් අස්ථිර ලෙස නැඟිට සිට බිත්තිය අල්ලා ගෙන කාමරයේ ගමන් කිරීමට තැත් කළේය. මවගේ සහාය ඇතිව ඔහු කවුළුව අසලට ගොස්, බොහෝ වේලාවක් මඟ දෙස බලා සිටියේය. දියවී යන හිම හිරු රැස් නිසා දිලිසිණි. වසන්තය ළඟ එන බව දන්වන හිම දියවීම පටන් ගැනිණි.

කවුළුව ඉදිරියේ චෙරි ගහක අත්තක උඩ වසා සිටි අළු පැහැති පපුවක් ඇති ගේ කුරුල්ලෙක් තම අත්තටු හොටින් ශුද්ධ කරමින් පාවෙල් දෙස හදිසි හොර බැලුම් හෙළීය.

"ඉතින් යාළුවා, අපි නුඹ සමඟ හිම කාලයට මූණ පෑවා නේද?" කවුළුවට ඇඟිල්ලකින් තට්ටු කරමින් ඔහු සෙමින් විචාළේය.

අම්මා බිය වී ඔහු දෙස බැලුවායː

"නුඹ කතා කරන්නේ කා සමඟද?"

"මම ගේ කුරුල්ලා එක්ක... හොර බැල්මක් තියෙන ඌ ඉගිලී ගියා." පාවෙල් දුබල ලෙස මඳ සිනා පෑවේය.

වසන්තය දසත පැතිරිණි. කොර්චාගින් නගරයට පැමිණීම ගැන කල්පනා කරන්නට විය. ඇවිදීමට තරම් ඔහුට ශක්තියක් ලැබුණද, ඔහුගේ සිරුරෙහි යම් කිසි නොපැහැදිලි රෝග ලක්ෂණ පහළ විය. දවසක් ඔහු වත්තේ ඇවිදිමින් සිටින විට,

ඔහුගේ පිටකොන්දෙහි උග්‍ර වේදනාවක් පැන නැඟුණෙන් ඔහු බිම ඇද වැටුණේය. ඔහු ඉතා අමාරුවෙන් කාමරයට ඇතුළු විය. පසුදින දෙස්තර ඔහු පිරික්සා බැලුවේ ඉතා සැලකිල්ලෙනි. පිටකොන්දේ ගැඹුරු වළක් දුටු ඔහු ප්‍රශ්න කළේයඃ

"මේක කොහොමද හැදුණේ?"

"ඒක රෝව්නොවල සටනෙදි වුණ දෙයක්, අපට පිටුපසින් අඟල් තුනක කාලතුවක්කු වෙඩි උණ්ඩයක් පුපුරලා. ලොකු ගල්ගෙඩියක් මගේ පිට කොන්දට වැදුණා..."

"ඊට පස්සෙ ඔබ ඇවිද්දෙ කොහොමද? වේදනාව දැනුණෙ නැත්ද?"

"නැහැ. ඒ වේලාවෙදී පැයක්, දෙකක් විතර මට නැගිට ගන්න බැරුව හිටියා. පස්සේ අස්පයා පිට නැගලා ගියා.

දෙස්තර තැන බරපතළ බවක් ආරූඪ කරගෙන පිට කොන්දේ වළ පිරික්සා බැලීය.

"ඔව්. මගේ හිතවත් යාළුවා. වැඩේ එතරම් හොඳ නැහැ. පිට කොන්ද කම්පනයට ඔරොත්තු දෙන්නෙ නැහැ. මීට පස්සෙ පිට කොන්දෙ වේදනාව නොයේ දැයි බලාපොරොත්තු වෙමු. කොර්චාගින් සහෝදරයා ඇඳ ගන්න."

දෙස්තර තැන අනුකම්පා සහගතව සහ අදක්ෂ ලෙස සඟවාගත් බලාපොරොත්තු සුන් වූ බවකින් යුතුව රෝගියා දෙස බැලීය.

★

අර්ට්යොම් සිය බිරිඳ වූ රූමත් නොවන ස්තේෂා සමඟ ජීවත් විය. ඇගේ දෙමාපියෝ අන්ත දුප්පත් ගොවියෝ වූහ. එක් දවසක් පාවෙල් අර්ට්යොම් බැලීමට එහි ගියේය. කුණු තවරාගත් වපරැස් ඇති කොල්ලෙක් ඉතා කුඩා ගෙවත්තෙහි දුවමින් සිටියේය. ඔහු පාවෙල් දැක, කිසිදු ගරු සරු බවක් නැතිව, ඉදිරියට විත්, අමුත්තා දෙස බලමින් නහයේ ඇඟිල්ලක් ඔබා ගනිමින් විචාළේයඃ

"නුඹට මොනවද ඕන? නුඹ හොරකම් කරන්ට ආවද? නුඹ මෙතැනින් ඉක්මනට පලයන්. නැතිනම් අපෙ අම්මාගෙන් වදීවි!"

දිරාපත් වුණු කුඩා ගොවි ගෙදර කුඩා කවුළුවක් විවර වී අර්ට්යොම් කතා කළේය.

"පව්ලූෂා ගෙතුළට වරෙන්!"

කහ පැහැති සිවුරකට සමාන මුහුණක් ඇති මැහැල්ලක් ලිප අසල කෑම පිසිමින් සිටියාය. ඇය අසලින් ගිය පාවෙල් දෙස අකාරුණික බැල්මක් හෙළූ ඈ ඔහුට යාමට ඉඩ හැර තඹහැළි සූරමින් හඬ නැගුවාය.

ගැට වයසේ වූ කෙල්ලො දෙදෙනෙක්. ගෙතූ ඔවුන්ගේ හිසකේ කුඩා වලිග වැනිය. උඳුනේ පියස්ස මත නැගගෙන වැද්දියන් සේ ඔහු දෙස අපූරු බැලුම් හෙළන්නට වූහ.

තරමක් ලජ්ජාවට පත් අර්ට්යොම් මේසය අසල වාඩි වී සිටියේය. ඔහුගේ විවාහයට මවද, මල්ලීද කැමැති නොවූ බව ඔහු දනී. නිර්ධන පන්ති පරපුරකින් පැවත එන අර්ට්යොම්, ගල් වඩුවකුගේ දුවක වන සුන්දර ගාල්යා සමඟ ආලයෙන් බැඳී තුන් අවුරුද්දක් සිටියද, රැකියාවෙන් ඇඳුම් මසන්නියක වූ ඇය, අත හැර දමා සිත් නොගන්නා මුග්ධ තරුණියක වූ ස්තේෂා සරණ පාවා ගත්තේය. පස් දෙනෙකුගෙන් යුත් පවුලකට ආහාර පානාදිය සපයන එකම සාමාජිකයා වූයේ අර්ට්යොම්ය. දුම්රිය ඩිපෝවේ බර වැඩවලින් පසු ගෙදර එන අර්ට්යොම් වල් බිහිවුණු, නිසරු ඉඩම් කැබැල්ල වගා කරනු වස් නගුල අතට ගෙන වෙහෙසෙයි.

★

තමාගේ පසු බැසීම ගැන මල්ලී අකැමැති බව අර්ට්යොම් දනී, එය පාවෙල් හැඳින්වූයේ 'සුළු ධනපති මූලිකාංග' ලෙසිනි. තමා වටවී සිටින වටපිටාව ගැන මල්ලී කෙබඳු තක්සේරුවක් කරත් දැයි අර්ට්යොම් නිරීක්ෂණය කළේය.

ඔවුන් දෙදෙනා වාඩි වී අල්ප තේරුම් සහිත වචන දෙඩමින් මඳ වේලාවක් සිටියහ. ඉක්බිති පාවෙල් පිටවී යාමට සැරසුණේය. අර්ට්යොම් ඔහු නවත්වා ගත්තේය.

"නැවතියන්, අප සමඟ එක්වී කෑම ටිකක් කාපන්. ස්තේෂා අපට කිරි ගෙනේවි ඉක්මනට. ඉතින් මල්ලියෙ, නුඹ නගරයට යනවද? පාව්කා, නුඹ තවම දුර්වලයි."

ස්තේෂා පැමිණ පාවෙල්ට ආචාර කොට, ඈත මඩුවට යමක් ගෙනයාමට උදව් වන ලෙස අර්ට්යොම්ගෙන් ඉල්ලා සිටියාය. පාවෙල් වැඩි කතාබහක් නොකරන මැහැල්ල සමඟ විය. අසල දේවස්ථානයේ සීනු හඬ ගෙදරට ඇසෙත්ම මැහැල්ල වැඩ කිරීම නවත්වා අසතුටින් මුමුනන්නට වූවාය.

"ජේසු ස්වාමි දරුවනි! මේ කාලකණ්ණි වැඩ හන්දා දෙවියන්ට වඳින්ටවත් වේලාවක් නැහැ!" ගෙල බැඳි ලේන්සුව

ඉවත් කළ ඇ, අමුත්තා දෙස ඇස් කොනින් බලා, කබල් දේව රූප හා පින්තූර තබා ඇති මුල්ල දෙසට ගියාය. සමින් වැසුණු මස් රහිත ඇට සහිත ඇඟිලි තුනකින් ඈ කුරුසියේ ලකුණ ඇඳ ගත්තාය.

"ස්වර්ගයේ වැඩ සිටින අපේ දෙවි මාතාවෙනි, ඔබගේ නාමය ආරාධිත වේවා!" ඈ වියළි දෙතොලින් මිමිනුවාය.

ගෙවත්තේ සිටි කොල්ලා දිග කන් ඇති ඌරකු පිට නැග ගත්තේය. ඔහු පාවහන් රහිත තම පාදවලින් ඌරාගේ බඩ තද කොට අල්ලා ගෙන උගේ ලොම් දෑතින් ගෙන කෑ ගැසීය.

"හා, හා, දුවපිය. හුරතල් නොකර දුවපිය."

ඌරා වේගයෙන් ගෙවත්ත හැමතැනම දිව්වේ කොල්ලා බිම දමා නිදහස් වන අටියෙනි. එහෙත්, වැරැහැලි ඇඳගත් වපර කොල්ලා බිම නොවැටී සිටීමෙහි සමත් විය.

මැහැල්ල දෙවියන් යැදීම නවත්වා කවුළුවෙන් හිස පිටතට දමාගෙන බැලුවාය.

"ජඩයා, මම තොට පෙන්වන්නම් ඌරා පිට යන හැටි. තොට හෙණ වදීවි. ඉක්මනට බැහැපිය. යක්පැටියා."

අවසානයේදී කොල්ලා බිම දැමීමට ඌරා සමත් විය. මැහැල්ල සතුටු සිතින් යළි දේව පින්තූර වෙත හැරුණාය.

උපශාන්ත ලීලාවක් ආරූඪ කරගත් ඈ, යාච්ඤා කිරීම යළි ඇරඹුවාය.

"ඔබගේ රාජ්ජ්‍යය එනු ලද්දේවා..."

එවේලෙහි දෙර ඇරගෙන ගෙට ඇතුළු වූයේ කොල්ලාය. ඔහු ඇඬූ කඳුළෙනි. තුවාල වූ නහය ඔහු කමිස අත්වලින් පිසද ගනිමින්, වේදනාව නිසා කෙඳිරි ගෑවේය."

"අම්මේ, රොටියක් දෙන්නකො!"

මැහැල්ල කෝප වී කොල්ලා දෙසට හැරුණාය.

"තෝ මට දෙවියන් වඳින්නවත් ඉඩ දෙන්නෙ නැහැ. වපර යක් පැටියා. දැන්ම නුඹට බඩපුරා දෙන්නම්!" මෙසේ පවසමින් ඈ බංකුව මත තිබූ කසයක් අතට ගත්තාය. කොල්ලා මොහොතකින් අතුරුදහන් විය. ගිනි උදුනේ පියස්ස උඩ සිටින කෙල්ලෝ දෙදෙනා සිනහව මැඩගෙන සෙමින් "හිකි හිකි" ගෑහ.

මැහැල්ල තෙවැනි වරටත් දෙවියන් යැදීමට පටන් ගත්තාය.

අර්ට්යොම් එන තුරු නොසිටි පාවෙල් නැගිට ගෙයින් පිටතට ගියේය. ඔහු ගෙවත්තේ කඩුල්ල වසන විට, මැහැල්ල

කවුළුවේ අයිනකට වී ඔහු දෙස සැක සිතින් බලන සැටි ඔහුට පෙනිණි.

"අර්ට්යොම්ව කිනම් මායාකාරී බලවේගයක් විසින් මෙතනට ඇද දැමීද? දැන් ඉතින් මරණය තෙක් ඔහුට ගැලවීමට බැහැ. ස්තේෂා අවුරුදු පතා වදන්ට පටන් ගනීවී. ගොම ගොඩට වැදුණු කුරුමිණියා වගේ හිටීවී. සමහර විට අර්ට්යොම් ඩිපෝවේ රස්සාවත් අත හරින්නට ඉඩ තියෙනවා." දෙම්නස් සිතින් පාවෙල් සිතමින් කුඩා නගරයේ ජනයා රහිත වීදි ඔස්සේ පා නැඟීය. "මා හිතුවා ඔහුව දේශපාලන කටයුතුවලට ඇදගන්නට."

තම මිතුරන් හා තම හදවතට කිට්ටු, වටිනා මිනිසුන් ඉන්නා මහ නගරයට තමා හෙට පිටත්ව යන නිසා පාවෙල් කොර්චාගින් සතුටු විය. බලය නිසාද, ජීවමය ශක්තිය නිසා ද, යුහුසුලුව එහා මෙහා යන විශාල ජනකාය නිසාද, ට්‍රෑම් රථවල හඬ හා මෝටෝ රියවල නළා හඬ නිසාද මහ නගරය ඔහුගේ සිත් ගත්තේය. ඒ හැමටම වඩා ඔහු තුළ ආසාවක් උපන්නේ ගඩොලින් තැනූ විශාල කම්හල්ද, දුමෙන් වැසුණු වැඩපොළවල්ද යන්ත්‍රද දැකීමට සහ සම්ප්‍රේෂණවල පහත් හඬ ඇසීමටය. යන්ත්‍රවල යෝධ ගුරු රෝදය දැකීමටද, මැෂින් තෙල් සුවඳ ඉව ඇල්ලීමට, ඔහුගේම ජීවිතයේ කොටසක් වූ ඒ හැම දෙයක්ම දැක ගැනීමටද ඉමහත් වුවමනාවක් පැන නැඟිණි. ඈත පෙදෙසක කුඩා නගරයක් වූ මෙහි වීදිවල ඇවිදින පාවෙල් එක්තරා විෂාදයකින් පෙළෙන්නාක් මෙනි. මේ කුඩා නගරයට ඔහු අමුත්තකු මෙනි, ඔහුට කාන්සියක් දැනිණි. මේ සියල්ල මවිතයට හේතු නොවීය. මෙහි මාවත්වල ඇවිදීම පවා පාවෙල්ට නොරිසි විය. තම ගෙවල්වල පිළිකන්නේ වාඩි වී ඕපා දූප කතා කරන ගැහැනුන්ගේ කතාබහ ඔහුට නොඅසා සිටිය නොහැකි විය.

"ඒයි, බොලං බලපිය අර එන හොල්මන කවුද?"

"පේන්නෙ ඔහු හරියට කාස රෝගකාරයෙක් වගෙයි. පෙණහලුවල ලෙඩ හැදිච්ච මිනිහෙක්."

"ඔහුගෙ කබාය බොහොම ලස්සනයි. වටිනා එකක්. හොරකම් කරපු බවට සහතිකයි.."

මෙවැනි ඕපා දූප කතා අසන පාවෙල්ගේ සිත කලකිරිණි.

ඔහු මෙවැනි දේවලින් සම්පූර්ණයෙන්ම වෙන් වී බොහෝ කල්ය. විශාල නගරය ඔහුට වඩාත් ළං විය, එය ඔහුගේ කොටසක් බවට පත්විය. ප්‍රීතිය හා ශක්තිය ගෙන දෙන

සහෝදරාත්මක බැම්මකින් හා ශ්‍රමයෙන් එය බැඳී ඇත.

සස්නා ගස් ඇති බැද්ද ළඟට පැමිණි පාවෙල් කොර්චාගින් මංසන්ධිය අසලට ආවේය. දකුණු පසින් පැරැණි සිර ගෙදරය. එය වනයෙන් වෙන් කොට ඇත්තේ උසැති වැටකිනි. ඊට පිටුපසින් රෝහලට අයත් සුදු පැහැති ගොඩනැඟිලිය.

මෙන්න මෙතැන විශාල චතුරශ්‍රයේදී වාල්යා සහ ඇගේ සගයෝ මරණයට මූණ පෑහ. පෝරකය තිබුණු තැනට පැමිණි ඔහු නිහඬව සිට, අනතුරුව බෑවුම් දෙසට ගියේය. පහළ බෑස සගයන්ගේ පොදු මිනීවළ ළඟට පැමිණියේය.

කිසිවකුගේ සැලකිලිමත් අත්වලින් මිනීවළවල් වටේ නත්තල් ගස් අතුවලින් සරසා ඇති බැව් පෙනේ. මිනීවළවල් මත මල් වඩම් තබා ඇත. බෑවුමේ මුදුණෙහි සිහින් සස්නා ගස්ය. බෑවුමේ දිගට ළපටි තණ පඳුරුය.

දුප්පතුන් ලෙස මෙලොව එළිය දුටු අයටද, ඉපදීම වහල් බවේ මුල පටන් ගැන්ම හැටියට ගැනුණු අයටද සුන්දර ජීවිතයක් ලබාදීම සඳහා මෙතැනදී සගයෝ නිර්භයව මරණයට මූණ පෑහ.

පාවෙල් සෙමින් හිස් වැස්ම ගලවා දුකින් පිරි සිතින් ඔවුන් සිහි කළේය. ඔහුගේ හදවත සෝකයෙන් පිරිණි.

මිනිසාගේ අති උතුම් වස්තුව ජීවිතයයි. එය ඔහුට ලැබෙන්නේ එක් වරක් පමණකි. අරමුණක් නැතිව ජීවත්වීම නිසා කටුක වේදනාවක් ඇති නොවන සේ, නීච සහ නොවැදගත් අතීතයක් නිසා ලැජ්ජාවීමට සිදු නොවන සේ, ඔහු ජීවත් විය යුතුය. ඔහු මිය යන විට ඔහුට මෙසේ කීමට පුළුවන්කමක් තිබිය යුතුය. මගේ මුළු මහත් ජීවිතයත්, මුළු මහත් ශක්තියත් ලෝකයේ අතිශයින්ම උදාර හා සුන්දර පරමාර්ථය උදෙසා, එනම් මිනිස් සංහතියට විමුක්තිය ලබා දීමේ සටන උදෙසා කැප කළේය. ජීවත්වීම සඳහා යුහුසුලු විය යුතුය. කිසියම් හදිසි රෝගයක් හෝ කිසියම් ශෝකාන්විත අනතුරක් හෝ ජීවිතය කෙටි කළ හැකි බැවිනි.

එම හැඟීම්වලින් පිරුණු හදවතක් ඇති පාවෙල් කොර්චාගින් සගයන්ගේ සොහොන් බිමෙන් ඉවත්වී ගියේය.

අම්මා ශෝකයෙන් යුතුව පුතාගේ ගමනට අවශ්‍ය දෑ පිළියෙල කළාය. පාවෙල් ඇගේ හැසිරීම නිරීක්ෂණය කරන්නේ, ඇය ඔහුගෙන් කඳුළු සඟවන බව දුටුවේය.

"පව්ලූෂා පුතේ, නුඹට ගෙදර නවතින්න බැරිද? මහලු වුණාම තනියම ජීවත්වීම අමාරුයි. ළමයින් කොපමණද,

පොඩියක් ලොකු වුණ හැටියේම උන් පැනලා යනවා. නුඹට නගරයට යන්න තියෙන ආසාව මොකක්ද? මෙහි ඉන්ට පුළුවනි. එහෙනම් නුඹට කොණ්ඩෙ කපාපු මයිනෙකුවත් එහෙම ඉන්නවාද? නුඹලා කවුරුවත් මට කිසිවක් කියන්නෙ නැහැ. අර්ට්යොම් කසාද බැන්දා. වචනයක්වත් කීවේ නැහැ. නුඹ ඊටත් වැඩියෙ අන්තයි. මට නුඹලාව දකින්නට ලැබෙන්නේ නුඹලා ලෙඩ වුණාම විතරයි." අම්මා පුතාගේ බඩු ටික පිරිසිදු මල්ලක තැන්පත් කරමින් පැවසුවාය.

පාවෙල් අම්මාගේ උරහිසින් ගෙන තමා වෙතට ඇද ගත්තේය.

"අම්මේ මට මයිනන්ගෙන් වැඩක් නැහැ! අම්මා දන්නවද කිරිල්ලියෝ ස්වභාව ධර්මයේ රීතිය අනුව තමන්ගේ මිතුරන් හොයාගන්නා බව? අම්මා හිතන හැටියට මමත් පිරිමි මයිනෙක්ද?"

පාවෙල්ගේ කතාව නිසා අම්මා මඳ සිනා පෑවාය.

"මේ ලෝකයේ සියලු ම ධනපතීන් විනාශ කරන තුරු මම කෙල්ලන්ව හොයන්නේ නැති බවට පොරොන්දු වී තිබෙන බව අම්මාට මම කියනවා. අම්මා කියන්නේ බොහෝ කල් ඉන්ට වේවි කියලද? නැහැ අම්මේ, ධනපතීන්ට බොහෝ කල් අල්ලාගෙන ඉන්ට බැහැ... මේ ලෝකයේ සියලුම මිනිසුන්ට එකම ජනරජයක් ඇතිවේවි. වැඩ කරන ජනතාවට අයත් ආච්චිලාව සහ සීයලාව ඉතාලියට යවනවා. ඒක බොහොම උණුසුම ඇති රටක්. තුන් පැත්තකින් මහ මුහුද. අම්මේ, එහෙ හීතල කාලෙ කිසි දවසක පටන්ගන්නෙ නැහැ. අම්මලාව ඉතාලියේ ධනපතීන්ට අයිති මාලිගාවලට යවනවා සනීප ගන්නට. ඉර අව්ව තපින්නට. ධනපතීන්ව ඉවර කරන්නට අපි ඇමරිකාවට යනවා.

"අනේ පුතේ නුඹේ කතා ඉෂ්ටවන තුරු මට ජීවත් වෙන්ට ලැබෙන්නෙ නැහැ... නුඹ හරියට නුඹේ සීයා වගෙයි. එයත් නැවියෙක් හැටියට රට රටවලට ගියා. ඔහු හැබෑ පල්හොරෙක්. අනේ දෙවියනේ ඔහුට සමාවන සේක්වා! සෙවස්තෝපොල් නගරයේදි ඔහු යුද්ධ කරලා ගෙදර ආවේ අත් පා නැතිවයි. ඔහුගේ පපුවේ කුරුස පදක්කම් දෙකක් පැලඳුවා. නාකියා මළේ හිඟන දුප්පතකු වෙලා. මිනිහාට බොහොම කේන්ති යනවා. කාටදෝ ලොක්කෙකුට පොල්ලකින් ගහලා අවුරුද්දකට හිරගෙට ගියා. යුද්දෙදි ඔහු දිනා ගත්තු මැඩල්වලින්වත් ඔහුට පිහිටක් වුණේ නැහැ.

මා නුඹ දිහා බලන විට, මට පේන්නේ නුඹත් සීයා වගේම වේවියි කියලා.”

“අනේ අම්මේ සමුගන්න කොටත් ඔය වගේ දේ කියනවද? මට ඔය ඇකෝඩියනය දෙන්නකො, බොහොම කාලෙකින් අතට ගත්තෙවත් නැහැ.”

සංගීත භාණ්ඩයේ යතුරු ඇති පැත්තට හිස හරවා ගත් පාවෙල්, අලුත් ගීයක් වයමින් අම්මා සතුටු කළේය.

ඔහු පෙර මෙන්ම නොවූව ද, දක්ෂ ලෙස වැයීය. ඉස්සර තරුණ පාවෙල් ප්‍රසිද්ධිය ලැබුවේ වේගයෙන් නැටවෙන, අසන විට සිතෙහි කම්පනයක් ඇතිවෙන, මත්වෙන ගී සින්දු වාදනය කිරීමටය. ඒ කුලප්පු රාග, තාල දැන් ඔහුගේ වාදනයෙහි නැත. ඔහුගේ අත්වල ඇඟිලි පෙර සේම වේගයෙන් ක්‍රියාකාරී වෙයි. එහෙත්, දැන් ඔහු වයන ගී පෙර ඒවාට වඩා ගැඹුරුය. ගීතමය අතින් පොහොසත්ය.

★

ඔහු දුම්රියපොළට පැමිණියේ තනිවමය.

අම්මාට ගෙදර නැවතී සිටින ලෙස ඔහු කීවේ සමු ගන්නා විට ඇගේ කඳුළු දැකීමට ඔහු අකැමැති බැවිනි.

මඟීහු දුම්රිය මැදිරි පිරී ඉතිරී යන තෙක් ඒවාට නැඟ ගත්හ. පාවෙල් මැදිරියක උඩම කුටියකට නැඟ ගෙන, එහි සිට කෑ ගසන, තර්ක කරමින් හා අත් දිග හරිමින් කතාබහ කරන කැලඹුණු මඟීන්ගේ හැසිරීම දෙස බලන්නට විය.

හැමදා මෙන්ම මඟීහු ගමන් මලු, වට්ටි ගෙනැවිත් ආසන යට තැබූහ.

දුම්රිය දුවන්නට පටන් ගතිත්ම, කෑ කෝ ගැසීම කෙමෙන් කෙමෙන් අඩු වූයෙන්, මඟීහු ආහාර පානාදිය ගිල දැමීමට පටන් ගත්හ.

උඩ කුටියක සිටි පාවෙල් නිදන්නට විය.

පාවෙල් කීයෙව් නගරයට පැමිණි විගසම ක්‍රෙෂ්යාටික් වීදියේ නිවසක් කරා පා නැඟීය. ඔහු පිය ගැට පෙළ සෙමින් නැංගේය. අවට හැම දෙයක්ම ඔහුට පුරුදුය. කිසිවක් වෙනස් වී නැත. ඔහු පාලම ඔස්සේ පා නඟන්නේ සිනිඳු වැට අතකින් අල්ලා ගනිමිනි. පහළ බසින තැනට පැමිණියේ, එතැන නැවතී අවට බැලීය. එකද මිනිස් ප්‍රාණයක්වත් පෙනෙන්ට නැත. ඔහු නැවතී සිටි ජවනිකාවේ උදාරත්වය නැරඹීය. ඝනැති විල්ලුද රෙද්දකින් පැන නගින අඳුරෙහි ඈත ක්ෂිතිජය

එති ඇත. අහසේ තරු දීප්තිමත් ලෙස බැබළෙන්නේ ස්ඵුර දීපනයක් ඇති කරමිනි. පහළ අහස මහ පොළොව සිප ගන්නා ස්ථානයේ එක්තරා අදිසි තැනක නගරය විසිර ඇත. අඳුර බිඳ එහි පහන් දස ලක්ෂයක් දැල්වේ.

පාවෙල් ඉදිරියට මිනිස්සු කීප දෙනෙක් ආවෝය. කිසියම් දෙයක් ගැන උස් හඬින් වාද කරන ඔවුහු රැයෙහි නිහඬතාව බිඳ දැමූහ. නගරයේ පහන් දෙස නෙත් යොමා ගෙන සිටි පාවෙල් පියගැට පෙළ බසින්නට විය.

ප්‍රාදේශීය විශේෂ අංශයේ එදින සේවයෙහි යෙදී සිටි නිලධාරි තැන, ෂුක්රායි දැනට බොහෝ කලක සිට නගරයේ නැති බව පාවෙල් කොර්චාගින්ට දන්වා සිටියේය.

ඔහුගෙන් බොහෝ ප්‍රශ්න ඇසූ නිලධාරී තැන. ඔහු ෂුක්රායිව පෞද්ගලිකව හඳුනන බව සැක හැර දැනගත් පසු, මීට දෙමසකට පමණ පෙර ප්යෝදර් ෂුක්රායි තුර්කිස්තාන් පෙරමුණට යැවූ බව ඔහුට කීවේය. පාවෙල් කොර්චාගින් කොතරම් බලාපොරොත්තු සුන් කර ගත්තේද යත්, ඔහු ෂුක්රායි ගැන කිසිදු විස්තරයක් නොඅසා නිහඬව මහ මඟට බැස්සේය. දැඩි විඩාවක් ඔහු වෙළා ගත්තෙන්, නිවෙසක දොර පඩියක් මත වාඩි වී, ගිමන් හැරියේය.

'දඩ් බිඩ්' හඬක් නංවමින් දුවන ට්‍රෑම් රථය ටිං ටිං ගා සංඥා කළේය. මඟ දෙපස පදික වේදිකාවේ වැල නොකැඩී මිනිස්සු එහා මෙහා දුවති. නගරය ජීවයෙන් පිරිලාය. වරෙක ගැහැනියක් සොම්නසින් සිනාසෙයි. වරෙක මිනිහකුගේ ගොරෝසු කට හඬක් ඇසේ. තරුණයෙක් උස් හඬකින් කතා කරයි. පපුවේ ගොරගොරයක් ඇති මහල්ලෙක් යමක් කියයි. වැල නොකැඩී යන එන මිනිස්සු හැමදාම ඉක්මනින් පියවර නඟති. ට්‍රෑම් රථය ආලෝකවත්ය. මොටෝ රියවල විදුලි පහන් දිලිසේ. ළඟැති සිනමා හලක දොරටු හා දැන්වීම් පුවරු විදුලි බුබුළුවලින් බබළයි. වීදිවල හා වේදිකාවල යන එන මිනිසුන්ගේ හඬ දසත පැතිරේ. එය නගරයේ සැඳෑ සිරියයි.

ප්යෝදර් ෂුක්රායිගේ තුර්කිස්තාන් ගමන නිසා ඇති වූ වේදනාව නගරයේ හඬ හා වේගය විසින් තුනී කැරිණි. යන්නේ කොහේද? යාළුවන් නැවතී සිටින සලෝමින්කාවලට යන්ටද. එය බොහෝ ඈතය. උනිවෙර්සිටෙට්ස්කි වීදියේ පිහිටි නිවෙස ගැන පාවෙල්ට හිටිහැටියේම මතක් විය. සත්තකින්ම ඔහු දැන්ම එහි යනු ඇත. ෂුක්රායිට පසුව ඔහු දැකීමට ආසා කරන්නේ රීතාවය. අකීම් හෝ මිහයිල් ළඟ ඔහුට රැය ගතකළ හැකිය.

නිවසෙහි කොනක කවුළුව විදුලි ආලෝකයෙන් බැබළෙයි. තම ආවේගික හැඟීම් මැඩ ගැනීමට උත්සාහ කළ පාවෙල් ඕක් ලීයෙන් කළ දොර හැරියේය. එළිපත්තෙහි තත්පර කීපයක් නැවතී සිටි ඔහුට දොරට එහා කට හඬ කීපයක්ද, කිසිවකු ගිටාරයක් වාදනය කරන සැටිද ඇසේ.

"ඔහෝ ගිටාර වාදනයට පවා ඉඩ දී තිබේද? පාලනය ලිහිල් වෙලා." එසේ සිතූ පාවෙල් කොර්චාගින් සෙමින් දොරට ගැසීය. තමා කැලඹෙන බව ඔහුට දැනුණෙන් ඔහු දෙතොල් සපා ගත්තේය.

හිස දෙපස 'ඩොන්කි' කැරැලි සහිත තරුණ කතක් දොර හැරියාය. ඇය කෝර්චාගින් දෙස බැලුවේ ප්‍රශ්න නඟන ලීලාවෙනි.

"හොයන්නෙ කාවද?"

ඈ දොර නොවැසුවාය. ගෙතුළ දෙසට ක්ෂණික බැල්මක් හෙළූ පාවෙල්ට තම ප්‍රයත්නය නිසරු බව පැහැදිලි විය.

"රීතා උස්තිනෝවිච් හමුවීමට පුළුවන්ද?"

"ඇය මෙහි නැහැ. පහුගිය ජනවාරියේදී ඈ හාර්කොව් ගියා. දැන් ඈ මොස්කව් නගරයේ වැඩ කරන බව ආරංචියි." ඕ කීවාය.

"අකීම් සහෝදරයා මෙහි ඉන්නවද, නැත්නම් එයත් ගිහිල්ලද?"

"අකීම් සහෝදරයත් නැහැ. ඔහු ඔඩෙස්සා ගුබේර්නියාවේ කොම්සොමොල් සංවිධානයේ ලේකම්."

ආපසු යාම හැර අන් කිසිවක් කළ නොහැකිය. නගරයට පැමිණි ප්‍රීතිය ඔහු කෙරෙන් ඈත් වන්නට විය.

රැය ගත කරන හැටියක් දැන් බැරෑරුම් ලෙස කල්පනා කළ යුතු ය.

"ඔය විදිහට යාළුවන් හොයන්ට ගියොත් මුළු රැයම ඇවිද්දත් එකකුවත් හමු නොවන්නට පුළුවනි." දෙමනසින් පාවෙල් මුමුනන්ට වූයේ බලාපොරොත්තු සුන් බව මැඬ ගනිමිනි. කෙසේ වුවද, පන්ක්‍රාතොව් නගරයේ සිටිත්දැයි සොයමින් තම වාසනාව උරගා බැලීමට ඔහු ඉටා ගත්තේය. පන්ක්‍රාතොව් පදිංචිව සිටියේ ගඟ අද්දර තොටුපළ අසලය. එය සලෝමින්කාවට යාම තරම් දුර නොවේ.

බොහෝ සේ විඩාපත් පාවෙල් අවසානයේදී පන්ක්‍රාතොව්ගේ නිවස දක්වා ගියේය. කහ පැහැති තීන්ත ගා ඇති දොරකට තට්ටු කළ ඔහු මෙසේ සිතන්නට විය.

"මේ හාදයාත් ගෙදර නැති නම්, මීට වඩා හොයන්ට යන්නෙ නැහැ. බෝට්ටුවක් ඇතුළට රිංගලා රෑ ගත කරන්නම්."

දෙර හැරියේ මහලු කතකි. චාම් ලේන්සුවකින් ඈ හිස නිකට දක්වා වසාගෙන සිටියාය. ඈ පාන්ක්‍රාතොව්ගේ අම්මාය.

"අම්මේ, ඉග්නාත් ගෙදරද?" පාවෙල් ඇසීය.

"මේ දැනුයි ගෙදර ආවෙ. ඔහු හමුවන්ටද?"

ඈ පාවෙල් හඳුනාගැනීමට අසමත් වූවා ගෙතුළට හැරී හඬ ගැසුවාය.

"ගේන්කා, ඔබ හමුවීමට ඇවිත්!"

පාවෙල් ගෙතුළට ගොස් ගමන් මල්ල බිම තැබීය. පන්ක්‍රාතොව් මේසය අසල වාඩි වී ආහාර ගිල දමමින්, ඔහු දෙසට හැරී කතා කළේය.

"නුඹ මා හමුවන්නට ආවා නම්, වාඩිවෙලා ආ කාරණය ගැන කියපන්. මම මේ බෝර්ෂ් සුප් ටිකක් බොන්නම්, උදේ හිට වතුර විතරයි බිව්වේ." පන්ක්‍රාතොව් අති විශාල ලී හැන්දක් අතින් ගත්තේය.

කබල් පුටුවක කොනක පාවෙල් වාඩි විය. පැරණි පුරුද්ද අනුව හිස් වැස්ම ගලවා එයින් නළල පිසදමා ගත්තේය.

"ගේන්කා පන්කාරාතොව්ට හඳුනා ගැනීමට බැරි තරම් මා වෙනස් වෙලාද?" පාවෙල් කල්පනා කරන්නට විය.

පන්ක්‍රාතොව් සුප් හැඳි දෙකක් බී, ගෙට පැමිණි අමුත්තා කතා නොකරන බැවින් හිස හරවා ඔහු දෙස බැලීය.

"ඉතින් කියාපන්, නුඹේ ප්‍රශ්නය මොකක්ද?"

අතින් ගත් පාන් කැබැල්ල කට ළඟට ගොස් නැවතිණි. පන්ක්‍රාතොව් අන්දමන්ද වී ඇසිපිය හෙළන්නට විය.

"ඒ.... හරි වැඩක් නොවැ.... හැබෑටම!"

පන්ක්‍රාතොව් අන්දමන්ද වී, විස්මයට පත්වූයෙන් ඔහුගේ මුහුණ රත් පැහැ ගති. එය දුටු පාවෙල් ඉවසා ගත නොහී හඬ නගා සිනාසුණේය.

"පාව්කා! අප හැමදෙනාම හිතුවේ නුඹ එලොව ගියයි කියලා...! නැවතියන් නුඹේ නම කුමක්ද?"

පන්ක්‍රාතොව්ගේ කෑ ගැසීම නිසා යාබද කාමරයේ සිටි ඔහුගේ මව සහ වැඩිමහලු සොහොයුරිය පැමිණියහ. තිදෙනාම එකතුව ප්‍රශ්න කර තමා ඉදිරියේ සිටින්නේ පාවෙල් කොර්චාගින් බව සැකහැර දැනගත්හ.

ගෙදර හැමදෙනාම නින්දට ගියහ. පන්ක්‍රාතොව් පසුගිය හාර මසෙහි සිදුවූ දේ විස්තර කරන්නට විය.

"ශීත කාලයේ දීම ෂාර්කි, මිත්‍යායි දුබාවා සහ මිහයිලෝ හාර්කොව් ගියා. ඒ කොල්ලො තුන්දෙනා ගියේ වෙන කොහාටවත් නොවෙයි, කොමියුනිස්ට් සරසවියට. ෂාර්කි සහ මිත්‍යායි ප්‍රාථමික අංශයට ඇතුළු වුණා. මිහයිලෝ එක පාරටම පළමුවැනි අවුරුද්දට. අපේ කට්ටිය පහළොස් දෙනෙක් එකතු වුණා. මටත් ආසා හිතිලා මාත් අයදුම් පතක් යැව්වා. ඉගෙනීම ලබාගෙන මගේ මොළය සුද්ද කරගන්ට ඕන කියලා මම කල්පනා කළා. ආචාර්ය මණ්ඩලය මාව සුදුස්සකු හැටියට තෝරා ගත්තෙ නැහැ."

ඒ සිද්ධිය නිසා කෝපයට පත් පන්ක්‍රාතොව් ගොරවා දිගටම කතා කළේය.

"මුලදි මගේ වැඩ යසට සිදුවුණා. හැම දෙයක් ම අගෙයි. පක්ෂයේ සාමාජික කාඩ් පත තියෙනවා. කොම්සොමොල් තරුණ සංවිධානයේ සෑහෙන කාලයක් හිටියා. මගේ පසුතලය හා පරම්පරාව ගැන ප්‍රශ්නයක් පැන නැංගේ නැහැ. දේශපාලන දැනීම පිළිබඳ ප්‍රශ්නයේ දී මම මඩේ එරුණා.

"එක් ආචාර්යවරයෙකු සමඟ මම තර්ක කළා. ඔහු මගෙන් ප්‍රශ්නයක් අහනවා. "පන්ක්‍රාතොව් සහෝදරයා, ඔබ දර්ශනවාදය ගැන දන්නෙ මොනවාද? නුඹ දන්නවද? මම දර්ශනවාදය ගැන මොනවත් දැනගෙන හිටියෙ නැහැ. මට මතක් වුණා අප ළඟ බඩු පටවන කම්කරුවකු හැටියට වැඩ කළ විදුහල් ශිෂ්‍ය රස්තියාදුකාරයා ගැන. ඔහු වැඩ කළේ නිකම් විහිළුවට වගෙයි. හැම ප්‍රශ්නයකටම පිළිතුරු දන්න මිනිසුන් වගයක් ග්‍රීසියේ හිටිය බවත්, ඔවුන්ට දර්ශනවාදීන් කියලා කී බවත් ඔහු කියනවා මා අසා තිබුණා. එක මිනිහකුගෙ නම මට හරියට මතක නැහැ. ඉඩියෝග්ගෙන් වෙන්ට ඕනෑ. ඒ මිනිහා මුළු ජීවිතයම පීප්පයක් ඇතුළට වෙලා හිටියා... ඒ ගොල්ල අතර හිටිය ගජ හපනා තමයි කළු සුදුයි කියලා හතළිස් වාරයක් ඔප්පු කරපු මිනිහා. එක වචනයකින් කියනවා නම් ඒගොල්ල සෑහෙන පචයෝ. මට අර විදුහල් ශිෂ්‍යයගෙ කතාව මතක් වෙලා. මෙහෙම කල්පනා කළා. "ආචාර්ය මණ්ඩලයේ මේ ආචාර්යතුමා මාව ගොනාට අන්දවන්නට හදනවා වගෙයි." එතකොටම ආචාර්යතුමා මා දිහා කපටි බැල්මක් දැම්මා. මම මෙහෙම කිව්වා. "දර්ශනවාදය කියන්නේ පට්ටපල් බොරු ගොඩකට.

සහෝදරවරුනි, මම ඔය බොරු ඉගෙන ගැනීමට යන්නෙ නැහැ. පක්ෂයේ ඉතිහාසය ගැන නම් මුළු හිතින්ම ඉගෙන ගැනීමට ආසයි." ඒ පාර ඒගොල්ල මගෙන් අහන්ට පටන් ගත්තා දර්ශනවාදය ගැන ඔය ආරංචි ලැබුණෙ කොහෙන්ද කියලා. මම එතකොට අර විදුහල් ශිෂ්‍යයාගෙ කතා ටිකක් කීවාම ආචාර්ය මණ්ඩලයම බක බක ගාලා හිනාවුණා. මට බොහොම කේන්ති ආවා. "නුඹලා මාව මෝඩයකු කරන්න හදනවද?" මම තොප්පිය අතට අරන් යන්ට ගියා.

"පසුව ඒ ආචාර්යවරයා මාව ගුබේර්නියා කමිටු කාර්යාලයේදී හමුවෙලා පැය තුනක්ම කතා කළා. විදුහල් ශිෂ්‍යයා මාව රවටාපු බව මට දැනගන්ට ලැබුණා. දර්ශනවාදය කියන්නේ බොහොම ලොකු බුද්ධිමත් දේකට."

"දුබාවායි ෂාර්කියි සමත් වුණා. දුබාවා නම් බොහොම හොඳට ඉගෙන ගත්තා. ෂාර්කිගේ දැනුම මගේ වගේමයි. ෂාර්කි යුද්ධයෙදි දිනාගත්තු රතු ධජයේ පදක්කම ඔහුට පිහිට වෙන්ට ඇති. මම මෙතැන පල් වෙනවා. ඒ ගොල්ල ගියාට පස්සේ මට රේගුවේ පාලක මණ්ඩලයේ රස්සාවක් දුන්නා. මම බඩු රේගුවේ සහකාර ලොක්කා. ඉස්සර මම හැම තිස්සේම තරුණ ප්‍රශ්න ගැන කළමනාකාරවරුන් සමඟ හැප්පෙනවා. දැන් මමත් කළමනාකරුවෙක්. වැඩවලට නායකත්වයක් දීමට සිදුවී තියෙනවා. දැන් මම කවුරුහරි කම්මැලියකුව, හොර වැඩකාරයකුව දැක්කොත් කළමනාකරු හැටියටයි, කොම්සොමොල් ලේකම් හැටියටයි එයාට තරවටු කරනවා. ඔහුට බැහැ මා ඉදිරියේ බොරු කරන්නට. මා ගැන පසුවට නුඹට නොකී පුවත් මොනවාද? අකීම් ගැන නුඹ දන්නවා. අපේ පරණ කට්ටියෙන් ගුබේර්නියා කමිටුවේ ඉන්නේ ටුප්ටා විතරයි. තෝකරෙව් සලෝමින්කාවල පක්ෂ දිස්ත්‍රික්ක කමිටුවේ ලේකම්. නුඹ සමඟ එකට කොමියුනයේ හිටිය ඕකුන්යෙව් ගුබේර්නියා කොම්සොමොල් සංවිධානයේ ඉන්නවා. තාල්යා දේශපාලන අධ්‍යාපන අංශයේ වැඩ කරනවා. වැඩපොළේ නුඹේ තැනට ස්වෙතායෙව් පත්කරලා. මම ඔහු ගැන දන්නෙ ටිකයි. ගුබේර්නියා කමිටුවේදි හමුවෙනවා. ඔහු මෝඩයෙක් නොවෙයි, නමුත්, මමත්වයෙන් පිරිලා. නුඹට මතකද? ආන්නා බොර්හාර්ට්ව. ඈ සලෝමින්කා දිස්ත්‍රික් කමිටුවේ කාන්තා අංශයේ වැඩ කරනවා. ඔව්, පව්ලූෂා පක්ෂය බොහෝ දෙනෙකුව ඉගෙන ගන්නට යැව්වා. ගුබේර්නියා සෝවියට් සහ පක්ෂ පාසලේ පැරැණි ක්‍රියාකාරීන්

හැම දෙනෙක් ම ඉගෙන ගන්නවා. මාවත් ලබන වසරෙදි යවන්නට පොරොන්දු වෙලා තියෙනවා."

මැදියම් රෑ වූ පසු ඔවුහු නින්දට ගියහ. පාවෙල් උදෑසන අවදිවන විට, පන්ක්‍රාතොව් ගෙදර නොසිටියේය. ඔහු තොටුපළට ගොසිනි. ඔහුගේ අක්කා වන ශක්තිමත් සිරුරක් ඇති, මුහුණින් පන්ක්‍රාතොව්ට සමාන දූස්යා පාවෙල්ට තේ සාද දෙමින් නොයෙක් දේ ගැන කියමින් දෙඩවන්නට වූවාය. දුම්බෝට්ටු පදවන පන්ක්‍රාතොව්ගේ පියාද ගෙදර නොසිටියේය.

කොර්චාගින් ගෙදරින් ඉවත යාමට සැරසෙත්ම, දූස්යා ඔහුට "ආයුබෝවන්" කියමින් මතක් කළාය.

"අමතක කරන්න එපා පාෂා. දවල් කෑමට අපි ඔබව බලාපොරොත්තු වෙනවා."

★

පක්ෂයේ ගුබේර්නියා කමිටු කාර්යාලය වෙනද මෙන්ම ක්‍රියාකාරීය. ඇතුළු වන දොරටුවට නිවාඩුවක් නැත. කෝරිඩෝරය ජනයාගෙන් පිරිලාය. කාර්යාලය තුළ ටයිප්රයිටර හඬ නඟයි.

පාවෙල් කෝරිඩෝරයේ සිට අඳුනන පුද්ගලයන් ඇත්දැයි සොයා බැලීය. අඳුනන කිසිවෙකු නොවූයෙන් ලේකම්වරයාගේ කාර්යාලයට ඇතුළු විය. නිල් පැහැති රුසියානු කමිසයක් හැඳ සිටි ලේකම් තැන විශාල මේසයක් අසල වාඩිවී සිටියේය.

පාවෙල් ඔහු ඉදිරිපිට වාඩි වී අකීම් වෙනුවට පත් වී සිටින්නා දෙස පිරික්සුම් බැල්මක් හෙළීය. යමක් ලිවීම අවසාන කළ රුසියානු කමිසය හැඳ සිටි ලේකම්වරයා හිස ඔසවා ප්‍රශ්න කළේය.

"ආ කාරණය කුමක්ද?"

පාවෙල් ඔහුට සම්පූර්ණ කතාව කීවේය.

"සාමාජික ලැයිස්තුවට මගේ නම ඇතුළු කිරීම සහ මාව දුම්රිය වැඩපොළට යැවීම ඉතාම අවශ්‍යයි, සහෝදරයා. ඒ ගැන නියමයක් කරන්න."

ලේකම්වරයා පුටු ඇන්දට හේත්තු වී අස්ථිර ලෙස කතා කළේය.

"නම ආයෙමත් ඇතුල් කිරීම සහතිකවම කළ හැකියි. නමුත්, නුඹව වැඩපොළට යැවීම තරමක අපහසු වැඩක්.

ස්වෙතායෙව් එතැන වැඩ කරනවා. ඔහු ගුබේර්නියා කමිටුවේ සාමාජිකයෙක්. නුඹට වෙනින් වැඩක් සොයාදීමට අපට හැකි වේවි.”

කොර්චාගින් දෙනෙත් හකුළුවා ගත්තේය.

“මම වැඩපොළට යන්නේ ස්වෙතායෙව්ගේ වැඩට බාධා කරන්නට නොවෙයි. මම යන්නේ මගේ වෘත්තීය අනුව වැඩ කරන්නට මිස ලේකම් වැඩට නොවේ. මගේ සෞඛ්‍ය තත්ත්වය අයහපත් නිසා වෙනින් වැඩකට මාව නොයවන ලෙස ඉල්ලා හිටිනවා.”

ලේකම් තැන එකඟ විය. ඔහු කඩදාසිය ගෙන වචන කීපයක් ලියා පාවෙල් අතට දුන්නේය.

“මේක ටුප්ටා සහෝදරයා අතට දෙන්න. එයා සියලු දේ කර දේවි.”

පෞද්ගලික අංශයේ ප්‍රධානියා වන ටුප්ටා එවේලාවේදී තම සහකරුට බණිමින් සිටියේය. විනාඩියක් පමණ ඔහුගේ බැණවැදීම් අසාගෙන සිටි පාවෙල් කොර්චාගින්, එය ඉක්මනින් අවසාන නොවන බව තීරණය කළෙන්, ටුප්ටාගේ කාර්යාල කාමරයට ඇතුළු වෙමින්, ඔහුගේ බැණවැදීම්වලට බාධා කරමින් මෙසේ පැවසීය.

“ටුප්ටා නුඹ ඔහුට පස්සේ බැණපන්. මෙන්න නුඹට ලියුමක්. මගේ සාමාජිකත්වයට අවශ්‍ය ලියවිලි සූදනම් කරපන්.

“ඔහෝ, නුඹ මැරුණේ නැතිද? දැන් ඉතින් මොනවා කරන්ටද? නුඹේ නම සාමාජික ලැයිස්තුවෙන් අයින් කළා. ඒ ලියවිලි මධ්‍යම කාරක සභාවට යැව්වේ මායි. ඒ විතරක් නොවෙයි සමස්ත රුසියානු සාමාජික ජන ලේඛනයේත් නුඹ නැහැ. කොම්සොමොල් මධ්‍යම කාරක සභාවේ චක්‍ර ලේඛනයක් අනුව, සාමාජික ජන ලේඛනයට ලියාපදිංචි නොකළ අය ඉබේම අස්වෙලා. ඒ නිසා නුඹට තියෙන්නේ ආයෙමත් මුල ඉඳලා කොම්සොමොල් සංවිධානයට බැඳීමයි.” තර්ක කිරීමට ඉඩක් නොතබන කට හඬකින් ටුප්ටා කතා කළේය.

කොර්චාගින් රවා බැලීය.

“නුඹ පරණ විදිහටමද නේද? ගතින් නුඹ තරුණ වුණාට හිතින් නුඹ ලේඛනාගාරයේ පරණ නිලධාරිවාදී උෟරු මීයකු වගේ නාකියි. ටුප්ටා, නුඹ කවදද මිනිහකු වෙන්නේ?”

ටුප්ටා නැගිට සිටියේය.

"නුඹ මට දේශනා කරන්නට එපා. මගේ වැඩවලට වගකියන්නේ මායි. චක්‍රලේඛන ලියන්නේ ඒවා උල්ලංඝනය කිරීමට නොවෙයි. 'උගුරු මීයන්' ගැන මතක් කරලා මට අපහාස කිරීම ගැන මම නුඹට විරුද්ධ ව ක්‍රියා කරනවා."

එම වචන ඇදබාමින් ටුප්ටා පුටුවේ වාඩිවී, නොබැලූ ලියුම් මිටියක් තමා වෙත ඇද ගනිමින් සාකච්ඡාව අවසන් බව ඇඟවීය.

පාවෙල් කලබල නොවී දෙර වෙතට ගමන් කළේය. අනතුරුව ඔහුට කිසිවක් මතක් වූයෙන් ටුප්ටාගේ මේසය අසලට ගොස් ලේකම් තැන දුන් ලිපිය අතට ගත්තේය. ටුප්ටා පාවෙල් නිරීක්ෂණය කළේය. කපටි හා පළිගන්නාසුලු පුද්ගලයකු වූ ඔහු, ගතින් තරුණයකු වුවද, සිතින් මහල්ලෙකි. නිතර පරීක්ෂාවෙන් සිටි ඔහුගේ දෙකන් විශාලය. එනිසා ඔහු අප්‍රියජනක මෙන්ම හාස්‍ය ජනකය.

"හොඳයි," අවඥා, සහගත සන්සුන් ගතියකින් යුතුව පාවෙල් කීය. "සංඛ්‍යාලේඛන අසංවිධාන කළැයි කියලා නුඹට පුළුවනි මට චෝදනා කරන්ට. තමා මිය යන බව වේලාසනින් ලියවිල්ලක් මගින් නොදන්වා, මිය යන මිනිසුන්ට නුඹ දඬුවම් දීමට තරම් කපටියෙක් වුණේ කොහොමදැ යි කියලා මට විස්තර කරපන්. මිනිහෙකුට ඕන නම් ලෙඩවෙන්ට පුළුවනි. ඕන නම් මැරෙන්ට පුළුවනි. ඒ ගැන චක්‍ර ලේඛන නැති බව කියන්නට පුළුවනි."

"හා, හා, හා!" මෙතෙක් වේලා දෙබසට සවන් දෙමින් මධ්‍යස්ථව සිටි ටුප්ටාගේ සහකරුවා තම ප්‍රතිපත්තිය බිඳිමින් හඬ නගා සිනාසුණේය.

ටුප්ටා ලියමින් සිටි පැන්සල් තුඩ කැඩිණි. ඔහු පැන්සලය බිම ගැසීය. ඔහු පාවෙල්ට පිළිතුරු දීමට පෙර මිනිසුන් කීපදෙනෙක් කාර්යාල කාමරයට කඩා වැදුණහ. හඬ නගා කතා කරමින් හා සිනාසෙමින් සිටි මේ පිරිස අතර ඔකුන්යෙව්ද විය. ප්‍රීතියෙන් මවිත වූ ඔවුන්ගේ ප්‍රශ්නවලට අවසානයක් නැතිවා සේය. විනාඩි කීපයකට පසු තවත් තරුණ පිරිසක් ඇතුළු වූ අතර, එහි ඔල්ගා යුරේනෙවාද වූවාය. පාවෙල් යළි දැකීම නිසා අන්දමන්ද වූ ඈ ඔහුගේ අතක් ගෙන බොහෝ වේලා මිරිකන්නට වූවාය.

සිදුවූ දේ ගැන නැවත කීමට පාවෙල්ට බල කෙරිණි. සගයන්ගේ අවංක ආදරයද, නොසැඟවුණු මිත්‍රත්වය සහ අනුකම්පාවද, උණුසුම් ආචාර කිරීම සහ මිතුරු ලීලාවෙන්

පිටට තට්ටු කිරීම ආදියද නිසා පාවෙල්ට මොහොතකට ටුප්ටා ගැන අමතක විය.

තම විස්තරය අවසානයේදී ටුප්ටා සමඟ ඇතිවූ සාකච්ඡාව ගැන දන්වා සිටි විට ඔහු වටකර ගෙන සිටි සගයෝ කෝපය පළ කරමින් හඬ නැගූහ. ටුප්ටා දවා අළු කරන බැල්මකින් ඔහුට සංග්‍රහ කළ ඔල්ගා ලේකම්වරයාගේ කාර්යාල කාමරයට ගියාය.

"අපි යමු නේෂ්දනොවේ ළඟට! ලේකම් ටුප්ටාට හොඳ පාඩමක් උගන්වාවි." මෙසේ කී ඕකුන්යෙව් පාවෙල්ගේ අතක් ගෙන පිට විය. තරුණ පිරිසද ඔල්ගා අනුකරණය කරමින් ගියහ.

"ටුප්ටාව පෞද්ගලික අංශයේ ලේකම් ධුරයෙන් අස්කරලා බඩු පටවන කම්කරුවකු හැටියට පත්කර පන්ක්‍රාතොව් ළඟට යැවිය යුතුයි. ඔහු දරදඬු විනාශකාරී නිලධාරීවාදියෙක්." ඔල්ගා උණුසුම් ලෙස කෑ ගැසුවාය.

ඕකුන්යෙව්, ඔල්ගා සහ අනික් අය ටුප්ටාවා පෞද්ගලික අංශයේ ප්‍රධාන ධුරයෙන් ඉවත් කළ යුතු යැයි ඉල්ලා සිටිවිට, නිහතමානී මද සිනාවකින් මුව සරසාගෙන ගුබේර්නියා ලේකම් තැන සවන් දී සිටියේය.

"කොර්චාගින්ට යළි සාමාජිකත්වය දීම ගැන ප්‍රශ්නයක් නැහැ. ඔහුට දැන්ම සාමාජික කාඩ්පතක් ලියා දෙනු ඇති." ඔල්ගාව සන්සුන් කරමින් නෙෂ්දනොව් පැවසීය. "මම සහෝදරවරුන් සමඟ එකඟ වෙනවා ටුප්ටා බාහිර චාරිත්‍රවලට පමණක් ගරු කරන පෝමලිස්ට්වාදියෙක් බව. ඔහුගේ ප්‍රධානම දුර්වලකම ඒක තමා. නමුත්, ඒ අතර සංඛ්‍යා ලේඛන ලියවිලි ඉතා හොඳ තත්ත්වයකට ඔහු ගෙනා බව අපි පිළිගන්නට ඕනෑ. මම වැඩකළ හැම තැනම කොම්සොමොල් සංඛ්‍යා ලේඛන ඉතා අයහපත් තත්ත්වයක තිබුණා. ඔවුන් ඉදිරිපත් කරන ඉලක්කම් විශ්වාස කරන්නට බැරි තරම් නරකයි. නමුත්, අපේ පෞද්ගලික අංශයේ සංඛ්‍යා ලේඛන හොඳ තත්ත්වයක පවතිනවා. ටුප්ටා රෑ බෝවන තුරු වැඩ කරන බව ඔබ දන්නවා. මම මෙහෙම කල්පනා කරනවා. ඔහුව අස්කරන්ට ඕනෑම වෙලාවක පුළුවනි. ඔහු වෙනුවට නිහතමානී තරුණයෙකුව එතැනට පත්කළ හැකියි. එවිට නිලධාරිවාදය නැතිව යාවි, ඒ වගේම අපට සැබෑ සංඛ්‍යා ලේඛන ලබාගැනීමත් නැතිවී යාවි. ඒ නිසා ටුප්ටා වැඩ කළාවෙ. මම ඔහුට සැහෙන්ට අවවාද කරන්නම්. ඒක ටික

කලකට සෑහේවි. පසුව අපි බලමු." ලේකම් තැන කීය.

"කමක් නැහැ. ඔහෙ වැඩ කළාවේ." ඕකුන්යෙව් එකඟ විය. "පව්ලූෂා අපි යමු සලෝමින්කාවලට. අද එහි සමාජ ශාලාවේ ක්‍රියාකාරීන්ගේ රැස්වීමක් තියෙනවා. නුඹ ජීවතුන් අතර ඉන්නා බව එහි කිසි කෙනෙක් දන්නේ නැහැ. හිටි හැටියේම මම යෝජනා කරනවා. "මීළඟට පාවෙල් කෝර්චාගින් කතා කරයි." පව්ලූෂා නුඹ මළේ නැහැ. හැබෑ හපනෙක්. නුඹ එදා මළා නම් නුඹෙන් නිර්ධන පන්තියට වන සේවය කුමක්ද?" විහිළු ලෙස නිගමනය කළ ඕකුන්යෙව් ඔහුගේ ගෙල වටා අතක් යවා ඔහු කොරිඩෝරයට ගෙන ගියේය.

"ඔල්ගා, නුඹත් එනවාද?"

"සත්තකින්ම එනවා."

දිවා ආහාරය සඳහා පාවෙල් එනතුරු පන්ක්‍රාතොව්ලා බලා සිටියද, ඔහු දහවල් පමණක් නොව එදින රැයෙහිද එහි නොපැමිණියේය. ඕකුන්යෙව් මිතුරා කැටුව තම කාමරයට ආවේය. සෝවියට් සභා නිවසේ ඕකුන්යෙව්ට වෙනම කාමරයක් විය. තමා සතු ආහාරවලින් පාවෙල්ට සංග්‍රහ කළ ඕකුන්යෙව් ඔහු ඉදිරියේ පුවත්පත් ගොඩක්ද, ලොකු පොත් දෙකක්ද තැබීය. ඒ පොත් දිස්ත්‍රික්ක කොම්සොමොල් කමිටුවේ රැස්වීම් වාර්තාය.

"මේ වාර්තා කියවාපන්. නුඹ උණ සන්නිපාතයට ගොදුරු වෙලා කාලෙ නාස්ති කරමින් හිටිය කාලෙදි මෙහෙ වැඩ ගොඩක් කරලා තියෙනවා. තිබුණු දේ ගැනයි, තියෙන දේ ගැනයි දැනගන්නට මේවා කියවාපන්. මම හවස් වෙනවිට එන්නම්. සවස සමාජ ශාලාවට යමු. මහන්සි වුණොත් පොඩ්ඩක් නිදාගනින්." ඕකුන්යෙව් අවවාද කළේය.

තම සාක්කු ලියවිලිවලින් සහ කඩදාසිවලින් පුරව ගනිමින් (බෑගයක් පාවිච්චි කිරීම ඕකුන්යෙව් ප්‍රතිපත්තියක් හැටියට ප්‍රතික්ෂේප කළ අතර, එය ඇඳ යට දමා තිබිණි.) කොම්සොමොල් දිස්ත්‍රික් කමිටුවේ ලේකම්වරයා පාවෙල්ට ආයුබෝවන් කියා කාමරයෙන් පිට විය.

හවස ඕකුන්යෙව් ගෙදර එන විට, ඔහුගේ කාමරය පුරා පුවත්පත් විසුරුවා දමා තිබිණි. මේසය යට තිබුණු පොත් ගොඩ එළියට ඇද දමා ඇති අතර, ඒවායින් කොටසක් මේසය මත ගොඩ ගසා තිබිණි. මිතුරාගේ කොට්ටය යට තිබුණු මධ්‍යම කාරක සභාවේ අලුත්ම ලිපිය, පාවෙල් ඇඳ මත වාඩි වී කියවමින් සිටින විට ඔහු පැමිණියේය.

"ඒයි, නුඹ මගේ කාමරය අවුල් කළේ මොකටද මිනිහෝ!" ව්‍යාජ කෝපයක් මවාගත් ඕකුන්යෙව් කෑගැසීය. "ඒයි සහෝදරයා නැවතියන්, නැවතියන්!" නුඹ කියවන්නේ රහස් ලියුම් නොවේද! මේ වගේ සතකුව මගේ ගෙදරට ඇතුල් කරගත්තාම වෙන දේ තමා මේවා!" පාවෙල් මඳ සිනා පාමින් ලිපිය පසෙක තැබීය.

"මේ ලියුමේ රහස් නැහැ. නමුත්, නුඹ ලාම්පු කවර වෙනුවෙන් පාවිච්චි කළ ලිපිය නම් රහස් ලිපියක්. ඒ ලිපිය වටේට පොඩ්ඩක් පිලිස්සී තියෙන හැටි පේනවද?" ඕකුන්යෙව් වටේට පිලිස්සී ඇති ලිපිය අතට ගෙන එහි සිරස්තලය කියවා බලා අත්ලෙන් නළලට ගසා ගත්තේය.

"මේ කාලකණ්ණි ලියුම දවස් තුනක් තිස්සේම හොයනවා! අතුරුදහන් වෙලා තිබුණා!. දැන් මට මතකයි, මීට දවස් තුනකට ඉස්සෙල්ලා වොලින්ට්සෙව් ඔය ලියුමෙන් ලාම්පු කවරය හැදුවා. ඊට පස්සේ එයාම ඩහදිය පෙරාගෙන ලියුම සෙව්වා." ඕකුන්යෙව් ඉතා ප්‍රවේසමෙන් ලියුම නවා ගුදිරිය යට සැඟවීය. "පසුව පොත් පත්තර අස් කර දමමු." සන්සුන් ලීලාවෙන් ඔහු කීය. "දැන් තියෙන හැටියට කාලා සමාජ ශාලාවට යමු. පව්ලූෂා වාඩි වෙයන්!"

කඩදාසියක එතූ දිගැති වේළුණු මාළුවෙකු ඔහු සාක්කුවෙන් එළියට ගත්තේය. අනික් සාක්කුවේ තිබුණු පාන් පෙති දෙකද ගෙන මේසය මත තැබීය. මේසයේ ඉඩ ඇති තැනෙක කඩදාසි එළා ඔහු මාළුවාගේ හිසෙන් අල්ලා මේසයට ගසමින් එය මොළොක් කළේය.

වියළි මාළුවාගෙන් අඩක් සහ පාන් කෑල්ලක් සපමින් ඕකුන්යෙව් විහිළු තහළු කළ අතර, වැඩ ගැනද කියමින් පාවෙල්ට තොරතුරු දැන්වීය.

★

සමාජ ශාලාවේ වේදිකාවට පිටුපසින් ඇති සේවක දොරටුවෙන් ඔහු පාවෙල් කැටුව ඇතුළු විය. ඉඩ කඩ ඇති ශාලාවේ වේදිකාවට දකුණින් පියානෝව අසල තාල්යා ලගූටිනාද, ආන්නා බෝර්හාර්ට්ද, දුම්රිය සේවයේ කොම්සොමොල් සාමාජිකයෝද වාඩිවී සිටියහ. ආන්නාට ඉදිරිපිට පුටුවක වාඩිවී පැද්දෙමින් සිටියේ ඩිපෝ කොම්සොමොල් සංවිධානයේ ලේකම් වොලින්ට්සෙවය. ඔහුගේ මුහුණ අගෝස්තු මාසයේ ඇපල් ගෙඩියක් මෙන්

රතුය. ඔහුගේ හිසකේ හා බැම සඟළද රන් පැහැතිය. ඔහු හැඳ සිටි සම් කබාය පරණ වී ගෙවී ගියද, එය ඉස්සර පැහැයෙන් කළුව තිබූ බව කිව හැකිය.

ඔහු සමීපයෙහි නොසැලකිල්ලකින් වැළමිට පියානෝව මත තබාගෙන ස්වෙතායෙව් වාඩිවී සිටියේය. කඩවසම් තරුණයෙකු වූ ඔහු දුඹුරු පැහැති හිසකේ ඇත්තෙකි. ඔහුගේ දෙතොල යසට කැපී පෙනෙයි. ඔහුගේ කමිස කර වසා නොතිබිණි.

මේ පිරිසට ඕකුන්යෙව් ළංවෙත්ම, ආන්නාගේ කතාවේ අවසාන වචන කීපය ඔහුගේ කන්හි වැකිණි.

"සමහර උදවිය අලුත් සාමාජිකයන් බඳවා ගැනීමට හැම අතකින්ම බාධා කරනවා. ඉන් එක් කෙනෙක් තමා ස්වෙතායෙව්."

"කොම්සොමොලය මහ පාරේ යන එන අය ලගින අම්බලමක් නොවෙයි." රළු හා නොසැලකිලි ලෙස ස්වෙතායෙව් පිළිතුරු දුන්නේය.

"බලපල්ලා, බලපල්ලා, නිකොලායි ඕකුන්යෙව් අද සමොවාරයක් වගේ දිලිසෙනවා." යැයි තල්යා ඔහු දැක කීවාය.

ඔවුහු ඕකුන්යෙව් වටකර ගෙන ප්‍රශ්න අසන්නට වූහ.

"ගියේ කොහෙද?"

"රැස්වීම පටන් ගනින්!"

කණ්ඩායම සන්සුන් කරනු වස් ඕකුන්යෙව් අතක් එසවීය.

"සහෝදරවරුනි, කලබල වෙන්ට එපා. දැන් තෝකරෙව් ආ හැටියම පටන් ගනිමු."

"ඔන්න එයා එනවා." ආන්නා කීවාය.

සැබැවින්ම දොර හැරගෙන ශාලාවට ඇතුළු වුණේ සලෝමින්කා පක්ෂ කමිටුවේ ලේකම්වර තෝකරෙව්ය. ඔහු පිළිගැනීමට ඕකුන්යෙව් ඉදිරියට දිව ගියේය.

"ලොකු තාත්තේ, වේදිකාවේ පිටු පස්සට යමු. ඔබේ පරණ යාළුවකුව මම හඳුන්වා දෙන්නම්. ඔබ පුදුම වේවි!"

"නුඹේ වැඩේ මොකක්ද?" මහලු තෝකරෙව් සිගරැට්ටුව උරා දුම් වැටියක් යවමින් මිමිනුවේය. එහෙත්, ඕකුන්යෙව් ඔහුව අතින් ඇදගෙන ගියේය.

★

ඕකුන්යෙව් සභාපතිවරයාගේ සීනුව කොතරම් ප්‍රචණ්ඩකාරී

ලෙස ගැසුවේද යත්, නිතර දෙඩීමෙහි දක්ෂ කටකාරයෝ පවා නිහඬ වූහ.

තෝකරෙව්ට පිටුපස බිත්තියේ, නත්තල් ගසේ අතුවලින් සැරසූ රාමුවක් තුළ 'කොමියුනිස්ට් ප්‍රකාශනය' ලියූ මහ ප්‍රඥාවන්තයා - කාල් මාක්ස්ගේ සිංහමය හිස සහිත පිංතූරයකි. ඕකුන්යෙව් රැස්වීමේ වැඩ අරඹමින් කතා කළ අතර, තෝකරෙව් වේදිකාවේ කොනක සිටි පාවෙල් කොර්චාගින් දෙස බලාගත්වනම සිටියේය.

"සහෝදරවරුනි! අපේ සංවිධානයේ කාර්යභාරයන් ගැන සාකච්ඡා කිරීම පටන් ගැනීමට පෙර, අපේ සගයෙක් කතාවක් ඉල්ලා සිටිනවා. තෝකරෙව් සහෝදරයාත් මාත් තීරණය කළා ඔහුට කතා කිරීමට අවසර දීමට."

රැස්ව සිටි පිරිස අනුමත කරමින් හඬ නගත්ම, ඕකුන්යෙව් සභාව ඇමතීය.

"මීළඟට ඔබ අමතන්නේ පාවෙල් කොර්චාගින්ය!"

ශාලාවේ රැස්ව සිටි සිය දෙනාගෙන් අසූ දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් කොර්චාගින් දැන සිටියහ. දැක පුරුදු පුද්ගලයාගේ රුව වේදිකාවට පැමිණි විට, උසැති මලානික තරුණයා කතා කිරීමට පටන් ගත් විට, රැස්වූවෝ සතුට ප්‍රකාශ කර ඉමහත් ප්‍රීති ඝෝෂා පැවැත්වූහ.

"ආදරණීය සහෝදරවරුනි!"

කොර්චාගින්ගේ කටහඬ එක සමාන වුවද, ඔහුගේ කැලඹීම මැඩ ගැනීමට ඔහු අසමත් විය.

"මිත්‍රවරුනි, මම මට නියමිත ස්ථානය ගැනීමට පැමිණ සිටිමි. මා නැවත පැමිණීම ගැන මම ඉතාමත්ම ප්‍රීතිවෙමි. මගේ මිතුරන්ගෙන් බොහෝ දෙනෙකු මම මෙහිදී දකිමි. මට ඕකුන්යෙව්ගේ ගෙදරදී දැනගන්නට ලැබුණා. සලෝමින්කාවල කොම්සොමොල් සංවිධානයේ සාමාජික සංඛ්‍යාව සියයට තිහකින් වැඩිවුණු බව. වැඩපොළේදි සහ ඩිපෝවලදී සිගරැට් ලයිටර හැදීම නවත්වා තිබෙන බව ආරංචියි. පරණ දුම්රිය යන්ත්‍ර ආපසු සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කිරීම පටන් අරගෙන. මෙහි තේරුම අපේ රට නැවත ජීවය ලබා ශක්තිය ගොනු කරගෙන ඉදිරියට යන බවයි. ජීවත්වීමට අවශ්‍ය හේතු තියෙනවා! මේ වගේ වේලාවක මට මිය යාමට පුළුවන්ද?" කොර්චාගින්ගේ දෙනෙත් ප්‍රීතිමත් ලෙස මඳ සිනා පෑවේය.

අත් පොළසන් හා ප්‍රීති ඝෝෂා මධ්‍යයේ ඔහු වේදිකාවෙන් බිමට බැස ආන්නා බොර්හාර්ට් සහ තාල්යා ලගුටිනා වාඩි

වී සිටි තැනට යමින් හණිකට කීප දෙනෙකුට අත දී ආචාර කළේය. යහළුවෝ ඔහුට ඉඩ දුන්හ. ඔහු ඔවුන් දෙදෙනාට මැදින් වාඩි විය. තාල්යා ඔහුගේ අතක් රැගෙන ඉතා තදින් මිරිකමින් ආචාර කළාය.

ආන්නා දෙනෙත් මහත් කරගෙන ඔහු දෙස බලයි. ඇගේ ඇසිපිය යන්තමින් නැටවෙයි. ඇගේ බැල්මෙහි විමතියක් හා සාදරයක් පෙනෙන්නට තිබිණි.

★

දවස් ඉක්මනින් ගෙවිණි. ඒවා ඒකතානමය දවස් ලෙස නම් කළ නොහැකිය. හැම දවසක්ම නවතාවක් ගෙනාවේය. හැමදම උදෑසන තමාගේ කාලය බෙදා වෙන් කරන පාවෙල් කලින් පිළියෙල කරගත් යමක් සඳහා කාල වේලාව මඳ බැවින් එය නොකළ බව දකින්නේ කනගාටු විය.

පාවෙල්, ඕකුන්යෙව්ගේ කාමරයේ පදිංචි වී දුම්රිය වැඩපොළේ විදුලිබල කාර්මික ශිල්පියකුගේ සහායක හැටියට වැඩ කළේය.

කොම්සොමොල් සංවිධානයේ නායකත්වයේ කටයුතුවලින් ඈත්වී වැඩ කිරීමට ඕකුන්යෙව්ගේ කැමැත්ත පාවෙල් ලබා ගත්තේ දීර්ඝ ලෙස ඔහු සමඟ තර්ක කිරීමෙන් පසුවය.

"අපට මිනිස්සු මදි. නුඹ වැඩපොළට වෙලා 'සැපට' වැඩ කරනවා. නුඹ ලෙඩ වුණා කියලා මට කියන්න එපා. මට උණ සන්නිපාතය හැදුණයින් පස්සෙ මාසයක්ම හැරමිටියක් අරගෙන තමයි, දිස්ත්‍රික් කමිටු රැස්වීම්වලට ආවේ. පච්කා, මම නුඹේ හැටි දන්නවා. මෙතැන වෙන හොරයක් තියෙනවා. නුඹ මට එක පාරම ඇත්ත කියාපන්." ඕකුන්යෙව් බල කළේය.

"කෝල්යා, ඇත්ත නම් මම ඉගෙනගන්ට කැමතියි."

ඕකුන්යෙව් ජයගත් ලීලාවෙන් හඬ නැඟීය.

"ආ-හා! ඔන්න හොරේ! නුඹ කැමතියි, නුඹ හිතන්නේ මා අකැමැතියි කියලද? සහෝදරයා, ඔය ආත්මාර්ථවාදයයි. අපි මෙතන වැඩ කරන්න ඕන. නුඹ ඉගෙන ගන්නවා. එහෙමද? ඒවා හරියන්නෙ නැහැ. හෙටම නුඹ සංවිධායක ධුරයට පත් කරනවා."

එහෙත්, දිගු සාකච්ඡාවකින් පසුව ඕකුන්යෙව් පසු බැස්සේය.

"හොඳයි, මාස දෙකක් යනතුරු මම නුඹට අත තියන්නෙ

නැහැ. මගේ හොඳ ගති නුඹ අගය කරාවි. නමුත්, නුඹට බැහැ ස්වෙතායෙව් සමඟ එකට වැඩ කරන්ට. ඔහුගේ ඔළුව ඉදිමිලා."

කෝර්චාගින් දුම්රිය වැඩපොළට පැමිණීම නිසා ස්වෙතායෙව් සුපරීක්ෂාකාරී විය. කොර්චාගින්ගේ පැමිණීමත් සමඟම නායකත්වය සඳහා පොරකෑමක් ඇතිවන බව ඔහු විශ්වාස කළේය. දැඩි ආත්මාඩම්බරයෙන් පෙළුණු ඔහු පහර දීමට සැරසුණේය. එහෙත්, පළමුවැනි දවස් කීපය තුළදී ඔහුගේ මතය වැරැදි බව ඔහුට ඒත්තු ගියේය. කොම්සොමොල් බියුරෝ මණ්ඩලයට ඔහු ඇතුළු කර ගැනීමට වැඩ පිළිවෙළක් තිබෙන බව දැනගත් පාවෙල්, ලේකම් තැනගේ කාර්යාලයට ගොස් තමාත්, ඕකුන්යෙව්ත් අතර ඇති එකඟතාව කරුණක් හැටියට පෙන්වමින්, ඔහුගේ නම ඉවත් කරන ලෙස ඉල්ලා සිටියේය. වැඩපොළේ ශාඛා සමිතියේ දේශපාලන අධ්‍යාපනය භාරගත් ඔහු බියුරෝවේ වැඩ ඉල්ලා නොසිටියේය. නිල වශයෙන් පාවෙල් කොර්චාගින් නායකත්වයෙන් ඈත් වුණද, සාමූහික හැම වැඩකදීම ඔහුගේ බලපෑම දැනිණි. ස්වෙතායෙව් අමාරුවේ වැටුණු කීප වාරයකදීම, පාවෙල් ඔහුට නොදැනුවත්ම මිතුරු ලීලාවෙන් ඔහු ගොඩගත්තේය.

වැඩ ශාලාවේ තරුණ සමිති ශාඛාවද, පාක්ෂිකයන් නොවන තරුණයන් තිස්දෙනෙකු පමණද ඉමහත් උනන්දුවකින් යුතුව ජනේල සෝද, අවුරුදු කීපයක් තිස්සේ කුණු තැවරී තිබුණු යන්ත්‍ර හා උපකරණ ශුද්ධ කොට, නුවමනා යකඩ කෑලි සහ කුණු ගොඩගසා වත්තට යන සැටි ස්වෙතායෙව් විමතියෙන් යුතුව බලාගෙන සිටියේය. ග්‍රීස් හා මැෂින් තෙල්වලින් වැසී තිබුණු වැඩ ශාලාවේ සිමෙන්ති පොළොව සේදු පාවෙල් එය රෙදි මුස්නයකින් පිස දමන්නට විය.

"නුඹලා මොකද මේ පිරිසිදු කරන්නෙ?" තේරුම් ගත නොහැකිව ස්වෙතායෙව් පාවෙල්ගෙන් විචාළේය.

"කුණු ගොඩේ වැඩ කිරීමට අපි කැමති නැහැ. අවුරුදු විස්සක් තිස්සේ මෙතන කවුරුවත් සුද්ද කළේ නැහැ. අපි සුමානෙකින් වැඩ ශාලාව අලුත් කරන්නෙමු." පාවෙල් ඔහුට කෙටියෙන් පිළිතුරු දුන්නේය.

ස්වෙතායෙව් දෙඋර සොලවා යන්නට ගියේය.

විදුලි කාර්මික ශිල්පියෝ එතැනින් නොනැවතී වැඩ ශාලාවේ වත්ත ශුද්ධ කිරීමට පටන් ගත්හ. මේ විශාල

වත්ත බොහෝ කලක් තිස්සේ කසල ගොඩක් විය. එතැන නොතිබුණේ මොනවාද? එතැන දුම්රිය රෝද සිය ගණනකි. අක්ෂ දඬු, මල කෑ යකඩ දුම්රිය පීලි, බපර් පටි, අක්ෂ අඬු පෙට්ටි, අව්වට වේළෙන වැස්සට තෙමෙන ලෝහ ටොන් දහස් ගණනක් එතැන විසිකර තිබිණි. ඒවා ශුද්ධ කිරීම පාලන අංශය විසින් නවත්වන ලදි.

"අප විසින් කළයුතු වැදගත් වැඩ තවත් ඇත. වත්ත සුද්ද කිරීම පසුව කළ හැකිය."

එවිට විදුලි කාර්මික ශිල්පියෝ ගඩොල් තබා තම වැඩ ශාලාවට යාමට පාරක් සාද, දෙර අසල සපත්තුවල කුණු ශුද්ධ කිරීම සඳහා කම්බිවලින් සෑදූ පාපිස්නක් තැබූහ. පිටත ශුද්ධ කිරීම එතැනින් නැවතුණද, වැඩ ශාලාව තුළ හැමදම හවස වැඩ කිරීමෙන් පසු පිරිසිදු කිරීම නොනැවැතිණි. සතියකට පසුව දුම්රිය වැඩපොළේ ප්‍රධාන ඉංජිනේරු තැන්පත් ස්ට්‍රීෂ් වැඩ ශාලාවට පැමිණි විට, එය ආලෝකයෙන් දිලිසිණි. විශාල යකඩ රාමු රහිත කවුළුවල අවුරුදු කීපයක් තිස්සේ බැඳී තිබුණු කුණු සහ තෙල් සහිත පැල්ලම් අතුරුදහන් විය. එබැවින් හිරු එළිය වැඩ ශාලාව තුළට වැටී මැෂින්-යන්ත්‍ර ශාලාවේ ඇති ඩීසල් යන්ත්‍රවල තඹ කොටස් ආලෝකයෙන් බැබළිණි. යන්ත්‍රවල බරැති කොටස්වලට කොළ පාට තීන්ත ගා තිබුණු අතර, කිසිවකු විසින් යන්ත්‍ර රෝදවල 'ස්පෝක්වල' කහ පැහැති ඊතල අඳිනු ලැබ තිබිණි.

"යසයි, යසයි" ස්ට්‍රීෂ් ඉංජිනේරු තැන විමතිය පළ කළේය.

වැඩ ශාලාවේ ඈත කොනක මිනිස්සු කීප දෙනෙක් වැඩ අවසන් කරමින් උන්හ. ස්ට්‍රීෂ් එතැනට ගමන් කළේය. දිය කළ තීන්ත බඳුනක් අතැතිව පාවෙල් කොර්චාගින් ඉදිරියට ආවේය.

"යාළුවා නැවතියන්." ඉංජිනේරුවා ඔහු නැවැත්වීය.

"නුඹලා කරන වැඩවලට මා කැමැතියි. නමුත්, නුඹලාට තීන්ත දුන්නෙ කවුද? දැනට ලෙහෙසියෙන් හොයාගන්ට බැරි ද්‍රව්‍යයක් වන තීන්ත මගෙන් අවසර නැතිව පාවිච්චි කිරීම තහනම් කරලා තියෙනවා. නුඹලා කරන වැඩවලට වඩා දුම්රිය කොටස්වලට තීන්ත ගෑම වැදගත්." ඉංජිනේරුවා පැවැසීය.

"අපි තීන්ත හොයාගත්තෙ වීසි කරපු තීන්ත ටින්වලින්. දවස් දෙකක් තිස්සේම පරණ ටින් හූරලා තීන්ත රාත්තල් විසිපහක් විතර හොයා ගත්තා. අප නීතියට එකඟව වැඩ

කරලා තියෙනවා ඉංජිනේරු සහෝදරයා.”

ඉංජිනේරුවා තව වරක් හඬ නැගුවද, තරමක ලජ්ජාවක් පෙන්වීය.

“එහෙමනම් සත්තකින්ම වැඩ කරපල්ලා. ඔව්... කොහොම වුණත් මා දැනගන්ට කැමතියි... වැඩ ශාලාව සිය කැමැත්තෙන්ම පිරිසිදුව තබා ගැනීමේ ආසාව ගැන විස්තර කරන්නේ කොහොමද? මේවා සියල්ල නුඹලා කළේ වැඩ කරන කාලයෙන් පසුව නේද?”

ඉංජිනේරුවාට තම කාරණය වටහා ගැනීමට බැරි වී ඇති බව පාවෙල්ට වැටහිණි.

“සත්තකින්ම, ඔබ කල්පනා කළේ කොහොමද?”

“ඔව් නමුත්...”

“ස්ට්‍රීජ් සහෝදරයා, ඔන්න ඔහොමයි. මේ තරම් විශාල කසළ ගොඩක් දිහා නොබලා බොල්ෂෙවික්වරු වැඩ කරනවයි ඔබට කීවේ කවුද? නවතින්නකො, අපි මේ ව්‍යාපාරය තවත් පුළුල් කරනවා. ඔබට තවත් බොහෝ අලුත් දේ බලන්නටත්, මවිත වීමටත් ඉඩ ලැබේවි.”

ඉංජිනේරුවාගේ ඇඟෙහි තීන්ත නොතැවරීමට වග බලාගත් කොර්චාගින් දොර දක්වා ගියේය.

මහජන පොත්ගුලට යන කොර්චාගින් රෑ බෝ වන තුරු එහි වාඩි වී පොත් කියැවීය. ඔහු මෙහි සේවය කරන සේවකයන් තිදෙනා සමඟ මිත්‍ර වී, සියලු ප්‍රචාරක මාධ්‍ය පාවිච්චි කරමින් ඔවුන්ගේ සිත් දිනාගෙන අවසානයේදී තමන්ට වුවමනා පොත් සඟරාදිය ගෙන බැලීමට තරම් නිදහසක් ලබා ගත්තේය. යෝධමය පොත් රාක්කවලට ඉණිමඟක් තබා පාවෙල් එහි නැග තමාට අවශ්‍ය පොත ගෙන එහිම වාඩි වී පැය ගණනක් තිස්සේ එය කියවයි. එහි ඇති පොත්වලින් ඉතා විශාල කොටස පැරැණි ඒවාය. සමකාලීන සාහිත්‍යය එක් කුඩා පොත් රාක්කයක තබා ඇත. රටවැසි යුද්ධ සමයේදී මුද්‍රණය කළ පොත් පිංචවල් කීපයක්ද, කාල් මාක්ස්ගේ ප්‍රාග්ධනයද, ජැක් ලන්ඩන්ගේ යකඩ විළුඹද, තවත් පොත් කීපයක්ද එහි විය. පැරැණි පොත් අතර වරක් ‘ස්පාටකස්’ නම් වූ නවකතාව පාවෙල් සොයා ගත්තේය. දෙරැයකින් එය කියවා අවසන් කළ ඔහු එය ගෙනැවිත් මක්සිම් ගෝර්කිගේ පොත් අසලින් තැබීය. තමා කැමැති පොත් එකට ගොඩ ගැසීම ඔහු විසින් බොහෝ කලක් තිස්සේ කරන ලදි.

පොත් ගුල් සේවකයෝ එයට බාධා නොකළහ. මන්දයත්, ඔවුන් උදාසීනව සිටි බැවිනි.

★

දුම්රිය වැඩපොළේ කොම්සොමොල් ශාඛාවේ සන්සුන් ජීවිතයට දැඩි ලෙස පළමුවෙන්ම බාධා කරනු ලැබුවේ බැලූ බැල්මට වැදගත් යැයි නොකිව හැකි සිද්ධියක් විසිනි. ශාඛා බියුරෝවේ සාමාජිකයෙකු වූ, අලුත්වැඩියා කරන අංශයේ වැඩ කරන කෝස්ට්යා පීඩින් යකඩ කැල්ලක් විදින අතර, ඉතා වටිනා ඇමෙරිකන් උපකරණයක් කැඩීය. හෙමින් ක්‍රියාකරන පීඩින්ගේ නහය පෙතැලිය. මුහුණ වසූරිය කැළැල් වලින් ගහනය. ඔහු එය කඩා දැමුවේ ඔහුගේ නින්ද සහගත නොසැලකිලිමත්කම නිසාය. වඩාත් නරක ඔහු එසේ කළේ වුවමනාවෙන් බැවිනි. එය සිදුවූයේ උදෑසනය. අලුත්වැඩියා කරන අංශයේ ජ්‍යෙෂ්ඨ ශිල්පියා වූ හොදෙරොව් යකඩ තැටියක සිදුරු කීපයක් විදින ලෙස කෝස්ට්යාට කීවේය. ඔහු මුලදී එය කිරීම ප්‍රතික්ෂේප කළද, ජ්‍යෙෂ්ඨ ශිල්පියාගේ බලකිරීම නිසා යකඩ තැටිය ගෙන එහි සිදුරු විදින්නට විය. හොදෙරොව් වැඩ කොටස් ඉටු කිරීමේදී දැඩි බවක් පෙන්වා සිටි බැවින් ඔහු ජනප්‍රිය පුද්ගලයකු නොවීය. ඔහු කලෙක මෙන් බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයකුව සිටියේය. පොදු සමාජමය වැඩවලට කොහෙත්ම සහභාගි නොවීය. ඔහු කොම්සොමොල් සාමාජිකයන් දෙස බැලුවේ මිතුරු ඇසකින් නොවේ. එහෙත්, හොදෙරොව් තම වෘත්තීය ඉතා හොඳින් දැනසිටි අතර, තමාට අයත් වැඩ කොටස නොපිරිහෙළා ඉටු කළේය. කෝස්ට්යා සිදුරු විදීමට අවශ්‍ය ඛණිජ තෙල් රහිතව 'වියළි ලෙස' විදින බව හොදෙරොව් දුටුවෙන්, ඔහු හණිකට සිදුරු විදින ලියවන පට්ටලය දෙසට විත්, එය නවත්වා බැණ වැදුණේය.

"නුඹ පොට්ටයෙක්ද, එහෙමත් නැති නම් මෙතන වැඩට ආවේ ඊයේද?"හොදෙරොව් කෝස්ට්යාට කෑ ගැසුවේ, එසේ සිදුරු විදීම කළහොත් උපකරණය බිඳෙන බව මැනවින් දත් බැවිනි.

එහෙත්, කෝස්ට්යාද පෙරළා ශිල්පියාට බැණ වැදී පෙර සේම ලියවන පට්ටලය ක්‍රියා කරවීය. හොදෙරොව් අංශයේ ප්‍රධානියා සොයා ගියේ තම සහායකට විරුද්ධව චෝදනා කිරීමටය. ඒ අතර කෝස්ට්යා ලියවන පට්ටලය නොනවත්වා ඛනිජ තෙල් සෙවීම සඳහා දිව ගියේය. අංශය භාර ප්‍රධානියා පැමිණීමට පෙර නිසිලෙස තෙල් දමා වැඩ කළ බව පෙන්වීම ඔහුගේ අදහස විය. ඔහු තෙල් බඳුන සොයාගෙන එන විට

විදින කටුව කැඩී ඉවරය. අංශය භාර ප්‍රධාන තැන කෝස්ට්යා පීඩින් රැකියාවෙන් නෙරපා දැමීමට වාර්තාවක් ඉදිරිපත් කළේය. කොම්සොමොල් බියුරෝ මණ්ඩලය හොදෙරොව් ක්‍රියාකාරී තරුණයන්ට විරුද්ධව කටයුතු කරන බව කියමින් කෝස්ට්යාට පක්ෂව ඉදිරිපත් විය. පරිපාලකයෝ ඔහු අස්කළ යුතු බව කියා සිටියහ. ඔහු පිළිබඳ ප්‍රශ්නය කොම්සොමොල් බියුරෝ මණ්ඩලයට ඉදිරිපත් කළෙන් අරගලය ඇරැඹිණි.

බියුරෝ මණ්ඩලයේ සාමාජිකයන් පස්දෙනාගෙන් ස්වෙතායෙව් ඇතුළු තිදෙනෙක් කෝස්ට්යාගේ ක්‍රියාව හෙළාදකිමින් ඔහුට වෙනත් වැඩක් භාරදිය යුතු බව කියා සිටි අතර, ඉතිරි දෙදෙනා ඔහු වරදකරු නොවන බව කියා සිටියහ.

මේ රැස්වීම පැවැත්වූයේ ස්වෙතායෙව්ගේ කාමරයේදීය. මෙහි රතු රෙද්දකින් වැසූ විශාල මේසයකි. එය වටා දිගැති බංකු සහ කුඩා බංකු කීපයකි. මේවා වඩු වැඩ අංශයේ තරුණ කම්කරුවන් විසින් සාදනු ලැබූ දේය. බිත්තියේ කොමියුනිස්ට් නායකයන්ගේ පිංතූරය, මේසයට පිටුපසින් සමූහයේ රතු ධජය විහිදුවා එල්ලා ඇත.

ස්වෙතායෙව් "වැඩවලින් නිදහස් කළ" කොම්සොමොල් සංවිධානයේ ක්‍රියාශීලියෙකි. යකඩ කම්කරුවකු වූ ඔහු, සිය දස්කම් නිසාම පහුගිය හාරමස තුළදී තරුණ සංවිධානයේ නායකත්වයේ සාමාජිකයෙකු බවට පත්විය. කොම්සොමොල් තරුණ සංවිධානයේ ප්‍රාදේශීය කමිටුවේ හා ගුබේර්නියා කමිටුවේ සාමාජිකයෙකු දක්වා ඔහු උසස් විය. යන්ත්‍රණ ශාලාවේ යකඩ තැළුෑ ඔහුට අලුත්වැඩියා කරන ශාලාව අලුත් තැනකි. පළමුවැනි දවසේ සිටම ඔහු පාලනය සියතට ගත්තේය. තමා කෙරෙහි දැඩි විශ්වාසයක් ඇතිව සිටි ඔහු හදිසි තීරණ ගත් අතර, තරුණ කම්කරුවන්ගේ උනන්දුව පාගා දැම්මේය. හැම දෙයක්ම කිරීම තම අතට ගත්තේය. ගත් වැඩ කිරීම අතපසු වූ විට, ස්වෙතායෙව් ඒවා තම සහායකයන් පිට පටවා ඔවුන්ට බැණ වැදුණේ, ඔවුන් නිකමුන් බව කියමිනි.

ශාඛා කාර්යාල කාමරය සැරසුවේද ඔහුගේ නායකත්වය යටතේය.

ඔහු රැස්වීම මෙහෙයවූයේ මුදු ආසනයක් සහිත එකම ඇඳි පුටුවේ වාඩි වෙලාය. එය සමාජ ශාලාවෙන් ගෙන ආ එකකි. රැස්වීම බියුරෝ සාමාජිකයන්ට පමණක් සීමා වූවකි.

පක්ෂ සංවිධායක හමුතොව් කතා කිරීමට නැඟිට සිටිත්ම, අඟුළුදා වසා තිබුණු දොරට කිසිවකු විසින් තට්ටු කෙරිණි.

ස්වෙතායෙව් මූණ අසතුටින් රැලි ගන්වා ගත්තේය. යළිත් දොරට තට්ටු කරන හඬ ඇසිණි. කත්‍යූෂා සෙලෙනෝවා දොර අගුළු හැරියාය. දොර අසල කොර්චාගින් සිටි අතර කත්‍යූෂා ඔහුට ඇතුළු වීමට ඉඩ දුන්නාය.

පාවෙල් හිස්ව තිබූ බංකුවක් වෙත පා නඟත්ම ස්වෙතායෙව් ඔහු ඇමතීය.

"කොර්චාගින්, අපේ බියුරෝ රැස්වීම සාමාජිකයන්ට පමණයි."

පාවෙල්ගේ දෙකොපුල් රත් පැහැ ගති. ඔහු සෙමින් මේසය දෙසට හැරුණේය.

"මම ඒ බව දන්නවා. කෝස්ට්යාගේ වැඩ ගැන නුඹලාගේ අදහස් දැනගන්නයි මට වුවමනා. එයට සම්බන්ධ වූ අලුත් ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට මා කැමැතියි. නුඹ මා සහභාගී වනවාට විරුද්ධද?"

"මම විරුද්ධ නැහැ. නමුත්, නුඹ දන්නවා ප්‍රසිද්ධ නොවන රැස්වීම්වලට සහභාගි වන්නේ බියුරෝ සාමාජිකයන් පමණක් බව. සෙනඟ වැඩිවුණාම සාකච්ඡා කිරීමට අපහසුයි, දැන් ඉතින් ආවා නම් වාඩිවෙයන්."

"බාහිර චාරිත්‍රවලට මේ තරම් නුඹ ගරු කරන්නෙ මොකටද?" හමුතොව් තම නොසතුට ප්‍රකාශ කළද, පාවෙල් ඉඟියකින් ඔහු නවත්වා අසල වූ බංකුවක වාඩි විය. "මා කතා කරන්න කැමති මෙන්න මේ කාරණය ගැනයි." හමුතොව් පැවසීය. "හොදෙරොව් පරණ නිකායට අයිති බව නම් ඇත්ත. නමුත්, අපේ විනය ඉතාම පහතට වැටිලා. කොම්සොමොල් තරුණයො හැම එක්කෙනෙකුම ඔහොම උපකරණ කඩන්නට ගියොත් අපට වැඩ කරන්ට කිසිවක් නැතිවී යාවි. පක්ෂයේ නොවන අයට දෙන ආදර්ශයත් ඉතාම නරකයි. අපේ හාදයාට තදබල අවවාද කිරීමක් කළ යුතුයි."

ස්වෙතායෙව් පක්ෂ කමිටුවේ සංවිධායකයාට කතාව අවසාන කිරීමට ඉඩ නොදී ඔහුට බාධා කළේය. විනාඩි දහයක් බලා සිටි කොර්චාගින්ට බියුරෝ තත්ත්වය වැටහිණි. එම ප්‍රශ්නය ඡන්දයට දැමූ පසු කොර්චාගින් කතා කිරීමට අවසර ඉල්ලා සිටියේය. ස්වෙතායෙව් ඔහුට ඉඩ දුන්නේ අකැමැත්තකිනි.

"සහෝදරවරුනි, කෝස්ට්යාගේ ක්‍රියාව පිළිබඳ මගේ

අදහස් මා ඔබට දන්වා සිටීමට කැමැතියි.”

පාවෙල්ගේ කටහඬට තමා කැමති වුණාට වඩා දැඩි විය.

“කෝස්ට්යාගේ ක්‍රියාව එක්තරා සංඥාවක් විතරයි. මෙතැන වැදගත් කෝස්ට්යාගේ ක්‍රියා කලාපය පමණක් ම නොවෙයි. මම ඊයේ ඉතාමත්ම වැදගත් ඉලක්කම් ටිකක් හොයාගත්තා.” පාවෙල් සාක්කුවකින් සටහන් පොතක් ඇදගත්තේය.

“මා ඒවා ලබාගත්තේ වේලාව සටහන් කරන්නා ගෙන්. සැලකිල්ලෙන් අහන්න. කොම්සොමොල් තරුණ සාමාජිකයන්ගෙන් සියයට විසිතුනක් දිනපතා විනාඩි පහේ සිට විනාඩි පහළොව දක්වා පමාවෙනවා. මෙය දැන් නීතියක් බවට පත්වෙලා. කොම්සොමොල්වරුන්ගෙන් සියයට දහහතක් මාසෙකට දවසක් හෝ දෙකක් හෝ වැඩට නැවිත් ඉන්නවා. ඒ අතර, පක්ෂයට හා තරුණ සමිතියට අයත් නැති තරුණයන් අතර ඔය විදිහට වැඩට නැවිත් ඉන්න ගණන සියයට දහ හතරක් විතරයි. ඉලක්කම් වේවැලට වඩා දරුණුයි, මම තවත් දේ සටහන් කරගත්තා. පක්ෂයේ සාමාජිකයන් අතර මසකට එක දවසක් වැඩට නොඑන අයගේ සංඛ්‍යාව සියයට හතරකි, පමා වී වැඩට එන සංඛ්‍යාවද සියයට හතරකි. පක්ෂයේ සාමාජිකයන් නොවන අය අතර මසකට වරක් වැඩට නොඑන සංඛ්‍යාව සියයට එකොළහකි. වැඩට පැමිණීමේදී පමා වෙන අයගේ සංඛ්‍යාව සියයට දහ තුනකි. සියයට අනූවක් උපකරණ කඩා බිඳ දමන්නේ තරුණයන්ය. අලුතින් වැඩට පැමිණි අය මින් සියයට හතකි. ඒ අනුව මෙවැනි නිගමනයකට බැසිය හැකිය. කොම්සොමොල්වරුන් වන අපි පක්ෂයේ සාමාජිකයන්ට හා වැඩිහිටි කම්කරුවන්ට වඩා බොහෝ සෙයින් නරක ලෙස වැඩ කරමු. මේ තත්ත්වය හැම වැඩ ශාලාවකටම සමාන නොවේ. වාත්තු වැඩ ශාලාව ඉතාම හොඳයි. විදුලි කාර්මික වැඩ ශාලාව සතුටුදයකයි. අනික් වැඩ ශාලාවල් අඩු වැඩි වශයෙන් සමානයි. විනය ගැන හමුතොව් සහෝදරයා කතා කළේ සියයට විසිපහක් පමණක් බව මගේ හැඟීමයි. මේ ඇදවීම් හා වක්‍රවීම් නිසි තත්ත්වයට ගෙන ඒම සඳහා ක්‍රියා කිරීම අපේ කාර්යයයි. මෙතැනදී උද්ඝෝෂණය කිරීම් හා රැස්වීම් තැබීම් කිරීමට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. නොසැලකිලිකමට හා අලසකමට විරුද්ධව අපි ඉතා දැඩි ලෙස ක්‍රියා කළ යුතුයි. පැරැණි කම්කරුවෝ මෙහෙම කියනවා. ස්වාමියා යටතේ

හොඳට වැඩ කළා. ධනපතියා යටතේ හොඳට වැඩ කළා. දැන් අපි ස්වාමිවරුන් බවට පත්වී ඉන්නා විට, නරක වැඩ කිරීමට කිසිම අයිතියක් නැහැ. පළමුවෙන්ම මෙයට වැරැදිකාරයා කෝස්ට්යා හෝ වෙන කවුරුවත් හෝ නොවෙයි. අපයි, මේ පාපිෂ්ට ක්‍රියාවට විරුද්ධව අපි සෑහෙන තරම් දැඩි ලෙස සටන් කළේ නැති නිසා. ඒ වෙනුවට අපි නොයෙක් හේතුන් නිසා කෝස්ට්යා වැනි අය ආරක්ෂා කළා.

පීඩින් අපේ කොල්ලෙක් කියලා මෙතැනදි කතා කළ සමෝහින් හා බුතිල්යාත් කීවා. ඔහු කොම්සොමොල් සංවිධානයේ ක්‍රියාශීලී සාමාජිකයෙක් නිසා අමතර වැඩ කරන බව කීවා. විදින උපකරණය කඩා දැම්මා. හරිම 'වැදගත්' බඩුවක්. කා අතින්ද ඔහොම දේ නොවෙන්නෙ. කෝස්ට්යා අපේ කොල්ලා, බාස් උන්නැහේ පිට මිනිහෙක්... හොදෙරොව් සමඟ කිසිවෙකු දේශපාලන වැඩ කරන්නේ නැහැ. ඒ මිනිහා අවුරුදු තිහක් තිස්සේ වැඩ කරලා තියෙනවා! ඔහුගේ දේශපාලන මතය ගැන මෙහිදී කතා නොකරමු. නමුත්, දැනට ඔහු නිවැරැදියි. ඔහු පිට මිනිහෙක් වුණාට රජයේ වස්තුව ආරක්ෂා කරනවා. අපි පිටරටින් ගෙනා උපකරණ කඩා බිඳ දමනවා. මෙවැනි තත්ත්වය අපි හඳුන්වන්නේ කොහොමද? අපි පළමුවෙන්ම මේ අංශයේ ප්‍රහාරය ගසා ආරම්භ කරමු.

අලසයකු හැටියටත්, නිෂ්පාදනය අසංවිධානය කරන්නෙකු හැටියටත්, කෝස්ට්යා පීඩින්ව කොම්සොමොල් සංවිධානයෙන් අස් කළයුතු බව මා යෝජනා කරනවා. ඔහුගේ ක්‍රියාව ගැන බිත්ති පුවත්පතෙහි එළිපිටම, කෙළින්ම ලියන්න ඕන. කතාබහවලට බයවෙන්නට නරකයි. මෙන්න මේ සංඛ්‍යා ලේඛන කතු වැකියේ පළකරන්ට ඕන. අපට ආධාර ගැනීමට බලවේග තිබෙන නිසා අපට ශක්තියක් තියෙනවා. කොම්සොමොල් සාමාජිකයන්ගෙන් වැඩි දෙනා ඉතා හොඳ නිෂ්පාදන වැඩකාරයො. මෙයින් හැට දෙනෙක්ම බෙයාර්කාවල දුම්රිය හැදීමට එහි ගිහින් වැඩ කළා. මෙය ඉතා හොඳ විශ්වාසවන්ත පාසලක්. ඔවුන්ගේ ආධාර ඇතිව දැනට ඇතිවී තිබෙන අයහපත් තත්ත්වය මඟ හරවා ගන්නට පුළුවන් වේවි. මේ දේ ගැන දැනට අප දක්වන ආකල්පය සදහටම වෙනස් කළ යුතුයි.''

සාමාන්‍යයෙන් සන්සුන්, වැඩි කතා නොකරන පාවෙල් කෝර්චාගින් මෙවර වේගවත් ලෙස හා දැඩි ලෙස කතා කළේය. නියම පාවෙල් කවුද යන්න පළමුවරට

ස්වෙතායෙව් දුටුවේ අදය. ඔහු සිතින් පාවෙල් නිවැරැදි බව පිළිගත්තේය. පාවෙල් සමඟ එකඟවීමට ස්වෙතායෙව්ට බාධා කළේ පරීක්ෂාකාරී භාවයයි. එහෙත්, පාවෙල්ගේ කතාව සංවිධානයේ පොදු තත්ත්වය දැඩි විවේචනයට ලක් කර තිබෙන බවත්, ඔහුගේ ආධිපත්‍යයට අභියෝගයක් කර තිබෙන බවත්, දුටු ස්වෙතායෙව්, සිය ප්‍රතිමල්ලවයා පාගා පොඩිකර දැමීමට ඉදිරිපත් විය. පාවෙල් කොර්චාගින් මෙන්ෂෙවික්වාදී හොදෙරොව් ආරක්ෂා කිරීමට ඉදිරිපත් වී සිටින බව පවසමින් ඔහු විරුද්ධත්වය ප්‍රකාශ කළේය.

උණුසුම් විවාදය තෙපැයක් තිස්සේ පැවැත්විණි. රෑ බෝවූ පසු එහි ප්‍රතිඵල කිරා බැලූහ. නොපිළිගත නොහැකි සත්‍ය කරුණු මත පදනම් වූ තර්ක නිසා බහුතර කොටස කොර්චාගින්ගේ පැත්ත ගත්තෙන් පරාජයට මුහුණ පෑ ස්වෙතායෙව් වරදක් කළේය. අවසාන වරට ඡන්දය ගැනීමට පෙර ඔහු කොර්චාගින්ට කාමරයෙන් පිටවී යන ලෙස අණ කරමින් ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කළේය.

"හොඳයි මම පිටවී යන්නම්. ස්වෙතායෙව්, නුඹේ හැසිරීම නුඹට කිසිම ගෞරවයක් ලබා දෙන්නෙ නැහැ. නමුත්, මම නුඹට අනතුරු හැඟවීමක් කරනවා. නුඹගේ අදහස් නුඹ දිගින් දිගටම ඉදිරිපත් කළහොත්, මම හෙට ප්‍රසිද්ධ මහා සභා රැස්වීමේ දී කතා කරනවා. නුඹට වැඩි ඡන්ද ලබාගත නොහැකි බව මට සහතිකයි. ස්වෙතායෙව්, නුඹේ ක්‍රියාව හරි නැහැ. හමුතොව් සහෝදරයා මේ ප්‍රශ්නය හෙට මහ සභා රැස්වීමට ඉස්සෙල්ලා පක්ෂ කණ්ඩායමේ සාකච්ඡා කරාවි කියලා මා බලාපොරොත්තු වෙනවා."

අභියෝගයක් කරමින් ස්වෙතායෙව් කෑ ගැසීය.

"නුඹ මාව බය කරනවද? මටත් පුළුවනි පක්ෂ කාර්යාලයට යන්න. මම පක්ෂයට නුඹ ගැන කියන්නම්. වැඩ කරන්නෙ නැති නම්, අනික් අයට බාධා කරන්න එපා."

පාවෙල් දොර වසා දමා, ගින්දර සේ රත්වී ඇති තම නළල අතකින් පිසදමා ගනිමින්, හිස්වී ඇති කාර්යාලය මැදින් ගමන් කොට පිටවීමේ දොරටුවට ගියේය. ඔහු මහ මඟට බැස ළය පුරා සිසිල් වාතය ආශ්වාස කොට දුම් වැටියක් උරා බතියෙව' කන්ද මත පිහිටි කුඩා නිවෙසක් කරා පා නැඟීය. එහි තෝකරෙව් වාසය කළේය.

කොර්චාගින් එහි යන විට, ගෙහිමියා රාත්‍රී ආහාර ගනිමින් සිටියේය.

"ඉතින්, කියාපන් මොනවාද නුඹලාගේ අලුත් ආරංචි. දරියා, මේ තරුණයාට කෑම පීරිසියක් ගෙනැවිත් දෙන්නකො." මෙසේ කී තෝකරෙව් පාවෙල් කෑම මේසයට වාඩි කරවීය.

දාරියා පොමිනිෂ්නා, තෝකරෙව්ගේ බිරිඳ සැමියාට වඩා හාත්පසින්ම වෙනස්ය. ඈ උසය. තරබාරුය. මිලට කෑම පීරිසියක් ගෙනැවිත් මේසය මත තබා, තම සුදු පැහැති රෙදිකඩින් තොල පිසදගත් ඈ පසන් හඬෙකින් මෙසේ පැවසුවාය:

"කාපන්, හොඳ ළමයා."

★

ඉස්සර තෝකරෙව් වැඩපොළේ මිකැනික් හැටියට වැඩ කරන කාලයේදී පාවෙල් නිතර මෙහි පැමිණීමටද, රෑ බෝවන තුරු සිටීමටද, පුරුදුව සිටියේය. අසනීපයෙන් පසු නගරයට පැමිණි ඔහු මහල්ලාගේ ගෙදරට පැමිණි පළමුවැනි වාරය මෙයයි.

පාවෙල් විස්තර කරන තුරු තෝකරෙව් හැන්ද පාවිච්චි කරමින් ඉක්මනින් කෑම පානය කරන්නට විය. කිසිවක් නො කී ඔහු ඉඳහිට 'ක්ම්' යන හඬක් නැගීය. කෑම පානය කොට ඉවර වූ පසු තෝකරෙව් රෙදි කඩකින් රැවුළ පිසදමා ගෙන සෙමින් කහින්නට විය.

"සත්තකින්ම නුඹ හරි. මේ වැඩේ නිසි විදිහට කිරීමට ඉදිරිපත් විය යුතුව තිබුණේ මීට ඉස්සර. මේ දිස්ත්‍රික්කයේ අනික් පළාත්වලට වැඩියෙ වැඩපොළේ කොම්සොමොල් සාමාජිකයන් ඉන්නවා. පටන් ගන්න ඕන එතැනින් තමා. ඉතින්, නුඹ ස්වෙතායෙව් එක්ක හටන් කළා හොඳ මදි. ඔහු ආත්මාර්ථකාමියෙක් බව නම් ඇත්තයි. නමුත්, නුඹට කොල්ලන් සමග වැඩ කිරීමට තරම් දක්ෂකමක් තිබුණා නේද? නුඹ ඔය වැඩපොළේ කරන වැඩේ මොකක්ද?"

"මම වැඩ ශාලාවේ සාමාන්‍යයෙන් හැම තැනම පොඩ්ඩ පොඩ්ඩ වැඩ කරනවා. ශාඛාවේ දේශපාලන අධ්‍යාපනය භාරව ඉන්නවා."

"බියුරෝ මණ්ඩලය තුළ මොනවද කරන්නෙ?"

කොර්චාගින් අවිනිශ්චිතව සිටියේය.

"මගේ ශරීර ශක්තිය තරමක් දුර්වල හන්ද, මට ටිකක් ඉගෙන ගැනීමට ඕන හන්ද, නිල වශයෙන් නායකත්වයේ සාමාජිකයෙකු හැටියට දැනට ක්‍රියා කරන්නේ නැහැ."

"එතකොට තත්ත්වය ඔහොමයි!" තෝකරෙව් ඔහුගේ කතාව අනුමත නොකරමින් කෑගැසීය. "පුතේ නුඹ දන්නවද, මම නුඹට සෑහෙන්ට බණිනවා. නුඹට පිහිට වෙන්නේ නුඹේ දුර්වල සෞඛ්‍යය. දැන් නුඹේ තත්ත්වය කොහොමද? ටිකක් හොඳද?"

"ඔව්"

"එහෙනම් හිතට අරගෙන වැඩ කරපන්. හාවා අතහැරලා පඳුරට විදින්ට එපා. අනික් අතට පැත්තකට වෙලා ඉඳගෙන ප්‍රයෝජනවත් වැඩක් කරන්නට බැහැ. නුඹ වගකීම භාර නොගෙන ඉන්නවා. කිසිවෙක් එය පෙන්වා දුන්නොත් නුඹට එය නැහැයි කියන්ට බැහැ. හෙට ඉඳලා වැඩ කිරීම පටන් ගනින්. ඕකුන්යෙව්ට හොඳවායින් දෙකක් කියන්නම්."

තෝකරෙව් අසතුටකින් කතා කළේය.

"ලොකු තාත්තා ඕකුන්යෙව්ට බණින්ට එපා." පාවෙල් විරුද්ධත්වය ප්‍රකාශ කළේය.

"මට වැඩ දෙන්ට එපා කියලා කිව්වේ මායි."

තෝකරෙව් සාවඥ ලෙස උරුවම් බෑවේය.

"නුඹ ඉල්ලා හිටියා. ඔහු එකඟ වුණාද? කොම්සොමොල් සාමාජිකයන් වන නුඹලා සමඟ මොනවා කරන්ටද... අනේ පුතේ ඉස්සර වගේ මට පත්තරය කියවාපන්... මගේ ඇස් පෙනීම දුර්වලයි."

★

කොම්සොමොල් බියුරෝවේ බහුතර සංඛ්‍යාව විසින් ගනු ලැබූ තීරණය වැඩපොළේ පක්ෂ ශාඛාවේ බියුරෝව සම්මත කළාය. පක්ෂයේ හා කොම්සොමොල් සාමාජිකයන්ට වැදගත් හා අසීරු කාර්යයන් භාර දෙන ලදි: පෞද්ගලික ආදර්ශ මඟින් ශ්‍රම විනය පිළිපැදීමය. බියුරෝ රැස්වීමේදී ස්වෙතායෙව් දැඩි විවේචනයට ලක් විය. මුලදී ස්වෙතායෙව් විවේචනවලට විරුද්ධව නැඟී සිටි නමුදු, කහ පැහැති මුහුණකින් යුත් ක්ෂය රෝගයෙන් පෙළෙමින් සිටින, වැඩපොළේ පක්ෂ ශාඛාවේ ලේකම්වර ලොපාකින් දැඩි ලෙස චෝදනා ඉදිරිපත් කළෙන්, ස්වෙතායෙව් අඩ වශයෙන් තම වැරදි පිළිගත්තේය.

පසු දින වැඩපොළේ බිත්ති පුවත්පතේ පළ වූ ලිපිවලට කම්කරුවන්ගේ අවධානය යොමු විය. ඒවා හඬ නඟා කියවූ අතර, උණුසුම් වාද විවාද පැන නැඟිණි. එදින සවස පැවැත්වූ තරුණ රැස්වීමට ඉතා විශාල සංඛ්‍යාවක් පැමිණ

සිටියහ. බිත්ති පුවත්පත විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්න සාකච්ඡාවට භාජනය විය.

කෝස්ට්යා පීඩින් කොම්සොමොල් තරුණ සංගමයෙන් අස්කර දැමීය. දේශපාලන අධ්‍යාපනය භාර අලුත් සාමාජිකයෙක් බියුරෝවට ඇතුළු කර ගැනිණි. ඔහු පාවෙල් කොර්චාගින්ය.

මේ නව අවධියේ දුම්රිය වැඩපොළේ දුම්රිය කම්කරුවන්ට අයත් නව කාර්යභාරයන් පිළිබඳව නෙෂ්දනොව් කළ කතාවට අසන්නන් මහත් වුවමනාවෙන් සවන් දීම නිසා අසමසම නිසලතාවක් රජ කළේය.

රැස්වීමෙන් පසු කොර්චාගින්, ස්වෙතායෙව් එනතුරු මඟ බලා සිටියේය.

"එකට යමු. අපට කතා කරගන්ට දේ තියෙනවා." ඔහු ලේකම්ට ළංවිය.

"කතා කරන්නෙ මොනවා ගැනද?" ස්වෙතායෙව් මුහුණ පැඟිරි කරගනිමින් විචාළේය.

පාවෙල් ඔහුගේ අතක් ගෙන පියවර කීපයක් ඉදිරියට ගොස්, බංකුවක් අසල නැවතුණේය.

"විනාඩියකට වාඩි වෙමු!" ඔහු පළමුවෙන් වාඩිවිය.

ස්වෙතායෙව්ගේ කටේ ඇති සිගරැට්ටුව වරෙක දැල්වී රතු පැහැ ගනී. වරෙක නිවෙයි.

"ස්වෙතායෙව්, මට විරුද්ධව නුඹට කියන්නට තියෙන දේ මොනවාද?"

විනාඩි කීපයක නිහඬතාවකි.

"ඔහෝ ඔන්න නුඹ කල්පනා කළ දේ. මා හිතුවේ වැඩ ගැනයි කියලා!" ව්‍යාජමය විමතියක් මවා පාමින් ස්වේතායෙව් කතා කළද ඔහුගේ කටහඬ අස්ථිර බවක් පෙන්වීය.

පාවෙල් ඔහුගේ දණහිසක් මත ස්ථිර ලෙස අතක් තැබීය.

"දීම්කා ඕන නැති දේ අතහැරපන්. ඔය වගේ වැඩ හොඳ රාජ්‍ය තන්ත්‍රිකයන්ට, ඩිප්ලොමැට්වරුන්ට. නුඹ මගේ ප්‍රශ්නයට කෙළින්ම පිළිතුරු දීපන්. නුඹ මා කෙරෙහි මෙතරම් අමනාප මොකද?"

ස්වෙතායෙව් තම අසුනෙහි ඉවසිලි රහිත ලෙස සෙලවිණි.

"නුඹ කියන්නෙ මොනවා ගැනද? නුඹට මා විරුද්ධ වන්නේ මොන කරුණක් නිසාද? මම නුඹට වැඩ භාර කළා නේද? නුඹ ප්‍රතික්ෂේප කළා. දැන් නුඹව කොන් වෙලා කියලා මට චෝදනා කරනවා."

"ඔහුගේ කතාවේ අවංක බවක් තිබේ දැයි පාවෙල් සැක කළේය. දණහිස මත තැබූ අත නොගෙනම පාවෙල් කැලඹීමෙන් යුතුව කතා කළේයඃ

"ඒ ගැන නුඹට කියන්ට බැරිනම් මම කියන්නම්. නුඹ හිතනවා මම නුඹට පාර හරස් කරනවා කියලා. නුඹේ ලේකම්කම ගැන මම හීන දකිනවා කියලා නුඹ හිතනවා නේද? නුඹ එහෙම කල්පනා නොකළා නම්, කෝස්ට්යා පීඩින්ගේ ප්‍රශ්නයේදි නුඹ මා සමඟ හැප්පෙන්නට එන්නෙ නැහැ. නුඹගේ ඔය ආකල්පය හන්ද වැඩට ලොකු පාඩුවක්. මේ ප්‍රශ්නය අපි දෙදෙනාට පමණක් සීමා වෙනවා නම් ඒක බරපතළ දෙයක් නොවෙයි. නමුත්, හෙට සිට අප දෙදෙනාට එකට වැඩ කරන්නට වෙනවා. එතකොට සිදු වන්නේ මොනවාද? මා කියන දේ අහපන්. අප අතර භේදයක් නොතිබිය යුතුයි. අප දෙදෙනාම කම්කරුවො. අපේ ව්‍යාපාරය අන් හැමටම වඩා නුඹට උතුම් නම්, නුඹ මට අත දී මිතුරු වෙයන්. හෙට සිට මිත්‍ර ලීලාවෙන් වැඩ කරමු. නුඹේ ඔය විකාර අදහස් ඔළුවෙන් අස්කරගන්නෙ නැතිව, කූට කුමන්ත්‍රණකාරී මඟ ඔස්සේ යනවා නම්, නුඹේ ඔය ආකල්පය හන්ද වැඩට බාධා වන විට, අපට සිද්ධවෙනවා දැඩි ලෙස සටන් කරන්නට, මෙන්න මගේ අත. තවම එය සගයකුගේ අතක්, පමා නොවී පිළිගනින්."

ස්වේතායෙව්ගේ ගොරහැඩි අත පාවෙල්ගේ අත්ල මත තබත්ම ඔහුට අති විශාල ප්‍රීතියක් දැනිණි.

★

සතියක් ගෙවිණි. ප්‍රාදේශීය කොමියුනිස්ට් පක්ෂ කාර්යාලයේ එදා වැඩ අවසන් විය. එහෙත්, තෝකරෙව් තම කාර්යාල කාමරයෙන් පිට නොවීය. මහල්ලා ඇඳි පුටුවේ වාඩි වී අලුත් වාර්තා කියවන්නට විය. කිසිවෙක් දොරට තට්ටු කළහ.

"එන්න!" තෝකරෙව් පැවසීය.

පාවෙල් කොර්චාගින් කාර්යාල කාමරයට ඇතුළු වී ඔහුගේ මේසය මත පිරවූ පෝර්ම කොළ දෙකක් තැබීය.

"මේ මොනවාද?"

"මොකද ලොකු තාත්තේ? මේ තමා වගකීම් රහිත බව නැති කර දැමීම. මා හිතනවා දැන් නියම කාලයයි. ලොකු තාත්තාත් එහෙම හිතනවා නම්, මාව රෙකමදරු කරල

අත්සන් කරන්න."

තෝකරෙව් පෝර්ම කොළ දෙස බැලීය. ඉක්බිති ඔහු පාවෙල් දෙස තත්පර කීපයක් බලා, නිහඬව පෑන අතට ගෙන, පාවෙල් අන්ද්‍රෝයෙවිච් කොර්චාගින් රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ (බොල්ෂෙවික්) අපේක්ෂක සාමාජිකයෙකු වශයෙන් රෙකමදරු කරන සාමාජිකයා පක්ෂයට බැඳුණු අවුරුද්ද සටහන් කළ යුතු පේළියේ ඔහු මෙසේ ලියුවේය. 1903. අනතුරුව පැහැදිලි අකුරින් අත්සන් කළේය.

"මෙන්න පුතේ, හිසකේ පැසුණු මට නුඹ නින්ද නොකරන බව මා විශ්වාස කරනවා."

★

කාමරය තුළ අපිරිසිදු වාතය පිරිලාය. හැම එකෙක්ම එක් දෙයක් ගැන කල්පනා කළහ. එනම් දුම්රියපොළ අසල ඇති කෂ්ටාන්[1] ගස්වලින් පිරි අතු මගෙහි සෙවණට වී සුවදායී සිසිල් වාතය ආශ්වාස කිරීම ගැනය.

"පාවෙල් ඔය ඇති නවත්වාපන්. මගේ ශක්තිය සිඳිලා." දහඩිය පෙරමින් සිටි ස්වෙතායෙව් ඉල්ලා සිටියේය. කත්‍යූෂාද, අන් අයද එසේම ඉල්ලා සිටියහ.

කොර්චාගින් පොත වැසීය. අධ්‍යාපන කවයේ එදින වැඩ අවසන් විය.

ඔවුන් විසිර යත්ම, බිත්තියේ එල්ලා තිබූ 'එරික්සන්' වර්ගයේ ටෙලිෆෝනය හඬ නැඟීය. ටෙලිෆෝනය අතට ගෙන කතා කළේ ස්වෙතායෙව්ය. අවට අය හඬ නැඟූ බැවින් ඔහුට කෑ ගසා කතා කරන්නට සිදුවිය.

රිසීවරය ටෙලිෆෝනයේ තබා ඔහු පාවෙල් දෙසට හැරුණේය.

"දුම්රියපොළේ නවත්වලා තියෙනවා පෝලන්ත තානාපති කාර්යාලයට අයත් දුම්රිය මැදිරි දෙකක්. ඒවායේ විදුලි පහන් නිවිලා. දුම්රිය තව පැයකින් පිට වෙනවා. පාවෙල්, නුඹ උපකරණ පෙට්ටිය අරගෙන ගිහින් ඒ වැඩේ කරපන්. හදිසි වැඩක්."

දුම්රියපොළේ පළමුවැනි වේදිකාවේ දිලිසෙන තෙක් මැද්ද ජාත්‍යන්තර දුම්රිය මැදිරි දෙකක් නවත්වා තිබිණි. එක් මැදිරියක් තුළ ආලෝකය දීප්තිමත්ය. එහෙත්, යාබද මැදිරිය ඇඳිරි විය.

---

1 ඉංග්‍රීසියෙන් මේ ගස චෙස්නට් නමින් හැඳින්වේ.

සුඛෝපභෝගී දුම්රිය මැදිරිය වෙත ගිය පාවෙල් එහි දෙර හැර ඇතුළුවීමට සැරසුණේය.

දුම්රියපොළේ බිත්තිය අසල සිටි මිනිහෙක් ඉක්මනින් විත්, පාවෙල්ගේ උරහිසට අතක් තබා කතා කළේය.

"රටවැසියා යන්නේ කොහෙද?"

කට හඬ අසා පුරුදුය. ඔහු හැරී බැලීය. සමින් කළ කබායක් හැඳ පුළුල් ආවරණයක් සහිත හිස් වැස්මක් දමා ගත් මිනිහෙකි. ඔහුගේ නහය වක්‍ය, සිහින්ය. ඔහුගේ බැල්ම සුපරික්ෂාකාරීත්වය මුසු අවිශ්වාසයක් පළ කරයි.

අර්ට්‍යුහින් පාවෙල් හඳුනාගත්තේ දැන්ය. ඔහුගේ අත පාවෙල්ගේ උරහිසින් ගිලිහිණි. මුහුණේ වියළි ගතිය අතුරුදහන් විය. එහෙත්, ඔහුගේ දෙනෙත් පාවෙල්ගේ විදුලි උපකරණ පෙට්ටිය දෙස ප්‍රශ්න අසන ලීලාවෙන් බැලීය.

"නුඹ යන්නෙ කොහිද?"

පාවෙල් කෙටියෙන් විස්තර කළේය. දුම්රිය පෙට්ටියෙන් තවත් මිනිහෙක් එළියට ආවේය.

"දැන් මම ඔවුන්ගේ මුරකරුවාට අඬ ගසන්නම්."

මුරකරු පිටුපසින් පාවෙල් මැදිරියට ඇතුළු විය. එහි සැප පහසු පුටුවල ඉතා වටිනා ඇඳුමින් සැරසුණු මිනිස්සු වාඩි වී සිටියහ. රෝස මල් වැටුණු සේද රෙද්දකින් වැසූ මේසයක් අසල දෙරට පිටුපා කාන්තාවක් වාඩි වී සිටියාය. කොර්චාගින් මැදිරියට ඇතුළුවන විට, කාන්තාව ඇය ඉදිරිපිට සිටගෙන සිටි උසැති නිලධාරියා සමඟ කතා කරමින් සිටියාය. විදුලි කාර්මික ශිල්පියා දුටු හැටියේම දෙබස ඇණ හිටිණි.

අවසාන විදුලි ලාම්පුවේ සිට කොරිඩෝරය දක්වා ඇති විදුලි කම්බි පිරික්සා බැලූ පාවෙල් එම ශාලාවෙන් පිටවී පලුදු වී ඇති තැන සෙවීමට ගියේය. ඌරකුගේ මෙන් මහතැති තරබාරු බෙල්ලක් ඇති දුම්රිය මැදිරි මුරකරුවා පාවෙල් පිටුපසින් පියවර නැඟීය. ඔහු ඇඳ සිටි සේවා කබායේ පිත්තල බොත්තම් දිලිසෙයි. ඒවායේ පෝලන්ත ආණ්ඩුවේ ලාංඡනය වන එක් හිසක් ඇති රාජාලියෙකි.

"අපි යාබද මැදිරිය බලමු. මෙතැන ඇකියුමලේටරය වැඩ කරනවා. වැරැද්ද යාබද මැදිරියේ වෙන්ට ඕන."

මුරකරුවා යාබද කාමරයේ දෙරට යතුර දමා එය හැරියේය. ඔවුහු ඈඳිරි කොරිඩෝරය දිගේ ගමන් කළහ. අතැ'ති විදුලි පන්දමේ ආධාරයෙන් පලුදු වී ඇති ස්ථානය ඉක්මනින් සොයා ගැනීමට පාවෙල්ට පුළුවන් විය. විනාඩි

කීපයකට පසු කොරිඩෝරයේ තිබුණු විදුලි පහන පිපිරිණි. එහි වීදුරු බුබුළ අපැහැදිලි ලෙස සුදු පැහැ ගති.

"මැදිරියේ ඇති ලාම්පු අස් කරලා වෙනත් ඒවා දන්ට ඕන. ඒවා පිච්චිලා."

"එහෙම නම් නෝනාට කතා කරලා යතුර ඉල්ලා ගන්නට ඕන." විදුලි කාර්මිකයා තනිකර මැදිරිය තුළ නවත්වා යාමට අකැමැති වූ මුරකරුවා ඔහුටද තමා සමඟ එන ලෙස කීය.

ඇඳිරි දුම්රිය මැදිරියට පළමුවෙන් කාන්තාවද, ඇය පිටුපසින් පාවෙල්ද ඇතුළු වූහ. මුරකරුවා දොර අසල සිට ගත්තේ, එහි දොර තම සිරුරෙන් වසා ගනිමිනි. ඉතා ලස්සන හම් බෑග් දෙකක් දෙසද, ආසනය මත නොසැලකිලිමත් ලෙස දමා ඇති දිගු ලෝගුවක්, කුඩා සුවඳ විලවුන් බෝතලයක් සහ කවුළුව අසල මේසය මත වූ කුඩා පුයර පෙට්ටියක් දෙසද පාවෙල්ගේ දෙනෙත් රැඳිණි. කාන්තාව සෝපාවේ මුල්ලක වාඩි වී රන් පැහැති තම හිසකේ අත ගා වැඩෙහි යෙදෙන විදුලි ශිල්පියා දෙස බැලීය.

"නෝනා මහත්මයාගෙන් අවසර ඉල්ලා හිටිනවා විනාඩියකට ඉවත් වීමට. මේජර් තුමා කූල් බීර ඉල්ලනවා." මුරකරුවා අමාරුවෙන් තම තරබාරු බෙල්ල නමා අවසර ඉල්ලීය.

කාන්තාව ඇද පැද ගීතමය ලෙස කතා කළාය.

"නුඹට යන්ට පුළුවනි."

දෙබස පෝලන්ත බසින් කෙරිණි.

කොරිඩෝරයේ සිට ආලෝකයක් කාන්තාවගේ උරය මත වැටී ඇත. පැරීසියේ ඉතාම උසස් ඇඳුම් මසන්නන්ගේ සමාගමකින් මස්වා ගෙන්වා ගත් ඉතා අලංකාර ගවුම ඇගේ උරහිස හා දෑත්ද නග්නව තැබීය. දෙකන් පෙතිවල අභරණවල වූ දියමන්ති කැට දිලිසිණි. ඇත් දත් මෙන් සුදු පැහැති ඇගේ උරහිස හා දෑත් පමණකි කෝර්චාගින් දුටුවේ. අඳුර ඇගේ මුහුණ වසා ඇත. ඉස්කුරුප්පු නියන අල්ලා ඉක්මනින් සීලිමේ කුඩා බිහිදොර ගැලවූ පාවෙල් විනාඩියකට පසුව මැදිරියට ආලෝකය ලබා දුන්නේය. කාන්තාව වාඩිවී සිටි සෝපාවට ඉහළින් ඇති විදුලි ලාම්පුව පිරික්සා බැලීම පමණකි. ඉතිරිව තිබුණේ.

"මට මේ ලාම්පුව බලන්නට ඕන." ඇය ඉදිරිපිට සිට ගත් පාවෙල් පැවසීය.

"ආ ඔව්, මම බාධා කරනවා නෙව" ඉතා හොඳ රුසියන්

භාෂාවෙන් කතා කළ කාන්තාව නැගිට පාවෙල් අසලින් සිට ගත්තාය. දැන් ඔහුට ඇය ඉතා හොඳින් පෙනෙයි. දුනු කවයක් සේ නැමුණු බැම සඟළ, උද්දච්ච බව කියා පාන දෙතොල ඔහු දැක පුරුදුය. සැක කිරීමට කිසඳු හේතුවක් නැත. ඔහු ඉදිරියේ නේලී ලෙෂින්ස්කයාය. මවිතය කියාපාන ඔහුගේ බැල්ම අධිනීතිඥයාගේ දුව නොදුටුවාය. එහෙත්, කොර්චාගින් ඇය හැඳිනගත්තද, මේ අවුරුදු හතර ඇතුළතදී, වැඩී සිටින විදුලි කාර්මිකයා තම දඟකාර අසල්වැසියා බව ලෙෂින්ස්කයා නොදත්තාය.

ඔහුගේ විමතියට පිළිතුරු වශයෙන් නොසතුටකින් බැම සඟළ හකුළුවා ගත් කත නිදන කාමරයේ දොර දක්වා ගොස් නොඉවසිලිමත් ලෙස තම දිලිසෙන සපත්තුවේ අඩියෙන් පොළොවට තට්ටු කරමින් සිටියාය. පාවෙල් ලාම්පුවට සම්බන්ධ විදුලි කම්බි සැදීය. විදුලි බුබුළ ගලවා එය එළියට අල්ලා බලන ගමන්ම, පාවෙල් තමාට නොදැනුවත්වම හිටිහැටියේ පෝලන්ත බසින් ප්‍රශ්න කළේ ලෙෂින්ස්කයාවද විමතියට පත් කරවමිනි.

"වික්ටරුත් මෙහෙ ඇවිත් ඉන්නවද?"

එසේ ප්‍රශ්න කරන ගමන්ම පාවෙල් කොර්චාගින් නොහැරී සිටියේය. ඔහුට නේලිගේ මුහුණ නොපෙනිණි. එහෙත් දිගු නිහඬතාව නිසා ඈ අන්දමන්ද වී සිටින බව ඔහු වටහා ගත්තේය.

"ඔබ ඔහුව හඳුනනවාද?"

"බොහොම හොඳට හඳුනනවා. අපි ඔබගේ අසල් වැසියෝ" පාවෙල් ඇය දෙසට හැරුණේය.

"ඔබ පාවෙල්..." නෙලී වචන ගිල්ලාය.

"කුස්සි අම්මාගේ පුතා." පාවෙල් වචන සම්පූර්ණ කළේය.

"ඔබ බොහොම උස ගිහිල්ලා. වැඩිලා! මට මතකයි දඟකාර කොල්ලෙක් හැටියට හිටියා."

නෙලී ගරු සරු නැතිව ඔහුගේ හිස සිට දෙපා දක්වා බැලීය.

"ඔබ මොකද වික්ටර් ගැන උනන්දු වෙන්නෙ? මට මතක හැටියට ඔබ ඔහු සමඟ යාළු වී හිටියෙ නැහැ." නෙලී තම ගීතමය ස්වරයෙන් පැවසුවේ, බලාපොරොත්තු රහිත හමුවීම නිසා පැන නැඟි කාන්සිය නැතිකර ගැනීමේ බලාපොරොත්තුවෙනි.

පාවෙල් ඉස්කුරුප්පු ඇණය තද කළේය.

"වික්ටර් මට පරණ ණයක් ගෙවන්ට තියෙනවා. ඔබ ඔහු හමුවුණාම කරුණාකර කියන්න මම ඒ ණය කොහොමහරි ලබා ගැනීමේ බලාපොරොත්තුව අත හැරලා නැතැයි කියලා."

"කියන්න ඔහු ගත් ණය කොපමණද මම දැන්ම ඔහු වෙනුවෙන් එම මුදල ගෙවන්නම්."

කොර්චාගින් කතා කළ 'ණය' කුමක් දැ යි ඈ හොඳින් දැන සිටියාය. වික්ටර් ලෙෂින්ස්කි පාවෙල්ව පෙතෙල්යූරා හමුදාවට පාවා දීම පිළිබඳ සම්පූර්ණ ඉතිහාසය නෙලී දැන සිටියාය. එහෙත්, 'වැරැහැලි හැඳ සිටින' මේ මිනිහාට සරදම් කිරීමට ඇයට සිත් විය.

කොර්චාගින් නිහඬ විය.

"අපේ ගෙය කඩා බිඳ දමලා බඩු සියල්ල හොරකම් කරගත්තයි කියන්නෙ ඇත්තද? ගිම්හාන නිවෙසයි, මල් පාත්තියි විනාශ කරලා ඇති නේද?" දෙමනසින් යුතුව නෙලී ඇසුවාය.

"ඒ ගෙය දැන් අපේ, ඔබේ නොවෙයි. අපේ දේපොළ අපි විනාශ කරන්නෙ නැහැ."

නෙලී උපහාසාත්මක ලෙස මඳ සිනා පෑවාය.

"ඔහෝ තුඹට සෑහෙන්ට උගන්වලා තියෙනවා! ඒ වුණත් මේ පෝලන්ත දුම්රිය තානාපති සේවයට අයිතියි. මේක ඇතුළෙ ස්වාමිදුව මමයි. තුඹ ඉස්සර වගේම මගේ වහලා. දැන් තුඹ මට විදුලි ආලෝකය ලබා දීමට වැඩ කරනවා. මට මෙන්න මේ සෝපාවට වෙලා පොතක් කියවීමට. ඉස්සර තුඹේ අම්මා අපේ රෙදි සේදුවා. තුඹ වතුර ඇද්දා. දැන් අපි නැවත හමුවෙලා ඉන්නවා පැරැණි තත්ත්වයම අනුව."

ඇය එසේ කීවේ ආඩම්බරකාරී නපුරු සතුටකිනි. පාවෙල් පිහියකින් විදුලි කම්බියේ කොනක් කපා ශුද්ධ කරමින් ඇය දෙස නොසැඟවුණු පිළිකුලකින් බැලීය.

"තුඹ වෙනුවෙන් මම මලකඩ කාපු එක ඇණයක්වත් ගහන්නෙ නැහැ. ධනපතියො තනාපති සේවය කියල දෙයක් හොයාගෙන තියෙනවා. අපටත් පුළුවනි, ඒ අනුව වැඩ කරන්ට. අපි ඔවුන්ගේ හිස් ගසා දමන්නෙ නැහැ. ඒ විතරක් නොවේ. ඔවුන්ට අපි ආචාරශීලිකම් දක්වනවා. තුඹ වගේ හැසිරෙන්නෙ නැහැ."

නෙලීගේ දෙකොපුල් රත් පැහැගති.

"තුඹලාට වෝසෝ නගරය අල්ලා ගන්ට පුළුවන් වුණා නම්, තුඹ මට මොනවා කරයිද? මාව කෑලිවලට කපා දමාවි.

නැතිනම් ගෑනියක් හැටියට ගනීවි."

ඈ දෙර අසල තේජාන්විත විලාසයක් පාමින් සිටියාය. කොකයින් නමැති මත් ද්‍රව්‍යවලට පුරුදු ඇගේ නාස් පුඩු යම්තමින් නැටවිණි. විදුලි පහන ආලෝකවත් විය. පාවෙල් නැඟිට සිටියේය.

"නුඹව ඕන කාටද? අපේ කඩු නැතුවට නුඹගේ කොකයින් නිසා නුඹ මකබෑ වේවි. ගෑනියක් හැටියටවත් මම නුඹව ගන්නෙ නැහැ.

උපකරණ පෙට්ටිය රැගත් පාවෙල් දෙර ළඟට ගියේය. ඔහුට යනු පිණිස නෙලී ඉඩ දුන්නාය. කොරිඩෝරයේ ඈතට ගිය ඔහුට ඇගේ බැණ වැදීම් ඇසිණිඃ

"ශාපලත් බොල්ෂෙවික්වාදියා!"

★

පසුදා හවස කොර්චාගින් පොත් ගුලට යන විට, මහ මඟදී කත්‍යූෂා සෙලෙනෝවා හමුවිය. ඈ ඔහුගේ කමිස අත තම කුඩා අතින් අල්ලා ගනිමින්, ඔහු යන මග අවහිර කළාය.

"ඒයි දේශපාලනය හා අධ්‍යාපනය, නුඹ දුවන්නෙ කොහිද?"

"පුංචි අම්මේ මම පොත් ගුලට යනවා. මට පාර ඉඩ දීපන්." ඇගේ කතා විලාසය අනුකරණය කළ පාවෙල් පවසා, ඇගේ උරහිසක් මුදු ලෙස අල්ලා ඇය පාර අයිනේ පදික වේදිකාවට ඇද ගත්තේය. ඔහුගේ ග්‍රහණයෙන් මිදුණු කත්‍යූෂා ඔහු සමඟ ගමන් කළාය.

"පව්ලූෂා මේ අහපන්. හැම තිස්සේම ඉගෙනගන්ට පුළුවන්ද... හොඳ අදහසක් කියන්නද? අද අපි හැන්දෑවේ පාටියකට යමු. සීනා ග්ලාදිෂ්ලාගේ ගෙදර කොල්ලො කෙල්ලෝ රැස්වෙනවා. අපේ කෙල්ලො මට කීපවරක්ම කීවා නුඹව කැඳවා ගෙන එන්ටයි කියලා. නුඹ දේශපාලනයටම ඇබ්බැහි වෙලා. ටිකක් ප්‍රීතිවෙලා විනෝද වෙන්ට කැමැති නැත්ද? එක දවසක් නොකියවා හිටියම ඔළුවට නිවාඩුවක්" කත්‍යූෂා දැඩි ලෙසම ඉල්ලා හිටියාය.

"ඔය හැන්දෑ සාදය කුමක්ද? එහි කරන්නෙ මොනවාද?"

තක්‍යූෂා උපහාසාත්මක ලෙස විසුළු කළාය.

"මොනවාද කරන්නේ! අපි දෙවියන් වඳින්නේ නැහැ. විනෝදයෙන් කාලය ගෙවනවා. එපමණයි. නුඹ ඇකෝඩියන් සෙල්ලම් කරනවා නේද? මම නුඹේ වාදනය කවදාවක්වත්

අහලා නැහැ. නුඹ අද මා සතුටු කරන්ට වාදනය කරපන්. සීනාගේ මාමා ළඟ ඇකෝඩිනයක් තියෙනවා. ඔහුට හොඳට වාදනය බැහැ. කෙල්ලෝ නුඹ ගැන උනන්දු වෙනවා. නුඹ පොතක් අල්ලාගෙන මැරෙන්ට හදනවා. කොම්සොමොල් සාමාජිකයන්ට විනෝද වෙන්ට තහනම් කියලා තියෙන්නෙ කොහෙද? නුඹට එන්ටයි කියල ඉල්ලීම මට කරදරයක් වෙන්ට ඉස්සෙල්ලා යමු. නැතිනම් මම මාසෙකට නුඹ සමඟ කතා නොකර තරහ වෙනවා."

වෘත්තියෙන් තීන්ත ගාන කම්කරු තරුණියක වූ කත්යූෂා (කාච්යා) හොඳ සගයෙකි. හොඳ, ක්‍රියාකාරී කොම්සොමොල් සාමාජිකාවකි. සැන්දෑ සාද කොර්චාගින්ට නොරිසි වුවද, එවැනි තැන්වලදී ඔහුට අසතුටක් දැනුණද, ඔහු තරුණිය අමනාප නොකිරීමට සිතා, ඈ සමඟ යාමට එකඟ විය.

දුම්රිය පදවන්නෙකු වූ ග්ලාදිෂ්ලාගේ ගෙදර රැස් වූ පිරිස හඬ නැඟූහ. ගෙදර වැඩිහිටියෝ තරුණයන්ට ඉඩ දී අනික් කාමරයට වැදුණහ. පළමුවැනි විශාල කාමරය හා ගෙමිදුල තරුණයන් සඳහා වෙන් විය. එහි රැස්වූ තරුණ තරුණියන්ගේ ගණන පහළොවකි. ගෙවත්ත මැදින් ගෙමිදුලට කත්යූෂා, පාවෙල් කැඳවාගෙන එන විට, පිරිස 'පරෙවියන්ට කෑම දීම' නමැති ක්‍රීඩාවෙහි යෙදී සිටියහ. තරුණයෙක් හා තරුණියක එකිනෙකාට පිටුපා පුටු දෙකක වාඩි වූහ. සාදය මෙහෙයවන තරුණිය "පරවියන්ට කෑම දීපල්ලා!" යැයි කියත්ම, එකිනෙකාට පිටුපා වාඩි වී සිටින යුවළ ඔවුන්ගේ දෙතොල් හමුවන තුරු හිස පස්සට නමති. අවට රැස්ව සිටින අය ප්‍රීතිය පළ කරති. ඉක්බිති ඔවුහු "මුද්ද", "තැපැල්කාරයා" ආදී සෙල්ලම්වල යෙදුණහ. "තැපැල්කාරයා" ක්‍රීඩාවේදී දෙතොල් සිපගැනීම රැස්ව සිටි අයවලුන්, ඉදිරියේ නොකරනු වස් දෙදෙනා බැගින් ඇතුළු කාමරයට යවා, සිප ගන්නාවිට විදුලි පහන නිවා දැමීය. හැම ක්‍රීඩාවක්ම සිපගැනීමෙන් අවසන් විය. එවැනි දේවලින් සතුටක් නොලබන තරුණයන් හා තරුණියන් සඳහා වූ ක්‍රීඩාව 'කුසුම් විලාසිනී'ය. ඒ සඳහා වට මේසයක් මත කාඩ් පැකට්ටුවක් විය. පාවෙල් අසල සිටි දහසය හැවිරිදි සුනේත්‍රාවක් වූ මූරා නමින් තමා හඳුන්වා ගත් තරුණිය ලජ්ජා සහිත ලෙස පාවෙල් දෙස බලන්නී ඔහු අතට කාඩ් පතක් දී මෙසේ පැවසුවාය.

"වදමල"

මීට වසර කීපයකට උඩදී, මෙවැනි ක්‍රීඩාවලට පාවෙල්

සහභාගී විය. නැතිනම් ඒවා නිරීක්ෂණය කළේය. එවකට ඔහු ඒවා සාමාන්‍ය දෙයක් ලෙස සැලකීය. එහෙත්, දැන් ඔහු සුළු ධනපතිවාදී කුඩා නගර ජීවිතයෙන් සදහටම වෙන් වූ පසු, ඒවා ඔහුට විකෘති, තරමක් හාස්‍යජනක ක්‍රීඩා ලෙස පෙනෙයි.

ඒ කෙසේ වුවද, 'කුසුම් විලාසනීගේ' කාඩ්පත ඔහු අත විය.

වදමලක චිත්‍රයක් ඇති කාඩ්පතේ විරුද්ධ පැත්තේ මෙසේ ලියා තිබිණි. "ඔබ මට බොහෝ ප්‍රියමනාපය."

පාවෙල් තරුණිය දෙස බැලීය.

"මොන හේතුවක් නිසාද?"

ඔහුගේ ප්‍රශ්නය බරපතළ විය. මූරා පිළිතුර කල් ඇතිව සූදානම් කරගෙන සිටියාය.

"රෝසමල" මෙසේ කියමින් තවත් කාඩ් පතක් දුන්නාය. එහි මෙසේ ලියා තිබිණි. "ඔබ මගේ පරමාදර්ශයයි." පාවෙල් තරුණිය දෙසට හැරී කටහඬ මුදු කරගැනීමට උත්සාහ ගනිමින් විචාළේය.

"මේ වගේ විකාර වැඩ කරන්නෙ මන්ද?"

ලජ්ජාවට පත් මූරා අන්දමන්ද වූවාය.

"මගේ පිළිගැනීම ඔබට ප්‍රිය නැතිද?" ඇගේ දෙතොල් දඟකාරී ලෙස නැටවිණි.

ඇගේ ප්‍රශ්නයට කොර්චාගින් පිළිතුරු නොදුන්නේය. ඇය ගැන වඩාත් තොරතුරු දැන ගැනීම ඔහුට රිසි විය. ඔහු ඇසූ ප්‍රශ්නවලට තරුණිය සතුටින් පිළිතුරු දුන්නාය. විනාඩි කීපයක් ගතවත්ම, ඇය හත්වන පන්තිය දක්වා උගන්වන පාසලකට යන බවත්, පියා දුම්රිය මැදිරි අලුත්වැඩියා කරන්නෙකු බවත්, ඇය ඔහු ගැන බොහෝ කලක සිට දන්නා අතර, ඔහු හමුවීමට ආසාවෙන් සිටි බවත් පාවෙල් දැන ගත්තේය.

"නම මොකක්ද?" කොර්චාගින් ඇසීය.

"වොලීන්ට්සෙවා මූරා"

"නුඹේ අයියා ඩිපෝ කොම්සොමොල් ශාඛාවේ ලේකම්වරයා නේද?"

"ඔව්"

ප්‍රදේශයේ අතිශයින්ම ක්‍රියාකාරී සාමාජිකයකු වන වොලීන්ට්සෙව් තමාගේ නංගී ගැන කිසිදු සැලකිල්ලක් නොදක්වන බවත්, ඈ මෝඩ කෙල්ලක ලෙස සහ ශිෂ්ට ගති නොරුස්සන්නියක ලෙස හැසිරෙන බවත් කොර්චාගින්ට

දැන් නම් පැහැදිලි විය. ඈ පසුගිය වසරේ සිට සිය මිතුරියන්ගේ ගෙවල්වල පවත්වන සැන්දෑ සාදයන්ට යාමටද, ඒවාවල හිස කකියනතුරු කොල්ලන් සිප ගැනීමටද පුරුදුව සිටියාය. සිය සොහොයුරාගේ ගෙදරදී ඈ කීපවරක්ම පාවෙල් කොර්චාගින් දුටුවාය.

තමාගේ හැසිරීම පාවෙල් අනුමත නොකරන බව දැන ගත් මූරා "පරෙවියන්ට කෑම දීමට" ඇයට අඬ ගැසූ විට පාවෙල්ගේ උපහාසාත්මක මඳ සිනාව දැක එය දැඩි ලෙසම ප්‍රතික්ෂේප කළාය.

දෙදෙනා විනාඩි කීපයක් වාඩිවී සිටි අතර, මූරා තමා ගැන ඔහුට කීවේය. කත්‍යූෂා සෙලෙනෝවා ඔවුන් වෙත ආවාය.

"ඇකෝඩියනය ගෙනෙන්නම්, නුඹ වාදනය කරන්ට කැමැතිද?" දඟකාරී ලෙස මූරා දෙස බැලූ ඈ, "ඉතින් නුඹ එයාව හඳුනගත්තාද?"

පාවෙල් කත්‍යුෂාව ළඟින් වාඩි කරවාගෙන, තරුණ පිරිස නඟන හඬ ප්‍රයෝජනයට ගනිමින් ඈට මෙසේ පැවසීය:

"වාදනය කරන්නෙ නැහැ. මම මූරා සමඟ ගෙදර යනවා."

"ඔහෝ, නුඹ කෙල්ලට ආලය කරන්ට පටන් අරගෙන වගෙ, එහෙම නේද?"

"එහෙම තමා. මෙතැන නුඹත්, මාත් හැර වෙනත් කොම්සොමොල්වරු ඉන්නවද? එහෙම නැතිනම් 'පරෙවි කූඩුකාරයො' අප දෙදෙනා විතරක්ද?"

කත්‍යුෂා සාමකාමී ලෙස කතා කළාය.

"ඒ විකාර ක්‍රීඩා නවත්වලා දැන් නැටුම් පටන් ගනීවි. අපි නටමු."

කොර්චාගින් නැඟිට සිටියේය:

"හොඳ කෙල්ලේ නුඹ මෙහෙ නටාපන්. මම මූරා වොලීන්ට්සෙවා සමඟ ගෙදර යනවා."

★

දවසක් ද හවස ආන්නා බොර්හාර්ට් ඕකුන්යෙව් හමුවීමට ආවාය. ඔහුගේ කාමරයේ කොර්චාගින් ද සිටියේය.

"පාවෙල් නුඹට වැඩ තියෙනවද? නාගරික සෝවියට් සභාවේ රැස්වීමට යමුද? අප දෙදෙනා එකට යනකොට කාන්සියක් නැහැ. රෑ බෝ වෙලා ගෙදර එන්ට වේවි."

කොර්චාගින් ඉක්මනින් සූදනම් විය. ඔහුගේ ඇඳට ඉහළින් බිත්තියේ 'මවුසරය' එල්ලා තිබිණි. එය බර වැඩි

විශාල අවියකි. ඔහු මේස ලාච්චුවකින් ඕකුන්යෙව්ගේ කුඩා 'බ්‍රවුනිංග්' පිස්තෝලයක් ගෙන සාක්කුවේ දමා ගත්තේය. ඉක්බිති ඔහු යතුර නියමිත ස්ථානයේ සැඟවීය.

නාගරික සෝවියට් සභාවේ රැස්වීම පැවැත් වූ රඟහලේදී ඔවුහු පන්ක්‍රාතොව් හා ඔල්ගා (යුරේනොවා) හමුවූහ. හතර දෙනාම එකට වාඩි වී රැස්වීමට සහභාගි වූ අතර, විවේක කාලයේදී, චතුරශ්‍රයේ ඇවිද්දහ. ආන්නා බලාපොරොත්තු වූ පරිදි රැස්වීම රෑ බෝවන තුරු පැවැත්විණි.

"අපේ ගෙදර ගිහිල්ලා රෑ ගත කරමුද? දැන් රෑ බෝ වුණා. දුර යන්නට ඕන." යුරේනොවා යෝජනා කළාය.

පන්ක්‍රාතොව් සහ ඔල්ගා යුරේනොවා මහ මග ඔස්සේ පහළට ගිය අතර, පාවෙල් සහ ආන්නා සලෝමින්කාවලට යනු වස් ඉහළට ගියහ.

එය දැඩි අඳුර සහිත රැයකි. නගර ජනතාව නිදා සිටියහ. නගර සෝවියට් සභා රැස්වීමට සහභාගි වූවෝ නොයෙකුත් මාවත්වලට වැද විසිර ගියහ. ඔවුන්ගේ පියවර හා කට හඬ කෙමෙන් තුනී විය. පාවෙල් සහ ආන්නාද ඉක්මනින් ප්‍රධාන මාවත්වලින් ඈත් වූහ. පාළු වෙළඳ පොළ අසලදී, මිලීෂියා භටයා ඔවුන් නවත්වා, ඔවුන්ගේ බලපත්‍ර පිරික්සා බලා ඔවුන්ට යාමට ඉඩ හැරියේය. මහ මග හරහා ගිය ඔවුහු ආලෝකය සහ ජනයා රහිත පාළු මගක් ඔස්සේ ගමන් කළහ. අනතුරුව වමට හැරී දුම්රිය සේවයේ ප්‍රධාන ගබඩාවලට සමාන්තරව පිහිටි මග ඔස්සේ පා නැගූහ. ඒ ගබඩා කොන්ක්‍රීට් සිමෙන්තියෙන් කළ දිගැති, ඇඳිරි මූසල ගොඩනැගිලිය. ආන්නාගේ සිත නොපැහැදිලි බියකින් වෙළිණි. ඈ නොසන්සුන් ලෙස අඳුර දෙස බලමින් තම සගයාගේ ප්‍රශ්නවලට බිඳුණු පිළිතුරු දුන්නාය. ඇගේ සැකයට භාජන වුණු සෙවණැල්ල ටෙලිෆෝන් කණුවක් බව දැනගත් ආන්නා හඬ නගා සිනාසී, කොර්චාගින්ට තම තත්ත්වය ගැන කීවාය. ඈ ඔහුගේ අතක් අල්ලාගෙන ඇගේ උරහිසට වැදෙන තරම් ළංවී සන්සුන් වුණාය.

"මගේ වයස අවුරුදු විසිදෙකයි, හරියට මහලු ආච්චි කෙනෙකු වගේ නගර දුර්වලත්වයෙන් පෙළෙනවා. නුඹ මාව බියගුල්ලියක ලෙස ගණන් ගනීවි. නමුත්, එය වැරැදියි. අද මගේ සිත දැඩි නොසන්සුන්තාවකින් පිරිලා තියෙනවා. නුඹ මා, අසලින් ඉන්නා විට, මගේ හිත සන්සුන් වෙනවා. මගේ හිතේ ඇති බිය නිසා මට ලැජ්ජයි."

පාවෙල්ගේ දැඩි සන්සුන් ගතියද, ඔහුගේ දෙතොලෙහි ඇති දුම්වැටියෙන් නඟින ගිනි පුලිඟුවෙන් ඇතිවන ආලෝකයද නිසා ඇයට පෙනෙන ඔහුගේ අභීත බැම සඟළද විසින් රැයෙහි දැඩි අඳුර, පාළු පෙදෙසේ කාන්සිය, නගරාසන්නයේදී පොදෝල්හීදී ඊයේ රෑ සිදු වූ භයානක මිනීමැරුම ගැන සෝවියට් සභා රැස්වීමේදී ඇසූ පුවතින් හටගත් බිය තුනී කරන ලදි.

දුම්රිය ගබඩාද, කුඩා ගඟ හරහා දමා ඇති ලී පාලමද, පසුකළ මේ දෙදෙනා දුම්රිය මඟට යටින් තනා ඇති උමං මඟට ඇතුළු වූහ. නගරයේ මේ කොටස දුම්රිය පෙදෙස සමඟ සම්බන්ධ කරන එකම මඟය.

දුම්රියපොළ මීට දකුණින් ඈත පිහිටා ඇත. බිම්ගෙයක් වැනි උමං මඟ ඩිපෝවට එහායින් අවසන් විය. එය ඔවුන් පදිංචි පෙදෙසය.

ඉහළ දුම්රිය මඟෙහි විවිධ පාටින් විදුලි පහන් හා සංඥා ලකුණු අඳුරෙහි දිලිසණි. ඩිපෝව අසල දුම්රිය යන්ත්‍රයක් දවසේ වැඩ නිමකොට විඩාපත් කලෙක මෙන් හඬ නැඟීය.

උමං මඟ සිට පියවර දහයක් ඈතින් මහ මඟ අසල කුඩා ගෙයක් විය. වසර දෙකකට පෙර මේ ගෙට ෂෙල් වෙඩිල්ලක් වැදී එහි ඇතුළු පැත්ත සහ මූණත විනාශ විය. දැන් එහි ඉදිරි කොටසේ විශාල සිදුරකි. මඟ අයිනේ සිටගෙන තම විකලාංග පෙන්වමින් සිඟාකන සිඟන්නෙකුට දැන් එය සමානය. ඉහළ, දුම්රිය හඬ නඟමින් දිව ගියේය.

"ඔන්න ඉතින් අපි ගෙදර ආවා." ආන්නා සැනසිල්ලකින් කීවාය.

පාවෙල් තම අතක් මුදාගැනීමට වෑයම් කළද, ඔහුගේ අතේ එල්ලීගෙන ගමන් කළ ආන්නා එයට ඉඩක් නොතැබුවාය. ඔහු අත මුද ගැනීමට සමත් වන විට පමාවී තිබිණි. ඔහුගේ ගෙල අයෝමය අතක් විසින් දැඩි ලෙස ඇල්ලිණි. මොහොතකින් ඔහුගේ මුහුණ සතුරාගේ මුහුණට හැරුණේය. සතුරා එක් අතකින් පාවෙල්ගේ දත්වලට 'පාරබෙල්ලුම්' පිස්තෝලයක් එල්ල කොට, අනික් අතින් ඔහුගේ උගුරු දණ්ඩ මිරිකන්නට වූයේ කබායේ කර තද කරමිනි. සතුරා අතැති පිස්තෝලය පාවෙල්ගේ දෙනෙත් ඉදිරියේ අඩ කවයක් ඇන්දේය.

පාවෙල්ගේ දෙනෙත් මවිතයෙන් යුතුව හා නොමිනිස් නොසන්සුන්තාවක් සහිතව එම කවය දෙස බැලීය. පිස්තෝල කට තුළින් ඔහු වෙත මරණය ළං වී ඇත. එකද නිමේෂයක්

හෝ දෙනෙත් ඇත් කිරීමේ අධිෂ්ඨානයක් හෝ ශක්තියක් හෝ ඔහුට නොතිබිණි. ඔහු මාරක පහර බලාපොරොත්තුවෙන් සිටියේය. එහෙත්, වෙඩි තැබීමක් නොවීය. පිම්බී දෙට්ට පැනීමට තරම් මහත් වූ පාවෙල්ගේ දෙනෙත් ප්‍රචණ්ඩකාරී හොර දෙටුවාගේ මුහුණද, ඔහුගේ විශාල හිස් ගෙඩියද, ශක්තිමත් හකු පාඩාද නොකැපූ උඩු හා යටි රැවුළේ කළු පැහැයද දිටීය. එසේ වුවද, කැප් තොප්පියෙන් වැසී තිබුණු ඔහුගේ ඇස් පාවෙල් නොදිටීය.

සුදු හුණු මෙන් මලානික ආන්නාගේ මුහුණ පාවෙල් දුටුවේ නෙත් කොනිනි. හොරුන් තිදෙනාගේ එකෙකු විසින් ඇය බිත්තියේ සිදුරකට ඇද ගෙන යන ලදී. ඔහුට සහාය පිණිස තවත් කළු පැහැති සෙවණැල්ලක් ළං විය. එම සෙවණැල්ල බිම් ගෙයක් බඳු උමං මගෙහි බිත්තියේ පිළිබිඹු විය. ගෙයි සුන්බුන්වලට එපිට මාරාන්තික සටනක් විය. මරළතෝනියක් වැනි ඇගේ කෑගැසීම් නැවතුණේ එකෙක් සිය හිස්වැසුම ඇගේ කට තුළට එබූ බැවිනි. කොර්චාගින්ගේ කටට පිස්තෝලය එල්ල කොට ඔහුගේ ගෙල මිරිකා සිටි විශාල හිස් කබලක් ඇති හොරදෙටුවා ආන්නා වෙත කඩා පැන්නේ ගොදුරක් වෙත පනින මෘගයකු මෙනි. ඔහුගේ අත් අඩංගුවේ සිටින සිහින් තරුණයා නෝන්ජලයෙකු බවත්, ඔහු දුම්රිය ඩිපෝවේ වැඩ කරන 'කැඳයකු' බවත් හොරදෙටුවා තීරණය කළේය. ඔහුගෙන් තමාට කිසිදු අනතුරක් නැත. " මුගේ හිසට සෑහෙන පහරවල් දෙකක් තුනක් දීලා දුවන්ටයි අණ කළාම මූ ආපසු නොබලා නගරයටම යනකල් දුවයි." මෙසේ සිතූ හොරා පාවෙල්ගේ ගෙල මුදා හැරියේය.

"දුවපිය ජඩයා ආ දිහා බලාගෙන. කෑගැසුවොත් මේ පිස්තෝලයේ පතරොම් නුඹේ ඔළුවට කා වදීවි."

හොරදෙටුවා පාවෙල්ගේ හිසට පිස්තෝල බටයෙන් ගැසීය.

"දුවපිය" ගොරෝසු හඬින් කී ඔහු වෙඩි තැබීමේ බියෙන් තොරව දිවීමට දිරි ගැන්වීමක් සේ පිස්තෝලය අහකට ගත්තේය.

කොර්චාගින් පස්සට විසි වී පියවර දෙකක් පසෙකට තැබුවේ හොරදෙටුවා අතුරුදහන්වීම වළක්වනු පිණිසය.

තමා ඉදිරිපිට සිටින තරුණයා වෙඩි පහර කෑමට ඇති බිය නිසා ගල් ගැසී ඉන්නා බව වටහාගත් හොරා තම සගයන්ට එක්වීම පිණිස ඔහුට පිටුපෑවේය.

පාවෙල් හණිකට තම අත සාක්කුවට යැවීය. "ඉක්මනට වෙඩි තබන්ට, ඉක්මනට වෙඩි තබන්ට!" ඔහුගේ යටි සිත කෑගැසීය.

පාවෙල් වහාම හැරී පිස්තෝලය ගත් වම් අත දිග හැර හොරදෙටුවා වෙත ඉලක්කය බලා වෙඩි තැබීය.

හොරදෙටුවාට තම වැරැද්ද වැටහිණි. එහෙත්, දැන් පමා වෙලාය. පාවෙල්ගේ වෙඩි පහර ඔහුගේ සිරුරේ පැත්තකට වැදුණේ ඔහු අත එසවීමටත් පෙරය.

වෙඩි පහර කෑ හොරදෙටුවා උමං මගෙහි බිත්තියකට හේත්තු වී බැරෑඩි හඬක් නගමින් බිත්තිය අල්ලා ගෙන බිම පතිත විය. බිඳුණු ගෙයින් පිට වූ සෙවණැල්ලක් පහළ වූ වළ දෙසට පා නැඟීය. කොර්චාගින් එම සෙවණැල්ලටද වෙඩි පහරක් තැබීය. දෙවැනි සෙවණැල්ල කඳ නමාගෙන උමං මගට පැන්නේය. නැවත වෙඩි තැබීය. මූනිස්සම කොන්ක්‍රීට් සිමෙන්ති බිත්තියට වැදී දුවිලි නගත්ම සෙවණැල්ල නැගී සිට අඳුරට පැන අතුරුදහන් විය. පාවෙල් රැයෙහි නිහඬතාව බිඳිමින් තවත් තෙවරක් වෙඩි තැබීය. බිත්තිය අසල පණුවකු සේ දඟලමින් පණ අදිමින් සිටියේ විශාල හිස් කබලක් ඇති හොරදෙටුවාය.

භයානක සිද්ධිය නිසා කම්පනය වූයෙන් අන්දමන්ද වී සිටි ආන්නා, පාවෙල් විසින් නැගිට සිටුවන ලදි. වෙඩිපහර කා පණ අදිමින් සිටින හොරා දෙස බැලූ ඈ තමාගේ ගැලවීම ගැන යන්තමින් වටහා ගත්තාය.

කොර්චාගින් ඇය අඳුරට, ආලෝකයෙන් ඈතට, නගරය දෙසට ගෙන ගියේය. ඔවුහු දුම්රියපොළ දෙසට දිව්වෝය. වෙඩි පහර නිසා දුම්රිය ආරක්ෂක භටයෝ පහන් ගෙන එළියට ආහ. ඒවායින් පිට වූ ගිනි දලු ආලෝකයක් ඇති කළේය. උමං මඟ අසලින් රයිපලයක් විසින් වෙඩිපහරක් තැබිණි.

අවසානයේදී ඔවුහු ආන්නාගේ ගෙදරට ළඟා වන විට, බතියෙව, කන්දේ කුකුළෝ හඬලෑහ. ආන්නා ඇඳෙහි වැතිර ගත්තාය. කොර්චාගින් පුටුවක වාඩි විය. දුම්වැටියක් උරන්නට පටන් ගත් ඔහු කවාකාරව ඉහළ නඟින දුම් වලා දෙස බලමින් සිටියේය. තම ජීවිතයේ හතරවැනි වරට ඔහු සතුරකු මරා දැම්මේ මේ දැන්ය.

අංග සම්පූර්ණ ආකාරයකින් යුතුව පැන නඟින නිර්භයත්වයක් තිබේද? තමාට විඳින්නට ලැබුණු වේදනා

සහ සංවේදනා සිහියට නඟා ගත් පාවෙල් කොර්චාගින් හොර දෙටුවා තමාගේ මුහුණට පිස්තෝලය එල්ල කළ මුල් තත්පරයේදී තම හදවත හිම කැටයක් බවට පත් වූ බව පිළිගත්තේය. හොරුන් දෙදෙනෙකු ගැලවී පැන ගියේ එක් ඇහැක අඳ බව සහ වම් අතින් වෙඩි තැබීමට සිදුවූ නිසාද? නැත. පියවර කීපයක් ඈතින් සිටියවුනට මීට වඩා සාර්ථක ලෙස වෙඩි තැබීමට හැකිය. එහෙත්, නොසන්සුන්තාව හා ඉක්මන්කම ස්නායු දුර්වලත්වයේ සලකුණක් වූ අතර, එය ඔහුට බාධා කළේය.

මේසය උඩ ඇති විදුලි පහනේ ආලෝකයෙන් ඔහුගේ හිස පෙනිණි. ආන්නා ඔහුගේ මුහුණේ හැම මාංස පේශියකම චලනය නිරීක්ෂණය කළාය. එසේ වුවද, ඔහුගේ දෙනෙත් ශාන්ත බවක් කීය. නළලේ රැලි පමණක් ඔහුගේ කල්පනාවේ ආතතිය ගැන කියා පෑවේය.

"පාවෙල්, නුඹ මොනවා ගැනද කල්පනා කරන්නෙ?"

ඇගේ හදිසි ප්‍රශ්නය නිසා ඔහුගේ කල්පිත ලෝකයේ අදහස් ආලෝක කවයට එපිට ගොස් අතුරුදහන් වන දුම් වලා මෙන් අදිසි විය. ඔහුගේ හිතට ආ පළමු දේ ඔහු එකවර පැවසීය.

"මම නගර පාලකයාගේ කාර්යාලයට ගිහින් මේ සියල්ල ගැන විස්තර කරන්නට ඕන."

ඔහු තම විඩාව මැඩ අකැමැත්තෙන් නැඟිට සිටියේය.

ආන්නා ඔහුගේ අත එකවර මුදා නොහැරියාය. තනිව සිටීමට ඇය අකැමැතිය. පසුව ඈ ඔහු කැටුව දොර දක්වා ගියාය. ඔහු රැයෙහි අඳුරට වැද නොපෙනී ගිය පසු ඈ දොර වැසුවාය. දැන් පාවෙල් ඇයට ඉතා කිට්ටු, වටිනා පුද්ගලයකු විය.

දුම්රිය ආරක්ෂක භටයනට ප්‍රහේලිකාවක් වූ මිනීමැරුම පිළිබඳ අබිරහස පාවෙල්ගේ විස්තර වාර්තාව නිසා පැහැදිලි විය. මළ මිනිහා හඳුනා ගැනිණි. අපරාධ අංශ ඉතා හොඳින් දැන සිටි දිගු කලක් තිස්සේ සිර දඬුවම් ලැබූ හොරදෙටුවකු හා මිනීමරුවකු වන පීම්කා වෙරෙප් 'මිනී ඔළුවා'ය ඒ.

උමං මගේ සිද්ධිය ගැන පසුදින හැම දෙනාම දැන ගත්හ. මේ සිද්ධිය නිසා බලාපොරොත්තු රහිතව පාවෙල් හා ස්වෙතායෙව් අතර හැප්පීමක් ඇති විය.

පාවෙල් වැඩ ශාලාවේ වැඩ කරමින් සිටියදී, හදිසියේම එහි පැමිණි ස්වෙතායෙව් ඔහුට අඬ ගැසීය. හේ ඔහු කැටුව

කොරිඩෝරයේ ඈත නිහඬ තැනකට ගියේය. කතාව පටන් ගන්නේ කෙසේ දැයි නොදත් ස්වෙතායෙව් කැලඹී සිට, අවසානයේ දී මෙසේ ඉල්ලා සිටියේය.

"ඊයේ සිදුවූ දේ ගැන කියපන්."

"නුඹ ඒ ගැන දන්නවා."

ස්වෙතායෙව් නොසන්සුන්ව දෙඋර සෙලවීය. උමං මගෙහි සිද්ධිය අන් අයට වඩා තියුණු ලෙස ස්වෙතායෙව්ට බලපාන බව පාවෙල් නොදැන සිටියේය. වෘත්තියෙන් යකඩ තළන්නෙකු වූ ස්වෙතායෙව් බාහිර වශයෙන් උදාසීනතාවක් පෙන්වූවද, ආන්නා බොර්හාර්ට් කෙරෙහි දැඩි ඇල්මක් දැක්වූ බව පාවෙල් නොදත්තේය. ආන්නාට ඇලුම් කළේ එකෙකු පමණක් නොවේ. එහෙත්, ස්වෙතායෙව්ගේ හැඟීම් සංකීර්ණ විය. උමං මගෙහි සිද්ධිය ඔහු තාල්යා ලගුටිනාගෙන් දැනගත්තේ මේ දැන්ය. ඔහුගේ සිතට වධ දෙන, නොවිසඳුණු ප්‍රශ්නයක් පැන නැඟී ඇත. ඔහුට එම ප්‍රශ්නය එක එල්ලේම පාවෙල්ගෙන් ඇසිය නොහැකි නමුදු, ඔහු එයට පිළිතුරු බලාපොරොත්තු වෙයි. ඔහුගේ බයෙහි ඇති ආත්මාර්ථකාමී, නීච ගතිය ඔහුගේ සංවිඥානයට යන්තමින් දැනෙයි. එසේ වුවද, ඔහුගේ සිත තුළ ඇති වූ සංවේදනීය ගැටුමේදී ම්ලේච්ඡ හා පහත් හැඟීම් මතු විණි.

"කොර්චාගින් මේ අහපන්." ඔහු ගොළු හඬකින් මිමිනුවේය. "මේ කතාව අප දෙදෙනාට විතරක් සීමා වෙනවා. ආන්නාට හානියක් සිදුවෙතැ යි යන හැඟීම උඩ නුඹ එය නොකියා සිටීම මට වටහා ගන්ට පුළුවනි. නමුත් නුඹට මා කෙරෙහි විශ්වාසය තැබීමට පුළුවන්. නුඹට එක පල්හොරෙක් අල්ලාගෙන ඉන්නා විට අනික් දෙදෙනා ආන්නාගේ හිරි ඔතප් බිඳ දැමුවාද?" ප්‍රශ්නයේ අවසාන වචන ස්වෙතායෙව්ගේ කටින් පිටවෙත්ම ඔහු දෙනෙත් ඉවත ගත්තේය.

කොර්චාගින්ට යම්තමින් කාරණය පැහැදිලි විය. "ආන්නා කෙරෙහි ස්වෙතායෙව් වුවමනාවක් නොදැක්වූවා නම්, ඔහු මෙතරම් කැලඹෙන්නේ නැත. එහෙත්, ආන්නා ඔහුට වටිනා කෙනෙකු නම්.." ආන්නා නින්දවට හසු කළ ඒ ප්‍රශ්නය නිසා පාවෙල් කෝප විය.

"නුඹ එහෙම අහන්නෙ මොකටද?"

ස්වෙතායෙව් එකිනෙකට සම්බන්ධ නැති කිසිවක් දෙඩවීය. පාවෙල් තමා වටහාගත් හොඳින් දැනගත්

ස්වේතායෙව්ගේ ඉවසීම සිඳිණි.

"නුඹ 'වහෙන් ඔරෝ' කතා කියන්නේ මොකටද? මම නුඹෙන් පිළිතුරක් ඉල්ලා හිටිනවා. නුඹ මගෙන් හරස් ප්‍රශ්න අහනවා."

"නුඹ ආන්නාට ආලය කරනවද?" පාවෙල් ප්‍රශ්න කළේය.

නිහඬතාවකින් ඉනික්බිති ස්වෙතායෙව් ඉතා අමාරුවෙන් පිළිතුරු දුන්නේය.

"ඔව්"

පාවෙල් කොර්චාගින් තම කෝපය ඉතා අමාරුවෙන් මැඩ ගනිමින් ඔහුට පිටුපා, ඔහු දෙස නොබලා කොරිඩෝරය ඔස්සේ පා නැඟීය.

★

එක් රැයෙකදී ඕකුන්යෙව්, තරමක ලජ්ජාවකින් යුතුව තම මිතුරාගේ ඇඳ වටේ කරකැවෙමින් සිට, ඇඳ අයිනක වාඩි වී, පාවෙල් කියවීමට දිග හැරිය පොත වසමින් මෙසේ පැවසීය:

"පව්ලූෂා නුඹ දන්නවාද, මා හිතාගෙන හිටියා, නුඹට කතාවක් කියන්ට. එක් අතකින් ඒක කොහෙත්ම වැදගත් නැතුවා වගෙයි, නමුත්, අනික් අතින් ඊට වෙනස්. මායි තාල්යා ලගුටිනා අතරයි ඇති හැඟීම් කියන්නට මට පුළුවන්කමක් නැහැ. ඉස්සෙල්ලා ඇය මගේ හිත ගත්තා." හේ වරදක් කළ එකකු මෙන් හිස කැසීය. තම මිතුරා සිනහ නොවී සිටින සැටි දුටු ඕකුන්යෙව් දිරිවඩා දිගටම කතා කළේය. "පස්සේ තාල්යා... ඒ වගේ දෙයක් ගැන. මම නුඹට මේ හැම දෙයක් ගැනම විස්තර සහිතව කියන්ට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. නුඹට දැන් කාරණය පැහැදිලියි නෙව. ඊයේ අපි තීරණය කළා දෙදෙනාම එක්වෙලා අපේ ප්‍රීතිය එකට ගොඩ නඟන්නට. මගේ වයස අවුරුදු විසි දෙකක් වෙනවා. අප දෙදෙනාටම ඡන්දය දීමට අයිතියක් තියෙනවා. තාල්යා සමඟ සමාන අයිතිය මත පදනම් වූ ජීවිතයක් ගොඩ නැඟීමට මා කැමතියි. නුඹේ අදහස කොහොමද?"

පාවෙල් කොර්චාගින් කල්පනා කළේය.

"කෝල්යා, මට දිය හැකි පිළිතුර කුමක්ද? නුඹලා දෙදෙනාම මගේ මිතුරෝ. අපි එකම නිර්ධන පන්තියක ශ්‍රෝතයට අයත් උදවිය. හැම දෙයක්ම අප අතර පොදුයි. තාල්යා ඉතාම හොඳ කෙල්ලක්. මට නම් හැම දෙයක්ම පැහැදිලියි."

ඊට පසු දින පාවෙල් තම ඇඳුම් ටිකත් රැගෙන ඩිපෝ

කම්කරුවන්ගේ ලැගුම් නිවසට ගියේය. දවස් කීපයකට පසු තාල්යා ලගුටිනාගේ සහ නිකොලායි ඕකුන්යෙව්ගේ විවාහය නිමිත්තෙන් කෑම බීම රහිත කොමියුනිස්ට්වාදී සැන්දෑ හමුවක් ආන්නා බොර්හාර්ට්ගේ නිවසේදී පැවැත්වීය. එය තම මතකය සිහිකිරීම්, ඉතාම කැමැති පොතින් කොටස් කියවීම් සහිත සැන්දෑවකි. සමූහය හඬනඟා බොහෝ ගීත ගැයූහ. ඔවුන්ගේ රණකාමී ගීත ඈතට ඇසිණි. අනතුරුව කත්යූෂාසෙලේනොවා සහ වොලීන්ට්සෙවා (ඇකෝඩියනයට බොහෝ සේ සමාන) බයානයක් ගෙනාහ. ඝනැති හඬ හා රිද්මය ස්වරවලින් පැන නැඟි නාදයෙන් කාමරය පිරිණි. එදින පාවෙල් කොර්චාගින් ඉතා කදිම ලෙස බයානය වාදනය කළේය. හැම දෙනාගේම සිත් සතන් පිනවමින් උසැති පන්ක්‍රාතොව් නටන්නට විය. පාවෙල් අලුතින් පුරුදු කරගත් උපශාන්තමය තාල අමතක කර ඉස්සර මෙන් ගිනි පිටවන වේගවත් තාල වාදනය කළේය.

ඩෙනීකින් නීචයා පැන දුවයි බැට කා
බලැති සයිබීරියානු චෙකා[1]
කොල්චාක්ට පෙන්නයි කොකා

අතීතය ගැනද, ගිනි ඇවිළ පැවැති අවුරුදු ගැනද, වත්මන් මිත්‍රත්වය, සටන සහ ප්‍රීතිය ගැනද එද බයානය ගැයීය. සංගීත භාණ්ඩය වොලීට්සෙව්ට දුන් පසු කොර්චාගින් 'යාබ්ලොච්කා' නැටුම වේගයෙන් නැටුවේය. එදින ඔහු නැටුවේ විදුලි වේගයෙනි. දුටුවන් මවිත කරමින් තාලය අනුව සපත්තු අඩි පොළොවේ හප්පා හඬක් නංවමින් පාවෙල් කොර්චාගින් තම ජීවිතයේ තෙවැනි වරට සහ අවසාන වරට එදින නැටුවේය.

IV

මෙය දේශ සීමාවය. එකිනෙකට එදිරිව සිටවූ කණු දෙකකි. නිහඬ සතුරු බවකින් යුතුව එය ලෝක දෙකක් නියෝජනය කරයි. ඉන් එකක් යතු ගා මැදලාය. එය කළු සහ සුදු පැහැයෙන් පාට කර ඇත. පොලිස් මුරපොළක් වැනිය. කණුව මුදුනේ විශාල, ඇණ ගසා සවි කළ එක් හිසක් ඇති රාජාලියෙකි. උගේ පියාපත් විහිදී ඇත. කකුලේ නියපොතුවලින් ඌ කණුව තදින් අල්ලාගෙන සිටින බවක් පෙන්වයි. උගේ හොට වකුටුය. දිගය. ඌ, ඉදිරිපිට ඇති දැකැති

1 චෙකා - අපරාධ හා සෝවියට් විරෝධී ක්‍රියා පරීක්ෂක සේවයයි.

මිටි සලකුණ සහිත පලිහ දෙස දුෂ්ට බැල්මක් හෙළයි. එයට පියවර හයක් ඈතින්, ඉදිරිපිට තවත් කණුවකි. එය යෝධමය ඕක් ගහක කඳකි. ගැඹුරු ලෙස පොළොව හාරා සිටුවා ඇත. එම කණුව උඩ දැකැත්තේ සහ මිටියේ ලාංඡනය සහිත පලිහකි. කණු දෙක අතර සමතලා පොළොවේ ආගාධයකි. කණු දෙක එක, එක බැගින් ලෝකයක් නියෝජනය කරයි. කිසිවකුට අයිති නැති කණු දෙක අතර ඇති කුඩා බිම් තීරයට, සිය ජීවිතය අනතුරට භාජනය නොකර මිනිහකුට පා තැබිය නොහැකිය.

මෙය දේශ සීමාවය.

කළු මුහුදේ සිට උත්තර ද්‍රැව පෙදෙසේ සඳ හිමෙන් වැසී ඇති උතුරු සාගරය දක්වා සැතැපුම් දහස් ගණනකි. දේශසීමා ඔස්සේ සිටුවා ඇති දේශ සීමා කණු නිහඬ මුර සෙබළුන් වැන්න. ඒවායේ දැකැති මිටි සලකුණ හෙවත් සෝවියට් සමාජවාදී ජනරජ සංගමයේ ශ්‍රේෂ්ඨතම ශ්‍රමකාමී රාජ්‍ය ලාංඡනය සහිත පලිහක් බැගින් ඇත. ගසා කන රාජාලි රූපය සහිත කණුවට මෙහා නව සෝවියට් සමාජවාදී උක්රයින ජනරජයයි. එහා රදල ධනපති පෝලන්තයයි. ප්‍රත්‍යන්ත ප්‍රදේශයේ කුඩා නගරයකි බෙරෙස්දෙව්. මෙහි සිට කිලෝමීටර දහයක් ඈතින් කොරෙට්ස් නම් වූ කුඩා පෝලන්ත දේශ සීමා නගරය පිහිටියේය. ස්ලවුතා සිට අනාපොල් දක්වා පෙදෙස දේශ සීමා ආරක්ෂා කරන බැටෑලියන් හමුදවක් විසින් රකිනු ලැබෙයි.

දේශ සීමාව සලකුණු කරන කණු හිමෙන් වැසුණු පෙදෙස්ද, කැලෑ පෙදෙස්ද, පල්ලම් සහිත තැන්වලද කඳු හා කඳු ගැටවලද, ගං ඉවුර දක්වාද සිටුවා ඇත. ඒවා උසැති කඳුවල සිට හිමෙන් වැසී ඇති විදෙස් බිම් බලා සිටින්නාක් මෙනි.

ඉසිලිය නොහැකි තරම් දැඩි ශීතලකි. හිම සපත්තුවලට පෑගෙන හිම "කර කර' හඬක් නඟයි. දැකැති මිටි සලකුණ සහිත කණුවට එහා යෝධමය සිරුරක් ඇති රතු හමුද සෙබළෙක්, විශාල තොප්පියක් හිසේ දමාගෙන බරැති අඩි තබමින් සිය පෙදෙස පිරික්සා බලයි. මේ යෝධ රතු සෙබළා අළු පැහැති සෙබළ කබායක් හැඳ 'වාලෙන්කි' නමැති හිම සපත්තු දමාගෙන සිටී. සෙබළ කබායේ උර පටි කොළ පැහැතිය. සෙබළ කබායට උඩින් බැටළු සමින් කර ඇති විශාල හිම කබායක් ඔහු පොරවා ගෙන සිටී. එහි

කර පටි අතිවිශාලය. ඔහුගේ දෑත් වැසී ඇත්තේද බැටළු හමින් කළ අත් වැසුම්වලිනි. හිම කබාය බිමට වැදෙන තරම් දිගය. ඕනෑම දැඩි හිම කුණාටුවකදී වුවද, එයින් උණුසුම ලැබෙයි. හිම කබායට උඩින් රයිපල් තුවක්කුවක් ඔහු උරයක එල්ලාගෙන ඇත. රතු සෙබළා අඩි පාර ඔස්සේ පිය නගයි. ඔහුගේ හිම කබායට හිම කැටි වැදෙයි. බාල වර්ගයට අයත් දුම්කොළවලින් සෑදූ දුම්වැටියක් උරමින් ඔහු ප්‍රීති විය. සෝවියට් දේශ සීමාවේ කිලෝමීටරයකට එක් සෙබළෙක් බැගින් මුර කරයි. ඔවුන් එකිනෙකාට පෙනෙයි. පෝලන්ත දේශ සීමාවේ කිලෝමීටර් දෙකකට සෙබළෙක් බැගින් සිටී.

දේශ සීමා පටු මඟෙහි රතු සෙබළා ඉදිරියට පෝලන්ත දේශ සීමා භටයෙක් පා නගයි. ඔහු රළු සෙබළ පාවහන් දමාගෙන සිටී. ඔහුගේ යුද ඇඳුම කොළ පැහැතිය. එයට උඩින් කළු කබායක් පොරවාගෙන සිටී. එහි දිලිසෙන බොත්තම් දෙපෙළකි. ඔහුගේ හිස්වැස්මේ උඩ කොටස හතරැස් කොටුවකට සමානය. එහි සුදු රාජාලි ලාංඡනයකි. ඔහුගේ උරපටි හා කරපටිවල රාජාලි ලාංඡනය. එහෙත්, ලාංඡන නිසා ඔහුට උණුසුම නොදැනේ. දැඩි ශීතල ඔහුගේ හම හා මස විනිවිද කටුවටම වැදී ඇත. හිරිවැටී ඇති දෙකන් ඔහු පිරිමදී. පා නගන අතර ඔහු සපත්තුවට සපත්තුවකින් ගසා පායේ හිරිවැටීම වැළැක්වීමට වෙර දරයි. සිහින් අත් වැසුම් නිසා ඔහුගේ අතේ ඇඟිලි හිරිවැටී ඇත. පෝලන්ත දේශ සීමා මුරභටයාට එකද විනාඩියක්වත් එකතැන නැවතී සිටිය නොහැකිය. එසේ සිටියහොත් ඔහු ශීතලට හසුව ගල් ගැසෙනු ඇත. එබැවින් ඔහු නිතරම ඉක්මනින් ඇවිදියි. ඉඳහිට ඔහු අසකු සේ හැල්මේ යයි. දෙපැත්තේ සිටින දේශ සීමා සෙබළු දෙදෙනා එකිනෙකාට ළං විය. පෝලන්ත සෙබළා හැරී රුසියානු සෙබළා සමඟ එක්වී පියවර නගයි.

දේශ සීමාවේදී කතා කිරීම තහනම්ය. එහෙත්, අවට ජනයා රහිත වූ විට, ඊළඟ සෙබළා ඊට කිලෝමීටරයක් ඈතින් සිටින විට මේ දෙදෙනා කතා කර ජාත්‍යන්තර නීතිය කඩ කරතිද, නිහඬව සිටිතිද යනු කිසිවෙක් නොදනී.

පෝලන්ත සෙබළාට දුම්බීමට ආසාවක් ඇත. එහෙත්, ඔහුට ගිනිපෙට්ටිය ගෙන ඒමට අමතක විය. රුසියන් දේශ සීමාවේ සිට හමන සුළං දුම්කොළ සුවඳ ගෙන එන බැවින් ආසාව වැඩි වේ. පෝලන්තයා දෙකන් පිරිමැදීම නවත්වා පසු පස බැලීය. ඉඳ හිට හිටිහැටියේ අසකු පිට නැඟ ගත්

පෝලන්ත නිලධාරියෙක් දේශ සීමා පිරික්සා බැලීමට පැමිණීම සිරිතකි. බලාපොරොත්තු රහිතව ඔවුහු කන්දෙන් එළියට එති. එහෙත්, දැන් අවට හිස්ය. දීප්තිමත් හිරු රැස් නිසා බිම වැටී ඇති හිම කැට දිලිසේ. අහස හිම පියලිවලින් නිදහස්ය.

"සහෝදරයා ගිනිපෙට්ටියක් තියෙනවද?" දේශ සීමාවේ ශුද්ධ වූ නීතිය පළමුවෙන්ම පෝලන්ත සෙබළා කඩ කරයි. ඔහු තම ප්‍රංශ බයිනෙත්තුවක් සමඟ රයිපල් තුවක්කුව පටියෙන් ගෙන උරහිසේ එල්ලාගෙන සාක්කුවකින් බාල වර්ගයේ සිගරැට් පැකැට්ටුවක් එළියට ඇද ගත්තේය. දැඩි ශීතල නිසා ඇඟිලි හිරිවැටී ඇති බැවින්, ඔහු එය කළේ ඉතා අමාරුවෙනි.

රතු සෙබළාට ඔහුගේ ඉල්ලීම ඇසුණද, විදේශිකයන් සමඟ කතා කිරීම තහනම් කරන දේශ සීමා නීතිය කඩ කිරීමට ඔහු ඉදිරිපත් නොවේ. ඒ හැර පෝලන්ත සෙබළා කී දේ ඔහුට හරියට නොවැටහිණි. රතු සෙබළා දැඩි ලෙස පා නඟමින්, උණුසුම් හිම සපත්තුවලින් හඬක් නඟමින් නිහඬව ගමන් කරයි.

"බෝල්ෂෙවික් සහෝදරයා, සිගරැට්ටුව පත්තු කරගන්නට ගිනිපෙට්ටිය දීපන්!" මේ වර පෝලන්ත සෙබළා රුසියන් බසින් කතා කරයි.

රතු සෙබළා තම අසල්වැසියා දෙස බලයි. "දැඩි ශීතල හන්ද පෝලන්ත සෙබළා සෑහෙන්න පීඩා විඳිනවා. ඔහු ධනපති සෙබළකු වුව ද, ඔහුගේ ජීවිතය බල්ලකුටත් අන්තයි. මේ තරම් දැඩි ශීතල තියෙන විට, සෙබළ කබාය විතරක් අන්දවලා වැඩට එවලා. ඔහු හාවකු වගේ උඩ පනිනවා. දුමක් නැතිව ඔහුට හොඳටම අමාරුයි වගේ." රතු සෙබළා සිතන්නට විය. රතු සෙබළා ඔහු දෙස හැරී නොබලාම ගිනි පෙට්ටිය ඔහු දෙසට විසි කරයි. පෝලන්ත සෙබලා බිම වැටීමට ඉඩ නොදී, එය අල්ලාගෙන ගිනි කූරු කීපයක්ම දල්වා අවසානයේදී සිගරැට්ටුව පත්තු කරගනී. ගිනිපෙට්ටිය නැවත දේශ සීමා හරහා යැවෙයි. එවිට රතු සෙබළා නීතිය කඩ කරමින් කතා කරයි.

"නුඹ තියාගනින්. මා ළඟ තව එකක් තියනවා."

පෝලන්ත සෙබළා පිළිතුරු දෙයි. "බොහොම ස්තුතියි. ඔය ගිනි පෙට්ටිය හින්ද මට දෑවුරුද්දක් හිර ගෙදර ලගින්න සිදු වේවි."

රතු සෙබළා ගිනිපෙට්ටිය දෙස බලයි. එහි අහස් යානාවක රූපයකි. අවර පෙත්ත වෙනුවට මිට මෙළවූ අතකි. එහි 'අවසාන නිවේදනය' අකුරු පෙළකි.

"ඔව් හැබැටම උන්ට මේක ගැළපෙන්නෙ නැහැ."

රතු සෙබළාට සමාන්තරව පෝලන්ත සෙබළා පා නගයි. ඔහුට හුදෙකලාව ගමන් කිරීම මහත් කාන්සියක් ගෙන දෙන්නකි.

★

සන්සුන් ලෙස හැල්මේ යන අසුන්ගේ පිට උඩ ඇති සැදෑල 'ක්‍රිස්' හඬක් නගයි. කළු පැහැති අසකුගේ මුහුණ සහ නාස්පුඩු වටා ඇති ලොම්වල ඉතා කුඩා අයිස් කැට ඇත. උගේ ප්‍රශ්වාසය නිසා අවට වාතය වාෂ්ප බවට පත්වේ. බැටෑලියනයේ අණ දෙන්නාගේ අශ්වයා ලප සහිතය. ඌ හැල්මේ යනවිට, උගේ බෙල්ල යම්තමින් වැනෙයි. එවිට ඌ හුරතල් පාන්නා සේය. අසරුවන් දෙදෙනාම සෙබළ කබා හැඳ, බඳ වටා පටි බැඳ සිටියහ. ඔවුන්ගේ අත්වල රත් පැහැති කුඩා හරි හතරැස් රතු කොටු සලකුණු තුන බැගින් ඇත. වෙනසකට ඇත්තේ බැටෑලියනයේ අණ දෙන ගව්රිලව්ගේ කර පටිවල කොළ පැහැය පමණකි. ඔහුගේ සගයාගේ කරපටි රතු පැහැතිය. ගව්රිලව් දේශ සීමා මුර සෙබළ මූළක සේවය කළේය. ඔහුගේ බැටෑලියනය කිලෝමීටර් හැත්තෑවක් දිග දේශ සීමා පෙදෙසක් රකී. ඔහු එම පෙදෙසේ 'ස්වාමියා'ය. ඔහුගේ සගයා බෙරෙස්දෝව් නගරයෙන් පැමිණි අනිවාර්ය යුද්ධ සේවයේ බැටෑලියන් කොමසාරිස්වර පාවෙල් කොර්චාගින්ය.

ඊයේ රෑ හිම වැටිණි. දැන් එය සුදෝසුදු කපු පුලුන් මෙනි. බිම වසා සිටින හිම පැදුරේ හිම සිනිඳුය. තවම අස් කුරවලට හෝ මිනිස් පයට හෝ මේ නැවුම් හිම පෑගී නැත. අසරුවෝ දෙදෙනා කැලෑවක සිට එළිමහන් බිමකට වැදෙන්ට ළංවූහ. එතැන සිට පියවර හතළිහක් ඈතින් දේශ සීමා හඳුන්වන කණු දෙකකි.

"ප්-ර්-ර්-ර්"

ගව්රිලොව් අසුගේ නාස් පටි අදියි. කොර්චාගින් තම කළු පැහැති අසු හැරවූයේ නැවතීමේ හේතුව දැන ගැනීමටය. ගව්රිලොව් සැදෑලයේ සිට පහතට නැමී හිමෙන් වැසී ඇති පොළොව දෙස පිරික්සුම් බැල්මක් හෙළීය. කිසිවකු දැති

රෝදයක් වැනි යමක් ඇදගෙන ගිය හැටි දැක්වෙන සලකුණු දකින්නට ඇත. තම පා සටහන් අවුල් කිරීමට මෙන් යම් කිසි කපටි කුඩා සතෙක් පා සටහන මත තවත් සටහනක් තබා ගිය සැටියකි. ගව්රිලොව් නැවතුණේ සතාගේ පා සටහන් නිසාම නොවේ. දැතිරෝද සටහනට පියවර දෙකක් ඈතින් මිනිහකුගේ පා සටහන් පෙනෙන්නට ඇත. ඒවා මත ඉතා කුඩා හිමපියලි වැටිලාය. මිනිස් පා සටහන් අවුල් කිරීමට තැත දරා නැත. මිනිහෙක් පෝලන්තයේ සිට කෙළින්ම සෝවියට් දේශසීමාවේ කැලෑවට වැදුණු සැටි ඉන් කියැවෙයි. බැටැලියනයේ අණ දෙන්නා තම අසු පටු මඟ ඔස්සේ මෙහෙයවමින් ගියේය. පෝලන්ත දේශසීමාව පැත්තේ පියවර දහයක් හෝ දෙළහක් හෝ ඉතා පැහැදිලිව පෙනෙයි.

"ඊයේ රෑ කිසිවෙක් දේශසීමාවට ඇතුළු වෙලා තියෙනවා." ගව්රිලොව් මිමිනුවේය. "තුන්වෙනි සේනාංකය ආයෙත් නිදි කිරා වැටිලා. උදේ වාර්තාවේ ඒ ගැන කිසිවක් නැහැ! යක්ෂයෝ." ඔහුගේ උඩු රැවුළ යම්තමින් පැසීමට පටන් ගෙන ඇත. ඔහුගේ උණුසුම් ප්‍රශ්වාසය නිසා උඩු රැවුළට වැටී ඇති හිම කැට අයිස් බවට පත්වී රිදී පැහැයක් ගත්තේය. ඒවා තොලට උඩින් එල්ලී ඇත.

අසරුවන් ඉදිරියට දෙදෙනෙක් ගමන් කරති. එකෙක් මිටිය. ඔහුගේ උරහිසෙහි එල්ලා ඇති ප්‍රංශ රයිපලයට සවිකොට ඇති බයිනෙත්තුව හිරු රැස් නිසා දිලිසෙයි. අනිකා දැවැන්තයෙකි. බැටළු හමින් කළ ඔහුගේ හිම කබාය කහ පැහැතිය. ලප සහිත අශ්වයාගේ බඳයට යම්තමින් වැදුණු පා පහර නිසා ඌ හැල්ම වේගවත් කළේය. ඉදිරියට එන සෙබළුන් වෙත අසරුවෝ ගියහ. රතු සෙබළා උරහිසෙහි ඇති තම තුවක්කුවේ පටිය ඇද, කටේ තිබුණු සිගරැට්ටුව හිම ගොඩට වීසි කොට කෙළ ගැසීය.

"ආයුබෝවන් සහෝදරයා! කොහොමද මේ කොටසේ වැඩ?" මෙසේ කී බැටැලියනයේ අණ දෙන්නා අතක් දිගු කළේය. යෝධ රතු සෙබළා තම අත්වැස්ම හණිකට ගලවා අතට අත දී ආචාර කළේය. යෝධ රතු සෙබළා කොතරම් විශාලද යත්, අණ දෙන්නාට ඔහුට අත දීම් වස් උඩු කය එතරම් නැවීමට පවා සිදු නොවීය.

පෝලන්ත සෙබළා ඈත සිට නිරීක්ෂණය කළේය. රතු හමුදාවේ නිලධාරියෝ දෙදෙනෙක් (රතු කොටු තුනක සලකුණ මේජර් ධුරය පෙන්වයි.) තම හිතවත් මිතුරකුට සේ

දේශ සීමා සෙබළාට ආචාර කරති. තමා, තම සේනාංකයේ මේජර් සක්ෂෙව්ස්කිට අත දුන්නොත් කුමක් වෙති දැයි පෝලන්ත සෙබළා කල්පනා කරයි. එම අදහස නිසා තැති ගත් ඔහු උරහිසට උඩින් බැලීය.

"අණ දෙන සහෝදරයා මේ දැන් තමා මුර කිරීම භාරගත්තේ"

"අර පෙනෙන පා සටහන් දුටුවාද?"

"නැහැ, තවම දුටුවේ නැහැ."

"ඊයේ රෑ දෙකේ සිට උදේ හය වන තුරු කවුද මුර කළේ"

"සුරොතෙන්කෝ, අණ දෙන සහෝදරයා."

"හොඳයි. ඇස් දෙකම ඇරගෙන බලාගෙන ඉන්න ඕන." ඉවත් වී යාමට සූදානම් වූ ගව්රිලොව් දැඩි ලෙස අනතුරු හැඟවීමක් කළේය.

"අරගොල්ල එක්ක ඇවිදීම අඩු කරනවා!"

දේශ සීමාවේ සිට බෙරෙස්දෙව් දක්වා වැටී ඇති පුළුල් මඟ ඔස්සේ හැල්මේ යන අසුන් පිට නැඟ සිටි අසරුවෝ කතා කළහ. දේශ සීමා බැටැලියනයේ අණ දෙන ගව්රිලොව් මෙසේ පැවසීය:

"දේශ සීමාවේ මුර කරන විට හොඳට බලන්ට ඕන. පොඩ්ඩක් එහෙම නිදගත්තොත් සෑහෙන පාඩු විඳින්නට සිදු වෙනවා. අපේ රස්සාව නිදිමැරීමයි. දවල් වෙලාවට දේශ සීමාව හරහා යාම ලේසි නැහැ. රෑට නම් සෑහෙන සුපරීක්ෂාකාරිත්වයකින් ඉන්ට ඕන. කොර්චාගින් සහෝදරයා ඔබම කල්පනා කර බලන්න. මට අයිති කොටසේ දේශ සීමා ගම් හතරක් මැදින් වැටිල තියෙනවා. මේ නිසා තත්ත්වය තවත් අමාරු වෙනවා. කොපමණ මුර සෙබළුන් දැම්මත්, හැම මඟුලකදීමත්, හැම උත්සවයකදීමත් ගම්වල නෑයො එකට එක්කහු වෙනවාමයි. එක් ගෙයක සිට අනික් ගෙය දක්වා ඇත්තේ අඩි කීපයක දුරක් විතරයි. දේශ සීමා ගඟ කොතරම් පටුද යත්, කුකුළෙකුට වුණත් එය හරහා යන්ට පුළුවනි. නීති විරෝධී ලෙස බඩු ගෙන යාම දිගටම කෙරෙනවා. මේ සියලු දේ සුළු දේ බව ඇත්ත. මැහැල්ලක් "සුබ්රෝව්කා" කසිප්පු බෝතල දෙකක් ගෙනෙන වෙලාවල් තියෙනවා. නමුත්, ඒ අතර, නීති විරෝධී ලෙස විශාල වශයෙන් හොර ජාවාරම් කරන අයත් ඉන්නවා. උන් ඒවාට විශාල වශයෙන් මුදල් යොදවනවා. පෝලන්තය කළ වැඩක් දන්නවද? දේශ සීමා ගම්වල ඕනෑම බඩුවක් මිල දී ගන්ට පුළුවන් විශාල කඩ

සාප්පු ඇරලා තියෙනවා. මේවා තමන්ගේ දුප්පත් ගොවීන් සඳහා නොවන බව සහතිකයි."

කොර්චාගින් ඉමහත් වුවමනාවකින් ඒ කතාව අසාගෙන සිටියේය. දේශ සීමාවේ ජීවිතය අවසානයක් නැති ඔත්තු බැලීමට සමානය.

"ගව්රිලොව් සහෝදරයා, සමහර විට බඩු නීති විරෝධී ලෙස එහා මෙහා ගෙන යනවාට වඩා තවත් දෙයක් තියෙන්ට පුළුවන් නේද?"

බැටැලියනයේ අණ දෙන්නා කනස්සල්ලකින් ඇසීය.

"අන්න ඒක තමා කාරණය!"

★

බෙරෙස්දෙව් කුඩා නගරයකි. ප්‍රත්‍යන්ත නගරයක් වූ මෙහි ඉස්සර යුදෙව්වෝ සම්ප්‍රදායානුකූලව වාසය කළහ. ගෙවල් දෙතුන් සීයක් මෙහි ඇත. එයද හිතූ හිතූ තැන සාදා ඇත්තේ ආවාට ගියාටය. විශාල වෙළඳ පොළකි. ඒ මැද කඩ සාප්පු විස්සක් පමණ තිබේ. වෙළඳපොළෙහි කුණු කසළ හා ගොම ගොඩකි. නගරය වටා ගොවි ගෙවල්ය. යුදෙව්වන්ගේ මධ්‍යම පෙදෙසේ සිට, මස් මඩුව දක්වා ඇති මඟෙහි යුදෙව් දේවස්ථානය හෙවත් සීනගෝගයයි. පැරැණි ගොඩනැඟිල්ලක් වූ එය දිරාපත් වී ඇත. සෙනසුරාද දවස්වල සීනගෝගය බැතිමතුන්ගෙන් පිරී ගියද, ඉස්සර මෙන් නොවේ. රබ්බි හෙවත් යුදෙව් පූජකයාගේ ජීවිතය ඔහු සතුටු කරන්නක් නෙවෙයි. එක්දහස් නවසිය දහහතේදී කිසියම් අයහපත් දෙයක් සිදුවී තිබෙන හැඩයි. මෙතරම් ඇත කුඩා නගරයක පවා තරුණයෝ පූජකයාට සැලකිය යුතු තරම් ගරු නොකිරීමට නිර්භය වී සිටිති. ඇත්ත තවමත් මහලු යුදෙව්වෝ 'දෙවියන්ගේ' ආශිර්වාදය ලැබූ ආහාර පමණක් ගනිති. එහෙත්, කොල්ලෝ කොතරම් විශාල සංඛ්‍යාවක් දෙවියන් විසින් ශාපකරන ලද ඌරු මස්වලින් සැදූ ලිංගුස් කතිද! ඒ ගැන සිතීම පවා සිත කලකිරවයි! කෑම සොයමින් කුණු ගොඩක් අවුස්සමින් සිටි ඌරකුට රබ්බි යුදෙව් පූජක බොරුක් පා පහරක් ගැසීය. බෙරෙස්දෙව් නගරය ප්‍රාදේශීය මධ්‍යස්ථානය කිරීම නිසා බොරුක් රබ්බි තැන කොහෙත්ම සතුටු නොවීය. යක්ෂයා පමණක් දන්නා කිසියම් තැනකින් මතු වූ මේ කොමියුනිස්ට්වරු හැම දෙයක්ම උඩු යටිකුරු කොට පෙරළති. දවස් පතාම ඔහුට අලුත්, අලුත් අසතුටක්

ගෙනදෙයි. ඊයේ පූජක නිවාසයේ වැටෙහි අලවා තිබුණු අලුත් දැන්වීමක් රබ්බී තැන දුටුවේය.

උක්රයිනයේ තරුණ කොමියුනිස්ට් සංගමයේ බෙරෙස්දෙව් ප්‍රාදේශීය කමිටුව.

මේ දැන්වීමෙන් යම් කිසි හොඳක් බලාපොරොත්තු විය නොහැකිය. මෙසේ සිතමින් ගිය රබ්බී තම සීනගෝගයේ අලවා තිබූ කුඩා දැන්වීම දකින තුරුම ඒ ගැන නොදැන සිටියේය.

"වැඩ කරන තරුණයන්ගේ ප්‍රසිද්ධ මහා සභා රැස්වීමක් අද සමාජශාලාවේදී පවත්වනු ලැබේ. කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපති ලසීට්සින් සහ කොම්සොමොල් දිස්ත්‍රික් කමිටුවේ වැඩ බලන ලේකම් කෝර්චාගින් කතා කරනු ඇත. නව අවුරුදු පාසලේ සිසුන්ගේ සහාය ඇතිව රැස්වීමෙන් පසු විවිධ ප්‍රසංගයක් පවත්වනු ලැබේ."

රබ්බී පූජක තැන දැන්වීම ඉරා දැමුවේ වියරු වූවකු මෙනි.

"ඔන්න පටන් ගන්නවා!"

විශාල වත්තක් මැද දේවස්ථානයකි. ඊට යාබද පැරැණි ගෙයකි.

එය පූජක නිවසය. මීට පෙර පූජකයා සහ ඔහුගේ බිරිඳ වාසය කළ එම නිවසේ කාමර, කාන්සිය මුසු වාතයෙන් පිරිලාය. ගෙය මෙන්ම පැරැණි, මහලු පූජකයා සහ ඔහුගේ බිරිඳ වූ මැහැල්ල එකිනෙකා නොරුස්සමින් එහි වාසය කළහ. මේ ගෙදරට පැමිණි අලුත් ස්වාමිවරුන් නිසා කාන්සිය වහාම අතුරුදහන් විය. ඉස්සර ගෙදර ස්වාමියාව සිටි පූජකයා ශාලාවේ අමුත්තන් පිළිගත්තේ මංගල දවස්වලදී පමණකි. දැන් නිතර එහි ජනයා පිරී සිටිති. පූජක නිවාසය බෙරෙස්දෙව් නගරයේ පක්ෂ කමිටුවේ කාර්යාලය බවට පත්විය. මැද ශාලාවේ දකුණුපස පිහිටි කුඩා කාමරයේ දොරවල රට හුනුවලින් 'කොම්සොමොල් දිස්ත්‍රික් කමිටුව' යන වචනය ලියා තිබිණි. බෙරෙස්දෙව් නගරයේ කොමියුනිස්ට් තරුණ සංගම් දිස්ත්‍රික් කමිටුවේ වැඩ බලන ලේකම් ධුරය සහ අනිවාර්ය යුද්ධාභ්‍යාස දෙවැනි බැටැලියන් හමුදාවේ අණ දෙන නිලධාරී ධුරය එකවර දැරූ පාවෙල් කෝර්චාගින් එම කාමරයේ දිනපතා පැය කීපයක් ගත කළේය.

ආන්නා බෝර්හාර්ට්ගේ නිවසේ සැන්දෑ උත්සවය පවත්වා මාස අටක් ගෙවිණි. එහෙත්, එය මෑත සිදු වූ දෙයක් ලෙස හැඟෙයි. ලිපි ගොනුව පසෙක තබා කෝර්චාගින් පුටු ඇන්දට

හේත්තු වී කල්පනා කරන්නට විය.

නිවස තුළ නිහඬතාවකි. රෑ බෝ වන විට, නිවස පාළු වෙයි. ප්‍රාදේශීය කොමියුනිස්ට් පක්ෂයේ ලේකම්වර ත්‍රපීමොව් ගෙදර ගොසිනි. කොර්චාගින් නිවසෙහි තනි වී ඇත. හිම තුෂාරය විසින් කවුළුවේ වීදුරුවල අපූරු සිත්තම් මවන ලදි. එහෙත් කාමරය තුළ උණුසුම්ය. මේසය මත භූමිතෙල් ලාම්පුවකි. කොර්චාගින් මෑත සිද්ධීන් සිහියට නඟා ගත්තේය. අගෝස්තු මාසයේදී වැඩපොළේ කොම්සොමොල් සංවිධානය විසින් ඔහු අලුත්වැඩියා කරන දුම්රියක සංවිධායකයා වශයෙන් යෙකතෙරීනොස්ලාව් නගරයට යවන ලදි. එකසිය පනහක් පමණ වූ පිරිසක් සමඟ ඔහු දුම්රිය ස්ථානයෙන්, ස්ථානයට යමින් යුද්ධය නිසා ඇති වූ විනාශය තුනී කිරීමට සහාය විය. අඩ වශයෙන් විනාශ වුණු හා පිලිස්සී ගිය දුම්රිය මැදිරි අලුත්වැඩියා කරමින් සහ ඉතිරි මැදිරි ශුද්ධ කරමින් දුම්රිය සේවයට විශාල සහායක් දුන්නේය. සිනේල්නිකොවෝ සිට පොලොග් දක්වා ඔවුහු මෙසේ ගියහ. ඉස්සර මෙහි රජකළ මහ්නෝ නමැති අරාජිකවාදී මිනීමරු හොරදෙටුවා විසින් ඇති කරන ලද විනාශයේ සහ සමූල ඝාතනයේ පා සටහන් හැම තැනම දකින්නට තිබිණි. ගුල්යායි පෝලේ නගරයේ දුම්රිය ස්ථානයේ ගඩොලින් සෑදූ ජල මාර්ග ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහාත්, ඩයිනමයිට් වෙඩි නිසා බිඳීගිය වතුර ටැන්කිය යකඩ තැටි දමා අලුත්වැඩියා කිරීම සඳහාත් සම්පූර්ණ සතියක් ගත කිරීමට ඔවුන්ට සිදුවිය. වෘත්තියෙන් විදුලි කාර්මික ශිල්පියෙකු වූ පාවෙල් කොර්චාගින් මිකැනික් කෙනෙකුගේ වැඩ මෙතරම් අසීරු බව නොදත්තේ, යතුරක් ගෙන මල කෑ යකඩ බෝල්ට් ඇණ දහස් ගණනක් සවි කළේය.

සරත් සමය අවසානයේදී මේ විශේෂ දුම්රිය සිය වැඩපොළට ළඟාවිය. වැඩ ශාලා විසින් මේ එකසිය පනස් දෙනා නැවත පිළිගන්නා ලදි.

ආන්නාගේ ගෙදරදී පාවෙල් නිතර දැකිය හැකි විය. ඔහුගේ නළලේ රැලි කෙමෙන් අතුරුදහන් වූ අතර, ඔහුගේ ප්‍රීතිමත් සිනා හඬ නිතර ඇසිණි.

ඉකුත් වූ අවුරුදුවලදී පැවැති සටහන් ගැනද, සාර් නමැති රකුසා ගොවීන්ගේ රුසියාව මත ඇති කළ පාලනය පෙරළා දැමීම් වස් ගෙන ගිය ජනතා සටන් ගැනද, ගොවි ජනතාවගේ නායකයන් වන ස්තෙපාන් රාසින් සහ පුගාචොව් සංවිධානය

කළ කැරැලි ගැනද පාවෙල් කළ කතා ඇසීමට ඔහුගේ දුම්රිය කම්කරු සගයෝ රැස්වූහ.

එක් දවසක සවස ආන්නාගේ නිවසේ තරුණයෝ බොහෝ දෙනෙක් රැස්වූහ. එදින පාවෙල් හිටිහැටියේම තමාට ඇබ්බැහිවුණු නරක පුරුද්දකින් ගැලවිණි. වයස අවුරුදු දහයේ සිට දුම්බීමට පුරුදු වූ ඔහු එදින දැඩි ලෙසත්, ස්ථිර ලෙසත් මෙසේ පැවසීය:

"මීට පස්සේ මම දුම් බොන්නෙ නැහැ." එය සිදු වූයේ හිටි හැටියේමය. මිනිහාට පුරුදු වන දේට ඔහු වහලකු වන්නේ යැයි කිසිවෙක් තර්ක කළහ. නිදසුනක් ලෙස ඔහු පෙන්වූයේ දුම් බීමය. රැස්වූවෝ දෙපැත්තට බෙදී තර්ක කළහ. පාවෙල් නිහඬව සිටියද තාල්යා ඔහු තර්කයට ඇද ගත්තාය. ඔහු සිතූ දේ පැවසීය.

"මිනිහා පුරුද්ද පාලනය කරයි. එහෙම නැතිනම් අපේ තත්ත්වය කුමක්ද?"

ස්වෙතායෙව් මුල්ලක සිට කෑ ගැසීය.

"වචන නම් හරි අගෙයි. කෝර්චාගින් කථාවට කියාපු පුතා. ඔහුගේ නුවණ ඔහු, තමාටම යොදවන්නේ නැත්තෙ මන්ද? ඔහු දුම් බොනවා. එය නරක පුරුද්දක් බව ඔහු දන්නවා. නමුත්, ඒ පුරුද්ද ඔහුට අතහරින්න බැහැ. ඔහු දුර්වල නිසා මේ ළඟදී ඔහු අධ්‍යාපන කවයේදී 'සංස්කෘතිය පැතිරවීම' ගැන දෙසා බෑවා. ස්වෙතායෙව් හඬ මාරු කරමින් සාවඥ ලෙස ප්‍රශ්න කළේය. "ඔහු පාවිච්චි කරන කැත වචන සහිත බස ගැන ඔහු කියන්නෙ මොනවාද? පාවෙල් ගැන දන්නා අය, දන්නා කරුණක් තියෙනවා. ඔහු අම්මා මතක් කොට බැණ වදින්නේ ඉඳහිටලා. හැබැයි බණින විට සෑහෙන්න බණිනවා. මුනිවරයකු වෙනවාට වඩා ලේසියි දෙවියන් යැදීම."

නිහඬතාවකි. ස්වේතායෙව්ගේ තියුණු බස හැම දෙනෙකු කෙරෙහිම බලපෑවේය. පාවෙල් පිළිතුරු දීමට ඉදිරිපත් වූයේ එක වර නොවේ. ඔහු තම කටේ තිබූ සිගරැට්ටුව සෙමින් ඉවතට ගෙන මෙසේ පැවසීය:

"මම මීට පස්සෙ දුම් බොන්නෙ නැහැ."

"මෙය මා කරන්නෙ මා වෙනුවෙන් සහ තරමක් දීම්කා වෙනුවෙන්. නරක පුරුදුවලින් මිදෙන්නට බැරි මිනිහා තඹයක් වටින්නෙ නැහැ. නරක වචන පාවිච්චි කිරීම මගේ දුර්වලකමක්. ඒ නින්දා සහගත දුර්වලකම නැති කිරීමට මම

උත්සාහ කරනවා. සහෝදරවරුනි, දුම් බීම නැවැත්වීමට වඩා අමාරුයි නරක වචනයක් කටින් පිටවීම වැළැක්වීම. එය සදහටම අතහැර දැම්මයි කීමට මම දැනට ඉදිරිපත් වෙන්නේ නැහැ. නමුත්, කැත වචන පාවිච්චි කිරීම නවත්වනවා."

★

හිම කාලය පටන් ගන්න ඔන්න මෙන්න කියා තිබියදී දැව දඬු නිසා ගඟ පිරී අවහිර විය. සරත් සමයේ ගංවතුර නිසා අත්‍යවශ්‍ය තාපන ද්‍රව්‍යයක් වන දර ගඟ පහළට ගසාගෙන ගියේය. දැව දඬු බේරාගැනීම සඳහා සලෝමින්කා සංවිධානය නැවත තරුණ කණ්ඩායම් යැවීය.

සහෝදරවරුන්ගෙන් වෙන්වීමට අකැමැති වූ කොර්චාගින් තමාට වැලඳී ඇති බරපතළ සෙම්ප්‍රතිශ්‍යා රෝගය සැඟවීය. සතියකට පසු ගඟේ පාවී ගිය දැව දඬු ඉවුරේ ගොඩ ගැසූ පසු අයිස් කැට වැනි ශීතල වතුර සහ සරත් සමයේ දැඩි ශීතල විසින් ඔහුගේ සිරුර තුළ සැඟවී සිටි රෝග බීජ නමැති සතුරා අවදි කරන ලදින්, කොර්චාගින් උණ රෝග යට භාජනය විය. සති දෙකක්ම උග්‍ර රක්තවාතයෙන් ඔහු පෙළුණේය. රෝහලෙන් පැමිණි කොර්චාගින්ට දඬුඅඬුව ළඟ වැඩ කිරීමට හැකි වූයේ දෙපා පුළුල් කරගෙන බංකුව මත වාඩිවෙමිනි. ශිල්පියා ඔහු දෙස බලා හිස වැනීය. ඊට දවස් කීපයකට පසු වෛද්‍ය මණ්ඩලය ඔහු පිරික්සා බලා ඔහු වැඩට නුසුදුසු බව තීරණය කළේය. ඔහු සේවයෙන් අස්කළ අතර, ඔහුට විශ්‍රාම වැටුප් ගෙවීමට නියමවිණි. පාවෙල් කෝපයෙන් විශ්‍රාම වැටුප් ප්‍රතික්ෂේප කළේය.

ඔහු දුම්රිය කම්හලේ අලුත්වැඩියා කරන වැඩපොළෙන් ඉවත් වූයේ දුකින් පිරි හදවතකිනි. ඔහු සැරයටියක ආධාරයෙන් හෙමින් ගමන් කළේය. හැම පියවරක් පාසාම ඔහුට දැඩි වේදනාවක් ගෙන දිණි. ගෙදර එන ලෙස ඉල්ලා අම්මා ලියුම් කීපයක්ම එව්වාය. අම්මා ගැන සිතන හැම වාරයකදීම පාවෙල්ට ඇගේ කියමනක් මතක් විය. "නුඹ අබ්බගාතයෙක් නූණොත්, නුඹව කිසි දිනෙක මට දකින්නට ලැබෙන්නෙ නැහැ."

ගුබේර්නියා කමිටුවේදී ඔහුට ඔහුගේ පක්ෂයේ සාමාජික කාඩ්පත සහ කොම්සොමොල් කාඩ්පත ලැබිණි. කනගාටුව වැඩි නොකරනු වස් කිසිවකුට ආයුබෝවන් නොකියා ඔහු මවු බැලීමට ගියේය. සති දෙකක් තිස්සේ පාවෙල්ගේ මහලු

මවු තම පුතාගේ ඉදිමුණු කකුල් උණු වතුරෙන් සෝදා සාත්තු කළාය. ඔහුට නැවත සැරයටිය නැතිව ගමන් කිරීමට හැකි වූයෙන් ඔහුගේ ප්‍රීතිය නිම්හිම් නැති විය. අඳුර පහවී හිරු එළිය උදාවිය. ඔහු නැවත ගුබේර්නියාවේ මධ්‍යස්ථානයට පැමිණියේය. දවස් තුනකට පසු සංවිධායක අංශය විසින් ඔහු යුධ අංශයට යවන ලද්දේ දේශපාලන කාඩර්ස් කෙනෙකු වශයෙන් ඔහුගෙන් ප්‍රයෝජන ගැනීම පිණිසය.

සතියක් ඉකුත් වෙත්ම, හිමෙන් පිරි කුඩා නගරයකට පාවෙල් කෝර්චාගින් පැමිණියේ දෙවැනි බැටැලියන් හමුදාවේ යුද්ධ කොමිසාර් වශයෙනි. තැනින් තැන විසිරී සිටින කොම්සොමොල් තරුණ සාමාජිකයන් එක්රැස් කොට අලුත් පෙදෙසේ තරුණ සංවිධානයක් සෑදීමේ කාර්යය ප්‍රාදේශීය කොම්සොමොල් කමිටුව විසින් ඔහුට පවරන ලදි. ජීවිතය නව අවධියකට එළඹිණි.

★

එළිමහනේ දැඩි උණුසුමකි. කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපතිගේ කාර්යාල කාමරයේ විවෘතව ඇති කවුළුවට චෙරි ගසක අත්තක් එබිකම් කරයි. පාරෙන් එපිට පිහිටි ගොතික් නිර්මාණ ශිල්පය අනුව සෑදූ පෝලන්ත කතෝලික දෙව් මැදුරේ සීනු කණුව මුඳුනේ ඇති රන් පැහැති කුරුසිය හිරු එළිය නිසා දිලිසෙයි. කෘත්‍යාධිකාරී කමිටුවට අයත් කාර්යාල වත්තේ තණ මෙන්ම, කොළ පැහැති තාරා පැටව් කෑම සොයමින් ඇවිදිති.

කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපතිවරයා තමාට ලැබුණු වාර්තාවක් කියවා අවසන් කළේ මේ දැන්ය. ඔහුගේ මුහුණට සෙවණැල්ලක් වැටුණු කලෙක මෙන්, එය කළු පැහැවිය. කරගැට සහිත ඔහුගේ විශාල අතක් කෙස් කැරැලි සහිත හිසකේ අත ගාන්නට වූයේය.

කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපති නිකොලායි නිකොලායෙවිච් ලිසීට්සින්ගේ වයස අවුරුදු විසි තුනකි. එහෙත්, ඔහු සමඟ වැඩ කරන සගයෝ හෝ පක්ෂයේ සහෝදරවරු හෝ ඒ ගැන නොදනිති. ඔහු විශාලය. ශක්තිමත්ය. ඔහුගේ බාහිර පෙනුම දැඩිය. බිය ගෙන දෙනසුලුය. අවුරුදු තිස්පහක් වයසැති මිනිසකු මෙනි. ඔහුගේ ශරීරය ශක්තිමත්ය. විශාල හිස යෝධමය ගෙල මත පිහිටා ඇත. දුඹුරු පැහැති ඇස් විනිවිද යනසුලුය. නිකට

ශක්තිමත්ය. ඔහු නිල් පැහැති කලිසමක්ද, තරමක් ගෙවී ගිය දුඹුරු පැහැති කබායක්ද, ඇඳ සිටියේය. ඔහුගේ පපුවේ වම් පස රතු ධජයේ පදක්කම පැලඳ තිබිණි.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පෙර ලිසීට්සින් තුලා නගරයේ යුද්ධායුධ සාදන ලියවන පට්ටලයක වැඩ කළේය. ඔහුගේ සීයාද, තාත්තාද ඔහුද කුඩා කල සිටම මේ කම්හලේ ලෝහ කම්කරුවෝ වූහ.

සරත් සමයේ ඔක්තෝබරයේ එදින රැයෙහි අවි සාදන කම්කරුවකු වූ ඔහු, තුවක්කුවත් රැගෙන කම්කරුවන්ගේ බලය සඳහා සටන් කිරීමට ගියෙන් ඔහු කුණාටුවකට මූණ පෑවේය. විප්ලවය හා පක්ෂය විසින් ඔහු එක් තැනක සිට තවත් තැනකට යවන ලදි. තුලා අවි කම්හලේ අවි සාදන්නකු වූ නිකොලායි ලිසීට්සින් රතු හමුදා සෙබළාගේ සිට අණ දෙන්නා දක්වාද, රෙජිමේන්තුවේ කොමිසාර් දක්වාද ඉහළ නැංගේය.

යුද ගිනි හා කාලතුවක්කු හඬ අතීතයට වැදිණි. දැන් නිකොලායි ලීසීට්සින් දේශ සීමාවේ සේවය කරයි. මෙහි ජීවිතය සාමකාමීය. කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපතිවරයා වූ ඔහු අස්වැන්න පිළිබඳ වාර්තා කියවමින් උදේ සිට රෑ වන තුරු කාර්යාලයේ වැඩ කරයි. දැන් ඔහු කියවන වාර්තා නිසා මෑත අතීතය යළි මතක පටයට පිවිසියේය. එම වාර්තාව විදුලි පණිවුඩවල මසුරු බසින් අනතුරු හැඟවීමක් කරයි.

"සම්පූර්ණ රහස් වාර්තාවකි. බෙරෙස්දෙව් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සභාපති ලිසීට්සින් වෙතටයි.

දේශසීමා දිස්ත්‍රික්කවල වැසියන් බියගැන්වීම සඳහා පෝලන්තය විශාල හොරමුළක් එවීමේ සූදානමක් පවතී. අවශ්‍ය සියලු පියවර වහාම ගන්න. අයබදු ඇතුළුව, මුදල් අංශයේ ඇති වටිනා හැම දෙයක්ම මධ්‍යස්ථානයට යවන ලෙස යෝජනා කරමු."

තම කාර්යාල කාමරයේ කවුළුවෙන් බලන ලිසීට්සින්ට කෘත්‍යාධිකාරී කමිටුවේ ගොඩනැඟිල්ලට ඇතුළුවන හැම කෙනෙකුම පෙනේ. කොර්චාගින් ආලින්දයට පැමිණියේය. විනාඩියකින් ඔහුගේ දොරට කොර්චාගින් තට්ටු කළේය.

"වාඩිවෙයන්. කතා කරන්නට ඕන." ලිසීට්සින්, කොර්චාගින් අත ගෙන ආචාර කරයි.

පැයක් තිස්සේ කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපතිවරයා අමුත්තන් පිළිනොගත්තේය.

කොර්චාගින් සභාපතිගේ කාර්යාල කාමරයෙන් පිටවී යන විට, දවල් දොළහ පසුවී තිබිණි. ලිසීට්සින්ගේ පිංචි නංගී වන න්යූරා වත්තේ සිට දුව ආවාය. පාවෙල් ඇය ඇමතුවේ අන්යුට්කා නමිනි. නිතර ලැජ්ජාවන ඈ වයසට වඩා බැරෑරුම් ගතියක් පෑවාය. ඈ දැන් පාවෙල් හමුවූවා, ආචාරශීලී ලෙස මඳ සිනා පාන්නී, කුඩා දැරියක සේ කොටට කැපූ හිසකේ කැරැල්ලක් පිටුපසට යවමින් මඳ සිනා පෑවාය.

"කෝල්යා ළඟ කවුරුත් නැත්ද? මරියා මිහයිලොව්නා දවල් කෑමට අයියා එනතුරු බලාගෙන ඉන්නවා. බොහෝ වේලාවක් ඉඳලා."

"අන්යූටා, උඹ තනිවම, පලයන්."

ඊළඟ දවසේදී අරුණෝදයටත් කලින් ශක්තිමත් අසුන් සහිත ගැල් තුනක් කෘත්‍යාධිකාරී කමිටුවේ කාර්යාලය අසල නවත්වන ලදි. එහි වූ මිනිස්සු සෙමින් කතා කළහ. මුදල් අංශයේ සිට සීල් තැබූ මලු කීපයක් ගැල්වලට පැටවීය. විනාඩි කීපයක් ගතවෙත්ම රෝද ගැටෙන ශබ්දය ඇසිණි. ගැල්වල ආරක්ෂාව සඳහා කොර්චාගින්ගේ නායකත්වය යටතේ අසරු සෙබළු ගමන් ගත්හ. යා යුතු දුර ප්‍රමාණය කිලෝමීටර් හතළිහකි. (ඉන් විස්සක්ම කැලෑව හරහා යා යුතුය.) මුදල් හා සියලු වස්තුව ප්‍රාදේශීය කමිටුවේ මුදල් අංශයට භාර දුන්නේය.

ඊට දවස් කීපයකට පසු දේශ සීමාවේ සිට බෙරෙස්දෙව්වලට අසරුවෙක් පැමිණියේය. ඔහු වීදිවල යන විට, නගරවැසියෝ ඔහු දෙස පුදුමව බැලූහ.

කෘත්‍යාධිකාරී කමිටුවේ වැට කඩුල්ල අසලදී අසරුවා බිමට පැන්නේය. එක් අතකින් කඩුවක් ගත් ඔහු සපත්තු හඬ නංවමින්, පඩිපෙළ නැංගේය. ලිසීට්සින් බැම සඟළ හකුළුවා ගනිමින් ඔහු ගෙනා ලියුම් කවරය භාරගෙන අත්සන් කළේය. අසුට විඩාහැරීමට පවා ඉඩක් නොතබා දේශ සීමා අසරු සෙබළා ආපසු අසු පැන්නීය.

ලියුමේ ඇති කරුණු එය ලැබුණු කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපති ලිසීට්සින් හැර කිසිවෙක් නොදත්හ. එහෙත්, නගරයේ සාමාන්‍ය මිනිසුන්ට අපූරු ඉවක් ඇත. මෙහි කුඩා කඩ අයිතිකරුවන් තුන්දෙනෙකුගෙන් දෙදෙනෙක්ම නීති විරෝධී ලෙස ගෙනෙන හොර බඩු ජාවාරම් කරන්නෝය. මේ වෘත්තීය නිසා ඔවුහු අවදානම දැන ගැනීමේ අපූරු ඉවක් වර්ධනය කර ගත්තෝ වූහ.

යුද්ධාභ්‍යාස බැටැලියන් හමුදාවේ කාර්යාලයට යන පදික වේදිකාව දිගේ දෙදෙනෙක් ගමන් කළහ. එකෙක් පාවෙල් කොර්චාගින්ය. නිතර තුවක්කුවක් ගෙන යන ඔහු නගරවැසියෝ දැන සිටියහ. අනිකා පක්ෂ කමිටුවේ ලේකම්වර ත්‍රපීමොව්ය. ඔහුගේ උරපටියක පිස්තෝලයක් එල්ලා ඇත. එය අයහපත් ලක්ෂණයකි.

විනාඩි කීපයකට පසු, සෙබළු පහළොස් දෙනෙක් පමණ බයිනෙත්තු සවි කළ රයිපල් තුවක්කු රැගෙන ඉක්මනින් ගොස් මංසන්ධියේ ඇති පිටිමෝලට වැදුණාහ. කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයන්ට සහ කොම්සොමොල් තරුණ සංවිධානයේ සාමාජිකයන්ට පක්ෂ කමිටු කාර්යාලයේදී අවි බෙදා දුන්නේය. කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපතිවරයා කුබාන් තොප්පියක් හිස දමාගෙන පුරුදු 'මවුසර්' පිස්තෝලයද රැගෙන අසකු පිට නැඟ උඟ පැන්නීය. යම් කිසි අයහපතක් සිදු වී ඇති බව පැහැදිලිය. විශාල චතුරශ්‍රයද, පටු මාවත්ද ජනයා රහිතව පාළු විය. එකද මිනිසෙක්වත් නැත. නිමේෂයකින් කුඩා කඩවල්වල දොරවල් වසා ඒවාට මැද යුගයේ විශාල යතුරු ඉබ්බන් දැමිණි. සියලු දොර කවුළු වැසිණි. බය නැති කුකුළෝ සහ අව්ව නිසා පීඩා විඳි ඌරෝ කසළ ගොඩවල් අවුස්සමින් කෑ කෝ ගැසූහ.

නගර කෙළවරේ වතුවල මුර කපොලු සැදුවේය. එතැන සිට සමතලා බිම පටන් ගැනෙයි. දිගැති මඟ හොඳට පෙනෙයි.

ලිසීට්සින්ට ලැබුණු ලියුමේ වචන කීපයකි.

"පොද්දුබ්ත්සි පෙදෙසේදී ඊයේ රෑ අසරු භටයන් සිය දෙනෙකුගෙන් පමණ යුත් පල්හොරු කණ්ඩායමක් සටන් කරමින් සෝවියට් දේශ සීමාවට කඩා වැදුණාහ. අත් මැෂින් තුවක්කු දෙකක්ද ඔවුන් සතුව ඇත. වහාම සුදුසු පියවර ගන්න. ස්ලවූතා කැලෑව අසලදී ඔවුන්ගේ පා සටහන් මැකී ගොසිනි. දහවල් කාලයේදී පල්හොරුන් ලුහු බඳිමින් රතු කොසාක් හමුදාවක් බෙරෙස්දෙව් හරහා යනු ඇත. ඔවුන් සතුරන් යැයි වරදවා නොගන්න. මීට දේශ සීමා බැටැලියනයේ අණ දෙන නිලධාරී ගව්රිලොව්."

පැයකට පමණ පසු නගරය දක්වා වැටී ඇති මාවතේ අසරු සෙබළෙකු එන හැටි පෙනිණි. ඔහු පිටුපසින් තවත් අසරුවන් කණ්ඩායමකි. කොර්චාගින් ඉතා විමසිල්ලෙන් ඉදිරියට එන අසරුවන් දෙස බලා සිටියේය. අසරු සෙබළා

ප්‍රවේසමින් අසු පැන්නුවද වත්තේ ඇති මුර කපොලු නොදිටීය. රතු කොසාක් හමුදාවේ හත්වෙනි රෙජිමේන්තුවේ තරුණ අසරුවෙකි ඔහු. ඔත්තු බැලීමේ නවකයකු වූ ඔහු වත්තේ කඳවුරු ලා සිටි මුර භටයන් විසින් වටකරනු ලැබූ විට, ලැජ්ජාශීලීව මඳ සිනා පෑවේ මුර භටයන්ගේ කබාවල කොමියුනිස්ට් තරුණ සමිතියේ පදක්කම් දුටු බැවිනි. කෙටි සාකච්ඡාවකින් පසුව ඔහු තම අසු හරවාගෙන කොසාක් අසරු සෙබළ මුළ වෙත ගියේය. කොසාක් රතු හමුදාවට මුර කපොල්ල හරහා යාමට ඉඩ දෙන ලදි. මුරභටයෝ නැවත වත්තේ පඳුරුවල සැඟවී ගත්හ.

නොසන්සුන්ව දවස් කීපයක් ගෙවිණි. පල්හොරුන්ගේ තැත අසාර්ථක වූ බව දැන්වෙන පුවතක් ලිසීට්සින්ට ලැබිණි. රතු අසරු හමුදාව විසින් ලුහුබඳිනු ලැබූ පල්හොරු පෝලන්ත දේශ සීමාව දක්වා පසු බැස ගියහ.

බොල්ෂෙවික්වාදීන් අතළොස්සක්, සංඛ්‍යාවෙන් දහනවදෙනෙක් ප්‍රදේශයේ සෝවියට් ජීවිතය ගොඩ නැඟීම සඳහා වෙහෙස නොබලා වැඩ කළහ. නොබෝද සංවිධානය කළ අලුත් පෙදෙස් හැම දෙයක්ම නැවත ගොඩනැඟිය යුතු විය. දේශ සීමාව ළංවීම නිසා හැම දෙනෙක්ම සුපරීක්ෂාකාරීව සිටියහ.

සෝවියට් සභාවට නියෝජිතයන් තෝරා පත් කිරීම සඳහා යළි මැතිවරණයක් පැවැත්වීමද, පල්හොරුන්ට විරුද්ධව සටන් කිරීමද, සංස්කෘතික වැඩ කිරීමද, නීති විරෝධී ලෙස බඩු ගෙන යන්නවුනට විරුද්ධව සටන් කිරීමද, යුද්ධ දේශපාලන සහ කොමියුනිස්ට් තරුණ සමිති වැඩද යන මේ සියලු ක්‍රියා ලිසීට්සින්, ත්‍රපීමොව් සහ කොර්චාගින් ප්‍රමුඛ ක්‍රියාශීලීන් විසින් කරනු ලැබූහ. උදේ සිට රෑ බෝ වන තෙක් ඔවුහු මේ වැඩවල යෙදී සිටියහ.

අසුගේ සැදෑලයේ සිට ලියන මේසය දක්වාද, යුද්ධාභ්‍යාසයේ යෙදී සිටින නවකයන්ගේ සරඹ භූමියටද, සමාජ ශාලාවටද, පාසලටද, රැස්වීම් දෙක තුනකට සහභාගි වීමද, රෑ වූ පසු මවුසර් පිස්තෝලය රැගෙන අසු පිටින් යාමද, 'නවතිනු, යන්නේ කවුද?' ආදී ප්‍රශ්න ඇසීමද, නීති විරෝධී ලෙස බඩු පටවාගත් ගැල්වල රෝද ගැටෙන හඬ අසා සිටීමද, ආදී මේවා සියල්ලම අංක දෙක දරන බැටෑලියන් හමුදාවේ යුද්ධ කොමිසාර්ගේ දිනචරියාව විය.

කොම්සොමොල් ප්‍රාදේශීය කමිටුව කොර්චාගින්, වොල්ගාහි

සිට පැමිණි කාන්තා අංශයේ ලිඩා පොලෙව්ක්, මෑතක් වනතුරු විදුහලක උගත් උසැති, කඩවසම් තරුණයකු වූ ෂේන්කා රස්වලීහින් යන තිදෙනාගෙන් යුක්ත විය. සිත් කාවදින ත්‍රාසජනක ක්‍රියා ගැන විශාල ආසාවක් දැක්වූ රස්වලීහින්, ෂර්ලොක් හෝම්ස් සහ ලුවි බුසෙනාර් ගැන විශේෂඥයෙක් විය. කොමියුනිස්ට් පක්ෂයේ දිස්ත්‍රික් කමිටුවේ කාර්යාල කළමනාකරුවකු වූ රස්වලීහින්, කොම්සොමොල් තරුණ සංගමයට බැඳුණේ මීට හාර මසකට උඩදීය. එහෙත්, ඔහු කොම්සොමොල් සාමාජිකයන් අතර 'පැරණි බෝල්ෂෙවික්වාදියකු' ලෙස රඟපෑවේය. බෙරෙස්දෙව් නගරයට යැවීම සඳහා කිසිවකු සිටියේ නැති බැවින් රස්වලීහින් 'දේශපාලන අධ්‍යාපනාංශයේ' වැඩට තෝරා යැවීය.

★

හිරු මුදුන් විය. හැමතැනම දැඩි හිරු තාපය නිසා මිනිස්සු හා සජීව වස්තු සෙවණ සෙවූහ. බල්ලෝ පවා මඩු යටට රිංගා ගෙන හතිලමින්, කම්මැළිව නිදිමතින් සිටියහ. ගම අතහැර හැම සජීව වස්තුවක්ම පලා ගිය බවකි. ළිඳ අසල මඩ ගොඩක ලගිමින් හඬ නඟන ඌරකු පමණක් ගමේ එකම පණැති වස්තුව විය. කොර්චාගින් අසුගේ පටිය ලිහා දණහිසින් ඇති වූ වේදනාව නිසා යටි තොල සපා ගනිමින් සැදෑලයට නැඟ ගත්තේය. ගුරුවරිය පාසලේ පඩියක් මත සිටගෙන හිරු රැසින් ආරක්ෂා වනු වස් දෑතින් මුහුණ වසා ගත්තාය.

"යුද කොමිසාර් සහෝදරයා, නැවත හමුවන තුරු අයුබෝවන්!" ඈ මඳහස පෑවාය.

"රකීතිනා සහෝදරිය, එහෙනම් අපි තීරණය කර ගත්තා. ඔබ හෙට පළමුවැනි පාඩම මෙහෙයවන්න."

අශ්වයා ලණු ලිහිල් කළ බව දැන ගෙන හැල්මේ යන්නට විය. කොර්චාගින්ට කිසිවකුගේ වැලපීම් ඇසෙන්නට විය. ගමේ ගිනි ඇවිළීම් ඇති වූ විට ගැහැනු එසේ විලාප නඟති. අසු හැරවූ විට, හතිලමින් ගම දෙසට දුවන තරුණ ගෙවිලියක් කොර්චාගින්ගේ නෙතට හසුවිය. රකීතිනා වීදිය මැදට පැන ඇය අල්ලා ගත්තාය. අසල වූ ගෙවල්වල සිටි අය - මින් වැඩිදෙනා මහල්ලෝ වූහ - මහපාර දෙස බලා සිටියහ. තරුණයෝ හා මැදවියෙහි පසුවූවෝ ගොවිතැනට ගොසින් සිටියහ.

"අනේ සැදැහැවත්නි, ඉක්මනට වරෙල්ලා. එතැන ඇන කොටා ගන්නවා. අනේ අම්මේ ඇගේ ලේ වතුර වෙලා!"

කොර්චාගින් ඇය ළඟට අසු පන්නත්ම වටින් පිටින් මිනිස්සු එළියට ආහ. ඇගේ සුදු පැහැති හැට්ට අත අදිමින්, බියමුසු ප්‍රශ්න ඇසුවෝය. එහෙත්, ඇගේ කතාව එකිනෙකට අසම්බන්ධ නිසා කිසිවක් වටහා ගැනීමට බැරිවිය. "මැරුවා! කපා දැම්මා!" කියමින් ඈ කෑ ගැසුවාය. යටි රැවුළක් ඇති මහල්ලෙක් තම කලිසම අතකින් අල්ලා ගනිමින් ගෙවිලිය ළඟට විත් කෑගැසීය.

"පිස්සු ගෑනියේ කෑගහන්න එපා! කොහෙද ගහන්නේ? මොකටද ගහන්නේ? කෑ නොගහා කාරණය ගැන කියපන්! තූඃ! යකින්න!"

"අපේ ගම්හු පද්දුබිට්සිවලින් ආ අය සමඟ ඇන කොටා ගන්නවා.... ආයෙමත් මාඉම හන්ද! අපේ අයව මරනවා!"

විපත ගැන හැම දෙනෙක්ම වටහා ගත්හ. මහ පාරේ ගැහැනු වියරු ලෙස කෑ ගැසූහ. මහල්ලෝ කෝප වී හඬ නැගූහ. ගම හැමතැනම දුවමින් අනතුරු හඟවා සටනට කැඳවූහඃ "පද්දුබිට්ස්වල එවුන් ගමේ මාඉම හන්ද අපේ එවුන්ව දෑකැතිවලින් කපනවා." මහ මඟට බසින්න පුළුවන් හැම එකෙක්මත්, එකියක්මත් කැති, පොරෝ, උදලු, උල්, රිටි ආදිය රැගෙන ගම්මු දෙකට බෙදී මාඉම සඳහා කරන මාරාන්තික වාර්ෂික සටනට එක්වීමට දුව ගියහ.

කොර්චාගින් කොතරම් වේගයෙන් අසුට පහර දුන්නේද යත්, ඌ දුවන්නට පටන් ගත්තේය. අශ්වයා දුවන ගම්මුන් පසු කරමින් එක පිම්මට දුවන අතර ගම්මුන් කෑ ගසන හඬ දැන් පසු පසින් ඇසෙයි. ඌ දෙකන් හිස දෙසට ඇදගෙන සතර පා ඉහළට ඔසවමින් වේගය තව තවත් වැඩි කළේය. කුඩා කන්දක හුළං මෝලක් සිය අවර පෙති දිග හැර සිටියේ පාර හරස් කරන්නට මෙනි. දකුණු පසින් ගං ඉවුර අසල තණ බිම්ය. වම් පසින් ඈත ක්ෂිතිජය දක්වා රයි නමැති ධාන්‍ය කුඹුරුය. ඒවා ළා රත් පැහැයෙන් දිලිසේ. අදිසි අතකින් පිරිමදින්නාක් මෙන්, සුළං පහරට පැසුණු කරල් වැනෙයි. පාර දෙපස වැවී ඇති පොපි මල් රත් පැහැතිය. මෙහි නිසලතාවකි. හිරු තාපය ඉතා දැඩිය. හිරු රැස් නිසා රිදී කඳක් මෙන් දිලිසෙන නදී ජලය බැස යයි. එතන, ඈත සිට මාඉම් බෙදා ගැනීමේ සටන ඇවිළ පවතින යුද බිමෙන් විලාප හඬ ඇසෙයි.

අශ්වයා තණ බිම දක්වා වූ පල්ලම ඔස්සේ දිව්වේය. " අශ්වයාගේ පය පැටලුණොත් උඹත් මාත් දෙන්නම ඉවරයි." පාවෙල්ට හදිසියේම සිතිණි. එහෙත්, වේගයෙන් දුවන උඹ නැවැත්වීම දැන් කළ නොහැකිය. උගේ බෙල්ලට උඩු කය ළං කළ පාවෙල්, උගේ කන් සිපගන්නා සුළං හඬ නඟන සැටි ඇසීය.

පාවෙල් කොර්චාගින් තණ පිටියට අසු පැන්නුවේ විදුලිය වේගයෙනි. ගම්මු මුග්ධ, මෘගයන් සේ මෙතැන ඇන කොටා ගත්හ. ලේ පෙරාගත් ගම්මු කීපදෙනෙක් ලේ වගුරුවමින් බිම වැතිර සිටියහ.

අසුගේ පපුවට හැප්පුණු දිග මිටක් සහිත දෑකැත්තක් ගත් රැවුලෙක් බිම ඇද වැටුණේය. ඔහු මොහොතකට පෙර තුවාල වූ මුහුණක් ඇති තරුණයකු ලුහුබඳිමින් දිව්වේය. හිරු රැස් නිසා දුඹුරු පැහැති සමක් ඇතිව සිටි යෝධමය ගොවියෙක් බිම වැටී සිටි තම සතුරාගේ යටි බඩට සපත්තු පහරක් ගැසීය.

ඇනකොටා ගන්නා පිරිස මැදට වේගයෙන් අසු පැන්නූ කොර්චාගින් ඔවුන් විසුරුවා හැරීය. අසු දැකීම නිසා මවිත වූවන්ට යළි ප්‍රකෘති සිහිය ලැබීමට පෙර ඔහු මිනිසුන් වෙත අසු පැන්නුවේ, මෘගයන් සේ පොර කන පිරිස විසුරුවා හැරිය හැක්කේ ඔවුන් බිය කිරීමෙන් බව වටහා ගැනීමෙනි.

"නීචයනි විසිර පලයව්! නැතිනම් තොපට වෙඩි තියනවා!"

ඔහු මවුසරය අතට ගෙන කෝපය නිසා විකෘති වූ මුහුණක් ඇති එකකුගේ හිසට උඩින් වෙඩි තැබීය. පිරිස දෙසට නැවත අසු පැන්නීමද, යළිත් අහසට වෙඩි තැබීමද නිසා ඇන කොටා ගත් සමහරු දෑකැති බිම දමා පසු බැස්සාහ. වට රවුමට අසු පන්නමින් අහසට වෙඩි තබමින් යුද කොමිසාර් පාවෙල් කොර්චාගින් හැසිරුණු නිසා කෝලාහලය සංසිඳවීමට ඔහු සමත් විය. අසකු පිට නැඟගෙන මහ හඬින් කෑගසන, ඉමක් නැතිව වෙඩි තබන මේ මිනිහා ඉදිරියේ වගකීමට සිදුවෙතියි බිය වූ ගොවියෝ දෑකැති, පොලු, මුගරු ආදිය බිම දමා පසු බැස විසිර ගියහ.

ඉක්මනින්ම පද්දුබිට්සිවල ගොවියෝ ප්‍රාදේශිය අධිකරණය ඉදිරියේ පෙනී සිටියහ. මහජන විනිසුරු බොහෝ වේලාවක් සාක්ෂිකරුවන්ගෙන් කරුණු ඇසුවද වරදකරුවන් සොයා ගත නොහැකි විය. මේ කෝලාහලය නිසා කිසිවකු නොමැරිණි. තුවාල ලැබූ අයද පසුව සුවය ලැබූහ. ඔවුන්ගේ ඇන කොටා ගැනීම් කොතරම් වනචාරි මෘග ක්‍රියාවක් දැයි බුම්මාගෙන

සිටි ගොවීන්ට වටහා දීමට දීර්ඝ වේලාවක් කතා කළ බෝල්ෂෙවික්වාදී විනිසුරුතුමා එවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියා නීති විරෝධී බව දන්වා සිටියේය.

"නඩුකාර සහෝදරයා! වැරැදිකාරයා ඉඩම් මායිමයි. මේ ඉඩම්වල මායිම් පැටලිලා, මේ නිසා හැම අවුරුද්දෙම ඇන කොටා ගන්නවා." ගොවියෝ පැවසූහ.

කෙසේ වුවද සමහර ගොවීන්ට වග උත්තර කීමට සිදු විය.

සතියකට පසු පිදුරුවලින් වැසී ඇති කුඹුරුවලට පැමිණි කොමිසන් මණ්ඩලයක් විවාදයට භාජන වී ඇති මායිම් ඔස්සේ වැටවල් ගැසීය. හිරු රැස් නිසා පීඩා විඳිමින්ද, බොහෝ දුර ඇවිදීම නිසා විඩාපත් වීද සිටි මහලු මිනින්දෝරු තැන, වටකුරු උපකරණයක් කරකවමින් කෝර්චාගින් ඇමතීය.

"අවුරුදු තිහක් තිස්සේ ඉඩම් මනිනවා. හැම තැනම ඇන කොටා ගැනීමේ එකම හේතුව මායිම් පටලවා ගැනීම තමා. තණ පිටිය බෙදා වෙන්කර තියෙන හැටි බලන්න. හිතන්නවත් බැහැ. බීපු මිනිහෙක් වුණත් ඔයිට වැඩියෙ කෙළින් ඉරක් අඳීවි. කුඹුරු බෙදා තියෙන හැටි ඊට වඩා අන්තයි. ඉඩමක පළල පියවර තුනයි. එකිනෙක නයා වගේ එතිලා. ඒක ලිහලා වෙන්කිරීම කරන්ට බැරි දෙයක්. පුත්තු ලොකු වෙන්ට, වෙන්ට මේ ඉඩම් තව පුංචි වෙනවා. තාත්තලාට ඒවා බෙදා දෙන්නට සිද්ද වෙනවා. තව අවුරුදු විස්සක් යන විට, ගොවිතැන් කරන්ට ඉඩක් නැති වේවි. හැමතැනම මායිම්. දැනටමත් ඉඩම්වලින් සියයට දහයක් මායිම්වලට යටවෙලා."

කෝර්චාගින් මඳ සිනා පෑවේය.

"තව අවුරුදු විස්සක් යන විට, ඉඩම් මායිම් නැතිව යාවි. මිනින්දෝරු සහෝදරයා."

මහල්ලා තරුණයා දෙස කාරුණික ලෙස බැලීය.

"ඔබ කියන්නේ කොමියුනිස්ට්වාදී සමාජය ගැනද? ඔබ දන්නවාද, එයට තව බොහෝ කාලයක් ගතවේවි."

"බුදනොව්ස්ක් සමූහ ගොවිපළට මම ගියා... නමුත් කෝර්චාගින් සහෝදරයා ඒක විශේෂයක්."

කොමිෂන් මණ්ඩලය ඉඩම් මැන්නේය. ගැටවරයෝ දෙදෙනෙක් මායිම් සලකුණු කළ කණු සිටවූහ. මීට පෙර ඉඩම් සලකුණු කළ දැනට දිරාපත් වී ගිය කොට අසලින්ම අලුත් සලකුණු කණු සිටුවීම සහතික කරනු පිණිස කුඹුර දෙපැත්තේ සිටි ගොවීහු විමසිල්ලෙන් බලා සිටියහ.

★

කෙවිටෙන් අසුට පහරක් ගැසූ ගැල පදවන්නා තම ගැලෙහි ගමන් ගත් මඟීන් වෙත හැරී දෙඩමලුවීමට ආසාවක් දක්වමින් කතා කළේය.

"මේ තරම් කොම්සොමොල්කාරයො බෝ වුණේ කොහොමදැයි කියලා මම දන්නෙ නැහැ. මීට ඉස්සෙල්ලා ඔහොම දෙයක් වුණේ නැහැ. මේක පටන් ගත්තෙ අර ඉස්කෝල හාමිනේ තමා. ඇගේ නම රකීතිනා, එයා දන්නවද? ඈ තවම තරුණයි, හැබැයි ගෝරිකාරියක්. ගමේ ඉන්න ගෑනු අම්මණ්ඩිලා ඔක්කොමල්ලව ඈ එකතු කරලා උන්ගෙ ඔළුවලට නොයෙකුත් අදහස් දමනවා. ඒ නිසා හැම තැනම කලබල තමයි. දැන් කාලෙ තමාගෙ ගෑනිට පහරක්වත් ගහන්න බැහැ. ඉස්සර ඉඳලා හිටලා පහරක් ගැහුවම ගෑනි තරහවෙලා බුම්මාගෙන ඉන්නවා. දැන් එහෙම අත තිබ්බොත් ගෑනි හැබෑ ජරමරයක් කරනවා. අත නොතිබ්බනම් වඩා හොඳයි කියලා හිතෙනවා. මහජන අධිකරණයට යන්ට හදනවා. තරුණ ගෑනු දික්කසාදවීම ගැනයි, නීති ගැනයි දේශනා කරනවා. මගේ ගාත්කා උපන් ගෙයි හිමිඡ්ජියක්. දැන් ඈ නියෝජිතවරියක් වෙලා. ඈ ගෑනුන්ගේ නඩ නායිකාව වෙලා. ඒ වගේ පදවියක්. ඈ ළඟට ගමේ ඉන්න ගෑනු ඔක්කොමල්ලාම එනවා. මට ඉස්සෙල්ලා හිතුණා ගාත්කාට සබුක්කුවෙන් දෙකක් දෙන්න. පස්සෙ ඒ අදහස අතහැරියා, ඔහෙ යකාට ගියාවෙ! ඔහෙ ඕන දෙයක් කළාවෙ. ගෙදර වැඩ කටයුතුවලදි නම් ඈ යස ගෑනියක්."

ගැල්කරුවා තම පපුව කසන්නට විය. ගෙදර වියා සෑදූ කමිස කරින් ඔහුගේ පපුවේ කෙස් රොද දිස්වේ. ඔහු තම කෙවිට ගෙන අසුගේ බඩ යටට දමා කැසීය. ගැලේ ගමන් ගත් දෙදෙනා රස්වලීහින් හා ලීඩාය. පොද්දුබීට්සිවල ඔවුන්ට වැඩ තිබිණි. ලීඩා එහි ගියේ නියෝජිතවරියන් කැඳවා සාකච්ඡාවක් පැවැත්වීමටය. පළාතේ ශාඛාවේ වැඩ සංවිධාන කිරීම සඳහා රස්වලීහින් එහි ගියේය.

"තමුසෙ කොම්සොමොල්කාරයන්ට අකැමැතිද?" ලීඩා ගැල්කරුගෙන් විසුළු ලෙස ඇසුවේය.

ඔහු නිකටේ රැවුළු ගස් අදිමින් ඉක්මන් නොවී පිළිතුරු දුන්නේය.

"කැමැතියි, මොකද නැත්තෙ...? තරුණයන්ට තරුණ

කාලෙදි සෙල්ලම් කරන්ට ඉඩ දෙන්ට ඕන. නාටක නැටුම් පෙන්වීම වැනි දෙයක්. මාත් ඉස්සෙල්ලා කල්පනා කළේ අපේ තරුණයො නරක අන්දමට විනෝද වෙන්ට හදනවා කියලා. නමුත්, වුණේ ඒකෙ අනික් පැත්තයි. කොම්සොමොල්කාරයො බෙබද්දුකම් මැරකම් කරන්නෙ නැහැයි කියලා මිනිස්සු කියනවා මම අහලා තියෙනවා. ඒ ගොල්ල වැඩියෙන් ඉගෙන ගන්ට උත්සාහ කරනවා. දෙවියන්ට නිකම් ඉන්ට ඉඩ දෙන්නේ නැහැ. දේවස්ථානය සමාජ ශාලාවකට හරවන්න ලෑස්ති වෙනවා. ඒක නිකරුණේ, බොරු වැඩක්. මේ නිසා මහලු අය කොම්සොමොල්කාරයන්ට විරුද්ධ වෙලා. එහෙම නැතිනම් ඉතින් නරක නැහැ නේද? නමුත්, ඒගොල්ල ළඟ එක නරක වැඩක් තියෙනවා. ගමේ ගොඩේ නැති බැරි එවුන්ගේ කුලී ගොවීන්ගේ දූ පුතුන් කොම්සොමොල් එකට බඳවා ගන්නවා. පෝසත් ගොවීන්ගේ පුතුන්ව බඳවා ගන්නෙ නැහැ."

ගැල පල්ලම දිගේ ගොස් පාසල් ගොඩනැගිල්ල අසල නැවැත්විණි.

★

ගෙයි අයිතිකාරිය අලුත පැමිණි අමුත්තන් දෙදෙනාට රැය ගත කිරීම සඳහා ගෙය ඉඩ දී පිදුරු මඩුවට ගොස් නිදාගත්තාය. ලීඩා සහ රස්වලීහින් දිග් ගැසුණු රැස්වීමකින් පසුව රෑ බෝවී පැමිණියහ. ගෙය ඇඳිරිය. සපත්තු ගලවා දැමූ ලීඩා ඇඳට පැන එකවර නින්දට වැටුණාය. තම අදහස කෙළින්ම කියා පාන රස්වලීහින්ගේ දෑත් ඇගේ සිරුරට රළු ලෙස වැටීම නිසා ඈ අවදි වූවාය.

"නුඹට මක්වෙලාද?"

"ලීඩ්කා, හෙමින්. කෑ ගහන්ට ඕනද? මට තනිවම නිදා ඉන්ට කාන්සියි! යක්ෂ කාන්සියක්! ගොරව ගොරවානිදා ගන්නවාට වඩා මිහිරි වැඩ නුඹ දන්නෙ නැතිද?"

"වහාම මගේ ඇඳෙන් එළියට බැහැපිය!" ලීඩා ඔහු තල්ලු කළාය. රස්වලීහින්ගේ සෙවල හිනාව පෙර සිටම ඇට නොරිසි විය. රස්වලීහින් අපහාසයට හා නින්දවට ලක් කරන යමක් කීමට ඇට වුවමනා නමුදු නිදිමත ඇයට ඉඩ නොදෙයි.

"නුඹ මොකද කෙකර ගාන්නෙ? අපූරු බුද්ධිමත් හැසිරීමක්! ඔබතුමිය කන්‍යාරාමයක වැඩුණු ළමාතැනී කෙනෙක්ද? නුඹගේ හැසිරීම මා විශ්වාස කරාවි කියලා

නුඹ හිතුවද? කෙල්ලේ නිකම් මෝඩියක් වෙන්ට එපා. නුඹට හැඟීමක් තියෙනවා නම් ඉස්සෙල්ලා මගේ ආසාව සපුරාපන්. පස්සෙ නුඹට ඕන තරම් නිදාගනින්."

ඕනෑවට වැඩියෙ කතා කිරීමට නොසිතූ රස්වලීහින් යළිත් බංකුවෙන් නැඟිට ඇඳ අයිනක වාඩි වී, අධිපති බවක් අඟවමින් ඇගේ උරහිස මත අතක් තැබීය.

"යකාට පල!" වහාම නින්දෙන් අවදිවුණු ලීඩා කෑ ගැසුවාය. "සත්තකින්ම මම මේ ගැන හෙට කොර්චාගින්ට පැමිණිලි කරනවා."

රස්වලීහින් ඇගේ අතක් අල්ලා කුපිතව මිමිනුවේය.

"නුඹේ කොර්චාගින්ගෙ මූණට කෙළ ගහන්ට වුණත් මම ලෑස්තියි. නුඹ මට ඉඩ නුදුන්නොත් මම නුඹට බලහත්කාරකම් කරනවා."

ලීඩා හා රස්වලීහින් අතර කෙටි පොරයක් ඇති විය. ගොවි ගෙදර නිහඬතාව බිඳ හඬක් පැතිරිණි. ලීඩා රස්වලීහින්ගේ කම්මුලට එක පිට එක ගැසූ පහරවල හඬය ඒ. ඔහු හණික අයිනට පැන්නේය. ලීඩා අඳුරේ අත පත ගාමින් දොර හැරගෙන ගෙවත්තට පැන සිට ගත්තාය. ඈ හඳපානේ සිටගෙන කෝපයෙන් වෙවුලන්නට වූවාය.

"ගේ ඇතුළට වරෙන් මෝඩියෙ!" රස්වලීහින් නපුරු ලෙස කෑ ගැසීය.

ඔහු සිය කොට්ට පැදුරු මඩුවට ගෙන ගොස් එහි රැය ගත කළේය. ලීඩා ගෙතුළට විත් දොර අගුළු ලා ඇඳට වැටී කුදු ගැසී නිදාගත්තාය.

පසුවදා උදෑසන ගැලෙහි නැග නගරයට යන ගමන් ජේන්කා රස්වලීහින් ගැල්කරු ළඟට වී නොනවත්වා දුම් බීවේය.

"අතින්වත් අල්ලන්ට බැරි මේ කෙල්ල හැබෑටම කොර්චාගින්ට කීවොත් ඕකිට හෙණ වදින්න ඕන. ඇහැට කනට පේන්ට හිටිය නම් ඒත් කමක් නැහැ. කැත ගෑනියක්. කොහොමහරි සමාදන වෙන්ට ඕන. නැතිනම් වැඩ වරදීවි. කොර්චාගින් දැනටමත් මා දිහා රවනවා." ඔහු සිතන්නට විය.

රස්වලීහින් ලීඩා අසලින් වාඩි විය. ඔහු ලජ්ජාශීලී බවක් පෙන්වමින් දුක්මුසු බැලුම් හෙළීය. නොයෙකුත් බොරු ගොතමින් තමාගේ වරදට හේතු පෙන්වා, සමාව ඉල්ලා සිටියේය.

ඔහු ඇය රැවටීමෙහි සමත් විය. ගමේ සීමාව තෙක් යාමට

පෙර ඊයේ රැයෙහි වූ සිද්ධිය කිසිවකුට නොකීමට ලීඩා පොරොන්දු වූවාය.

★

දේශසීමාව අසල ගම්වල කොම්සොමොල් තරුණ සංගම් ශාඛා එකිනෙක බිහිවන්නට විය. කොමියුනිස්ට් ව්‍යාපාරයේ පළමුවැනි අංකුර හැටියට ගැනෙන ඒ තරුණ සංවිධාන සෑදීම සඳහා ප්‍රාදේශීය කොම්සොමොල් කමිටුවේ සාමාජිකයෝ බොහෝ සේ මහන්සි වූහ. පාවෙල් කොර්චාගින් සහ ලීඩා පොලෙවික් මේ ගම්වලට වැදී දවස් ගණනක් ගත කළහ.

රස්වලීහින් ගම්වලට යාමට අකැමැති විය. ඔහුට ගොවි තරුණයන්ගේ සිත දිනා ගැනීමට නොහැකි වූ අතර, වැඩ අයහපත් තත්ත්වයකට ඇද දැම්මේය. ලීඩා පොලෙවික් හා පාවෙල් කොර්චාගින් චාම් ලෙසත්, ස්වභාවික ලෙසත් ගොවි තරුණයන් අතර වැඩ කළහ. ලීඩා ගොවි තරුණියන් තමා වට රැස් කරවාගෙන, පෞද්ගලික යෙහෙළියන් ඇති කරගෙන, ඔවුන් සමග සම්බන්ධකම් නැති කර නොගත්තාය. එමගින් කොම්සොමොල් තරුණ සංවිධානයේ වැඩ ගැන ගොවි තරුණියන් තුළ ඉබේම උනන්දුවක් ඇති කරවීමට සමත් වූවාය. ප්‍රදේශයේ හැම තරුණයෙක්ම කොර්චාගින් දැන සිටියහ. අනිවාර්ය යුද්ධාභ්‍යාස සේවයේ දෙවැනි බැටැලියනයේ අභ්‍යාසවල යෙදී සිටින තරුණයන්ගේ සංඛ්‍යාව එක්දස් හයසියයකි. ඇකෝඩියනය, ගම්වල ප්‍රචාරක සැන්දෑ හමුවීම්වලදී මින් පෙර නොවූ විරූ වැඩ කොටසක් ඉටු කළේය. ඇකෝඩියනය වයන කෝර්චාගි න් කොතරම් ජනප්‍රිය වීද යත්, ඔහු ‘අපේ මිනිහා’ හැටියට ගම්මු පිළිගත්හ. බොහෝ ගැමි තරුණයන්ට කොම්ෂොමොල් තරුණ සංගමයට මඟ පෙන්වූයේ ඇකෝඩියනයයි. වරෙක රාගාන්විත හා සංවේගාත්මක ලෙසද, තවත් වරෙක මුදු මොළොක් බව හා අභීත බවෙන්ද වැයෙන ඇකෝඩියනය උක්රයීනයේ ගැමි ගී, ජන ගී ආදිය මනහර ලෙස වැයීය. ඇකෝඩියනයටද, එය වයන බැටැලියන් හමුදාවේ අණ දෙන නිලධාරියා සහ කොම්සොමොල් තරුණ සංවිධානයේ ප්‍රාදේශීය ලේකම්වරයාටද ඔවුහු සවන් දුන්හ. තරුණ කොමිසාර් පාවෙල් කොර්චාගින්ගේ කටින් පිටවන වචන ඔහුගේ වාදනය සමඟ ඉතා හොඳින් සුමධුර ලෙස ගැළපිණි. ඉක්මනින්ම ගම්වල අලුත් ගී සිංදු පැතිරිණි. ඉස්සර ගොවි

ගෙවල්වල තිබුණු යාච්ඤා පොත් හා බයිබල් වෙනුවට දැන් අලුත් පොත් පැතිරෙන්නට පටන් ගති.

නීති විරෝධී ලෙස බඩු ගෙන යන්නවුන්ගේ ජාවාරම්වලට නරක දසාවක් උදා විය. ඉස්සර මෙන් දේශ සීමාවේදී පමණක් බේරී යාම අඩු විය. සෝවියට් ආණ්ඩුවට ආධාර කරන තරුණ මිතුරෝ හා උනන්දු සහගත ආධාරකරුවෝ හැම තැනම බෝ වූහ. සමහර අවස්ථාවලදී, සතුරා අල්ලා ගැනීමේ උනන්දුවෙන් පෙළෙන කොම්සොමොල් ශාඛා අමාරුවේ වැටුණු විට අනිකුත් වැඩ අතපසු කොට ඔවුන්ට සහාය වීමට කොර්චාගින්ට සිදුවිය. පද්දුබිට්සි කොම්සොමොල් තරුණ ශාඛාවේ ලේකම්වර ග්‍රිෂුට්කා හොරොවොද්කො එදින රෑ යෙහි නීතිවිරෝධී බඩු ගෙන යන්නවුන් ගමේ මෝල්කරු වෙත එවැනි බඩු ගෙනෙන බව පෞද්ගලික ඔත්තුවක් අනුව දැන ගත්තේය. නිල්වන් ඇස්ද, උණුසුම් හිසක්ද ඇති මේ තරුණයා වාද කිරීමට ආසාවක් දක්වයි. ආගම් විරෝධී ව්‍යාපාරයේ මුල් තැනක් ගෙන ඔහු ක්‍රියා කළේය. තමාට ලැබුණු ඔත්තුව අනුව ඔහු තම ශාඛාවේ සාමාජිකයන් කැඳවාගෙන, යුද්ධාභ්‍යාස රයිපල් තුවක්කුවක් සහ බයිනෙත්තු දෙකක්ද ඇතිව ජාවාරම්කාරයන් පැමිණිය යුතු තැනට ගොස් සැඟවී සිටියේය. නීති විරෝධී ජාවාරම්කාරයන් ගැන ගෙ.පෙ.උ[1] නමැති රාජ්‍ය දේශපාලන සංවිධානයටද ඔත්තුවක් ලැබුණෙන්, සෙබළ පිරිසක්ද එහි යැවිණි. රෑ මහ කළුවරේ ග්‍රිෂුට්කාගේ තරුණයන් හා දේශ සීමා මුර සෙබළුන් අතර සටනක් ඇතිවිය. මුර සෙබළුන්ගේ ඉවසීමේ ශක්තිය හා සුපරීක්ෂාකාරීභාවය නිසා තරුණයෝ විපතින් හා තුවාල ලැබීමෙන් බේරුණෝය. දේශ සීමා මුර සෙබළු තරුණයන් සිරභාරයට ගෙන, කිලෝමීටර් හතරක් ඈතින් පිහිටි අල්ලපු ගමේ ගොඩනැඟිල්ලක සිර කළහ.

පසුදා උදෑසන කොර්චාගින් දේශ සීමා බැටෑලියන් හමුදාවේ අණ දෙන කොමිසාර් ගව්රිලොව්ගේ කාර්යාලයේ සිටින විට, ඉකුත් රෑයෙහි සිද්ධිය පිළිබඳ පුවත් ලැබිණි. ප්‍රාදේශීය කොම්සොමොල් ලේකම්වරයා වහාම අසු පිට නැඟී තම සගයන්ට උදව් වීමට ගියේය.

රජයේ දේශ සීමා භාර නිලධාරී තැන කතාව කියමින් හඬනඟා සිනාසුණේය.

"කොර්චාගින් සහෝදරයා අපි මෙහෙම දෙයක් කරමු.

---

1 ගෙ.පෙ.උ - රාජ්‍ය ආරක්ෂක කටයුතු භාර සංවිධානය මෙනමින් හැඳින්වේ.

ඒගොල්ලො හොඳ තරුණ කට්ටිය. ඔවුන්ට විරුද්ධව ක්‍රියා කිරීමට අපි බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මීට පසුව අපේ වැඩවලට අත නොතබන ලෙස ඔවුන්ට තදින් පවසන්ට ඕන."

මුරකරුවා මඩුවේ දෙර හරිත්ම තරුණයෝ එකොළොස් දෙනාම නැගිට සිට ලජ්ජාවෙන් නොසන්සුන්ව සිට ගත්හ.

"ඔන්න ඒගොල්ල දිහා බලන්නකො." කනගාටුවෙන් නිලධාරියා දෑත් වැනීය. "මදෑ ඒගොල්ල කළ වැඩක හැටි. මට සිද්ද වෙලා තියෙනවා දැන් මේ කට්ටිය ප්‍රාදේශීය කාර්යාලයට යවන්න."

එවිට කැලඹුණු සිතින් ග්‍රිෂුට්කා කතා කළේය.

"සාහරොව් සහෝදරයා, අප කළේ මොනවාද? අපි සෝවියට් ආණ්ඩුවට උදව් කරන්නට හැදුවා. අපි ඒ කුලාකයා ගැන දවස් කීපයක් තිස්සේම පරීක්ෂාවෙන් හිටියා. ඔබ අප පල්හොරුන් හැටියට ගණන් ගෙන හිර කළා." ඔහු අමනාපයෙන් ආපසු හැරුණේය.

කොර්චාගින් හා සාහරොව් විසින් බැරෑරුම් ලෙස සාකච්ඡා කිරීමෙන් පසුව, අමාරුවෙන් සැරවීම් පාලනය කරගෙන ඔවුනට බැණවැදීම් නැවැත්වූහ.

"නුඹ ඔවුන් වෙනුවෙන් වග කියනවා නම්, මින් පසු දේශ සීමාවට නොයාමට ඔවුන් පොරොන්දු වෙනවා නම්, ඔවුන්ගේ සහාය අපට අන් ආකාරයකට ලැබෙන්නට සලස්වන්නේ නම්, මම ඔවුන්ව නිදහස් කරන්නම්." සාහරව් කොර්චාගින්ට පැවසීය.

"හොඳයි, මම ඔවුන් වෙනුවෙන් වග කියන්නම්. ඔවුන් මා අමාරුවට පත් නොකරතියි මා විශ්වාස කරනවා."

පද්දුබීට්සි කොම්සොමොල් ශාඛාවේ සාමාජිකයෝ ගී ගයමින් ගෙවල් බලා ගියෝය. ඒ සිද්ධිය ගම්මුන්ට ආරංචි නොවීය. එහෙත්, මෝලේ හොර ජාවාරම්කාරයාව නීත්‍යානුකූලව පසුව අල්ලා ගැනිණි.

මයිඩාන් විල්ලා නම් වූ කැලෑ ගම්මානයේ පොහොසත් ජර්මන් ජනපදවාසීහු වාසය කරති. එකිනෙකට කිලෝමීටර් බාගයක් පමණ ඈතින් කුඩා බලකොටු වැනි ශක්තිමත් ගෙවල් සාදගෙන මේ ජර්මන් පොහොසත් ගොවීහු කුලාකයෝ විසූහ. අත්තෝන්යුක් නමැති පල්හොරා සිය සොරමුළ මෙහෙයවූයේ මෙහි සිටය. සාර්ගේ යුද්ධ හමුදාවේ සාජන්ට් - මේජර් ධුරයක් දැරූ අන්තෝන්යුක් තම නෑයන් හත් දෙනෙකු සංවිධානය කොට මං පැහැරීමට පටන් ගත්තේය. නගරය බලා යන මග

රැක සිටි ඔහු කළුකඩකාරයන්ට පහර දී ඔවුන්ට තුවාල කළ අතර, සෝවියට් ආණ්ඩුවේ සේවකයන්ටද පහර දුන්හ. ඔවුහු අවි පාවිච්චි කළහ. අන්තෝන්යුක් ජංගමශීලී ලෙස ක්‍රියාකාරී විය. එක් දවසකදී සමුපකාරයක ලියන්නන් දෙදෙනෙකුගේ මුදල් පැහැර ගත් ඔහු පසුදින ඊට කිලෝමීටර් විස්සක් ඈතින් ගමක තැපැල්කරුගේ අන්තිම තඹය දක්වා පැහැර ගත්තේය. අන්තෝන්යුක්ට තරහකාරයකුද විය. ඔහු ගොර්දිය. මොවුන් දෙදෙනා එකිනෙකාට නොදෙවෙනි පල් හොරු වූහ. මේ නිසා ප්‍රාදේශීය මිලිෂියාවටද, ගෙ.පෙ.උ සෙබළුන්ටද වැඩ ගොඩක් විය. අන්තෝන්යුක් බෙරෙස්දෙව් නගරයේ සීමා අසලම තම කටයුතු කළ බැවින්, නගරයෙන් පිට මාර්ගවල යාම අවදානම් වූ අතර, ඔහු අල්ලා ගැනීම අසීරු කාර්යයක් විය. ඔහු හැම අතින්ම ලුහුබඳින විට, දේශ සීමාවෙන් එපිටට පැන ගොස්, කලක් ගත කොට බලාපොරොත්තු රහිත වේලාවක පැමිණ පහර දෙයි. මේ බියජනක සතුරා පහර ගසන හැම අවස්ථාවකදීම ඒ පිළිබඳ වාර්තා කියවන කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපති ලිසීට්සින් ස්නායු කිපුණු විටෙක මෙන් දෙතොල් සපා ගනී.

"මේ ගැරඬියා තව දවස් කීයක් අපව සපා කාවිද? ජඩයා තෝ බලාගෙන ඉන්නෙ මම තොට විරුද්ධව සටන් කරන තුරුද?" ඔහු දත් සපමින් පැවසීය. ලිසීට්සින් දෙවරක්ම ඔහු ලුහුබැඳ ගියේ කොර්චාගින් සහ තවත් කොමියුනිස්ට්වරුන් තිදෙනෙකු සමඟය. එහෙත්, අන්තෝන්යුක් පැන ගියේය.

ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ සිට පල්හොරුන්ට විරුද්ධව ක්‍රියාකිරීම සඳහා විශේෂ කණ්ඩායමක් එවීය. එහි නායකයා වූයේ, හොඳට ඇඳ පැළඳගත් පිලාතොව්ය. කුකුළු නාම්බෙකු සේ උඩගු පිලාතොව් දේශ සීමා නියෝග අනුව කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපතිවරයා වෙත ලියාපදිංචි විය යුතුව තිබුණද, එය කඩකරමින් දේශ සීමාව අසලම පිහිටි ගමක් වන සෙමාකියට ගියේය. ඒ ගමට මහ රෑ පැමිණි ඔහු තම සෙබළුන් ගම්මානය අසල වූ ගෙයක නැවැත්විය. නාඳුනන මිනිසුන්ගේ පැමිණීම ගැන සැක කළ අසල්වැසි ගෙදර කොම්සොමොල් සාමාජිකයා, ඒ බව ගමේ සෝවියට් සභාවේ සභාපතිවරයාට දැන්වීය. ගම් සභාපතිවරයාට ඔවුන් ගැන නිල වාර්තා නොලැබුණු නිසා, මහ රෑ පැමිණියවුන් සතුරන් බව සිතා කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපති ලිසීට්සින් බොහෝ ජීවිත හානි වීමේ තර්ජනයක් පවා ඇතිවීමට ඉඩ තිබිණි. ලිසීට්සින්

මහ රෑ තම මිලීෂියා භටයන් දසදෙනෙකු සමඟ පිලාතොව් නැවතී සිටි ගෙදරට කඩා පැන්නේය. ගෙවැටින් පැන ගෙදරට ඇතුළු විය. ගෙය මුර කළ භටයාගේ හිසට පහරක් දුන් ලිසීට්සින් උරහිසින් දොර කඩා කණා මැදිරි පහනක් එල්ලා ඇති කාමරයට පැන්නේ, එක් අතකින් අත් බෝම්බයක් හා අනික් අතින් "මවුසර්" පිස්තෝලයක් අරගෙන ය. ඔහු ජනේල වීදුරු දෙදරන තරම් මහ හඬින් කෑගැසීය.

"යටත් වෙයව්, නැතිනම් තොප විනාශ කරනවා!"

තවත් තත්පරයක් ගෙවෙත්ම, නිදා සිට නැගී සිටියවුන් බෝම්බ පහරින් තූ තූ කොට ඉරී යන්නට ඉඩ තිබිණි. එහෙත් කෑගසන මිනිහාගේ බිහිසුණු විලාසය දුටුවෝ දෑත් ඔසවා යටත් වූහ. විනාඩියකට පසු නිදා සිටිය වුන් යට ඇඳුම් පිටින් ගෙවත්තට ගෙන ගිය විට, පිලාතොව්, ලිසීට්සින්ගේ රතු ධජ පදක්කම දැක තමා කවුදැයි විස්තර කළේය.

ලිසීට්සින්ගේ කෝපය නිම්හිම් නැති විය. ඔහු නින්දා සහගත ලෙස කෙළ ගැසීය.

"බූරුවා"

★

ජර්මන් විප්ලවයේ සටන්කාමී හඬ ඇසෙන්නට විය. හැම්බර්ග් නගරයේ කපොලු සටන්වල කාහල නාදය රැව් පිළිරැව් දිණි. දේශ සීමාවේ තත්ත්වය නොසන්සුන් විය. කැලඹිලි සහගත බලාපොරොත්තුවකින් යුතුව දිනපතා පුවත්පත් කියවීය. ඔක්තෝබර් විප්ලවයේ සුළි සුළං බටහිර දිගින් හමන්නට විය. රතු හමුදාවේ ස්වෙච්ඡා සේවකයන් ලෙස බැඳී සේවය කිරීමට කැමැති අය දහස් ගණනින් ප්‍රාදේශීය කොම්සොමොල් කමිටුවට ඉල්ලුම් පත් එවූහ. සෝවියට් දේශය සාමකාමී ප්‍රතිපත්තියක් අනුගමනය කරන බවත්, අසල්වැසි රටවල් සමඟ යුද්ධ කිරීමට අදහස් නොකරන බවත් පවසමින් තරුණයන්ට විස්තර කරදීමට කොර්චාගින්ට සිදුවිය. එහෙත්, එය අඩු ප්‍රතිඵල ගෙනදිණි. හැම ඉරිදා දවසක් පාසාම පූජකයාට අයිති වත්තේ සියලු ශාඛාවල කොම්සොමොල් සාමාජිකයන් රැස්වීම සිරිතක් විය. එක් දවසක දහවල් කාලයේදී පද්දුබ්ට්සිහි කොම්සොමොල් ශාඛාවේ සියලු සාමාජිකයෝ පෙළපාළියකින් ප්‍රාදේශීය කොම්සොමොල් කාර්යාලයට පැමිණියහ. මෙය කාර්යාල කාමරයේ සිට දුටු කොර්චාගින් එළිපත්තට පැමිණියේය.

ග්‍රිෂුට්කා හොරොවොද්කෝගේ නායකත්වයෙන් යුත් සාමාජිකයෝ එකොළොස් දෙනෙක් දණහිස දක්වා වූ බූට්ස් සපත්තු දමාගෙන උරවල විශාල ගමන් මලු එල්ලාගෙන කාර්යාලයේ දොර අසල නැවතුණහ.

"ග්‍රීෂා මොකද කාරණාව?" මවිතයට පත් කොර්චාගින් ඇසීය.

එහෙත්, හොරොවොද්කෝ කොර්චාගින් දෙස බලා ඉඟිමරා ඔහු සමඟ කාර්යාලයට ඇතුළු විය. ලීඩා, රස්වලීහින් හා තවත් කොම්සොමොල් සාමාජිකයන් දෙදෙනෙකු හොරොවොද්කෝගෙන් විස්තර ඉල්ලා සිටි විට, ඔහු කාර්යාල කාමරයේ දොර වසා බැම සඟළ හකුළුවාගෙන මෙසේ පැවසීයඃ

"සහෝදරවරුනි, මම අපේ සාමාජිකයන්ගේ සටන්කාමී සූදනම් පරීක්ෂා කර බලනවා. මම ඒගොල්ලන්ට අද මෙහෙම කිව්වා. ප්‍රාදේශීය කාර්යාලයේ සිට රහස් විදුලි පුවතක් ලැබුණා. සත්තකින්ම ජර්මන් ධනපති පන්තියට විරුද්ධව යුද්ධය පටන් ගන්නා බවත්, ඉක්මනින්ම පෝලන්තයේ රදලයන්ට විරුද්ධවත් සටනක් ඇතිවන බවත් විදුලි පුවතින් කියැවෙන බව මම කීවා. සියලුම කොම්සොමොල් සාමාජිකවරු යුද පෙරමුණට යා යුතු බව නියෝග කරමින් මොස්කව් ඉඳලා අණක් නිකුත් කර තිබෙන බව කීවා. ඒ නියෝගය අනුව ගෙදර නවතින්න කැමැති අයට ලියුමක් ලියලා දීලා ගෙදර නවතින්න පුළුවනි. යුද්ධය ගැන පිට අයට දැන්වීම තහනම්. පාන් ගෙඩියකුයි සත්ව තෙල් කෑල්ලකුයි හැම එක්කෙනෙකුම ගෙනෙන්ට ඕන. සත්ව තෙල් නැතිනම් සුදු ලූනු හරි නිකම් ලූනු හරි. රහසින් තව පැයකින් ගමට එහා රැස්වෙලා ප්‍රාදේශීය කාර්යාලයටත්, පසුව දිස්ත්‍රික්ක මධ්‍යස්ථානයටත් යනවා. එතැනදි අපට අවි ලැබෙනවා. අපේ සාමාජිකයෝ මගෙ කතාව නිසා බොහොම උනන්දු වුණා. ඒ ගොල්ලො නොයෙකුත් ප්‍රශ්න අහන්ට පටන් ගත්තා. මා කීවා කතා නැතිව වහාම ලැහැස්ති වෙන්ට කියලා. ගෙදර නවතිනවානම් ඒ බවට ලියුමක් දිය යුතුයි කියලා. සටනට යාම සිය කැමැත්ත අනුවයි. සාමාජිකයෝ ගෙවල්වලට ගියා. මගේ හදවත පට පට ගාලා ගැහෙන්නට පටන් ගත්තා. කවුරුවත් හරි ආවේ නැතිනම්? එහෙමනම් ශාඛාව විසුරුවා හැරලා මම වෙනින් තැනකට යනවා. ගමට එහා තැනකට වෙලා බලාගෙන හිටියා. එක, එකා එන්නට පටන් ගත්තා. සමහරු

අඬපු බව මූණෙන් පෙනුණත්, ඒ බව ඇඟවුවේ නැහැ. දහ දෙනාම ආවා. එකෙක්වත් ගෙදර නැවතුණේ නැහැ. ඔන්න පේනවද පද්දුබිට්සිවල කොම්සොමොල් ශාඛාවේ තරම!" ආස්වාදයකින් යුතුව පැවසූ ග්‍රිෂුට්කා හොරොවොද්කෝ ආඩම්බරයෙන් පපුවට ගසා ගත්තේය.

කෝපයට පත් ලීඩා පොලෙවික් ඔහුට බැණ වැදුණු විට ඔහු අන්දමන්දව ඇය දෙස බැලීය.

"ඒ කතාවේ තේරුම කුමක්ද? මේක තමා ඉතාම හොඳ පරීක්ෂණය! මෙතැනදි හැම සාමාජිකයෙකුගෙම තරම ඉතා හොඳට මැන ගන්නට පුළුවනි. ගමනේ වැදගත්කම වැඩිපුර පෙන්වන්ට මම ඔවුන්ව දිස්ත්‍රික්ක මධ්‍යස්ථානයට ගෙන යාමට සූදානම් වුණා. නමුත්, කොල්ලන්ට හති. ඔවුන් ගෙදර ගියාවෙ. නමුත්, කොර්චාගින් සහෝදරයා නුඹ ඔවුන්ට කතාවක් කරන්නටම ඕන. එහෙම නැතිව කොහොමද? කතාවක් නැතිව හොඳ මදි... හමුදාවට බඳවා ගැනීම අත්හිටවා තිබෙනවා. නුඹලාගේ චිරත්වයට සදා කීර්තිය අත්වේවා කියලාවත් කියාපන්." ග්‍රිෂුට්කා පැවසීය.

ප්‍රාදේශීය මධ්‍යස්ථානයට කොර්චාගින් ගියේ ඉඳහිටලාය. එම ගමනට දවස් දෙක තුනක් ගතවන නිසාද, තම පෙදෙසේ වැඩවලින් ඈත් වී සිටීමට නොහැකිවීම හා දිනපතා වැඩවල යෙදීම අත්‍යවශ්‍ය වීම නිසාද ඔහු එහි නොගියේය. එහෙත් රස්වලීහින් ඕනෑම හේතුවක් පෙන්වමින් නගරයට යාමට ආසා කළේය. හිස සිට දෙපා දක්වා අවිවලින් සැරසෙන රස්වලීහින් පෙනිමෝ කූපර්ගේ වීරයන් සිතින් මවා ගනිමින් ඉමහත් සතුටින් නගරයට ගියේය. කැලෑවට වැදී කාක්කෙකුට හෝ ලේනෙකුට හෝ වෙඩි තබා ඔහු ප්‍රීතිවෙයි. කැලෑවේ ගමන් කරන ගැමියකු දුටුවොත් ඔහුගෙන් දැඩි ලෙස ප්‍රශ්න කොට යන්නේ කොහිද, ගියේ කොහිද, ආදී තොරතුරු විමසයි. නගරයට ළං වන විට, රස්වලීහින් රයිපල් තුවක්කුවේ පතොරොම් ගලවා, එය පිදුරු යට සඟවයි. පිස්තෝලය සාක්කුවේ ඔබාගෙන, සාමාන්‍ය කෙනෙකු ලෙස ප්‍රාදේශීය මධ්‍යස්ථානයට යයි.

"ඉතින් බෙරෙස්දෙව්වල ආරංචි මොනවාද?" පෙදෝතොව් රස්වලීහින්ගෙන් ඇසීය.

ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ලේකම්වරයා වන පෙදෝතොව්ගේ කාර්යාලය හැමදම ජනයාගෙන් පිරිලාය. කතාබහ ලහි ලහියේ කෙරිණි. එවැනි තත්ත්වයක් යටතේ

වැඩ කිරීමට දක්ෂතාවක් තිබිය යුතුය. හතර දෙනෙකුට සවන් දෙන ඔහු පස්වැනියාට එකවර පිළිතුරු දෙයි. එසේ වුවද, පෙදෝතොව් ගැටවරයෙකි. ඔහු කොමියුනිස්ට් පක්ෂයට බැඳුණේ 1919 දීය. සටන් ඇවිළ පැවැති ඒ කාලයේදී පමණක් පහළොස් හැවිරිදි කොල්ලෙකුට පක්ෂයේ සාමාජිකත්වය ලබා ගත හැකි විය.

පෙදෝතොව්ගේ ප්‍රශ්නවලට රස්වලීහින් පිළිතුරු දුන්නේ නොසැලකිලිමත් ලෙසය.

"හැම ආරංචියක් කීමේ තේරුමක් නැහැ. උදේ සිට රෑ බෝ වන තුරු වැඩ කරනවා. හැම අඩුපාඩුවක්ම පිරිමහන්නට ඕන. අලුත් තැනක නොවැ වැඩ කරන්නේ. වැඩ ගොඩක්. ආයෙමත් අලුත් ශාඛා දෙකක් හැදුවා. මොකටද අඬගැහුවෙ?"

ආර්ථික අංශයේ ප්‍රධානියා වන ක්‍රිම්ස්කි ලියවිලිවලින් දෙනෙත් මොහොතකට ඉවතට ගෙන ඔහු දෙස බැලීය.

"අපි ආරාධනා කළේ කොර්චාගින්ට, ඔබට නොවේ."

රස්වලීහින් දුම්වැටිය උරා දුම් ගුළියක් පිට කළේය.

"කොර්චාගින් කැමැති නැහැ මෙහාට ඒමට. මගේ අනික් වැඩ අතපසු කරලා මට මෙහෙ එන්න සිදුවෙලා තියෙනවා... පොදුවේ බලන කොට සමහර ලේකම්ලාට හොඳයි. ඒ ගොල්ලන්ට කිසි වැඩක් කරන්ට ඕන නැහැ. මා වගේ බූරුවන් පිට සියලු වැඩ පටවනවා. කොර්චාගින් දේශසීමාවට ගියාම සුමාන දෙක තුන එතැන පල්වෙනවා. වැඩ ඔක්කොම මගෙ කර පිට." රස්වලීහින් තම කතාවෙන් ඇඟවූයේ ප්‍රාදේශීය කොම්සොමොල් තරුණ සංගමයේ ලේකම් ධුරයට තමා ඉතාම සුදුස්සා බව ස්ථිර ලෙසම ඒත්තු ගන්වමිනි.

"ඒ හාදයා නම් මගෙ හිතට ඇල්ලුවේ නැහැ." රස්වලීහින් ගියපසු අනිකුත් කොම්සොමොල් නිලධාරීන් ඉදිරියේ පෙදෝතොව් පැවසීය.

රස්වලීහින්ගේ කපටිකම් හෙළිදරව් වූයේ අහම්බෙනි. කාත්‍යාධිකාරී කමිටුවේ සභාපති ලිසීට්සින් තැපැල් ලබා ගැනීම සඳහා පෙදෝතොව් වෙත ආවේය. ප්‍රාදේශීය මධ්‍යස්ථානයට පැමිණෙන පුද්ගලයා තම පෙදෙසේ සියලු සහෝදරවරුන් සඳහා තැපැල් ගෙන යාම සිරිතක් විය. පෙදෝතොව් ලිසීට්සින් සමඟ බොහෝ වේලාවක් කතා කළේය. එහිදී රස්වලීහින්ගේ කපටිකම් හෙළිදරව් විය.

"කොහොමහරි කොර්චාගින්ව එවන්න. මා එයාව හඳුනාගෙන නැති තරම්." සමුගනිමින් පෙදෝතොව් පැවැසීය.

"හොඳා එක කොන්දේසියක් පිට. කොර්චාගින් අපෙන් ඉවත් කරගන්ට ලැහැස්ති වෙන්ට එපා. අපි දැඩි ලෙසම ප්‍රතික්ෂේප කරනවා." ලිසීට්සින් කියා සිටියේය.

★

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයේ ජයන්තිය එම වසරේදී දේශ සීමා අසල පෙදෙස්වල ඉතා ඉහළින් පැවැත්විණි. දේශ සීමා අසල ගම්වල ඔක්තෝබර් ජයන්ති සංවිධානයේ සභාපති ධුරය කොර්චාගින්ට පැවැරිණි. පද්දුබිට්සිවල මහජන රැලියෙන් පසු ගම් තුනක පන්දහසක් පමණ වූ ගොවි ජනතාව, අනිවාර්ය යුද්ධාභ්‍යාස බැටැලියන් හමුදාවේ නායකත්වය යටතේ, බෑන්ඩ් තූර්යවාදන සහිතව, රතු ධජ රැගෙන කිලෝමීටර් බාගයක් පමණ දිගැති පෙළපාළියකින් දේශ සීමාවෙන් බෙදූ වෙන්කොට ඇති ගම් දක්වා ගමන් කළහ. ඉතා දැඩි විනය ගරුක බවක් හා සංවිධානාත්මක බවක් පෙන්වමින් පෙළපාළිය දේශ සීමා වෙන්කොට ඇති සලකුණු ඔස්සේ ගියේය. පෝලන්ත දේශ සීමාවේ මිනිස්සු මෙවැනි දර්ශනයක් මින් පෙර නොදුටුහ. පෙළපාළිය ඉදිරියෙන් අසුන් පිට නැඟී ගව්රිලොව් හා කොර්චාගින් ගමන් ගත්හ. ඔවුන් පිටුපසින් බෑන්ඩ් තූර්ය වාදනය විය. රතු ධජ ලෙළ දිණි. ජනතාව ගී සින්දු ගායනා කළහ! ගමේ තරුණයෝ උත්සව සිරියෙන් ඇඳ පැලඳ සිටියහ. තරුණ ගෙවිලියෝ හඬ නගමින් සුන්දර සිනා පෑහ. මහල්ලෝ උත්සවාකාරී බැරෑරුම් සිරියක් ඉසුලූහ. පේන තෙක් මානයක සිට ජනතාව ගංගාවක් සේ ගලා බසිති. මිනිසුන් කොතරම් සංවිධානාත්මක ලෙස ගමන් කළේද යත්, එකකු වත් තහනම් පෙදෙසට පයක් වත් තුබුවේ නැත. කොර්චාගින් තමා අසලින් පෙළපාළියට යාමට ඉඩ හැරියේය. අනතුරුව කොමියුනිස්ට් තරුණ සංගමයේ ගී සින්දු ගැයීම ඇරැඹිණි.

තයිගා මහ වනයේ සිට, බ්‍රිතනි මහ මුහුද දක්වා තෙද බල ඇති රතු සේනා ජය ගොස හඬ නගයි. ඉනික්බිති ගෙවිලියෝ ගැයූහ.

"කඳු බෑවුම අද්දර කෙල්ලො බලා ඉඳිති."

දේශ සීමාවේ මුර සේවයේ යෙදී සිටි සෝවියට් මුර භටයෝ සතුටු සිතින් මඳ සිනා පෑහ. පෝලන්ත මුර භටයෝ අන්දමන්ද වී චකිතයෙන් යුතුව බලා සිටියහ. මේ පෙළපාළිය පිළිබඳව පෝලන්ත දේශ සීමා නිලධාරීන්ට කල් ඇතිව

දැනුම් දී තිබුණද, ඔවුහු කලබල වූහ. අසුන් පිට නැග ගත් පෝලන්ත දේශ සීමා පොලිස් නිලධාරීහු එහා මෙහා ගියහ. මුර සේවය පස් ගුණයකින් වැඩිකර තිබිණි. අසල කඳුගැට වලට එහා අතිරේක (පෝලන්ත) සේනා සැඟවී උන්හ. එහෙත්, පෙළපාළිය සෝවියට් දේශ සීමාව අසලින් ප්‍රීති ගී ගයමින්, වයමින් ගමන් කළේය.

කඳුගැටයක් උඩ පෝලන්ත මුරභටයෙක් සිටියේය. පෙළපාළිය පියවර මනිමින් ගමන් ගත්තේය. පෙළපාළියේ හඬ ඇසෙත්ම පෝලන්ත මුරභටයා තුවක්කුව උර හිසින් ගෙන ආචාර දැක්වීය. "කොමියුනයට ජයවේවා!"යි ඔහු කී සැටි කොර්චාගින්ට පැහැදිලිව ඇසිණි.

ඒ වචන කීවේ තමා බව ඔහුගේ දීප්තිමත් නෙත් කියා පායි. පාවෙල් කොර්චාගින් ඔහු දෙස බලාගත්වනම සිටියේය.

ඔහු මිතුරෙකි! සෙබළ ඇඳුමකින් සැරසී සිටියද, ඔහු පෙළපාළියට හිතවත් කමක් දක්වයි. පාවෙල් ඔහුට පෝලන්ත බසින් පිළිතුරු දුන්නේය.

"සහෝදරයා සුබ පැතුම්!"

පෙළපාළිය යත්ම, පෝලන්ත මුර භටයා ආචාර කරමින් සීරුවෙන් සිටියේය. කළු පාට ඇඳුමක් ඇඳ සිටි කුඩා මුරභටයා දෙස පාවෙල් කීප වරක් හැරී බැලීය. ඊළඟට වෙනත් ආකාරයක පෝලන්ත භටයෙකි. ඔහුගේ උඩුරැවුළ යන්තමින් ඉදිලාය. හිස් වැස්මට යටින් ඇති ඔහුගේ දෙනෙත් කිසිවක් නොකියයි. පළමු සෙබළාගේ හැසිරීම නිසා ප්‍රීතියෙන් ඔද වැඩී ගිය පාවෙල් තමාටම කියා ගන්නාක් මෙන් පෝලන්ත බසින් මෙසේ මිමිනුවේය.

"ආයුබෝවන් සහෝදරයා!"

පිළිතුරු නොලැබිණි.

ගව්රිලොව් මඳ සිනා පෑවේය. ඔහු මේ සියල්ලම අසා සිටි බැවිනි.

"යාළුවා නුඹ බොහෝ දේ බලාපොරොත්තු වෙනවා. සාමාන්‍ය සෙබළුන් වගේම මෙතන දරදඬු පොලිස්කාරයොත් ඉන්නවා. ඔහුගේ අතේ තියෙන 'වෙවොන්' පටිය දැක්කද? ඒකා පොලිස්කාරයෙක්."

පාවෙල්ගේ මිතුරකු සහ දේශ සීමා බැටෑලියන් හමුදාවේ අණ දෙන්නා වූ ගව්රීලොව් කීවේය.

පෙළපාළියේ හිස කන්දෙන් පල්ලමට බැස ගියේ දේශ සීමාවෙන් දෙකඩ වූ ගමක් වෙතටය. ගමේ සෝවියට් කොටස

පෙළපාළිකරුවන් මහත් හරසරින් පිළිගැනීමට සූදානම් විය. කුඩා ගඟක් අසල වූ දේශ සීමා පාලම සමීපයෙහි සෝවියට් කොටසට අයත් ගම්මු එක්රැස් වූහ. ගමේ තරුණ කොටස් මඟ දෙපස පෙළ ගැසී සිටියෝය. පෝලන්ත කොටසට අයත් ගම්මු ගෙවල්වල පියස්ස උඩට හා මඩු උඩට නැගී ගෙන සෝවියට් කොටසේ උත්සවය නැරඹූහ. ගෙමිදුල්වලට හා වැටවල් අසලට රැස් වූ ගොවියෝ මහත් ඕනෑ කමින් පෙළපාළිය දෙස බලා සිටියහ. පෙළපාළිය මඟ දෙපස පෙළ ගැසී සිටින තරුණයන්ගෙන් යුත් වැටක් වැනි කොටසට ඇතුළුවත්ම බෑන්ඩ් තූර්ය වාදකයෝ ජාත්‍යන්තර ගීත ගැයූහ. ගොවීන් විසින් සාද මලින් සරසන ලද වේදිකාවක් සහිත කතා මණ්ඩපයට නැගුණු කථිකයෝ තරුණයන් හා මහල්ලන් එකසේ ප්‍රබෝධවත් කරවන කතා පැවැත්වූහ. කොර්චාගින් තම මවු බස වූ උක්රයීන් බසින් කතා කළේය. රාජ්‍ය දේශ සීමා බිඳගෙන ඔහුගේ මුවින් පිට වූ වචන ගඟින් එහා රැස් ව සිටි පෝලන්ත කොටසේ ගොවීන්ටද ඇසිණි. පෝලන්ත නිලධාරීන් එම කතා ගොවීන් නෑසිය යුතු යැ යි තීරණය කළෙන්, අසරු පොලිස් හමුදාවෝ විත් ගොවීන් ගෙවල් තුළට එළවා දොරවල් වසා දැමූහ. කස පහර දෙමින්, අහසට වෙඩි තැබූහ.

පෝලන්ත කොටසේ ගම්සභා පාරවල් හිස් විය. වෙඩි පහරින් බියට පත් තරුණයෝ ගෙවල්වල වහලවල්වලින් බිමට බැස ගෙවල් තුළට වැදුණෝය. සෝවියට් කොටසේ ගම්මු එදෙස බලත්ම, ඔවුන්ගේ මුහුණු රොස් විය. මේ ජවනිකාව නිසා කැලඹුණු සිත් ඇති මහලු ගොවියෙක්, තරුණයන්ගේ ආධාර ඇතිව, කතා මණ්ඩපයට නැඟ ඉමහත් කෝපයකින් හා සංවේගයෙන් යුතුව කතා කළේය.

"ඔන්න වැඩක හැටි! ළමයිනි බලපල්ලා! ඉස්සර අපටත් ඔය විදිහට තමා සැලකුවේ. දැන් ගොවීන් වන අපට කස පහර දීමට කිසිම කෙනෙක් ඉදිරිපත් වෙන්නෙ නැහැ. පාන්වරුන්ගේ රදල පාලනය අවසන් කළා. අපට කස පහර දීමත් නැවතුණා. මගේ දූ පුතුනි, මේ ආණ්ඩුවට බොහොම ආධාර දීපල්ලා. මම මහලු ගොවියෙක්. කතා කරන හැටි දන්නේ නැහැ. නමුත්, බොහෝ දේ කීමට මා කැමැතියි. සාර්ගේ කාලයේ අපි වැඩ කළේ හරක් වගේයි. අන්න ඒ නිසයි පෝලන්ත කොටසේ අපේ ගොවීන්ට කරන හිරිහැර දැක්කම මට දුක උපන්නේ..!" කටු ගොඩක් වූ තම අතකින්

ගඟින් එහා ගම පෙන්වා ඔහු හඬා වැලපුණේ ළමයින් හා මහල්ලන් අඬන්නාක් මෙනි.

මහල්ලාට පසු කතා කිරීමට නැගී සිටියේ ග්‍රිෂුට්කා හොරොවොද්කෝය. කෝපාන්විත ඔහුගේ කතාව අසා සිටි ගව්රිලොව් අසු හරවා පෝලන්ත කොටස දෙස විමසිල්ලෙන් බැලුවේ කිසිවකු එම කතාව සටහන් කර ගනිති දැ යි දැන ගැනීමටය. එහෙත්, ගං ඉවුර පාළු වී තිබිණි. පාලම මුර කළ සෙබළා පවා අස්කර ගෙන ඇත.

"අපේ විදේශ ඇමතිවරයා වෙත විරුද්ධත්වය ප්‍රකාශ කිරීම් එවන්නේ නැති හැඩයි." ඔහු විහිළු කළේය.

★

නොවැම්බරයේ සරත් සමයේ වැසි සහිත රැයෙකදී අන්තෝන්යුක් සහ ඔහුගේ සහචරයන් හත්දෙනාගේ මිනී මැරුම් හා කොල්ලකෑම් අවසානයට පත් විය. මයිදන් විල්ලා ගොවි ජනපදයේ පොහොසත් ගොවියකුගේ විවා මඟුලට මේ වෘකයා සහ පිරිස පැමිණියහ. හ්රොලීන් කොමියුනයේ ගොවීන් විසින් ඔවුන් වටකරන ලදි.

අන්තෝන්යුක් සහ පිරිස එම විවාහ මඟුලට සහභාගි වන බව ගමේ ගෑනු කතා කරන්නට වූයෙන්, ඒ ගැන දැන ගන්නට ලැබුණු කොමියුන් ගොවීන්ගෙන් කොම්සොමොල්වරු දෙළොස් දෙනෙක් තම අතට අසුවුණු අවි ගනිමින් අස් රියක නැග මයිදන් විල්ලාහි මඟුල් ගෙදර බලා පිටත් වූහ. ඒ අතර, ඔවුන්ගෙන් එකෙක් අසකු පිට නැගී බෙරෙස්දෙව්වලට වේගයෙන් ගියේය. සෙමාකි ගම්මානයේදී අසරුවාට පිලාතොව්ගේ අසරු කණ්ඩායම හමුවුණෙන්, ඔවුහු ඔහු සමඟ එකතුව මයිදන් විල්ලා බලා අසුන් පැන්නූහ. හ්රොලීන්ස්කි කොම්සොමොල්වරු මඟුල් ගෙදර වට කළ විට අන්තෝන්යුක් සහ සහචරයන් වෙඩි තබන්නට වූයෙන්, දෙපිල අතර වෙඩි තැබීමේ සටනක් ඇවිළිණි. සොරමුල බළකොටුවක් වැනි ඒ ගොවිගෙදර එක් කුඩා අංශයක් පාවිච්චි කරමින් ළඟට ආ හැම එකෙකුටම වෙඩි තැබීමට පටන් ගත්හ. අනතුරුව ඔවුන් වෙඩි තබමින් පැනයාමට තැත් කළද, කොම්සොමොල්වරුන් වෙඩි තැබීමට පටන් ගත්තෙන් ඔවුහු යළි පසු බැස්සාහ. එම සටනේදී එක් සොරෙක් මැරුම් කෑවේය. අන්තෝන්යුක් මෙවැනි තත්ත්වයන්ට මුහුණ පා පුරුදු ඇත්තෙකි. ඔහු එවැනි වටලෑම්වලින් පැන ගියේ අත්

බෝම්බ හා රාත්‍රී අන්ධකාරයේ ආධාරයෙනි. මෙවරද ඔහුට පැන යාමට ඉඩක් තිබිණි. කොම්සොමොල්වරුන්ගෙන් දෙදෙනෙක් තුවාල ලැබ සිටියහ. එහෙත්, පිලාතොව්ගේ අසරු හමුදව එතැනට පැමිණියේය. මේ වාරයේදී තමා අසුවන බව අන්තෝන්යුක් දැන ගත්තේය. ඔහු සහ ඔහුගේ පිරිසට උදේ එළිය වැටෙන තුරුම වෙඩි තැබූහ. එළිය වැටුණු පසු ඔවුන් අල්ලා ගත්තේය. හත්දෙනාගෙන් එකෙකුවත් යටත් නොවූ අතර, දුෂ්ට සොරමුළට අවසානය ගෙන දුන් ඒ සටනේ දී හ්රොලීන්ස්කි කොමියුනයේ සාමාජිකයන් තිදෙනෙකු දිවි පිදූ අතර, එක් සොරෙක් මැරුම් කෑවේය.

★

භෞමික හමුදවල යුද්ධාභ්‍යාස සඳහා සරත් සමයේදී කොර්චාගින්ගේ බැටෑලියනය කැඳවීය. නා කපන මහ වැස්ස නොතකා ඔහුගේ බැටෑලියනය උදේ සිට හවස් වන විට කිලෝමීටර් හතළිහක් දුර ගෙවා යුද කඳවුරට පැමිණියේය. බැටෑලියනයේ අණ දෙන නිලධාරියා වූ ගුසෙව් සහ කොමිසාර් වූ කොර්චාගින්ද අසු පිට නැඟී ගියහ. යුද සේවයට බැඳුණ නවකයන් අටසියයක් දෙනා කඳවුරට පැමිණි විගසම ඇඳන් මත වැතිර නිද ගත්හ. භෞමික ඩිවිෂන් හමුදවේ සෙනෙවි මණ්ඩලය නිසි කලට බැටෑලියනය අභ්‍යාසවලට නොකැඳවූ බැවිනි එසේ වූයේ. පසුදින යුද්ධාභ්‍යාස පටන් ගන්නා ලදී. ඊයේ රෑ පැමිණි බැටෑලියනය පිරික්සුමට භාජන විය. ඩිවිෂනයේ සෙනෙවි මණ්ඩලයේ සිට අසරුවෝ පැමිණියහ. යුද ඇඳුමින් සැරසී රයිපල් තුවක්කු ගෙන සිටි නවකයෝ අමුතු සිරියක් පෑවෝය. බැටෑලියනයේ යුද්ධ අණ දෙන නිලධාරියා වන ගුසෙව් සහ කොමිසාර් තැන් පත් කොර්චාගින් තම සේනාව ශක්තිමත් කොට පුරුදු පුහුණු කිරීම සඳහා විශාල කාලයක් හා පරිශ්‍රමයක් කැප කළහ. තම බැටෑලියනය පරීක්ෂණයෙන් සමත් වෙතියි ස්ථිරවම ඔවුහු විශ්වාස කළහ. නිල පරීක්ෂණ වාරය අවසාන වූ පසු, යුද්ධාභ්‍යාස කිරීමේ දක්ෂතාව පෙන්වීමෙන් අනතුරුව, ලස්සන නමුදු, වැහැරුණු මුහුණක් ඇති යුද්ධ නිලධාරියෙක් කොර්චාගින්ගෙන් දැඩි ලෙස ප්‍රශ්න කළේය.

"ඔබ අස්පයා පිට නැඟලා ඉන්නේ ඇයි? යුද්ධාභ්‍යාසවල යෙදෙන බැටෑලියන්වල අණ දෙන නිලධාරීන්ට සහ කොමිසාර්වරුන්ට අසුන් පිට යාම යුතු නැහැ. වහාම

අස්වයාව ඉස්තාලෙට භාර දීලා යුද්ධාභ්‍යාසවල පාබළ සේනා සමඟ එකතු විය යුතුය කියලා මම අණ කරනවා.”

අසු පිටින් බිමට බටහොත් තමාට එක කිලෝමීටරයක්වත් පයින් යාමට නොහැකි බව, කොර්චාගින් දැන සිටියේය. එහෙත්, නොයෙකුත් උර පටි පැලඳගෙන සිටින මේ සෝෂාකාරී නිලධාරියාට ඒ බව දන්වන්නේ කෙසේද?

“අසු නැතිව මට යුද්ධාභ්‍යාසවල යෙදෙන්නට බැහැ.”

“මන්ද?”

තම තත්ත්වය වෙනත් විදිහකින් ඔහුට අවබෝධ කර දීමට බැරි බව වටහාගත් කොර්චාගින් ගොළු හඬකින් මෙසේ කීය.

“මාගේ දෙපා ඉදිමිලා. සතියක් මට දුවන්ටයි, ඇවිදින්ටයි බැහැ. ඒ හැර ඔබ දරන නිලය මා දන්නෙ නැහැ සහෝදරයා.”

“මම ඔබගේ රෙජිමේන්තුවේ සෙනෙවි මණ්ඩලයේ ප්‍රධානියා. ඒක පළමුවැන්නයි. දෙවැන්න මම නැවත වරක් අණ කරනවා ඔබට අසු පිටින් බහින්න කියා. ඔබ රෝගියෙක් නම්, යුද සේවයට බැඳී ඉන්න එක ගැන මා වරදකරුවෙක් නොවෙයි.”

කොර්චාගින්ට අදිසි කස පහරක් ලැබුණු විටෙක මෙන් දැනිණි. ඔහු අසුගේ නාස් ලණුව ඇද්දේය. එහෙත්, සවි ඇති අතක් විසින් ඔහු වළක්වන ලදි. පාවෙල්ගේ සිත තුළ හැඟීම් දෙකක් පොර බැදීය. එකක් අමනාපය නිසා පෑරුණු උඩඟුවය, අනික ඉවසීමේ ශක්තියය. එක් අංශයක සිට තවත් අංශයකට සැහැල්ලු සිතින් මාරුවෙන රතු හමුදා සෙබළකු නොවේය. පාවෙල්, බැටෑලියනයේ යුද්ධ කොමිසාර් ඔහු ය. ඒ බැටෑලියනය ඔහු සමඟය. ඔහු එලෙස හැසිරුණොත් සෙබළුනට ලැබෙන විනය පිළිබඳ නිදර්ශනය කුමක්ද? ඔහු බැටෑලියනය ඇති දැඩි කළේ මේ මාන්නක්කාර නිලධාරියා සඳහා නොවේ. ඔහු සැදෑල වළලුවලින් දෙපා ඉවත ගෙන සන්ධිවලින් පැන නඟින ඉමහත් වේදනාව ඉවසාගනිමින් බිමට බැස පෙළ ගැසී සිටින හමුදාවේ දකුණු අංශයට දෙපයින් ගමන් කළේය.

★

දවස් කීපයක් තිස්සේ කාලගුණය ඉතා යහපත් විය. යුද්ධාභ්‍යාස කෙළවර වෙමින් තිබිණි. පස්වැනි දවසේදී ෂෙපෙතෝව්කා අවට අවසාන ස්ථානයේ එය පැවැත්විණි. බෙරෙස්දෙව් බැටෑලියනයට ක්ලිමෙන්තෝවිච් ගමෙන් විත්

නගර දුම්රියපොළ අල්ලා ගැනීමට තීරණය කර තිබිණි. ෂෙපෙතෝව්කාව හා ඒ අවට ඉතා හොඳින් දැන සිටි පාවෙල් කොර්චාගින් නගර දුම්රියපොළ වෙත යා හැකි සියලු මාර්ග හා අන්තර් මාර්ග ගූසෙව්ට පෙන්වා දුන්නේය. බැටැලියනය දෙකඩ වී බෙදී අතුරු මඟක් ඔස්සේ ගොස් 'සතුරු' කඳවුරේ පිටිපසට වැද ජය ඝෝෂා නගමින් දුම්රිය ස්ථානයට වැදුණේය. නිරීක්ෂකයන්ගේ තීරණය අනුව එම අභ්‍යාසය ඉතා උසස් අන්දමින් කොර්චාගින්ගේ බැටැලියනය විසින් සපුරාලන ලදි. බෙරෙස්දෙව් බැටැලියනය දුම්රිය ස්ථානය අල්ලාගත් අතර 'සතුරාට' තම සේනා බලයෙන් සියයට පනහක් නැතිව ගියෙන් ඔහු කැලයට පසුබැස ගියේය.

බැටැලියනයෙන් අඩකට අණ දීමේ කාර්යය කොර්චාගින් භාර ගත්තේය. පෙළට විත් විහිදී යාමට සෙබළුන්ට අණ කළ ඔහු තුන්වැනි සේනාංකය භාර නිලධාරියා හා දේශපාලන කණ්ඩායම මෙහෙයවන්නා සමඟ සාකච්ඡා කරමින් සිටියේය.

"කොමිසාර් සහෝදරයා, බැටැලියනයේ අණ දෙන සහෝදරයා අහනවා අපේ මැෂින් තුවක්කු කණ්ඩායම් දුම්රිය සන්ධි අල්ලා ගත්තද කියලා. දැන් කොමිෂන් සභාව මෙහාට ඒවි." කොර්චාගින් වෙත පැමිණි රතු සෙබළෙක් හති දමමින් දැන්වීය.

පාවෙල් සේනාංක නිලධාරීන් සමඟ දුම්රිය මංසන්ධියට ගියේය.

දුම්රිය මංසන්ධිය අසල රෙජිමේන්තුවේ නිලධාරීහු රැස්ව සිටියහ. යුද්ධාභ්‍යාස ඉතා ඉහළින් සපුරාලීම නිසා ගූසෙව්ට ඔවුහු ස්තුති කළහ. 'සතුරු' බැටැලියනයේ නිලධාරීන් කොතරම් ලජ්ජාවට පත්වීද යත්, ඔවුහු නිදහසට කරුණු කීමට පවා ඉදිරිපත් නොවූහ.

"එය මගේ හපන්කමක් නොවෙයි. කොර්චාගින් මේ පළාතේ කෙනෙක්. එයා තමා අප මෙතැනට ගෙනාවේ." ගූසෙව් පැවසීය.

රෙජිමේන්තුවේ සෙනෙවි මණ්ඩලයේ ප්‍රධානියා අසු දක්කමින් පාවෙල් අසලට ගොස් උපහාසාත්මක ලෙස මෙසේ පැවසීය:

"සහෝදරයා, තමුසෙට ඉතා හොඳට දුවන්ට පුළුවන් නොවැ. තමුසේ අස්පයා පිටින් ගියේ ප්‍රදර්ශනයට, එහෙම නේද?" ඔහු තවත් යමක් කීමට සූදනම් වුණද, පාවෙල්ගේ විලාසය දුටු නිසා දෝ නිහඬ විය.

රෙජිමේන්තුවේ නිලධාරි පිරිස ගිය පසු කොර්චාගින් ගුසෙව්ගෙන් සෙමින් ඇසීය.

"නුඹ අරයගෙ නම දන්නවද?"

ගුසෙව් ඔහුගේ උරහිසට තට්ටු කරමින් මෙසේ කීයඃ

"ඒ උඩගු මිනිහා ගැන නුඹ සැලකිලමත් වෙන්ට එපා. ඔහුගේ නම චුෂානින්. ඔහු ඉස්සර සුළු නිලධාරියෙක්."

එදින කීප වරක්ම කොර්චාගින් එම නම මීට පෙර අසා ඇත්තේ කොහේ දැයි මතක් කිරීමට උත්සාහ ගත් නමුදු අපොහොසත් විය.

★

යුද්ධාභ්‍යාස අවසන් විය. ඉතා උසස් ලෙස සම්මාන ලැබූ බැටැලියනය බෙරෙස්දෙව්වලට ගිය අතර කොර්චාගින් ශාරීරික වශයෙන් ඉමහත් පීඩාවට පත් වී සිටියෙන්, ඔහු වෙත ගොස් දෙදවසක් විවේක ගත්තේය. ඔහු සිය අසු අර්ට්යොම් ළඟ නැවැත්වීය. දෙදවසක් තිස්සේම පාවෙල් දවසකට පැය විස්සක් බැගින් නිදාගෙන සිට තෙවැනි දවසේදී අර්ට්යොම් හමුවීමට ඩිපෝවට ගියේය. මෙතැන, දුමෙන් කළු පැහැගෙන ඇති ගොඩනැගිල්ල ඔහුගේ ගෙදර මෙනි. ඔහු ගිජු ලෙස බිම් අඟුරු දුම් ආශ්වාස කළේය. ළමා වියෙහි පටන් තමාට සුපුරුදු, තමා හැදී වැඩුණු වටපිටාව, තමාගේම ජන්ම ස්ථානය ලෙස සැලකිය හැකි එම ස්ථානය පාවෙල්ගේ සිත තදින් ඇද ගත්තේය. තමාට සුපුරුදු යමක් නැති වූ කලෙක මෙන් ඔහුට දැනිණි. දිගු කලක් තිස්සේ මුහුදු නොගිය නාවිකයකු මහා සාගරය ගැන සිතමින් ළතැවෙන්නේ යම් සේද, එසේම ගිනි උදුන් කම්කරුවෙකු හා විදුලි කාර්මික ශිල්පියෙකු වූ කොර්චාගින් තමාට සුපුරුදු දෙයක් වූ දුම්රිය යන්ත්‍රයක හූ හඬ මාස කීපයක්ම නොඇසීම නිසා මහත් කාන්සියකින් පෙළිණි. එම හැඟීම් යටපත් කිරීමට ඔහුට බොහෝ කලක් ගත විය. ඔහු තම වැඩිමහලු සොහොයුරා සමඟ කතා කළේ ටිකකි. අර්ට්යොම්ගේ නළලේ රැලිවලට තවත් එකක් අලුතින් එකතු වී තිබෙන බව ඔහු දුටුවේය. අර්ට්යොම් දැන් ජංගමශීලී පට්ටලයක වැඩ කරයි. ඔහුට දැන් දරුවන් දෙදෙනෙකි. ඔහුට ජීවිතය අසීරු බව පෙනේ. අර්ට්යොම් ජීවිතය ගැන නොකීවද, එය පෙනෙන්ට තිබිණි.

පැයක්, දෙකක් එකට වැඩ කළ අයිය මලෝ දෙදෙනා, අනතුරුව විසිර ගියහ. දුම්රිය මංසන්ධිය අසල තම අශ්වයා

නැවැත්වූ පාවෙල් බොහෝ වේලාවක් දුම්රිය ස්ථානය දෙස බලා සිටියේය. ඉනික්බිති ඔහු තම අසුගේ ගෙල පටි ඇද කැලෑව ඔස්සේ වේගයෙන් අසු පැන්නීය.

දැන් කැලෑ මාර්ගවල යාම අනතුරුදායක නොවේ. පල්හොරුන්ගේ විශාල හා කුඩා කණ්ඩායම් සියල්ල විනාශ කර දැමූ බොල්ෂෙවික්වරු ඔවුන්ගේ තිප්පොළවල් හා මර්මස්ථාන සියල්ල සමූල ඝාතනය කර දැමූහ. මේ නිසා ප්‍රදේශයේ ගම්වල ජීවිත නිසල විය.

දහවල් දෙළහ වනවිට පාවෙල් බෙරෙස්දෙව්වලට පැමිණියේය. ප්‍රාදේශීය කාර්යාලයේ එළිපත අසලදී ලීඩා පොලෙවික් ඔහු සාදරයෙන් පිළිගත්තාය.

"ඔන්න යාන්තම් ඔබ ආවා! ඔබ නැතිව අපට පාළුයි." ලීඩා ඔහුගේ උරහිස් බදාගෙන කාර්යාලයට ඇතුළු වුණාය.

"රස්වලීහින් කොහිද?" පාවෙල් කොර්චාගින් තම උඩු කබාය ගලවමින් ඇසුවේය.

ලීඩා පිළිතුරු දුන්නේ කැමැත්තකින් නොවේ.

"ඔහු කොහේදැයි මා දන්නෙ නැහැ. ආ... මතක් වුණා. ඔහු පාසලට ගියා සමාජ විද්‍යාව පිළිබඳව පාඩම් ගැනීමට. ඒ කාරිය අයිති කොර්චාගින්ට නොව, ඔහුට බව ඔහු කීවා."

එම පුවත නිසා පාවෙල් අසතුටු සිතින් මවිතයට පත් විය. රස්වලීහින් අහිතකර පුද්ගලයකු බව ඔහු දැන සිටියේය.

"මේ මිනිහා පාසලට ගිහින් මොනවා කරනවාද?" පාවෙල් අසතුටු සිතින් කල්පනා කරන්නට විය.

"හොඳයි කමක් නැහැ. මෙහෙ හොඳ තොරතුරු මොනවාද? ග්‍රුෂෙව්කාවලට ගියාද? එහෙ තරුණයන්ගෙ තත්ත්වය කොහොමද?"

ලීඩා පොලෙවික් ඔහුට සියලු තොරතුරු කීවාය. විඩාපත් දෙපාවලට විවේකයක් ලබාදෙමින් පාවෙල් සෝපාවෙක වැතිර සිටියේය.

"රකීතිනාව පෙරේද පක්ෂයේ අපේක්ෂක සාමාජිකාවක ලෙස බඳවා ගත්තා. පද්දුබ්ට්සිවල පක්ෂ ශාඛාව මේ නිසා තවත් ශක්තිමත් වෙනවා. රකීතිනා ඉතා හොඳ තරුණියක්. මම ඇයට බොහොම කැමතියි ජේනවද, දැන් ගුරුවරුන් අතර වෙනසක් ඇතිවෙන්නට පටන් ගෙන. සමහර අය සම්පූර්ණයෙන්ම අපේ පැත්ත ගන්නවා."

සමහර දවස්වලදී හවස ලිසීට්සින්ගේ ගෙදර ලොකු මේසය වටේ රෑ බෝවන තුරු කීපදෙනෙක් වාඩි වී සිටිති.

ඔවුන් නම් ලිසීට්සින්, කොර්චාගින් සහ පක්ෂයේ ප්‍රාදේශීය ලේකම් ලෙස අලුතින් පැමිණි ලිච්කොව්ය.

නිදන කාමරයේ දොර වසලාය. අන්යූට්කා සහ කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපති ලිසීට්සින්ගේ බිරිඳ එහි නිදති. තිදෙනාම ලොකු මේසය වටා වාඩි වී, හිස් පෙරටු කරගෙන පක්රොව්ස්කිගේ ඉතිහාසය නමැති පොත කියවති. ලිසීට්සින්ට කිසියම් දෙයක් ඉගෙන ගැනීමට වේලාව ඇත්තේ රැයෙහිදී පමණකි. ගම්වලට යන පාවෙල් නැවත ලිසීට්සින්ලාගේ ගෙදර පැමිණි විට, ලිච්කොව් සහ නිකොලායි ලිසීට්සින් පොත බොහෝ දුරට කියවා ඇති බව දැන ගන්නේ ඉතා කනස්සල්ලෙනි.

පද්දුබ්ට්සිවල සිට සංවේගාත්මක පුවතක් පැමිණියේය. නාඳුනන පුද්ගලයන් විසින් රාත්‍රියේදී ග්‍රිෂුට්කා හොරවොද්කෝ මරා දමන ලදි. පාවෙල් තම දෙපාවල වේදනාව පවා අමතක කොට විනාඩි කීපයකින් කෘත්‍යාධිකාරී කමිටුවේ ඉස්තාලයට දුව ගොස් අසෙකු පිට නැඟීගෙන දේශ සීමාව දක්වා වේගයෙන් උඟ පැන්නවීය.

සෝවියට් ගම්සභා කාර්යාලයේ කොළ අතු ඇතිරූ මේසයක් මත ග්‍රිෂුට්කා හොරවොද්කෝගේ මළ සිරුර සතප්පවා එය සෝවියට් ධජයෙන් වසා තිබිණි. ආණ්ඩුවේ නිලධාරීන් පැමිණෙන තුරු සිරුරට කිසිවෙකුට ළං වීමට ඉඩ නොදුන්නේය. සිරුර අසල දේශ සීමාවේ රතු සෙබළෙක් හා කොම්සොමොල් සාමාජිකයෙක් මුර කළහ. කොර්චාගින් ගම්සභා කාර්යාලයේ මේසය අසලට ගොස් රතු ධජය මෑත් කෙළේය.

ග්‍රිෂුට්කාගේ මළ සිරුර ඉටි මෙන් සුදු පැහැතිය. දෙනෙත් දෙවට පැනීමට තරම් විවෘතව ඇත. එය ඔහුගේ මරණ මොහොතේදී ඔහු විඳි දුක් පීඩා කියා පාන්නකි. ඔහුගේ මළ සිරුරේ දෙතොල් පැත්තකට වැටී තිබිණි. ඔහුගේ හිසෙහි පසු පස කොටස කිසියම් තියුණු අවියකින් බිඳ තිබුණෙන්, එය වසා ඇත්තේ නත්තල් ගසක අත්තකිනි.

මේ තරුණයාට එදිරිව ඔසවා ඇත්තේ කාගේ අතද? ග්‍රිෂුට්කා හොරොවොද්කෝ පවුලේ සිටි එකම පුතාය. ඔහුගේ පියා කුලී ගොවි කම්කරුවෙකු විය. ඔහු විප්ලවයට පසු ඇති වූ සිවිල් යුද්ධයට ගොස් ජීවිතය පූජා කළෙන් ඔහුගේ බිරිඳ පුතාත් සමඟ කල් ගෙවූවාය. විප්ලවයෙන් පසු ග්‍රිෂුට්කාගේ පියා දුප්පත් ගොවීන්ගේ කමිටුවේ සාමාජිකයෙකුව සිටියේය.

පුතාගේ මරණය ඇසූ ග්‍රිෂුට්කාගේ මැණියෝ සිහිසන් නැතිව ඇද වැටුණෙන්, අසල්වැසියෝ ඇය වත්තන් කර ගෙන ගොස් ඇයට සාත්තු කළහ. ඇගේ පුතා තම මරණය පිළිබඳ අබිරහස හෙළි නොකරමින් වැතිර සිටී. ග්‍රිෂුට්කාගේ මරණය නිසා මුළු මහත් ගමම කෝපාන්විතව නැඟී සිටියේය. තරුණ කොම්සොමොල් නායකයා සහ දුප්පත් ගොවීන්ගේ ආරක්ෂකයා වූ ග්‍රිෂුට්කාට ගමේ හතුරන්ට වඩා මිතුරන් සිටිය බව හෙළි විය.

ග්‍රිෂුට්කාගේ මරණය නිසා කම්පනයට පත් රකීතිනා සිය කාමරයට වැදී අඬන්නට වූවාය. කොර්චාගින් පැමිණි විට පවා ඈ හිස ඔසවන්නේ පවා නැතිව අඬමින් සිටියාය.

"රකීතිනා ඔබගේ අදහස මොකක්ද, ඔහුව මැරුවේ කවුද?" පහත් හඬින් ඇසූ කොර්චාගින් බරැති ලෙස පුටුවක් මත වාඩි විය.

"මෝලේ හොරු කට්ටිය හැර වෙන කවුද? කුට ජාවාරම් කාරයන්ට විරුද්ධව ග්‍රිෂුට්කා නැඟී සිටියා නේද?"

ග්‍රිෂුට්කා හොරොවොද්කෝගේ මළ සිරුර වැළලීම පිණිස ගම් දෙකකින් ජනතාව පැමිණියහ. කොර්චාගින් තම බැටැලියන් හමුදුව ගෙනාවේය. ප්‍රදේශයේ කොම්සොමොල් සංවිධානයේ සියලු සාමාජිකවරු පැමිණියහ. ගව්රිලොව් දේශ සීමා සෙබළුන් දෙසිය පනස් දෙනෙකු සෝවියට් ගම් සභාවේ චතුරශ්‍රයේ සිටවිය. සංවේගය දනවන සංගීතය අනුව පා තබමින් රතු රෙදිවලින් වැසූ පෙට්ටියක බහාලූ ග්‍රිෂුට්කාගේ මළ සිරුර චතුරශ්‍රයට ගෙනාවේය. සිවිල් යුද්ධ කාලයේදී දිවි පිදූ බොල්ෂෙවික් දේශප්‍රේමීන්ගේ සොහොන් කොත් අසලම වළක් හෑරුවේය.

ග්‍රිෂුට්කා සිය ජීවිත කාලයේදී කිසිවකුගේ අයිතිවාසිකම් ආරක්ෂා කළේද, ඔවුහු හැමදෙනාම ඔහුගේ මරණය නිසා එක්සත්ව නැඟී සිටියහ. දුප්පත් හා කුලී ගොවි තරුණයෝ කොම්සොමොල් ශාඛාවට ආධාර දීමට පොරොන්දු වූහ. ඔහුගේ මිනීවළ අසල කතා කළ හැම කථිකයෙක්ම මිනීමරුවන් සොයා අල්ලා ගත යුතු බවත්, ඔවුන් මේ චතුරශ්‍රයට ගෙනැවිත්, හැමදෙනාටම ඔවුන් බලා ගනු පිණිස ඔහුගේ මිනී වළ අසල නඩු ඇසිය යුතු බවත් කියා සිටියහ.

තෙවරක්ම ආචාර වෙඩිමුර පැවැත්විණි. තුරු අතු ග්‍රිෂුට්කා හොරොවොද්කෝගේ මෘත දේහය බහා ලූ මිනී වළට උඩින් තැබිණි. එදින හවස එගම කොම්සොමොල් ශාඛාවේ ලේකම්

ධුරයට රකීතිනා තේරී පත් වූවාය. දේශ සීමාවේ මුරපොළින් කොර්චාගින්ට පණිවුඩයක් ලැබිණි. එය මිනීමරුවන් ලුහුබැඳ යන බව දැක්වෙන පුවතකි.

ඊට සතියකට පසු පළාතේ රඟහලේදී ප්‍රාදේශීය සෝවියට් සභාවල දෙවැනි සම්මේලන වාරය පැවැත්විණි. ලිසීට්සින් දැඩි ලෙසත්, උත්සවාකාර ලෙසත් තම වාර්තාව ඉදිරිපත් කළේය.

"සහෝදරවරුනි, පසුගිය වසර තුළදී අපට විශාල වැඩ කොටසක් සපුරාලීමට පුළුවන් වූ බව මා වාර්තා කරන්නේ සතුටකිනි. මේ පෙදෙසේ සෝවියට් බලය අපි ගැඹුරු ලෙස තහවුරු කර ඇත්තෙමු. පල්හොරුන්ගේ ව්‍යාපාර මුලිනුපුටා දමා ඇත. නීති විරෝධී ලෙස බඩු එහා මෙහා ගෙනයාම නවත්වා ඇත්තෙමු. ගම්වල දුප්පත් ගොවීන්ගේ සංවිධාන පැන නැඟී ශක්තිමත් වී ඇත. කොම්සොමොල් තරුණ සංවිධාන දස ගුණයකින් වැඩි වී ඇති අතර, පක්ෂය පුළුල් වී ඇත. පද්දුබ්ට්සිවල කුලාක්වරුන් හොරොවොද්කෝ සහෝදරයාව මරා දමා කළ අවසාන අපරාධය හෙළිදරව් වී ඇත. මෝල් හිමියා සහ ඔහුගේ බෑනා හිර භාරයට ගෙන තව දින කීපයකින් ගුබේර්නියා අධිකරණය ඉදිරියට පමුණුවන්නෙමු. ගම්වලින් පැමිණි නියෝජිත මණ්ඩල කීපයක්ම පල්හොරුන්ට හා ත්‍රස්තවාදීන්ට මරණ දඬුවම දිය යුතු යැයි ඉල්ලා යෝජනා අප වෙත එවා ඇත."

සම්මේලන ශාලාවෙන් අනුමත කරන විශාල හඬක් ඇසිණි.

"යෝජනාවට එකඟයි. සෝවියට් ආණ්ඩුවේ සතුරන්ට මරණ දණ්ඩනය නියම කළ යුතුයි."

එක් දෙරකින් සම්මේලන ශාලාවට ලීඩා පොලෙවික් ඇතුළු වූවාය. ඈ ඇඟිල්ලකින් පාවෙල්ට සංඥා කළාය.

කොරිඩොරයේදී ලීඩා විසින් පාවෙල් අත 'හදිසියි' ලේබලය අලවා ඇති ලියුම් කවරයක් තබන ලදි. ඔහු එය කඩා බැලීය.

"බෙරෙස්දෙව් ප්‍රාදේශීය කොම්සොමොල් කමිටුව වෙතටයි, මින් එක පිටපතක් පක්ෂයේ ප්‍රාදේශීය කමිටුවටය. ගුබේර්නියා කමිටුවේ තීරණයක් අනුව කොර්චාගින් සහෝදරයාට වෙනත් වගකිව යුතු කොම්සොමොල් තනතුරක් භාරදීම සඳහා ගුබේර්නියා කමිටුව ඔහු කැඳවයි."

අවුරුද්දක් වැඩ කළ පෙදෙසට පාවෙල් කොර්චාගින්

ආයුබෝවන් කීය. ඔහු සහභාගි වූ අවසාන ප්‍රාදේශීය පක්ෂ කමිටුවේ රැස්වීමේ න්‍යාය පත්‍රයේ කරුණු දෙකක් විය. පළමුවැන්න පාවෙල් කොර්චාගින්ට කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකත්වය පිරිනැමීම. දෙවැන්න ප්‍රාදේශීය කොම්සොමොල් කමිටුවේ ලේකම් ධුරයෙන් ඉවත්ව යන ඔහුට චරිත සහතිකයක් දීම.

කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපතිවර ලීසිට්සින් සහ ලීඩා පොලෙවික් ඔහුගෙන් සමුගනිමින් ඔහුට අත දී ආචාර කළේ ඉමහත් ආදරයකිනි. කොර්චාගින් අසු පිට නඟිත්ම දස දෙනෙක් පිස්තෝලවලින් ආචාර වෙඩි තබා ඔහුගෙන් සමු ගත්හ.

V

ට්‍රෑම් රිය පුන්ඩුක්ලේව්ස්කායා වීදිය ඔස්සේ දිවගියේ මෝටරයේ හඬ අසීරු ලෙස නංවමිනි. ඔපෙරා රඟහල ඉදිරියේදී එය නැවැත්වීය. තරුණ කණ්ඩායමක් ඉන් පිටතට බටුයේය. ට්‍රෑම් රිය උඩහ වීදිය ඔස්සේ නැවත දුවන්නට විය.

සෙමෙන් ගමන් කරන්නවුන් දෙස බැලූ පන්ක්‍රාතොව් ඔවුන් ඇමතීය.

"කොල්ලනේ යමු. අප පමාවීම නම් සහතිකයි."

ඕකුන්යෙව් රඟහල අසල දී ඔහු වෙත ළං විය.

"ගේන්කා නුඹට මතකද, මීට අවුරුදු තුනකට ඉස්සෙල්ලා අපි නුඹත් සමඟ මෙතනට ආවා. එද දුබාවා "කම්කරු විරුද්ධ පක්ෂය" සමඟ අප වෙත ආවා. එද රැස්වීම අපූරුයි! අද අපි දුබාවත් සමඟ ආයෙමත් සටන් කරමුද?"

පන්ක්‍රාතොව්, ඕකුන්යෙව්ට පිළිතුරු දුන්නේ රැස්වීම් ශාලාවට ගිය පසුය. ඇතුළුවන තැන සිටි කණ්ඩායමට ප්‍රවේශ පත්‍ර පෙන්වීමෙන් අනතුරුවය.

"ඔව්, මිත්‍යායි දුබාවාගේ ඉතිහාසය ආයෙමත් එම තැනදීම නැවත සිදුවෙලා."

ඔවුන්ට නිහඬ වන ලෙස රැස්ව සිටියහු අණ කළහ. තමන් අසලම තිබූ ආසනවල වාඩිවීමට ඔවුන්ට සිදුවූයේ සාකච්ඡාවේ හවස සැසි වාරය ඇරඹී තිබුණු බැවිනි. කතා මණ්ඩපයේ කාන්තාවකි.

"හරියට වෙලාවටම බිරිඳ පොඩිත්ත මොනවද කියන්නෙ කියලා වාඩිවෙලා අහපන්." ඕකුන්යෙව්ගේ ඉළයට වැළමිටින් තට්ටු කළ පන්ක්‍රාතොව් මිමිනුවේය.

"....ඇත්ත තමා. සාකච්ඡාවට අපේ වේලාවයි ශක්තියයි බොහොම ගෙවී ගියා. නමුත්, එයට සහභාගි වුණු තරුණයන්ට බොහෝ අලුත් දේ දැනගන්නට ලැබුණා. අපේ සංවිධානය තුළ ට්‍රොස්කිගේ අනුගාමිකයන් පරාජයට පත්වීම ගැන අපි අතිශයින්ම සතුටු වෙනවා. ඔවුන්ගේ අදහස්වලට අපි සවන් නොදුන්නයි කියලා ඔවුන්ට පැමිණිලි කළ නොහැකියි. නැත. සිදුවුණේ ඒකේ අනික් පැත්තයි. ඔවුන්ට කොතරම් නිදහස් ලෙස හැසිරෙන්නට අප ඉඩ දුන්නේද යත්, පක්ෂයේ විනය ඉතා සැහැසි ලෙස කඩකිරීමට ඔවුන්ට පිළිවන් වුණා."

තාල්යා කැලඹීමට පත් වූවාය. ඇගේ හිසෙහි කෙස් කැරැල්ලක් නිතර නිතර ඉදිරියට කඩා වැටීමට පටන් ගත්තෙන්, කතාවට බාධා ඇතිවිය.

"ට්‍රොස්කිවාදීන් ප්‍රයෝජනයට ගත් ක්‍රම හා ආකාර ගැන අනික් පෙදෙස්වලින් පැමිණි සහෝදරවරුන් කළ විස්තර අපි අසා සිටියෙමු. මේ සාකච්ඡාවේද ට්‍රොස්කිවාදීන් සෑහෙන සංඛ්‍යාවක් ඉන්නවා. ප්‍රාදේශීය මණ්ඩල ඔවුන්ට වුවමනාවෙන් ම නියෝජිත බලය දී තිබෙනවා. නගරයේ පාක්ෂික සාකච්ඡා සභාවට ඔවුන්ගේ අදහස් අසා දැන ගැනීමට අවස්ථාවක් එයින් ඇති කර දී ඇත. ඔවුන් සංඛ්‍යාව අනුව අඩුවෙන් කතා කරති නම් වරද අප අත නොවෙයි. පක්ෂ ශාඛාවලදීත්, ප්‍රාදේශීය මණ්ඩලවලදීත් ඔවුන් ලැබූ සම්පූර්ණ පරාජය නිසා සමහරුන් පාඩම් ඉගෙන ගෙන තිබෙනවා. ඊයේ ඔවුන් කී දේ මේ කතා මණ්ඩපයේ සිට යළිත් කීම අමාරු කාරණාවක්."

ශාලාවේ දකුණු පැත්තේ සිට කිසිවෙක් කතාවට බාධා කරමින් ගොරෝසු හඬකින් කෑ ගැසූහ.

"තවම කිව යුතු දේ කිව්වේ නැහැ."

තාල්යා ලගුටිනා හැරී බැලුවාය.

"ඉතින් මොකද දුබාවා. මෙහාට එන්න. ඇවිත් කියන්න. අපි අහන්න ලෑස්තියි."

දුබාවා ඇය දෙස බැරෑරුම් ලෙස බැලීය. ඔහුගේ දෙතොල් කෝපය නිසා විකෘති ලෙස නැමී තිබිණි.

"වෙලාව ආවාම කියන්නම්!" තමා හොඳින් දන්නා ප්‍රදේශයේදී ඊයේ තමාට අත් වූ පරාජය ගැන මතක් වූ දුබාවා කෑ ගැසීය.

රැස්වීම් ශාලාව පුරා පහත් හඬක් පැතිරිණි. පන්ක්‍රාතොව්ට ඉවසුමක් නැති විය.

"පක්ෂය තව පාරක් සොලවන්නට නුඹලා කල්පනා කරනවද?"

දුබාවා ඔහුගේ කටහඬ හැඳින ගත්තද, හැරී බැලීමට පවා ඉදිරිපත් නොවීය. වේදනා ඇතිවන තුරු තොල් සපාගත් ඔහු හිස බිමට හරවා ගත්තේය.

තාල්යා දිගටම කතා කළාය.

"පක්ෂයේ විනය ට්‍රොස්කිවාදීන් කඩකරන්නේ කොහොමද කියන එක ඉතා හොඳට පෙන්වාදෙන නිදසුනක් තමා දුබාවා. ඔහු පැරැණි කොම්සොමොල් සේවකයෙක්. බොහෝ දෙනෙකු ඔහුව හඳුනනවා. අවි සාදන 'ආසනල්' කම්කරුවෝ ඔහුව විශේෂයෙන් හඳුනනවා. දුබාවා හාර්කොව්හි කොමියුනිස්ට් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙක්. ඔහු දැන් සුමාන තුනක් තිස්සේ ෂ්කොලෙන්කෝ සමඟ මෙහි ඇවිත් ඉන්නවා. විශ්ව විද්‍යාලයේ දේශන හා පන්ති පැවැත්වෙන විට ඔවුන් මෙහි ආවේ කුමකටද? ඔවුන් නොගිය පළාතක් මේ නගරයේම නැහැ. ඔවුන් හැම තැනම ගිහිල්ලා තම අදහස් කියා පෑවා. පසුගිය දවස්වලදි ෂ්කොලෙන්කෝට සිහි නුවණ තරමක් ඇවිත් තිබෙන බව පේනවා. ඔවුන්ව මෙහාට එවුවේ කවුද? මේ අය හැර තවත් වෙනත් සංවිධානවලට අයත් ට්‍රොස්කිවාදීන් සෑහෙන ගණනක් මෙහි ඉන්නවා. මේ අය ඉස්සර මෙහි වැඩ කළා. දැන් මෙහි ඇවිත් ඉන්නවා, පක්ෂ අභ්‍යන්තර අරගලය නමැති ගිනි ඇවිළවීමට. ඔවුන් අයත් පක්ෂ සංවිධාන දැන් ඔවුන් නතර වී සිටින ස්ථාන ගැන දන්නවාද? සත්තකින්ම නැහැ. මෙ සාකච්ඡාව ට්‍රොස්කිවාදීන් කළ වැරැදි ඔවුන් පිළි ගනිති යි බලාපොරොත්තු වුණා."

ඔවුන් කළ වැරැදි ඔවුන් ලවා පිළිගැනීමකට වෙහෙස දැරූ තාල්යා කතා කළේ වේදිකාවක සිට සභාවක් අමතන ආකාරයකට නොව, සහෝදරාත්මක සාකච්ඡාවක ස්වරූපයෙනි.

"මීට අවුරුදු තුනකට ඉස්සෙල්ලා දුබාවා 'කම්කරු විරුද්ධ පක්ෂය' සමඟ අප වෙත නැවත ආවා ඔබ හැම දෙනාටම මතක ඇති. "අප අතේ ඇති පක්ෂයේ ධජය බිමට වැටීමට ඉඩ නොතබමු."යි ඔහු එදා කීවා ඔබට මතක ඇත. අවුරුදු තුනක් ගතවුණා. දුබාවා නැවත එම ධජය බිම දමා තිබේ. ඔව්, මම කියනවා ඔහු එය බිම දැම්මා කියලා. අපි 'තවම කිවයුතු දේ කීවේ නැහැ." යැයි ඔහු කී කතාවේ තේරුම, ඔහු සහ ඔහුගේ සගයෝ තව දුරටත් ක්‍රියා කරන බවයි."

පසු පස පුටු පෙළින් කට හඬක් ඇසිණි.

"ටුප්ටා බැරෝමීටරය ගැන කියපුදෙන්. ඔහු ඒ ගොල්ලන්ගෙ

කාලගුණ විශේෂඥයා.”

කිපුණුහු කතා කළහ.

“විහිළු කළා ඇති!”

“ඔවුන් උත්තර දිය යුතුය. පක්ෂයට විරුද්ධව සටන නවත්වනවාද නැත්ද?”

“පක්ෂ විරෝධී ප්‍රකාශනය ලියුවේ කවුදැයි කියලා කියපුදෙන්.”

කැලඹීම් වැඩිවූයෙන්, සභාපතිවරයා බොහෝ වේලාවක් සීනුව හැඬවිය.

කෑ කෝ ගැසීම නිසා තාල්යාගේ කතාව නැසිණි.

එහෙත්, සභාව ඉක්මනින්ම සන්සුන් වූයෙන්, ඇගේ කතාව යළි ඇසෙන්නට විය.

“ඈත පෙදෙස්වල ඉඳලා අපට ලියුම් ලැබෙනවා. ඒ ගොල්ල අප සමඟ සිටින නිසා, ඒක අපට ලොකු ආස්වාදයක්. එක ලියුමකින් කොටසක් කියවීමට අවසර දෙන්න. එය ඔල්ගා යුරේනොවාගෙන්. මෙතැන රැස්වී සිටින බොහෝ දෙනෙක් ඇය හඳුනනවා. කොම්සොමොල් ප්‍රාදේශීය කමිටුවක සංවිධාන අංශය භාරව ඈ වැඩ කරනවා.”

තාල්යා ලිපි ගොනුවකින් කඩදාසියක් ගෙන එහි ලියා ඇති අකුරු පේළි ඔස්සේ දෙනෙත් යවා කියවන්නට වූවාය.

“ප්‍රායෝගික වැඩ හැම දෙයක්ම අතපසු කොට දවස් හතරක් තිස්සේ බියුරෝවේ සාමාජිකවරු ප්‍රදේශවලට ගිහිල්ලා ඇත්තේ ට්‍රොස්කිවාදීන් මින් පෙර නොවූ විරූ අන්දමට උග්‍ර සටනක් පටන්ගෙන තිබෙන නිසායි. ඊයේ ඇති වූ සිද්ධියක් නිසා මුළු මහත් සංවිධානයේම කෝපය ඇවිස්සුණා. නගරයේ එකම ශාඛාවක්වත් බහුතර ඡන්ද දිනා ගැනීමට බැරි වූ ට්‍රොස්කිවාදියෝ සම්පූර්ණ බලය ප්‍රාදේශීය මිලිටරි කොමිසරියාට්හි පක්ෂ ශාඛාවට යෙදෙව්වා. මේ ශාඛාවට ප්‍රාදේශීය ක්‍රම සම්පාදක මණ්ඩලයේ ඉන්න කොමියුනිස්ට්වාදීන් සහ අධ්‍යාපන අංශයේ කොමියුනිස්ට්වාදීන් අයිතියි. මේ ශාඛාවේ සාමාජිකයන් හතළිස් දෙදෙනෙකි. නමුත්, සියලු ට්‍රොස්කිවාදීන් එකට එකතුවෙලා මෙතැනට ආවා. මේ රැස්වීමෙදි තරම් පක්ෂ විරෝධි කතා අපි මීට පෙර කවදවත් අහලා නැහැ. යුද්ධ කොමසාරිස් මණ්ඩලයේ වැඩ කරන එක් සාමාජිකයෙක් මෙහෙම කිව්වා. “පක්ෂයේ සංවිධාන අපට යටත් වෙන්නේ නැතිනම්, අපි ඒවා බලාත්කාරයෙන් කඩා බිඳ දමමු.” ඉන් පසු කතා කළ කොර්චාගින් මෙහෙම කීවා.

"පක්ෂයේ සාමාජිකයන් වන තමුන්නාන්සේලා මේ පැසිස්ට් වාදියාගේ කතාවට අත්පොළසන් දුන්නේ කොහොමද?" කොර්චාගින්ට වැඩිදුර කතා කිරීමට ඉඩ දුන්නේ නැහැ. කෑ කෝ ගහන්ටයි, පුටු අදිමින් ශබ්ද කරන්ටයි පටන් ගත්තා. පක්ෂ ශාඛාවේ සාමාජිකයෝ කෝපයට පත් වී කොර්චාගින්ටම කතා කිරීමට ඉඩ දිය යුතු බව ඉල්ලා සිටියා. එහෙත් පාවෙල් කොර්චාගින් කතා කරන්නට පටන් ගත් විගස ආයෙමත් කෑ කෝ ගසන්නට පටන් ගත්තා. පාවෙල් ඔවුන් දෙස බලා කෑ ගසා මෙහෙම කීවා. 'නුඹලාගේ ප්‍රජාතන්ත්‍රවාදය නම් බොහොම අපූරුයි. කොහොම වුණත් මම කතා කරනවාමයි!' එවිට මිනිසුන් කීප දෙනෙක් නැඟිට ඔහු වේදිකාවෙන් බිමට ඇද දැමීමට උත්සාහ කළා. හැම තැනම මහා කලබලයක් ඇති වුණා. පාවෙල් සමහරුන්ට පහර දී දිගටම කතා කරගෙන ගියා. ඔවුන් වැඩි ගණනක් වේදිකාවට නැගලා පාවෙල්ව අල්ලා පැත්තක දොරක් ඇරලා රැස්වීම් ශාලාවෙන් එළියට දැම්මා. එක් නීචයෙක් පාවෙල්ගේ මුහුණට පහරක් ගැසූ නිසා ලේ වැගිරුණා. ඉන් පසු පක්ෂයේ සාමාජිකයෝ සෑම දෙනෙක්ම පාහේ රැස්වීමෙන් ඉවත් වී ගියා. මේ සිද්ධියෙන් පසු බොහෝ දෙනෙකුගේ ඇස් ඇරුණා..."

තාල්යා සිය කතාව අවසන් කොට වේදිකාවෙන් ඉවත ගියාය.

★

ගුබේනියා පක්ෂ කමිටුවේ උද්ඝෝෂණ හා ප්‍රචාරක අංශය භාරව දෙමසක් තිස්සේ ක්‍රියා කළ සෙගාල්, සභාපති මණ්ඩලයේ තෝකරෙව් අසලින් වාඩි වී නියෝජිතයන්ගේ කතාවලට ඉතා වුවමනාවෙන් සවන් දෙමින් සිටියේය. මෙතෙක් වේලා සාකච්ඡා සභාව අමතා කතා කළේ කොම්සොමොල් සාමාජිකයන් වන තරුණයන්ය.

"මේ අවුරුදුවලදී ඔවුන් කොතරම් වර්ධනය වී සිටිත්ද?" සෙල්ගා සිතීය.

"විරුද්ධ පක්ෂයේ උදවියට දැනටම සැරට වදිනවා." ඔහු තෝකරෙව්ට කීය. "තවම ලොකු කාලතුවක්කු ක්‍රියාකාරී වුණේ නැහැ. ට්‍රොස්කිවාදීන්ට බැට දෙන්නේ තරුණයෝ."

මේ වර වේදිකාවට නැංගේ ටුප්ටාය. රැස්වීම් ශාලාව ඔහු අනුමත නොකරන අටියෙන් හූ හඬ තැබූහ. සමහරු

කෙටි සිනා පැහ. ටුප්ටා සභාපති මණ්ඩලය වෙත හැරී තම විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට සැරසෙත්ම, නිහඬතාව ඇති විය.

"මෙතැනදි කවුදෝ මාව කාලගුණ විශේෂඥයා හැටියට හැඳින්වූවා. නුඹලා මගේ දේශපාලන හැඟීම් පරිභවයට ලක් කරන්නේ ඔහොම තමා. බහුතර පක්ෂයේ සහෝදරවරුනි!" ඔහු එකවර කීවේය.

ඔහුගේ කතාව නිසා රැස්වීම් ශාලාව සිනා හඬින් පිරිණි. ටුප්ටා කෝපයෙන් රැස්වීම් ශාලාව සභාපති මණ්ඩලයට පෙන්වීය.

"නුඹලා කොතරම් හිනා වුණත්, තරුණයො වායු පීඩනමානය බව මම නැවත වරක් කියනවා. ලෙනින් ඒ ගැන කීප වරක්ම ලියා තිබෙනවා."

මොහොතකට රැස්වීම් හල තුළ නිහඬතාව රජ කළේය.

"ලීවේ මොනවාද?" කිසිවකු විසින් ප්‍රශ්න කරන ලදි.

ටුප්ටා ප්‍රබෝධමත් විය.

"ඔක්තෝබරයේ අවිගත් කැරැල්ලට සූදානම් වන විට, කම්කරු පන්තියට අයත් තරුණයන්ට අවි දීලා, නාවිකයන් සමඟ ඉතාම වගකිව යුතු ස්ථානවලට යවන ලෙස ලෙනින් අණ කළා. ඔබ කැමති නම් මම ඒ පිටුව කියවන්නම්? උද්ධෘත පාඨ සියල්ලක්ම මම වෙනම ලියාගෙන තියෙනවා." ටුප්ටා තම බෑගයට අත යැවීය.

"අපි එය දන්නවා!"

"සමඟිය ගැන ලෙනින් ලීවේ මොනවාද?"

"පක්ෂයේ විනය ගැන ලිව්වේ මොනවාද?"

"ලෙනින් තරුණයන් වැඩිමහලු අයට විරුද්ධව ඉදිරිපත් කළේ කොතැනදිද?"

ටුප්ටාට තම කතාව පැටලිණි. ඔහු වෙනත් දෙයක් ගැන කතා කරන්නට පටන් ගත්තේය.

"මෙතැනදි ලගුටිනා යුරේනොවාගේ ලිපියක් කියෙව්වා. සාකච්ඡාවලදි සමහර විට ඇති වන සීමාන්තික දේවලට අපට වග කියන්ට බැහැ."

ෂ්කොලෙන්කෝ අසල වාඩි වී සිටි ස්වෙතායෙව් වියරු වැටුණකු සේ මිමිනුවේය.

"මෝඩයාව යැව්වාම දෙවියන් වඳින්ට, ඌ නළල පැළෙන තුරු ඔළුව බිම ගහනවා."

ෂ්කොලෙන්කෝද එලෙසම සෙමින් පිළිතුරු දුන්නේය.

"ඔව් ඒ පල් මෝඩයා අපව අවසානය දක්වා නැති කර දමාවි."

ටුප්ටාගේ සිහින් හඬ දෙකන් විදින්නට විය.

"නුඹලා බහුතර කොටසගේ කණ්ඩායමක් හැදුවානම්, අපට අල්පතර කොටසගේ කණ්ඩායමක් හදන්ට අවසර තියෙන්න ඕන!"

රැස්වීම් හල කුණාටුවකට හසුවූ කලෙක මෙන් විය.

ටුප්ටා දෙසට කෝපාන්විත ප්‍රශ්න එල්ල විය.

"මේකෙ තේරුම කුමක්ද? ආයෙමත් බොල්ෂෙවික් මෙන්ෂෙවික් කියලා බෙදෙනවද!"

"රුසියන් කොමියුනිස්ට් පක්ෂය පාර්ලිමේන්තුවක් නොවෙයි!"

"ඔවුන් හැමදෙනාම සඳහා සටන් කරනවා. මියස්නිකොව්ගේ සිට මාටොව් දක්වා!"

ගඟකට පැන පීනන්නට යන්නාක් මෙන් ටුප්ටා දෑත් විදහා වේගයෙන් කෑ ගැසීය.

"කාණ්ඩ හැදීමට අපට අයිතියක් තිබිය යුතුයි. එහෙම නැති නම්, වෙනත් විදිහට සිතන අපට හොඳින් සංවිධානය වුණු, හොඳ විනයක් ඇති බහුතර කොටසට විරුද්ධව අපේ මත සඳහා අරගල කරන්නේ කොහොමද?"

රැස්වීම් හලේ ඝෝෂාව වැඩි විය. පන්ක්‍රාතොව් නැගිට කෑ ගැසී ය.

"ඔහුට කතා කිරීමට අවසර දෙන්න. අනික් අය නොකියන රහස් ටුප්ටා එකවරම හෙළි කරනවා."

නැවත නිහඬතාවකි. තමා වුවමනාවට වඩා දුර ගිය බැව් ටුප්ටාට වැටහිණි. නොකිවයුතු දෙයක් ඔහුගේ කටින් පිටවිය. ඔහුගේ අදහස් බොහෝ ඈත ගියේය. ඔහු සිය කතාව අවසානයේ දී අසන්නන් වෙත වචන ගොඩක් ඇද බෑවේය.

"ඇත්තටම ඔබට පුළුවනි අප අස්කර දමලා කොන් කරන්නට. දැනටමත් එය පටන් අරගෙන තියෙනවා. කොම්සොමොල් ගුබේර්නියා කමිටුවෙන් මාව දැනටමත් නෙරපා දමලා. කමක් නැහැ. නිවැරැදි කවුද යන්න ඉක්මනටම බලාගත හැකි වේවි." එසේ කී ඔහු වේදිකාවෙන් බිමට පැන්නේය.

දුබාවාට ස්වෙතායෙව්ගෙන් ලිපි කැබැල්ලක් ලැබිණි.

"මිත්‍යායි දැන් නුඹ කතාකරපන්. එයින් වෙනසක් නොවීම නම් ඇත්ත තමා. මෙතැනදී අපේ පරාජය සහතිකයි. නමුත්, ටුප්ටා කළ හානිය අඩු කිරීමට අවශ්‍යයි. ටුප්ටා මෝඩයෙක් හා වාචාලයෙකි."

දුබාවා කතා කිරීමට අවසර ඉල්ලා සිටි විගසම ඔහුට එය ලැබිණි.

දුබාවා වේදිකාවට නගිත්ම ශාලාව සුපරීක්ෂාකාරී ලෙස නිහඬ විය. කතාවකට පෙර සාමාන්‍යයෙන් ඇතිවන එම නිහඬතාව දුබාවාට නම් ඔහු විනිශ්චය කරන සතුරු නිහඬතාවක් විය. ශාඛාවලදී ඔහු කතා කරන විට තිබුණු ප්‍රාණවත් ගතිය මෙවර නොතිබිණි. ඔහු ඇවිළෙන දර ගොඩකට වතුර දමා ගිනි නිවා දැමූ කලෙක පිටවන දුමක් මෙන් විය. දැන් එයින් පැන නගින්නේ දුමක් පමණය. එය ඔහුගේ ආත්මාර්ථකාමීත්වය පිළිබඳ දුමකි. ඔහුගේ පැරණි මිතුරන් විසින් පරාජයට පත් කරනු ලැබූ හා විරෝධයට පාත්‍ර වූ ඔහු තමා තවමත් වැරැදියි පිළිගැනීමට අකැමැති තම දරදඬු ස්වභාවය පෙන්වීය. බහුතර සංඛ්‍යාවෙන් තමා වඩාත් ඈත් වන බව දැන දැනත් දුබාවා ප්‍රතිප්‍රහාර එල්ල කිරීමට තීරණය කළේය. ඔහුගේ කට හඬෙහි එක්තරා ගොළු බවක් තිබුණද, වචන පැහැදිලිය.

"මගේ කතාවට බාධා නොකරන ලෙස මා ඉල්ලා සිටිනවා. අපේ ප්‍රතිපත්ති සම්පූර්ණයෙන්ම පැහැදිලි කර දීමට, එසේ කිරීම ප්‍රයෝජන රහිත වුවද, මා අදහස් කරනවා. නුඹලාට බහුතර සංඛ්‍යාවක් සිටිනවා."

ඔහු කතාකොට අවසාන වූ විට රැස්වීම්හල තුළ බෝම්බයක් පිපුරුණාක් මෙන් විය. දිමිත්‍රි දුබාවා වෙත එල්ල වූ වාග් ප්‍රහාරය කුණාටුවක් මෙනි. ඒවා ඔහුගේ මුහුණට ගැසූ කස පහර වැන්න. හැම තැනින්ම කෝපාන්විත කෑ ගැසීම් ය.

"ලැජ්ජයි!"

"කඩාකප්පල්කාරීන් හංගවේවා!"

"ඇති! මඩ ගැසීම් නවත්වාපන්!"

දිමිත්‍රි දුබාවාගේ කතාවෙන් පසු ඔහු වේදිකාවෙන් බිමට බසිත්ම උපහාසාත්මක සිනා හඬක් මතුවිය. එය ඔහුට ඉමහත් කනස්සල්ලක් ගෙනදිණි. රැස්වූ පිරිස කෝපයෙන් දැඩි වෛරයකින් කෑ ගැසුයේ නම්, ඔහු සතුටු වනු ඇත. රාග තාල වරදවා ගීයක් ගැයූ නළුවකු මෙන් ඔහු සමච්චලයට භාජන විය.

"මීළඟට කතා කරන්නේ ෂ්කොලෙන්කෝය." මුලසුන පැවැසීය.

මිහයිලො ෂ්කොලෙන්කෝ නැගිට සිටියේය.

"කතා කිරීම මම ප්‍රතික්ෂේප කරනවා."

පිටුපස අසුනක සිටි පන්ක්‍රාතොව්ගේ ගොරෝසු කටහඬ ඇසිණි.

"මට කතා කිරීමට අවසර දෙන්න!"

කටහඬ අනුව පන්ක්‍රාතොව්ගේ ආධ්‍යාත්මික තත්ත්වය ගැන දුබාවා දැන ගත්තේය. බර පටවන කම්කරුවෙක් වූ පන්ක්‍රාතොව් කිසිවකු තමාට බරපතළ ලෙස නින්ද කළ විට, එවැනි කට හඬකින් කතා කළේය. උසැති නමුදු මඳක් කුදු ඔහු ඉක්මන් ගමනින් වේදිකාවට නගිත්ම, ඔහු දෙස දෙම්නස්ව බැලූ දුබාවාගේ සිතෙහි එක්තරා චංචල බවක් හට ගැනිණි. පන්ක්‍රාතොව් කියන දේ දුබාවා දැන සිටියේය. සලෝමින්කාහි පැරැණි මිතුරෝ ඊයේ ඔහු හමුව විරුද්ධ පක්ෂයෙන් අස්වැන්නැයි තමාට ආයාචනා කළ හැටි දුබාවාට මතක් විය. ඔහු සමඟ ස්වෙතායෙව් හා ෂ්කොලෙන්කෝද වූහ. ඔවුන් රැස්වූයේ තෝකරෙව්ලාගේ ගෙදරදීය. ඔවුන් අතර ඉග්නාත්, ඕකුන්යෙව්, තාල්යා, වලීන්ට්සෙව්, සෙලෙනොවා, ස්තාරොවේරොව්, අර්ට්යුහින්ද වූහ. සමඟි වීමට කළ ආයාචනයේදී දුබාවා බිහිරකු මෙන් සිටියේය. සාකච්ඡාව ඉතා උණුසුම් ලෙස කෙරීගෙන යද්දී දුබාවා ස්වෙතායෙව් සමඟ නැඟිට ගියේ තම වැරැදි මත පිළි ගැනීමට තමා සූදනම් නැති බව අවධාරණය කරමිනි. ෂ්කොලෙන්කෝ එහි නැවතිණි. දැන් ඔහු කතා කිරීමද ප්‍රතික්ෂේප කළේය. "කොඳු ඇටය නැති බුද්ධිමතා! උන් මිනිහගේ ඔළුවට උන්ගේ අදහස් ඇතුළු කරලා. සත්තකින්ම," දැඩි කෝපයකින් දුබාවා කල්පනා කළේය. මේ වියරු සටනේදී ඔහු සිය මිතුරන් හැම දෙනෙකුම නැති කර ගත්තේය. 'හතළිස් හයදෙනාගේ ප්‍රකාශනයට'[1] විරුද්ධව ඉතා දැඩි විරුද්ධත්වයක් ප්‍රකාශ කළ ෂාර්කි සමඟ තැබූ ඉපැරැණි මිතු දහමද ඔහුට නැති විය. අනතුරුව මතභේදය උග්‍රවත්ම, ඔහු ෂාර්කි සමඟ කතා කිරීමද නැවැත්වීය. ෂාර්කි ඔහුගේ ගෙදරට විත් ඔහුගේ බිරිඳ වන ආන්නා සමඟ කතා කරනවා ඔහු දැක ඇත. ආන්නා බොර්හාර්ට් සහ දිමිත්‍රි දුබාවා අතර විවාහය සිදු වී අවුරුද්දක් ගෙවිණි. ඔවුන් දෙදෙනා වෙන වෙනම කාමරවල පදිංචිවී සිටියහ. දුබාවාගේ මත පිළිනොගත් ආන්නා හා

1 ට්‍රොස්කි වටා එක්රැස් වූ 'හතළිස් හයදෙනා' විසින් කරන ලද ප්‍රකාශනය ගැනය. පක්ෂය තුළ කණ්ඩායම් සංවිධාන කිරීමේ අවසර ඉල්ලා සිටීම මෙහි එක් කාර්යයක් විය. ට්‍රොස්කිගේ පක්ෂ විරෝධී හැම ක්‍රියාවක් මෙන්ම මෙයද 1942 ජනවාරි මාසයේදී පැවැත්වූ දහතුන් වැනි පක්ෂ සාකච්ඡාවේ දී පරාජයට පත් වීය.

තමා අතර ඇති සම්බන්ධකම් අයහපත් තත්ත්වයකට වැටී තිබෙන අතර, ෂාර්කි ඇය බැලීමට නිතර පැමිණීම නිසා එය වඩාත් උග්‍ර තත්ත්වයකට වැටී ඇති බව දුබාවා සිතීය. මෙය දුබාවාගේ සිතෙහි පැන නැඟි ඊර්ෂ්‍යාවක් නොවීය. තමා කතා නොකරන ෂාර්කි සමඟ තම බිරිඳ මිත්‍රත්වයක් ඇතිකර ගැනීම නිසා දුබාවා කෝපවිය. ඔහු සිය බිරිඳට ඒ බව දැන්වීය. එයින් හටගත් ප්‍රතිඵලය වූයේ සැමියා හා බිරිඳ අතර ඇති සම්බන්ධකම් වඩාත් අයහපත් වීමය. ඔහු තමා යන තැන බිරිඳට නොකියා සාකච්ඡාවට පැමිණියේය. දුබාවාගේ මේ සිතුවිලි ලෝකයට බාධා කරමින් ඉග්නාත් පන්ක්‍රාකොව් කතා කළේය. ඔහු සිය දේශනය පටන් ගත්තේය.

"සහෝදරවරුනි!" එම වචන රැස්වීම් හල තුළ රැව් පිළිරැව් දුනි. ඔහු වේදිකාවේ කොනක සිටියේය. "සහෝදරවරුනි! අපි දැන් දවස් නවයක් තිස්සේ විරුද්ධ පාක්ෂිකයන්ගේ කතාවලට සවන් දෙමින් සිටිනවා. මම එක් කරුණක් ගැන කියන්නම්. මේ උදවිය කතා කළේ අපේ සගයන් වගේ නොවෙයි. විප්ලවවාදී සටන්කාමීන් සහ එකම පන්තියක හා එකම සටනක මිතුරන් වගේ නොවෙයි. ඔවුන්ගේ කතා දැඩි සතුරුකමක් පෙන්නුවා. සමාදන විය නොහැකි නපුරු හා ද්වේෂ සහගත කතා ඔවුන් කළේ. ඔව් සහෝදරවරුනි! ද්වේෂ සහගත කතා. පක්ෂය තුළ පොල්ලේ බලයට යටවන මිනිසුන් හැටියට බොල්ෂෙවික්වාදීන් වන අප පෙන්වීමට ඔවුහු උත්සාහ කළා. ඔවුන් කියන හැටියට අපි අපේ පන්තියේ හා විප්ලවයේ වුවමනා පාවා දෙන්නෝ වෙමු. ඔවුන් අප පක්ෂයේ අතිශයින්ම උසස් පන්නරය ලැබූ සහ පරීක්ෂණවලට මූණ පෑ තේජාන්විත පැරණි බොල්ෂෙවික්වරුන්ව, රුසියානු කොමියුනිස්ට් පක්ෂය නිර්මාණය කොට එය ඇති දැඩි කළ අයව, සමස්ත ලෝක මෙන්ෂෙවික්වාදයට හා ට්‍රොස්කිට විරුද්ධව ලෙනින්ගේ නායකත්වයෙන් සටන් කළ සගයන්ව පක්ෂයේ නිලධාරීන් හැටියට හංවඩු ගැසීමට ඉදිරිපත් වී ඇත. මෙවැනි වචන භාවිත කළ හැක්කේ සතුරන්ට මිස වෙන කාටද? පක්ෂය හා එහි නොයෙකුත් නිල දරන සාමාජිකයන් එකම අඛණ්ඩයක් නොවන්නේද? කියන්න මේ කතා සමාන මොනවාටද? රතු හමුදවක් සතුරා විසින් වටලනු ලැබ ඇති වෙලාවක එහි සෙබළුන් අණ දෙන සෙනෙවිවරුන්ට කොමිසාර්වරුන්ට හා සෙනෙවි මණ්ඩලයට විරුද්ධව උසි ගැන්වීමට කෙනෙකු

ඉදිරිපත් වන්නේ නම්, අප එය නම් කරන්නේ කෙසේද? මම අද මිකැනික් කෙනෙක් නම්, ට්‍රොස්කිවාදීන්ගේ නිගමනය හැටියට, මා 'හොඳ කෙනෙකි.' එහෙත්, හෙට මම පක්ෂ කමිටුවක ලේකම් කෙනෙකු වුවහොත්, මම නිලධාරියෙකු හා පුටු රත් කරන්නෙකු වන්නෙමි. විරුද්ධ පාක්ෂිකයන් අතර නිලධාරීවාදයට විරුද්ධව ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සටන් කරන පුද්ගලයන් අතරෙන්, නිලධාරීවාදී ආකල්පය නිසා මේ නොබෝද රැකියාවෙන් නෙරපූ ටුප්ටාද, සලෝමින්කාවල සහෝදරවරුන් අතර ප්‍රජාතන්ත්‍රවාදය ගැන ප්‍රසිද්ධියක් උසුලන ස්වෙතායෙව්ද, පොදෝල්ස්ක් පෙදෙසේ අණ කිරීම් හා බලපෑම් මගින් වැඩ කළ නිසා ගුබේර්නියා කමිටුව තෙවරක්ම රක්ෂාවෙන් නෙරපා දැමූ අපනාසියෙව්ද, සිටීම පුදුමයක් නොවේද? පක්ෂය විසින් දඬුවම් කළ පුද්ගලයන් හැම එකෙකුම දැන් පක්ෂයට විරුද්ධව එකමුතු වී සටන් කිරීම සත්‍යයකි. ට්‍රොස්කිගේ 'බොල්ෂෙවික් වාදය' ගැන පැරණි බොල්ෂෙවික්වරුන් ඔබට කියනු ඇත. දැන් ට්‍රොස්කිගේ නාමය පක්ෂය වෙනුවට ඉදිරිපත් කර තිබෙන මේ අවධියේදී බොල්ෂෙවික්වරුන්ට විරුද්ධව ට්‍රොස්කි ගෙන ගිය සටන ගැනත්, ඔහු එක කඳවුරක සිට තවත් කඳවුරක් දක්වා නිතර නිතර පිල් මාරු කළ සැටිත් අපේ තරුණයෝ දැනගත යුත්තාහ. විරුද්ධ පක්ෂයට එදිරිව ගෙන ගිය සටන නිසා අප පක්ෂය වඩාත් ශක්තිමත් විය. අපේ තරුණයෝ දෘෂ්ටිමය වශයෙන් වඩාත් ශක්තිමත් වූහ. සුළු ධනපතිවාදී දෘෂ්ටිවලට විරුද්ධව ගෙන ගිය සටනේදී බොල්ෂෙවික් පක්ෂය හා කොම්සොමොල් තරුණ සංවිධානය පන්නරය ලබා ඇත. බියෙන් වියරු වැටී සිටින විරුද්ධ පක්ෂයේ පරාජිතවාදියෝ අප ආර්ථික හා දේශපාලන වශයෙන් පරිහානියට මූණ පාන බවට අනාවැකි පළ කරති. අපේ අනාගතය ඒ වැකි බොරු බව පෙන්වනු ඇත. අපේ පැරණි සහෝදරවරුන්ව, නිදසුනක් වශයෙන් තෝකරෙව් හා සෙගාල්ව ලියවන පට්ටලවල වැඩට යැවිය යුතු බව කියති. හුළං හමන දිසාවට නොනැමෙන වායු පීඩන මානයක් වන, පක්ෂයට විරුද්ධව ගෙනයන සටන විරෝදර ක්‍රියාවක් හැටියට සිතින් මවාගෙන ඉන්නා දුබාවා වැනි කෙනෙකුට ඔවුන්ගේ නිලතල පවරා දිය යුතු බවද විරුද්ධ පක්ෂය කියා සිටී. නැත. සහෝදරවරුනි, එවැනි දේ පිළිගන්නට අප සූදානම් නැහැ. මහලු සහෝදරවරුන් වෙනුවට අනාගතයේ දී තරුණ අය පත් කරනු ඇත. හැම

අමාරු අවස්ථාවකදීම වියරු ලෙස පක්ෂයට පහර දෙන පුද්ගලයන් එම නිලතලවලට පත් නොකළ යුතුය. අපේ ශ්‍රේෂ්ඨ පක්ෂයේ ඇති සමගිය නැති කිරීමට අපි කිසි විටක ඉඩ නොතබමු. පැරණි සහෝදරවරුන් හා අලුත් සහෝදරවරුන් වශයෙන් කිසි කලෙක අපි භේද නොවමු. සුළු ධනපතිවාදී මතවලට විරුද්ධව ලෙනින්ගේ ධජය යටතේ ගෙන යන නිරන්තර සටන් තුළින් අපි ජය ලබන්නෙමු."

කතාව අවසන් කළ පන්ක්‍රාතොව් වේදිකාවෙන් බසිත්ම, රැස්වූවෝ මහත් උද්යෝගයකින් අත්පොළසන් දුන්හ.

පසුදා මිනිස්සු දසදෙනෙක් පමණ ටුප්ටාගේ ගෙදර රැස් වූහ. දුබාවා කතා කළේය.

"අද මායි, ෂ්කොලෙන්කෝයි හාර්කොව් යනවා. අපට මෙතන ඇති වැඩක් නැහැ. නුඹලා එකට එකතු වෙලා ඉන්නට මහන්සි ගනිල්ලා. මොනවා වේවිද කියලා බලා ඉදීම පමණයි දැන්නම් අපට කරන්න තියෙන එකම දේ. සමස්ත රුසියානු සාකච්ඡා සභාව අපව හෙළා දකිනවා නොඅනුමානයි. අපට විරුද්ධව අප පාගා දැමීමේ පියවර ඉක්මනින්ම ගනීවි කියලා අපට හිතන්නට බැහැ. බහුතර කොටස අපව නැවත වැඩ මඟින් පිරික්සා බැලීමට තීරණය කරලා තියෙනවා. විශේෂයෙන් පක්ෂ සාකච්ඡාවට පසුව, දැන් එළිපිටම පක්ෂ විරෝධී අරගල කළොත් අපව පක්ෂයෙන් නෙරපා දමාවි. එය අපේ වැඩ පිළිවෙළට අයත් නැහැ. අනාගතයේදී මොනවා සිදුවේ දැයි කීම අමාරු වැඩකි. මීට වඩා යමක් කීමට මට නැති හැඩයි." දුබාවා නැඟිට සිට පිටවී යාමට සැරසුණේය.

සිහින් සිරුරක් ඇති සිහින් දෙතොල් සහිත ස්තාරොවේරොව්ද නැඟිට සිටියේය.

"මිත්‍යායි, මට නුඹව තේරුම් ගන්ට බැහැ." ඔහු තරමක් ගොත ගසමින් ර් වෙනුවට 'ල' යොදමින් පැවසීය.

"සාකච්ඡාවේ තීරණ අප කෙරෙහි අනිවාර්ය ලෙස බලපාන්නේ නැතැයි කියලද නුඹ කියන්නේ?"

ස්වෙතායෙව් ඔහුගේ කතාවට දැඩි ලෙස හරස් කැපීය.

"බාහිර චාරිත්‍ර අනුව නම් අනිවාර්ය වශයෙන් බලපානවා. නැතිනම් පක්ෂයේ සාමාජික කාඩ්පත උදුරා ගනිවී. හුළං හමන්නේ කොයි පැත්තටද කියලා බලා ඉඳිමු. ඒ වනතුරු විසිර යමු."

ටුප්ටා කලබල ගතියක් පාමින් පුටුව මත වැටුණේය.

ෂ්කොලෙන්කෝ දෙම්නසින් සුදුමැලි විය. රාත්‍රී කීපයක්ම නිදිමැරීම නිසා ඔහුගේ දෙනෙත් යට නිල් පැහැති ලප මතුවී තිබිණි. ඔහු කවුළුව අසල වාඩි වී නියපොතු සපමින් සිටියේය. ස්වෙතායෙව්ගේ කටින් පිටවූ අවසන් වචන කීපයත් සමඟම ඔහු සිය වේදනාකාරී ක්‍රියාවෙන් ඈත්ව රැස්ව සිටියවුන් දෙසට හැරුණේය.

"මම ඔය වගේ කූට වැඩවලට විරුද්ධයි."

ෂ්කොලෙන්කෝ දැඩි කෝපයකින් යුතුව පහත් හඬින් කීවේය. "සාකච්ඡා සභාව ගත් තීරණය අපට අනිවාර්යයෙන්ම බලපාන බව මා පෞද්ගලිකව කල්පනා කරනවා. අපි අපේ මතය අනුව සටන් කළා. දැන් අප සාකච්ඡා සභාවේ තීරණය පිළිගත යුතුයි."

ස්තාරොරොවේරොව් ඔහුගේ අදහස අනුමත කරන බැල්මක් හෙළීය.

"මාත් ඒ ගැන කීමට අදහස් කළා." ඔහු මිමිනුවේය.

දුබාවා ෂ්කොලෙන්කෝ දෙස රවා බලා සාවඥ ලෙස මෙසේ පැවසීය:

"නුඹට කිසිවෙක්, කිසිවක් යෝජනා කරන්නෙ නැහැ. ගුබේර්නියා සාකච්ඡාවේදී 'සමාව ඉල්ලන්ට' නුඹට තවම අවස්ථාවක් තියෙනවා."

ෂ්කොලෙන්කෝ නැගිට සිටියේය.

"දිමිත්‍රි නුඹේ කතා විලාසය මට අල්ලන්නෙ නැහැ. මම කෙළින්ම කතා කරන්නම්. නුඹේ කතාව නිසා මා කලකිරුණා විතරක් නොවේ, මා ඊයේ ගත් තීරණය ගැන නැවත කල්පනා කිරීමට පෙලඹුණා."

දුබාවා අතක් වැනීය.

"නුඹ ඉදිරියේ ඇත්තේ එකම මඟකි. පලයන් පමාවීමට පෙර ගිහින් සමාව ඉල්ලා ගනින්."

සමුගනිමින් දුබාවා ටුප්ටාට සහ අනිත් සගයන්ට අත දුන්නේය.

ඔහු ගිය පසු, ෂ්කොලෙන්කෝ සහ ස්තාරොරොවේරොව්ද නිකුත්ව ගියහ.

එක්දස් නවසිය විසිහතරේ අවුරුද්ද පටන් ගත්තේ ඉතා දැඩි හිම තුෂාරය සහිත ශීතලත් සමඟය. හිමෙන් පිරි බිම මත ශීත සමයේ දැඩි ග්‍රහණය තවත් උග්‍ර විය. ජනවාරි මාසයේ දෙවැනි භාගයේදී හූ හඬ නඟන හිම කුණාටු සහ සුළි සුළං ද හමන්නට විය.

නිරිත දිග දුම්රිය මාර්ග හිමෙන් වැසිණි. මෘගයෙකු මෙන් නැඟී සිටි සොබාදහමට විරුද්ධව මිනිස්සු සටන් කළහ.

හිම අතුගා ශුද්ධ කරන වානේමය යන්ත්‍ර දුම්රිය මග පිරිසිදු කරන්නට විය. හිම කුණාටු හා සුළි සුළං නිසා විදුලි පණිවුඩ කම්බිවල පවා රැඳුණු හිම කැට අයිස් බවට පත් වූයෙන් ඒවා කැඩිණි. විදුලි පණිවුඩ මාර්ග දොළහකින් ක්‍රියාකාරී වූයේ තුනක් පමණකි. ඉන්දු - යුරෝපීය විදුලි පණිවුඩ මාර්ගය සහ රජයේ පණිවුඩ මාර්ග දෙකක් පමණි.

ෂෙපෙතෝව්කා-1 විදුලි පණිවුඩ කාර්යාලයේ මෝස් සංඥා යන්ත්‍ර තුනෙන් පිටවන ඉමක් නැති සංඥා හඬ කියවා තේරුම් ගත හැක්කේ පළපුරුදු කනකට පමණකි.

මෝස් සංඥා ක්‍රියා කරවන සේවිකාවෝ අලුත සේවයට බැඳුණු දා සිට මෙතෙක් මෝස් සංඥා අනුව ලියා ඇති ටේප්වල දිග දවසකට කිලෝමීටර් විස්සකට නොවැඩිය. ඔවුන්ගේ සගයා පළපුරුදු මහලු සේවකයා ඒ වන විට කිලෝමීටර් දෙසීයක් දිගැති ටේප්වල සංඥා ලකුණු සටහන් කර ඉවරය. ඔහුගේ තරුණ සගයන් මෙන් ඔහු ටේප් පටිවල ඇති සංඥා කියවූයේ නැත. අමාරු වචනයක් කියවීමට බැරිව නළල රැලි ගසා ගත්තේද නැත. ඔහු වචනයෙන් වචනය මෝස් සංඥාවෙන් ප්‍රකෘති වචනවලට පෙරළා ක්‍රියා කරවීය. ඔහු දැන් තම යන්ත්‍රයට සවන් දෙමින් සිටී. 'සියලු දෙනාටම, සියලු දෙනාටම, සියලු දෙනාටම' යන වචන ඔහුගේ කන්හි වැකිණි.

එම වචන ලියා ගන්නා පළපුරුදු විදුලි පණිවුඩ සේවකයා "හිම ශුද්ධ කිරීම ගැන තවත් චක්‍රලේඛයක් වෙන්ට ඕනැ"යි සිතීය. විදුලි පණිවුඩ කාර්යාලයේ කවුළුවට පිටතින් කුණාටුව විසින් හිම කැටි වීදුරුවට විසි කරනු ලැබේ. කිසිවකු කවුළුවට තට්ටු කරතියි සිතූ විදුලි පණිවුඩ සේවකයා හැරී බැලීය. කවුළුවේ ඇති හිම රටාව එතරම් අපූරු ලෙස ඇඳීමට එකද සිත්තරකුටවත් නොපුළුවන.

සොබාදහම විසින් මවන ලද හිම මල් රටාවේ සුන්දර සිරි නැරඹූ ඔහු මොහොතකට සවන් දීම නැවැත්වීය. එහෙත් ඔහුට කියවීමට නොහැකි වූ වචන සොයනු වස් ඔහු ටේප් පටිය අතට ගත්තේය.

යන්ත්‍රයෙන් මෙසේ කියැවිණි.

"ජනවාරි විසි එක් වෙනිදා හවස හය පසුවී විනාඩි පනහට..."

ලැබුණු පණිවුඩය ඉක්මනට ලියාගත් සේවක තැන ටේප් පටිය අතහැර දමා නැවත සවන් දීමට පටන් ගත්තේය.

"ඊයේ ගොර්කිවලදී අභාවයට පත් විය..."

විදුලි පණිවුඩ සංඥා සේවකයා සෙමින් ලීවේය. ඔහු තම ජීවිතයේ ප්‍රීතිමත් හා දුක්බර නිවේදන කොපමණ ලියා තිබේද, අසා තිබේද, අනුන්ගේ ප්‍රීතිය හා දුක පළමුවෙන්ම දැනගන්නේ ඔහුය. අල්ප වචනවල හා වාක්‍ය ඛණ්ඩවල තේරුම් ගැන කල්පනා කිරීම බොහෝ කලෙක සිට අත්හැර දැමූ සංඥා සේවකයා, එම වචනවලට සවන් දී යාන්ත්‍රික ලෙස කඩදාසියේ ලියුවේ හරය ගැන නොතකමිනි.

දැන් යමෙකුගේ අභාවය ගැන කිසිවකු විසින් කිසිවෙකුට දන්වනු ලැබේ. 'සියලු දෙනාටම, සියලු දෙනාටම, සියලු දෙනාටම!" නමැති සිරස්තලය ගැන ඔහුට අමතක විය. සංඥා යන්ත්‍රයෙන් දිගටම කියැවිණි. ව්-ල-දි-මී-ර් ඉ-ල්-යි-ච්- මහලු සංඥා සේවකයා හඬ අනුව අකුරු ලියුවේය. තරමක් විඩාපත් වූ ඔහු සන්සුන්ව වාඩි වී සිටියේය. කොහේදෝ ව්ලදිමීර් ඉල්යිච් නමැත්තෙක් මිය ගොසිනි. ඔහු අද එම සංවේගාත්මක පුවත කාටදෝ යැවීම සඳහා ලියයි. ඒ පුවත අසන කිසිවකු අඬා වැලපී සුසුම්ලනු ඇත. එහෙත්, සංඥා සේවකයාට මේ සියල්ල පිටත්තර දේය. ඔහු පිටත සිටින සාක්ෂ්‍යකරුවෙක් පමණකි. සංඥා යන්ත්‍රය මෝස් ක්‍රමයට තිත, ඉර, තිත, ඉර බැගින් හඬ නගයි. ඔහු හඬ අසා පළමුවැනි අකුර කඩදාසිය මත ලියුවේය. 'ලෙ' ඊළඟට 'නි' තෙවනුව 'න්' ඔහු අල් කිරීම දෙවරක්ම හරිදැයි සෙයා බැලීය.

ඔහු විසින් මේ දැන් ලියා නිම කරන ලද වචනය දෙස නිමේෂයක් නැවතී බලා සිටියේය.

"ලෙනින්"

සංඥා යන්ත්‍රය දිගටම හඬ නැඟීය. එහෙත්, අහම්බෙන් මෙන් ඔහුගේ සංවිඥානය දැක පුරුදු, අසා පුරුදු නම වෙත යළි ඇදිණි. විදුලි පණිවුඩ සංඥා සේවකයා නැවත වරක් අවසාන වචනය දෙස බැලීය. 'ලෙනින්.' මොනවද? ලෙනින්? විදුලි පණිවුඩය සම්පූර්ණයෙන් ඔහුගේ මනැස ඉදිරියේ මැවී පෙනිණි. නිමේෂයක් ඔහු කඩදාසිය දෙස බලාගෙන සිටියේය. දෙතිස් වසරක් වැඩ කළ ඔහු පළමුවැනි වරට තම අතින් ලියූ දෙය විශ්වාස කිරීමට මැළි විය.

ඔහු විදුලි පණිවුඩය තෙවරක්ම කියවීය. එහෙත්, වචන මුරණ්ඩු ලෙස යළිත් කියැවිණි.

"ව්ලදිමීර් ඉල්යච් ලෙනින් අභාවයට පත්විය." මහලු සංඥා සේවකයා නැඟිට සිට, ටේප් පටි රෝල අතට ගෙන දෙනෙත් මහත් කරගෙන එදෙස බැලීය. ඔහුට කොහෙත්ම විශ්වාස නොකළ හැකි දෙය මීටර් දෙකක් පමණ දිගැති ටේප් පටිය සනාථ කළේය. මළ මිනියක් සේ සුදුමැලි තම මුහුණ හරහා සංඥා සේවකයා සිය සගයන් දෙස බැලීය. ඔහු බිය වී කෑ ගසන සැටි ඔවුන්ට ඇසිණි.

"ලෙනින් මළා!"

★

හිම කුණාටුවක් වේගයෙන් හමා ගොස් එහි සුළි සුළංවලින් දුම්රිය මාර්ගද, ස්විච් යතුරුද වසා දමමින්, හිම සහ අයිස් කැට සහිත කුණාටුව දුම්රිය වැඩ ශාලාවල යකඩ දොරවල් ඉරා දමන්නේ කිනම් වේගයකින්ද, එතරම් වේගයකින් ලෙනින්ගේ මරණය පිළිබඳ සංවේගදයක පුවත විදුලි පණිවුඩ සංඥා කාර්යාලයේ සිට දසත පැතිර ගියේය.

අලුත්වැඩියා කරන පළමුවැනි වේදිකාවේ කම්කරුවෝ දුම්රිය යන්ත්‍රයක් ලඟි ලඟියේ අලුත්වැඩියා කරමින් සිටියහ. මහලු පොලින්තොව්ස්කි වේදිකාවට යටින් වූ වළට රිංගා දුම්රිය යන්ත්‍රයේ අඩුපාඩු මිකැනික්වරුන්ට පෙන්වා දුන්නේය. සහාර් බ්රුෂ්ෂාක් සහ අර්ට්යොම් නැමුණු හරස් පටියක් දිග හරිමින් සිටියහ. සහාර් යකඩ දැලක් කිණිහිරය මත තැබූ අතර, අර්ට්යොම් මිටියකින් තැළීය.

සහාර් බ්රුෂ්ෂාක් පසුගිය අවුරුදුවලදී බොහෝ සෙයින් මහලු විය. ඔහුගේ නළලේ සම රැලි වැටී, හිස දෙපස රිදී වන් පැසුණු කෙසින් පිරිණි. ඔහුගේ පිට කුදු වී ඇත. ගිලුණු ඇස්වල ඇඳිරි බවක් පෙනිණි.

අලුත්වැඩියා කරන වැඩ ශාලාවේ දොර හැර මිනිහෙක් ඇතුළු විය. ඔහුගේ සෙවණැල්ල අනිකුත් කළු පැහැති සෙවණැලි විසින් ගිල ගනු ලැබීය. මුල් වාරයේදී කෑගැසූ නමුදු මිටි පහර නිකුත් කළ හඬට එය යට විය. එහෙත්, ඇතුළු වූ මිනිහා දුම්රිය යන්ත්‍රය අසල සිටි මිනිසුන් ළඟට දුව එත්ම, මිටිය එසවූ අර්ට්යොම් එය පහත් නොකළේය.

"සහෝදරවරුනි! ලෙනින් මළා!"

අර්ට්යොම්ගේ අත වූ මිටිය උරහිසේ සිට ඉතා සෙමින් පහතට වැටී, ශබ්ද රහිතව සිමෙන්ති පොළොව මත තැබිණි.

"නුඹ කීවේ මොකක්ද?" බියජනක පුවත ගෙනා

මිනිහාගේ බැටළු සම් කබාය තදින් අල්ලාගත් අර්ට්යොම් එය සොලවමින් ඇසීය.

මිනිහා හතිලමින් පහත්, බිඳුණු ස්වරයකින් කතා කළේය. ඔහුගේ ඇඳුම් හිමවලින් නැහැවී තිබිණි.

"ඔව්, සහෝදරවරුනි, ලෙනින් මළා!"

මිනිහා කෑ නොගැසූ නිසා අර්ට්යොම් ඒ බියජනක පුවත විශ්වාස කළේය. ඔහු පුවත ගෙනා මිනිහාගේ මුහුණ දෙස බැලීය. ඔහු අන් කිසිවකු නොව, වැඩ ශාලාවේ පක්ෂ කමිටුවේ ලේකම්වරයායි.

අලුත්වැඩියා කරන වේදිකාවේ සිට මිනිසුන් එළියට ආවේ මුළු ලෝකයම දත් ඒ පුද්ගලයාගේ මරණය පිළිබඳ පුවත නිහඬව අසමිනි.

කම්හලේ වැට අසල හැම දෙනෙකුම කම්පනය කරමින් දුම්රියක් හඬ නැඟීය. එම හඬට දුම්රියපොළේ ඈත කෙළවර තවත් දුම්රියක් එක් විය. අනතුරුව තවත් දුම්රිය යන්ත්‍රයක්ද හඬ නැඟීය. දුම්රිය යන්ත්‍ර නඟන ශෝකාන්විත හඬට විදුලිබල ස්ථානයේ සයිරන් නළාවද එක් විය. වෙඩි උණ්ඩයක් පුපුරා විසිර යාමේදී ඇති වන උස් සිහින් හඬට සමාන හඬක් ඉන් පිට විය. කියෙව් බලා පිටත්වීමට සූදානමින් සිටි මඟීන් රැගත් ලස්සන 'එස්' (ශීඝ්‍රගාමී) දුම්රිය ගැඹුරු ගම්භීර නාදයක් පතුරුවා හැරියේය.

සියලු දුම්රිය යන්ත්‍ර හඬ නඟන හේතුව දැන ගත් පෝලන්තයට අයත් ෂෙපෙතෝව්කා - වෝසෝ ශීඝ්‍රගාමී දුම්රිය පදවන්නා, මොහොතක් නළා හඬට සවන් දී, අනතුරුව තම අත සෙමින් ඔසවා නළාවේ ලණුව අදිත්ම, ඔහුගේ ක්‍රියාව දුටු ගෙ.පෙ.උ නියෝජිතයා මවිතයට පත් විය. ඔහු මෙසේ කරන්නේ අවසාන වරට බව දැන සිටියේය. ඔහුට මින් පසු එම දුම්රිය පැදවීමට අවසර නොදෙනු ඇත. එසේ වුවද, ඔහුගේ අත නළාවේ ලණුව නොහැරියේය. ඇන්ජිමේ නළා ශබ්දය නිසා පෝලන්ත තානාපති සේවයේ පණිවුඩකරුවෝ සහ නිලධාරීහු තැති ගෙන තම සැපපහසු ආසනවලින් නැගී සිටියහ.

ඩිපෝව ජනයාගෙන් පිරිණි. දොරටු හතරින්ම රැස්වීම්හලට පැමිණි ජනකාය අතිවිශාල ය. ලෙනින්ගේ මරණය නිමිත්තෙන් ශෝක ප්‍රකාශ කරන එම රැස්වීම විනාඩියක් නිහඬව සිට වැඩ ඇරඹීය.

ෂෙපෙතෝව්කා පෙදෙසේ පක්ෂ කමිටුවේ ලේකම්වර,

පැරැණි බොල්ෂෙවික්වාදියෙකු වූ ෂරාබ්රින් රැස්වූවන් අමතා කතා කළේය.

"සහෝදරවරුනි! ලෝක නිර්ධන පන්ති ව්‍යාපාරයේ නායකයා මිය ගියේය. පිරිමැසිය නොහැකි අති විශාල හානියකට පක්ෂය මූණ පා ඇත. බොල්ෂෙවික් පක්ෂයේ හතුරන්ට සමාව නොදෙන සේ උගන්වා පක්ෂය නිර්මාණය කළ නායකයාණෝ අවසන් හුස්ම හෙළූහ. පක්ෂයේ හා පන්තියේ නායකයාගේ මරණය විසින් නිර්ධන පන්තියේ ඉතා හොඳ පුතුන්ට පක්ෂයට බැඳෙන ලෙස ඉල්ලා සිටිනු ලැබේ..."

අවමඟුල් සංගීතය වාදනය වෙත්ම, මිනිස්සු හිස්වැසුම් ගැලවූහ. පහුගිය අවුරුදු පහළොවක් තිස්සේ (වරක් හෝ) නොහැඬූ අර්ට්යොම්ට තම උගුර හිරවන සැටියක් දැනිණි. ඔහුගේ සවිබලැති උරතල සෙලවිණි.

දුම්රිය කම්හලේ සමාජ ශාලාව පුපුරා යන තරම් එය ජනයාගෙන් පිරිලාය. පිට දැඩි හිම තුෂාරය සහිත ශීතලකි. සමාජ ශාලා වත්තේ නත්තල් ගස් දෙක තද ශීතලට හසුවී ඇත. එහි කුඩා හිම කැට හා තියුණු ඉදිකටු වැනි අයිස් කැලි දක්නට තිබේ. එහෙත්, සමාජ ශාලාව තුළ පිරී ඉතිරී සිටින ජනයාට දැඩි උණුසුමක් දැනෙයි. තාපනය ගෙන දෙන ඕලන්ද ලිප් සහ අවමඟුල් රැස්වීමට සිය කැමැත්තෙන්ම පැමිණි හය සියයකට අධික ජනකායගේ ආශ්වාස ප්‍රශ්වාස කිරීම් නිසා සමාජ ශාලාව තුළ හුස්ම ගැනීමට පවා අපහසු උණුසුමක් දැනෙයි.

සාමාන්‍ය රැස්වීම්වලදී මෙන් කෑ කෝ ගැසීම් හා කතාබහ නොතිබිණ. මහා ශෝකය නිසා නිහඬව සිටී. ඔවුහු ඉඳහිට සෙමින් කතා කළහ. සිය ගණනකගේ දෙනෙත්වල දුක හා අනතුර මුසු කැලඹීමක් දක්නට තිබිණි. මහා කුණාටුවක් නිසා කපිතාන් නැති වූ (නැවක) නැවියන් සමූහයක් රැස්ව සිටින සැටියක්, එම රැස්වීම කියා පෑවේය.

බියුරෝවේ සාමාජිකයෝ සභාපති මණ්ඩලයේ තමන්ට හිමි ආසනවල නිහඬව වාඩි වූහ. පුළුල් උරහිස් ඇති සිරොතෙන්කෝ ප්‍රවේසමින් සීනුව නාද කොට, එය මුදු ලෙස මේසය මත තැබීය. කෙමෙන් කෙමෙන් සම්පූර්ණ නිහඬතාවක් ඇති කරවීමට එය ප්‍රමාණවත් විය.

ප්‍රධාන කථිකයා සිය කතාව අවසන් කළ පසු පක්ෂ ශාඛාවේ ලේකම්වර සිරොතෙන්කෝ නැඟිට සිටියේය. අවමඟුල් රැස්වීමකදී ඔහු කළ ප්‍රකාශය අසමාන දෙයක් වුවද,

එයින් කිසිවෙක් මවිත නොවූහ. සිරොතෙන්කෝ මෙසේ පැවසීයඃ

"කම්කරුවන් කීපදෙනෙක් තමන්ගේ අයැදුම්පත් සලකා බලන ලෙස මේ රැස්වීමෙන් ඉල්ලීමක් කරනවා. එම අයැදුම්පතට සහෝදරවරුන් තිස් හත් දෙනෙක් අත්සන් තබා ඇත." ඉනික්බිති ඔහු අයදුම් පත කියවීය.

"නිරිතදිග දුම්රිය මාර්ගයේ ෂෙපෙතෝව්කා දුම්රියපොළේ කොමියුනිස්ට් (බොල්ෂෙවික්) පක්ෂයේ ශාඛාව වෙතටයි.

අපේ නායකයාගේ මරණය නිසා අපි බොල්ෂෙවික් පක්ෂයට බැඳීමට තීරණය කළෙමු. ලෙනින්ගේ පක්ෂයට බැඳීමට තරම් අප සුදුස්සන්ද යන්න තීරණය කරන ලෙස මේ රැස්වීමෙන් ඉල්ලා සිටිමු."

එම ඉල්ලීමට පහළින් දෙපේළියට අත්සන් කර තිබිණි. අත්සන් කළ පුද්ගලයන්ගේ නම් එකක් බැගින් කියවූ සිරොතෙන්කෝ, රැස්ව සිටියවුන්ට තමා දන්නා හඳුනන පුද්ගලයන් මතක් කර ගැනීමට කල් වේලා දෙන්නාක් මෙන් තත්පර කීපයක් බැගින් නිහඬව සිටියේය.

"පොලින්තොව්ස්කි ස්තනිස්ලාව් සිග්මුන්දෙවිච් දුම්රිය පදවන්නෙකි. අවුරුදු තිස් හයක් සේවය කර ඇත."

රැස්වූවෝ අනුමත කරමින් හඬ නැගූහ.

"කොර්චාගින් අර්ට්යොම් අන්ද්රේවිච් යකඩ කම්කරුවෙකි. දහත් අවුරුද්දක් සේවය කර ඇත."

"බ්රුෂ්ෂාක් සහාර් වසීලෙවිච් දුම්රිය පදවන්නෙකි. අවුරුදු විසි එකක් සේවය කර ඇත."

රැස්ව සිටියහු අනුමතය පළ කළහ. මේසය අසල සිටි පුද්ගලයා නම් එකින් එක හඬ නගා කියවීය. එකම පවුලක් බඳු වූ දුම්රිය සේවයේ ශිල්පීන්ගේ නම්වලට රැස්වීම සවන් දුන්නේය.

පළමුවෙන්ම අත්සන් තැබූ පුද්ගලයා වේදිකාවට නගිත්ම රැස්වීම් හලෙහි නිහඬතාව පැතිරිණි.

රැස්වූවන් අමතා තම ජීවිත කතාව කී මහලු පොලින්තොව්ස්කිට නොකැලඹී සිටීමට නොහැකි විය.

"සහෝදරවරුනි මට කියන්න තියෙන්නේ මොනවාද? ඉස්සර කාලේ කම්කරුවකුගේ ජීවිතය කොහොමද කියලා දන්නවා නෙවෙද, වහලකු ලෙස වැඩ කළා. මහලු කාලයේ දී දුගී දුප්පත් බවට වැටී සිටිනවා. විප්ලවය ඇති වූ දවස්වල මා කල්පනා කළේ මා මහලු, පවුලක බරක් ඇති මිනිහකු

ලෙසටයි. පක්ෂයට බැඳීම ගැන මා කල්පනා කළේ නැහැ. නමුත්, සටන්වලට සහභාගි වුණේ කලාතුරකිනි. 1905දී වෝසෝ දුම්රිය කම්හලේ ස්ට්‍රයික් කමිටුවේ සාමාජිකයෙකුව සිටියා. බොල්ෂෙවික්වරුන්ට පක්ෂව ක්‍රියා කළා. ඒ දවස්වල මා තරුණයි. සටන්කාමීත්වයෙන් පිරී හිටියා. පරණ දේ ගැන මතක් කරලා ප්‍රයෝජනයක් නැහැ! ඉල්යිච්ගේ මරණය නිසා මගේ හදවත කම්පා වුණා. අපේ මිතුරා හා වීරයා අපට නැතිව ගියා. මහලු වයස ගැන මින්පසු මා කතාකරන්නේ නැහැ..! මට කතා කිරීමට දක්සකමක් නැහැ. මට වඩා හොඳට වෙනත් කෙනෙක් ඒ ගැන කියාවි. එක දෙයක් ගැන නම් ස්ථිරවම කියන්ට පුළුවනි. මගේ මඟ බොල්ෂෙවික්වාදීන්ගේ මඟයි, වෙනත් මඟක් මට නැහැ.”

දුම්රිය පදවන්නාගේ හිස මුරණ්ඩු ලෙස සෙලවිණි. පැසුණු බැම සඟළට යටින් ඔහුගේ දෙනෙත් රැස්ව සිටි ජනකාය දෙස බැලුවේ නොසැලෙන ගතියකින් හා දැඩි අදිටනකිනි. රැස්වීමෙන් තීරණයක් බලාපොරොත්තු වන්නාක් මෙනි. පැසුණු හිසක් ඇති මහලු, කුඩා මිනිසාගේ අයැදුම් පතට විරුද්ධව එකද අතක්වත් එසවුණේ නැත. පාක්ෂිකයන්ට ඡන්දය දෙන ලෙස බියුරෝ මණ්ඩලය ඉල්ලා සිටි විට හැමදෙනාම ඒකච්ඡන්දයෙන් ඔහුගේ අයැදුම්පත අනුමත කළහ.

පොලින්තොව්ස්කි වේදිකාවේ මේසය වෙතින් ඉවත ගියේ කොමියුනිස්ට්වාදියෙකු ලෙසිනි.

දැන් කිසියම් අසමාන දෙයක් සිදුවන බව හැම දෙනාටම අවබෝධ විය. කුඩා මිනිහෙකු වූ දුම්රිය පදවන්නා සිටි ස්ථානයට මේ වර පැමිණියේ යෝධමය සිරුරක් ඇති අර්ට්යොම්ය. තමාගේ දිගැති බාහු යුවළ කොහේ දැමිය යුතුදැයි නොදත් ඔහු දැතින් හිම තොප්පිය අතට ගෙන එය මිරිකන්නට විය. දෙපැත්තෙන් ගෙවී ගිය හිම කබායේ බොත්තම් හැර දමා තිබිණි. එහෙත්, හිම කබායට යටින් වූ ඔහුගේ සෙබළ කමිස කර පටිය මනා සේ පිත්තල බොත්තම් දෙකකින් වසා ඇත. යකඩ කම්කරුවකු වන අර්ට්යොම්ගේ විලාසය මේ නිසා කිසියම් උත්සව සිරියක් ඉසිලීය. ඔහු රැස්වීම්හල දෙස බලත්ම අඳුනන කතකගේ මුහුණක් දිටීය. ඇඳුම් මසන වැඩ ශාලාවේ යෙහෙළියන් සමඟ පැමිණි ගල්වඩුවාගේ දුව වූ ගලීනාය ඒ. ඔහුට සමාව දෙන්නාක් මෙන් ඈ ඔහු දෙස බලා මඳ සිනා පෑවාය. ඇගේ මඳහසෙහි තමාට වචනවලට පරිවර්තනය කළ නොහැකි කිසිවක් අනුමත කරන

සැටියක්ද, පෙනෙන්නට තිබිණි.

"අර්ට්යොම් නුඹ ගැන අපට ටිකක් විස්තර කරපන්." සිරොතෙන්කෝ ඉල්ලා සිටියේය.

විශාල රුස්වීම්වල කතා කර නැති අර්ට්යොම්ට තමා ගැන කීම ලෙහෙසි කාර්යයක් නොවීය. ජීවිතය විසින් ගොඩ ගසන ලද දේ කියා පෑමට නොහැකි බැව් ඔහුට වැටහුණේ දැන්ය. කටින් වචන පිටවීම දුෂ්කර දෙයක් වූ අතර, කැලඹීම කතාවට බාධාවක් විය. මින් පෙර මෙවැනි හැඟීමකට ඔහු කිසි කලෙක ගොදුරු නොවීය. තම ජීවිතය හාත්පසින්ම වෙනස්වීමකට මූණ පාන බවත්, තම දැඩි, ඇද කුදු ගැසුණු ජීවිතය උණුසුම් කළ හැකි පියවරක් ගැනීමට යන බවත් අර්ට්යොම් ප්‍රත්‍යක්ෂ ලෙස වටහා ගත්තේය.

"අපේ මවුට දූ දරුවන් හතර දෙනෙක් හිටියා." අර්ට්යොම් තම කතාව පටන් ගත්තේය.

රුස්වීම්හල නිහඬ විය. හයසිය දෙනෙක් උසැති කම්කරුවාට සවන් දෙති. ඔහුගේ නහය රාජාලියෙකුගේ හොටක් මෙනි. දැඩිව වැවී ඇති බැම සඟළට යටින් ඔහුගේ දෙනෙත් සැඟවී ඇත.

"මගේ අම්මා ලොක්කන් ළඟ කුස්සි අම්මා කෙනෙකු ලෙස රස්සාව කළා. තාත්තා ගැන යන්තමින් මතකයි. අම්මයි තාත්තයි සාමයෙන් හිටියෙ නැහැ. ඔහු ඕනෑවට වැඩිය මත්පැන් බීවා. අපි අම්මා ළඟ ජීවත් වුණා. ළමයින් හතර දෙනෙකුට කෑම සොයා දීම ඇට ලෙහෙසි වුණේ නැහැ. ඇට වැටුප් හැටියට ගෙව්වේ මාසයකට රූබල් හතරක් සහ ඇගේ ආහාර වේල පමණයි. උදේ පාන්දර සිට රෑ යාමය දක්වා ඈ කොන්ද නමාගෙන වැඩ කළා. අවුරුදු දෙකක්ම මට ප්‍රාථමික පාසලට යාමට වාසනාව ලැබුණා. එහිදී මම කියවීම සහ ලිවීම ඉගෙන ගත්තා. මට අවුරුදු නවය ලැබුවා විතරයි අම්මා මාව යකඩ වැඩ කම්මලකට වැඩ ඉගෙන ගන්ට යැව්වා. අවුරුදු තුනක්ම පඩි නැහැ. කෑම විතරයි... මේ කම්මලේ අයිතිකරුවා ජර්මන්කාරයෙක්. ඔහුගේ නම පොරෙස්ටර්. ඔහු මාව වැඩට ගැනීමට කැමති වුණේ නැහැ. නමුත්, මම උසැති කොල්ලකුව හිටි නිසා අම්මා මගේ වයස දොළහයි කිව්වා. මම ඔහු ළඟ අවුරුදු තුනක් සේවය කළා. ඔහුට වොඩ්කා ගේන්ට කඩේ ගියා. ඔහු කණමදයා වගේ බිව්වා... බිම් අඟුරු සහ යකඩ ගෙනෙන්ට මාව පිටත් කළා. ඔහුගේ බිරිඳ මාව වහලකු කළා. හැළි වළන් සේදීම,

අර්තාපල් අල සුද්ද කිරීම මා ලවා කරවා ගත්තා. නිතරම මට පා පහරවල් කනේ පහරවල් ලැබුණා. හේතු රහිතව පුරුද්ද අනුව පහර ගැසුවා. හාම්පුතා නිතර බීලා වෙරිවී සිටින නිසා ඔහුගේ බිරිඳ සියලු කේන්ති මා පිටින් යැව්වා. ඈ මට නිතර කම්මුල් පහරවල් දුන්නා. මා ඈගෙන් බේරීමට මහ පාරට පැන ගියා. එහෙත්, කොහේ දුවන්ටද, දුක කාට කියන්ටද? අම්මා ඉන්නේ හැතැප්ම හතළිහක් ඈත. ඈ මට පිහිටවීමට තරම් තත්ත්වයක හිටියේ නැහැ... කම්මලේ තත්ත්වයත් ඒ වගේම නරකයි. කම්මල භාරව හිටියේ අයිතිකරුගේ මල්ලී. ඒ නීචයා මා අමාරුවේ දැමීමට නොයෙක් දේ කළා. 'අන්න අර මුරිච්චිය මට දියන්.' ඔහු මෙසේ කියමින් ගිනි උදුන අයිනේ ඇති මුරිච්චියක් පෙන්වනවා. ඔහු ඒ මුරිච්චිය මේ දැනුයි ගින්නේ රත් කරලා ගිනිගොඩින් එළියට අරගෙන අළු උඩට දැම්මේ. පෙනුමෙන් කළු පාට වුණාට අල්ලපු හැටියෙම හමයි මසුයි පිච්චිලා යනවා. මම වේදනාවෙන් කෑගසන විට, ඔහු මහත් සන්තෝෂයෙන් හිනාවෙනවා. වේදනාව උහුලා ගන්ට බැරිව මම අම්මා ළඟට පැනලා ගියා. මට පිහිටවීමට අම්මාට බැහැ. අම්මා නැවත මාව ජර්මන්කාරයා වෙත ගෙන ගියා. මා සමඟ යන ගමන් ඈ ඇඬුවා. තුන්වැනි අවුරුද්දෙදි ඔවුන් මට යකඩ කර්මාන්තය ගැන සමහර දේ උගැන්නුවා. නමුත් මට තැළීම නැවැත් වූයේ නැහැ. තුන්වැනි අවුරුද්දේදී මම ස්තාරොකොන්ස්තන්තිනොව් නගරයට පැනලා ගියා. එතැන ලිංගුස් හදන තැනක මම අවුරුදු එක හමාරක කාලය නාස්ති කළා. සතුන්ගේ බොකු බඩවැල් සෝදන රස්සාව කළා. අපේ මස් කම්මල අයිතිකාරයා සූදු කෙළලා පැරදුණා. ඔහු අපට හාර මාසයක් තිස්සේම පඩි ගෙව්වේ නැහැ. අවසානයේදී ඔහු අපට නොකියා පැනලා ගියා. මම එතැනින් නිදහස් වෙලා දුම්රියෙන් ෂ්මෙරින්කාවලට ඇවිත් රස්සාවක් සෙව්වා. එතනදී මගෙ වාසනාවට මට දුම්රිය කම්කරුවෙකු හමුවුණා. ඔහු මට අනුකම්පා කළා. මා ඔහුට කිව්වා මා මිකැනික් වැඩ දන්නවා කියලා. ඔහු මාව හාම්පුතා ළඟට ගෙනගිහිල්ලා ඔහුගේ බෑනා කෙනෙක් කියලා මට රස්සාවක් ඉල්ලා සිටියා. මගේ උස අනුව මට වයස දහ හතක් කියලා ඔවුන් සිතු නිසාදෝ ඔවුන් මිකැනික් ශිල්පියකුගේ අතවැසියකු හැටියට මට රස්සාවක් දුන්නා. මේ දුම්රිය කම්හලේ මම අවුරුදු නවයක් තිස්සේ වැඩ කරනවා. මගේ අතීතය ගැන මට කිව හැක්කේ එපමණයි. මෙහි මගේ ජීවිතය ගැන ඔබ දන්නවා."

අර්ට්යොම් හිම තොප්පියෙන් නළල පිසදගනිමින් ගැඹුරු ලෙස සුසුමක් හෙළීය. කිසියම් ප්‍රශ්නයක් ඇසීමට පෙර ඉතාම ප්‍රධාන තමාට ඉතාම අමාරු දෙය ගැන කිව යුතුය. බැම සඟළ හකුළුවාගෙන ඔහු තම ජීවිත කතාව පිළිබඳ විස්තර දිගටම කීවේය.

"කිසි කෙනෙකුට ප්‍රශ්නයක් අහන්ට පුළුවනි ඇයි මම විප්ලව කාලයේ සිටම බොල්ෂෙවික් පක්ෂයට බැඳුණේ නැත්තේ මන්ද කියල. මට මහලු වීමට තව බොහෝ කලක් තියෙනවා. නියම මඟ තෝරා ගැනීමට තව බොහෝ කාලයක් තියෙනවා. නියම මඟ තෝරා ගැනීමට පුළුවන් වුණේ දැන් තමා. මා සඟවන්නේ කුමටද? මම එම මඟ ගත යුතුව තිබුණේ එක්දස් නවසිය දහ අටේදි, ජර්මනුන්ට විරුද්ධව ස්ට්‍රයික් කරපු වේලාවේදි ෂුක්රායි නමැති නාවිකයා අප සමඟ කීප වරක්ම කතා කළා. මා තුවක්කුව අතට ගෙන සටන් කළේ එක්දහස් නවසිය විස්සෙදි සටන අවසන් වුණා. ප්‍රතිවිප්ලවකාරී සුදු හමුදව කළු මුහුදෙන් එහාට පන්නලා අපි නැවත ගෙවල් බලා ගියා. ඊට පස්සෙ ළමයි, පවුල, මම ගෙදර වැඩට සීමා වුණා. නමුත්, ලෙනින් සහෝදරයා මළායින් පස්සේ, පක්ෂය ආයාචනා කළා. මම මගේ ජීවිතයේ අඩුපාඩු සොයා බැලුවා. අපේ ආණ්ඩුව ආරක්ෂා කරලා විතරක් මදි. ලෙනින්ගේ තැන ගෙන අපි සියලු දෙනාම එකම විශාල පවුලක් ලෙස නැඟී සිටින්නට ඕන, හරියට වානේමය කන්දක් වගේ සෝවියට් ආණ්ඩු බලය නඟා සිටුවීම සඳහා. අප බොල්ෂෙවික්වාදීන් විය යුතුමයි. පක්ෂය අපේම නොවේද?"

යකඩ කම්කරුවා තම කතාව අවසන් කළේ එතරම් දිග කතාවක් කිරීම නිසා චකිතයට පත් වෙමිනි. ඔහුගේ කර මත පටවා තිබුණු බරකින් ඔහු නිදහස් වුණාක් මෙනි. ඔහු තම උසැති සිරුර ඍජුව තබාගෙන ප්‍රශ්න බලාපොරොත්තුවෙන් සිටියේය.

"කිසිවෙක් ඔහුගෙන් ප්‍රශ්න අහන්න ලැහැස්තිද?" සිරොතෙන්කෝ නිහඬතාව බිඳිමින් ඇසීය.

මිනිසුන් සෙලවෙන බවක් පෙනිණි. රැස්වීම්හලින් පිළිතුරු එකවර නොලැබිණි. කුරුමිණියකු මෙන් කළු පැහැති ගිනි උදුන් කම්කරුවකු - ඔහු රැස්වීමට පැමිණියේ දුම්රිය යන්ත්‍රයේ වැඩ කළ ගමන්ය. තීරණාත්මක ලෙස කතා කළේය.

"අහන්නෙ මොනවා ගැනද? අපි ඔහු ගැන දන්නෙ නැතිද? ඔහුට අවසර දිය යුතුයි. කතාව එපමණයි.!"

රශ්මිය නිසා රත් පැහැ ගත් යකඩ තළන්නකු වූ ගිල්යාක් බැරෑඬි හඬකින් කතා කළේය.

"ඔය වගේ කෙනෙක් පීලි පැනලා යන්නේ නැහැ. ඔය සහෝදරයා ශක්තිමත් කෙනෙක්. සිරොතෙන්කෝ එයාට ඡන්දය දෙන්න!"

තරුණ කොමියුනිස්ට් සංගමයේ සාමාජිකයන් වාඩිවී සිටි අවසාන පුටු පේළියේ කෙනෙක් නැගිට ප්‍රශ්නයක් ඇසීය. අඩ අඳුර නිසා ඔහුගේ මුහුණ හරි හැටි නොපෙනිණි.

"කොර්චාගින් සහෝදරයා ඉඩමට බැඳී සිටින්නේ මන්ද ඔහුගේ නිර්ධන පාන්තික හැඟීම්වලින් ඔහු ගොවි ජනතාව වෙතට ඇදී යන්නේ නැතිද?"

රැස්ව සිටියවුන් අනුමත නොකරන හඬක් ශාලාව තුළින් නික්මිණි. විරුද්ධත්වය ප්‍රකාශ කරන හඬක් ඇසිණි.

"පැහැදිලි ලෙස කතා කරපන්! දැනීම පෙන්වීමට යස වේලාවක් සෙයා ගත්තා..."

එහෙත්, අර්ට්යොම් පිළිතුරු දුන්නේය.

"සහෝදරවරුනි, කමක් නැහැ. ඒ ඉලන්දරියා කියන්නේ ඇත්තයි. මා ඉඩමට බැඳුණා කියන කතාව ඇත්තයි. නමුත්, මගේ කම්කරු පන්ති හැඟීම් මා නැති කර ගත්තෙ නැහැ. අද සිට ඉඩමට බැඳීම ඉවර කරනවා. පවුලත් සමඟ ඩිපෝවට ළඟ තැනක පදිංචියට එනවා. ඒ ඉඩම් කෑල්ල හන්ද මට හුස්ම ගැනීමට පවා බැහැ."

තමාට පක්ෂව ඔසවන ලද අත්වල සංඛ්‍යාව දුටු අර්ට්යොම්ගේ හදවත සැලිණි. එවර උරහිස මත බරක් ඇත්තාක් මෙන්ද, පිටි කොන්ද වක් වූ කලෙක මෙන්ද ඔහුට නොදැනිණි. ඔහු තමා වාඩිවී සිටි පුටුව දෙසට ගියේය. පසු පසින් සිරොතෙන්කෝගේ කටහඬ ඇසුණේය.

"ඒකච්ඡන්දයෙන් සම්මතයි."

ඉනික්බිති වේදිකාවේ මේසය අසලට පැමිණියේ සහාර් බරුෂ්ෂාක්ය. පොලින්තොව්ස්කිගේ පැරැණි සහකරු වූ සහාර් වැඩි කතා නොකරන්නෙකි. ඔහු දුම්රිය යන්ත්‍රයක් පැදවීමට පටන් ගෙන දැන් බොහෝ කල්ය. ඔහු තම ශ්‍රම ජීවිතය ගැන විස්තර කොට අවසාන දවස් ගැන කීවේ ඉතා පහත් හඬකින් වුවද, රැස්ව සිටි හැම දෙනාටම එය ඇසිණි:

"මගේ ළමයින් වෙනුවෙන් ඔවුන් පටන් ගත් දේ අවසන් කළ යුතුයි. මගේ දුක් කනගාටුව සහිතව මුල්ලකට වී සැඟවී සිටීමට ඔවුන් කැමති වන්නේ නැහැ. ඔවුන් ජීවිත පිදුවේ

ඒ නිසා නොවෙයි. මගේ ළමයින්ගේ ජීවිත පූජාව නිසා වූ අඩුව පිරිමැසීමට මා ඉදිරිපත් වූයේ නැහැ. නමුත්, අපේ නායකයාගේ මරණය නිසා අපේ ඇස් පෑදුණා. පැරැණි දේ ගැන මගෙන් ප්‍රශ්න අසන්න එපා. සැබෑ ජීවිතය අමුතුවෙන් පටන් ගන්නවා."

සහාර්ට තම දුවගේ සහ පුතාගේ මරණ ගැන සිහිවූයෙන් ඔහුගේ මුහුණ කළු පැහැ ගති. එය රොස්වූ ගතියක් පෑවේය. එහෙත්, රැස්ව සිටි හැම දෙනාම අත් ඔසවමින් ඔහුට පක්ෂපාතිත්වය දැක් වූ විට ඔහුගේ නෙත්වල ආලෝකයක් ඇති විය. රිදීවන් හිස කෙස් සහිත ඔහුගේ හිස එදා සිට පහත නොවැටිණි.

පක්ෂයට අලුතින් බැඳීමට ඉල්ලුම් පත් ඉදිරිපත් කළ අය ගැන රෑ බෝ වන තුරු සාකච්ඡා ඇතිවිය. හොඳින් දන්නා අය අතුරෙන් පක්ෂයට බඳවා ගත්තේ ඉතාම හොඳ, පලුදු නැති ජීවිත ඇති කම්කරුවන් පමණකි.

ලෙනින්ගේ මරණය විසින් ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන් සංඛ්‍යාවක් බොල්ෂෙවික්වාදීන් බවට පත්කරන ලදි. නායකයාගේ අභාවය නිසා පක්ෂය සෙලවුණේ නැත. ඉතා ගැඹුරු ලෙස මුල් බැස ඇති යෝධමය ගසක මුදුන කපා දැමූ පමණින් එය මිය යන්නේ නැත.

VI

හෝටලයේ විවිධ ප්‍රසංග ශාලාවට ඇතුළු වන තැන දෙදෙනෙක් සිටියහ. උස මිනිහා 'පෙන්ස්නේ' උපැස් යුගලක් දමාගෙන, අතක 'පාලක තැන' යන අකුරු සහිත රතු පටියක් බැඳගෙන සිටියේය.

"උක්රයින නියෝජිත මණ්ඩලයේ රැස්වීම පවත්වන්නේ මෙතැනද?" රීතා උස්තිනෝවිච්චි ඇසුවාය.

උස මිනිහා නිල ස්වරූපයක් පාමින් පිළිතුරු දුන්නේය.

"ඔව්, කාරණය කුමක්ද?"

"ඇතුළුවීමට අවසර දෙන්න."

උසැති මිනිහා අඩ වශයෙන් දෙරටුව අවහිර කරමින් රීතා දෙස බලා කතා කළේයඃ

"ඔබගේ නියෝජිත බලපත්‍රය කොහිද? නියෝජිත ඡන්ද බලය නැතිනම් උපදේශක බලය ඇති අයට විතරයි ඇතුළුවීමට අවසර තියෙන්නෙ."

රීතා තම අත් බැගයෙන් රන් අකුරු සහිත කාඩ්පතක්

එළියට ගත්තාය. උස මිනිහා එය කියවීයඃ "මධ්‍යම කාරක සභාවේ සාමාජිකාවකි." ඔහුගේ කතාවේ තිබුණු නිල ස්වරූපය හිරු දුටු කදෝපැණියන් සේ අතුරුදහන් විය. ඔහු සැණෙකින් ආචාරශීලී හා 'සුහදතාවක්' පෙන්වීය.

"කරුණාකරලා ඇතුළු වෙන්න. අන්න වම් පැත්තේ හිස් පුටු තියෙනවා."

රීතා පුටු පේළි දෙකක් අතරින් ගොස් හිස් ආසනයක් දැක වාඩි වූවාය. නියෝජිතවරුන්ගේ රැස්වීම් අවසන් වුවා සේය. සභාපතිවරයාගේ දෙසුමට ඈ සවන් දුන්නාය. කටහඬ අසා පුරුදු ඇතිවා සේය.

"සහෝදරවරුනි, සමස්ත රුසියානු සම්මේලන වාරයට නියෝජිතයන් තෝරා පත් කොට අවසානයි. එමෙන්ම උපදේශකවරුද පත් කොට ඇත. සම්මේලන වාරය පටන් ගැනීමට ඇත්තේ තව දෙපැයකි. සම්මේලනයට පැමිණ සිටින නියෝජිතවරුන්ගේ නාම ලැයිස්තුව නැවත වරක් කියවීමට අවසර දෙන්න.

රීතා, අකීම්ගේ කටහඬ හැඳින ගත්තාය. ඔහු හණිකට නියෝජිතයන්ගේ නම් කියවීය.

ඈ ඉමහත් සැලකිල්ලකින් සවන් දී සිටියාය.

ඇය දන්නා නමක් ඇසිණිඃ

"පන්ක්‍රාතොව්."

රීතා එසවූ අත දෙස හැරී බැලුව ද, වාඩි වී සිටි නියෝජිතයන් අතරින් තමා හඳුනන බර උසුලන කම්කරුවාගේ මුහුණ නොදුටුවාය. අකීම් දිගටම නම් කියවයි. "ඕකුන්යෙව්" ඊළඟට "ෂාර්කි" ඈ දන්නා අයගේ නම් ඇසිණි.

රීතාට ෂාර්කි පෙනෙයි. ඔහු වාඩිවී සිටියේ ඇය දෙසට හැරීය. වාන්යා ෂාර්කිගේ මුහුණේ අංශ චිත්‍රය ඇගේ නෙතට හසුවිය. ඔව්, සත්තකින්ම ඒ ඔහුය. ඈ ඔහු දැක අවුරුදු කීපයක් ගෙවී ඇත.

දිගටම නම් කියැවෙයි. එක් නමක් කියවත්ම රීතා තිගැස්සුණායඃ

"කොර්චාගින්."

ඈත ඈයට ඉදිරිපස පුටු පෙළකින් අතක් එසවිණි. මියගිය තම මිතුරාගේ වාසගම ඇති මේ නියෝජිතයා දැක ගැනීමට රීතා උත්තිනෝව්ච් තුළ ඇති වූයේ වේදනා සහගත වුවමනාවකි. ඈ අත එසවුණු දිසාව දෙස බලාගත්වනම සිටි නමුදු, හරිහැටි හඳුනා ගැනීමට අපොහොසත් වූවාය. රීතා

නැඟිට බිත්තිය අයිනෙන් ඉදිරිපසට ගියාය. අකීම් නම් අඬ ගැසීම අවසන් කළේය. පුටු ඒ මේ අත ඇදීම් නිසා හඬක් ඇතිවිය. නියෝජිතවරු හඬ නඟා කතා කළහ. ඔවුන්ගේ යෞවන සිනා හඬ පැතිරිණි. ශාලාවේ පැන නැඟි හඬ අබිබවා කෑගැසීමට උත්සාහ කළ අකීම් උස් හඬින් මෙසේ පැවසීය:

"පමාවෙන්ට එපා. බොල්ෂොයි රඟහලට හරියට හතට."

පිටවීමට ඇති දොර අසල නියෝජිතවරු රොක්වූහ.

තමා මේ දැන් අසා සිටි නම් ඇති නියෝජිතවරුන් එකෙකුවත් සෙනඟ ගොඩේ දැක ගැනීමට බැරිවන බව රීතා වටහා ගත්තාය. කෙසේ හෝ අකීම් මඟ නොහරින සේ වගබලාගත යුතුය. එවිට අනික් නියෝජිතවරුන් සොයා ගැනීමට පිළිවන. නියෝජිතවරුන්ගේ අවසාන කණ්ඩායමට යාමට ඉඩ හරිමින් ඈ අකීම් දෙසට ගියාය.

"ඉතින් කොර්චාගින් අපිත් යමු!"

ඈ ඉතා හොඳින් අසා ඇති, ඇයට ඉතා හොඳින් මතක ඇති, කටහඬක් විසින් පිළිතුරු සපයනු ලැබීය:

"යමු"

රීතා හැරී බැලුවාය. ඇය ඉදිරිපිට උසැති, තලෙළු තරුණයෙකි. ඔහු කාකි රෙදිවලින් මැසූ සෙබළ කමිසයක්ද නිල් පැහැති අසරු කලිසමක්ද හැඳ සිටියේය. ඉණ වටා සිහින් කොකේසියානු බඳපටියකි.

රීතා ඔහු දෙස දෙනෙත් මහත් කරගෙන බැලුවාය. ඔහුගේ දෑත් ඇගේ උරහිස වටා ගෙතී ඇති බවට ඇයට හැඟී යත්ම, කැලඹුණු හඬකින් ඔහු මිමිනුවේය. "රීතා." ඒ අන් කිසිවෙකු නොව පාවෙල් කොර්චාගින් බව ඈ වටහා ගත්තාය.

"ඔබ ජීවතුන් අතරද?"

ඒ වචනවලින් ඔහුට සියල්ල පැහැදිලි විය. ඔහුගේ මරණය ගැන පැතිරී ගිය පුවත බොරුවක් බව ඈ නොදත්තාය.

ශාලාව හිස් විය. හැරිය කවුළුව තුළින් නගරයේ ප්‍රධාන මාවතක් වන ත්වෙර්ස්කායාව ඔස්සේ දුවන රියවල ඝෝෂාව ඇසිණි. ඔර්ලෝසුවේ කණිසම හයවරක් වැදිණි. එහෙත්, ඔවුන් හමු වුණේ මොහොතකට පෙර බව ඔවුන්ගේ හැඟීමය. ගෙවී යන කාලය විසින් ඔවුන් බොල්ෂොයි රඟහලට කැඳවන ලදි. පුළුල් පියගැට පෙළ ඔස්සේ පිටත යන විට රීතා යළිත් වරක් පාවෙල් දෙස හැරී බැලුවාය. ඔහු දැන් ඇයට වඩා අඬ හිසකින් උසය. බාහිර පෙනුම පෙර මෙනි, ඔහු මුහුකුරා වැඩී

සිටීමත්! ආත්ම දමනයකින් යුක්ත වීමත් පමණකි වෙනසකට ඇත්තේ.

"පේනව නේද, මා ඔබෙන් ඔබ වැඩ කරන ස්ථානය ගැනවත් ඇසුවේ නැහැ."

"මම කොම්සොමොල් සංවිධානයක ප්‍රාදේශීය කමිටුවක ලේකම්වරයෙක්. නැතිනම් දුබාවා කියන විධිහට " උපකරණයක ඇණයක්" පාවෙල් මඳ සිනා පෑවේය.

"ඔබ ඔහු දුටුවාද?"

"ඔව්! මම ඔහු හමු වුණා. එය අප්‍රියජනක මතකයක් ඇති කළා."

ඔව්හු මහ මගට බටහ. මොටෝ රියවලින් නැඟෙන හඬද, ඒ මේ අත යන මිනිසුන්ගේ කෑගැසීම්ද ඇසිණි. ඔවුන් බොල්ෂොයි රඟහල දක්වා ගමන් කළේ නිහඬවය. දෙදෙනාම එක් දෙයක් ගැන සිතූහ. බොල්ෂොයි රඟහල අවට මහ මුහුද ගොඩ ගැලුවාක් මෙන් ජනතාව රැස්ව සිටියහ. ඔව්හු ප්‍රබෝධවත් උනන්දුවක් දැක්වූහ. රතු සෙබළුන් විසින් මුර කරනු ලැබ සිටි දෙරටු තුළින් බොල්ෂොයි රඟහලට කඩා වැදීමට රොක් වූ ජනතාව වෙර දැරූහ. එහෙත්, දෙරටු මුර කළ රතු සෙබළුන් ඇතුළු වීමට ඉඩ දුන්නේ නියෝජිතයන්ට පමණකි. විවිධ කපොලුවල සිටි මුර සෙබළුනට තම නියෝජිත බලපත්‍ර ආඩම්බර ලෙස පෙන්වමින් ඔව්හු ශාලාවට ඇතුළු වූහ.

බොල්ෂොයි රඟහල අවට තරුණ කොමියුනිස්ට්වරුන් දස දහසකි. අමුත්තන්ගේ ආරාධනා බලපත්‍ර නොලැබුණු මේ මහ පිරිස කෙසේ හෝ සම්මේලනය විවෘත කිරීමේ උත්සවයට සහභාගි වීමට උත්සාහ කළහ. සමහර කඩිසර කොම්සොමොල් සාමාජිකවරු නියෝජිතයන් අතරට වැද නියෝජිත බලපත්‍රවලට සමාන රතු කඩදසි පෙන්වමින් දෙර අසලටම යාමට සමත් වූහ. එහෙත්, එතැනදී ඔවුන් මධ්‍යම කාරක සභාවේ නියෝජිතවරයාට හෝ පාලක තැනට හෝ අසුවිණි. අමුත්තන් දෙපස ආසනවලටත්, නියෝජිතයන් මැද ආසනවලටත් යැවීම් කරන ලද්දේ මේ දෙදෙනා විසිනි. "බලපත්‍ර නැති" මහ පිරිස සතුටු කරවමින් ව්‍යාජ බලපත්‍ර පෙන් වූ පුද්ගලයන් නැවත පිටත දමන ලදි.

බොල්ෂොයි රඟහලට ඇතුළු වීමට පැමිණි පිරිසෙන් විස්සෙන් කොටසකටවත් එහි යාමට බැරිවිය.

රීතා සහ පාවෙල් ඉතා අමාරුවෙන් දෙරටුව වෙත ගියහ.

නියෝජිතවරු එන්නට පටන් ගත්හ. සමහරු ට්‍රෑම් රියෙන්ද, අන් සමහරු මොටෝරියෙන්ද, පැමිණියහ. දෙරටු අසල තෙරපීම් ඇතිවිය. කොම්සොමොල්වරු වන රතු හමුදාවේ සෙබළු මේ තෙරපීම් නිසා බිත්තිය දක්වා තල්ලු වී ගියහ. එවෙලාවෙ දෙරටු අසල මහා කෑ ගැසීමක් ඇති විය.

"බාවුමන් පෙදෙසේ කොල්ලනි, තල්ලු කරපියව්!"

"චාප්ලින්ටයි, සාෂා කෝසරෙව්ටයි එන්ට කියන්න. ඒ ගොල්ලන්ට ඇතුළු වීමට අවසර දේව්!"

"තල්ලු කරපන්, ජය අපිටයි."

"මෙල්ල වේව්!.."

පාවෙල් සහ රීතා සමග තියුණු ඇස් ඇති, කොම්සොමොල් පදක්කමක් පැලඳ සිටි තරුණයෙක්ද දෙරටුවෙන් ඇතුළු විය. ඔහු පාලක තැන අසලින් වේගයෙන් යමින් රඟහලේ විවේක ගැනීමේ කාමරය දෙසට පා තැබීය. නිමේෂයකින් ඔහු නියෝජිතයන් අතරට වැද අතුරුදහන් විය.

"අපි මෙතැන වාඩි වෙමු" යි ඇඳිපුටුවලට පිටිපසින් වූ ආසන දෙකක් පෙන්වූ රීතා දෙරටුවෙන් ඇතුළු වූ පසු පැවසුවාය. දෙදෙනාම එම මුල්ලෙහි වාඩි වූහ.

"එක ප්‍රශ්නයකට පිළිතුරු ලබා ගැනීමට මා කැමතියි. ඒක පසුගිය දවස්වලට අයිති දෙයක් වුණත් මා හිතනවා ඔබ ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙතියි කියලා, අපේ දේශපාලන අධ්‍යාපනයයි, අපේ මිත්‍රත්වයයි ඔබ එදා කඩා බිඳ දැමුවේ මොන හේතුවක් නිසා ද?" රීතා ඇසුවාය.

ඇය හමු වූ පළමුවැනි මොහොතේ සිට ඔහු එම ප්‍රශ්නය බලාපොරොත්තුව සිටියද, එයින් ඔහු චකිතයට පත්විය. ඔවුන්ගේ දෙනෙත් ගැටිණි. ඇය හේතුව දන්නා බව පාවෙල් වටහා ගත්තේය.

"රීතා, මා හිතනවා ඔබ ඒ ගැන දන්නවා කියලා. එය මීට අවුරුදු තුනකට ඉස්සෙල්ලා සිදුවූ දෙයක්. එදා ඒ වරද කළ පාවෙල්ට දෙස් පැවරීම විතරයි දැන් මට කළ හැක්කේ. පොදුවේ කියනවා නම්, පාවෙල් කෝර්චාගින් නමැති පුද්ගලයා තම ජීවිතයේදී ලොකු සහ කුඩා වැරැදි කර තියෙනවා. ඔබ දැන් ඇසුවේ ඔහු කළ වැරැද්දක් ගැනයි."

රීතා මඳහස පෑවාය.

"ඒක බොහොම හොඳ පෙරවදනක්. නමුත්, මම පිළිතුරු බලාපොරොත්තු වෙනවා." පාවෙල් මුමුනන්නට විය.

ඒකට වරදකරු මා පමණක් නොවෙයි, ඔවොද්[1] සහ ඔහුගේ විප්ලවවාදී විචිත්‍ර හැඟීම්. නිර්භීත මහත් ආත්ම ශක්තියක් ඇති, විප්ලවවාදීන් අභීත ලෙස හිත කය දෙකම අපේ ව්‍යාපාරයට කැපකර සිටින සැටි පොත්වල ලියා තිබුණා. ඔවුන්ගේ චරිත මාගේ සිත තුළ නොමැකෙන ලෙස ඇඳී තිබුණා. ඔවුන් වැනි වීරයන් වීමේ ඉමහත් ආසාවක් මා තුළ ඇති වුණා. ඔබ කෙරෙහි මගේ සිතේ හටගත් හැඟීම්වලට බාධා කළේ "ඔවොද්" නමැති පොතයි. දැන් මට එය විහිළුවක් පමණක් නොවෙයි, ලොකු පසුතැවිල්ලකට හේතුවක්."

"එහෙනම් ඔබ "ඔවොද්" පොත ගැන කළ තක්සේරුව වෙනස් කළාද?"

"නැහැ, රීතා ප්‍රධාන වශයෙන් නැහැ. මා අතහැර දැම්මේ වුවමනා නැති ශෝකාන්විත කොටස් සහ තම අධිෂ්ඨාන ශක්තිය පිරික්සා බැලීම සඳහා ගෙනගිය දුක්බර පරීක්ෂණ විතරයි. මූලික වශයෙන් මම 'ඔවොද්'වල එන වීරයන්ගේ නිර්භීතකමටයි, සීමාරහිත ඉවසීමේ ශක්තියටයි, එකකුට හෝ කිසිවකුට හෝ නොපෙන්වා සියලු දුක් විඳ දරා ගැනීමට ශක්තියක් ඇති චරිතවලටයි කැමතියි. පොදුවේ ඇති දේ ගැන සසඳා බලන විට පෞද්ගලික දේ කිසිදු වැදගැම්මකට නැතැයි යන මතය දරන විප්ලවවාදීන්ට මම හැමදම කැමතියි."

"මේ සාකච්ඡාව ඇති විය යුතුව තිබුණේ මීට අවුරුදු තුනකට උඩදියි. පාවෙල්, දැන් එය සිදුවීම ගැන මම කනගාටු වෙනවා." කිසියම් කල්පනාවක නිමග්න වූ රීතා මඳ සිනා පාමින් පැවසුවාය.

"රීතා ඔබේ කනගාටුව ඔබට මා හැමදම ව්‍යාපාරයේ සගයෙකුට වඩා වැඩි කෙනෙකු බවට පත් නොවීම නිසා නේද?"

"නැහැ. පාවෙල් ඔබට ඊට වඩා වැඩි කෙනෙකු වීමට ඉඩ තිබුණා."

"දැන් ඒ අත්වැරැද්ද හරි ගස්සා ගන්ට පුළුවනි."

"තරමක් පමා වුණා 'ඔවොද්' (සහෝදරයා)." තමා කළ විහිළුව නිසා මඳ සිනා පෑ රීතා විස්තර කළාය.

"දැන් මට පුංචි දුවෙක් ඉන්නවා. එයාට තාත්තා කෙනෙක් ඉන්නවා, ඔහු මගේ ඉතාම හොඳ මිතුරා. අපි තුන්දෙනා

---

1 ඔවොද් - මෙය ගැඩ්ප්ලයි නමැති සුප්‍රසිද්ධ ඉංග්‍රීසි නවකතාවේ පරිවර්තනයකි.

ඉතා සතුටින් ජීවත් වෙනවා. දැනට අපේ පවුල බෙද වෙන්කරන්නට බැහැ."

ඇගේ ඇඟිලි පාවෙල්ගේ අත ස්පර්ශ කළේය. ඒ ඉඟිය ඔහු නිසා හටගත් බිය මුසු කනස්සලු ගතිය කියා පෑවේය. එහෙත්, එය නුවමනා දෙයක් බව ඈට සැණෙකින් වැටහිණි. ඔව්. ඒ තෙවසර තුළදී ඔහු වැඩි ඇත්තේ ශාරීරික වශයෙන් පමණක් නොවේ. ඔහුට එය වේදනාවක් ගෙන දුන් බව ඈය දත්තාය. එය ඔහුගේ දෙනෙතින් පෙනෙයි. ඔහු පුහු මානයෙන් තොරව සත්‍යගරුක ලෙස මෙසේ පැවසීය:

"මා ළඟ ඉතිරිව ඇති දේ මා අතින් නැතිවූ දේවලට වඩා බොහෝ වැඩිය."

පාවෙල් සහ රීතා නැඟිට සිටියහ. වේදිකාව අසලින් අසුන් ගැනීමට වේලාව පැමිණ ඇත. උක්රයිනයේ නියෝජිත මණ්ඩලය අසුන් ගෙන සිටි ඇඳි පුටු පේළිය දෙසට ඔව්හු ගියහ. සංගීත වාදනය ඇරැඹිණි. රතු පැහැති විශාල බැනර් කොඩියක් ශාලාව හරහා දිස්විය. ඒවායේ අකුරු ආලෝකවත් ලෙස දිලිසිණි. "අනාගතය අප අතේය!" අතිවිශාල බොල්ෂොයි රඟහලේ හැම ආසනයක්ම පිරිලාය. දහස් ගණනක් වූ නියෝජිතයෝ කිසි කලෙක ශක්තිය නොසිඳන මහා විදුලි බල යන්ත්‍රයක් මෙන් විය. රටේ ශ්‍රේෂ්ඨ කර්මාන්තමය සහෝදරත්වයේ පුෂ්පය වන තරුණ ආරක්ෂක හමුදුව බොල්ෂොයි රඟහල විසින් පිළිගන්නා ලදි. විශාල බැනර් ධජයේ දිලිසෙන අකුරින් ලියා ඇති උද්ධෘත පාඨය රැස්ව සිටි හැම නියෝජිතයෙකුගේම ඇස්වලද දකින්නට තිබිණි.

"අනාගතය අප අතේය!"

රැස්වීම් හල තුළට එන අයගේ ගණන අඩුවක් නොවිණි. තව විනාඩි කීපයකින් වැල්වට් තිරය දෙබෑවී රුසියානු තරුණ කොමියුනිස්ට් සංගමයේ මධ්‍යම කාරක සභාවේ ලේකම් චාප්ලින් උත්සවයේ ගාම්භීරත්වය නිසා කැලඹුණු ස්වරයකින් යුතුව මෙසේ පවසනු ඇත:

"රුසියානු කොමියුනිස්ට් තරුණ සංගමයේ හයවැනි සම්මේලන වාරය ආරම්භ කරන බව දන්වා සිටිමි."

විප්ලවයේ මහා බලය හා මහිමය ගැන මෙතරම් ගැඹුරු ලෙසත්, මෙතරම් සුපැහැදිලි ලෙසත් පාවෙල් කොර්චාගින්ට මීට පෙර කිසිදක නොවැටහිණි. බොල්ෂෙවික්වාදයේ තරුණ ආරක්ෂක මුර හටයන්ගේ තේජාන්විත ජයග්‍රාහී මහා රැලියට

සටන්කාමියකු හා නව සමාජය ගොඩනගන්නකු හැටියට තමාට සහභාගි වීමට ඉඩ ලැබීම නිසා වචනවලින් විස්තර කළ නොහැකි ප්‍රෞඪත්වයෙකින් හා විශාල ප්‍රීතියකින් ඉපිලී ගොස් සිටින බව කොර්චාගින්ට දැනිණි.

★

උදේ සිට රෑ බෝවන තුරු සම්මේලනයට සහභාගි වූවන්ට වැඩ කිරීමට සිදුවිය. පාවෙල්ට රීතා මුණ ගැසුණේ එක් අවසාන රැස්වීම් වාරයකදීය. ඇය උක්රයීන නියෝජිත කණ්ඩායම සමඟ සිටිනු ඔහු දිටීය.

"හෙට සම්මේලනය ඉවරවුණු හැටියේම මම යනවා." ඈ කීවාය. අපට සමුගැනීමටවත් ඉඩක් ලැබේ දැ යි මා දන්නේ නැහැ. ඒ නිසා අපේ අතීතයට අයත් දිනපොත් දෙකක් සහ කුඩා ලිපියක් මා ඔබට දීමට තීරණය කළා. ඒවා කියවා තැපැල් මගින් මා වෙත එවන්න. මා ඔබට නොකී දේ ගැන මගේ දිනපොතින්, ලියුමෙන් දැන ගැනීමට පුළුවනි."

ඔහු ඇගේ අතක් ගෙන ආචාර කරමින් ඇගේ මුහුණ අමතක නොකිරීමට මෙන් ඉතා සැලකිල්ලෙන් ඇය දෙස බැලීය.

ඔව්හු තීරණය කරගත් පරිදි පසු දින ප්‍රධාන දොරටුව අසල දී හමුවූහ. රීතා ඔහුට පාර්සලයක් හා ලිපියක් දුන්නාය. අවට ජනයා රැස්ව සිටි බැවින් ඔවුන්ට සිය හැඟීම් මැඩගෙන සමුගැනීමට සිදුවිය. තරමක් කඳුළින් පිරි ඇගේ දෙනෙත්වල විශාල උණුසුමක් හා මඳ දුකක් ඔහු දුටුවේය.

ඊට පසුදින නොයෙක් දුම්රිය මැදිරිවලින් ඔව්හු සිය පෙදෙස් බලා ගියහ.

උක්රයීනයේ නියෝජිත මණ්ඩලය දුම්රිය මැදිරි කීපයක ගමන් කළ අතර, කොර්චාගින් කියෙව් නගරයේ නියෝජිත මණ්ඩලය සමඟ සිටියේය. රාත්‍රියේදී නියෝජිතයන් නින්දට ගිය පසු, තම අසල්වැසි මඟියා වූ ඕකුන්යෙව් යාබද ඇඳට වී නාසයෙන් ශබ්දයක් පිට කරමින් නිදන්නට වූ විට කොර්චාගින් පහන අසලට වී ලියුම් කවරය ඉරා කියවන්නට විය.

ආදරණීය පව්ලූෂා!

මෙය මට ඔබ ඉදිරියේ පෞද්ගලිකව කිව හැකිව තිබුණා. නමුත්, මේ විධිහ වඩාත් හොඳයි. සම්මේලනය පටන් ගැනීමට පෙර අප දෙදෙනා අතර ඇති වූ සාකච්ඡාව ඔබ ජීවිතයට අහිතකර ලෙස බල නොපානු ඇතැයි මම සිතමි.

ඔබ ශක්තිමත් පුද්ගලයෙකු බව මම දනිමි. එබැවින් ඔබ කී දේ කෙරෙහි විශ්වාසය තබමි. මම ජීවිතය දෙස බාහිර ලෙස බලන කෙනෙක් නොවෙමි. පෞද්ගලික සම්බන්ධතාවලදී, ඒවා පැන නැගී ඇත්තේ විශාල හා ගැඹුරු හැඟීම් අනුව නම්, කෙනෙකුට කලාතුරකින් හෝ විශේෂතාවක් කළ හැකි බව මගේ විශ්වාසයයි. ඔබ එවැන්නකට සුදුස්සෙකි. එහෙත් අපේ තරුණ වයසට එවැනි සේවයක් කිරීමේ ආවේගය මම ප්‍රතික්ෂේප කළේ එය අප දෙදෙනාට විශාල සැපතක් නොදෙනු ඇති බැවිනි. පාවෙල් ඔබ, ඔබ කෙරෙහිම දක්වන දැඩි ගතිය නොකළ යුතු දෙයකි. අප ජීවිතයේ ඇත්තේ සටන පමණක් නොවේ, යහපත් හැඟීම්වල ප්‍රීතියද ඇත.

ඔබ ජීවිතයේ ඉතිරි හරිය ගැන, එනම් එහි මූලික හරය ගැන මා තුළ කිසිදු බියක් නැත. මම ඔබේ අත වැරෙන් මිරිකමින් ආචාර කරමි.

මීට රීතා.

පාවෙල් කල්පනාකාරීව ලියුම ඉරා කැබැලි මිටින් ගෙන දුම්රියේ කවුළුවෙන් පිටතට දැමීය. දැඩි සුළං පහර ඔහුගේ අතැති කඩදාසි කැබැලි උදුරා ගත්තේය.

උදය වන විට රීතාගේ දින පොත් දෙකම පාවෙල් කියවා අවසන් කළේය. හාර්කොව්හිදී උක්රයින නියෝජිත මණ්ඩලයෙන් කොටසක් දුම්රියෙන් බටුයේය. ඕකුන්යෙව්, පන්ක්‍රාතොව් සහ කොර්චාගින් ඔවුන් අතර වූහ. ආන්නාගේ නිවසෙහි නැවතී සිටින තාල්යා කැඳවාගෙන ඒම සඳහා නිකොලායි ඕකුන්යෙව් කීයෙව් බලා යා යුතු විය. උක්රයිනයේ කොම්සොමොල් සංවිධානයේ මධ්‍යම කාරක සභාවට තේරී පත් වූ පන්ක්‍රාතොව්ට භාර වැඩ ගොඩකි. ෂාර්කි සහ ආන්නා හමුවීම් වස් කීයෙව් නගරයට යාමට කොර්චාගින් තීරණය කළේය. රීතාට ඇගේ දිනපොත් තැපැල් කිරීම සඳහා දුම්රියපොළේ තැපැල් කාර්යාලයට ගිය කොර්චාගින් ඒවා යවා පිටතට ආ විට මිතුරන්ගෙන් එකෙකුවත් නොසිටියේය.

★

ඔහු කීයෙව් නගරයට විත් ට්‍රෑම් රථයක නැගී දුබාවා සහ ආන්නා පදිංචි වී සිටි නිවසට පැමිණියේය. ඔහු දෙවැනි මාලයට නැග වම් පැත්තෙහි වූ ආන්නාගේ කාමරයහි දොරට තට්ටු කළද, පිළිතුරු නොලැබිණි. උදේ පාන්දර වූ බැවින් ඇයට වැඩට යාමට කල් තිබිණි. "ඈ තවම නිදි ඇතැයි" ඔහු සිතුවේය. යාබද කාමරයේ දොර හැරී දුබාවා දොරකඩට

ආවේය. ඔහුගේ දෙනෙත් නිදිබරින් පිරී ඇත. මුහුණ අළු පැහැතිය. ඇස්වලට යටින් කළු පැහැති පැල්ලම්ය. ඔහු වෙතින් ලූනු සුවඳක් වහනය විය. පාවෙල්ගේ තියුණු ඉවට මත්පැන් ගඳක්ද දැනිණි. යම්තමින් ඇරී තිබුණු දොර අතරින් ඇඳක වැතිර සිටින තරබාරු ගැහැනියකගේ සිරුරක්ද, වඩාත් ස්ථිරව, ගැහැනියකගේ උරහිස් හා තරබාරු කකුලක්ද ඔහු දුටුවේය.

දුබාවා ඔහුගේ බැල්ම දුටුවෙන්, කකුලකින් දොර වැසුවේය.

"නුඹ බොර්හාර්ට් සහෝදරිය හමුවෙන්නද?

දුබාවා එක එල්ලේ ඔහු දෙස නොබලා විචාළේය.

"ඈ දැන් මෙහි නැහැ. නුඹ ඒ ගැන දන්නෙ නැත්ද?"

බුම්බාගත් කොර්චාගින් ඔහු දෙස පිරික්සුම් බැල්මක් හෙළී ය.

"මා ඒ ගැන දැන සිටියෙ නැහැ. ඈ කොහේ ගිහින්ද?" ඔහු ඇසීය.

දුබාවා සැණෙකින් කෝපයට පත් විය.

"ඒ ගැන මට ඇති වුවමනාවක් නැහැ" ඔහු කෑගැසීය. ඔහු රාමතෙල් හැර මැඩ ගත් කෝපයෙන් යුතුව මෙසේ කීය. "නුඹ ඇයව සනසන්ට ආවාද? ඉතින් හරි, නියම වේලාව. දැන් ඇබෑර්තුවක් තියෙනවා. ඉක්මන් වෙයන්. ඈ නුඹව ප්‍රතික්ෂේප කරන්නෙ නැහැ. ඈ මට කීප වරක්ම කීවා නුඹ ඇගේ සිත් ගත් බව. වෙලාව බලලා වැඩේ කරපන්. ආත්මයේත්, ශරීරයේත් එක්සත්කම ඇති වෙනවා."

තමාගේ දෙකම්මුල් රත්වෙන බව ඔහුට දැනුණද, ඔහු තම හැඟීම් පාලනය කර ගනිමින් පහත් හඬින් කතා කළේය:

"මිත්‍යායි, නුඹ කොතරම් පහත් තත්ත්වයකට වැටී තියෙනවාද? නුඹ මෙතරම් අධමයකු බවට වැටී සිටිනවා. දැකීමට මා බලාපොරොත්තු වුණේ නැහැ. නුඹ ඉස්සර වටිනා හාදයකුව සිටියා නොවැ, නුඹ මෙවැනි නීච තත්ත්වයකට වැටුණේ කොහොමද?"

දුබාවා බිත්තියට හේත්තු වී සිටියේය. සිමෙන්ති පොළොවේ පාවහන් රහිතව සිටීම ඔහුට අසීරු කරුණකි. ඔහු වෙවුලන්නට විය. දොර හැරිය විට ඉදිමුණ ඇස් ඇති තරබාරු කොපුල් ඇති ගැහැනියකගේ මුහුණ දිස් විය.

"සුදු කොල්ලා මෙහෙ එන්නකෝ. ඔයා ඔතනට වෙලා කරන්නෙ මොනවාද?" ගැහැනිය ඇසුවාය.

ඇට කතා කිරීමට ඉඩ නොතබා තම සිරුරෙන් දොර වසා,

දෙරටුව ඉදිරියේ දුබාවා සිටියේය.

"හොඳ පටන් ගැන්මක්..." පාවෙල් කීවේය.

"නුඹේ කාමරයට වැද්ද ගන්නේ කාවද? මෙය ඉවර වෙන්නෙ කොහොමද?"

සාකච්ඡාව නිසා හෙම්බත් වූයෙන් දුබාවා කෑගැසීය.

"මා කා සමඟ නිදගත යුතුදැයි නුඹලා මට අණ කරන්නට එනවද? නුඹලා මට දේශනා කළා ඇති! ආ අතක් බලාගෙන පලයන්! දුබාවා වේස ගෑනු එක්ක නිද ගන්නවා, බොනවා කියලා ගිහින් කියපන්."

පාවෙල් ඔහුට වඩාත් ළං වී කැලඹීමෙන් යුතුව මෙසේ පැවසීය. "මිත්යායි ඔය නැන්දට එළියට බහින්ට කියාපන්. නුඹ සමඟ අවසාන වරට කතා කිරීමට මා කැමතියි..."

දුබාවාගේ මුහුණ කළු පැහැගති. ඔහු පාවෙල්ට පිටුපා ගොස් කාමරයට වැදුණේය.

"අනේ නීචයා!" එසේ කී කොර්චාගින් සෙමින් පිය ගැටපෙළ ඔස්සේ පහත බැස්සේය.

★

දෙවසරක් ගෙවිණි. කාලය දවස් හා මාස වශයෙන් ගෙවී ගියද, විවිධ වර්ණයෙන් යුත් ජීවිතය විසින් එම දවස් පිරවිණි. මේ නිසා දවස්වල ඒකාකාර බවක් නොවීය. දහසය කෝටියකින් යුත් ශ්‍රේෂ්ඨ ජනතාවක් ලෝක ඉතිහාසයේ පළමුවැනි වරට තම ඉරණම සහ සීමාරහිත ධන නිධානයන්ගෙන් යුත් තම අතිවිශාල රටෙහි සියලු ධනසම්භාරය සිය'තට ගෙන යුද්ධය නිසා විනාශ වුණ ආර්ථික පුනරුත්ථාපනයට පත් කිරීම සඳහා වීරෝදාර කාර්යයක යෙදෙන්නට වූහ. රට ශක්තිමත් වන්නට විය. බලය ගොනුකරගෙන නැඟී සිටින්නට විය. මෑතක් වන තුරු සුපුරුදු දර්ශනයක් වූ අතහැර දැමූ කම්හල් හා දුම් රහිත දුම්බට තවත් නොවීය.

ඒ අවුරුදු දෙක තුළදී පාවෙල් කොතරම් වේගයෙන් වැඩ කටයුතුවල යෙදුණේද යත් එම කාලය ගෙවී යන සැටි පවා නොදිටීය. ඔහුට නිවිහැනේ ජීවත්වීම නොපුරුදුය. උදේ නැඟිට ඈනුම් හරිමින් දවස පිළිගැනීමත් හරියට රෑ දහයට නින්දට යාමත් ඔහුට නොරිසි විය. ඔහු ජීවත්වීම සඳහා යුහුසුලු විය. ඔහු යුහුසුලු වූවා පමණක් නොව, අන් අයද උනන්දු කරවීය.

නිදාගැනීම සඳහා ඔහු වෙන් කළේ ඉතා සුළු කාලයකි. රෑ බෝවූ පසුද ඔහුගේ කාමරයේ පහන් දැල්විණි. එහි රැස්

වූ මිනිස්සු මේසය වටා වාඩිවී සිටියහ. ඔව්හු අධ්‍යාපන කටයුතුවල යෙදුණහ. අවුරුදු දෙකක් තුළදී කාල් මාක්ස්ගේ 'ප්‍රාග් ධනයේ' තෙවැනි කාණ්ඩයද කියවා හැදෑරූහ. ධනපති සූරා කෑමේ සියුම්තම යාන්ත්‍රණය වටහා ගැනීමට ඔව්හු සමත් වූහ.

පාවෙල් කොර්චාගින් වැඩ කළ පෙදෙසට රස්වලීහින් පැමිණියේය, ගුබේර්නියා කමිටුවේ රෙකමදරුව අනුව දිස්ත්‍රික්කයක කොම්සොමොල් ලේකම් ධුරයට පත් කරන ලෙස ඔහු එවා තිබිණි. ඒ දවස්වලදී කොර්චාගින් වෙනත් වැඩක් සඳහා පිටත ගොස් සිටියෙන්, ඔහුගේ සහභාගිත්වය නැතිව බියුරෝව රස්වලීහින්ව එක් දිස්ත්‍රික්කයකට යැවීය. පාවෙල් පැමිණි පසු එම පුවත ගැන ඔහුට කීවද ඔහු මුවින් නොබැණ සිටියේය.

මසකට පසු පාවෙල් රස්වලීහින් වැඩ කරන දිස්ත්‍රික්කයට ගියේය. ඔහු එහි දී සමහර කරුණු එක් රැස් කර ගත්තේය. ඒවා අතර, නිතර මත්පැන් බීම, තමා වටා පන්දම්කාරයන් එකතු කරගෙන හොඳ සාමාජිකයන්ගේ උනන්දුව විනාශ කර දැමීම ආදී දේ විය. පාවෙල් එම කරුණු බියුරෝව ඉදිරියේ තැබූ විට, එය සාකච්ඡාවට භාජනය කළෙන්, රස්වලීහින්ට දැඩි ලෙස දෙස් පවරන යෝජනාවක් ඉදිරිපත් විය. එවිට පාවෙල් හැම දෙනෙකුම මවිතයට පත් කරමින් මෙසේ කීය.

"නැවත කොම්සොමොල් සංවිධානයට බැඳීමට බැරිවන සේ ඔහු නෙරපා දැමිය යුතුයි."

ඔහුගේ මතය ඉතා දැඩි බැවින් හැම දෙනාම පුදුම වූහ. එහෙත්, පාවෙල් දැඩි ලෙසම මෙසේ කීවේය.

"ඒ නීචයා නෙරපා දැමිය යුතුයි. ඒ විදුහල් සිසුට යහපත් කෙනෙකු වීමට සෑහෙන කාලයක් දුන්නා. එහෙත්, ඔහු පහත් තත්ත්වයෙන් ගොඩ ආවෙ නැහැ." ඉක්බිති පාවෙල් බෙරෙස්දෙව්වලදී රස්වලීහින්ගේ වැඩ ගැන විස්තර කළේය.

"පාවෙල් කොර්චාගින්ගේ කතාවට මම දැඩි විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ඔහු මා සමඟ පෞද්ගලිකව තරහයි. ඕනෑම කෙනෙකුට පුළුවනි බොරු ප්‍රචාරය කරන්ට. කරුණු ඇතිව කොර්චාගින්ට පුළුවන් නම් ලියවිලි ඉදිරිපත් කළාවෙ. මටත් එහෙම නම් බොරු කියන්ට පුළුවනි, ඔහු නීතිවිරෝධී ලෙස ජාවාරම් කළා යි කියලා. එතකොට ඔහුව අස්කළ යුතුද? නැහැ. ඔහු ලියවිලි මගින් ඔප්පු කළාවෙ!" රස්වලීහින් කෑ ගැසීය.

"කලබල වෙන්ට එපා. මම ලියකියැවිලි ඉදිරිපත් කරන්නම්!" ඔහුට පාවෙල් පිළිතුරු දුන්නේය.

රැස්වලීහින් පිටවිය. අඩ පැයකට පසු පාවෙල්ගේ යෝජනාව සම්මත විය. "කොම්සොමොල් සංවිධානයට පිටත්තර පුද්ගලයකු මෙන් සලකා ඔහු නෙරපා දැමිය යුතුයි."

★

ගිම්හාන කාලයේදී සහෝදරවරු එකිනෙකා විවේක ගැනීම සඳහා පිටවී ගියහ. සෞඛ්‍යය අතින් දුර්වල සගයන් මුහුද අසලට යවන ලදී. ගිම්හානයත් සමගම හැම කෙනෙක්ම විවේකය ගැන කල්පනා කිරීමට පටන් ගනිති. කෝර්චාගින් තම සගයන්ට සෞඛ්‍යාගාරවලට හා විනෝදගාරවලට යාම සඳහා අවසර පත් ලබා ගැනීමට සටන් කළේය. විඩාපත්ව සිටි ඔව්හු සුදුමැලිව එහෙත්, ප්‍රීතිමත් විවේක ගැනීමට ගියහ. ඔවුන්ගේ වැඩද කෝර්චාගින් කර පිට වැටිණි. එහෙත්, ඔහු අසකු ගැලක් ඇදගෙන කන්දක් නගින්නා සේ ඔවුන්ගේ වැඩද කළේය. ඔහුගේ සගයෝ හිරු රැස් නා, ප්‍රීතියෙන් ඔද වැඩි, ශක්තිය ලබාගෙන යළි වැඩට ආහ. අනතුරුව වෙනත් අය විවේක ගැනීමට ගියහ. ගිම්හාන කාලයේදී නිතරම කීපදෙනෙකු විවේක ගැනීමට ගොසිනි. එහෙත්, වැඩ කටයුතු එක ලෙසම කෙරිණි. කෝර්චාගින් තම කාර්යාල කාමරයේ නොසිටීම ගැන කිසිවකුටවත් සිතා ගැනීමට පවා බැරි විය.

එලෙස ගිම්හානය ගෙවිණි.

සරත් සමය හා ශීත සමය පාවෙල්ට නොරිසි විය. ඒ කාලවලදී ඔහුගේ ශාරීරික වේදනා වැඩි වූ බැවිනි.

පාවෙල් එම ගිම්හානය බලාපොරොත්තු වූයේ නොඉවසිල්ලෙනි. වසරක් පාසාම තම ශක්තිය හීන වන බව පිළිගැනීම තමාටම පවා වේදනා සහගත බරපතළ කරුණක් විය. ඔහු ඉදිරියේ ක්‍රම දෙකක් විය. තමාගෙන් බලාපොරොත්තු වන සූක්ෂ්ම ශ්‍රමය සපුරාලීමට නොහැකි බව කියා සිටීමෙන් තමා පිරිහුණු සෞඛ්‍ය තත්ත්වය ඇත්තෙකැ යි පිළිගැනීම පළමුවැනි ක්‍රමයයි. දෙවැන්න තමා ඇද වැටෙන තුරු දැන් කරන වැඩ කොටස එලෙසම කරගෙන යාමයි. පාවෙල් දෙවැනි ක්‍රමය තෝරා ගත්තේය.

එක් දවසක පක්ෂයේ ප්‍රාදේශීය කමිටුවේ රැස්වීම් වාරයක් පැවැති අවස්ථාවකදී පක්ෂයේ ඉපැරැණි සාමාජිකයෙකු වූ විප්ලවයට පෙර නීති විරෝධී ලෙස සැඟවී දේශපාලන වැඩ

කළ දෙස්තර බාර්තෙලික් පාවෙල් අසලින් වාඩි විය. ඔහු දැන් ප්‍රාදේශීය සෞඛ්‍ය අංශයේ ප්‍රධානියාය.

"කොර්චාගින් සහෝදරයාගේ පෙනුම හොඳ මදි. ඔබගේ සෞඛ්‍යය කොහොමද? ඔබ වෛද්‍ය කොමිසම ඉදිරිපිට පෙනී හිටියද? නැතිද? මට මතක නැහැ ඔබ ආ බව. ඔබව පරීක්ෂා කිරීමට අවශ්‍යයි. යාළුවා බ්‍රහස්පතින්ද සවසට එන්න."

පාවෙල් වෛද්‍ය කොමිසම ඉදිරියට නොගියේය. ඔහුට වැඩ තිබිණි. එහෙත්, බාර්තෙලික්ට ඔහු ගැන අමතක නොවීය. පසුව ඔහු විත් පාවෙල් කැටුව ගියේය. පාවෙල් වෛද්‍ය කොමිෂන් සභාව ඉදිරියට යැව්වේය. (එහි ස්නායු රෝග විශේෂඥයා ලෙස බාර්තෙලික් සේවය කළේය.) කොමිසම විසින් කරන ලද වෛද්‍ය පරීක්ෂණයේ ප්‍රතිඵල මෙසේ ලියුවේය.

"පාවෙල් කොර්චාගින්ගේ සෞඛ්‍ය තත්ත්වය අනුව ඔහුට වහාම විවේක කාලයක දී දීර්ඝ කාලීන ප්‍රතිකාර සඳහා ඔහු ක්‍රිමියාවට යැවිය යුතුය. ඉන් පසුවද ඔහුට දිගු කලක්ම වෛද්‍ය ප්‍රතිකාර කළ යුතුය. නැතිනම් ඉතා බරපතළ විපාකවලට මූණ පෑමට සිදුවන බව වෛද්‍ය කොමිසම තීරණය කරයි."

එම තීරණය සමඟ ඔහුගේ රෝගයත් ලතින් බසින් ලියා තිබිණි. ඉන් එක් දෙයක් ගැන පාවෙල්ට පැහැදිලි විය. ප්‍රධාන රෝගාබාධය කකුල්වල නොව, මධ්‍යම ස්නායු පද්ධතියේ බවය.

බාර්තෙලික් වෛද්‍ය කොමිසමේ තීරණය පක්ෂ බියුරෝවට ඉදිරිපත් කොට සම්මතය ලබා ගත්තේය. වහාම කොර්චාගින් වැඩවලින් නිදහස් කොට, ඔහුට නිවාඩු දීමට කිසිවෙක් විරුද්ධ නොවූහ. කොම්සොමොල් සංවිධානයේ සංවිධාන අංශයේ ප්‍රධානියා වූ ස්බිට්න්යොව් පැමිණෙන තුරු තමාට වැඩ කිරීමට අවසර දෙන ලෙස ඔහු ඉල්ලා සිටියේය. කොම්සොමොල් කොමිටිය නායකත්වයෙන් තොරව තැබීමට ඔහු අකැමැති විය. දෙස්තර බාර්තෙලික් විරුද්ධ වූවද පක්ෂ කමිටුව ඔහුගේ ඉල්ලීමට එකඟ විය.

ජීවිතයේ පළමුවැනි වරට නිවාඩු ගැනීම සඳහා තව ඇත්තේ සති තුනක් පමණකි. ඔහුගේ මේසය මත එව්පතෝරියාවේ සෞඛ්‍යාගාරයක් සඳහා අවසර පතක් විය. ඒ දවස්වලදී පාවෙල් වඩාත් වැඩි වේගයකින් වැඩ කළේය. ප්‍රාදේශීය කොම්සොමොල් කමිටුවේ පූර්ණ රැස්වීමක් තබා සියලු දුබලකම් මඟ හැරීම සඳහා කටයුතු කළේ, සන්සුන් ව

යාමට නිසි අවකාශයක් ලබා ගැනීමටය.

තම ජීවිතයේ කිසි දිනෙක නොදුටු, මූදු වෙරළට විවේක ගැනීම සඳහා යාමට ඔන්න මෙන්න කියා තිබියදී ඔහු බලාපොරොත්තු නො වූ පිළිකුල් සහගත, නින්දනීය දෙයක් සිදු විය.

දවසේ වැඩ අවසන් වීමෙන් පසු පාවෙල් ප්‍රචාරක අංශයට ගියේ එහි රැස්වීමකට සහභාගි වීමටය. ඔහු එහි යනවිට එම කාමරයේ කිසිවෙකු නොසිටියෙන් ඔහු කවුළුවට අයත් පඩිකඳ මත වාඩි විය. එය පොත් අල්මාරියට පිටුපසින් තිබිණි. ඔහු එන විට කාමරයේ කිසිවකු නොසිටියේය. ඉක්මනින්ම කීප දෙනෙක් පැමිණියහ. පොත් අල්මාරියට පිටුපසින් සිටි පාවෙල්ට ඔවුන් නොපෙනුණද, එකකුගේ කටහඬ ඔහු හොඳින් හැඳින ගත්තේ ය. ඔහු ප්‍රාදේශීය ආර්ථික අංශය භාර උසැති පායිලෝය. කඩවසම් පුද්ගලයෙකු වූ ඔහු, යුදකාමී ඉරියව් ඇත්තෙකි. ඔහු මත්පැන් බීමට හා ගෑනුන් පස්සේ යාමට නම් දැරූ කෙනෙකු බව පාවෙල් අසා ඇත.

පායිලෝ ඉස්සර දේශ ප්‍රේමී භට කණ්ඩායමක සේවය කළ බවත්, අවස්ථාවක් ලත් විගස ඔහු මහ්නෝ නමැති ත්‍රස්තවාදී හොර දෙටුවාගේ සෙබළුන් දවසකට දහදෙනෙකු පමණ කපා දැමූ හැටි සිනාහඬ නගමින් කියන බවත් ප්‍රකටය. කොර්චාගින්ට ඔහු නොරිසි විය. වරක තරුණ කොමියුනිස්ට් සංගමයේ සාමාජිකාවක් පාවෙල් හමුවීමට විත් අඬ අඬා පායිලෝ ඇය සමඟ විවාහ වීමට පොරොන්දු වී සතියක් ඇය අඹුකමට ගෙන ඉන් පසු ඇය සමඟ කතා කිරීම පවා ප්‍රතික්ෂේප කළ බව විස්තර කළාය. පාලක කොමිසමට මේ කරුණ ගැන පැමිණිලි කළ විට, තරුණියට එය ඔප්පු කිරීමට සාක්ෂි නැති වූ නිසා පායිලෝ චෝදනාවෙන් ගැලවීමට සමත් විය. එහෙත්, පාවෙල් කොර්චාගින් ඇය විශ්වාස කළේය. දැන් ප්‍රචාරක කාර්යාලයේ පොත් අල්මාරියට එහා කෙරෙන සාකච්ඡාව පාවෙල්ට ඇසෙයි.

"ඉතින් පායිලො නුඹේ වැඩ කටයුතු කොහොමද? අලුතෙන් ගොදුරක් හොයා ගත්තේ නැතිද?"

එසේ ප්‍රශ්න කළේ ග්‍රිබොව්ය. ඔහු පායිලෝව්ගේ අඹ යාළුවාය. ග්‍රිබොව් නොදියුණු, පටු බුද්ධියක් ඇති, මුග්ධයෙක් වූවද, යම් කිසි හේතුවක් නිසා ඔහු ප්‍රචාරකයෙකු ලෙස ගැනිණි. තමා ප්‍රචාරකයෙකු බව කියාගැනීමට ආඩම්බර වූ ග්‍රිබොව් අවශ්‍ය හා අනවශ්‍ය හැම තැනකදීම එම කරුණ ගැන මතක් කළේය.

"මල්ලි නුඹ මට ජය පතපන්, මම ඊයේ තවත් බඩුවක් මෙල්ල කළා. කරතායෙවාව. නුඹ කීවා නේද ඒ වැඩේ හරියන්නේ නැතැයි කියලා. නැහැ මල්ලී නුඹ පරාදයි. මම ගැනියක් අල්ලා ගන්ට හිතුවොත් කොහොම හරි ඒක අල්ලාගෙන තමයි ඉවර කරන්නේ" තම කටමැත දෙඩවීම පායිලෝ අවසන් කළේ කුණු හරුප ගොඩක් ඇද බාමිනි.

කොර්චාගින් ස්නායු කිපීමෙන් පෙළෙන්නට විය. ඔහුගේ කෝපය බුර බුරා නැංගේය. කරතායෙවා කාන්තා අංශය භාරව වැඩ කළාය. ඇය මෙහි පැමිණියේ පාවෙල් පැමිණි දවස්වලදීය. පක්ෂයේ උද්යෝගිමත් සාමාජිකාවක් වූ ඈ පසන් ගති ඇත්තියක වූවාය. ඈ පිහිටාධාර සොයා තමා වෙත පැමිණි හැම කතකටම ඉතා සැලකිල්ලෙන්, සවන් දී, කළ හැකි හැම දෙයක්ම කළාය. ප්‍රාදේශීය කමිටුවේ අනිකුත් සාමාජිකයෝ ඇයට ගරු කළහ. ඈ අවිවාහක කතකි. පායිලෝ කීවේ ඇය ගැන බවට සැකයක් නැත.

"පායිලෝ නුඹ බොරු කියනවා නේද...? ඇය එහෙම කෙනෙක් නෙවෙයි." ග්‍රිබොව් කීවේය.

"මමද බොරු කියන්නෙ? නුඹ මාව ගණන් ගන්නේ කවුරුන් හැටියටද? ඔයිට වැඩිය සැර බඩු මම මෙල්ල කරලා තියෙනවා. වැඩේ කරන හැටි දැනගෙන තියෙන්ට ඕන. දවසකින්, දෙකකින් යටත් වෙනවා නම් ඒවා බොහොම බාල බඩු. සමහර අයව අල්ලාගන්ට මාස ගණන් දුවන්ට ඕන. තැනේ හැටියට හැසිරෙන්න ඕන. මල්ලී ඒකත් විද්‍යාවක්, මම ඒ විද්‍යාවේ මහාචාර්යවරයෙක්, හා-හා-හා..."

පායිලෝ ඉමහත් සතුටකින් ඉපිල ගොස් ඇති බව පෙනේ. ඔහු වටකර සිටි අසන්නෝ ඔහු පොලඹවන්නට වූහ. ඔහුගේ හපන්කම පිළිබඳ විස්තර අසා දැන ගැනීමට ඔවුන් දැක්වූයේ ඉමහත් ආසාවකි.

පොත් අල්මාරියෙන් එපිට සිටි කොර්චාගින් දැත් මිට මොළවාගෙන නැඟිට සිටියේය. ඔහුගේ හදවත වේගයෙන් සැලෙන්නට විය.

"හැම දෙනාටම දන ඇම දල කරතායෙවාව අල්ලා ගැනීමට බැරි බව මා දැන සිටියා. ග්‍රිබොව් එක්ක පෝට්වයින් බෝතල දෙළහකට ඔට්ටු අල්ලා තිබුණ නිසා කොහොම හරි ඒකිව මෙල්ල කර ගන්ට ඕනයි කියලා මම ඉටා ගත්තා. මම කුමන්ත්‍රණකාරී උපක්‍රම පාවිච්චි කිරීමට පටන් ගත්තා. ඇගේ කාර්යාලයට වරක් දෙවරක් ගියා. වැඩේ හරියන පාටක් නෑ. ඒ

හැර මා ගැන නොයෙකුත් කථා පැතිරිලා තියෙනවා නො වැ. ඈ මේවා දන්නවා ඇති... වචනයකින් විස්තර කරනවා නම් කෙළින්ම ගැසූ ප්‍රහාරය අසාර්ථකයි. මම ඒ පාර වක්‍ර මාර්ග යෙන් ප්‍රහාරය පටන් ගත්තා. වක්‍ර ප්‍රහාරය හා, හා!.. මම ඈට අසරණ අහිංසක පාට් එකක් දැම්මා. නුඹ දන්නවාද මම යුද්ධ කළා සතුරන් මැරුවා රට හැම තැනම ඇවිද්දා. දුක දැක්කා. ඒ වගේම දුක් වින්දා. හොඳ කෙල්ලක් හමු වුණේ නැහැ. දැන් ඉතින් පාදඩ බල්ලෙක් වගේ තනි වෙලා ඉන්නවා. කාගෙ න්වත් මිහිරි වචනයක්, සැනසුමක් නැහැ. ඉතින් හැමද ම ඇගේ අනුකම්පාව ඇවිස්සෙන කතා කියන්නට වුණා. ඇගේ දුර්වල තැනට මම පහර එල්ල කළා. මේ විදිහට ඈ සමඟ බොහොම දවසක් කතාව දැම්මා. මේ විකාරය අත හැර යන යකාට ගියාදෙන් කියලා නවතින්ටත් හිතුණා. මෙතැන ප්‍රතිපත්ති මූලධර්ම පිළිබඳ ප්‍රශ්නයක් නොවැ. ඉතින් මමත් ප්‍රතිපත්තිය අතහැරියේ නැහැ... අවසානයේ දී ඇගේ බල බිඳ දැම්මා. මගේ ඉවසීම නිසා මට සැනසීම ලැබුණා. ගෑනියක් වෙනුවට කන්‍යාවක් මට ලැබුණා හා-හා!.. කොහොමද වැඩේ!"

පායිලෝ එම අධම කතාව දිගටම කියන්න විය.

කොර්චාගින් පායිලෝ සමීපයට ආවේ කෙසේදැයි ඔහුටම මතක නැත.

"තෝ, වල් ඌරා!" පාවෙල් ගුගුළේය.

"වල් ඌරා මාද නැතිනම් නුඹද? අනුන්ගේ කතා අහගෙන හිටියේ නුඹ නේද?"

පාවෙල් ඔහුට යමක් කීවා විය යුතුය. තරමක් මත් පැන් බී සිටි පායිලෝ පාවෙල්ගේ කබාය අල්ලා ගත්තේය.

"නුඹ මට අවමන් කරනවද?" මෙසේ කෑ ගැසූ පායිලෝ පාවෙල්ට මිටින් පහරක් ගැසීය.

අසල තිබූ ඕක් ලීයෙන් තැනූ බංකුවක් අතට ගත් පාවෙල් එයින් ඔහුගේ හිසට වැරෙන් ගැසීය. පායිලෝ බිම පතිත විය. ඔහුගේ වාසනාවට එදින පාවෙල්ගේ පිස්තෝලය ඔහු ළඟ නොතිබිණි. ඒ නිසා ඔහුගේ ජීවිතය බේරුණි.

කෙසේ හෝ ඒ අශෝභන සිද්ධිය වූයේ පාවෙල් නිවාඩු ගැනීම සඳහා ක්‍රිමියාවට යාමට නියමව තිබූ දවසේදීය. පාවෙල් කොර්චාගින්ට පක්ෂයේ අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට සිදුවිය.

නගරයේ රඟහලට මුළු මහත් පක්ෂ සංවිධානයම රැස්

විය. ප්‍රචාරක කාර්යාලයේ සිද්ධිය නිසා සෑම කෙනෙක්ම උනන්දු වූහ. අධිකරණය ඉදිරියේ පක්ෂයේ සදාචාර ධර්මය, ආධ්‍යාත්මික ගුණ ධර්ම හා පෞද්ගලික සම්බන්ධකම් ගැන තියුණු විවාදයක් පැන නැඟිණි. එය සංඥාවක් හැටියට සැලකුවේය. පායිලෝ ගරු සරු නැති ලෙස හැසුරුණේය. අවඥා සහගත ලෙස මඳ සිනා පෑවේය. ඔහුගේ චෝදනාව මහජන අධිකරණයට ඉදිරිපත්කර ඇති බැවින් ඔහුගේ ඔළුව පැළීම නිසා කොර්චාගින්ට බරපතළ වැඩ ඇතිව හිරගෙට නියම වන බවක් කියා සිටියේය. ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම ඔහු විසින් දැඩි ලෙස ප්‍රතික්ෂේප කරන ලදී.

"මගේ නම පාවිච්චි කරල කට කතා, ඕපා දූප ගොතන්නට හදනවාද? ඒවා හරියන්නෙ නැහැ. මට විරුද්ධව ඕනෑම චෝදනාවක් කරන්න පුළුවනි. මෙතැන ඉන්න ගෑනු මට විරුද්ධව නැගිටලා ඉන්නෙ මම උන් ගැන පොඞ්ඩක්වත් සලකන්නේ නැති නිසා. මට විරුද්ධව තියෙන චෝදනා කුණු බිත්තරයක් තරම් වටින්නේ නෑ. එක්දස් නවසිය දහ අටේදී මේ සිද්ධි වුණා නම් කොර්චාගින් නමැති පිස්සාට දෙන බෙහෙත මම දන්නවා. දැන් මා නැතිවාට නුඹලාට සුදුසු පියවර ගත හැකි යි පැවැසූ පායිලෝ ශාලාවෙන් පිට වී ගියේය.

සිදුවූ දේ ගැන විස්තර කරන ලෙස සභාපතිවරයා කොර්චාගින්ට දැන් වූ විට ඔහු සන්සුන් ලෙස කතා කළද, ඔහු තම හැඟීම් ඉතා අමාරුවෙන් මැඩගෙන සිටි බව හැඟිණි.

"මේ සියල්ල සිදුවුණේ මගේ හැඟීම් පාලනය කර ගැනීමට මා අපොහොසත් වූ නිසයි. හිසට වැඩියෙ දැත් පාවිච්චි කළ කාලය ගෙවී ගොස් බොහෝ කල්ය. මෙවර සිදු වුණේ අත්වැරැද්දකි. මා කරන්නේ මොනවාදැයි නොසිතාම පායිලෝගේ ඔළුව පැළුවේය. පසුගිය අවුරුදු කීපය තුළ මා කළ එකම හදිසි පක්ෂග්‍රාහි ක්‍රියාව මෙය පමණකි. මම මගේ ක්‍රියාව හෙළා දකිමි. එහෙත්, ඒ අතර ඔහුගේ ඔළුව පැළීම යුක්ති සහගත බව පවසා සිටිමි. අපේ කොමියුනිස්ට්වාදී ජීවිතයේ පායිලෝ වැන්නවුන් සිත් කලකිරවන නිදසුන්ය. මිනිහෙකු කොමියුනිස්ට්වාදී විප්ලවවාදියකු වන අතරම නීචයකු හා අධමයකු වන්නේ කෙසේ දැ යි වටහා ගැනීමට මම අපොහොසත් වන අතර, එය පිළිගැනීමටද මැළි වෙමි. පෞද්ගලික ජීවිතයේදී අපේ කොමියුනිස්ට්වාදී සගයන්ගේ හැසිරීම ගැන සැලකිලි දැක්වීමට මේ සිද්ධිය අපට බල කරයි."

රැස්වීමට සහභගි වූ කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයන්ගෙන් අතිවිශාල බහුතර සංඛ්‍යාව පායිලෝ පක්ෂයෙන් නෙරපා දැමීමට ඡන්දය දුන්හ. බොරු සාක්ෂි දීම නිසා ග්‍රිබොව් හෙළා දුටු පක්ෂ අධිකරණය ඔහු බරපතළ ලෙස විවේචනයට භාජනය කළේය. එම සාකච්ඡාවට සහභාගි වූ අනික් අය අධිකරණය ඉදිරියේ ඇත්ත පිළිගත්හ. ඔවුන්ගේ ක්‍රියා කලාපය හෙළා දැක්කේය.

බාර්තෙලික් දෙස්තර පාවෙල් කොර්චාගින්ගේ ස්නායු රෝගාබාධ ගැන විස්තරයක් ඉදිරිපත් කළේය. අධිකරණයේ සභාපතිවරයා පාවෙල් හෙළා දකින යෝජනාවක් ඉදිරිපත් කළ විට, රැස්ව සිටියහු දැඩි ලෙස විරුද්ධත්වය ප්‍රකාශ කළහ. චෝදනා ඉදිරිපත් කළ පරීක්ෂකවරයා ඒවා ඉල්ලා අස්කර ගත්තේය. පාවෙල් කොර්චාගින් අධිකරණය විසින් නිදහස් කරන ලදි.

ඊට දවස් කීපයකට පසු පාවෙල් කොර්චාගින් රැගත් දුම්රියක් හාර්කොව් බලා ගියේය. ප්‍රාදේශීය කමිටුවේ වැඩවලින් තමා නිදහස් කොට උක්රයීනයේ කොම්සොමොල් සංවිධානයේ අණසකට තමා යටත් කරන ලෙස දැඩි ලෙසම පාවෙල් ඉල්ලා සිටියෙන්, එය ඉටු කෙරිණි. හොඳ චරිත සහතිකයක් ලැබ ඔහු පිට වී ගියේය. උක්රයීනයේ කොම්සොමොල් සංවිධානයේ මධ්‍යම කාරක සභාවේ එක් ලේකම්වරයෙකු වූයේ අකීම්ය. පාවෙල් ඔහු හමුවීමට ගොස් සියලු දේ ගැන විස්තරයක් කළේය.

ඔහුට දී ඇති චරිත සහතිකයේ "පක්ෂයට සීමා රහිත ලෙස කැප වී සිටින්නෙකි" යන වැකිය අකීම් කියවීය. "පාක්ෂික ඉවසීමක් ඔහුට ඇත. අතිශයින්ම විරල අවස්ථාවලදී පෞද්ගලික හැඟීම් මෙල්ල කර ගැනීමට බැරිවන තරමට ඔහු කිපෙයි. මෙයට ප්‍රධාන හේතුව ඔහුගේ ස්නායු පද්ධතියේ රෝගාබාධයයි."

"පව්ලූෂා, මේ තරම් හොඳ චරිත සහතිකයකට එම කරුණ ඇතුළු කරලා නරක් කළා. නුඹ බලාපොරොත්තු සුන් කරගන්ට එපා. ශක්තිමත් මිනිසුන් පවා මෙවැනි තත්ත්වයන්ට වැටෙන අවස්ථා තියෙනවා. නුඹ දකුණු පෙදෙසට ගිහිල්ලා ශක්තිය ලබා ගනින්. ආවායින් පසුව කතාකර ගනිමු. නුඹට දිය යුතු වැඩ ගැන."

මෙසේ පැවසූ අකීම් මිතුරු ලීලාවෙන් ඔහුගෙන් සමු ගත්තේය.

★

මධ්‍යම කාරක සභාවේ සෞඛ්‍යාගාරය "කොමියුනාර්" නමින් හැඳින්වෙයි. එය ඉදිරිපස රෝසමල් පඳුරුය. ජලය විහිදුවා හරින කදිම උල්පතකි. සෞඛ්‍යාගාරයේ ඉදිරිපස බිත්තිවල මිදිවැල් වැවී ඇත. විවේක සුවයෙන් සිටින්නෝ සුදු ඇඳුමින්ද, නාන ඇඳුම්වලින්ද සැරසී සිටිති. තරුණ කාන්තාවක් වූ දෙස්තරවරිය ඔහුගේ වාසගම හා නම ලියාගෙන එක් කොනක වූ විශාල කාමරයකට ඔහු යැවීය. ඇඳ ඇතිරිලි හිම මෙන් සුදු පැහැයෙන් දිලිසේ. පවිත්‍ර බවද කිසිවකු විසින් උල්ලංඝනය නොකරනු ලබන නිහඬතාවද සිත් ගනී. දිය නා පිරිසිදු ඇඳුම් ඇඳගෙන පාවෙල් කොර්චාගින් මුහුද දෙසට ගමන් කළේය.

ඔහු ඉදිරියේ ඇති මුහුද ශ්‍රේෂ්ඨය. මැද්ද නිල් කළු පැහැති කිරිගරුඬ කැටයක් බඳු මහ මුහුද ක්ෂිතිජය දක්වා විහිදී ඇත. එහි සීමා ඈත ගොස් නිල් පැහැති දුමක් වැන්නක් මවා පා අතුරුදහන් වෙයි. අහස ගෙන සිටින හිරු මුහුදු දිය මත දිලිසෙන රත් පැහැයක් පිළිබිඹු කරයි. උදෑසන මීදුම අතරින් අතිවිශාල කන්දක සේයාව යම්තමින් පෙනිණි. පාවෙල් පිරිසිදු වාතය ආශ්වාස කරමින් පෙණහලු පුරවා ගත්තේය. ඔහුගේ දෙනෙත් නිසල ශ්‍රේෂ්ඨ මහ මුහුද දෙසට යොමු විය.

ඔහුගේ දෙපා ළඟට කම්මැළියකු සේ පැමිණි රැල්ල මුහුදු වෙරළේ රන් පැහැති වැලි සිපගත්තේය.

VII

මධ්‍යම කාරක සභාවේ සුබාගාරය අසලම මධ්‍යම බහු චිකිත්සාගාරයේ වත්ත පිහිටියේය. 'කොමියුනාර්' සුබාගාරයේ විවේක ගන්නා අය එම වත්ත හරහා මුහුදු වෙරළ දක්වා යාම්, ඊම් කළහ. මෙහි හුනුගල් බිත්තියක් අසල වූ විශාල චිනාරා ගසක් යට විවේක ගැනීමට පාවෙල් ආසා කළේය. මෙතැනට යමෙකු ආවේ කලාතුරකිනි. වත්තේ මාවත් හා පටු මාවත් ඔස්සේ යන එන මිනිසුන් නිරීක්ෂණය කිරීමටද, හවස සංගීතය ඇසීමටද, විශාල සුබාගාරයේ කන්දෙස්කිරියාවෙන් ඈත් වී සිටීමටද කැමැති අයට මෙතැන අභය භූමියකි.

නැවතත් අද කොර්චාගින් මෙතැනට පැමිණියේය. වේවැල් හාන්සි පුටුව මත වාඩි වූ ඔහු මුහුදු වතුර නෑමෙන් හා හිරු රැසින් ලත් පසන් විඩාව නිසා නිදි කිරා

වැටෙන්නට විය. යාබද හාන්සිපුටුව මත ඔහුගේ නාන තුවායද පූර්මනොව්ගේ 'කැරල්ල' නමැති නවකතා පොතද තිබිණි. සුබාගාරයට පැමිණි පළමු දවස්වලදී ඔහු ස්නායු දුර්වලත්වයෙන් පෙළෙන්නට වූයේ හිසරදයට ගොදුරු විය. එහි වූ මහාචාර්යවරු ඔහුගේ සංකීර්ණ හා විරල රෝගය ගැන හදුරන්නට වූහ. නිතර ඔහුගේ සිරුර පිරික්සා බැලීම නිසා ඔහු අමනාපයට හා විඩාවට පත්විය. යෙරුසෙලීම්චික් නමැති පුදුම නමක් ඇති පාක්ෂික කාන්තාව ඔහු භාර දොස්තරවරිය වූවාය. කිසියම් විශේෂඥයෙකු වෙත ඔහු කැඳවාගෙන යාම සඳහා ඔහුට ඇවිටිලි කිරීමට ඇයට නිතර සිදුවිය.

"අනේ හැබැට මේ වැඩවලින් මම හොඳටම මහන්සි වුණා." පාවෙල් පැවසීය. "දවසකට පස් වරක් එකම දෙයක් ගැන කියන්නට ඕන. ඔබගේ ආච්චිට පිස්සු හැදිලා තිබුණද, ඔබගේ මුත්තා වාත රක්ත රෝගයෙන් පෙළුණාද? මම කොහොමද දන්නෙ ඔහුට හැදුණු ලෙඩ ගැන. මම ඔහුව දැකලාවත් නැහැ! ඒ විතරක්ද, හැම කෙනෙකුම දඟලනවා මා ගොනෝරියා වැනි සමාජ රෝගයකින් හෝ ඊටත් වඩා දරුණු රෝගයකින් හෝ පෙළුණු බව මා ලවාම කියවා ගැනීමට. එවිට මට ඔවුන්ගේ ඔළුගෙඩිවලට පහර දෙන්ට හිතෙනවා. මට විවේක ගැනීමට ඉඩ දෙන්න! එහෙම නැතිනම් මම සමාජයට අනතුරුදායක මිනිහකු වීමට ඉඩ තියෙනවා."

යෙරුසෙලීම්චික් සිනාසී විහිළු කරන්නී විනාඩි කීපයකට පසු පාවෙල්ගේ අතක් ගෙන සැත්කම් දොස්තර තැන වෙත ඔහු ගෙන යන ගමන් නොයෙකුත් දේ ගැන දොඩවන්නට වූවාය.

අද පිරික්සා බැලීම් නැත. තව පැයකින් දහවල් බත ලැබේ. අඩ නින්දේ පසුවන ඔහුට කිසිවකු පියවර නඟන හඬක් ඇසෙයි. ඔහු දෙනෙත් හැර නොබැලීය: "මා නිදා ඉන්නවා කියා සිතාගෙන ඔවුන් ඉවතට යාවි." පාවෙල් සිතීය. බලාපොරොත්තුව සුන් විය. අසල තිබූ හාන්සිපුටුව හඬක් නැඟීය. කිසිවෙක් එහි වාඩි විය. එතැනින් පිටවූ සියුම් සුවඳ නිසා කාන්තාවක් තමා අසලින් වාඩි වූ බව පාවෙල්ට දැනිණි. ඔහු දෙනෙත් හැර බැලීය. දිලිසෙන සුදු ගවුමක් ඇඳ සිටින ඇයගේ දෙකකුල් හිරු රැස් නිසා තලෙළු පැහැ ගෙන ඇති බවත්, ඇගේ දෙපාවල සෙරෙප්පු දෙකක් ඇති බවත් ඔහු එක වරම දිටී ය. අනතුරුව, කොල්ලකු මෙන් කොටට හිසකේ කපා ඇති ඇගේ හිසද, විශාල දෙනෙත්ද, මීයකුගේ

මෙන් සුදු පැහැති කුඩා දත් දෙපළද ඔහුගේ නෙතට ලක්විය.

"සමාවෙන්න, මා ඔබට බාධා කළාද?"

කොර්චාගින් නිහඬව සිටියේය. එය ආචාරශීලී නොවූවද, ඇය මෙතැනින් නික්ම යතියි ඔහු බලාපොරොත්තු විය.

"මේ ඔබේ පොතද?"

ඈ 'කැරැල්ලේ' පිටු පෙරළන්නට වූවාය.

"ඔව්. මගේ."

විනාඩියක නිහඬතාවකි.

"සහෝදරයා, ඔබ මධ්‍යම කාරක සභාවේ සැනටෝරියමේ විවේක ගත්තා නේද?"

කොර්චාගින් නොඉවසිල්ලෙන් දැඟලීය. "මේ මනුස්සයා කොහේ ඉඳලා ආවද? මැඳෑ විවේක ගත්තා. මගේ රෝගය ගැන දැන් විස්තර අසාවි. මෙතැනින් යන්ට ඕන." ඔහු සිතීය.

"නැහැ" යි ඔහු පිළිතුරු දුන්නේ තරමක දැඩි ගතියකිනි.

"මම ඔබ එහෙදි දුටුවා වගෙයි."

පාවෙල් නැගිට සිටිත්ම, කාන්තාවට පිටුපසින් කිසිවකු විසින් ප්‍රශ්නයක් අසනු ලැබිණි.

"ඩෝරා, ඔබ මෙතැන මොනවා කරනවාද?"

පුටුව අයිනේ රන්වන් හිසකේ ඇති තරබාරු කතක් වාඩි වුණාය. ඈ සෞඛ්‍යාගාර සැහැල්ලු ඇඳුමකින් සැරසී සිටියාය. ඈ ඔහු දෙස ක්ෂණික බැල්මක් හෙළා විතාළාය:

"මා ඔබව කොහේදිද දැකලා තියෙනවා. සහෝදරයා. ඔබ වැඩ කරන්නේ හාර්කොව්වල නේද?"

"ඔව්. හාර්කොව්වල."

කොර්චාගින් ඒ දීර්ඝ සාකච්ඡා අවසන් කිරීමට ඉටා ගත්තේය.

"කසළ ශෝධක දෙපාර්තමේන්තුවේ!" කතුන් දෙදෙනා හඬ නගා සිනාසෙත්ම, ඔහු ඉබේටම නැඟිට සිටියේය.

"සහෝදරයා ඔබ ආචාරශීලී කියලා කීමට පුළුවන් කමක් නැහැ."

හාර්කොව් පක්ෂයේ බියුරෝ කමිටුවේ සාමාජිකාවක් වන ඩෝරා රෝද්කිනා සමඟ පාවෙල්ගේ මිත්‍රත්වය පටන්ගත්තේ එලෙස ය. පසුකලෙක ඈ නිතර ඔහුගේ පිළිතුර නිසා ඔහුට විහිළු කළාය.

★

දිවා ආහාරයෙන් පසු පැවැත්වූ විවිධ ප්‍රසංගයක් බැලීමට

'තලාසා' සුබාගාරයේ වත්තට පැමිණි පාවෙල් කොර්චාගින්ට හිටිහැටියේම ඉවාන් ෂාර්කී හමුවීය. ඔවුන්ගේ හමුවීම ඇති වූයේ 'පොක්ස් ට්රොට්' (හිවල් ගමන) නමැති ආලිංගන නැටුම නිසාය.

'අහෝ! රාගයෙන් ඉපිලෙන රාත්‍රිය' නමැති ගීය යෝධමය පියයුරු ඇති ගායිකාවක් විසින් අංග චලනය අනුව ගයනු ලැබූ පසු වේදිකාවට යුවළක් පැමිණියහ. මිනිහා අඩ නිරුවතිනි. ඔහුගේ හිස මත 'ටොප් හැට්' නමැති මුග්ධ තොප්පියකි. ඔහුගේ ඉණ වටා දිලිසෙන ලොවිරිච්චිය. උඩුකය සුදු කමිසයකින්ද, කර 'බෝ-ටයි' පටියකින්ද වසා ඇත. ඔහු වනචාරියකු දුබල ලෙස පිළිබිඹු කළේය. රුවැති ගැහැනියක් කෑලි කීපයක් සහිත සායක් ඇඳ සිටියාය. සෞඛ්‍යාගාරයේ රෝගීන් වාඩි වී සිටි හාන්සිපුටුවලට පිටුපසින් සිටගෙන සිටි 'උෟරු කර' සහිත තරබාරු මුදලාලිවරුන් ප්‍රීතියෙන් ඔකඳ කරවමින් මේ යුවළ 'පොක්ස් ට්රොට්' ආලිංගන නැටුම රාගය කුප්පමින් අමුතු අන්දමකට පා තබමින් නැටූහ. මෙයට වඩා සිත් කලකිරවනසුලු නැටුමක් ගැන සිතා ගැනීමට පවා අපහසු විය. පාවෙල්ට පිටුපසින් සිටි තරබාරු දේහයක් ඇති මිනිහෙක් හතිලන්නට විය.කොර්චාගින් නැගිට එතැනින් පිටවීමට යත්ම, ඉස්සරහ පෙළෙහි වාඩි වී සිටි කෙනෙක් නැගිට සිට කෑගැසීය:

"වේසා නැටුම් නවත්වාපියව්! යකාට පලයව්!"

කෑගැසූ තැනැත්තා ෂාර්කිය. පාවෙල් ඔහු හැඳින ගත්තේය.

පියානෝ වාදකයා වාදනය නැවැත්වීය. වයලීන වාදකයා බොල් හඬක් නංවා නැවැතිණි.

යුවළ කකුල් පටලැවීම නැවැත්වූහ. පුටු පෙළට එහා සිටගෙන සිටියහු කෝපවූවෝ හඬ නැගූහ.

"හරිම උද්දච්චයෙක්, නැටුම නැවැත්තුවා!"

"මුළු යුරෝපයම 'පොක්ස් ට්රොට්' නැටුම නටනවා."

"දරුණු ක්‍රියාවක්!"

"කොමියුනාර්" සෞඛ්‍යාගාරයේ විවේක ගන්නා, චිරිපොවේට්ස් කොම්සොමොල් තරුණ සංවිධානයේ ලේකම්වර සිරියෝෂා ෂ්බානොව් ඇඟිලි හතරක් කට තුළට ඔබා දෙකන් බිහිරි කරවන සේ උරුවම් බෑවේය. අන් අයද ඔහුට සහාය පිණිස ඉදිරිපත් වූහ. වේදිකාවේ සිටි යුවළ අතුරුදහන් වූහ. ඉස්සර කාලේ සේවකයකු සිහියට නැගූ

විවිධ ප්‍රසංගය මෙහෙයවන්නා නැටුම් කණ්ඩායම පිට වී යන බව කියා සිටියේය.

කොර්චාගින් ඉස්සරහ පුටු පේළිය දක්වා ගොස් ෂාර්කි හොයා ගත්තේය. දෙදෙනා කොර්චාගින්ගේ කාමරයෙහි වාඩි වී බොහෝ වේලාවක් සතුටු සාමීචී කතා කළහ. පක්ෂයේ ප්‍රාදේශීය කමිටුවක ප්‍රචාරක අංශයක ඉවාන් ෂාර්කී එවකට වැඩ කළේය.

"නුඹ දන්නවද, මම විවාහ වුණා. මට බිරිඳක් ඉන්නවා. ඉක්මනින්ම අපට දුවක නැතිනම් පුතකු ලැබේවි." ෂාර්කි කීය.

"ඔහෝ නුඹේ බිරිඳ කවුද?" පාවෙල් විමතියට පත්විය.

ෂාර්කි තම කබා සාක්කුවකින් ඡායාරූපයක් ගෙන පාවෙල් අත තැබීය.

"අඳුනනවද?"

ඡායාරූපය ෂාර්කිගේ සහ ආන්නා බොර්හාර්ට්ගේය.

"දුබාවා දැන් කොහිද?" වඩාත් විමතියට පත් කොර්චාගින් ඇසීය.

"දුබාවා දැන් මොස්කව්වල. පක්ෂයෙන් නෙරපා දැමූවාට පස්සේ ඔහු කොමියුනිස්ට් විශ්වවිද්‍යාලයෙන් අස්වෙලා මොස්කව් නගරයට ගියා. දැන් ඔහු බාවුමන් කාර්මික විද්‍යාලයේ ඉගෙන ගන්නවා. ආරංචියේ හැටියට ඔහුට නැවත පක්ෂයේ සාමාජිකත්වය දීලා. ඒක නොකළ යුතු වැඩක්? ඔහු විසකුරු සතෙක්... නුඹ දන්නවද ඉග්නාත් පන්ක්‍රාතොව් කොහෙද කියලා. නැව් හදන කම්හලක උප අධ්‍යක්ෂවරයෙක්. අනික් අය ගැන මා දන්නෙ ටිකයි. අපි එකිනෙකාගෙන් ඈත් වෙලා. රටේ නොයෙකුත් පළාත්වල අපි වැඩ කරනවා. කොහොම වුණත් එකට හමුවෙලා පරණ දේ ගැන මතක් කිරීම ප්‍රීතියට කරුණක් !" ෂාර්කි පැවසීය.

ඩෝරා හා තවත් කීපදෙනෙක් කාමරයට ඇතුළු වූහ. තම්බෝව් නගරයෙන් පැමිණි උසැති මිනිහා දොර වැසීය. ඩෝරා ෂාර්කිගේ කබායේ ඇති පදක්කම දැක පාවෙල්ගෙන් ඇසුවාය:

"ඔබේ සගයා පක්ෂයේ සාමාජිකයෙක්ද? ඔහු වැඩ කරන්නේ කොහිද?"

කුමක් නිසාදැයි නොදැන පාවෙල් ෂාර්කි ගැන විස්තරයක් කළේය.

"එයාට කාමරයේ නවතින්න පුළුවනි. මොස්කව් ඉඳලා මේ දැනුයි මේ සහෝදරවරුන් ආවේ. පක්ෂයේ අලුත්ම

තොරතුරු මේ සහෝදරවරු අපට කියාවි. ඔබේ කාමරයට විත් පක්ෂ රැස්වීමක් පැවැත්වීමට අපි තීරණය කළා." ඩෝරා කීවාය.

පාවෙල් හා ෂාර්කී හැර කාමරයට ඇතුළු වුණ අනික් අය බොල්ෂෙවික් පක්ෂයේ පැරැණි සාමාජිකයෝ වූහ. මොස්කව් පාලක කොමිසමේ සාමාජිකයෙකු වූ බර්තාෂොව් ට්‍රොස්කි, සිනෝවියෙව් සහ කාමිනෙව් ආදීන්ගේ නායකත්වයෙන් යුත් නව විරුද්ධ පක්ෂයේ තත්ත්වය ගැන තතු පැහැදිලි කළේය.

"මේ වගේ නොසන්සුන් වේලාවක අපි අපට අයත් ස්ථානවල වැඩ කළ යුතුයි. මම හෙටම මොස්කව් යනවා." බත්රාෂොව් කීය.

පාවෙල්ගේ කාමරයේ පැවැත්වූ රැස්වීමෙන් දවස් තුනකට පසු සෞඛ්‍යාගාරයට විවේක ගැනීමට පැමිණි අය නියමිත කාලයට පෙර පිටවූහ. සෞඛ්‍යාගාරය හිස් වන්නට විය. පාවෙල්ද තමා ප්‍රතිකාර ගත යුතු කාලය සම්පූර්ණ නොකර වේලාසනින් පිට වී ගියේය.

කොම්සොමොල් සංවිධානයේ මධ්‍යම කාරක සභාව පාවෙල් එක් කර්මාන්තමය පෙදෙසක ලේකම්වරයකු ලෙස පත් කළේය. ඊට සතියකට පසු නගරයේ ක්‍රියාශීලී සාමාජිකයන් ඉදිරිපිට ඔහු තම පළමුවැනි කතාව පැවැත්වීය.

සරත් සමය අවසානයේදී පාවෙල් කොර්චාගින් සහ තවත් පක්ෂයේ පූර්ණ කාලීනයන් දෙදෙනෙක් ඈත පෙදෙසකට මෝටෝ රියකින් යමින් සිටියහ. රිය ලිස්සා ගොස් පාර අසල වූ කානුවකට වැටී පෙරළිණි.

රියේ ගමන් කළ හැම දෙනෙක්ම තුවාල ලැබූහ. පාවෙල්ගේ දකුණු දණහිස බිඳිණි. දවස් කීපයකට පසු ඔහු හාර්කොව්හි සැත්කම් චිකිත්සාගාරයට මාරු කළේය. දණහිස පිරික්සා බලා එක්ස්රේ ඡායාරූපයක් ගත් දොස්තරවරු එය සුව කිරීම සඳහා සැත්කමක් කළ යුතු බව තීරණය කළහ.

කොර්චාගින් එකඟ විය.

"එහෙනම් හෙට උදේට" මෙසේ පැවසූ තරබාරු මහාචාර්යතුමා වෛද්‍ය මණ්ඩලයේ ප්‍රධානියා නැගිට සිටිත්ම, අනික් දොස්තරවරුද ඔහු අනුකරණය කරමින් ගියහ.

රෝහලේ කුඩා කාමරයක එක ඇඳකි. එය සුදෝ සුදු ඇතිරිවලින් වසා ඇත. ඔහුට බොහෝ කලක සිට අමතක වූ රෝහල් සුවඳ දැනිණි. කොර්චාගින් වට පිට බැලීය. ඇඳ අසල කුඩා මේසයකි. එයද සුදෝ සුදු රෙද්දකින් වසලාය. සුදු පැහැති කුඩා පුටුවකි.

හෙදිය ඔහුගේ රෑ කෑම වේල ගෙනාවාය. ඔහු එය ප්‍රතික්ෂේප කෙළෙන්, ඉවත ගෙන ගියේය. ඇඳ මත අඩ වශයෙන් වාඩි වී ඔහු ලිපි කීපයක්ම ලියුවේය. දණහිසේ වේදනාව කල්පනා කිරීමට හා ආහාර ගැනීමටද බාධාවක් විය.

ඔහු හතරවැනි ලිපිය ලියා අවසන් කරත්ම, කාමරයේ දොර හැර සුදු කබායක් හැඳගත් තරුණ කතක් ඇතුළු වූවාය. ඇගේ හිසද සුදු පැහැති හිස්වැස්මකින් වැසී තිබිණි.

සැදෑ අඩ අඳුර අතරින් ඔහු ඇගේ බැම සඟළද කළු පැහැති යැයි කිව හැකි විශාල දෙනෙත්ද දුටුවේ ය. ඇගේ එක් අතක කුඩා බෑගයකි, අනික් අත කඩදාසියක් සහ පැන්සලයකි.

"වාට්ටුව භාර දොස්තර මායි" ඈ කීවාය. "අද මම රෑ සේවයේ, ඔබ කැමති වුණත් නූණත් ඔබෙන් 'හරස් ප්‍රශ්න' ඇසීමට මම තීරණය කළා. ඔබට හැම දෙයක් ගැනම කීමට සිදුවේවි."

දොස්තරවරිය මඳ සිනා පෑවාය. එබැවින් 'හරස් ප්‍රශ්න' ඇසීමේ අප්‍රිය බව මඳක් තුනී විය.

පැයක් තිස්සේ පාවෙල් තමා ගැන පමණක් නොව, ආච්චි මුත්තා කාලේ තතුද විස්තර කළේය.

★

සැත්කම් ශාලාවේ දොස්තරවරු හා වෛද්‍ය සේවකයෝ නහය හා කට වැසෙන සේ සුදු පැහැති කවර දමාගෙන සිටියහ.

සැත්කම් වෛද්‍ය උපකරණ 'නිකල් පැහැයෙන්' දිලිසිණි. මේසය පටුය. එය යටින් විශාල බේසමකි. කොර්චාගින් මේසය මත වැතිරෙන විට, මහාචාර්යවරයා අත් සෝද ඉවර කළේය. ඔහුට පිටුපසින් සැත්කම් සඳහා අවශ්‍ය දේ ලහි ලහියේ කෙරිණි. කොර්චාගින් හැරී බැලුවේය. හෙදිය සැත්කම් උපකරණ පෙළට තැබුවාය. ඔහු සිටි වාට්ටුව භාර දොස්තරවරිය, බෂානොවා ඔහුගේ වෙළුම් පටිය ලිහන්නට වූවාය:

"කොර්චාගින් සහෝදරයා ඒ පැත්ත බලන්නට එපා. එය ස්නායුවලට හොඳ නැහැ." ඈ සෙමින් පැවසුවා ය.

"දොස්තර නෝනා. ඔබ කතා කරන්නේ කාගේ ස්නායු ගැනද?" කොර්චාගින් උපහාසාත්මක ලෙස මඳ සිනා පෑවේය.

විනාඩි කීපයකට පසු ඔහුගේ මුහුණ වැසුවේය. මහාචාර්යවරයා ඔහු ඇමතීය.

"අපි ඔබට ක්ලෝරොෆෝම් දීලා සිහි නැති කරනවා. දැන් දීර්ඝ ලෙස ආශ්වාස කරලා ගණන් කිරීම පටන් ගන්න."

වැසූ කඩතුරාවට යටින් කොර්චාගින් සන්සුන් ලෙස පිළිතුරු දෙන සැටි ඇසිණි:

"සිහි නැතිවේගන යන විට, මගේ කටින් අසභ්‍ය වචන පිටවුණොත්, ඒ ගැන වේලාසනින් මම සමාව ඉල්ලා සිටිනවා."

මහාචාර්යවරයාට මඳ සිනා පෑමෙන් වැළකී සිටීමට නොහැකි විය.

ක්ලොරොෆෝම් නාසයට ඇතුළු වත්ම, උගුර හිරවන අමිහිරි ගතියක් දැනිණි.

කොර්චාගින් දීර්ඝ ලෙස ආශ්වාස කොට පැහැදිලි ලෙස ගණන් කිරීමට උත්සාහ කළේය. පාවෙල් කොර්චාගින්ගේ ඛේදවාචකයේ පළමුවැනි ජවනිකාවට ඔහු පා තැබුවේ එලෙසය.

අර්ට්යොම් ලියුම් කවරය සම්පූර්ණයෙන්ම ඉරා දමා කැලඹීමෙන් යුතුව ලියුම දිග හැරියේය. ලියුම දෙස බැලූ ඔහු එය දිගටම කියවන්නට විය:

"අර්ට්යොම්! අපි එකිනෙකාට ලියන්නේ කලාතුරකිනි.

වසරකට වරක් හෝ දෙකක් හෝ පමණකි! මෙතැන ඇති ප්‍රශ්නය ලියුම්වල ප්‍රමාණයද? ගොවි පන්තියේ මුල් ඇදීම්වලින් බේරීම පිණිස ෂෙපෙතෝව්කා අතහැර කසාටින්ස්ක් ඩිපෝවට ගිය බව ඔබ ලියා ඇත. ස්තෝෂා සහ ඇගේ නෑයන්ගේ නොදියුණු, සුළු ධනපතිවාදී පසුබිම එම මුල්වලින් යුක්ත බව මම දනිමි. ස්තෝෂා වැනි අයවලුන්ට අලුත් ගතිගුණ පුහුණු කිරීම අසීරු වැඩකි. ඔබ එය කිරීමට සමත් නොවෙති යි මම විශ්වාස කරමි. 'මහලු වයයේදී ඉගෙන ගැනීමට බැරි බව' ඔබ ලියා ඇත. එහෙත්, අයියේ ඔබ හොඳට ඉගෙන ගන්නෙහිය. නිෂ්පාදන කටයුතුවලින් ඈත් වී නාගරික සෝවියට් සභාවේ සභාපති ධුරය භාර ගැනීම ඔබ දැඩි ලෙසම ප්‍රතික්ෂේප කිරීම හරි නැත. ඔබ සෝවියට් ආණ්ඩු බලය පිහිටුවීම සඳහා අවි ගෙන සටන් කළා නේද? එසේ නම් බලය අතට ගත යුතුය. හෙටම නාගරික සෝවියට් සභාවේ වැඩ භාරගන්න.

දැන් ඉතින් මා ගැන. මාගේ සෞඛ්‍යය ඉතාම පහත් තත්ත්වයකට වැටිලා. මා දැන් රෝහල්වලට යන්නට පටන් අරගෙන. දැනටමත් මාව දෙවරක්ම ඔපරේෂන් කළා. ලේ බොහොම නැති වුණා. ශක්තිය සිඳිලා. මේ ප්‍රතිකාර කවදා

කොහොම කෙළවර වේද කියලා තවම කිසිවෙක් මට කීවේ නැහැ.

මම දැන් සේවයෙන් ඈත්වෙලා. මගේ අලුත්ම වෘත්තිය තමා "රෝගීබව." මගේ සිරුර ලෙඩ රෝග කීපයකටම භාජන වෙලා. මේවා නිසා දකුණු දණහිස නවන්නට බැහැ. ඇඟ හැම තැනම තුවාල කීපයකි. අලුත්ම වෛද්‍ය මතය මෙහෙම කියා ඇත: මීට අවුරුදු හතකට පෙර පිට කොන්දට මා ලැබූ පහරක් නිසා වඩාත් දරුණු තත්ත්වයකට මූණ පෑමට සිදුවේවි. නැවත සේවයට පැමිණීම සඳහා මා ඕනෑම දෙයක් විඳ දරා ගැනීමට සූදනම්.

සේවයෙන් ඈත් වී සිටීම තරම් භයානක දෙයක් මගේ ජීවිතයේදී මම බලාපොරොත්තු නොවෙමි. ඒ ගැන සිතීමට පවා මා ලැහැස්ති නැහැ. මා හැම ප්‍රතිකාරයක්ම ගන්නේ මේ හේතුව නිසයි. එහෙත්, සුවයක් නැත. රෝගාබාධ වැඩි වීමේ කළු වලාකුළු ඇතිවී තිබේ. පළමුවැනි සැත්කමින් පසු මා වැඩට ගියා. එහෙත්, නැවත රෝහලට පැමිණීමට සිදුවුණා. දැන් මට එව්පතෝවරියාවේ 'මයිනාක්' සෞඛ්‍යාගාරයට යාමට අවසරපතක් ලැබී ඇත. හෙට මම එහි යනවා. අර්ට්යොම්, අයියේ කනගාටු වෙන්ට එපා. මා මෙල්ල කිරීම ලෙහෙසි නැහැ. මගේ ජීවිතය තිදෙනෙකුට සෑහෙනවා. අයියේ, අපි එක්ව වැඩ කරමු. සෞඛ්‍යය ආරක්ෂා කර ගන්න. ඕනෑවට වැඩිය බර වැඩ භාර නොගන්න. පසුව අලුත්වැඩියා කිරීමට පක්ෂයට බොහෝ වියදම් කිරීමට සිදුවේවි. කාලය අපට අත්දැකීම්ද, අධ්‍යාපනය අපට දැනීමද ලබා දෙනවා. මේවා ලබාදෙන්නේ රෝහල්වලට වෙලා ඉන්නට නොවෙයි.

මීට, මල්ලී

පාවෙල් කොර්චාගින්."

අර්ට්යොම් සිය සනැති බැම සඟල හකුළුවාගෙන පාවෙල්ගේ ලියුම කියවන වේලාවේදී පාවෙල් බෂානොවා දෙස්තරවරියට ආයුබෝවන් කියා රෝහලින් පිටවීමට සූදනම් විය. ඈ ඔහුට අත දෙමින් ප්‍රශ්න කළාය:

"ඔබ ක්‍රිමියාවට යන්නේ හෙට නේද? අද දවස ගත කරන්නේ කොහිද?"

"දැන් රොද්කිනා සහෝදරිය ඒවි. අද දවසයි, රැයයි ඒගොල්ලන්ගේ පවුලේ අය සමඟ ගත කරනවා. උදේට ඈ මාව දුම්රියපොළට ගෙන යාවි."

නිතර පාවෙල් බැලීමට පැමිණි ඩෝරා ගැන බෂානොවා දැන සිටියාය.

"කොර්චාගින් සහෝදරයාට මතකද අපේ සාකච්ඡාව. ඔබ යන්න ඉස්සෙල්ලා මගේ තාත්තාව හමුවීමට වූ පොරොන්දුව? මම ඔබේ රෝගය ගැන තාත්තාට සියලු කරුණු විස්තර කළා. මා කැමතියි මගේ පියා ඔබ පරීක්ෂාකර බලනවාට. අද හවස අපි එය කරමු."

කොර්චාගින් වහාම එකඟ විය.

එදින හවස ඉරිනා වසීලයෙව්නා බෂානොවා කොර්චාගින්ව තම පියා වෙත ගෙන ගියාය. ඔහුගේ කාර්යාල කාමරය විශාලය.

සුප්‍රසිද්ධ සැත්කම් දෙස්තර තැන සිය දුව ඉදිරියේ කොර්චාගින් පිරික්සා බැලීය. ඉරිනා චිකිත්සාගාරයේ සිට ඇක්ස්රේ ඡායාරූප හා සියලු පරීක්ෂණ වාර්තා ගෙනාවාය. ලතින් බසින් තම පියා යමක් පවසත්ම, ඉරිනාගේ මුව කඩදාසියක් මෙන් සුදුමැලි වූ සැටි පාවෙල්ගේ නෙතට හසු විය. පාවෙල් මහාචාර්ය බෂානොව්ගේ තට්ටය දෙස බලා, අනතුරුව ඔහුගේ ඇස්වල යම් කිසි හෝඩුවාවක් සෙවීමට තැත් කළේය. එහෙත්, බෂානොව් මහාචාර්ය තැන නොසෙල්වී සිටියේ, පර්වතයක් මෙනි.

පාවෙල් ඇඳුම් ඇඳගත් පසු බෂානොව් ආචාරශීලී ලෙස ඔහුගෙන් සමුගත්තේය. ඔහු වෛද්‍යවරුන්ගේ රැස්වීමකට ගියෙන් නිගමනය පිළිබඳ තොරතුරු දැන්වීම දුවට භාර කළේය.

ඉරිනා බෂානොවාගේ කාමරය උසස් රුචියක් අනුව සරසා තිබිණි. පාවෙල් සෝපාව මත වාඩි වී දෙස්තරවරියගේ නිගමනය බලාපොරොත්තුවෙන් සිටියේය. එහෙත්, එය පටන්ගත යුත්තේ කොහොමද, කිව යුත්තේ මොනවාද යන්න ඈ නොදත්තාය. ඇය අමාරුවකට වැටිණි. පාවෙල්ගේ සිරුර තුළ වැඩෙමින් ඇති විනාශකාරී රෝගය මැඩපැවැත්වීමට දැනට වෛද්‍ය විද්‍යාවට පුළුවන්කමක් නැති බව ඇගේ පියා ඇට කීවේය. ඔහු සැත්කම්වලට විරුද්ධ විය. "මේ තරුණයාට සිය අත් පා සහ සිරුර සෙලවීමට බැරිව ඔහු මහා ඛේදවාචයකට මූණ පානු ඇත. එය නැවැත්වීමට තරම් බලයක් අපට නොමැත."

දෙස්තරවරියක් හා මිතුරියක් හැටියට මේ සියල්ල හෙළි කිරීමට ඈ මැළිවූවා, ඉතා ප්‍රවේසමින් තෝරාගත් කෙටි වචන පාවිච්චි කරමින් එම සත්‍යයෙන් අඩක් ඈ කොර්චාගින්ට හෙළි කළාය.

"කොර්චාගින් සහෝදරයා, යෙව්පතෝරියාවේ ප්‍රතිකාර වලින් පසුව ඔබේ රෝගය හොඳ අතට හැරේවි. සරත් සමය වනවිට ඔබට නැවත සේවයට යාමට පුළුවන් වේවි."

ඈ මෙසේ පවසන විට, ඇය දෙස තියුණු නෙත් යොමුවී ඇති බව ඇයට අමතක විය.

"ඔබ කී වචන අනුව පමණක් නොව, ඔබ නොකී වචන අනුවද තත්ත්වයේ බරපතලකම මට වැටහෙනවා. මා සමග හැමදම එළිපිට කතා කරන ලෙස මා ඔබට කීවා මතකද? මගෙන් කිසිවක් සඟවන්නට එපා. මා සිහි නැතිව වැටෙන්නේවත්, බෙල්ල කපා ගන්නේවත් නැහැ. අනාගතයේදී මට වෙන දේ ගැන දැනගැනීමට මා බොහොම කැමතියි." පාවෙල් පැවසුවද, බෂානොවා විහිළු තහළු කරමින් නිසි පිළිතුරු නොදුන්නාය.

පාවෙල්ට සිය අනාගතය පිළිබඳ සත්‍යය එදිනද දැනග ැනීමට නොලැබිණි. ඔවුන් සමුගන්නා විට බෂානොවා පහත් හඬින් මිමිනුවාය:

"කොර්චාගින් සහෝදරයා මා ඔබ වෙත දක්වන මිත්‍රකම ගැන අමතක කරන්න එපා. ඔබේ ජීවිතයේදී ඔබට නොයෙක් දේවලට මූණ පෑමට සිදුවේවි. ඔබට මගේ උදව් හෝ උපදෙස් හෝ ඕන නම් මට ලියන්න. මට හැකි සියලු වෙර යොදා මම ඔබට උදව් කරන්නම්."

සම් කබායක් හැද සිටි උසැති තරුණයා හැරමිටි වාරුවෙන් වේදනාව මැඩගෙන ගමන් කොට අස් රියට නගින සැටි ඈ කවුළුව අසල සිටගෙන බලා සිටියාය.

★

නැවත යෙව්පතෝරියාව. දකුණු දිග උණුසුම් හිරු. විවේක සුවයෙන් පසුවෙන මිනිසුන්ගේ හම හිරු රැස් නිසා තද දුඹුරු පැහැයක් ගෙන ඇත. ඔවුහු ගෙතූ වාටි සහිත තොප්පි දමාගෙන සිටිති, කෑ ගසති. අලුත පැමිණි මිනිසුන් විනාඩි දහයක් තුළදී, හුනු ගලින් තැනූ අළු පැහැති දෙමහල් ගොඩනැඟිල්ලට ගෙන අවේ මොටෝරථයකිනි. එය මයිනාක් සෞඛ්‍යාගාරයයි.

එදින වැඩ බලන දොස්තර තැන අලුත පැමිණි රෝගීන්ට කාමර වෙන් කරයි.

"ඔබ මොන සංවිධානයට අයිති අවසර පත්‍ර ඇති

කෙනෙක්ද, සහෝදරයා?" දෙස්තර ඇසුවේය.

"උක්රයින කොමියුනිස්ට් (බෝල්ෂෙවික්) පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ."

"එහෙනම් මම ඔබ එබ්නර් සහෝදරයාගේ කාමරයට යවන්නම්. ඔහු ජර්මන් ජාතිකයෙක්. ඔහු ඉල්ලීමක් කළා ඔහුට රුසියන්කාරයකු අසල්වැසියකු හැටියට එවන්ටයි කියලා." දෙස්තර එසේ පවසා දොරට තට්ටු කළේය. ජර්මන් බස් වහර අනුව, කෙනෙක් කතා කළේයඃ

"ඇතුළට එන්න"

පාවෙල් තම අත් බෑගය පසෙක තබා ඇඳෙහි වැතිර සිටින පුද්ගලයා දෙස බැලීය. ඔහුගේ හිසකේ රන් පැහැතිය. ඔහුගේ දෙනෙත් අලංකාර නිල් පාටින් දිලිසේ. ජර්මන් ජාතිකයා පාවෙල් පිළිගත්තේ සුහද මඳ සිනාවක් පාමිනි.

"ගුටෙන් මෝර්ගන් ගෙනොස්සෙ. මා කීමට හැදුවේ ආයුබෝවන් කියලයි" ඔහු ඇඳ මත හරි ගැස්සී, තම සුදුමැලි අත සහ දිගැති ඇඟිලි පාවෙල් වෙත දිගු කළේය.

විනාඩි කීපයක් ගතවත්ම පාවෙල්, එබ්නර්ගේ ඇඳෙහි කොනක වාඩි විය. දෙදෙනා අතර 'අන්තර්ජාතික බසින්' උණුසුම් සුහද සාකච්ඡා ඇතිවිය. මෙහිදී වචන ක්‍රියා කළේ අප්‍රධාන තැනකි. නොතේරෙන හෝ අඩ වශයෙන් තේරුම්ගත හැකි හෝ වචනවල අඩුව පිරවූයේ අනුමාන නිගමන හා හැඟීම්ය, අංග චලනය හා ඉඟිපෑම් ය. එස්පෙරාන්ටෝ නමැති එවකට පැවැති ජාත්‍යන්තර භාෂාවට අයත් නැති මාධ්‍යයන් ප්‍රයෝජනයට ගනිමිනි. එබ්නර් ජර්මන් කම්කරුවකු බව පාවෙල් වටහා ගත්තේය.

1923 හැම්බර්ග් කැරැල්ලේදී එබ්නර්ගේ උකුල් ඇටයට වෙඩි පහරක් වැදිණි. ඔහුගේ පැරැණි තුවාලය යළි පෑරෙන්නට වූයෙන්, ඔහුට ප්‍රතිකාර ගැනීමට සිදුවිය. වේදනාව මැඬගෙන ඔහු ප්‍රීතියෙන් සිටීම නිසා පාවෙල් ඔහුට ගරු කළේය.

මීට වඩා හොඳ අසල්වැසියකු සොයාගැනීමට පාවෙල් සිහිනෙකින්වත් නොසිතීය. උදේ සිට රෑ වන තුරු තම රෝගය ගැන කියමින් සුසුම්ලන කෙනෙකු නොවේ, එබ්නර්. අනිත් අතින් ඔහු සමග ඉන්නා විට, තම රෝගාබාධ ගැන පවා අමතක වෙයි.

"එක ජර්මන් වචනයක්වත් මා දන්නෙ නැහැ නොව" පාවෙල් කනස්සලු විය.

★

සෞඛ්‍යාගාරයට අයත් වන්නේ පැද්දෙන පුටු කීපයකි. බම්බුවලින් සැදූ මේසයක් සහ රෝද සහිත පුටු දෙකකි. අනිකුත් රෝගීන් විසින් 'කොමින්ටර්නයේ (ජාත්‍යන්තර කොමියුනිස්ට් සංවිධානයේ) කෘත්‍යාධිකාරී මණ්ඩලය' හැටියට හඳුන්වනු ලැබූ පස්දෙනෙකු තම ප්‍රතිකාරවලින් පසුව මෙතැන රැස්වීම සිරිතක් විය.

රෝද සහිත එක් පුටුවක එබ්නර් අඩ වශයෙන් වාඩි වී සිටියේය. අනිකේ පාවෙල්ය. ඔහුට ඇවිදීම තහනම් කර තිබිණි. ක්‍රිමියානු සමූහාණ්ඩුවේ වෙළඳ අමාත්‍යාංශයේ සේවකයෙකු වූ එස්තෝනියානු ජාතික තරබාරු වයිමන්ද, දහඅට හැවිරිදි තරුණියකැයි කිව හැකි, දුඹුරු පැහැති ඇස් ඇති තරුණ කතක් වූ මාර්තා ලවුරින්ද, උසැති යෝධයෙකු වූ, පැසුණු හිසකේ ඇති, සයිබීරියානුවකු වූ ලෙඩ්නියෝව්ද මේ කණ්ඩායමට අයත් විය. සැබැවින්ම මෙහි ජාතීන් පහකට අයත් නියෝජිතයෝ වූහ. ජර්මන්, ලැට්වියන්, එස්තෝනියන්, රුසියන් හා උක්රයින ජාතිකයෝය. මාර්තා සහ වයිමන් ජර්මන් බස දැන සිටියහ. එබ්නර් ඔවුන් තම පරිවර්තකයන් ලෙස නිතර යොදගත්තේය. පාවෙල් සහ එබ්නර් එකම කාමරයක නවාතැන් ගෙන සිටි බැවින් ඔවුහු මිතුරෝ වූහ. මාර්තා සහ වයිමන් එබ්නර්ට ළං වූයේ ජර්මන් බස නිසාය. ලෙඩ්නියෝව් හා කොර්චාගින් අතර මිතුරුදම් ඇති වූයේ චෙස්දම් ක්‍රීඩාව නිසාය.

ඉනොකෙන්ති පාව්ලොවිච් ලෙඩ්නියෝව් පැමිණීමට පෙර සෞඛ්‍යාගාරයේ චෙස්දම් පිළිබඳ ශූරත්වය දිනාගෙන සිටියේ පාවෙල්ය. ඔහු එම පදවිය දිනාගත්තේ වයිමන් සමඟ උග්‍ර චෙස්දම් තරගයක යෙදීමෙනි. සෙම් අධික මිනිහකු වූ වයිමන් පරාජය වීමෙන් පසු නොඉවසිලිමත් විය. තම පරාජය නිසා පාවෙල්ට ඔහු සමාව දීමට පවා මැළි විය. එහෙත්, වැඩි කල් යන්නට පෙර තරුණ පෙනුමකින් යුතු පනස් හැවිරිදි උසැති මිනිහෙක් ආවේය. ඔහු චෙස්දම් ක්‍රීඩාව සඳහා ඉදිරිපත් වී පාවෙල්ට අඬ ගැසීය. තමා මුණ පාන අනතුර ගැන කොහෙත් ම සැක නොකළ පාවෙල් කොර්චාගින් 'බිසව ඉදිරියට යවමින්' සටන ඇරඹීය. එයට පිළිතුරු වශයෙන් ලෙඩ්නියෝව් 'පාබළ සෙබළුන්' ඉදිරියට යැවීය. සෞඛ්‍යාගාරයේ 'ශූරයා' හැටියට පාවෙල් එහි පැමිණෙන හැම අලුත් ක්‍රීඩකයකු සමඟ චෙස්දම් ඇදීම කළ යුතුය. මේ ක්‍රීඩාව නැරඹීම සඳහා නිතර බොහෝ

දෙනෙක් පැමිණියහ. ලෙඩ්නියෝව් පාබළ සේනාව නවවැනි පියවරේ සිට තමාට පහර එල්ල කර තිබෙන බව කොර්චාගින් දුටුවේය. තමා ඉදිරියේ ඉන්නේ අනතුරුදායක ප්‍රතිමල්ලවයකු බව ඔහුට වැටහිණි. ඔහු එදින සැහැල්ලු සිතින් චෙස්දම් ඇදීම නොකළ යුත්තක් විය.

තෙපැයක සටනකින් පසු, සියලු ප්‍රයත්න හා උපක්‍රම යෙදීමෙන් අනතුරුව පාවෙල්ට පරාජය පිළිගැනීමට සිදුවිය. තමා වටා සිටි නරඹන්නන්ට කලින් ඔහු තම පරාජය දිටීය.

ඔහු තම ප්‍රතිමල්ලවයා දෙස බැලීය. ලෙඩ්නියෝව් පියකුගේ සුහද ලීලාවෙන් මඳ සිනා පෑවේය. ඔහු පාවෙල්ගේ පරාජය කලින්ම දුටු බව පැහැදිලි විය. කැලඹී සිටි එස්තෝනියානු ජාතික වයිමන්, පාවෙල්ගේ පරාජය එළිපිටම පැතුවද, කල් ඇතිව එය නොදිටීය.

"මම අවසාන සෙබළ ඉත්තා දක්වා හැමදම සටන් කරනවා." පාවෙල් පැවසීය. ඔහුට පමණක් අවබෝධ කරගත හැකි එම වචන නිසා ලෙඩ්නියෝව් හිස වනා මඳ සිනා පෑවේය.

ඉනොකෙන්ති පාව්ලොවිච් ලෙඩ්නියෝව් සමග පාවෙල් කොර්චාගින් දවස් පහක් තුළදී චෙස්දම් දස වරක්ම ඇද්දේය. එයින් පාවෙල් හත් වරක්ම පරාජය වූ අතර, දෙකක් දිනා ගත්තේය. එකක් ජය පරාජය නැතිව කෙළවර විය. වයිමන් ප්‍රීතියෙන් ප්‍රමෝදයට පත්විය.

"ලෙඩ්නියෝව් සහෝදරයා බොහොම ස්තූතියි. ඔබ ඔහුට සෑහෙන්ට බැට දුන්නා! ඔහුට ඔහොම විය යුතුයි! ඔහු මහලු චෙස්දම් කාරයන් වන, අපව පරාජය කළා. අන්තිමේදි ඔහුම මහල්ලෙකුට පරාද වුණා. හා හා හා!.."

"මොකද, පරාද වුණාම අසතුටු වුණාද?" ඔහු පරාජිතයාට සරදම් කළේය.

කොර්චාගින්ට 'චෙස්දම් ශූරයා' යන නාමය අහිමි වුණද, ඒ ක්‍රීඩාත්මක ගෞරවය වෙනුවට, පසු කලෙක තමාට වැදගත් හා කිට්ටු කෙනෙකු බවට පත් වූ ලෙඩ්නියෝව්ගේ මිත්‍රත්වය හිමිවිය. චෙස්දම් ක්‍රීඩාවේදී පාවෙල්ගේ පරාජය අහම්බෙන් වූවක් නොවීය. ඔහු දැන සිටියේ චෙස් ක්‍රීඩාවේ මතුපිට පෙනෙන උපාය මාර්ග පමණකි. ක්‍රීඩාවේ සියලු රහස් දැන සිටි හැබෑ ශූරයකුට ඔහු පරාජය විය.

කොර්චාගින්ට හා ලෙඩ්නියෝව්ට පොදු වූ එක් දිනයක් විය. කොර්චාගින් උපන් වසරේදී ලෙඩ්නියෝව් රුසියානු

කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයකු වීමය. දෙදෙනාම බොල්ෂෙවික්වරුන්ගේ තරුණ හා මහලු මුරහට සේනාවේ සැබෑ නියෝජිතයෝ වූහ. ලෙඩ්නියෝව්ගේ ජීවිතයම හා දේශපාලනමය අත්දැකීම් බොහෝ විය. සාර් රජයට විරුද්ධව සැඟවී දේශපාලන කටයුතු කිරීම, සිරගෙදර කල් ගෙවීම, ඉනික්බිති රජයේ උසස් තනතුරු දැරීම. පාවෙල් සතුව ඇත්තේ දීප්තිමත් තරුණ බව සහ අවුරුදු අටක සේවයය. එහෙත්, එක් ජීවිතයකට වඩා දීප්තිය ලබාදිය හැකි අවුරුදු අටකි. මේ දෙදෙනාම මහල්ලා හා තරුණයා උණුසුම් හදවත්වලින්, අයහපත් සෞඛ්‍යයෙන් යුක්ත වූහ.

හවස එබ්නර්ගේ සහ කොර්චාගින්ගේ කාමරය සමාජ ශාලාවක් බවට පත්වෙයි. සියලු දේශපාලන පුවත් මෙතැන සිට පිටවිය. හවස අංක 11 දරන එම කාමරය තුළින් සෝෂාකාරී හඬ ඇති විය. වයිමන් නිතර පාහේ ග්‍රාම්‍ය විහිළු කතාවක් කීමට වෙර දැරීය. ඔහු ඒවා කීමට මහත් රුචියක් දැක්වූවෙකි. එහෙත්, එවැනි කතා පටන් ගනිත්ම ඔහු මාර්තාගේ හා කොර්චාගින්ගේ ප්‍රහාරයට ලක්වෙයි. මාර්තා තම තියුණු උපහාසයෙන් වයිමන් තු තු කොට ඉරා දැම්මාය. එයින් පලක් නොවූ විට කොර්චාගින් පහර ගැසීය.

"වයිමන් ඔබ අපෙන් ඉස්සෙල්ලා ඇහුවා නම් හොඳයි නේද, ඔබේ 'තියුණු බුද්ධිය' අපගේ රුචියට නොගැළපෙනවා වෙන්නට පුළුවනි..."

"ඔබ මෙවැනි පහත් කතා කීම මට නම් තේරුම් ගන්ට බැහැ." පාවෙල් නොසන්සුන් ගතියකින් පටන් ගත්තේය.

වයිමන් තම මහතැති යටි තොල දිගු කරගෙන රැස්ව සිටියවුන් දෙස උපහාසාත්මක බැල්මක් හෙළා මෙසේ පැවසීයඃ

"දේශපාලන අධ්‍යාපනාංශය යටතේ සදචාර ගුණධර්ම අංශයක් විවෘත කරලා එහි ප්‍රධාන පරීක්ෂක තනතුරට පාවෙල් කොර්චාගින්ට රෙකමදරු කරන්ටයි දැන් අපට තියෙන්නේ මට මාර්තාව නම් තේරුම් ගත හැකියි. ඈ ස්ත්‍රියක වශයෙන් ස්වභාවයෙන් එයට විරුද්ධයි. නමුත්, කොර්චාගින් නිර්දෝෂී කොල්ලකු වීමට හදනවා. කොම්සොමොල් බිලිඳෙකු වීමට... ඒ විතරක් නොවෙයි, බිත්තරය කිකිළියට උගන්වන්නට හදන විට මම විරුද්ධ වෙනවා."

කොමියුනිස්ට්වාදී සදචාර ගුණධර්ම ගැන එවැනි උණුසුම් විවාදයකින් පසු අසභ්‍ය විහිළු කතා පිළිබඳ වූ ප්‍රශ්නය

මූලධර්මානුකූලව සාකච්ඡාවට භාජන විය. මාර්තා සියලු අදහස් එබ්නර්ට ජර්මන් බසින් පරිවර්තනය කළාය.

"ඔය විහිළු කතා අසභ්‍ය ඒවා. බොහොම නරකයි. මම පව්ලූෂාගේ අදහස්වලට එකඟයි." එබ්නර් පැවසීය.

වයිමන් පසුබැස්සද ඉඩ ලැබුණු හැම අවස්ථාවකදීම එම සිද්ධිය විහිළුවක් හැටියට ගෙන ඔහු සිනාසුණේය. එහෙත්, පෙර මෙන් අසභ්‍ය විහිළු කතා නොකීවේය.

කොර්චාගින්, මාර්තා කොම්සොමොල් සංවිධානයේ සාමාජිකාවකැයි සිතීය. බැලූ බැල්මට නම් ඇය දහනව හැවිරිදි තරුණියක මෙනි. තමා 1917 සිට කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකාවක බවත්, තමාගේ වයස අවුරුදු තිස් එකක් බවත්, තමා ලැට්වියානු කොමියුනිස්ට් පක්ෂයේ ක්‍රියාශීලී සාමාජිකාවන්ගෙන් කෙනෙකු බවත් මාර්තා කී විට, ඔහු බොහෝ සෙයින්ම මවිතයට පත්විය. ලැට්වියාවේ ප්‍රතිවිප්ලවවාදීන් ඇය වෙඩි තබා මරා දැමීමට නියම කළ විට, සෝවියට් ආණ්ඩුව විසින් ඇය සහ අනිකුත් සගයන් යුද හිරකරුවන්ට හුවමාරු කර ගන්නා ලදි. දැන් මාර්තා ප්‍රව්ද පුවත්පතේ කතු මඬුල්ලේ සේවය කරන්නී විශ්වවිද්‍යාල පාඨම් මාලාවක්ද හදාරා සමත් වූවාය. නොදැනුවත්ම මෙන් පාවෙල් හා මාර්තා අතර මිතුරුකමක් ඇතිවිය. නිතර එබ්නර් බැලීමට එන මේ කුඩා ලැට්වියානු ගැහැනිය 'පස් දෙනාගේ කණ්ඩායමේ' අඛණ්ඩ සාමාජිකාවක් වූවාය.

සැඟවී වැඩ කළ පක්ෂයේ සාමාජිකයෙකු වූ ලැට්වියානු ජාතික එග්ලිට් ඇයට සරදම් කළේය: "මාර්තච්කා, මොස්කව්වල ඉන්න තුඹේ දූප්පත් ඔසොල්ට මොනවා වේවිද? ඔහොම හොඳද?"

හැමදම උදේට, රෝගීන්ට අවදිවන ලෙස දැන්වෙන සීනුව ගැසීමට පෙර සෞඛ්‍යාගාරයේ කුකුළෙක් උස් හඬින් හඬලයි. පුදුමයට පත්වන සෞඛ්‍ය සේවකයෝ හැම තැනම දුවමින් මේ දැන් හැඬලූ කුකුළා සොයයි. කුකුළා මෙන් ඉතා අගේට හඬලන්නේ එබ්නර් බව ඔවුහු නොදත්හ. එබ්නර් සිය විහිළුව නිසා ඉමහත් සතුටක් ලැබීය.

මාසය අවසන්වත්ම පාවෙල්ගේ සෞඛ්‍ය තත්ත්වය නරක අතට හැරිණි. ඇඳෙන් නොබසින ලෙස දෙස්තරවරු ඔහුට අවවාද කළහ. මේ නිසා එබ්නර් කනගාටුවට පත්විය. කිසි කලෙක දෙම්නස් සිතින් පසු නොවන, ජීවන ප්‍රීතියක් සහ විශාල උනන්දුවක් ඇති, තරුණ වියේදීම රෝගාබාධවලට

ගොදුරු වූ යෞවන බොල්ෂෙවික්වාදියාට එබ්නර් සැබැවින්ම ඇලුම් කළේය.

පාවෙල්ගේ රෝගය බේදවාචකයකින් කෙළවර වන බව දෙස්තරවරු කීහයි මාර්තා පැවසූ විට, ඇඩැම් එබ්නර් බොහෝ සේ දුක් විය.

සෞඛ්‍යාගාරයෙන් පිටවී යාමට නියමිත දිනය වනතුරු ම පාවෙල්ට ඇවිදීම තහනම් කළේය.

පාවෙල්ගේ වේදනාව ඔහු අන් අයගෙන් සඟවා ගත්තද මාර්තාට එය දැනිණි. ඔහුගේ සුදුමැලි මුහුණ නිසා ඇයට ඒ ගැන අනුමාන කිරීමට පුළුවන් විය. පිටවීමට සතියකට පමණ කලින් උක්රයීනයේ මධ්‍යම කාරක සභාවෙන් පාවෙල්ට ලියුමක් ලැබිණි. ඔහුගේ නිවාඩුව තව දෙමසකට දිගු කොට ඇති බවත්, සෞඛ්‍යාගාරයේ වෛද්‍යවරුන්ගේ නිගමනය අනුව දැනට ඇති අයහපත් සෞඛ්‍යය නිසා සේවයට නොපැමිණිය යුතු බවත් එම ලිපියෙන් දන්වා තිබිණි.

ලිපිය සමඟ මුදල්ද විය.

ඔහු එම ලිපිය පිළිගත්තේ ඉස්සර ෂුක්රායි වෙතින් බොක්සිං පාඩම් ගැනීමේදී පහර කා බිම වැටුණු විට මෙනි. එහෙත්, එද ඔහු වැටුණු හැටියේ ම නැගී සිටියේය.

බලාපොරොත්තු රහිත ව පාවෙල්ට තම මවගෙන් ලිපියක් ලැබිණි. එව්පතෝරියාවට නුදුරින් පිහිටි කුඩා වරායක් සහිත නගරයේ ඇගේ මිතුරියක වන ඇල්බීනා කියුට්සම් ජීවත් වන බවත්, තමා ඇය පහළොස් වසරකින් නොදුටු බවත්, පාවෙල්ට එහි ගොස් ඔවුන් හමුවන ලෙසත් එම ලිපියෙන් ඔහුගේ මව ඉල්ලා සිටියාය. අහම්බෙන් එවූ එම ලිපිය පාවෙල්ගේ ජීවිතයේ ඉතා වැදගත් ක්‍රියා කලාපයක් ඉටු කළේය.

සතියකට පසු සෞඛ්‍යාගාරයේ සහෝදරවරු පාවෙල්ට ආයුබෝවන් කීමේ උත්සවයක් පැවැත්වූහ. සමුගැනීමේදී එබ්නර් පාවෙල් සිප වැළඳ ගත්තේ සහෝදරයකු මෙනි. මාර්තා එදින එහි නොවූවාය. පාවෙල් ඇගෙන් සමු නොගෙන සෞඛ්‍යාගාරයෙන් පිටවිය.

ඊට පසු දින වරායේ සිට අස්රියකින් පැමිණි කොර්චාගින් වත්තක් සහිත කුඩා ගෙයකට පැමිණ කියුට්සම්වරු එහි පදිංචිව සිටිත් දැ යි දැනගැනීමට රියකරු යැවීය.

කියුට්සම් පවුල සාමාජිකයන් පස් දෙනෙකුගෙන් යුක්ත විය. ඇල්බීනා කියුට්සම් දරු තිදෙනෙකුගේ මවය. තරබාරු මහලු කතක් වූ ඇගේ දෙනෙත් කළු පැහැතිය, ඒවා අප්‍රසන්න

දෙම්නසකින් පිරී ඇත. ඇය තරුණ වියේදී රුවැත්තියකුව සිටි බවට ලකුණු ඇගේ මුහුණෙන් පෙනෙයි. ඇට දූවරුන් දෙදෙනෙකි, ලෝලා සහ තායාය. ලෝලාට කුඩා පුතකු සිටී. කැලෑ ඌරකුට සමාන මහලු කියුට්සම් අප්‍රසන්න මිනිහෙකි.

කියුට්සම් මහල්ලා සමුපකාරයක සේවය කළේය. තායා, බාල දුව නුපුහුණු කම්කරු කාන්තාවක හැටියට වැඩ කළාය. ලෝලා බේබද්දකු හා මැරවරයකු වන තම සැමියාගෙන් දික්කසාද වී දෙමාපියන් වෙත විත් රැකියාවක් නොකර සිටියද ඈ යතුරු ලියන්නියකි. ඈ තම කුඩා පුතාගේ වැඩ කටයුතු කරමින් ගෙදර වැඩවලට උදවු වුණාය.

ඇල්බීනා කියුට්සම්ට දූවරුන් හැර පුතකුද විය. ඔහුගේ නම ජෝජ්ය. ඔහු මොස්කව් ගොසිනි.

කියුට්සම් පවුල ඉතා සතුටින් කොර්චාගින් පිළිගත්තේය. මහල්ලා පමණක් අමුත්තා වෙත සැක සහිත, ප්‍රවේසම්කාරී බැලුම් හෙළන්නට විය.

කොර්චාගින්ගේ පවුලේ සිද්ධීන් පිළිබඳ සියලු තොරතුරු පාවෙල් ඉවසිලි සහිතව ඇල්බීනාට විස්තර කළ අතර, ඇගේ පවුලේ තොරතුරු විමසීමටද පසුබට නොවීය.

ලෝලාගේ වයස අවුරුදු විසිදෙකකි. දුඹුරු පැහැති හිසකේ කොටට කපා ඇති ඈ චාම් කතකි. ඇගේ මුහුණ විවෘතය. නෙත් විශාලය. ඈ ඉක්මනින්ම පාවෙල් සමඟ මිතුරු වූවා, පවුලේ හැම රහසක්ම හෙළි කළාය. මහල්ලා දරුණු පාලකයකු සේ මුළු පවුලම බියගන්වාගෙන සිටින බවත්, පවුලේ අනිකුත් සාමාජිකයන් සිය කැමැත්ත හා නිදහස අනුව වැඩ කිරීම ඔහු හැම අතින්ම පාගා දමන බවත් ඇගෙන් කොර්චාගින් දැන ගත්තේය. සීමා සහිත, අවිචාර බුද්ධියක් ඇති ඔහු හැම කුඩා දෙයක් ගැනම සොයා බලා නපුරුකම් දැක් වූ අතර, පවුලේ සෙසු සාමාජිකයන් තැති ගැන්වීයඃ මේ නිසා දූ පුතුන් ඔහුට ආදරය නොකළ අතර, විසිපස් වසරක් තිස්සේ ඔහුගේ ත්‍රස්තවාදී පාලනයට විරුද්ධව සටන් කළ ඔහුගේ බිරිඳ ඔහුට වෛර කළාය. දූවරු දෙදෙනා නිත්‍ය ලෙසම මවගේ පැත්ත ගත්තෝය. හැමදම කෙරෙන පවුල් ආරවුල් නිසා ඔවුන්ගේ ජීවිත තිත්ත විය.

සීමාවක් නැති ලොකු සහ කුඩා අමනාපවලින් පිරි දවස් ගෙවිණි.

පවුලේ දෙවෙනි විකෘති චරිතය ජෝජ්ය. ලෝලාගේ විස්තරය අනුව ජෝජ් වැදගැම්මක් නැති, අහංකාර, උද්දච්ච

මිනිහෙකි. රසැති කෑමට කෑදරයකු වූ ඔහු, මත්පැන් පානයටද, ජේත්තුවට ඇඳ පැලදීමටද ආසා කළේය. නවවැනි වසරින් අධ්‍යාපනය අවසන් කළ ජෝර්ජ් මවගේ ප්‍රියතම දරුවාය. අගනුවරට යාම සඳහා ඔහු ඇගෙන් මුදල් ඉල්ලා බල කළේය.

"මම විශ්වවිද්‍යාලෙට යනවා. ලෝලා ඇගේ මුද්ද විකුණා සල්ලි දිය යුතුයි. අම්මා ළඟ ඇති දේත් විකුණා සල්ලි හොයා දෙන්න. මට සල්ලි ඕන. කොහෙන් හොයලා දුන්නත් මට කමක් නෑ."

තමා ඉල්ලන හැම දෙයක්ම තමාට අම්මා දෙන බව දන්නා ජෝර්ජ් ඉතාම නින්දිත ලෙස ඇගේ එම දුබලකම ප්‍රයෝජනය පිණිස හරවා ගත්තේය. සොහොයුරියන් කෙරෙහි ඔහු මානාධික ආකල්පයක් දැරීය. මහල්ලා වෙතින් සඟවා තැබීමට හැකි වූ හැම දෙයක්මත්, තායා හම්බ කරන මුදලුත් ඇල්බීනා තම පුතුට යැව්වාය. ජෝර්ජ් සරසවි ප්‍රවේශ විභාගය අසමත් වී, මොස්කව්හි තම මාමාගේ නිවසෙහි පදිංචි වී, කා බී සතුටු වෙමින් වහාම මුදල් එවන ලෙස දන්වන විදුලි පණිවුඩ එවමින් අම්මා බිය ගැන්වීය.

පාවෙල්, බාල දුව තායා දුටුවේ රෑ වූ පසුවය. එළිපත්තට ගොස් තායා හමු වූ මව, අමුත්තා පිළිබඳ සියලු තොරතුරු ඇයට රහසේ කීවාය. පාවෙල්ට ආයුබෝවන් කියා අතක් දිගු කළ තායා ලජ්ජා සහගතව ආචාර කළාය. ඔහු ඉදිරියේ ඈ තම දෙකන් රතුවන තුරු ලජ්ජා වූවාය. ශක්තිමත් නමුදු, කරගැට සහිත ඇගේ අත පාවෙල් මුදුහැරියේ එකවර නොවේ.

තායා දහනව වැනි වියෙහි පසුවූවාය. ඇය රූමතියක නොවේ. එහෙත් ඇගේ දෙනෙත් විශාල ය, දුඹුරු පැහැතිය, මොන්ගෝලියානු බැම සඟළ සිහින්ය, දිගය, නහය ලස්සනය, රත් පැහැ දෙතොල් දඟකාරී බවක් පෙන්වීය. ඇගේ තරුණ ළැම ඉරි වැටුණු කම්කරු හැට්ටයට යටින් මතු වී පෙනිණි.

සහෝදරියෝ දෙදෙනා ඉතා කුඩා කාමර දෙකක ජීවත් වූහ. තායාගේ කාමරයේ පටු යකඩ ඇඳකි. නොයෙක් දේවලින් පිරි ලාච්චු මේසයකි. එය මත මූණ බලන කණ්ණාඩියකි. බිත්තියේ ඡායාරූප හා තැපැල් පත් තිහක් පමණ අලවා ඇත. ජනේල පඩිය මත රතු ගෙරානිමුස් මල් සහ රෝස පැහැති ඇස්ථර්ය. රේන්ද ගෙත්තම් සහිත ජනේල රෙද්දට නිල් පැහැති රිබන් පටියක් අල්ලා ඇත.

"තායා අවසර දෙන්නෙ නැහැ පිරිමින්ට එයාගෙ

කාමරයට ඇතුළු වීමට. නමුත්, ඔබට එයා විශේෂයක් කළා.” ලෝලා තම නැඟණියට විහිළු කළාය.

පසුදින සවස පවුල දෙමහල්ලන්ගේ කාමරයෙහි වාඩිවී තේ පානය කළහ. තායා තම කාමරයට වී මේසය වටා කෙරෙන කතාබහට සවන් දුන්නාය. කියුට්සම් මහල්ලා ඉතා උනන්දුවකින් සීනි දිය කරමින් උපැස් යුගලට යටින් තපුරු ලෙස තමා ඉදිරිපිට වාඩිවී සිටි අමුත්තා දෙස බැලීය.

“දැන් තියෙන කසාද නීති මම හෙළා දකිනවා.” මහල්ලා කීයඃ “හිතුණා බැන්ද. හිතුණා ලිහලා දැම්මා. සම්පූර්ණ නිදහස.”

පපුවේ සෙම හිරවූ විට ඔහු කැස්සේය. ඔහු හුස්ම ගෙන ලෝලා පෙන්වීය.

“මෙයා දිහා බලන්න. අපෙන් අහන්නෙ නැතුව මිනිහෙක් එක්ක ගියා, කසාද බැන්ද. ඒ වගේම දික්කසාද වුණා. දැන් ඉතින් ඈටයි ඇගෙ පොඩි පුතාටයි කෑම, ඇඳීම සපයන්න ඕන මායි. හරිම කාලකණ්ණිකමක්” ලෝලාගේ වත වේදනාවකින් රත් පැහැගති. ඈ කඳුළු පිරි දෙනෙත් පාවෙල්ගෙන් සඟවා ගත්තාය.

“ඔබ කියන හැටියට ඇය ඒ පරපෝෂිතයා සමඟ ජීවත් විය යුතුද?” මහල්ලා දෙස තියුණු බැල්මක් හෙළූ පාවෙල් ප්‍රශ්න කළේය.

“කා සමඟද දීග යන්නෙ කියලා වේලාසනින් බලන්නට ඕන.”

එම කතාවට ඇල්බීනා මැදිහත් වූවාය. සිය කෝපය ඉතා අමාරුවෙන් මැඩ පවත්වාගත් ඈ හඬිකට කතා කළායඃ

“ඔයා මොකද මේ වැනි දේ පිට අය ඉදිරිපිට කතා කරන්නෙ? වෙනින් දෙයක් ගැන කතා කරන්න. ඔය දේ ගැන විතරක් කතා කරන්න එපා.”

මහල්ලා ඇය දෙසට හැරී කඩා පැන්නේය.

“මා කියන්නෙ මොනවාද කියලා මා දන්නවා! මා කළ යුතු දේ ගැන නුඹ අණ කරන්ට ඉදිරිපත් වුණේ කවද ඉඳලද?”

එදින රැයෙහි පාවෙල් කියුට්සම් පවුල ගැන කල්පනා කළේය. අහම්බෙන් මෙහි පැමිණි ඔහුට එම පවුලේ කටයුතුවලට නොකැමැත්තෙන් වුවද අත දැමීමට සිදු විය. මේ වධ බන්දනයෙන් මිදීමට ඇල්බීනාට හා ඇගේ දූවරුන්ට උදවු කිරීම ගැන ඔහු කල්පනා කළේය. ඔහුගේ පෞද්ගලික

ජීවිතයද ක්‍රියාකාරීත්වය බාධාවක් විය. ඔහු ඉදිරියේ නොවිසඳූ ප්‍රශ්න කීපයකි. අන් කවර කලකටත් වඩා තීරණාත්මක ලෙස ක්‍රියා කිරීම දැන් දුෂ්කරය.

පිළියම එකකිඃ පවුල කඩා දැමිය යුතුය. මව සහ දූවරුන් මහල්ලාගේ ග්‍රහණයෙන් මුදා ගත යුතුය. එහෙත්, එය එතරම් ලෙහෙසි නොවේ. මේ පවුල් විප්ලවයට සහභාගි වීමේ තත්ත්වයක ඔහු පසු නොවීය. තව දින කීපයකින් පිටවී යා යුතුය. සමහර විට ඔහු මින් පසු කිසිම දිනක ඔවුන් හමු නොවනු ඇත. එම පවුලේ කටයුතු ඉබේම වර්ධනය වීමට ඉඩ හැරීම, එම ගෙදර දූලි ඇවිස්සීමට වඩා යහපත් නොවන්නේද? එහෙත්, මහල්ලාගේ ජුගුප්සිත ක්‍රියා කලාපය ඔහු සන්සුන් නොකළේය. පාවෙල් සැලැස්මයන් කීපයක් පිළියෙල කළද, ඒවා එකක්වත් ක්‍රියාවේ යෙදවිය නොහැකි විය.

ඊළඟ ඉරිදා දවසේදී කොර්චාගින් නගරයේ සිට හැරී ආ විට, ගෙදර සිටියේ තායා පමණකි. ඉතිරි සාමාජිකයන් නෑ ගෙදරකට ගොසිනි. පාවෙල් ඇගේ කාමරයට ගොස් පුටුවක් මත වාඩිවූයේ විඩාපත්ව සිටි බැවිනි.

"ඔබ ඇයි ඇවිදින්නට නොයන්නෙ? ටිකක් විවේක නො ගන්නේ ඇයි?" ඔහු ඇගෙන් ඇසීය.

"මට කොහේවත් යන්ට හිතක් නැහැ" තායා සෙමින් පිළිතුරු දුන්නාය.

ඔහු පසුගිය රැයෙහිදී සිතා ගත් සැලැස්ම ක්‍රියාවේ යෙදවීමට ඉටාගත්තේය. අනිත් උදවිය පැමිණීමට පෙර ඔහු සිය අදහස් ඇයට ඉක්මනින් එක එල්ලේම දැන්වීය.

"තායා අපි එකිනෙකාට වඩාත් ළංවී අමතමු. අපි මොකටද එකිනෙකා බොරු සිරිත් අනුව අමතන්නේ. මා ඉක්මනින්ම යනවා. මා ඔබ හමුවුණේ නරක වේලාවකයි. මාත් අමාරුවේ වැටී ඉන්න වේලාවකයි. නැතිනම් මීට වඩා වෙනස් වීමට ඉඩ තිබුණා. මීට අවුරුද්දකට ඉස්සෙල්ලා සිදුවුණා නම් අපට එක්වී මෙතැනින් පිටවීමට ඉඩ තිබුණා. ඔයාටයි, ලෝලාටයි ඕනෑ තරම් රස්සාවල් හොයාගන්ට පුළුවනි! මහල්ලාගේ අයුතු බලපෑම නවත්වන්නට ඕන. ඔහුව වෙනස් කරන්ට බැහැ. නමුත්, දැන් එය කරන්ට පුළුවන් කමක් නැහැ. මට මොනවා වේ දැයි මා දන්නෙ නැහැ. මා නිරායුධ වී සිටින්නේ මේ හේතුව නිසයි. දැන් ඉතින් මොනවා කරමුද? මා නැවත මගේ සේවයට යාම සඳහා වහාම ක්‍රියා කරනවා. දෙස්තරවරු මා

ගැන මොනවාදෝ හෑල්ලක් ලියා තිබෙනවා. මගේ සගයෝ මාව සීමාවක් නැතිව ප්‍රතිකාර ගැනීමට යවනවා. අපට එය වැළැක්වීමට පුළුවන් වේවි... නුඹලාගේ පවුල් කරදර ගැන මම අම්මාට ලියලා උපදෙස් ගැනීමට උත්සාහ කරන්නම්. මම ඔබ හැම දෙනා තනිකර දමන්නේ නැහැ. ආදරණීය තායා, ඔබ හැමගේ ජීවිතය, විශේෂයෙන් ඔයාගේ ජීවිතය උඩු යටිකුරු කොට පෙරළා දමන්නට ඕන. ඔයාට ඒ සඳහා ශක්තිය හා වුවමනාවක් තියෙනවද?

තායා හිස බිමට හරවාගත්තී පහත් ස්වරයකින් පිළිතුරු දුන්නාය:

"ආසාව තියෙනවා, ශක්තිය තියෙනවාද මා දන්නෙ නැහැ."

ඇගේ පිළිතුරෙහි ඇති අස්ථිරතාව පාවෙල්ට හොඳින් වැටහිණි.

"තයූෂා කමක් නැහැ! අපි ඒ ගැන නිසි පිළියම් යොදමු. ආසාව තිබුණොත් ඒ ඇති. මේ පවුලට ඔයා බොහොම බැඳී ඉන්නවද?"

හදිසි ප්‍රශ්නය නිසා තායා එකවර පිළිතුරු නොදුන්නාය.

"මට අම්මා ගැන බොහොම දුකයි." ඈ අවසානයේදී කීවාය. "තාත්තා මුළු ජීවිත කාලයේදීම අම්මාගේ ජීවිතය කාලකණ්ණි කළා. දැන් ජෝජ් ඇයට වධ දෙනවා. මට ඈ ගැන බොහොම කනගාටුයි... අම්මා ජෝජ්ට තරම් මට ආදරය නොකළත්..."

එදින ඔවුහු බොහෝ දේ ගැන කතා කළහ. අනික් අයවලුන් පැමිණීමට පෙර පාවෙල් විහිළුවට මෙන් මෙසේ පැවසීය:

"ඔයාගේ තාත්තා ඔයාව කාට හරි විවාහ කර නොදීම පුදුමයට කරුණක්!"

බිය වූ තායා අතක් ගස්සා දැම්මාය.

"මම කසාද බඳින්නෙ නැහැ. ලෝලාට වූ දේ මට පේනවා. මොනවා වුණත් කසාද නම් බඳින්නෙ නැහැමයි!"

පාවෙල් සිනා පෑවේය.

"එහෙනම් ඔයා මුළු ජීවිතයටම තීරණය කරලා ඉවරද? හොඳයි ඔයාට හමුවුණොත් හොඳ ඉලන්දාරියකුව, එතකොට කොහොමද?"

"කසාද බඳින්නෙම නැහැ. බඳින්ට ඉස්සෙල්ලා නම් ඒගොල්ල කවුරුත් හොඳයි"

පාවෙල් සමකාමී ලෙස ඇගේ උරයට අත තැබීය.

"කමක් නැහැ. මිනිහෙක් නැතුවම ඔයාට ජීවත් වෙන්ට පුළුවන්. නමුත්, ඔයා තරුණයන් කෙරෙහි ඔය තරම් දැඩි ගතියක් දැක්වීමට වුවමනා නැහැ. මා ඔයාට ආලය කරනවාය යන සැකයක් නැතිවීම හොඳයි. නැතිනම් මාවත් පන්නා ගනීවි." ඔහු මිතුරකු ලෙස ලජ්ජාශීලී තායාගේ අතට තට්ටු කළේය.

"ඔයා වගේ අය විවාහ වෙන්නෙ වෙනත් වර්ගයක කෙල්ලන් සමඟයි. ඔබ වැනි අයට අප වැන්නක් වුවමනා නැහැ." ඈ මිමිනුවාය.

★

දින කීපයකින් පාවෙල් හාර්කොව් බලා පිටත් විය. ඔහු හැරලීම පිණිස තායා, ලෝලා, ඇල්බීනා සහ ඇගේ සොහොයුරිය වන රෝසාද දුම්රියපොළට ආහ. දුම්රිය පිටත්වීමට පෙර තම දූවරුන් වැටී සිටින දුකින් ඔවුන් මුදා ගැනීමට ඇල්බීනා, පාවෙල්ගෙන් පොරොන්දුවක් ලබා ගත්තාය. ඔහු ඔවුන්ගෙන් සමුගත්තේ කිට්ටු නෑයන්ගෙන් මෙනි. තායාගේ දෙනෙත් කඳුළින් පිරී තිබිණි. ලෝලාගේ සුදු ලේන්සුවද, තායාගේ ඉරි සහිත හැට්ටයද දුම්රිය කවුළුව අසල වාඩි වී සිටි පාවෙල්ට බොහෝ වේලාවක් යන තුරු පෙනිණි.

හාර්කොව් පැමිණි පාවෙල් තම මිතුරකු වන පේත්යා නෝවිකොව්ගේ නිවසෙහි නවාතැන් ගත්තේ ඩෝරාට කරදර කිරීමට අකැමැති වූ බැවිනි. ඔහු විවේක ගෙන උක්රයීනයේ මධ්‍යම කාරක සභාව වෙත ගියේය. ඔහු අකීම් මුණගැසෙන තුරු සිට දෙදෙනා තනි වූ විගස සේවය සඳහා වහාම පත් කරන ලෙස ඉල්ලා සිටියේය. අකීම් විරුද්ධත්වය පාමින් හිස වැනීය.

"පාවෙල්, එය කරන්ට බැහැ. මධ්‍යම කාරක සභාවේ වෛද්‍ය මණ්ඩලයේ තීරණයේ මෙහෙම ලියා තිබෙනවා: "පාවෙල් කොර්චාගින්ගේ බරපතළ සෞඛ්‍ය තත්ත්වය නිසා ඔහුට යළි වැඩට පැමිණීමට ඉඩ නොතබා ස්නායු රෝග පිළිබඳ ආයතනයට යැවිය යුතුය."

"අකීම් වෙදුන්ට මොනවා ලියන්ට බැරිද! මම නුඹෙන් ඉල්ලා සිටිනවා. මට වැඩ කිරීමට අවස්ථාවක් දීපන්! චිකිත්සාගාරයෙන් චිකිත්සාගාරයට යාම පලක් නැති වැඩක්."

අකීම් ප්‍රතික්ෂේප කළේය.

"තීරණය වෙනස් කරන්ට අපට බැහැ. පච්ලූෂා, තේරුම් ගනින්. මේවා කරන්නේ නුඹේ හොඳටයි."

එහෙත්, පාවෙල් කොතරම් උණුසුම් ලෙස ඉල්ලා සිටියේද යත්, අකීම්ට විරුද්ධ වීමට බැරි වූවා පමණක් නොව, ඔහුට එකඟ වීමට පවා සිදු විය.

ඊට පසු දින සිට පාවෙල් ලේකම් මණ්ඩලයේ රහස් අංශයේ වැඩ කළේය. යළි වැඩ කිරීමට පටන් ගත් සැණෙකින් වැහැරී ගිය ශක්තිය නැවත ලැබෙනු ඇතැයි පාවෙල් සිතීය. ඔහුට වැරැදී ඇති බව පළමුවැනි දවසේ සිටම ඔහු වටහා ගත්තේය. ඔහු පැය අටක්ම තම කාර්යාලයේ වාඩිවී සිටියේ තට්ටු තුනක් පහළින් ඇති අවන්හලට ආහාර ගැනීම සඳහා යාමට තරම් ශක්තියක් ඔහුට නොතිබුණු බැවිනි. නිතර අතක් හෝ පයක් හෝ හිරි වැටිණි. සමහර දවස්වලදී මුළු සිරුරම සෙලවිය නොහැකි තත්ත්වයක පැවැතිණි. ඔහුට නිතර උණ රෝගයද වැලඳිණි. රැකියාවට යාම සඳහා නැඟී ටීමට ඔහු කොතෙක් වෙර දැරුවද පැයක් පමණ වෙලා යනතුරු ඔහු රෝගය සමඟ පොර බදයි. අනතුරුව, ඔහු පමා වූ බව මෙනෙහි කරන්නේ භීතියකිනි. මෙසේ පමා වීම නිසා ඔහුට නිල වශයෙන් දෙස් පැවරීමක් කළේය. ඔහු අනිකුත් සගයන්ගෙන් ඈත් වන බව ඔහුට දැනුණේ එවිටය.

දෙවරක්ම වෙනින් වැඩවලට මාරු කරමින් අකීම් ඔහුට උදවු කළද, නොවැළැක්විය හැකි දෙයක් සිදු විය. වැඩට අවුත් දෙමසක් ගත වෙත්ම පාවෙල් ඔත්පළව ඇඳෙහි වැතිර ගත්තේය. එවිට ඔහුට බෂානොවා සමුගැනීමේදී කී දෙය මතක් වූයෙන් ඇට ලිපියක් ලීවේය. ඈ එදිනම පැමිණ විස්තර අසා චිකිත්සාගාරයට ඇතුළු වී ප්‍රතිකාර ගැනීම අනිවාර්ය නොවන බව පැවසුවාය.

"එහෙනම් මගේ ලෙඩේ කොතරම් සුළුද ප්‍රතිකාර ගැනීමට පවා වුවමනාවක් නැහැ" යි ඔහු කියමින් විහිළු කිරීමට තැත් කළද, එම තැත සාර්ථක නොවීය.

යම්තම් ඇවිදීමට හැකියාවක් ලැබුණු හැටියේම පාවෙල් නැවත මධ්‍යම කාරක සභා කාර්යාලයට ගොස් යළිත් පත් කිරීමක් ඉල්ලා සිටියේය. එහෙත්, මෙවර අකීම් දැඩි ලෙසම එකඟ නොවීය. වහාම චිකිත්සාගාරයට ඇතුළු වී ප්‍රතිකාර ගත යුතු බව කියා සිටි විට, පාවෙල් දැඩි ලෙසම එය ප්‍රතික්ෂේප කළේය.

"මම කොහේවත් යන්නෙ නැහැ. ඒවායින් ප්‍රයෝජනයක්

නැහැ. මා ඒ ගැන විශේෂඥයන්ගෙන් දැන ගත්තා. මා ඉදිරිපිට ඇත්තේ එකම මඟයි. සේවයෙන් අස් වී විශ්‍රාම වැටුප් ගැනීමයි. මා එය කොහොමවත් කරන්නෙ නැහැ! නුඹලාට බැහැ මට පත් වීමක් නොදී ඉන්න. මගේ වයස අවුරුදු විසි හතරයි. අබ්බගාතයෙකු බව කියන සහතිකයකුත් අරගෙන චිකිත්සාගාරයෙන්, චිකිත්සාගාරයට යාමට මට බැහැ. එයින් වැඩක් නැහැ. මගේ සෞඛ්‍ය තත්ත්වයට සරිලන පත්වීමක් දිය යුතුමයි. මට ගෙදර ඉඳගෙන වැඩ කරන්නට පුළුවනි. නැති නම් කිසියම් ආයතනයක් තුළ ඉඳගෙන වැඩ කළ හැකියි. කඩදාසිවල ලකුණු කරන වැඩ විතරක් දෙන්න එපා. මා ප්‍රයෝජනත්වය යන හැඟීම් මගේ හදවතට හැඟෙන විදිහේ වැඩක් මට දිය යුතුයි.” පාවෙල් පැවසීය.

පාවෙල්ගේ කටහඬ චිත්තවේගී වූ අතර වඩාත් වේගවත් විය.

පාවෙල් නිසා බලවත් හැඟීමක් අකීම් තුළ ඇති විය. මෑතක් වනතුරු ගිනි පුපුරක් සේ ක්‍රියාකාරී වූ තරුණයාගේ හැඟීම් මොනවාද යන්න ඔහු වටහා ගත්තේය. පාවෙල්ගේ ඛේදවාචකය ඔහුට අවබෝධ විය. තම කෙටි ජීවිතය පක්ෂයට පිදූ පාවෙල්ට සටන් පෙරමුණෙන් ඈත් වී පසුපසට වී සිටීම බියජනක දෙයකි. තමා සතු හැම බලයක්ම යොදවා පාවෙල්ට උදව් කිරීමට අකීම් ඉටාගත්තේ එබැවිනි.

“හොඳයි පාවෙල් නුඹ කලබල වෙන්ට එපා. හෙට ලේකම් මණ්ඩලයේ රැස්වීමක් පවත්වනවා. නුඹේ ප්‍රශ්නය මම ඉදිරිපත් කරන්නම්. මට කළ හැකි හැම දෙයක්ම කරන බවට මම පොරොන්දු වෙනවා.”

පාවෙල් අමාරුවෙන් නැඟිට අකීම්ගේ අතක් අල්ලා ගත්තේය.

“අකීම්, මගේ ජීවිතය මාව මුල්ලකට එළවා දමා, මාව පොඩි කොට පාගා දමාවි කියලා නුඹ හිතනවද?මගේ හදවත වැඩ කරන තුරු” පාවෙල් අකීම්ගේ අතක් පරිශ්‍රමයෙන් ගෙන තම පපුව වෙත ඇද ගත්තේය. පාවෙල්ගේ හදවත වේගයෙන් ගැහෙන සැටි ඔහුට දැනිණි. “මගේ හදවත වේගයෙන් ගැහෙන තුරු මාව පක්ෂයෙන් ඉවතට ඇද දමන්ට බැහැ. සටන් පෙරමුණෙන් මාව ඈත් කළ හැක්කේ මරණයට පමණයි. සහෝදරයා ඒක මතක තබා ගන්න.”

අකීම් නිහඬ විය. එය හිස් ප්‍රලාපයක් නොවන බව ඔහු දැන සිටියේය. එය යුද්ධයේදී බරපතළ ලෙස තුවාල ලැබූ

සෙබළකුගේ වේදනා සහගත කෑ ගැසීමක් බව ඔහු වටහා ගත්තේය. මෙවැනි මිනිසුන්ට වෙනත් විදිහකට කතා කිරීමට හා බණින්නට බැරි බව අකීම් දන්නේය.

පාවෙල්ට මධ්‍යම පුවත්පතෙහි කතුමඬුල්ලේ වග කිවයුතු තනතුරක් දීමට තීරණය වූයෙන්, ඒ සඳහා ඔහුගේ සාහිත්‍යමය දක්ෂතාවන් ගැන සොයා බලා තක්සේරු කිරීමට අවශ්‍ය බව දවස් දෙකකට පසු අකීම් දැන්වීය. කතු මඬුල්ලේ කාර්යාලයේදී පාවෙල් සාදරයෙන් පිළිගැනිණි. උක්රයීන මධ්‍යම කාරක සභාවේ සභාපති මණ්ඩලයේ සාමාජිකාවක වූද, නීති විරෝධී ලෙස සැඟවී පක්ෂයේ කටයුතු කළ පැරැණි බොල්ෂෙවික්වරියක වූද, උපකතුවරිය ඔහු හමු වී ප්‍රශ්න කීපයක් ඇසුවාය.

"සහෝදරයා ඔබගේ අධ්‍යාපනය?"

"තුන්වැනි පන්තියෙන් සමත් වුණා."

"පක්ෂයේ දේශපාලන පාසල්වලට ගිහිල්ලා තියෙනවද?"

"නැහැ."

"ඒකට කමක් නැහැ. ඒවා නැතුව වුණත් හොඳ පුවත්පත් කලාවේදියෙකු වෙන්ට පුළුවනි. ඔබ ගැන අපට අකීම් කීවා. ඔබට වැඩ භාර දීමට පුළුවනි. කාර්යාලයට ඇවිත් වැඩ කිරීමට අවශ්‍ය නැහැ. ගෙදර සිට කළ හැකියි. කොහොම වුණත් මේ වගේ වැඩවලට පොදු පුළුල් දැනීමක් තියෙන්ට ඕන. විශේෂයෙන්ම සාහිත්‍යය හා භාෂාව ගැන."

එම කතාව තම පරාජයට මුල පිරීමක් හැටියට පාවෙල් දිටීය. අනතුරුව ඇති වූ සාකච්ඡාවේදී සිය දැනීමේ මඳ බව ඔහුට වැටහිණි. ඔහු විසින් ලියන ලද ලිපියෙහි බස් වහර පිළිබඳ අඩුපාඩු හා ව්‍යාකරණ දොස්ද තිහකට වඩා ඇති බව පෙන්වමින් උප කතුවරිය රතු පැන්සලයකින් ඉරි ගැසුවාය.

"කොර්චාගින් සහෝදරයා ඔබට සෑහෙන සහජ දක්ෂතාවක් තියෙනවා. ඔබගේ දැනීම දියුණු කරගතහොත් ඔබට අනාගතයේ දී සාහිත්‍ය කලා අංශයේ වැඩ කළ හැකියි. දැන් ඔබේ ලිපිවල ව්‍යාකරණ දොස් තියෙනවා. රුසියන් බස පිළිබඳ ඔබේ දැනීම පටු බවක් පෙනෙනවා. දැන් ඔබෙන් ප්‍රයෝජන ගැනීමට නොහැකි වීම ගැන අප කනගාටු වෙනවා. එහෙත්, මම තව වරක් අවධාරණය කරන්ට කැමතියි. ඔබට සෑහෙන කුසලතාවක් තිබෙන බව. ඔබේ ලිපියේ හරය වෙනස් නොකර බස් වහර නිසි ලෙස ගළපා ගත්තොත් එය බොහොම වටිනවා. අනුන්ගේ ලිපි මනා ලෙස සකස් කිරීමට

පුළුවන් අය තමා අපට වුවමනා.”

කෝර්චාගින් තම හැරමිටියට වාරුවී නැඟිට සිටියේය. ඔහුගේ දකුණු ඇස් බැම නැටවිණි.

“ඔව්, මම ඔබ සමඟ එකඟ වෙමි. මමත් මොන සාහිත්‍ය කාරයෙක්ද? මම ඉතා හොඳට ගිනි උදුනක වැඩ කළා. විදුලිබල ශිල්පියකු හැටියටත් වැඩ කළා. නරක නැහැ. අසු පැන්නීමට මට හොඳට පුළුවනි. කොම්සමොල් තරුණයන් උනන්දු කිරීමටත් පුළුවනි. නමුත් සාහිත්‍ය පෙරමුණට මම සුදුසු පුද්ගලයකු නොවෙයි.”

ඇගෙන් සමුගෙන ඔහු පිට විය. කොරිඩෝරයේ වංගුවෙන් හැරෙත්ම ඔහු බිම නොවැටුණා පමණකි. අත් බෑගයක් ගෙනයමින් සිටි කතක් ඔහු අල්ලා ගත්තාය.

“සහෝදරයා ඔබට මක් වෙලාද? සනීප නැහැ නේද!”

තත්පර කීපයකට පසු, ඔහුට පියවි සිහිය ලැබිණි. ඉනික්බිති ඔහු මුදු ලෙස කතගෙන් ඉවත් වී හැරමිටි වාරුවෙන් ගියේය.

එද සිට පාවෙල් කෝර්චාගින්ගේ සෞඛ්‍ය තත්ත්වය අයහපත් වෙන්නට විය. දැන් නම් වැඩ කිරීම තබා ඒ ගැන සිතීමට පවා බැරිය. ඔහු වැඩි වැඩියෙන් ඇඳට සීමා විය. මධ්‍යම කාරක සභාව ඔහු සේවයෙන් නිදහස් කළේය. ප්‍රධාන සමාජ සංරක්ෂණ අංශය ඔහුට විශ්‍රාම වැටුප් නියම කළේය. මධ්‍යම කාරක සභාව ඔහුට මුදල්ද, රෝගියෙකු බව කියැවෙන සහතිකයක්ද දී ඔහුට ඕනෑ තැනක පදිංචි වීමටද බලය දුන්නේය. මේ අතර, මොස්කව් විත් නැවතී විවේක ගැනීමට ආරාධනා කරන ලිපියක් ඔහුට ලැබිණි. පාවෙල් කෙසේ හෝ මොස්කව් යාමට ඉටාගෙන සිටියේ සමස්ත සෝවියට් මධ්‍යම කාරක සභාව මගින් සිය වාසනාව උරගා බැලීමටය. එනම් ඇවිදීමක් අවශ්‍ය නොවන රැකියාවක් ලබා ගැනීමටය. මොස්කව්හිදීද ඔහුට ප්‍රතිකාර ගන්නා ලෙස යෝජනා කෙරිණි. හොඳ චිකිත්සාගාරයකට යැවීමට ඔවුහු පොරොන්දු වූහ. පාවෙල් එය ප්‍රතික්ෂේප කළේය.

මාර්තා සහ ඇගේ මිතුරිය වන නාද්‍යා පීටර්සන්ලාගේ නිවසෙහි පාවෙල් නැවතී සිටි දවස් දහනවය නොදැනුවත්වම ගෙවිණි. දවල් කාලයේදී ඔහු තනිවමය. උදෙන් නැඟිට වැඩට යන මාර්තා සහ නාද්‍යා ගෙදර එන්නේ රෑ වූ පසුය. පාවෙල් දවස මුළුල්ලේම කියවීය. මාර්තාගේ පොත් අල්මාරියේ ඉතා හොඳ පොත්ය. හවස තරුණියෝ දෙදෙනා තවත් මිතුරන්

සමඟ ගෙදර ආහ.

කියුට්සම් පවුලෙන් පැමිණි ලියුම්වල ඔහුට එහි පැමිණෙන ලෙස ආරාධනා කර තිබිණි. එහි ඔවුන්ගේ ජීවිතය තවත් නරක අතට හැරුණෙන්, ඔවුහු ඔහුගෙන් ආධාර බලාපොරොත්තු වූහ.

එක් උදෑසනක කොර්චාගින් ගුස්යාට්නිකොව් වීදියේ නිහඬ නිවසින් නික්ම ගියේය. සරත් සමයේ වැසි සහිත ශීත කාලගුණයේ සිට දකුණු ක්‍රිමියාවේ උණුසුම් වෙරළ සහිත දකුණුදිග මුහුද වෙත ඔහු දුම්රියෙන් ගියේය. දුම්රිය විදුලි කණු පසු කරමින් දිවෙන සැටි ඔහු දිටීය. ඔහුගේ බැම සඟළ හැකිළී තිබිණි. ඔහුගේ කළුවන් දෙනෙත්වල මුරණ්ඩු ගතියකි. දුම්රිය විදුලි කණු පසු කරමින් දිවෙන සැටි ඔහු දිටීය.

VIII

පහළ ගල් ගොඩක් මත මුහුදේ රැලි හැප්පෙයි. ඈත තුර්කියේ සිට ශීත සුළං හමයි. කොන්ක්‍රීට් සිමෙන්ති බැම්මකින් මුහුදෙන් ආරක්ෂා කර ඇති වරාය වෙරළ දක්වා පැතිර ඇත. එය කඩතොලු සහිත අඩකවයක් මෙනි. කඳුවැටි මුහුද අසලින් නැවැතිණි. ඈත උඩරට කඳු මත ක්‍රීඩා භාණ්ඩවලට, සමාන වූ සුදු පැහැති ගෙවල්ය. ඒවා නගරාසන්නයේ පිහිටියේය.

නගරාසන්න පැරැණි උයනේ නිසලතාවකි. බොහෝ කලක සිටි පිරිසිදු නොකළ අතු පාරවල වල් පැළෑටි වැවිලාය. සරත් සමයේදී මිය යන කහ පැහැති ක්ලෝන් කොළ බිම වැටේ.

පාවෙල් කුලී අස්රියක නැංගේය. උයනට පැමිණි පසු ඔහු දෙස බැලූ පර්සියන් ජාතික මහලු රිය පදවන්නා නොඉවසිලිමත් ලෙස මෙසේ පැවසීය:

"මෙහාට ආවේ මොකටද? තරුණ ගෑනු නැහැ. නැටුම්හල් නැහැ. හිවල්ලු විතරයි... නුඹ මොනවා කරනවාද, මට තේරෙන්නෙ නැහැ. සහෝදර මහත්තයා ආපහු යමු!"

කොර්චාගින් මුදල් ගෙවූ පසු මහලු රියකරුවා ගියේය. උයන පාළුය. පාවෙල් මුහුදට මුහුණ ලා බංකුවක වාඩි විය. උණුසුම නැති හිරු රැස් දෙසට ඔහු මුහුණ හැරවීය.

නිසල වූ මෙතැනට ඔහු පැමිණියේ ජීවිතයට කුමක් කළ යුතු දැයි කල්පනා කර තීරණයක් ගැනීම පිණිසය. පැන

නැඟී ඇති තත්ත්වය සමාලෝචනයට භාජන කර තීරණයක් ගැනීමට වේලාව පැමිණ ඇත.

ඔහුගේ පැමිණීමත් සමඟම කියුට්සම් පවුලේ ප්‍රතිවිරෝධීතාවන් උච්චස්ථානය දක්වා වැඩී තිබිණි. ඔහුගේ පැමිණීම ගැන දැන ගත් කියුට්සම් මහල්ලා වියරු වූවකු සේ ගෙදර මහා කලබලයක් ඇති කළේය. මහල්ලාගේ දරදඬු පාලනයට විරුද්ධව කටයුතු කිරීම කොර්චාගින්ගේ කරපිට වැටිණි. තමා බලාපොරොත්තු නොවූ පරිදි දූවරුන් හා බිරිඳ තමාට විරුද්ධව නැඟී සිටින සැටි මහල්ලා දුටුවේය. කොර්චාගින් දෙවැනි වරට පැමිණි පළමුවැනි දවසේ සිටම කියුට්සම්ලාගේ නිවෙස එකිනෙකාට විරුද්ධව සතුරු කඳවුරු දෙකකට බෙදී වෙන් විණි. මහල්ලා සහ ඇල්බීනා පදිංචි කොටසට යා නොහැකි සේ එය වෙන්කොට වැසුවේය. නිවසෙහි එක් පසෙක වූ කාමරයක් කොර්චාගින්ට කුලියට දුන්නේය. ඔහු කාමර කුලිය කල් ඇතිව ගෙවීය. තම දූවරුන්ට උදව් කිරීමට වුවමනා නැතැයි සිතූ මහල්ලා මුල් දවස්වලදී සාමකාමී ආකල්පයක් දැරීය.

ඇල්බීනා තම දූවරුන්ට ආධාර දීමේ යටි අදහස ඇතිව 'රාජ්‍ය තාන්ත්‍රික හේතූන් නිසා' මහල්ලාගේ කොටසෙහි පදිංචි වූවාය. ඔහු දූවරුන් පදිංචි වී සිටි කොටසට ගියේවත් නැත්තේ තමා වෛර කරන කොර්චාගින් හමුවීමට මහල්ලා කොහෙත්ම අකැමැති වූ බැවිනි. එහෙත්, ගෙවත්තේදී ඔහු හැකි තරම් හඬ නඟා ශබ්ද කළේ ගෙදර ස්වාමියා තමා බව ඒත්තු ගැන්වීමටය.

සමුපකාරයේ රැකියාවට යාමට පෙර මහල්ලා වෘත්තීන් දෙකක් දැන සිටියේය: සපත්තු සාදන්නකු හා වඩුවෙකු ලෙස දැනුදු ඔහු ගෙවත්තේ මඩුවට වී වැඩ කරයි. කොර්චාගින් කුපිත කරනු වස් ඔහු තම වඩු පට්ටලය, කොර්චාගින් පදිංචි කාමරයේ ජනේලය ළඟටම ගෙනාවේය. ඔහු හඬ නංවමින් ඇණ ගසන්නේ ඉමහත් සතුටක් ලැබුවේ, කොර්චාගින්ගේ කියවීමට එය බාධාවක් බව ඔහු දැන සිටි බැවිනි.

"හිටපිය, මම නුඹව මෙතැනින් පන්නන්නම්." ඔහු මුමුනන්නට විය.

ඈත ක්ෂිතිජයේ සමීපව ඇති නැවක දුම් වලා මඟ සලකුණු කළාක් මෙනි. මුහුදු ළිහිණියන් රෑනක් උස් හඬක් නඟමින් පියෑඹූහ.

කොර්චාගින් දෑතින් හිස බදගෙන බැරෑරුම් ලෙස

කල්පනා කළේය. ඔහුගේ මනැස ඉදිරියේ ඔහුගේ ජීවිතය ළමා කාලයේ සිට අවසාන දවස් දක්වා මැවී පෙනිණි. ඔහු තම අවුරුදු විසිහතර ජීවත් වූයේ යහපත් ලෙසද, අයහපත් ලෙසද? ඔහු තම ගෙවී ගිය ජීවිතේ අවුරුදු එකිනෙක පිරික්සුමට භාජන කරමින්, දැඩි විනිසුරුවකු සේ කල්පනා කළේය. එතරම් නරක ලෙස ජීවත් නොවූ බව ඔහු ඉමහත් සතුටකින් තීරණය කළේය. එහෙත්, ඔහු අතින් වැරැදි ගොඩක් සිදුවී ඇත. ඒවා මෝඩකම් නිසාත්, තරුණ බව නිසාත් බහුතර වශයෙන් දැනීම අඩුකම නිසාත් සිදුවූ වැරැදිය. ප්‍රධාන දෙය සටන් අරගල පැවැති කාලයේදී, බලය සඳහා කළ සටනේදී තම ස්ථානය සොයා ගැනීමය. විප්ලවීය රතු ධජයේ ඔහුගේ ලේ බින්දු කීපයක්ද ඇත.

ශක්තිය සිඳී යන තුරු ඔහු සටන් පෙරමුණෙන් ඈත් නොවීය. පහර කා බිම වැටී සිටින ඔහුට පෙරමුණ ගෙන සටන් කළ නො හැකිය. පසුපස රෝහල්වල නැවතීම පමණක් මතක පටයට පිවිසියේය. එම සටනේදී සෙබළෙකුගේ වෙඩි පහරක් වැදුණෙන් ඔහු බිම පතිත විය. අසුගේ කුරවලට ඔහු යටවිය. සගයෝ වහාම ඔහුගේ තුවාල වටා වෙළුම් පටි ඔතා වෛද්‍ය සේවකයන්ට භාර දී සතුරා ලුහුබැඳ ගියෝය. සේනාංකය එක් සෙබළකු නැති වූ නිසා සටන නොනැත්වීය. ශ්‍රේෂ්ඨ කාරියක් සඳහා කරන සටනේදී එසේ සිදු විය, එසේ සිදුවිය යුතුය. සාමාන්‍ය රීතියට පිටින් විශේෂ සිද්ධීන්ද සිදුවූ බව ඇත්තකි. තවාන්කා නමැති රියවල සිට දෙපා නැති සෙබළුන් මැෂින් තුවක්කු ක්‍රියා කරවන සැටි ඔහු දැක ඇත. සතුරා බියවැද්දවීමට ඔවුහු සමත් වූහ. ඔවුහු සතුරන්ට මරණය හා විනාශය ළං කළහ. ඔවුන්ගේ අයෝමය ඉවසීම හා නොවරදින ලෙස ඉලක්කයට වෙඩි තැබීමේ දක්ෂතාව නිසා ඔවුන් රෙජිමේන්තුවේ ආඩම්බරය ලෙස සැලකීය. එහෙත්, එවැන්නෝ විරල වූහ.

විනාශයෙන් පසුව, සටන් පෙරමුණට නැවත පැමිණීමේ බලාපොරොත්තු සුන්වූ පසුව, ඔහු ක්‍රියා කළ යුත්තේ කිනම් ආකාරයටද? අනාගතයේදී ඔහුට වඩාත් නරක තත්ත්වයන්ට මූණ පෑමට සිදුවන බව බෂානොවාගෙන් දැන ගැනීමට ඔහු සමත් නොවීද? දැන් කළ යුත්තේ කුමක්ද? නොවිසඳුණු එම පැනය ඔහුගේ දෙපා ඉදිරිපිට මතුවූ බියජනක අගාධයක් වැන්න.

අතිශයින්ම වටිනා දෙය වූ සටන් කිරීමේ හැකියාව නැතිවූ

පසු ජීවත් වන්නේ කුමක් සඳහා ද? ප්‍රීතිය රහිත අනාගතයේදී තමා ජීවත්වීම සාධාරණ යැයි පෙන්වන්නේ කෙසේද?

තම ඉතිරි කාලය ගත කළ යුත්තේ මොනවා කරමින්ද? නිකම් කාලා, බීලා, ආශ්වාස ප්‍රශ්වාස කිරීමෙන් පමණක්ද? තම සගයන් සටන් කරමින් ඉදිරියට යන විට, කිසිවක් කරකියා ගත නොහැකිව නිකම් බලා සිටීමෙන් පමණක්ද? සෙබළා සේනාංකයට කරදරයක් විය යුතුද? තමා පාවා දුන් තම සිරුර විනාශ කළ යුතු නොවේද? හදවතට එක වෙඩි පහරකි. අමතර වැඩ කිසිවක් අවශ්‍ය නැත! අයහපත් නොවන අන්දමකට ජීවත්වීමට නුඹට හැකි වුණා. එසේ නම් නියම වේලාවට සිය පණ නසා ගැනීම කළ යුතුය. පණ ඇදීමෙන් තොර වීම සඳහා ක්‍රියා කරන සෙබළා විවේචනයට භාජනය කරන්නේ කවුද?

ඔහුගේ අතක් සාක්කුවක ඇති බ්‍රව්නිංග් පිස්තෝලය ඇල්ලීය. පුරුදු පරිදි අතේ ඇඟිලි විසින් පිස්තෝල මිට ඇල්ලිණි. ඔහු සෙමින් පිස්තෝලය ඇදගත්තේය.

"මෙවැනි තත්ත්වයකට ඇද වැටෙන්නට තරම් දවසක් එතියි සිතිය හැක්කේ කාටද?"

පිස්තෝලයේ බටය ඔහු දෙස අපහාසාත්මක ලෙස බැලීය. පාවෙල් පිස්තෝලය දණහිස මත තබාගෙන තමාටම බැණ වදින්නට විය:

"මල්ලී, මේ ක්‍රියාව කඩදාසි වීරකමකි! ඕනෑම මෝඩයකුට, ඕනෑම වේලාවකදී නුඹව මරා දමන්නට පුළුවනි. තත්ත්වයෙන් මග හැරීමට ඇති එකම ලෙහෙසි ක්‍රමයත්, බියගුලු ක්‍රියාවත් සිය පණ නසා ගැනීමයි. අමාරු වුණාම වෙඩි තබා ගන්නවා. මේ ජීවිතයේ සියලු අමාරුකම් මැඩ ජයගැනීමට නුඹ උත්සාහ කළාද? අයෝමය වළල්ල බිඳ දැමීමට උත්සාහ කළාද? නොව්ගොරොද් වොලින්ස්කිවලදී අපි එක දවසකදී දහහත් වාරයක්ම සතුරාට පහර දීමට ගොස් අවසානයේදී හැම බාධාවක්ම මැඩ ජයගත් සැටි නුඹට අමතක වුණාද? වහාම පිස්තෝලය සඟවා ගනින්. ඒ ගැන කාටවත් කිසිම දක කියන්ට එපා. ජීවත්වීම කොහෙත්ම බැරිතරමට දුෂ්කර වූ විට පවා, ජීවත්වීමට ඉගෙන ගනින්. නුඹේ ජීවිතය ප්‍රයෝජනවත් බවට පරිවර්තනය කරපන්."

පාවෙල් නැඟිට මග ඔස්සේ ගමන් කළේය. කඳුරට වැසියෙක් තම රියෙන් ඔහු නගරයට ගෙන ගියේය. මං සන්ධියකදී ඔහු පුවත්පතක් මිලට ගෙන කියවන්නට වූ විට,

සමාජ ශාලාවේ එදින පාක්ෂිකයන්ගේ රැස්වීමක් පැවැත්වෙන බවට දැන්වීමක් දිටීය. ඔහු එම රැස්වීමට සහභාගි වී ගෙදර එන විට, රෑ බෝවී තිබිණි. ඔහු එදා රැස්වීම අමතා කතාවක් කළේය. එය ඔහුගේ ජීවිතයේ අවසාන ප්‍රසිද්ධ කතාව බව එදා ඔහු නොදැන සිටියේය.

★

පාවෙල්ගේ නොපැමිණීම නිසා බියගත් තායා ඔහු එන තුරුම නොනිඳ සිටියේය. ඔහුට කුමක් වීද? ඔහු කොහේ ගියේද? නිතර උණුසුමක් හා ජීවමාන බවක් තිබුණු ඔහුගේ දෙනෙත්වල එදින දැඩි බවක් පෙනෙන්නට තිබුණු බව ඇට මතක් විය. ඔහු තමා ගැන කීවේ මඳ වශයෙනි. ඔහු කිසියම් අවාසනාවකට මූණ පා තිබෙන බව මේ නිසා තායා වටහා ගත්තාය.

අම්මා නිදා සිටින කාමරයේ ඔරලෝසුව රාත්‍රි දෙක බව කියන හඬ නගත්ම, ගෙවත්තේ කුඩා ගේට්ටුව අරින ශබ්දයක් ඇසිණි. තායා කබාය පොරවාගෙන දොර දෙසට ගියාය. ලෝලා සිය කාමරයට වී සිහිනෙන් දොඩවයි.

"පාවෙල් මම ඔයා නිසා හොඳටම කලබල වුණා." යැයි ඔහු ආලින්දයට ආ විගස තායා, ඔහුගේ පැමිණීම නිසා මහත් සේ සතුටු වෙමින් මිමිනුවාය.

"මා මැරෙන තුරු මට කිසිදෙයක් වෙන්නෙ නැහැ, තයූෂා. ලෝලා නිදිද? ඔයා දන්නවද මට නිදාගන්ට හිතක් නැහැ. අද දවස ගැන මම ඔයාට යමක් කියන්ට කැමැතියි. අපි ඔයාගෙ කාමරයට යමු. නැතිනම් ලෝලා ඇහැරේවි." ඔහුද ඇය මෙන්ම පහත් හඬින් මිමිනුවේය.

තායා අස්ථිර ගතියක් පෑවාය. මහ රෑ ඇ ඔහු සමඟ කතා කරන්නේ කොහොමද? අම්මා ඒ ගැන දැනගත්තොත් ඇය ගැන කුමක් සිතාවිද? එහෙත්, ඔහුට ඒ ගැන නොකිව යුතුය. ඔහු අමනාපයට පත් විය හැකි බැවිනි. එසේ වුවද, ඔහු කියන්ට යන්නේ මොනවා ගැනද? මෙසේ සිතමින් තායා සිය කාමරය දෙසට පා නැඟුවාය.

"තායා කාරණය මෙන්න මේකයි." පාවෙල් පහත් හඬින් පැවසීය. කළුවර කාමරය තුළ ඔවුන් දෙදෙනා එකිනෙකාට කොතරම් ළංව වාඩිවී සිටියෝද යත්, ඇයට ඔහුගේ හුස්ම ගැනීම පවා දැනිණි. "ජීවිතය කොතරම් වෙනස් වෙනවා දැයි කීවොත් පුදුමයට පවා පත්වෙනවා. මම මේ දවස්වල

ජීවත් වුණේ එතරම් හොඳින් නොවෙයි. මින්පසු ජීවත් විය යුත්තේ කොහොමදැයි මට පැහැදිලිව පෙනුණේ නැහැ. මේ දවස්වල තරම් මීට පෙර මගේ ජීවිතය ඇඳිරි වෙලා තිබුණෙ නැහැ. අද මා ගැන 'දේශපාලන බියුරෝ' රැස්වීමක් තියලා බොහොම වැදගත් තීරණයක් ගත්තා. මා කියන දේ ගැන ඔයා මවිත වෙන්නට එපා."

පසුගිය මාස කීපය තුළදී තමා විඳි දුක් කරදර ගැනද, උයනේ වාඩි වී කල්පනා කළ දේ ගැනද ඔහු ඇයට විස්තරයක් කළේය.

"තත්ත්වය ඔහොමයි. දැන් වැදගත්ම කරුණට බහිමු. පවුලේ කුණාටුව පටන් ගත්තා විතරයි. අපි මෙතැනින් පිරිසිදු වාතය ඇති ස්ථානයකට යන්නට ඕන. මේ ගුහාවෙන් හැකි තරම් ඈතට යා යුතුයි. යළිත් ජීවත්වීම පටන් ගත යුතුයි. මම මේ සටනට කොටස්කරුවෙකු වූ නිසා එය අවසානයක් දක්වා කළ යුතුයි. ඔයාගෙයි, මගෙයි පෞද්ගලික ජීවිතය ප්‍රීතියෙන් තොර වූවක්. මම එය උඩු යටිකුරු කොට පෙරළීමට තීරණය කළා. මෙහි තේරුම ඔයාට වැටහෙනවද? ඔයා මගේ බිරිඳ හා මිතුරිය බවට පත්වීමට කැමැතිද?"

අවසාන වැකිය වන තුරුම තායා ඉමහත් කැලඹීමකින් යුතුව අසාගෙන සිටියාය. අවසාන වචන කීපය ඇසෙත්ම බලාපොරොත්තු රහිත බව නිසා ඈ තිගැස්සුණාය.

"තායා, මම අදම ඔයාගෙන් පිළිතුරු ඉල්ලා හිටින්නෙ නැහැ. බැරෑරුම් ලෙස කල්පනා කර බලන්න. සංග්‍රහ සත්කාර නොකර එකවරට එවැනි දෙයක් යෝජනා කිරීම ගැන ඔයාට තේරුම් ගන්ට බැරුව ඇති. ඒ බොරු විකාරවලින් ඇති වැඩක් නැහැ. පුංචි කෙල්ලේ, මම ඔයාට මගේ අත දිගු කරනවා. මෙන්න ගනින්. ඔයා මෙවර මා කෙරෙහි විශ්වාස කළොත් ඔයාට වරදින්නෙ නැහැ. ඔයාගෙන් මටත්, මගෙන් ඔයාටත් බොහෝ දේ ලබාගැනීමට තියෙනවා. මා දැනටමත් මෙහෙම තීරණය කළාඃ අපේ මේ සමගි සම්මුතිය ඔයා හැබෑ, නියම කෙනෙකු හැටියට වර්ධනය වන තුරු එනම් බොල්ෂෙවික්වාදියකු වන තුරු පවතීවි. මට ඔයාට උදවු කරන්ට බැරිවුණොත් මා පොට්ට කාසියක් තරම්වත් වටින්නෙ නැහැ. ඒ වන තුරු අපේ ගිවිසුම කැඩීම සුදුසු නැහැ. ඔබ වර්ධනය වූ පසු ගිවිසුම බලපාන්නෙ නැතිව යාවි. මොනවා වේවිද කවුද දන්නේ, මා ශාරීරික වශයෙන් සම්පූර්ණයෙන් අබලන් වීමටත් ඉඩ තියෙනවා. එහෙම වුණොත් ඔයාට

සම්පූර්ණ නිදහස තියෙනවා මගෙන් ඉවත් වීමට.”

තත්පර කීපයක් නිහඬව සිට, ඔහු උණුසුම් හා සුරතල් ලෙස යළිත් කතා කළේය.

“දැන් මා ඔබට මගේ මිත්‍රත්වය හා ආලය පුද කරනවා.”

ඔහු ඇගේ අතක් ගෙන කොතරම් ශාන්තව සිටියේද යත්, ඇය ඔහුගේ අදහසට එකඟ වූවාක් මෙන් විය.

“ඔයා මාව අතහැර දමන්නෙ නැතිද?”

“තායා වචන ඔප්පු කිරීමක් නොවේ. මා වැනි අය තමන්ගෙ මිතුරන්ව පාවා දෙන්නෙ නැති බව විතරක් ඔයා විශ්වාස කළ යුතුයි... මගේ මිතුරන් මාව පාවා නුදුන්නොත් ඒ ඇති.” ඔහු දෙම්නසින් පැවසීය.

“අද මම ඔයාට කිසිවක් කියන්නෙ නැහැ. මෙය බලාපොරොත්තු නොවූ දෙයක්...”

කොර්චාගින් නැගිට සිටියේය.

“තායා ගිහින් නිදාගන්න. ඉක්මනින් එළිය වැටෙනවා.”

ඔහු සිය කාමරයට ගොස් ඇඳුම් නොගලවාම ඇඳෙහි වැතිරගත් විගසම නිදන්නට විය.

කොර්චාගින්ගේ කාමරයේ කවුළුව අසල මේසය මත පක්ෂයේ පොත්ගුලින් ගෙනා පොත් හා පුවත්පත් ගොඩකි. සටහන් පොත් කීපයකි. ඇඳකි, පුටු දෙකකි. ඔහුගේ සහ තායාගේ කාමර අතර ඇති දොරෙහි චීනයේ විශාල සිතියමකි. එහි රතු සහ කළු කුඩා කොඩි අමුණා ඇත. නගරයේ පක්ෂ කමිටුව ඔහුට පොත් හා සඟරාදිය එවීමට එකඟ විය. පාවෙල්ට අවශ්‍ය සියලු පොත් සැපයීමට නගරයේ විශාලම පොත්ගුල භාර පුද්ගලයාට දැන්වීමටද පක්ෂ කමිටුව පොරොන්දු විය. වැඩි කල් යාමට පෙර ඔහුට විශාල පොත් පාර්සල් එවීම ඇරඹිණි. උදේ පාන්දර සිට, උදේ හා දහවල් ආහාරය සඳහා ගන්නා විවේකය හැරුණු විට, රෑ බෝවන තුරු පාවෙල් කියවන සැටිත්, සටහන් ලියාගන්නා සැටිත් දුටු ලෝලා මවිතයට පත් වූවාය. පාවෙල්, තායා සහ ලෝලා නිතර එකට කල් ගෙවූහ. තමා කියවූ පොත් පිළිබඳ විස්තරයක් ඔහු ඔවුන් දෙදෙනාට නිතර ඉදිරිපත් කළේය.

මැදියම් රැය ගෙවී බොහෝ වේලාවක් ගත වූ පසුද, පාවෙල්ගේ කාමරයේ පහනේ ආලෝකය ජනේල රෙදිවලට මැදින් පෙනෙන්නට වූ බැවින් ගෙවත්තට පැමිණි කියුට්සම් මහල්ලා දෙපයේ ඇඟිලි තුඩුවලින් ගමන් කරමින් පාවෙල්ගේ කාමරය අසලට විත් කවුළුවෙන් එබිකම් කොට බැලීය.

මේසය අසල වාඩිවී හිස පහතට නමාගෙන පොතක් කියවන පාවෙල් ඔහුගේ නෙතට හසුවිය.

"මිනිස්සු නිදාගන්නවා. මේකා රෑ එළිවන තුරු පහන් පත්තුකරගෙන ඉන්නවා. මූ ගෙයි හැසිරෙන්නෙ හරියට ස්වාමියා වගෙයි. කෙල්ලො දෙදෙනා මට අකීකරු වීමට පටන් අරගෙන." මහල්ලා මුමුනමින් ඉවත ගියේය.

අවුරුදු අටකට පසු ජීවිතයේ පළමුවැනි වරට ඕනෑ තරම් කාලයක් හා කිසිදු යුතුකමක් නැති ස්වාධීනතාවක් භුක්ති විඳීමට පාවෙල්ට හැකිවිය. ඔහු ඉතා ගිජු ලෙස කියවන්නට වූයේ අලුත් දේ දැනගැනීමේ නොසිඳෙන ආසාවකිනි. දවසකට පැය දහඅටක් නොකඩවා කියවීමට ඔහු පුරුදු විය. දවසක්ද තායාගේ කටින් අහම්බෙන් පිට වූ වචන කීපයක් නිසා නොවේ නම්, මේ අසීරු දිනචරියාව නිසා ඔහුගේ සෞඛ්‍යයට හානි නොවී තව දවස් කීපයක් එසේ වැඩ කිරීමට ඔහුට හැකි වෙති දැයි කීම උගහටය.

"ඔයාගෙ කාමරයට යන මඟ අවහිර කරන ලාච්චු මේසය මම අයින් කළා. ඔයාට ඕන නම් මා සමඟ කතා කරන්න, ලෝලාගේ කාමරය හරහා නොගිහින් එකවරම මගේ කාමරයට දැන් එන්නට පුළුවනි" යි තායා කීවාය.

පාවෙල්ගේ දෙකොපුල් රත් පැහැ ගති. තායා සතුටු සිතින් මඳ සිනා පෑවාය. ඔවුන් දෙදෙනා අතර ගිවිසුමක් ඇතිවිය.

★

එද සිට මැදියම් රැයෙන් පසු පාවෙල්ගේ කාමරයේ පහන් එළිය දැකීමට මහල්ලාට බැරි විය. අසාර්ථක ලෙස සැඟවුවද, තායාගේ දෙනෙතින් ප්‍රකාශ වන ප්‍රීති ප්‍රමෝදය ඇගේ මව දුටුවාය. තායාගේ නෙත්වලට යටින් ඇති පැල්ලම් ඇය නිදි මරන බවක් කියා පෑවේය. තායා නිතර ගී කීමටද, ගිටාරයක් ඉඳහිට වැයීමටද, පටන් ගත්තාය. මෙය කුඩා නිවෙස තුළ රැව් දිණි.

එසේ වුවද, තායාගේ ප්‍රීතිය බාධාවලින් තොර නො වී ය. ඇගේ ආලය සොරකම් කළ සැටියක් අවදි වූ ඇගේ ස්ත්‍රීභාවයට දැනුණෙන් එය පෙළන්නට විය. හැම හඬක් ම විසින් ඇය තිගැස්සිණි. මව තමා දෙසට එන සැටියක් ඈට නිතර දැනෙන්නට විය. රෑට තම කාමරයේ දොරට අගුළුලන්නේ මන්දැයි ඇසුවොත් එයට පිළිතුරු දෙන්නේ කෙසේදැයි යන්න ගැන ඈ ළතැවෙන්නට වූවාය. කොර්චාගින්

මේ හැම දෙයක්ම දකින්නේ ඇය සන්සුන් කරවමින්, සුරතල් ලෙස මෙසේ තෙපළේය:

"ඔයා බයවෙන්නේ මොකටද? ඇත්ත ඇති සැටියෙන් කල්පනා කර බලනවා නම්, අපි තමා මේ කාමරයේ ස්වාමිවරු. ඔයා නිවිහැනේ නිදාගන්නකො. පිට අයට අපේ ජීවිතවලට බලපෑමට අවසර නැහැ."

සන්සුන් වන ඈ තම මුහුණ ඔහුගේ පපුව මත තබාගෙන, ඇගේ ආදරවන්තයාගේ ගෙල බදාගෙන නිදාගන්නීය. ඇගේ සැප නින්දට බාධා වෙතියි බිය වන ඔහු නොසැලී ඒ ආකාරයෙන්ම වැතිරගෙන, ඇගේ ආශ්වාස ප්‍රශ්වාසයට සවන් දෙයි. සිය ජීවිතය තමාට භාරදුන් ඒ තරුණිය නිසා උපන් භක්තියෙන් ඔහුගේ හදවත පිරෙයි.

තායාගේ දෙනෙත්වල ප්‍රීතියට ඇති නියම හේතුව පළමුවරට දැනගත්තේ ලෝලාය. එදා සිට අක්කා සහ නංගී අතර භේදයක් ඇති විය. අම්මාද ඉක්මනින් දැන ගත්තාය. නැති නම් අනුමාන වශයෙන් නිගමනය කළාය. ඈ දොම්නසට පත්වූයේ, කෝර්චාගින්ගෙන් ඈ එවැන්නක් කොහෙත්ම බලාපොරොත්තු නොවූ බැවිනි.

"තායා ඔහුට ගැළපෙන ගෑනියක් නොවෙයි, එයින් මොනවා වේද?"යි අම්මා ලෝලාගෙන් ඇසුවාය.

ඈ මේ හේතුව නිසා බොහෝ සේ නොසන්සුන් වූවද, ඒ ගැන කෝර්චාගින් සමඟ කතා කිරීමට තරම් එඩිතර නොවූවාය.

කෝර්චාගින් සොයා තරුණයෝ එන්නට පටන් ගත්හ. සමහර දවස්වලට ඔහුගේ කුඩා කාමරයේ තදබදයක් ඇති වේ. ඔවුන්ගේ ගී ගැයීම නිසා 'ගුම් ගුම්' නද දෙන මී මැසි රැළකට සමාන හඬක් කියුට්සම් මහල්ලාගේ කන්හි වැකිණි. ඔවුන් ගයන ගීතවල වචන ඔහුට ඇසිණි:

"සාගරය මිනිසත් බවෙන් තොරවී,
දිවා රෑ දෙක්හි හඬ නඟයි..."

පාවෙල්ගේ ප්‍රියතම ගීතයද ගායනා කළේය:

"මිහිතලය කඳුළින් පිරී ඉතිරී ඇත..."

තමාට ප්‍රචාරක වැඩ භාරදෙන ලෙස ඉල්ලා පාවෙල්

විසින් පක්ෂයේ ප්‍රාදේශීය කමිටුවට යවන ලද ලිපියට පිළිතුරු වශයෙන් තරුණ කම්කරුවන්ගේ දේශපාලන කවයක් මෙහෙයැවීම ඔහුට භාර දුන්නේය. ඒ අනුව පාවෙල්ගේ කාමරයෙහි තරුණ කම්කරුවෝ රැස්වූහ. එලෙස පාවෙල් දවස ගත කළේය.

තමාට අකීකරු වූ මෝටර් රියක් බඳු ජීවිතයේ රෝදය ඔහු යළිත් දැතින්ම අල්ලාගෙන අලුත් ඉලක්කයක් වෙත එය පැදවීය. අධ්‍යාපනය හා සාහිත්‍යය මඟින් ජීවිතයට යළිත් පැමිණීමට ඔහු තුළ වූ බලාපොරොත්තුව එසේ විය.

එහෙත්, ඔහුගේ ජීවිතය ඔහුට බාධා කරන්නට විය. තම අරමුණ කරා යාමේදී ඒවා තමාට කොතෙක් දුරට කරදර කරතිද යන්න සිතමින් පාවෙල් අසහනයට පත්විය.

උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළු වීමට අසමත් වූ ජෝජ් කියුට්සම් මොස්කව්හි සිට සිය බිරිඳත් සමඟ හදිසියෙන්ම නගරයට පැමිණියේය. ඔහු තම බිරිඳගේ පියා වූ නීතිවේදියකුගේ ගෙදර නැවතී මව හමුවීමට නිතර විත්, මුදල් ඉල්ලමින් කරදර කරන්නට විය.

ජෝජ්ගේ පැමිණීම නිසා පවුලේ භේදය වඩාත් උග්‍ර විය. ඔහු වහාම තම පියාගේ පැත්ත ගෙන, සෝවියට් විරෝධී අදහස් දැරූ තම මාමාගේද උදවු ඇතිව යටි උගුල් අදිමින් කොර්චාගින් ගෙදරින් පන්නා දැමීමටත්, තායා ඔහුගෙන් වෙන් කරවීමටත් ක්‍රියා කළේය.

ජෝජ් පැමිණ සති දෙකක් ඉකුත්වීමට පෙර ලෝලා නුදුරු තැනක රැකියාවක් ලබාගෙන ගෙදරින් පිට වූවාය. ඇය ගියේ තම කුඩා පුතා සහ අම්මා කැටුවය. පාවෙල් සහ තායා වෙරළබඩ වූ ඈත නගරයකට පදිංචිය පිණිස ගියහ.

★

අර්ට්යොම්ට සිය සොහොයුරාගෙන් ලියුම් ලැබුණේ කලාතුරකිනි. නාගරික සෝවියට් සභාවක සභාපති හැටියට සේවය කරන ඔහුගේ මේසය මත තමාට සුපුරුදු අත් අකුරු සහිත ලියුමක් දුටු අර්ට්යොම් කැලඹීමෙන් යුතුව කවරය ඉරා දැම්මේය. ඔහුගේ සිත මුදු ගුණයකින් පිරී ගොස් මෙසේ පැවසීයː

"අනේ පව්ලූෂා මල්ලියේ! නුඹ මා ළඟ තැනක පදිංචි වුණා නම්, නුඹගේ උපදෙස් ලබා ගැනීමට තිබුණ නොවේද!"

ඔහු ලියුම කියවීයː

"අර්ට්යොම් අයියේ, මා ඔබට මේ ලියුම ලියන්නේ මෑතකදී මට සිදුවූ දේ ගැන විස්තර කිරීමටයි. මේ වගේ ලියුම් මා වෙන කාටවත් ලියන්නෙ නැහැ. අයියා මාව දන්නවා. ඒ වගේම හැම වචනයක්ම තේරුම් ගනු ඇති. සෞඛ්‍ය පෙරමුණේදී රෝගය මට පහර පිට පහර දීමට පටන් ගෙන ඇත.

එක පහරක් කා යන්තම් හුස්ම ගන්නා විටම, එයටත් වඩා දරුණු තවත් පහරක් මට එල්ල විය. මට මේ රෝගය මැඩ නැගිට සිටීමට බැරි වීම තමා ඉතාම බියජනක කාරණය. මගේ වම් අත සම්පූර්ණයෙන්ම පණ රහිත වී ඇත. ඊළඟට මගේ දෙපා දැන් ක්‍රියා විරහිත වී තිබේ. (ඊට පෙර සිට මම යන්තමින් කාමරය තුළ පමණක් ඇවිද්දෙමි.) දැන් මට ඇඳෙහි සිට මේසය වෙත පවා යාමට පවා අමාරුය. හෙට දවස මා කිනම් උවදුරකට මූණපාති දැයි මට කිව නොහැකිය.

ගෙයින් පිටතට යාමට බැරි නිසා කවුළුව අසලට වී මුහුද දෙස බලමි. මගේ සිරුර මට කීකරු වීමට විරුද්ධ වෙයි. එහෙත්, බොල්ෂෙවික්වාදී මගේ හදවත, මගේ අපරිමිත ධෛර්යය, ශ්‍රමකාමී ජීවිතය සඳහා වේගයෙන් ඉදිරියට යයි. මට, මුළු මහත් පෙරමුණම ආක්‍රමණය කරමින්, අයෝමය ප්‍රහාර එල්ල කරමින් ඉදිරියට, නුඹලාගේ ක්‍රියාශීලී හමුදවට එක්වීමේ අවශ්‍යතාවක් ඇත. මේ ප්‍රතිවිරෝධීතාවට වඩා දැඩි ඛේදවාචකයක් තවත් තිබේද?

මම නැවත සටන් පෙරමුණට පැමිණෙන බව විශ්වාස කරමි. ඉදිරියට යන පෙරමුණ බළඇණියේ මගේ බයිනේත්තුවද දිලිසෙනු ඇත. අවුරුදු දහයක් තිස්සේ කොමියුනිස්ට් පක්ෂයත්, කොම්සොමොල් සංවිධානයත් සටන් කිරීමේ කලාව මට උගැන්වීය. අපේ නායකයාගේ වචන මට ද එක සේ බලපායි: "බොල්ෂෙවික්වාදීන්ට මෙල්ල නොවන බළකොටු නොමැත."

දැන් මගේ ජීවිතය අධ්‍යාපනයට පමණක් සීමා වී ඇත. පොත්, පොත් සහ තවත් පොත්. අර්ට්යොම්, මම වැඩ ගොඩක් සපුරාලූයෙමි. ආචීර්ණ කල්පික සාහිත්‍ය කෘතීන් කියවා හැදෑරූයෙමි. කොමියුනිස්ට්වාදී විශ්වවිද්‍යාලයේ පළමුවැනි වසරේ පාඩම් මාලාව හදරා තැපැල් මගින් පිළිතුරු යවා සමර්ථ විමි. හවස් පතා ක්‍රියාකාරී පාක්ෂික තරුණයන්ගේ අධ්‍යාපන කවයක් මෙහෙයවමි. පක්ෂයේ ප්‍රායෝගික වැඩ කටයුතු මේ සහෝදරවරුන් මගින් මම ගෙන යමි. ඊළඟට

මගේ ආදරණීය තයූෂාගේ දියුණුව හා ප්‍රගතිය සඳහා ක්‍රියා කරමි. මගේ බිරිඳ හා මිතුරියගේ ආදරය හා සුරතල් ආලිංගනය මට ලැබේ. අප දෙදෙනා මිතුරන් ලෙස ජීවත් වෙමු. අපේ අය වැය බොහොම චාම්ය. මගේ විශ්‍රාම වැටුප මසකට රූබල් තිස් දෙකකි. තායා රැකියාවක් කර වැටුප් ලබයි. මා ගිය මඟ ඔස්සේ තායාද පක්ෂය වෙත යමින් සිටී. දැන් ඈ ගෘහ සේවිකා රැකියාවෙන් අස්වී අවන්හලක පිඟන් සෝදන්නීය. (මේ නගරයේ කම්හල් නැත.)

මේ ළඟදී තායා කාන්තා අංශයේ සාමාජික නියෝජිත බල පත්‍රය මට පෙන්වූයේ ආඩම්බරයකිනි. ඇයට එය සාමාන්‍ය කඩදාසියක් නොවේ. ඇය අලුත් කෙනෙකු බවට පරිවර්තනය වන සැටි මම බලා සිටීමි. ඒ අතර, ඒ නව පුද්ගලයාගේ උපත සඳහා කළ හැකි හැම උදව්වක්ම දෙමි. යථා කාලයේදී ඇය විශාල කම්හලක වැඩ කරනු ඇත. විශාල කම්කරු සමූහයක සාමාජිකාවක වන ඇය, දේශපාලනමය වශයෙන් මුහුකුරා වැඩෙනු ඇත. අප මෙතැන සිටින තුරු ඈ යා හැකි එකම මඟ ඔස්සේ ගමන් කරමින් සිටින්නීය.

තායාගේ අම්මා දෙවරක්ම මෙහි පැමිණියාය. ඈ තමාට නොදැනුවත්වම තායා තමා වෙත ඇදගැනීමට ක්‍රියා කරන්නීය. ඇගේ ලෝකය නොවැදගත් කුඩා දේවලින් සැදුණු, පටු, පෞද්ගලික, ආත්මාර්ථකාමී එකකි. ඇගේ කාලයේ පැවැති ඇඳිරිබව ඇගේ දුවගේ මඟට බාධා නොකළ යුතු බව ඇල්බීනාට ඒත්තු ගැන්වීමට මම මහන්සි ගත්තෙමි. එහෙත්, ඒවා සියල්ල ඵල රහිත විය. දුවගේ අලුත් ජීවිතයට බාධා කිරීමට අම්මා කවදා හෝ නැඟිට සිටින බව මට හැඟෙයි. එවිට නොවැළැක්විය හැකි සටනක් සිදුවනු ඇත.

සුබ පැතුම් එවමු.

මීට ඔබගේ මල්ලී
පාවෙල්.”

පැරණි මට්ස්සෙස්ටාහි අංක 5 දරන සෞඛ්‍යාගාරය ගලින් තැනූ තෙමහල් පායක් වන එය කඳු බෑවුමේ ගැටිය අයිනේ පිහිටා ඇත. හැම පැත්තෙන්ම ඝනැති කැලෑවකි. මුහුද දක්වා ඇති මඟ වංගු සහිතය. සෞඛ්‍යාගාරයේ කවුළු විවෘතව ඇත. පහළ සිට හමන සුළං ගෙන්දගම් මිශ්‍ර ඛනිජ උල්පත්වල සුවඳ ගෙන එයි. කෝර්චාගින් තම කාමරය තුළ තනිවම වැතිර සිටී. හෙට අලුත් සහෝදරවරු පැමිණෙති. ඔහුට අසල්වැසි

සගයකු ලැබෙනු ඇත. කවුළුවට එහා ඔහු හඳුනන කිසිවකුගේ කටහඬක් ඇසෙයි. කීප දෙනෙක් කතා කරති. මීට පෙර ඔහු ඒ බැරෑඩි, ගොරෝසු කටහඬ අසා ඇත්තේ කොහෙදීද? ඔහු කල්පනා කරන්නට විය. ඔහුට අමතක නොවූ යටගියාවෙන් එම නම යළි ඉදිරියට ආවේයඃ 'ඉනකෙන්ති පාව්ලවිච් ලෙඩ්නියෝව්' ඒ ඔහු හැර අන් කිසිවකු නොවිය හැකිය. ඔහු ඒ ගැන සැකහැර දැන ගත්තෙන් නම උස් හඬින් කීය. විනාඩියකට පසු කාමරයට ඇතුළු වූ ලෙඩ්නියෝව් අත දී ප්‍රීතිමත් ලෙස ආචාර කළේය.

"ඉතින් කොල්ලෝ නුඹ ජීවත් වෙනවාද? නුඹ මා සතුටු කරන්නේ කොහොමද? නුඹ හැබෑටම ලෙඩවීමට සිතුවාද? මම එයට එකඟ නැහැ. මගෙන් නිදසුන් ගනින් මටත් දොස්තරවරුන් කීවා විශ්‍රාම ගන්ටයි කියලා. මම ඒකට එකඟ නොවී දිගටම වැඩ කරනවා." ලෙඩ්නියෝව් සතුටු සිතින් සිනා විය.

එහෙත්, ඔහුගේ ඒ සිනාවට යටින් සැඟවුණු අනුකම්පාවක් සහ බලාපොරොත්තු කඩ වූ බවක්ද පෙනෙන්නට තිබිණි.

ඔවුහු දෙපැයක්ම සතුටු සාමීචියෙහි යෙදුණහ. ලෙඩ්නියෝව් මොස්කව් නගරයේ තොරතුරු කීවේය. පක්ෂය විසින් ගන්නා ලද වැදගත් තීරණ වන කෘෂිකාර්මික සමූහ ගොවිපළවල් ඇති කිරීම, ගම් වෙනස් කිරීම ගැන පාවෙල් ඔහුගෙන් පළමුවැනි වරට දැනගත්තේය. ඔහු මහත් ගිජු ලෙස ලෙඩ්නියෝව්ගේ විස්තරයට සවන් දුන්නේය.

"පාවෙල්, නුඹ කොහේ හරි උක්රයිනයේ වැඩ කරනවා කියලයි මා හිතුවේ. බලනකොට රෝගය උග්‍ර වෙලා. ඒකට කමක් නැහැ. මගේ තත්ත්වය වඩාත් නරක අතට හැරී තිබුණා. මා නැඟිටින්නේ නැතිව ඇඳටම සීමා වෙලා හිටියා. දැන් පේනවා නේද මම සතුටින් ඇවිදිනවා. මේ වගේ වේලාවක අයිනක් අල්ලාගෙන ඉන්ට කොහොමටවත් බැහැ. ඒක සැබෑ පිළියම නොවේ! සමහර වේලාවට මම කල්පනා කරනවා, පොඩ්ඩක් විවේක ගන්න ඕන කියලා. හති අරින්ට ඕන කියලා. මම තරුණයෙක් නොවෙයි. එක හුස්මට පැය, දහයක්, දොළහක් වැඩ කළාම සමහර දවස්වලට ලොකු මහන්සියක් දැනෙනවා. ඉතින් මම වැඩ ටිකක් අඩු කිරීමට උත්සාහ ගන්නවා. කොහෙද, කොහොමටවත් හරියන්නෙ නැහැ. වේගය වැඩි කරලා ඉක්මනින් වැඩ කරලා නිදහස් වෙන්ට ඕන කියලා හිතාගෙන වැඩ කළාම දන්නෙම නැතුව

රෑ දෙළහ වෙනවා ගෙදර යනකොට. යන්ත්‍රය වේගයෙන් වැඩ කරන විට ඒ යන්ත්‍රයේ රෝදත් වේගයෙන් කරකැවෙනවා. ඉතින් හැමදම ඔය වේගය වැඩිවෙනවා. මහලු අපට සිද්ධ වෙනවා තරුණ කාලෙදි වගේ වැඩ කරන්ට."

ලෙඩ්නියෝව් තම පුළුල් නළල අත ගාමින් පියකු සේ උණුසුම් ලෙස මෙසේ පැවසීයඃ

"දැන් ඉතින් නුඹේ වැඩ කටයුතු ගැන කියාපන්."

පාවෙල් තම ජීවන පුවත් ගැන ඔහුට විස්තර කරන්නේ, ඔහුගේ අනුග්‍රහය සහිත සැලකිලිමත් බැල්ම දුටුවේය.

★

විශාල තුරු සෙවණ ඇති බිම් කණ්ඩියක විවේක ගන්නෝ කීපදෙනෙක් වාඩි වී සිටිති. හ්රිසාන්ප් චෙර්නකෝසොව් කුඩා මේසයක් අසල වාඩි වී බැම සගළ හකුළුවාගෙන 'ප්‍රව්ද' පුවත්පත කියවීය. ඔහු ඇඳ සිටි කළු පැහැති රුසියානු කමිසයද, පරණ කැප් තොප්පියද, හිරුරැස්වලට පිලිස්සුණු, කෙට්ටු, වළ ගැසුණු, රැවුළු නොකැපූ මුහුණද ඔහු ආකර කම්කරුවකු බව කියාපායි. ප්‍රදේශයේ ප්‍රධාන තැනක් ගැනීම සඳහා ඔහු තම වෘත්තියෙන් අස් වූයේ මීට දෙළොස් වසරකට පෙර වුවද, ඔහු තවම ආකරයක වැඩ කරන කම්කරුවකු මෙනි. ඔහුගේ හැසිරීමද, කතා විලාසයද බස් වහරද ඒ බව පෙන්වයි.

චෙර්නකෝසොව් ප්‍රාදේශීය කොමියුනිස්ට් පක්ෂ බියුරෝවේ සහ ප්‍රාදේශීය ආණ්ඩුවේ සාමාජිකයෙකි. කෝප්ප රෝගයෙන් පෙළෙන ඔහුගේ ශක්තිය වැහැරෙන්නට විය. කෝප්ප රෝගයට භාජන වී ඇති තම කකුලට ඔහු වෛර කළේ, එය නිසා ඔහුට හමසක් පමණ කාලයක් ඇඳට සීමාවී සිටීමට සිදුවූ බැවිනි.

ඔහු ඉදිරිපිට වාඩි වී කල්පනාකාරීව දුම් වැටියක් උරමින් සිටියේ ඇලෙක්සාන්ද්‍රා ඇලෙක්සෙයෙව්නා ෂිගරෝවාය. ඇගේ වයස අවුරුදු තිස් හතක් වුවද, ඇය පක්ෂයට බැඳුණේ මීට අවුරුදු දහ නවයකට පෙරදීය. පීටර්ස්බර්ග් නගරයේ නීති විරෝධී ලෙස සැඟවී දේශපාලන කටයුතු කළ සගයන් ඇය හැඳින්වූයේ 'ලෝහ කම්කරු ෂුරොච්කා' නමිනි. ළාබාල වයසේදීම ඇය සයිබීරියාවට පිටුවහල් කළේය.

මේසය අසල වාඩි වී සිටි තෙවැන්නා පන්කෝව්ය. ග්‍රීක ප්‍රතිමාවක හැඩයක් ඇති තම ලස්සන මුහුණ ඉදිරියට

නැඹුරු කරගෙන පන්කෝව් ජර්මන් සඟරාවක් කියවමින් සිටියේය. ඔහු ඉඳ හිට අතක් ඔසවා තම නාසය මත ඇති විශාල උපැස් යුගල හරි ගැස්සීය. මල්ලව ක්‍රීඩකයකුට සමාන තිස් හැවිරිදි මේ මිනිසා අංශභාග රෝගයට ගොදුරු වී ඇති තම කකුල අද්දවමින් යන හැටි දකින කෙනෙකු තුළ අනුකම්පාවක් හට ගනී. පොත් කතුවරයකු හා ලේඛකයෙකු වූ මිහයිල් වසීලවිච් පන්කෝව් යුරෝපය ගැන ඉතා හොඳින් දැන සිටියේය. විදේශීය භාෂා කීපයකින්ම ඔහු කතා කළේය. ඔහු සේවය කරන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේය. දැඩි ගති ඇති වේර්නකෝසොව් පවා ඇසූපිරූ තැන් ඇත්තකු වන පන්කෝව් වෙත ගරු සැලකිලි දැක්වීය.

"මේ ඔබ සමඟ කාමරේ එකට ඉන්න එක්කෙනාද?" ෂිගරෝවා වේර්නකෝසොව්ගෙන් සෙමින් අසන්නී, පාවෙල් වාඩි වී සිටි රෝද සහිත පුටුව දෙස බලා හිස වැනුවාය. පුවත්පත දෙසට නෙත් යොමා සිටි වේර්නකෝසොව් හැරී බලත්ම ඔහුගේ මුහුණෙහි පසන් ගතියක් ඇති විය.

"ඔව්. ඒ තමා පාවෙල් කොර්චාගින්. ෂූරා ඔබ එයාව හඳුනාගන්න ඕන. ඔහුගේ බරපතළ රෝගය නිසා විශාල බාධා ඇති වෙලා. නැති නම් අපට අමාරු තැන්වලදි ඔහුගෙන් විශාල සේවයක් ගන්ට තිබුණා. ඔහු කොම්සොමොල්වල පළමුවැනි පරපුරට අයිතියි. මට විශ්වාසයි අපි ඒ තරුණයාට ආධාර කළොත්, මම එසේ කිරීමට තීරණය කළා, ඔහුට වැඩ කිරීමට හැකි වේවි."

පන්කෝව් ඔහුගේ කතාවට සවන් දුන්නේය.

"ඔහුගේ රෝගය කුමක්ද?" ෂූරා ෂිගරෝවා යළිත් සෙමින් විචාළාය.

"එක්දස් නවසිය විස්සේ සිවිල් යුද්ධයේ නටබුන්. පිටකොන්දේ රෝගයක්. මම මෙහි ඉන්න දොස්තරවරුන් සමඟ කතා කළා. ඒගොල්ල කියනවා ඔහුගේ අත පය සම්පූර්ණයෙන්ම පණ නැතිව යාවියි කියලා. අනේ පව්, යස කොල්ලා!"

"මම ඔහුව මෙහාට ගෙනෙන්නම්." ෂූරා කීවාය.

ඔවුන් හැඳිනගත්තේ ඒ ආකාරයෙනි. අසාධ්‍ය ලෙස රෝග යෙන් පෙළෙන අවුරුදුවලදී මේ දෙදෙනා තමාගේ ප්‍රධාන ආධාරකරුවන් වන බව එදා පාවෙල් නොදැන සිටියේය.

★

ජීවිතය පෙර සේම ගෙවිණි. තායා රැකියාවකට ගියාය. පාවෙල් ඉගෙන ගත්තේය. ඔහු අධ්‍යාපන කවයේ වැඩ පටන් ගැනීමට පෙර බලාපොරොත්තු රහිත විපතකට ගොදුරු විය. ඔහුගේ දෙපා පණ නැතිව ගියේය. දැන් ඔහුට කීකරු වන්නේ දකුණු අත පමණකි. දෙපා සෙලවීම සඳහා ඉමහත් වෑයමක් දරා අපොහොසත් වූ විට, මින් පසු තමාට ඇවිදීමට බැරිවන බව වටහා ගත්තෙන් පාවෙල් ලේ ගලන තුරු දෙතොල් සපාගත්තේය. තම සැමියාට උදව් කිරීමට බැරි නිසා මහත් දුකට පත් තායා තම හැඟීම් වසන් කර ගත්තාය. පාවෙල් වරදක් කළ එකකු සේ මඳ සිනා පාමින් කතා කළේය:

"තයූෂා දැන් ඉතින් අප දෙදෙනා වෙන්විය යුතුයි. අපේ ගිවිසුමේ එහෙම වගන්තියක් නැහැ නොව. ආදරණීය කෙල්ලේ මම ඒ ගැන ඉතා හොඳින් කල්පනා කර බලන්නම්."

ඈ ඔහුට ඒ ගැන කතා කිරීමටවත් ඉඩක් නොදුන්නාය. ඈ සුසුම්ලමින් හඬමින් ඔහුගේ හිස තම පපුවට තද කරගෙන වැලපෙන්නට වූවාය.

අර්ට්යොම් සිය බාල සොහොයුරාගේ විපත ගැන දැනගෙන, හැම වැඩක්ම අතහැර දමා තම මව වන මාරියා යාකොව්ලෙව්නාට එහි යන ලෙස දන්වා සිටියේය. පාවෙල්ගේ අම්මා සහ තායා මිතුරියන් සේ ජීවත් වූහ.

පාවෙල් ඉගෙනීමේ කටයුතු දිගටම කරගෙන ගියේය.

ශීත සමයේ දැඩි කුණාටු සහිත දවසක තායා තම පළමුවැනි ජයග්‍රහණයේ තිළිණය ගෙදර ගෙනාවාය. එය නාගරික සෝවියට් සභාවේ නාගරික මන්ත්‍රිනි ධුරයට පත්වීම පිළිබඳ සහතිකයයි. ඉන් පසුව පාවෙල් ඇය දුටුවේ ඉඳ හිටලාය. දිවා කාලයේදී සෞඛ්‍යාගාරයේ කුස්සියේ පිඟන් සෝදන තායා හවසට නාගරික මන්ත්‍රීවරියක ලෙස සෝවියට් සභාවේ කාන්තා අංශයේ වැඩ කරයි. සමාජ වැඩවලින් පසුව ඇය ගෙදර එන්නේ විඩාපත් වී නමුදු, ප්‍රබල හැඟීම්වලිනි. කොමියුනිස්ට් පක්ෂයේ අපේක්ෂක සාමාජික ධුරයක් ඇයට පිරිනැමීමේ දිනය ළංවිය. ඈ ඒ සඳහා විශාල කැලඹීමකින් යුතුව සූදනම් වූවාය. මේ අතර, පාවෙල් තවත් විපතකට මූණ පෑවේය. පැතිර යන රෝගය තව තවත් උග්‍ර විය. පාවෙල්ගේ දකුණු ඇස තුළ ඇවිළෙන ගින්නකට සමාන වූ දැවිල්ලක්

හා වේදනාවක් හට ගැනිණි. ඉක්මනින්ම ඔහුගේ වම් ඇසද එම වේදනාවට ගොදුරු විය. ඔහුගේ දෙනෙත් ඉදිරියේ කළු පැහැති තිරයක් ඇති වූවාක් මෙන් විය. දෙනෙත් අඳවීමේ බියජනක ඉරණම කුමක්දැයි පාවෙල්ට තම ජීවිතයේ පළමුවැනි වරට වැටහිණි.

ඔහුගේ ඉදිරි ගමනට බාධා කරමින් නිහඬව රෝගය නමැති රකුසා යළිත් වරක් නැගී සිටියේය. මෙය බියජනක එමෙන්ම නොබිඳලිය හැකි බාධාවකි. තායා සහ පාවෙල්ගේ මව මින් බලාපොරොත්තු රහිත තත්ත්වයකට ඇද වැටුණහ. එහෙත්, පාවෙල් නිර්මදතාවකින් හා දැඩි ශාන්ත බවකින් යුතුව තීරණය කළේය:

"මොනවා වෙන්නේ දැයි නැවත බලා සිටිය යුතුය. නැවත සටන් පෙරමුණ ගැනීම සඳහා මා කළ හැම දෙයක්ම නිෂ්ඵල වී නම්, පැරැණි තත්ත්වයට පැමිණීමට මගේ දෙනෙත් අඳ බව මට සදහටම බාධා කර ඇති නම්, මගේ ජීවිතය අවසන් කර දැමිය යුතුය."

පාවෙල් කොර්චාගින් තම මිතුරන්ට ලියුම් යැවීය. දැඩි ලෙස නැගී සිට දිගටම සටන් කළ යුතු යැයි මිතුරෝ ඉල්ලා සිටියහ.

ඔහු ඉතා අමාරු තත්ත්වයකට වැටී දුක් විඳිමින් සිටි ඒ දවස්වලදී තායා කැලඹීමෙන් හා ප්‍රීතියෙන් යුතුව මෙසේ තෙපලාය:

"පව්ලූෂා මම පක්ෂයේ අපේක්ෂක සාමාජිකාවක්."

පක්ෂ ශාඛාව අලුත් සගයකු පිළිගත් හැටි විස්තර කළ තායාගේ කතාවට සවන් දුන් පාවෙල් පක්ෂයේ සාමාජිකයකු වීමට තමා ගත් මුල් පියවර ගැන සිහි කරන්නට විය.

"ඉතින් තායා කොර්චාගිනා සහෝදරිය අපි ඔබ සමඟ පක්ෂ ශාඛාවක කොටසක් වන්නෙමු"යි පාවෙල් තම බිරිඳගේ අත මිරිකමින් පැවසුවේය.

ඊට පසු දිනෙක පාවෙල් ප්‍රාදේශීය ලේකම් තැනට ලිපියක් ලියමින්, තම ගෙදරට පැමිණෙන ලෙස ඉල්ලීමක් කළේය. හවස් වන විට පාවෙල්ගේ නිවෙස අසල මඩ සහිත මෝටර් රියක් නැවැත්වීය. ඉන් පිටතට පැමිණි මැදි වියේ පසුවූ වොල්මර්, පාවෙල්ගේ අතක් ගෙන සුහද ලෙස සෙලවීය. ලැට්වියානු ජාතිකයෙකු වූ වොල්මර්ගේ යටි රැවුළ දෙකන් දක්වා වැවී තිබිණි.

"ඉතින් කොහොමද සුවදුක්? මොකද මේ හැසිරීමේ

තේරුම? නැඟිටපන් පාවෙල්, අපි නුඹව ගමකට යවනවා වැඩක් බාර දීලා.” වොල්මර් සිනාපාමින් පැවසීය.

හවස තමාට රුස්වීමක් පවා තිබෙන බව අමතක කරමින් ප්‍රාදේශීය ලේකම්වර වොල්මර් දෙපැයක්ම කොර්චාගින් සමග කතා කරමින් සිටියේය. ඔහු කාමරයේ ඔබ මොබ ඇවිදිමින් පාවෙල්ගේ විරාගික කතාවට සවන් දෙමින් සිට මෙසේ පැවසීය:

“දේශපාලන අධ්‍යාපන කටයුතු කිරීම දැනට නවත්වමු. නුඹ විවේක ගනින්. නුඹේ පෙනීම ලබා දීමට මහන්සි ගන්න ඕන. සමහර විට තවමත් යමක් කරන්ට පුළුවන් වේවි. නුඹට මොස්කව් ගියාම නරකද? නුඹ කල්පනා කරපන්...”

කොර්චාගින් ඔහුට බාධා කරමින් කතා කළේය:

“මට මිනිසුන් ඕන, වොල්මර් සහෝදරයා. පණැති මිනිසුන්. තනිවී මට ජීවත් වීමට බැහැ. වෙන කවරදටත් වඩා මට මිනිසුන් ඕන. ප්‍රයෝජනවත් තරුණයන් ඕන. ඔවුන් ගම්වල කොමියුන්වලට යැවීමට පටන් අරගෙන. ඔවුන්ට සමූහ ගොවිපළවල ඉඩ මදි. කොම්සොමොල් සංවිධානය මේ තරුණයන් ගැන සලකා නොබැලුවොත් ඔවුන් ඕනවට වඩා ඉදිරියෙන් යන්ට පටන් ගනීවි. මම දන්නවා, මමත් ඒ වගේම හිටියා.”

වොල්මර් නැවතුණේය.

“නුඹ ඒ පුවත ගැන දැනගත්තෙ කොහොමද? ප්‍රාදේශීය කාර්යාලයේ සිට එම පුවත අපට ලැබුණේ අදයි නොව.”

කොර්චාගින් මඳ සිනා පෑවේය.

“මගේ බිරිඳ ගැන දන්නවද? ඊයේ ඇයට පක්ෂයේ සාමාජිකත්වය ලැබුණා. ඈ මට කීවා.”

“ආ කොර්චාගිනා. පිගන් සෝදන්නිය නොවේද? ඈ නුඹේ බිරිඳ? හා, හා මම දැන හිටියේ නැහැ.” ටික වේලාවක් කල්පනා කොට ඔහුට යස අදහසක් පහළ වූ කලෙක මෙන් ඔහු නළලට ගසා ගත්තේය. “අපි නුඹ වෙත ලෙව් බේර්සේනෙව් සහෝදරයාව එවන්නෙමු. මීට වඩා හොඳ සහෝදරයකු හොයා ගන්නවත් බැහැ. ගති පැවතුම් අනුවත් ඔහු නුඹට කැපෙනවා. අධිවෝල්ටේජ් ට්‍රාන්ස්පෝමර් යන්ත්‍ර දෙකකට නුඹලා දෙදෙනා සමානයි. නුඹ දන්නවද මම එක් කලෙක විදුලි වැඩ කාර්මිකයකු හැටියට සේවය කළා. ඒ නිසා තමා ඔය වෝල්ටේජ් වගේ වචන නිතර මතක් වෙන්නෙ. ලෙව් නුඹට රේඩියෝ යන්ත්‍රයක් හදලා දේවි. මිනිහා

රේඩියෝ ශිල්පය ගැන මහාචාර්යවරයෙක්. නුඹ දන්නවද මම ලෙව්ලාගේ ගෙදර සමහර දවස්වලට රෑ දෙක වනතුරු කන් පෙති දමාගෙන රේඩියෝ ප්‍රචාරයට සවන් දෙනවා. මගේ පවුල දැන් මාව සැක කරන්ට පටන් අරගෙනඃ ඈ මගෙන් අහනවා, ඈ බොල නාකියෝ නුඹ මහ රෑ කොහෙද ඇවිදින්නෙ? කියලා."

කොර්චාගින් මඳ සිනා පාමින් ප්‍රශ්න කළේයඃ

"ඔය බෙර්සේනෙව් කවුද?"

කාමරය තුළ සක්මන් කළ වොල්මර් විඩාපත් වූයෙන් ඔහු පුටුවෙක වාඩි වී විස්තර කළේය.

"බෙර්සේනෙව් තමා අපේ නොතාරිස්වරයා. ඔහුගේ නොතාරිස්කම හරියට මගේ මුද්‍රා නැටුමට සමානයි. මෑතක් වන තුරු ලෙව් උසස් තනතුරක් ඉසිලුවා. 1912 ඉඳලා ඔහු විප්ලවවාදී ව්‍යාපාරයේ වැඩ කරනවා. 1917 ඔක්තෝබර් මාසයේදී පක්ෂයට බැඳුණා. රටවැසි යුද්ධ කාලයෙදි ඔහු දෙවැනි අසරු හමුදාවේ සෙනවි මණ්ඩලයේ වැඩ කළා. ඊට පස්සෙ යුද්ධාධිකරණයේ වැඩ කළා. කොකේසියාවේ ප්‍රතිවිප්ලවවාදීන්ට විරුද්ධව යුද්ධ හමුදාව සටන් කළේ ඒ කාලෙදි. සාරිට්සින්වල සටන් කළා. දකුණු පෙදෙසෙයි, ඈත පෙරදිගයි සටන් කළා. ඊට පස්සේ ඈත පෙරදිග සමූහාණ්ඩුවේ යුද්ධ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු පදවියකට පත් වුණා. ඒ කාලෙදි මිනිහා බොහොම වැඩ කළා. පසු ව ඔහුට ක්ෂයරෝගය වැලඳුණා. ඈත පෙරදිග අත හැරලා ලෙව් බෙර්සේනෙව් කොකේසියාවට ආවා. මුල දී ඔහු ගුබේර්නියාවේ අධිකරණයක සභාපති හැටියටත්, ප්‍රාදේශීය අධිකරණයේ උපසභාපති හැටියටත් නඩු ඇහුවා. ක්ෂයරෝගය හන්ද ඔහුට වැඩ කිරීම නැවැත්වීමට සිදු වුණා. ඔහුගේ පෙණහලු බොහොම නරක් වුණා. මිය යාම නමැති තර්ජනය ඉදිරියේ ඔහුට මෙහි පැමිණීමට සිදු වුණා. ඔන්න ඉතින් ඔහොමයි අපට අපූරු නොතාරිස් කෙනෙකු ලැබුණේ. මේ රස්සාව බොහොම සන්සුන්. ඔහුටම හරියනවා. ඉතින් හෙමිහිට ඔහුට පක්ෂ ශාඛාවක් භාර කළා. ඊට පස්සේ ඔහුව ප්‍රාදේශීය පක්ෂ කමිටුවට ඇතුළු කර ගත්තා. දේශපාලන පාසලක් භාර දුන්නා. දැන් ඔහුට පාලක කොමිෂන් සභාවේ වැඩ පවරා තියෙනවා. අමාරු ප්‍රශ්න විසඳීම සඳහා ඔහුව හැම වැදගත් කොමිසන් මණ්ඩලයකටම තෝරා පත් කර තිබෙනවා. මේ වැඩ කරන අතර ඔහු දඩයම් කරන්ට යනවා. රේඩියෝ

වැඩවලට මිනිහා හැබෑ හපනා. දැන් ඔහුට තියෙන්නෙ එක පෙණහල්ලයි. නමුත්, දැන් ලෙව් බෙර්සේනෙව් දිහා බලන කොට රෝගියකු කියලා හිතන්නටවත් බැහැ. ඔහු උද්යෝග යෙන් පිරිලා. ඔහු කවදහරි මියයන්නේ අධිකරණයයි පක්ෂ දිස්ත්‍රික්ක කමිටුවයි අතුරතුර ඇති මඟකදී."

පාවෙල් ඔහුට බාධා කරමින් ප්‍රශ්න කළේය:

"ඇයි ඔහුට එතරම් විශාල වැඩ ගොඩක් භාර දෙන්නේ? ඔහු දැන් ඉස්සරට වඩා වැඩ කරනවා නොවැ."

වෝල්මර් පාවෙල් දෙස දෙනෙත් හකුළුවාගෙන බැලීය:

"දැන් මම නුඹට පක්ෂ අධ්‍යාපන කවයක් භාර දුන්නොත් ලෙව් අහවි ඇයි පාවෙල්ට වැඩ ගොඩක් භාර දුන්නේ? කියලා. නමුත්, මිනිහාම මෙහෙම කියනවා: "අවුරුදු පහක් ලෙඩ වෙලා ඉන්නවට වැඩිය හොඳයි එක අවුරුද්දක් වැඩ ගොඩක් කිරීම." මිනිසුන්ව ආරක්ෂා කරගන්ට පුළුවන් සම්පූර්ණ සමාජවාදය ගොඩ නැගුවාට පසුව."

"ඒ කතාව ඇත්තයි. මාත් සූදනම් අවුරුදු පහක් ලෙඩ වෙලා ඉන්නවාට වඩා එක අවුරුද්දක් තුළදී වැඩ ගොඩක් කිරීමට. නමුත්, සමහර විට අපි අපේ ශක්තිය අපරාධකාරී ලෙස විනාශ කරනවා. මෙය වීරත්වයකට වඩා අදක්ෂතාව හා වගකීම් විරහිත බවක් හැටියට දැන් නම් පිළිගැනීමට මම සූදනම්. මෝඩයකු ලෙස මගේ සෞඛ්‍යය ගැන නොසැලකිලිමත්වීමට මට අයිතියක් නැති බව දැන් මම පිළිගන්නවා. මෙ වැනි ආකල්පයක වීරත්වයක් ඇත්තේම නැහැ. සමහර විට මට තව අවුරුදු කීපයක් වැඩ කිරීමට ඉඩක් තිබුණා, මම දැඩි ලෙස මගේ සෞඛ්‍යයට හානිවන ලෙස ක්‍රියා නොකළේ නම්. එකම වචනයකින් කියනවා නම් වාමාංශික අතිධාවනකාරී පක්ෂඝාත රෝගයක් තමා එයත්. මගේ ජීවිතයට හානි කළ ප්‍රධාන අනතුරක් තමා එය."

"මොහු දැන් මෙහෙම කියනවා. එහෙත්, ආයෙමත් සුවය ලැබී නැඟී සිටියොත්, ඔහු ඉස්සර වගේම වැඩ කරාවි." වොල්මර් එසේ සිතුවද, මුවින් නොබැණ සිටියේය.

දෙවැනි දවසේදී, හවස ලෙව්, පාවෙල් බැලීමට ආවේය. ඔහු එදින ආපසු ගෙදර ගියේ රෑ දෙළහත් පසු වූ විටය. ලෙව් බෙර්සේනෙව්, පාවෙල් කොර්චාගින්ගේ නිවසින් පිටවූයේ අවුරුදු කීපයක් තිස්සේ නැති වූ තම බාල සොහොයුරා හමුවූ විටෙක මෙනි.

පසුදා උදෑසන කාර්මික ශිල්පීහු පැමිණ පාවෙල්ගේ

නිවසේ වහල මත ගුවන්විදුලි ඒරියල් කම්බියක් සවි කළහ. ලෙව් නිවෙස තුළ ගුවන්විදුලි යන්ත්‍රයක් සාදමින් තම අතීතය පිළිබඳ රසවත් කතා කියන්නට විය. පාවෙල් ඔහු නොදිටීය. එහෙත්, තායාගේ විස්තර අනුව ලෙව් බෙර්සේනෙව් උසැති, රන් පැහැති හිසකේ සහ නිල් පැහැති ඇස් ඇති කඩිසර සිහින් පුරුෂයෙකි. පාවෙල් ඔහු හමු වූ පළමුවැනි මොහොතේදීම ඔහු එවැනි කෙනෙකු විය යුතු බව මනැසින් තීරණය කළේය.

හවස්වත්ම වැල්වි තුනක් සවි කළේය. ලෙව් උත්සවාකාරයෙන් පාවෙල්ට ගුවන්විදුලි යන්ත්‍රයේ ශ්‍රවණ පෙති භාර දුන්නේය. ගුවන්විදුලිය විවිධ හඬ නැඟීය. වරායේ ගුවන්විදුලි යන්ත්‍රවල හඬ කුරුල්ලන්ගේ ‘කිචි බිචි’ නාදයට සමාන විය. කොහේ දෝ (සාගරයේ විය යුතුය) නැවකින් මෝස් සංඥා ක්‍රමය අනුව “හඬ” පිට විය. එහෙත්, මේ සියලු හඬ නැඟීම් අතුරින් සන්සුන් විශ්වාසදයක හඬක් ඇසීමට පුළුවන් වන සේ යතුරු ඇණයක් කරකැවීය.

“මේ මොස්කව් ගුවන්විදුලියයි, සවන් දෙන්න, සවන් දෙන්න...”

මේ කුඩා ගුවන්විදුලි යන්ත්‍රයෙන් ලෝකයේ රටවල් හැටක ප්‍රචාරක ස්ථානවලට සවන් දිය හැකි විය. පාවෙල්ගෙන් වෙන්වුණු බාහිර ලෝකය ශ්‍රවණ පෙතිවල ආධාරයෙන් යළි ඔහුට ළංවිය. ඔහුට එම ලෝකයේ ක්‍රියාකාරී බලය දැනිණි.

අඳ වුවද, ඔහුගේ දෙනෙත් දිලිසෙන සැටි දුටු ලෙව් බෙර්සේනෙව් විඩාපත් වී සිටියද මඳ සිනා පෑවේ ය.

★

මහ ගෙදර හැම දෙනෙක්ම නිඳන්ට වූහ. නින්දෙන් නොසන්සුන් වන තායා යමක් දෙඩවයි. ඇය ගෙදර එන්නේ රෑ බෝවී, විඩාපත් වී සහ හීතලේ වෙවුලමිනි. පාවෙල්ට ඇගේ හඬ ඇසෙන්නේ නිතර නොවේ. ඇය සමාජමය වැඩවලට වඩාත් ගැඹුරු ලෙස කා වදිත්ම, ඇයට ඇති විවේක කාලයද කෙටිවෙයි. බෙර්සේනෙව්ගේ වචන පාවෙල්ට මතක් විය:

“බොල්ෂෙවික්වාදියකුගේ බිරිඳ පක්ෂයේ සාමාජිකාවක් නම්, ඔවුනොවුන් හමුවන්නේ කලාතුරකිනි. මෙයින් වාසි දෙකක් ඇතිවෙයි. එකක් නම් ඔවුනොවුන් එකිනෙකාට තිත්ත නොවීමය. අනික නම් අඬ දබරවලට කාලයක් නොතිබීමය!”

ඔහුට විරුද්ධ විය හැක්කේ කෙසේද? මෙය පාවෙල්

බලාපොරොත්තු විය යුත්තකි. තායා තමා සතු හැම සැන්දෑවක්ම පාවෙල්ට කැප කළ දවස්ද තිබිණි. ඒ දවස්වල වඩාත් වැඩි උණුසුම් බවක් හා මුදු බවක් ඇතිවිය. එහෙත් එවකට තායා පාවෙල්ගේ මිතුරිය හා බිරිඳ පමණක් වූවාය. එහෙත්, ඈ දැන් ඔහුගේ සිසුවිය හා පක්ෂයේ සහෝදර සාමාජිකාවකි.

තායා දේශපාලන හා සමාජමය කටයුතුවල යෙදෙමින් වැඩෙන්නේ කොතරම්ද, එතරම් දුරට ඇය ඔහු වෙනුවෙන් මිඩංගු කරන කාලය ද අඩුවන්ණේය. මෙය වටහා ගත් ඔහු එම තත්ත්වය යථාර්ථයක් ලෙස පිළිගත්තේය.

දේශපාලන අධ්‍යාපන කවයක් මෙහෙයැවීමට පාවෙල්ට ඉඩ ලැබිණි.

නැවත ඔහුගේ නිවසෙහි හවස් කාලයේදී කෑ කෝ ගැසීම් ඇසෙන්නට විය. තරුණයන් සමඟ ගත කරන පැය කීපය තුළදී පාවෙල්ට අමුතු දිරියක් හා පණක් ලැබේ.

අනික් වේලාවලදී පාවෙල් නිතර ශ්‍රවණ පෙති දමාගෙන ගුවන් විදුලියට සවන් දෙයි. අම්මා ඔහුට ආහාර කැවීමට සැරසී, ශ්‍රවණ පෙති උදුරාගන්නේ අමාරුවෙනි.

දෙනෙත් අඳ බව විසින් සොරාගනු ලැබූ හැම දෙයක්ම ඔහුට ගුවන්විදුලිය මඟින් ලැබිණි. ඉගෙනීමට අවස්ථාවක්ද ලබා දුන්නේය. ඉගෙනීමට ඇති මේ අසීමිත ආසාව නිසා ඔහුගේ සිරුරෙහි උපන් දැඩි වේදනාවද, දෙනෙත්වල හටගත් ගිනි මෙන් තියුණු දැවිල්ලද, ඔහුට ගෙනදුන් ඉමක් නැති දුක් කරදරද අමතක විය.

පාවෙල්ගේ තරුණ පරපුරට පසු කොම්සොමොල් තරුණ පරපුර විදහා පෙන්වන වීරත්වය හා දස්කම් පිළිබඳ පුවත් හා මැග්නීටෝගෝර්ස්ක්හි ඉදිකිරීම් ගැන, ගුවන්විදුලිය මගින් අසා දැනගත් පාවෙල් මහත්සේ සතුටු විය.

හිම කුණාටුද, සයිබීරියාවේ ඉවසිය නොහැකි දැඩි ශීතලද බඩගිනි වෘකයන් රැළකට සමාන කරන ජවනිකා ඔහුගේ සිතෙහි ඇතිවිය. හූ හඬ නඟමින් පැතිර යන හිම කුණාටුව ඔහුට ඇසෙයි. විශාල විදුලි පහන්වල ආධාරය ඇතිව හිම කුණාටුවලට මුහුණ දෙමින්, හිම කුණාටුවේ හා අයිස් කැටවල ප්‍රහාරයෙන් යෝධමය මහලේ පළමුවැනි කොටස් බේරාගනු වස් කොම්සොමොල් තරුණ සංවිධානයේ දෙවැනි පරපුර සටන් කරන සැටි ඔහුගේ මනැසෙහි දිස්විය. මෙය සමඟ සසඳා බලන විට, කීයෙව් කොම්සොමොල් තරුණයෝ එද

නගරයට දැව දඬු ලබාගනු වස් කළ සටන කොපමණ කුඩාද! රට වැඩි දියුණු වී ඇත. ඒ සමඟම ජනතාවද දියුණු වී සිටිති.

ද්නීපර් නදියේදී වානේමය බැම්ම බිඳ ගලා ආ ජලය මිනිසුන් හා යන්ත්‍ර සූත්‍ර යට කළේය. නැවත වරක් කොම්සොමොල් තරුණයෝ ජල ප්‍රවාහයට එදිරිව සටනට වන්හ. දෙදිනක මාරාන්තික සටනකින් පසුව නදී ජලය මෙල්ල කළහ. මේ මහ සටනේදී අලුත් කොම්සොමොල් පරපුරක් බිහිවිය. සටනට සහභාගි වූ වීරයන් අතර තම පැරැණි සගයකු වූ ඉග්නාත් පන්ක්‍රාතොව්ගේ නම ඇසූ පාවෙල් ඉමහත් ලෙස ප්‍රීතියට පත් විය.

IX

මොස්කව් නගරයට පැමිණි ඔවුහු (කොර්චාගින්, තායා සහ කොර්චාගින්ගේ අම්මා) ඔහුගේ මිතුරකු වන ලේඛනාගාරයක් භාරව සිටියකුගේ පාලනය යටතේ තිබුණු ගබඩාවක නවාතැන් ගත්හ. පාවෙල්ගේ මිතුරා ඔහු විශේෂ චිකිත්සාගාරයකට ඇතුළු කිරීමට උදව් කළේය.

තරුණ බව හා ශක්තිමත් සිරුරක් තියෙන විට, විඳදරා ගැනීම කොතරම් ලෙහෙසිද යන්න පාවෙල්ට හරිහැටි වැටහුණේ දැන්ය. එහෙත්, දැන් ජීවිතය අයෝමය දඬු අඬුවකට හසුවී තිබෙන විට විඳ දරා ගැනීම ගරුත්වය රකින කාර්යයක් විය.

★

ලේඛනාගාර ගබඩාවේ නවාතැන් ගත් දවසේ සිට මොස්කව් පැමිණ දහඅට මසක් ගෙවිණි. එය කොර්චාගින්ට විස්තර කළ නොහැකි වේදනා ඇති කළ කාලයක් විය.

පාවෙල්ට නැවත ඇස් පෙනීම ලබාදිය නොහැකි බව ඇස් රෝග පිළිබඳ චිකිත්සාගාරයේදී මහාචාර්ය අවෙර්බාහ් ඔහුට කීවේය. අනාගතයේදී ස්නායු දහය අඩු වූ විට ඇස්වල කනිනිකාවේ සැත්කම් කරනු ඇත. ස්නායු දහය අඩු කිරීම් වස් සැත්කම් කීපයක් කිරීමට යෝජනා කළේය.

ඔහුගේ කැමැත්ත විමසූ විට, දෙස්තරවරුන් අවශ්‍ය යැයි සිතන හැම දෙයක්ම කිරීමට පාවෙල් ඔවුන්ට අවසර දුන්නේය.

පැරාතයිරොයිඩ් ග්‍රන්ථිය ඉවත්කරලීම සඳහා ඔහුගේ උගුර

කපා කළ සැත්කමේදී ඔහුට පැය කීපයක්ම සැත්කම් මේසය උඩ වැතිර සිටීමට සිදුවිය. තෙවරක්ම ඔහු මරණයේ ගැට්ට අසලටම පැමිණියේය. එහෙත්, පාවෙල් මරණයට එදිරිව සටන් කොට ජය ගත්තේය. ඔහු සැත්කම් කාමරයෙන් එළියට ගෙනෙන තුරු නොඉවසිල්ලෙන් බලා සිටි තායාට මළ මිනියක් සේ සුදුමැලි නමුදු පණැති පාවෙල් හැමදා මෙන්ම, එදත් ශාන්තව හා සුරතල්ව මුහුණ දුන්නේය.

"පුංචි කෙල්ලේ, ඔයා බයවෙන්ට එපා. මාව මරා දැමීම එතරම් ලෙහෙසි නැහැ. උගත් දෙස්තරවරුන්ගේ අනාවැකි සියල්ල බොරු කරමින් මම ජීවත් වෙනවා. මගේ රෝගය පිළිබඳ නිගමන අනුව නම් ඒගොල්ල සියයට සියයක්ම හරි. නමුත්, වැඩ කිරීමට බැරි කෙනෙකු හැටියට මාව අයින් කිරීමේදී ඒ උගත්තු ලොකු වැරැද්දක් කළා. අපි ඒ ගැන පසුව බලා ගනිමු."

නව ජීවිතය ගොඩනඟන නිර්මාණකයන් සමඟ එක්වී පෙරමුණ ගැනීම සඳහා තමා ගත් මඟ ඔස්සේ දැඩි ලෙස යාමට පාවෙල් තීරණය කළේය. කළ යුත්තේ කුමක් දැයි දැන් ඔහු දනී.

ශීත සමය අවසන් විය. විවර වූ කවුළු අතරින් වසන්තය පැතිරිණි. අවසාන සැත්කමටද මුහුණ දුන් පාවෙල් මීට වඩා වැඩි කල් රෝහලේ සිටීම නුසුදුසු බව තීරණය කළේය. අබල දුබල වූ රෝගීන් අතරට වී සිටීමත්, සුව නොකළ හැකි රෝගවලින් පෙළෙන ඔවුන්ගේ කෙඳිරිගෑම් අසා සිටීම තම වේදනාවලට ඔරොත්තු දෙනවාට වඩා අමාරු කාරියක් බව ඔහුට වැටහිණි.

තවත් සැත්කමක් කිරීමට දෙස්තරවරුන් යෝජනා කළ විට, ඔහු තීරණාත්මක ලෙස ප්‍රතික්ෂේප කළේයඃ

"බැහැ. ඔය හොඳටම ඇති. විද්‍යාවේ දියුණුව සඳහා මා ගැලූ ලේ හොඳටම ප්‍රමාණවත්. ඉතිරි හරිය මට වෙනත් කාර්යයක් සඳහා බොහොම අවශ්‍යයි."

එදිනම ඔහු කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවට ලිපියක් ලියමින් තම බිරිඳ රැකියාව කරන මොස්කව් නගරයේ නැවතීමට අවසර දෙන ලෙස ඉල්ලා සිටියේය. තැනින් තැන යාම ඵල රහිත ක්‍රියාවක් බවද ඔහු පෙන්වා දුන්නේය. ඔහු තම ජීවිතයේ පළමුවැනි වරට පක්ෂයෙන් ආධාර ඉල්ලා සිටියේ දැන්ය. ඔහුගේ ලිපියට පිළිතුරු වශයෙන් මොස්කව් නගරයේ සෝවියට් සභාව කාමරයක්

ඔහුට දුන්නේය. පාවෙල් රෝහලින් පිට වී ගියේ මින් පසු කිසි දිනෙක නැවත එහි නොයාමට තීරණය කරමිනි.

ක්‍රපෝට්කින්ස්කායා වීදියට යාබද අතුරු මඟක චාම් කාමරය සුඛෝපභෝගීත්වයේ උපරිමය සංකේතයක් ලෙස ඔහුට දැනිණි. නිතර මහ රෑයෙහි නින්දෙන් අවදිවන පාවෙල් රෝහල් සඳහටම අතහැර පැමිණි බව විශ්වාස කිරීමට පවා මැළි විය.

තායා දැන් පක්ෂයේ සම්පූර්ණ සාමාජිකාවකි. පෞද්ගලික ජීවිතයේදී තමා විඳි අභාග්‍යය නිසා සිත අධෛර්ය නොකර ගත් තායා ඉතා දක්ෂ ලෙස කම්හලේ සේවය කොට, ක්‍රියාශීලී කම්කරු කතක ලෙස ප්‍රසිද්ධියට පැමිණ, කම්හලේ වෘත්තීය කමිටුවේ සාමාජිකාවක හැටියටද තේරී පත් වූවාය. බොල්ෂෙවික්වාදිනියක ලෙස පරිවර්තනය වූ තම බිරිඳ නිසා පාවෙල් ආඩම්බර වූයේ, තම බරපතළ රෝගය නිසා උපන් වේදනා මඳක් හෝ තුනී කර ගත්තේය.

★

මොස්කව් නගරයට වෘත්තීය කටයුත්තක් සඳහා පැමිණි බෂානොවා ඔහු බැලීමටද පැමිණියාය. ඔවුහු බොහෝ වේලාවක් කතාකරමින් සිටියහ. නුදුරු අනාගතයේදී සටන්කාමීන් සමඟ පෙරමුණ ගන්නා සැටි පාවෙල් ඇයට කීවේ ඉමහත් අනුරාගික හැඟීමකිනි.

බෂානොවා පාවෙල්ගේ හිස දෙපස හිසකේ යම්තමින් පැසී ඇති බව දකින්නී, සෙමින් මෙසේ තෙපලාය:

"ඔබ බොහෝ දුක් විඳ ඇති බව පෙනෙන්ට තිබෙනවා. එහෙත්, ඔබේ උනන්දුව දීප්තියෙන් අඩු වුණේ නැහැ. ප්‍රධාන දෙය එයයි. තවත් ඕන මොනවාද? අවුරුදු පහක් තිස්සේ ඔබ සූදනම් වූ දෙය ක්‍රියාත්මක කිරීමට පටන් ගැනීම හොඳ දෙයකි. නමුත්, ඔබ ලියන්නේ කොහොමද?"

පාවෙල් සන්සුන්ව මඳ සිනා පෑවේය.

"අකුරු පේළියට ලිවීමට හැකිවන ලෙස කාඩ්බෝඩ් එකක දිගැති සිදුරු කපලා මට හෙට ගෙනත් දේවි. එය නැතුව මට ලියන්ට බැහැ. නැතිනම් වෙන්නෙ එක අකුරු පේළියකට උඩින් තවත් අකුරු පේළියක් ලිවීමයි. බොහෝ දවස් ගණනක් කල්පනා කරලා මේ ක්‍රමය මම හොයා ගත්තා. කාඩ්බෝඩ් එකේ දිගැති සිදුරු නිසා මට පැන්සලය දිගටම පෙළට තබාගෙන ලියන්නට පුළුවනි. ලියාපු දේ නොදැක

දිගටම ලිවීම අමාරුයි. නමුත්, එය බැරි දෙයක් නොවෙයි. මට දැන් එය ඔප්පු වී තිබෙනවා. බොහෝ කලක් තිස්සේ කොහොම ලියුවත් හරි ගියේ නැහැ. පසුව හෙමිහිට අකුරින් අකුර වෙන් කරලා ලියන්ට පටන් ගත්තා. සෑහෙන තරම් හොඳින් ලියන්ට පුළුවන් වුණා."

පාවෙල් වැඩ කිරීමට පටන් ගත්තේය.

රටවැසි යුද්ධ සමයේ රතු සේනා මෙහෙයැ වූ කතොව්ස්කි සෙනෙවියාගේ වීර ඩිවිෂන් සේනාවකට කැප වූ නවකතාවක් ලිවීමට ඔහු කල්පනා කළේය:

"කුණාටුවකින් උපත ලද්දෝ."

එදා සිට ඔහුගේ හැම කල්පනාවක්ම එම නවකතාවට යොමු විය. සෙමින් අකුරු පෙළින් පෙළ ඔහු අතින් ලියැවිණි. ඒවා පිටු බවට පෙරළිණි. නවකතාවේ චරිත මවාගෙන ඔවුන් සිතින් මෙහෙයැවීමට සහ සාහිත්‍ය නිර්මාණය නමැති විලිරුදුවට ගොදුරුව සිටි පාවෙල්ට අන් හැම දෙයක්ම අමතක විය. සිතින් මැවෙන පණැති, දීප්තිමත් චරිත අප්‍රාණික ලෙස බසට පරිවර්තනය වන විට, ඇතිවන දැඩි දෙම්නස ඔහුට දැනිණි.

ඔහු ලියන හැම වචනයක්ම ඔහුට මතක තබා ගැනීමට සිදුවිය. අවිච්ඡින්නය අමතක වූ විට ලිවීම ඇන හිටිණි. අම්මා තම පුතු දෙස බියෙන් බැලුවාය.

මෙසේ ලිවීමේදී පාවෙල්ට පිටු ගණන් කට පාඩමින් කීමට සිදුවිය. සමහර විට ඔහු මුළු පරිච්ඡේදයන් කටපාඩම් කළේය. පුතාගේ සිහි විකල වී ඇති බව අම්මා සිතුවේ මේ නිසාය. ඔහු ලියන විට ඈ ඔහු අසලටවත් නොපැමිණියා ය. එහෙත්, ඔහුගේ අතින් බිමට වැටෙන කඩදාසියක් ගෙන ඔහුට දෙන ඈ චකිතයකින් මෙසේ තෙපලා ය:

"පව්ලූෂා, නුඹ වෙන මොනවා හරි දෙයක් කරපන්. අවසානයක් නැතුව ලිවීමෙන් වැඩක් නැහැ..."

ඇගේ බියට හේතුව දැනගත් පාවෙල් මුළු සිතින්ම සිනාසුණේය. තවම තමාට පිස්සු හැදී නැති බව ඔහු අම්මාට ඒත්තු ගැන්වීය.

★

ඔහු අදහස් කළ නවකතාවේ පරිච්ඡේද තුනක් ලියා අවසන් කළේය. පාවෙල් එය ඔඩෙස්සාහි පදිංචිව සිටි තම මිතුරන් වූ පැරැණි කතොව්ස්කි ඩිවිෂනයේ සෙබළුන් වෙත

යැවීය. මිතුරන් එයට පසසමින් ලියුම් එව්වද, නවකතාව නැවත තැපෑලෙන් එවීමේදී නැති විණි. හයමසක ශ්‍රමය විනාශ විය. එයින් පාවෙල්ගේ සිත කම්පනය විය. නවකතාව පිටපත් නොකර මුල් පිටපත එසේ යැවීම ගැන ඔහු බොහෝ සේ කනගාටු විය. ඔහු තමාට වූ විශාල අලාභය ගැන ලෙඩ්නියෝව්ට විස්තර කළේය.

"නුඹ එතරම් ප්‍රවේසම් රහිත ලෙස ක්‍රියා කළේ කුමට ද? දැන් ඉහිරුණු කිරි ගැන අඬලා වැඩක් නැහැ. සන්සුන් වෙලා ආයෙමත් ලියාපන්."

"ඉනකේන්ති පාව්ලොවිච්! හයමසක ශ්‍රමය නැති වුණා. හයමසක් තිස්සේ දවසකට පැය අටක් බැගින් මම වැඩ කළා. ඔන්න පරපෝෂිතයන්ගේ හැටි. උන්ට හෙණ හතක් වදින්ට ඕන."

ලෙඩ්නියෝව් ඔහු අස්වැසීමට මහන්සි ගත්තේය.

නවකතාව නැවත මුල සිට ලිවීමට සිදුවිය. ලෙඩ්නියොව් ඔහුට කඩදසි සොයා දුන්නේය. පාවෙල්ගේ අත් පිටපත ටයිප් කර දුන්නේය. සති හයකට පසු පළමුවැනි පරිච්ඡේදය යළිත් ලියා නිම කිරීමට පාවෙල් සමත් විය.

පාවෙල් පදිංචිව සිටි තට්ටු නිවසෙහි එක ගෙදරක ඇලෙක්සේයෙව් පවුල වාසය කළේය. ලොකු පුතා අලෙක්සාන්දර් නගරයේ ප්‍රාදේශීය කොම්සොමොල් සංවිධානයක ලේකම්වරයෙකි. ඔහුගේ නංගී දහහත් හැවිරිදි ගාල්යා කම්හල් අභ්‍යාස පාසලකින් සමත් වූ තරුණියකි. තමාගේ 'ලේකම්' හැටියට වැඩ කිරීමට ඇය කැමතිදැයි දැනගන්නා ලෙස පාවෙල් අම්මාගෙන් ඉල්ලා සිටියේය. ගාල්යා මහත් ආසාවකින් කැමැති වූවාය. ඈ ආචාරශීලීව මඳ සිනා පාමින් ගෙට ඇතුළු වූවා, පාවෙල් නවකතාවක් ලියන බව දැන ගත්තී, මෙසේ කීවාය:

"කොර්චාගින් සහෝදරයා මා ඔබට බොහොම කැමැත්තෙන් උදවු කරන්නම්. ගෙවල් පිරිසිදුව තබා ගැනීමේ වැදගත්කම ගැන කියන චක්‍රලේඛ තාත්තා වෙනුවෙන් ලියන වැඩේ වගේ මෙය කාන්සියක් ගෙන දෙන්නේ නැහැ."

එදා සිට නවකතාව ලිවීම දෙගුණයක වේගයෙන් කෙරෙන්නට විය. මසක් තුළදී කොතරම් ලිවීද යත්, පාවෙල් පවා මවිතයට පත් විය. ගාල්යා ඉමහත් උනන්දුවකින් ඔහුට උදව් කළාය. ඈ සන්සුන් ලෙස ලියුවාය. තමාට රිසි වගන්ති කීපවරක්ම කියවන ඈ ඉන් සතුටක් ලැබුවාය. පාවෙල්ගේ

නවකතාව සාර්ථක වෙතියි සිතූ එක ම පුද්ගලයා ගාල්යා පමණකි. ගෙදර සිටි අනික් අය ඉන් කිසිදු පලක් නොවන බවත්, රෝගියකු වූ පාවෙල් තම කාලය ගෙවීමට සොයා ගත් ක්‍රමයක් ලෙසත් සිතූහ.

කාර්ය කටයුතු සඳහා ඉවත ගොස් සිටි ලෙඩ්නියෝව් මොස්කව් විත්, පාවෙල් විසින් ලියන ලද නවකතාවේ පළමු වැනි පරිච්ඡේදය කියවා බැලීය.

"යාළුවා දිගටම ලියාපන්. ජය අපටයි. නුඹට තව බොහෝම ප්‍රීතිවීමට ඉඩ ලැබේවි. පාවෙල් සහෝදරයා. සටන් පෙරමුණට නුඹ තුළ ඇති ආසාව හරියනවාට සැක නැහැ. මගේ හොඳ පුතේ බලාපොරොත්තු නැති කර ගන්ට එපා."

මහලු ලෙඩ්නියෝව් බොහෝ සේ සතුටු විය. ඔහු පාවෙල් දිරි ගැන්වීය.

ගාල්යා දිනපතා විත් පාවෙල් කියවන විට ලියන්නට වූවාය. අමතක නොකළ හැකි අතීතය යළි පණ ගැන්විණි. පාවෙල් අතීතයට වැද කල්පනා කරමින් නිහඬව සිටින විට, ඔහුගේ බැම සඟල නැටවෙන සැටිද, ඔහුගේ සිතීම් මාලාව අඳ දෙනෙත්වල පිළිබිඹු වන්නාක් මෙන් ඒවා නැටවෙන සැටිද ගාල්යා දුටුවාය. ඔහුට නොපෙනෙන බව පිළිගැනීමට ඇය මැළි වූයේ එබැවිනි. පිටතට ඉතා පැහැදිලිව පෙනෙන දෙනෙත්වල ජීවනය තිබිණි.

ලියූ දේ දවස අවසානයේදී කියවන විට, එය අසා සිටින පාවෙල්ගේ මූණ ඇඹුල් වන සැටි සමහර දවස්වලදී ගාල්යා දකී.

"කොර්චාගින් සහෝදරයා මොකද මූණ ඇඹුල් කර ගන්නෙ? ඒ කොටස බොහොම හොඳයි."

"ගාල්යා, එය හොඳ නැහැ."

තමාට නුසුදුසු යැයි සිතෙන පිටු පාවෙල් යළිත් ලියුවේය. දිගැති කාඩ්බෝඩ් සිදුරේ පටු බව නිසා ඔහුගේ ඉවසීම සිඳී යයි. එවිට ඔහු එය අත හැර දමයි. තමාගේ දෙනෙත් අඳ කළ ජීවිතය කෙරෙහි කෝප වන ඔහු පැන්සලය කඩා දමයි. ලේ ගලන තුරු තොල් සපා ගනියි.

නවකතාව ලියා අවසන් වීම ළංවෙත්ම ඔහු විසින් තහනම් කරන ලද, එමෙන් ම මනා ලෙස පාලනයට පත් කළ හැඟීම් මතුවෙන්නට විය: දුක ඇතුළු සාමාන්‍ය මිනිස් ගතිද, උණුසුම හා මුදු බවද, එනම් ඔහු හැර අනික් හැම මිනිහකුටම විඳීමට අයිතියක් ඇති හැඟීම් මතු විය. එහෙත්, ඒවාට යට වූවොත්

ඉන් ලැබෙන විපාකය දුක බව ඔහු දැන සිටියේය.

තායා කම්හලේ සිට ගෙදර පැමිණියේ රෑ වූ පසුවය. ඈ මාරියා යාකොව්ලෙව්නා පාවෙල්ගේ අම්මා සමග පහත් හඬින් වචන කීපයක් කතා කොට නින්දට යන්නීය.

★

අවසාන පරිච්ඡේදයද ලියැවිණි. දවස් කීපයක් තිස්සේම ගාල්යා පාවෙල්ට එය කියැවුවාය.

ලෙනින්ග්‍රාඩයේ ප්‍රාදේශීය පක්ෂ කමිටුවේ සංස්කෘති ප්‍රචාරක අංශයට හෙට අත්පිටපත යවනු ඇත. නවකතාව අනුමත කළොත්, එය ප්‍රකාශකයන්ට භාර දෙනු ඇත. එවිට...

හදවත බියෙන් සැලෙන්නට විය. එවිට... අවුරුදු කීපයක් තිස්සේ දැඩි වෙහෙස ගෙන වැඩ කිරීම නිසා දිනාගත් නව ජීවිතයක් පටන් ගනු ඇත.

පාවෙල්ගේ ඉරණම නවකතාවේ ඉරණම මත රැඳී පවතී. අත්පිටපත ප්‍රතික්ෂේප කළහොත් එය ඔහුගේ ජීවිතයේ අවසානය වන්නේය. නැතිනම් අත්පිටපත අඩ වශයෙන් නුසුදුසු බවත්, ඒවා නැවත ලියා සුදුසු තත්ත්වයකට පත් කළ හැකි බවත් දැන්වුවහොත්, ඔහු වහාම තවත් ප්‍රහාරයක් අරඹනු ඇත.

බරැති පාර්සලය තැපැල් කිරීම සඳහා අම්මා එය තැපැල් කාර්යාලයට ගෙන ගියාය. නොසන්සුන් ලෙස බලාපොරොත්තු වී සිටීමේ කාලය එළඹිණි. මේ දවස්වලදී තරම් නොඉවසිල්ලකින් පාවෙල් ලියුම් බලාපොරොත්තු වූ කලක් තවත් නොවීය. උදේ තැපෑලෙන් පසු හවස තැපෑල බලාපොරොත්තුවෙන් ඔහු කල් ගෙවීය. එහෙත් ලෙනින්ග්‍රාඩයෙන් ලියුම් නොලැබිණි.

ප්‍රකාශකයන්ගේ නිහඬතාව තර්ජනයක් දක්වා වැඩි විය. දවස් ගෙවීයත්ම පරාජයක පෙර නිමිතිද උත්සන්න විය. ඔහුගේ නවකතාව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළහොත් මරණය නියත බව කොර්චාගින්ට දැනිණි. එවිට ජීවත් වීමට අවශ්‍යතාවක් නැත. ජීවත් වන්නේ කවර හේතුවක් නිසාද?

එවැනි අවස්ථාවලදී ඔහුට වෙරළබඩ පිහිටි උද්‍යානය ගැන සිහිවිය. යළි, යළිත් එක් පැනයක් මතු විය:

"යළිත් සටන් පෙරමුණ ගැනීම සඳහාත්, තම ජීවිතය ප්‍රයෝජනවත් දෙයක් බවට පත්කර ලීම සඳහාත්, තමා වට කළ අයෝමය කවයෙන් පිටවී යාම සඳහා කළ හැකි හැම

දෙයක්ම කළේද?"

ඔහු පිළිතුරු සැපයීය.

"ඔව්, හැම දෙයක්ම කළ බව මා විශ්වාස කරනවා."

දවස් බොහෝ ගණනක් ගෙවී යත්ම බලාපොරොත්තු වී සිටීම උසුලන්නට බැරි තරම් දෙයක් බවට පත්විය. පුතාට නොදෙවෙනි තරම් කැලඹීමකට පත්වී සිටි අම්මා කාමරයට විත් කෑ ගැසුවාය:

"ලෙනින්ග්‍රාඩ්වලින් ලියුමක් ඇවිල්ලා!!!"

එය ලෙනින්ග්‍රාඩයේ ප්‍රාදේශීය පක්ෂ කමිටුවෙන් එවූ විදුලි පුවතකි. එහි මෙසේ කියැවිණි: "නවකතාව ඉතා ඉහළින් අනුමත කළෙමු. මුද්‍රණය කිරීමට පටන් ගන්නෙමු. ජය නිසා ඔබට සුබ පතමු."

හදවතෙහි ගැස්ම වැඩි විය. ඔහුගේ සිහිනය සැබෑ විය. පාවෙල් වටා තිබුණු අයෝමය වළල්ල බිඳ දැමීමට ඔහු සමත් විය. ඔහු නැවත මේ වර අලුත් අවියක් ගෙන සටන් පෙරමුණට හා ජීවතුන් අතරට පැමිණියේය.

1930-1934

සටහන්

නිකොලායි ඔස්ත්‍රොව්ස්කි ගේ පළමුවැනි නවකතාව 'වානේ පන්නරය ලැබූ හැටි' ය.

'වානේ පන්නරය ලැබූ හැටි' නමැති නවකතාව මා ලියුවේ කෙසේද යන මැයෙන් කතුවරයා ලියූ ලිපියෙන් ඔහු මෙසේ යටගියාව මතක් කළේය: "මා දුටු දේ ගැනද, සමහර විට මා සහභාගි වුණු දේ ගැනද යමක් ලිවීමට මා තුළ ආසාවක් ඇති විය. එහෙත්, මා තරුණ කොමියුනිස්ට් සංවිධානයේ වැඩවල යෙදී සිටි නිසාත්, මෙතරම් වගකිව යුතු කාර්යයක් භාර ගැනීමට තීරණය නොකළ නිසාත්, මට එසේ නොකළ හැකි විය."

කොම්සොමොලයේ නායකත්වයෙන් ඈත් වීමට ඔහුට බලකළේ ඔහුගේ සෞඛ්‍ය තත්ත්වයය. කොමියුනිස්ට්වාදය සඳහා කැපවූ සටන්කාමීන් සමඟ පෙරමුණ ගැනීමට අන් මගක් නොදුටු නිකොලායි ඔස්ත්‍රොව්ස්කි බරැරුම් ලෙසම ගත්කරුවකු වීම ගැන කල්පනා කළේය. "පෙරමුණේ හැම කොටසකින්ම ඉදිරියට ගමන් කරන නිර්ධන පන්තිය සමඟ මට නැවත එකතුවීමට හැකියාවක් ලබාදෙන අලුත් අවියක් මා පුරුදු පුහුණු කරගත යුතු බව මට ජීවිතය බල කළේය." (මගේ නිර්මාණාත්මක කෘතීන් පිළිබඳ වාර්තාවෙනි.)

කතුවරයාගේ බිරිඳ වන ආර්.පී. ඔස්ත්‍රොව්ස්කායා සහ අයි.පී. පෙදේනෙව්ගේ සාක්ෂ්‍ය අනුව නිකොලායි ඔස්ත්‍රොව්ස්කි 1926-1927 අවුරුදුවලදී යෙව්පතෝරියාවට සහ නොවොරසීස්ක්වලට පැමිණි අවස්ථාවලදී, පුරවැසි යුද්ධයට අයත් සිද්ධීන් ගැනද, උක්‍රයිනයේ විවිධ වර්ගවලට අයත් පල්හොරුන්ට විරුද්ධව කළ සටන් ගැනද කීප වරක්ම මතක් කළේය. පුනරුත්ථාපනය ලබන අවධියේදී ශ්‍රම පෙරමුණෙහි කොම්සොමොල්වරුන් ලැබූ විරෝදාර මුල් ජය ගැනද ඔහු සිත් ඇදගන්නාසුලු කතා කීවේය. මෙතරම් පොහොසත් හා විවිධ සත්‍ය කරුණු ඔහුගේ අනාගත නවකතාවේ පදනම හැටියට ගැනිණි.

1927 ඔක්තෝබර් 22 ද නිකොලායි ඔස්ත්‍රොව්ස්කි තම මිතුරකු වන පී.එන්. නෝවිකව්ට මෙසේ ලියුවේය:

"ඓතිහාසික වර්ණනාත්මක වීර නවකතාවක් ලිවීමට සූදනම් වෙනවා. හැබැටම විහිළු කිරීමෙන් තොරව බැලුව හොත් බැරෑරුම් ලෙසම ඒ ගැන කල්පනා කරනවා. එහෙත් මොනවා වේදැයි මා දන්නෙ නැහැ. උදේ සිට රෑ වන තුරු මා කියවනවා."

1927 අවසානයේදී, ඔස්ත්‍රොව්ස්කි සේවය කළ කතොව්ස්කිගේ අසරු හමුදුව ගැන විශාල නොවන නවකතාවක් ලියුවේය. එම අසරු හමුදවේ සේවය කළ මිතුරන් වෙත ඔහු අත්පිටපත යැවීය. මිතුරෝ එය පිළි ගනිමින් හා අනුමත කරමින් පිළිතුරු එවූහ. එහෙත්, අත් පිටපත තැපැල් සේවය විසින් නැති කරන ලදි.

සිය මතක සටහන් ලියූ කේ. සිලීන්ස්කි කතුවරයා ගැන සඳහන් කරමින් නැති වූ අත්පිටපත 'වානේ පන්නරය ලැබූ හැටි' නමැති නවකතාවේ මුල් කතාව බව කියයි. එය නවකතාවේ වීරයා කොතොව්ස්කිගේ අසරු හමුදවේ සිටි කාලය ගැන පමණක් කියන බව සිලීන්ස්කි ලියුවේය. (ජනතාවගේ මිත්‍රත්වය නමැති සංග්‍රහය 1947 අංක 14.)

එසේ වුවද, එය ඔප්පු කරන ලියවිලි නැත.

නවකතාව ලිවීම සඳහා තම මිතුරන්ගේ අනුග්‍රහයද, උපදෙස්ද ඔස්ත්‍රොව්ස්කිට ලැබිණි. එහෙත්, ඒ හැමටම වඩා තම මවුබිමට සේවය කිරීමේ දැඩි ආසාවකින් පෙළෙමින් සිටි ඔහු අලුත් විශාල සාහිත්‍ය කෘතිය පටන් ගැනීම සඳහා සෑහෙන ලෙස සූදනම් වීමට අදහස් කළේය. එයට පිළියෙල වීමක් වශයෙන් ඔහු අන් හැම දේටම වඩා ඉගෙන ගත්තේය.

ස්වේර්ඩ්ලොව් අනුස්මරණීය කොමියුනිස්ට් විශ්ව විද්‍යාලයේ තැපැල් මාර්ගික අධ්‍යාපන අංශයට ඔහු 1927 දෙසැම්බර් මාසයේදී ඇතුළු විය. ඒ අතරම ඔහු බොහෝ සාහිත්‍ය කෘතීන් කියවන්නට විය. රුසියානු හා විදේශීය නවකතා කතුවරයන්ගේ ඉතාම උසස් කෘතීන් ඔහු හැදෑරීය. මක්සිම් ගෝර්කි, ඒ. සෙරපිමෝවිච්, ඩී. පූර්මනව්, ඒ. පදේයෙව් ආදීන්ගේ නිර්මාණාත්මක සාහිත්‍යයද ඔහු ගැඹුරු ලෙස හදරන්නට විය. මේ කාලයේදී ඔහු සිය මිතුරන් හා පැරැණි බොල්ෂෙවික්වාදීන් වන එච්.පී. චෙර්නකෝසොව්, ඒ.ඒ. ෂිගරෝවා සහ අයි.පී. පේදෙනෙව්ගේ ආධ්‍යාත්මික සහාය ලැබීය.

එහෙත්, ඔහුගේ රෝගය උත්සන්නවීම නිසා ඔහුට දිගු කලක්ම චිකිත්සාගාරවල ලගින්නට සිදු වූයෙන්, 1930 වන

තුරුම ඔහුට නවකතාව ලිවීම පටන් ගැනීමට බැරි විය. පී.එන්.නෝවිකොව්ට ඔහු ලියූ ලිපියක මෙසේ සඳහන් වෙයිඃ

"ජීවිතයක් හරයක් හා අරමුණක් ඇති දෙයක් බවට පත්කිරීම සහ ජීවත්වීම සාධාරණ යැයි පෙන්වීම සඳහා මට සැලැස්මක් ඇත. මම ඉතා හොඳ සෞඛ්‍යයක් ඇති තරුණයෙක්මි. මගේ දෙපා පණ නැති වීම හා මගේ ඇස් නොපෙනීම විශාල ලෙස වරදවා වටහා ගැනීමකි, මුග්ධ, සාතන් වැනි යකෙකුගේ විහිළුවකි. මට පණැති එක් පයක් සහ පෙනෙන එක් ඇසක් ලැබුණොත් අප රටේ ඉදිකිරීම්වල පෙරමුණ ගෙන සිටි නුඹලා ඕනෑම කෙනෙකුට මමද සමාන වන්නෙමි." (1930 සැප්තැම්බර් 11ද.)

'වානේ පන්නරය ලැබූ හැටි' නමැති නවකතාව ලිවීමට පටන්ගෙන මොස්කව්හි මියොත්ර් පටුමගෙහි (දැන් නිකොලායි ඔස්ත්‍රොව්ස්කි පටුමග) අංක 12 දරන නිවසෙහි පදිංචි වූ ගත් කතුවරයාගේ ආධ්‍යාත්මික තත්ත්වය එසේ විය. ඇස් අන්ධ වූ ඔස්ත්‍රොව්ස්කිට ලිවීම පහසු නොවීය. අකුරු සහ වාක්‍ය පේළි එක උඩ එක ඔහු අතින් ලියැවිණි.

එවිට ඔහු කාඩ්බෝඩ් ලැල්ලක අකුරු පේළිවලට සමාන දිගැති සිදුරු කපා, එයට යටින් ලියන කඩදසි 25-30 දමා ලිවීමේ ක්‍රමයක් සොයා ගත්තේය. එයින් ඔහුට ඉක්මනින් ලිවීමට බැරි බව වැටහුණු පසු, ඔහුගේ මිතුරෝ හා නෑයෝ ඔහු කියවන විට එය ලියමින් ඔහුට සහාය වූහ.

පසුකලෙක ඔස්ත්‍රොව්ස්කි මෙසේ ලියුවේයඃ "තම සිත කැලඹී ඇති, වින්දනයන් හා අදහස් තම අතින් ලියනවිට එය කොතරම් පැහැදිලි ලෙසත්, දීප්තිමත් ලෙසත් ලිවිය හැකිද යන්න හැම කෙනෙකුම දනී. එහෙත්, වෙනත් කෙනෙකුට ලියා ගැනීම සඳහා කියවන විට නිතර පාහේ ඒ වින්දන හා අදහස් අප්‍රාණික හා වියළි දේ බවට පත්වේ. ('වානේ පන්නරය ලැබූ හැටි' නවකතාව ලියුවේ කෙසේද නමැති ලිපියෙනි.)

1931 ඔක්තෝබර් මාසයේදී පරිච්ඡේද නවයකින් යුත් පළමුවෙනි කොටස ඔහු ලියා නිම කළේය. ඉන් එක් අත්පිටපතක් ලෙනින්ග්‍රාඩ් පක්ෂයේ හා සාහිත්‍ය කවයන්වල සාකච්ඡා කිරීමට සහ 'මොලදය ග්වාර්දියා' (තරුණ ආරක්ෂක සෙබළා) ප්‍රකාශක ආයතනයේ ලෙනින්ග්‍රාඩ් ශාඛාවේ පළකිරීමට ඒ.ඒ. ෂිගාරෝවාට යැවීය. දෙවැනි අත් පිටපත 'මොලදයා ග්වාර්දියා' ප්‍රකාශක සමාගමේ ප්‍රධාන කාර්යාලයට අයි.පී. පෙදේනෙව් විසින් භාරදෙන ලදි

ප්‍රකාශන සමාගම පොත මුද්‍රණය කිරීම ප්‍රතික්ෂේප කළේය. ලෙනින්ග්‍රාඩ් ශාඛාවෙන් කිසිදු පිළිතුරක් නො ලැබිණි.

එවිට අයි.පී. පෙදේනෙව් අත්පිටපත 'මොලදයා ග්වාර්දියා' සඟරාවේ කතු මඬුල්ලට භාර දුන්නේය.

1932 පෙබරවාරි මාසයේ දී නිකොලායි ඔස්ත්‍රොව්ස්කි ඒ.ඒ. ෂිගාරෝවාට ලියුමක් යවමින් මෙසේ සටහන් කළේයඃ

"සාහිත්‍ය පෙරමුණේ යහපත් ආරංචි ඔබට දැන්වීමට මා අදහස් කරනවා. පෙදේනෙව් සහ 'මොලදය ග්වාර්දියා' සඟරාවේ උප කතුවර කෝලසොව් සහෝදරයා ඊයේ අපේ ගෙදරට ආහ. මොස්කව්හි මගේ අත් පිටපත සංස්කරණය කළේය. කෝලසොව් සහෝදරයාද එය කියවීය. ඔහු මා බැලීමට විත් මෙසේ පැවසීයඃ "අපට එවැනි හරය ඇති නවකතා නැත. හොඳට ලියා තිබෙනවා සාහිත්‍ය නිර්මාණය සඳහා කුසලතාවක් ඔබ සතුව ඇත. පෞද්ගලිකව නවකතාව මගේ හිතට ඇල්ලුවා. අපි එය මුද්‍රණය කරන්නෙමු."

එවකට එම සඟරාවේ වගකිව යුතු සංස්කාරක ධුරය දැරූ ඒ.ඒ. කරවායෙවා තරුණ ගත්කරුවාගේ නවකතාව උසස් ලෙස තක්සේරු කළාය.

'වානේ පන්නරය ලැබූ හැටි' නමැති නවකතාවේ පළමුවැනි කාණ්ඩය කොටස් වශයෙන් 'මොලදයා ග්වාර්දියා' සඟරාවේ අංක 4, 5, 6, 7, 8 සහ 9 දරන කලාපවල පිළිවෙළින් පළවීය. දැන් නිකොලායි ඔස්ත්‍රොව්ස්කිට මෙසේ කීමට අයිතියක් තිබේඃ "මම දැන් ක්‍රියාකාරී සටන් කාමියෙකු බවට පත්වීමි..." (ඒ.ඒ. ෂිගාරෝවා වෙත 1932 මාර්තු 10 ද එවූ ලිපියකිනි.)

1932 ඔක්තෝබර් මාසයේදී 'මොලදයා ග්වාර්දියා' ප්‍රකාශකයන් විසින් 'වානේ පන්නරය ලැබූ හැටි' නවකතාවේ පළමුවැනි කොටස ප්‍රකාශයට පත් කරන ලදි. පොතේ කවරයේ චිත්‍රය තුරු අත්තක් සහ බයිනේත්තුවක් විය. ඔස්ත්‍රොව්ස්කි කවරය අතගාමින් චිත්‍රය වටහාගෙන, ජීවිතය සටන තුළින් දිනාගැනීමකි යන අරුතය නවකතාවෙන් කියාපාන බවත්, එය චිත්‍ර ශිල්පියා නිවැරදි ලෙස තේරුම් ගෙන ඇති බවත් පැවසූ සැටි, ඔහු අසල සිටි ඔහුගේ නෑයෝ දුටහ.

නවකතාවේ පළමුවැනි කොටස සාර්ථක වීම නිසා කතුවරයා විශාල ධෛර්යයක් ලැබීය.

1932 අගෝස්තු මාසයේදී ඔහු ඒ.ඒ. ෂිගරෝවාට යැවූ

ලිපියක මෙසේ සඳහන් විය:

"මා දැන් නවකතාවේ දෙවැනි කොටස ලිවීමට පටන් ගෙන තියෙනවා. පළමුවැනි කොටස වෙන ම පොතක් ලෙස අගෝස්තු මාසයේදී මුද්‍රණය කිරීමට තීරණය කර ඇත." ඔහු ඇයට ලියුවේ වෛදුන්ගේ බලකිරීම අනුව ඔහු සෝචි නගරයට ගොස් සිටියදීය.

1932 දෙසැම්බර් 5 ද ඔහු ඇම්.එස්. පින්කෙල්ෂ්ටෙයින්ට මෙසේ ලියුවේය: "මම අශ්වයකු සේ වැඩ කරමි. රෑට පොත ලියන විට කිසිවෙක් හෝ කිසිවක් හෝ මට බාධා නොකරති." දෙසැම්බර් මස අවසානයේදී පරිච්ඡේද දෙකක් ලියා නිම කිරීමට ඔස්ත්‍රොව්ස්කි සමත් විය. (1932 දෙසැම්බර් 27 ද) ඔහු සඟරාවේ කතුවරිය වූ ඒ.ඒ. කරවායෙවාට මෙසේ ලියා යැවීය: 'වානේ පන්නරය ලැබූ හැටි' නමැති නවකතාවේ දෙවැනි කොටසේ මුල් පරිච්ඡේද දෙක මේ සමඟ එවමි." ලියුම්වලින් පෙනෙන පරිදි දෙවැනි කොටසේ වැඩ සාර්ථක අන්දමින් කෙරිණි. කතුවරයා ලත් පුරුද්ද බෙහෙවින් ඔහුට උදව් විය.

ඔස්ත්‍රොව්ස්කි විසින් ඒ.ඒ. කරවායෙවාට 1933 අප්‍රේල් 30 ද යවන ලද ලිපියෙහි මෙසේ සඳහන් විය: "මමසඟරාවේ කතු මඬුල්ල වෙත පරිච්ඡේද හයක් යැවීමි. මුළු ප්‍රමාණය ටයිප් කළ පිටු 230 ක් පමණ වේ." එම වසරේ ජූනි මාසයේදී ලෙනින්ග්‍රාඩ්හි ෂිගරෝවා වෙත යැවූ ලිපියෙහි දෙවැනි කොටස ලියා නිම කළ බව කියා තිබිණි.

"මගේ ජීවිතය දැන් යහපත්ය. පසුපස අතහැර මම දැන් නැවත පෙරමුණ ගෙන සිටිමි"යි ඔහු තම සටන්කාමී සගයා වන ඒ.අයි. පුසිර්යොව්ස්කිට (1933 දෙසැම්බර් 26 ද) ලියා යැවීය.

1934 ජනවාරි මාසයේදී 'මොලදයා ග්වාර්දියා' සඟරාව 'වානේ පන්නරය ලැබූ සැටි' නවකතාවේ දෙවැනි කොටස පළකිරීමට පටන් ගත්තේය. එම වසරේදී දෙවරක්ම එය පොතක් ලෙස පිට විය.

1934 ජූනි මාසයේ දී නිකොලායි ඔස්ත්‍රොව්ස්කිට සෝවියට් ලේඛක සංගමයේ සාමාජිකත්වයක් පිරි නැංවීය.

"මා ඉදිරියේ ජීවන දෙරටු පුළුල් ලෙස විවෘත වී ඇත. ක්‍රියාශීලි කොටස්කරුවකු ලෙස සටනට සහභාගි වීමට මා තුළ ඇති රාගාන්විත ආසාව මුදුන් පත්වී ඇත... සහෝදරවරුනි මගේ අත දැඩි ලෙස මිරිකන්න!.. මගේ හදවත කොතරම් උණුසුම් ලෙස සැලෙන්නේද යන්න ඔබට

ඇසෙන්නෙහිද?" ඔස්ත්‍රොව්ස්කි පී.එන්. නෝවිකොව්ට 1932 අප්රේල් 4 ද) ලියුවේය.

නිකොලායි ඔස්ත්‍රොව්ස්කි තම ජීවිතයේ අවසාන දවස දක්වාම 'වානේ පන්නරය ලැබූ හැටි' නවකතාව සංස්කරණය කිරීම සඳහා කටයුතු කළේය. නවකතා සාහිත්‍යයේ භාෂාව පිළිබඳ ප්‍රශ්න ගැන මක්සිම් ගෝර්කි විසින් ලියන ලද ලිපියෙන් පසුව, කතුවරයා විශේෂයෙන් තම සාහිත්‍ය කටයුතු වැඩි කළේය. "මගේ නවකතාවේ පළමුවැනි කොටස මම යළි කියවන්නෙමි. මහා සාහිත්‍යකාරයා වන ගෝර්කිගේ ලිපිය මගේ දෙනෙත් පෑදුවේය. මගේ නවකතාවේ අයහපත් තැන් මට පෙනේ. අවශ්‍ය නැති වචන ගොඩක් මම අනුකම්පා විරහිතව කපා දැම්මෙමි. නැවත වරක් මගේ නවකතාව මුද්‍රණය කිරීමේ අවශ්‍යතාවක් ඇති වුවහොත්, එම වචන එහි නොතිබෙනු ඇත." 'මොලදය ග්වාර්දියා' සඟරාවේ 1934 වසරේ හයවැනි කලාපයට ලියූ 'බස්වහරේ පිරිසිදු බව' නමැති ලිපියෙහි ඔහු එසේ සඳහන් කළේය.

1934 දී නිකොලායි ඔස්ත්‍රොව්ස්කි 'වානේ පන්නරය ලැබූ හැටි' නවකතාව අලුතින් ලිවීමට පටන් ගත්තේය. බස් වහර උසස් කළ ඔහු ජවනිකා, චිත්‍ර හා සිද්ධීන් පොතට ඇතුළු කළේය. පළමුවැනි කොටසේ අටවැනි පරිච්ඡේදයට අලුත් චරිත දෙකක් ප්‍රතිවිප්ලවවාදී පෝලන්ත හමුද සහ නීති විරෝධී ලෙස සැඟවී වැඩ කළ කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයන්, හා පිල්සුඩ්ස්කි ඔවුන් මරාදැමීම ඇතුළු කළේය. "උක්රයිනයේ සෝවියට් ආණ්ඩු බලය සඳහා ගෙනගිය සටන උක්රයින ජාතිකයන්ට පමණක් සීමා නොවූ බව අලුත් පරිච්ඡේදයෙන් පෙන්වීමි"යි කතුවරයා ලියුවේය. (1934 මැයි 27 ද ඒ.ඉ. පොද්ගාසිට්ස්කායාට යැවූ ලිපියකිනි.) දෙවැනි කොටසේ දෙවැනි පරිච්ඡේදයට අලුත් ජවනිකා ගුබේර්නියා කමිටුවේ රැස්වීමක් ඔහු විසින් ලියනු ලැබීය. අර්ට්යොම්ගේ බිරිඳ වන ස්තෝෂාගේ චරිතය හෙළිකර පෙන්වීම සඳහා ප්‍රතිවිප්ලවවාදී පෝලන්ත හමුද විසින් මරා දමන ලද දේශප්‍රේමීන්ගේ සහෝදර සාමූහික මිනීවළ අසල සිද්ධියක්ද, කොමියුනිස්ට්වාදී උසස් විද්‍යුහලකට ඇතුළුවීම පිළිබඳ පන්ක්‍රාතොව්ගේ කතාවද, කතුවරයා ඇතුළු කළේය. කොමියුනිස්ට්වාදය සඳහා සටන් කරන දසලක්ෂ සංඛ්‍යාත සටන්කාමීන්ගේ ආදර්ශ පාඨය බවට පත්වන අනගිතම වැකිය ඔහු එම පරිච්ඡේදයට අමුතුවෙන්ම ලියුවේය. "මිනිසාගේ අති

උතුම් වස්තුව ජීවිතයයි. එය ඔහුට ලැබෙන්නේ එක වරක් පමණකි. අරමුණක් නැතිව ජීවත්වීම නිසා කටුක වේදනාවක් ඇති නොවන සේ, නීච සහ නොවැදගත් අතීතයක් නිසා ලජ්ජාවීමට සිදු නොවන සේ, ඔහු ජීවත් විය යුතුය. ඔහු මිය යන විට ඔහුට මෙසේ කීමට පුළුවන්කමක් තිබිය යුතුයඃ මගේ මුළු මහත් ජීවිතයත්, මුළු මහත් ශක්තියත් ලෝකයේ අතිශයින්ම උදාර හා සුන්දර පරමාර්ථය උදෙසා, එනම් මිනිස් සංහතියට විමුක්තිය ලබා දීමේ සටන උදෙසා කැප කළේය."

නවකතාවේ මුල් අත් පිටපතේ ප්‍රධාන වීරයා වූ පාවෙල් කොර්චාගින් කම්කරු විරුද්ධ පක්ෂයට එකතු විය. ඔස්ත්‍රොව්ස්කි දෙවැනි වර එය සංස්කරණය කළ විට, එම සිද්ධිය සම්පූර්ණයෙන්ම කපා හැරී ය. (දෙවැනි කොටසේ පළමුවැනි පරිච්ඡේදය.) "අප යුගයේ තරුණ විප්ලවවාදියාගේ ප්‍රතිමූර්තිය නොකිලිටි විය යුතු නිසාත්, එසේ ඔහු විරුද්ධ පක්ෂයට යවා අවුල් කරවීම වැඩක් නැති නිසාත් මම එසේ කළෙමි. එපමණක් නොව, මා මෙතැනදී සත්‍යයෙන් ඈත්වී පව් නොකළෙමි"යි 1935 ජූලි මස 2 ද කේ.ඩී. ත්‍රපීමොව්ට කතුවරයා ලියා යැවීය.

කියුට්සම් මහල්ලා සමඟ ඇතිවූ හමුවීම් කීපයක්ද කපා හැරියේය. "නායකත්වයේ සිටින සහෝදරවරුන් කීප දෙනෙකු සමඟ මා කළ සාකච්ඡාවලින් සහ ඔවුන්ගේ උපදෙස්වලින් පසුව, නවකතාවේ දෙවැනි කොටසේ කොර්චාගින් සහ කියුට්සම් මහල්ලා අතර ඇති වූ දෙබස් කපා හැරීමට තීරණය කළෙමි. මහල්ලාගේ සෝවියට් විරෝධී කතා කනට යුවල් ඇනීමක් වැනිය. මෙතැන සමහර දේ වෙනස් කළ යුතුය, නැතිනම් සම්පූර්ණයෙන්ම කපා හැරිය යුතු යැ"යි නිකොලායි ඔස්ත්‍රොව්ස්කි 'මොලොදයි බොල්ෂෙවික්' සඟරාවේ කතුවරයා වෙත 1934 නොවැම්බර් 25 ද ලියුවේය.

නව සංස්කරණයෙන් පසුව, 1935 පළමුවැනි භාගයේදී 'මොලදයා ග්වාර්දියා' ප්‍රකාශක සමාගම විසින් 'වානේ පන්නරය ලැබූ හැටි' නමැති නවකතාව මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කරන ලදි. එහි මෙසේ සඳහන් විය. (නිකොලායි ඔස්ත්‍රොව්ස්කි. 'වානේ පන්නරය ලැබූ හැටි.' කාණ්ඩ දෙකකින් යුත් නවකතාවකි. සම්පූර්ණ අත්පිටපත අනුව මුද්‍රණය කරන ලදි.)

තෙවැනි මුද්‍රණය සඳහා කතුවරයා ඉදිරිපත් කළ අත්පිටපත අවසාන වශයෙන් සංස්කරණය කළ බවට ඔහුගේ ලිපිය

සාක්ෂි දෙයි. "ගෝරිනා සංස්කාරකවරිය මා හමුවීමට ආවා. ඇය සමඟ එකතු වී 'වානේ පන්නරය ලැබූ හැටි' නවකතාවේ අත්පිටපත පිරික්සා බැලුවා. මගේ අදහස අනුව එය පිටපත් ලක්ෂයක් මුද්‍රණය කිරීමට තීරණය විය." (1935 මැයි 23 ද එම්.එස්. පින්කෙල්ෂ්ටෙයින්ට සහ ටී.බී අබේස්හවුස්ට යැවූ ලිපිවලිනි.) තවත් ලිපියක මෙසේ සඳහන් විය: "නවකතාවේ තෙවැනි උක්රයීන මුද්‍රණය තෙවැනි රුසියානු මුද්‍රණයෙන් පරිවර්තනය කළ යුතුය. මෙය අවසාන සංස්කරණයයි. අනාගත මුද්‍රණවලදී සංස්කරණය කිරීමට සිදුනොවේ. (කේ.ඩී. ත්‍රපීමොව්ට 1935 ජූලි 2 ද යැවූ ලිපියෙනි.)

සෝවියට් ආණ්ඩුවේ සහ පොදු ජන සංවිධානවල ඉමහත් පැසසුමට නවකතාව භාජනය විය. සෝවියට් සමාජවාදී ජනරජ සංගමයේ කෘත්‍යාධිකාරී කමිටුව 1935 ඔක්තෝබර් 1 ද නිකුත් කළ ආඥාවක මෙසේ සඳහන් විය: "කොම්සොමොල් සංවිධානයේ හිටපු ක්‍රියාශීලී සාමාජිකයකු වූද, රටවැසි යුද්ධයට වීරයකු ලෙස සහභාගි වූද, සෝවියට් ආණ්ඩු බලය සඳහා කළ සටනේදී රෝගියකු බවට පත් වූද, සමාජවාදය සඳහා කරන සටනේදී, අභීත ලෙස සාහිත්‍යය නමැති අවිය ගෙන පෙරමුණ ගත්තා වූද, 'වානේ පන්නරය ලැබූ හැටි' නමැති උසස් නවකතාවක් නිර්මාණය කළ කතුවරයා වූ නිකොලායි ඇලෙක්සේයිවිච් ඔස්ත්‍රොව්ස්කිට ලෙනින් සම්මානය පිරි නැමේ."

නවකතා කතුවරයාට ලෙනින් සම්මානය පිරිනැමීම නිසා නවකතාව නැවත වරක් මුද්‍රණය කිරීමට 1936 මුලදී මොස්කව්හි 'මොලදයා ග්වාර්දියා' ප්‍රකාශක සමාගම තීරණය කළේය. නිකොලායි ඔස්ත්‍රොව්ස්කි යළිත් වරක් නවකතාව සංස්කරණය කිරීමට ඉදිරිපත් විය. පාඨකයන් විසින් එවන ලද විවේචන හා පැසසුම් ගැන ඔහු වඩාත් සැලකිලිමත් විය. නවකතාව ඔහු වඩාත් දැඩි පිරික්සුමට භාජනය කළේය.

1936 මුද්‍රණය සඳහා කතුවරයා කළ සංස්කරණය සහ වර්ධනය වූ සාහිත්‍යමය දක්ෂතාව ගැන පහත සඳහන් කොටස් දෙක අතර ඇති වෙනස කදිම නිදසුනකි.

'වානේ පන්නරය ලැබූ හැටි' 1935 මුද්‍රණය

(ප්‍රකාශකයෝ මොලදය ග්වාර්දියා)

එස් එර් වාදී කුලාක් හමුදාවන්ට අයත් සාගරයක් වැනි එම පෙදෙසේ, බොල්ෂෙවික්වාදී දේශප්‍රේමී සේනාංක සටන් කොට අල්ලාගත් පෙදෙස් අයෝමය හා රතු පැහැති

දූපත්වලට සමාන විය. ලක්ෂ සංඛ්‍යාත අසුන්ගේ කුරවලටද මැෂින් තුවක්කු සහිත ගැල්වල රෝදවලට හා කාලතුවක්කු රෝදවලටද ගැටෙන මහ පොළොව කම්පනය විය. (63 පිටුව, පහළ සිට 5 වැනි පෙළ. රුසියන් මුද්‍රණය.)

1935 මුද්‍රණය (ප්‍රකාශකයෝ 'මොලදය ග්වාර්දියා')

එස් ඒර් වාදී කුලාක් හමුදාවන්ට අයත් පෙදෙසට විදුලිය වේගයෙන් රතු දේශප්‍රේමී හමුදාවෝ කඩා වැදී පහර දුන්හ. එවිට ලක්ෂ සංඛ්‍යාත අසුන්ගේ කුරවලටද, මැෂින් තුවක්කු රැගත් ගැල්වල රෝදවලට හා කාලතුවක්කු රෝදවලටද ගැටෙන මහ පොළොව කම්පනය විය. (64 පිටුව, ඉහළ සිට 6 වැනි පෙළ. රුසියන් මුද්‍රණය.)

එසේ වුවද, ඔස්ත්‍රොව්ස්කි ශෛලිය පමණක් වෙනස් කිරීමට සීමා නොවීය. ඔහු දෙවැනි කාණ්ඩයට තවත් කොටස් එකතු කළේය. පාවෙල් කොර්චාගින්ගේ දැඩි ආත්ම ශක්තියද, උසස් සදාචාර ගුණධර්ම පෙන්වන සිද්ධීන්ද, අවුරුදු තුනක අසීරු කාලය පෙන්වන සිද්ධීන්ද ඔහු ඇතුළු කළේය. අටවැනි පරිච්ඡේදයට ඔහු මහලු කොමියුනිස්ට් පරපුර සහ තරුණ ආරක්ෂක හට හමුද අතර ඇති නියම කොමියුනිස්ට්වාදී මිත්‍රත්වය පෙන්වන ජවනිකා දෙකක් අලුතින් ලියුවේය.

1936 මැයි මාසයේදී සංස්කරණ කටයුතු අවසන් කළෙන්, එම වසරේ ජූනි 10 ද මුද්‍රණය සඳහා අත්සන් තැබීය.

ඒ අතර 'සොවියිට්ස්කි පිසාතෙල්' (සෝවියට් ලේඛකයා) නමැති ප්‍රකාශන ආයතනයද එම නවකතාව මුද්‍රණය කිරීම සඳහා සූදානම් විය. එම ප්‍රකාශන ආයතනයේ සංස්කාරකවරයකු වූ කේ. සිලීන්ස්කි සංශෝධන 377ක් යෝජනා කළ අතර, කතුවරයා ඉන් 85ක් පිළිගත් බව ඔස්ත්‍රොව්ස්කි කෞතුකාගාරයට අයත් ලේඛනාගාරයේ ලියවිලිවලින් පෙනේ. 'මොලදයා ග්වාර්දියා' ප්‍රකාශක ආයතනයට යැවූ නවකතාවේ අත්පිටපතෙහි එම සංශෝධන කතුවරයා විසින් සටහන් කරන ලදි.

1936 සැප්තැම්බර් මාසයේදී 'වානේ පන්නරය ලැබූ සැටි' නමැති නවකතාවේ (පස් වැනි මුද්‍රණය - 1936) කතුවරයාට අයත් තිළිණ පිටපත් 'මොලදයා ග්වාර්දියා' ප්‍රකාශකයන් විසින් නිකොලායි ඔස්ත්‍රොව්ස්කි වෙත යවන ලදි. ඔහු නැවත නවකතාව කියවා වෙනස් කළ යුතු තැන් දහයක් ලකුණු කළේය. ඒ සංශෝධන දහය ඊළඟ මුද්‍රණයේදී, 1937දී 37 වැනි වරට 'ගොස්ලිටිස්දත්' (රජයේ සාහිත්‍ය ප්‍රකාශක

මණ්ඩලය) විසින් ප්‍රකාශ කරන ලද 'වානේ පන්නරය ලැබූ හැටි' නවකතාවට ඇතුළු කළේය.

කෙසේ වුවද, 'සෝවියට් පිසාතෙල්' සහ 'ගොස්ලිටිස්දත්' ප්‍රකාශක සමාගම්, කතුවරයා විසින් මොː ග්ː ප්‍රකාශකයන් සඳහා කරන ලද සියලු සංශෝධන සැලකිල්ලට නොගැනීම කනගාටුවට කරුණක් විය. එබැවින් 1936 දී ප්‍රකාශ කළ නවකතා මුද්‍රණවල කතුවරයාගේ සියලු සංස්කරණ හා කැමැත්ත ඇතුළු වී නැත.

(සිංහලට අනුවාදය කොට ඇති) මේ පොත නිකොලායි ඔස්ත්‍රොව්ස්කි ජීවත්ව සිටි කාලයේදී අවසාන වරට මොː ග්ː ප්‍රකාශකයන් විසින් ප්‍රකාශ කරන ලද මුද්‍රණයට අනුකූලය. කතුවරයා විසින් අත්‍යවශ්‍ය වෙනස් කිරීම් හැටියට හැඳින්වූ "සංශෝධන දහයද" වෙනත් වෙනස් කිරීම්ද මේ මුද්‍රණයට ඇතුළු කරන ලදි.